පර්ල් එස්. බක් ගේ "ගුඩ් අර්ත්" ග්‍රන්ථයේ පරිවර්තනය

සාර භූමි

ඌරාපොල හේමාලෝක හිමි
හේමපාල විජයවර්ධන



Scanned by CamScanner



එය වං ලුං ගේ විවාහ දිනයයි. එහෙත් තිර රෙදි වලින් ආවරණය වූ සිය සයනයෙහි මුළු රැය ගත කළ ඔහුට, වෙනදට වඩා එදින උදයෙහි වෙනසක් නොදැනුනේය--නො පෙනුනේය. මහළු පියාගේ කැස්ස හැරෙන්නට වෙන හඬක්ද එතෙක් ඒ ගෙයින් නොනික්මුනි. සෑම උදයකම වං ලුං ට අසන්නට ලැබෙන්නේ, මැද කාමරයට එහා පැත්තෙහි කාමරයක විසූ සිය පියාගේ කැස්සය. ඒ කැස්සේ හඬ අස අසා සෑම උදයකම ඇඳෙහි දිගාවී සිටින වං ලුං, ඇඳෙන් නැගිටින්නේ, පියාගේ කාමරයෙහි දොර ජනෙල්වල ලී සරනේරු වලින් නැගෙන ''ජර'' ''බර'' හඬත් පියාගේ ලී සෙරෙප්පු වලින් නැගෙන ''ටක්'' ''ටක්'' හඬත් ඇසෙන විටය.

එහෙත් මේ උදයෙහි ඔහු වෙනදමෙන් ඇඳෙහි පමා නො වූයේ ය. වහා ඇඳෙන් නැගී සිටි ඔහු එහි තිර රෙදි පසෙකට තල්ලු කෙළේය. එවිටය ඔහුට පෙනුනේ එතෙක් පහව නො ගිය අඳුරු සිමිදිරිය. මේ මුළු කාමරයටම කවුළුවක් වශයෙන් තිබුනේ කරදසි කැබලි වලින් වැසූ කුඩා හතරැස් සිදුරකි. ඒ කරදසි කැබලි ද උදය මාරුතයෙන් ''සර සර'' ගා සෙලවෙන්නට පටන් ගත්තේය. වං ලුං ඒ කවුළුව වෙත ගොස් අරුණා ලෝකයෙන් රතුවන් වූ අහස යන්තම් දැක ගෙන සුලඟට සෙලවුන කරදසි කැබලි ඉරා වීසි කෙළේ ''දැන් ඉතින් වසන්ත කාලය නිසා මෙයින් වැඩක් නැතැ'' යි කොඳුරමිනි.

එදින සවකීය ගෘහය පවිත්‍රව ද අලංකාරව ද තබාගත යුතු වීමේ හේතුව ශබ්ද නගා කීමට ඔහු ලජ්ජා වුනේය. වං ලුං මහත් වෑයමින් සිය අත ඒ සිදුරෙන් පිටතට දමත්ම වැස්ස ද කැඳවා ගෙන

Scanned by CamScanner

බටහිරින් හැමූ උදය මාරුතයේ සීතල සිනිඳු පහස ඔහුට දැනුනේය. ඒ මන්දමාරුතයම ඔහුට සුභ සූචකයකි – මංගලයක් බව පවසන්නකි.

"මේ තරම් සැර අව්ව තව දුරටත් වැටුනොත් තිරිඟු නම් කිරි වදින එකක් නැතැ"යි ඊයේ පියාට කියූ බස සිහියට නැගූ වං ලුං "දැන් ඉතින් දෙයියන්හාමුදුරුවන්ට පින් සිද්ද වෙන්න පොළොව සරු වේවි" යයි කිව්වේ සීතල උදය මාරුතයෙන් තුටු පහටු වෙමිනි.

මැද කාමරයට දුව ගිය ඔහු නිල් කලිසමක් ඇඳ මසින් ගැවසුන ඉණෙහි පටියක් බැඳ ඇඟ සෝද ගන්නා තෙක් උඩුකය නිරුවතින් තබා ගෙන අඳුරු හිමිදිරියෙහි ගිනිහල් ගෙට – කුස්සියට යන විට එහි දෙර ළඟ සිටි ගොනෙක් හිස කරකවා ඔහුට නැඹුරු වෙමින් තප්පු ලැව්වේය. ඔවුන්ගේ මේ ගෙය මෙන්ම මෙයට යාබදව පිහිටි ගිනිහල් ගෙය ද ගොඩ නංවා තිබුනේ ඔවුන්ගේම පයින් කළ ගඩොලිනි – මේ ගෙවල් සෙවිලි කොට තිබුනේ ඔවුන්ගේම කුඹුරු වලින් ලබා ගත් පිදුරු වලිනි. මේ ගිනිහල් ගෙයි උදුන වං ලුං ගේ සීයා විසින් කරවන ලද්දකි. අවුරුදු ගණනක් මුළුල්ලෙහි කෑම පිසීමෙන් පදම්වී තිබුන මේ උදුන මත විසාල රවුම් කල්දේරමක් වීය.

ඔහු මේ කල්දේරම පිරෙව්වේ ඒ අසළ වූ ජලයෙන් පිරී තිබුන මැටි භාජනයකින් ලබු කැටයකට ජලය ටික ටික ඉතා පරෙස්සෙමින් ගනිමිනි. ඔහුට ජලය ඉතා අගනා දෙයක් වීය. මැටි භාජනය ජලයෙන් මඳක් සැහැල්ලු වුන විට, වං ලුං, භාජනය පිටින්ම ඔසවා කල්දේරමට මුනින් නැමුවේ, මේ දිනයෙහි ඔහුගේ සර්වාංගයම පිරිසිදු කළ යුතුව තිබුන හෙයිනි. මවගේ තුරුල්ලෙහි ජීවත්වූ කාලයෙහි ඇයගේ ම නෙතට පමණක් ගොදුරු වුන සිය සිරුර මෙදින වෙනත් කෙනෙකුගේ නෙතට පළමු වරට ගොදුරු වන නිසා මහත් අමාරුවෙන් වුවද නෑන්ට ඔහු අදහස් කෙළේය.

උදුන වටා පිටුපසට ගිය ඔහු, කුස්සියේ මුල්ලක තිබුන පිදුරු මිටකුත් දර කෝටු කීපයකුත් අහුලා ගෙන ඒවා උදුනෙහි ක්‍රමානුකූලව අඩුක්කළේ හැම දර කෝටුවකින්ම – හැම පිදුරු ගසකින්ම ප්‍රයෝජනයක් වන පරිදිය. පරණ ගිණි ගලක වානේ කෑබැල්ලක්

Scanned by CamScanner

ගටා නිපදවා ගත් ගින්දර, උදුනෙහි පිදුරු සවල්පයට ඇවිල ගත්තේ කල්දේරම වටකරමින් මතුවී "හොස්" යන හඬක් ද නංවමිනි.

මේ ඔහු ලිප ගිනි දල්වන අන්තිම උදය යි. මෙයට අවුරුදු හයකට පෙර සිය මව මිය ගිය කාලයේ පටන් සෑම උදයකම ලිප ගිනි දැල්වීම ඔහුටම පැවරී තිබුන කාය්‍යීයකි. මෙසේ ලිප ගිනි දල්වා වතුර උණුකොට, කාමරයේ ඇඳෙහි එතෙක් වාඩිවී ලී සෙරෙප්පු ගටමින් සිටින මහළු පියාට උනු වතුර කෝප්පයක් ගෙන ගොස් දීමෙන් පසුව වං ලුං දවසේ වැඩ අරඹන්නේය. දෙළොස් මාසයේ සෑම උදයකම මේ මහළු මිනිසා, සවකීය පුත්‍රයා උණුවතුර භාජනය ගෙනෙන තුරු මේ ඇඳට වී බලාගෙන සිටියේ කැස්සෙන් වියලී ගිය උගුර උණු වතුරෙන් තෙමා ගැනීමටය.

මේ දිනයෙහි ද වතුර උණුවන තෙක් ලිප ලඟ ඇණ තියාගත් වං ලුං මෙසේ බර කල්පනාවක වැටුනේය.

"දැන් ඉතින් තාත්තටත් මටත් නිවාඩු ගත හැකි. බිරියකුත් හෙට අනිද්ද මේ ගෙදරට ඒවි. මීට පස්සෙ නම් සීත කාලයේ හෝ උෂ්ණ කාලයේ සෑම උදයකම මේ ලිප ලඟට එන්න වෙන එකක් නැහැ. මටත් උදේ කාලෙ ඇඳේ ටිකක් වේල දිග ඇරිල ඉන්නත් පුළුවන් වේවි. එයා තාත්තට වතුර උණුකරල දීල මටත් බොන්න වතුර ටිකක් ගෙනත් දේවි. පොළවත් සරුසාර උනොත් ඔය නිකමට බොන උණු වතුරට තේ කොළ ටිකකුත් දමන්න බැරිය."

"ඉතින් ඔහොම ඉන්න කොට මගේ බිරියටත් දරුවො ඇති වේවි. ඇයටත් මහන්සි නම් ගෙදර දෙරේ වැඩ කටයුතු වලට දරුවො යොදන්න පුළුවන්. අම්ම මිය ගියාට පස්සෙ පාලු වට ගිය මේ ගෙයි හෙට අනිද්ද මගේ දරුවො දුව පැන ඇවිදී වී. මේ බාප්පත් එයාගෙ හැත්තත් පිරුණොත් තමයි තියෙන කරදරේ."

"බොලා දෙන්නට මොටද්ද මෙච්චර ලොකු ගෙයක්"යයි ඊයේ බාප්පා ඇසූ විට "මම මේ ගේ ඉඩතියාගෙන ඉන්නෙ මගේ මුණුපුරාට"යයි කියාපු එක කොච්චර හොඳ ද?

"ඉතින් තාත්තට එක මුණුපුරෙක් නෙවෙයි තවත් මුණුපුරෝ ඇති වේවි. එතකොට ඒ ගොල්ලන්ගෙ ඇඳන් තියන්න වෙන්නෙ මැද කාමරෙත්, මේ බිත්ති අයිනෙත්"යයි සිතමින් සිටිද්දී ලිපෙහි ගින්දර නිවී වතුර කල්දේරම ඇල්වෙන්නට පටන් ගති. මේ අතර

Scanned by CamScanner

බොත්තම් නො දැමූ කබාය ද එල්ලා ගත් මහල්ලා ගිනිහල් ගෙයි දෙරකඩ ලඟට වින් කැහැ කැහැ කෙල ගස ගසා මෙසේ තැතනු වේය.

''මො-කො-ද බාං, ඔය වතුර ටික මෙච්චර පරක්කු වෙන්නෙ? අරං වරෙන් ඉක්මනට ඕක, මගේ පෙනහැලි රත්කර ගන්න.''

මහළු පියා දෙස බැලූ වං ලූං ලජ්ජාවට පත්ව ''මේ දරත් තෙතයි. ඒ මදිවට මේ සීතල සුලඟත්''යයි කියමින් කෙඳුරුවේය.

මහල්ලා නොනවත්වාම කැහැ ගෙන කැහැ ගෙන ගියේය. ඔහු වතුර දෙන තෙක්ම කැස්සේය. වං ලූං ද යළිත් ලිප ගිනි මොලවා වතුර සවල්පයක් කෝප්පයට වත් කෙළේය. අනතුරුව ඔහු, ලිප අද්දර තිබුන බෝතලයකින් වියලී ඇකිලුන තේ කොල සවල්පයක් ගෙන උණුවතුර කෝප්පයට දමා, එය මහල්ලා වෙත ගෙන ගියේය. ගිජු ලෙස ඒ වතුර කෝප්පය අතට ගත් මහල්ලා එහි මතුවී තිබුන තේ කොල කෑලි බලමින් මැසිවිලි කියන්ට පටන් ගත්තේය.

''මොකද බාං උඹ මේ තේ කොල නාස්ති කරන්නෙ? උඹ මේ කරන්නෙ හරියට සල්ලි කනව වගේ වැඩක්.''

''අද තමයි තාත්තෙ හොඳට කාල බීල සන්තෝෂයෙන් ඉන්න ඕන දවස යයි'' වං ලූං මහල්ලාට පිළිතුරු දුන්නේ සිහින් සිනහවක් ද පහළ කරමිනි.

තොල් මතුරමින් හා උගුරෙන් රළු හඬක් නංවමින් මහල්ලා, කරගැට වලින් කර්කශවූ ඇඟිලි වලින් ''ඒ උණුවතුර භාජනය'' අල්වා ගෙන එහි මතු පිට පාවෙන තේ කොළ කැබලි දෙස බලා ගත් වනම සිටියේ, තේ ගැන දක්වූ දැඩි ලෝභය නිසාය.

''ඉතින් ඕක සීතල වේවි''යයි වං ලූං කීවිට මහල්ලා ''ඒකත් හැබෑ තමා'' යයි තැතිගත් සවරයෙන් පවසමින් උගුරට දෙකට තේ භාජනය හිස් කෙළේය. මහල්ලා පොඩි දරුවෙකු මෙන් ඒ උණු වතුර කෝප්පයෙන් අමානුෂික රසයක් වින්දත්, සිය පුතා කිසිත් අර පරෙස්සමක් නැතුව අර කල්දේරමෙන්-ලී බාල්දියෙන්-වතුර වත්කරනු දකින්නට අමතක නො කෙළේය. එහෙයින් ඔහු හිස ඔසවා පුත්‍රයා දෙස රවා බලා එක් වරටම මෙසේ ඇසුවේය.

''මොකොද බාත් ඔය කුඹුරක් අස්වද්දන්න තරම් වතුරක් විනාස කරන්නෙ?''

Scanned by CamScanner

වං ලූං ද පියා කියූ දෙය නො ඇසුනාක්මෙන් කල්දේරමෙහි අන්තිම දිය බිඳුව දක්වා ලී බාල්දියට වත් කරද්දී ''හා හා! එපා''යයි පියා කෑ ගැසුවේය.

''මං මේ ඇඟ හෝදන්නෙ ගිය අවුරුද්ද දවසෙ ඇඟ හේදුවට පස්සෙ'' යයි සිහින් හඬින් වං ලූං කිව්වේ තමා මේ ඇඟ සෝද සැරසෙන්නේ නව බිරියක පිළිගැණීමට යයි පියාට කීමට ලජ්ජා වුන නිසාය. ඔහු ගනි ගනික මේ වතුර බාල්දියත් රැගෙන සිය කාමරයට ගියේය. ඔහු තදින් දෙර වසා කාමරයට පිවිසුන නමුත් දිරාගිය ලී උළුවස්ස මත රැඳුන දෙර අඩවල් වුනා පමණකි. වහා ඇඳෙන් නැගිට අඩවල් වුන ඒ දෙර ලඟට ගිය මහල්ලා දෙරෙහි විවරයට කට තබා ශබ්ද නගා කතා කෙළේය.

''මේක හරි වැඩක්! මොකක් ද බාන්. ඔය ගෑණියෙක් ගේන්න ඔච්චර ලෑස්ති වෙන්නෙ. උදේ බොන වතුරට තේ කොළ, දැන් මේ ගඟක විතර වතුර නාන්න!''

''මොකොද තාත්තෙ ඔච්චර කෑගහන්නේ? මෙහෙම හැම දටම නාන එකක් දෑ'' යි වං ලූං කෑගැසුවේ,'' නාල ඉවර උනාම ඒ වතුරත් මේ පොළොවටම වක්කරන හන්ද අපතෙ යන එකක් නැතැයි''ද කියමිනි. එයින් මහල්ලාගේ කෑගැසීම නතරවුනි.

වං ලූං, ඉණෙහි බැඳි පටිය බුරුල් කොට ඇඳුම් උනා තැබුවේ ය. හතරැස් සිදුරෙන් වැටුන එලියට අල්වා කුඩා තුවායක් උණු වතුරෙන් පොඟවා මිරිකාගත් ඔහු එයින් සිය සිරුර තදින් ඉලුවේය. උණුවතුර ඇඟෙහි තැවරුන මොහොතකින් ඔහුට සීතල දැනුනේය. එහෙයින් ඔහු වහ වහා තුවාය භාජනයට දමමින් යළි ගනිමින් සර්වාංගයෙන් හුමාලය නගින තෙක් ඇඟ ඉලුවේ සීතල ද දුරුකර ගන්නාක් මෙන්ය. නෑමෙන් පසු මවගේ ඇඳුම් පෙට්ටිය වෙත ගිය ඔහු එයින් නිල්වන් ඇඳුම් කට්ටලයක් පිටතට ගත්තේය. බොහෝ කලකින් නනා පිරිසිදු කළ තම සිරුරෙහි මේ ඇඳුම්-කට්ටලය දමන්නට ඔහු මැලි වූයේ ''කිලිටි වූ නූල් මතුවූ මාළුබවට පත්වූ'' මේ ඇඳුම් කට්ටලය ඇඳගෙන තරුණියක බලන්නට යන්නේ කෙසේ දැයි සිතූ හෙයිනි. එහෙත් වෙන ඇඳුම් ඔහුට නොතිබුන හෙයින් ''මේ ඇඳුම් තම බිරියට සෝද එලලන්ට සිදු වෙතියි'' සිත සිතා නිල් කලිසම ද නිල් කබාය ද ඇඳගෙන එයට උඩින් දිග කපු සළුවක් දමා ගත්තේය. ඔහු සතුව තිබුන එකම සළුව ද මෙයම

විය. මෙයද ඔහු පාවිච්චියට ගත්තේ උත්සව දිනවල පමණකි. මේ ඇඳුම් ඇඳ ගැනීමෙන් පසුව ඔහු කෙළේ සවකීය කබල් මේසයේ ලාච්චුවෙන් ලී පනාවක් ගෙන, දිග කෙස් වැටිය පිට දිගට වැටෙන්ට මුදා හැර, පීරන්ට පටන් ගැනීම ය.

ඔහුගේ පියා නැවතත් දොර ලඟට ගොස් එහි විවරයට කට තබා දෙස් නගමින් කතා කෙළේය.

''නැද්ද බාං උදේට මොකුත් මට කන්න දෙන්නෙ. මේ විදියට උදේට බඩගින්නෙ හිටියොත් මගේ ඇටකටු වතුර වේවි.''

''මේ එනව තාත්තේ''යි වං ලුං කිව්වේ සිනිඳු ලෙස කැරලි වලට බෙදූ කෙස් වැටිය කළු සිල්ක් පටියක් යොදා ගොතමිනි.

මොහොතක් ගතවිය. ගෙතූ කෙස් වැටිය හිස වටා දවටා ගෙන වතුර භාජනය ද රැගෙන කාමරයෙන් පිටවෙන විට එතෙක් අමතක වී තිබුන උදය ආහාරය ගැන යලිත් වං ලුං ට සිහිවුනි. තිරිඟු පිටි සවල්පයක් උණු වතුරෙන් කවලම් කොට පියාට දෙන්නට සිතමින් මහත් අමාරුවෙන් ඔසවා ගෙන ගිය වතුර බාල්දිය දොරටුව අසළ ම මුනින් නැමුවේය. කල්දේරමේ තිබුන වතුර සියල්ලම අවසන් වුන බව ඔහුට මතක් වුනේ වතුර බාල්දිය මුනින් නැමීමෙන් පසුවය. යලිත් ලිප ගිනි මොලවන්නට ද වතුර උණු කරන්නට ද සිදුවන නිසා මහළු පියා කෙරෙහි ඔහු තුළ හට ගත්තේ තරමක කෝපයකි.

''මේ නාකියට සිහිය තියෙන්නෙ කන්නයි බොන්නයි විතරයි. වෙන කිසිම අදහසක් නැතැ''යි කියමින් උදුන් විවරයට කට තබා කොඳුළ නමුත් ඔහු කිසිවක් ශබ්ද නගා නො කීවේය. කෙසේ නමුත් ඔහු දොර ලඟ ලිඳෙන් වතුර බාල්දියක් ඇද එයින් උණුකර ගත් වතුර සවල්පයකට පිටි ටිකක් කවලම් කොට පියා වෙත ගෙන ගියේය. ඔහු ඒ තිරිඟු බඳුන පියාගේ අතට දුන්නේ ''අපි රෑට බත් කමු තාත්තෙ. මෙන්න එතකං තිරිඟු ටිකක්'' යයි කියමිනි.

''ඔව් හැබැටම පෙට්ටියෙත් තිබුනෙ හාල් ටික ය''යි කියමින් තිරිඟු භාජනය අතට ගත් මහල්ලා මැද කාමරයේ මේසය ලඟ පුටු වෙහි වාඩි වූයේ උණ කෝටුවකින් ඒ තිරිඟු භාජනය කවලම් කරමිනි.

''අපි මේ වසන්ත කාලෙදි අරපරෙස්සමින් කන්න බොන්න ඕන'' යයි වං ලුං කියූ නමුත් මහල්ලාට එය නොඇසුනේ තලු ගස

Scanned by CamScanner

ගසා, දෙතොලින් ශබ්ද නග නගා තිරිඟු භාජනය හිස් කිරීමෙහි යෙදී සිටි නිසාය.

සිය කාමරයට නැවතත් ගිය වං ලුං කෙස් වැටිය මුදුහැර, ඇඟපත ගසා දමා ගෙන දවස් කීපයකට පෙර මුඩු කළ ඇස්බැම හා කම්මුල අත ගෑවේය. මෙහිදී ඔහුට අළුත් අදහසක් පහළ වීය. කල්වේලා තිබෙන නිසා පනික්කි වීදියට ගොස් "අළුතෙන් රැවුලත් කපාගෙනම මනමාලියගේ ගෙදරට ගියොත් හොඳය" යනු ඒ අළුත් අදහසයි. මේ අදහසද ඔහුට ඉටුකර ගත හැකි වන්නේ ලඟ මුදල් තිබුනොත් පමණකි.

ඔහු සිය පටියෙහි ගසාගෙන තිබුන දුඹුරුවන් රෙදි පසුම්බියක් ඇද එහි තිබුන මුදල් ගැණ බැලුවේය. රිදී ඩොලර් හයකුත් තඹ කාසි කීපයකුත් එහි ඇති බව දත් ඔහුට අනතුරුව මතක්වුනේ පියාටද නොකියා තමන් විසින් රෑ කෑමට ආරාධනා කළ අමුත්තන්ය. බාප්පාද බාප්පාගේ පුතාද අසල් වැසියන් කීපදෙනෙක්ද වං ලුං ගේ ආරාධනාව පිළිගෙන සිටියහ.

එදින රෑ කෑම සඳහා දුන්තෙලුත් සොයා බෝංචිත් ඔහු විසින් අවශ්‍යයෙන්ම ගතයුතු වීය. ඒවා මිලට ගෙන මුදල් ඉතුරු වුනොත් ඔහු ගන්නට බලාපොරොත්තු වුනේ දකුණේ උණ දළු සවල්පයකුත් තම කොටුවෙහි වැවුන ගෝවා සමග තැම්බීමට මස් ටිකකුත් ය. ඉදින් රැවුලත් කැපුවොත් වැඩිපුර ගැනීමට අදහස් කරගෙන සිටි ද්‍රව්‍ය ගැනීමට නොහැකිවේ යයි සිතූ වං ලුං අන්තිමට තීරණය කෙළේ මුදල් ඉතුරු නූනත් රැවුල කපා ගැනීමටය. ඉන්පසු ඔහු මහළු පියාට කිසිත් නොකියා උදෑසනම ගෙයින් පිටවී මගට බැස්සේ හිරු වලාකුල් අතරින් එබී බලද්දීය. මග දෙපස වූ තිරිඟු හා බාර්ලි පඳුරු මත පතිතවුන පිනි බිඳු, මුතු මෙන් බැබලුනේ ලහිරු රැසිනි. වං ලුං ගේ ගොවි සිත පිබිදුනේ ලහිරු රැසින් නැහැවුන-බණ්ඩි කරලින් යුතු වුන සරු සාර තිරිඟු හා බාර්ලි කෙත් දැකීමෙනි. එහෙත් ඒ බණ්ඩි වෙනද මෙන් නො පිරීමේ හේතුව "වැස්ස නොමැති නිසා බව" ඔහු දනියි. වාතය ඉව කරමින් අහස දෙස බැලූ ඔහුට වර්ෂාව රැඳී තිබෙන අඳුරු වලාකුල් පෙනුනි. වැස්සෙන් බරව සීතල මන්දමාරුතය හමන විට "දැන් ඉතින් දෙවියන්ට හඳුන් කූරක් පහනක් පත්තු කරන්න සුදුසු කාලය"යි වං ලුං සිතුවේ මෙවැනි දිනවල එය ඔහු විසින් සිරිත් පරිදි කළ යුතු හෙයිනි.

Scanned by CamScanner

කුඹුරු අතරින් වැටුන පටු මාවත දිගේ ගමන් කළ ඔහුට ඈත සිට ම නගරයේ මහා ප්‍රාකාරය දිස්වුණි. මේ ප්‍රාකාරය පෙනෙන විට වං ලුං කල්පනා කරන්නට වූයේ ප්‍රාකාරයෙන් ඔබ්බෙහි තිබෙන "හ්වැං" මැඳුර ගැනය. තමන් කැඳවාගෙන ඊමට අදහස් කොට සිටින ගැහැණිය කුඩා කල පටන්ම වහලියක මෙන් සිටින්නේ මේ මහා මැඳුරෙහිය. එහි වෙසන ඒ ගැහැණිය ගැන කල්පනා කරන විට මතක් වුනේ පසුගිය දිනක තම විවාහය පිළිබඳව තම පියාත් තමාත් අතර ඇතිවුන විවාදයකි.

"විශාල ගෙදරක-පොහොසත් ගෙදරක වහලියක හා විවාහ වෙනවාට වඩා අවිවාහකව වෙසෙන එක හොඳ බව" අසල් වැසියන් පියාට කියා තිබුණි. මේ කියමන් අනුව තම විවාහය පිළිබඳව උදාසීන බවකි මහළු පියා පළකෙළේ. මෙයින් නොඉවසුම් බවට පත් වං ලුං "ඇයි තාත්තෙ, මට කියන්නෙ හැමදම තනියම ඉන්න දැ" යි පියාගෙන් ඇසුවේය.

"මේ දවස්වල ඔය මගුල් තුලා වැඩ වලට කෙළවරක් නැතුව මුදල් හදල් ඕන. ඉතින් ඔය ගෑනුන්ට කණ කර ආයිත්තමයි සිලික් රෙදියි අපි කොහොමද හරිහම්බ කරන්නෙ. අඩු වියදමින් කටයුත් තක් කරගන්න නම් ඉන්නෙ ඔය වහල් ගෑනු තමා" යයි මහල්ලා වං ලුං ට පිළිතුරු දුන්නේ තමා හ්වැං මැඳුරට ගොස් සිය පුතා වෙනුවෙන් එබඳු වහලියක ගැන කලින් සොයාබලා තිබුන හෙයිනි.

"හුහක් ලාබාල උනත් හුහක් ලස්සන වහලියක් නම් වුවමනා නැතැ" යි පියා කීවිට, රූමත් තරුණියක පාවා ගැනීමට ආසාවෙන් සිටි වං ලුං සවකීය මුහුණෙන් විරුද්ධබවක් පළකොළේය. එවිට පියා මෙසේ කීවේය :—

"අපට මොටොද බාන් ලස්සන ගෑණු. අපට ඕන කරන්නෙ කුඹුරු වැඩ කරන ගමන් ගෙදර දොරේ වැඩපලත් කරගෙන ළමයිනුත් හද වඩා ගන්න ගෑණියෙක්. ලස්සන ගෑණියකගෙන් ඒව සිද්දවෙන්නෙ නැහැ. එහෙම ගෑණු කිස්සේම හිතන්නෙ හැඩ වැඩ වෙල ඉන්නයි. ඒ ඇරත් ගොයිරාළ කෙනෙකුට මොනවටද බාන් ලස්සන ගෑණු. ඊටත් වඩා මේ පොහොසත් ගෙවල කොයින්ද තරුණ කම රැකගත් ලස්සන ගෑණු."

"පොහොසත්. ගෙවල ඉන්න ඉලන්දරින්ගෙ ගොදුරු තමයි ලස්සන දසියො. මම නං හිතන්නෙ නැහැ පොහොසත් ඉලන්දරින්

සමග කාලය ගත කරපු ලස්සන ලමිස්සියො උඹවගේ හැඩි දැඩි ගොයිරාළ කෙනෙකුට කැමතිවේය කියල.''

පියාගේ ඒ කතාවෙහි සත්‍යයක් ගැබ්ව ඇති බව වං ලූං වටහා ගත්තේය. එහෙයින් බලවත් චිත්ත විප්ලවයකට භාජන වෙමින් වුවද ඔහු යලිත් පියා සමග කතාකෙළේය.

''ඒ උනාට තාත්තෙ, අපි තෝරගන්න ඕන තොල් පැලුනෙ නැති මූනෙ වසූරි කැලැල් නැති ගෑණියෙක්.''

''හොඳයි ලැබෙන ගෑණි කොයි විදියෙ එකියක් දැයි බලමු'' යයි පියා කීවේය. රිදී මුදු දෙකකුත්, රත්රන් වතුරේ දැමූ රිදී තෝඩු දෙකකුත් සවකීය පියා විසින් විවාහය සපිරවීම සඳහා ගැහැණිය අයිතිකාරයට ගෙන ගොස් දී තිබෙන බව විනා වෙන කිසිවක් ඔහු සිය බිරිය ගැන නොදත්තේය. මෙසේ පසුගිය දිනක සිදුවූ කතා බහ ද සිහි කරමින් නගරයේ දොරටුවෙන් පිවිසුන ඔහුට වීදිවල එහා මෙහා ගමන් ගත් වතුර භාජන පටවා ගත් කරත්ත දක්නට ලැබුණි. මේ භාජන වලින් වීසිවුන ජලයෙන් නගරයේ වීදි නිතර තෙමී තිබුණි. එහෙයින් ගිම්හානයේ මේ උණුදියද ඔහුට දැනුනේ සීතල දවසක් මෙන්ය. මෙහි මග දෙපස පදික වේදිකා දෙඩම් හා ඇටඹ කුඩ වලින් පිරී තිබුණි. පලතුරු වෙළඳුන් සිය පලතුරු ගොඩවල් ලඟට වී කල් ඇතුව කඳවුරු බැඳගෙන සිටියේ වෙළඳාමට කල් යල් බලමිනි.

''ඇටඹේ, ඇටඹේ! ඇටඹේ! ඇටඹේ! ගුණයි රසයි ලාබයි, මේව තමයි අළුත්ම පලතුරු'' කිය කියා වෙළඳුන් කෑගසන විට වං ලූං ''මම ආපහු බිරියත් සමග මෙතනින් යනවිට ඇයට ඇටඹ ගෙඩි ටිකක් අරන් දෙන්න ඕන'' යයි සිතුවේ බිරියකුත් සමග තමා ආපසු පැමිණෙන බව ද තමාටම කියා ගනිමිනි.

මෙසේ වං ලූං නගරයේ දොරටුවෙන් පිවිසී දකුණට හැරී ගමන් කෙළේ පනික්කි වීදිය දෙසටය. ඔහුට කලින් පනික්කි වීදියට පැමිණ සිටියේ ඉතා ටික දෙනෙකි. ඔවුනතර ද සිටියෝ තමා දන්නා හඳුනන ගොවියෝය. පාන්දරින්ම බඩු මුට්ටු විකුණගෙන කල් ඇතිව කුඹුරු වලට යාමට රෑ හරියෙන්ම පැමිණි ඔව්හු සිය හිස් කූඩා සමීපයට වී සීතලෙන් වෙවුල වෙවුලා ගුලිගැහී නිදවැටෙමින් සිටියහ. මේ මිනිසුන්ට නොපෙනෙන ලෙස යන්නට වං ලූං අදහස් කෙළේමේ දිනයෙහි ඔවුන්ගේ විහිළු වලට තමා අසුවේ දෝ යන භීතිය

Scanned by CamScanner

නිසාය. වීදිය දිගටම තිබුනේ බාබර් සාප්පු ය. ඔහු කෙළවරේම තිබුන බාබර් සාප්පුවකට ගොඩ වැදී එහි මුල්ලක තිබුණු පුටුවක වාඩි ගත්තේ, අසල් වැසියෙකු සමග කතාකරමින් සිටි බාබරයාට ඉඟියක් කරමිනි. බාබරයා වහා පැමිණ අඟුරු ගොඩ මත තබා තිබුන කේතලයෙන් තඹ භාජනයකට වතුර වත්කරමින් ''කොහොමද සේරම මුඩු කරනවා දැ''යි විමසුවේය.

''හිසත් මුහුණත් තමා'' යයි වං ලුං පිළිතුරු දුන්නේය.

''ඇයි කණුයි නාසයි සුද්ද කරන්නෙ නැද්ද?''

''හොඳයි ඒවටත් එක්ක වැඩිපුර කීයක් යාවිද?''

''පැන්ස හතර'' යයි බාබරයා කීවේ කලු රෙද්දක් උණු වතුරෙන් පොඟවමිනි.

''බැහැ බැහැ පැන්ස දෙකක් දෙන්නම්.''

''එහෙනං මම එක කණකුයි එක නාස් පුඩුවකුයි සුද්ද කරන්නම්'' යයි බාබරයා කිව්වේ එහි සිටි තවත් බාබරයෙකු දෙස බලා ඉඟියක් කරමිනි. ඔවුන් දෙදෙනා සිනාසෙන විට තමා විහිලු කාරයෙකුට අසුවුන බව වං ලුං ට වැටහුනි. බාබරයා පහත් මිනිහෙකු වුවත් ඔහුගේ නාගරික කම නිසා වං ලුං සවකීය ගැමිකම සිහි කරමින් දීනත්වයෙන් මිරිකී යලිත් කතාකළේය.

''හොඳයි උඹට කැමැත්තක්.''

බාබරයා ඔහුගේ මුහුණෙහි හා හිසෙහි සබන් ගා රැවුල කපන්නට සැරසුණේ මෙවිටය. රැවුල කපා අවසන් කොට හිසෙහි කෙස් සවල්පයක් කපන ගමන් මෙසේ ඇසුවේය.

''මේ කෙස් වැටියත් කපා දැමුවොත් ටිකක් ලස්සනට හිටීවි. කෙස් වැටිය කපන එක තමයි දැන් අළුත් පන්නෙ.''

''තාත්ත ගෙන් අහන්නෙ නැතුව ඒක නං කරන්න බැරිය''යි කියන විට බාබරයා සිනාසෙමින් කෙස් වැටිය අවට ප්‍රදේශය මුඩුකර දැම්මේය.

බාබරයාගේ වැඩ අවසන් වූ විට වං ලුං මුදල් ගැන ඔහුට නියමිත ගාස්තුව ගෙව්වේ බියෙන් මෙන්ය. ''කොච්චර මුදලක් දැ''යි සිත සිතා බාබර් සාප්පුවෙන් එළියට බසින විට ඔහුගේ අළුත මුඩු කල හිසට හා මුහුණට සුලඟේ සීතල පහස ලැබීමෙන් ඔහුට අළුත් ප්‍රීතියක් ඇතිවුණේය. ''නැහැ කොච්චර මුදලක් ගියත් කමක් නැහැ''යි තමාට කියා ගනිමින් ඔහු වීදිය දිගේ ගමන් කෙළේ

Scanned by CamScanner

වෙළඳ පොලටය. එහිදී ඔහු පළමු කොට කූඩයක් මිලට ගෙන මස් කඩයට ගොස් ඌරු මස් රාත්තල් දෙකක් ඉල්ලුවේය. වෙළෙන්ද ඌරු මස් රාත්තල් දෙක නෙලුම් කොළයක ඔතා දූ පසු හරක් මස් අවුන්ස හයක්ද ගත්තේය. අවසන් වරට දුන් තෙල් අවුන්ස හතරක්ද ඒ කඩයෙන්ම මිලට ගත් ඔහු ඉටිපන්දම් විකුණන කඩයකට ගියේ සඳුන් කූරු දෙකක් ගැනීමටය. මේ බඩු සියල්ලම දැමූ කූඩය ද කරගසා ගෙන ලජ්ජාවෙන් මෙන් වං ලූං ''හ්වෑං'' නිවාසය දෙසට පා නැගීය.

ඒ මහා මන්දිරයෙහි ගේට්ටුව ලඟට ගිය ඔහුට ඇතිවූනේ මහත් බියකි.

''තනියම ආපු එක ලොකු මෝඩකමක්.''

''බාප්ප හෝ තාත්ත එහෙමත් නැත්නම් කිට්ටුව පහත කෙනෙක් එක්කර ගෙන ආවනං කොපමණ හොඳද? මෙච්චර විසාල ගෙදරකට මම කවදක්කත් ගිහිල්ලත් නැහැ. මේ කන බොන දේවලුත් කරගහගෙන මම කොහොමද ගෑණියක් එක්කරගෙන යන්න ආවයි කියන්නෙ''යි සිතමින් ඔහු බොහෝ වේලාවක් ඒ දැවැන්ත ගේට්ටුව දෙස බලාගත්වනම සිටියේය.

කළුසායම් ගෑ යකඩින් හා ලීයෙන් කළ ඒ දැවැන්ත ගේට්ටුව තදින් වසා තිබුණි. ගේට්ටුව දෙපසෙහි වූ ශෛලමය සිංහ රූප දෙක හැර වෙන කිසිවෙක් එහි මුරට නැතැයි ඔහුට සිතුනේය. මේ වන තෙක් උදෑසන ආහාරයක් නොගත් නිසා ක්ලාන්ත ගතියක් දැනී ආපසු හැරී ගමන් කළ ඔහු තේ කඩයකට ගොඩ නැගී එහි මේසයක් මත පැන්ස දෙකක් දමා පුටුවක ඉඳගත්තේය. මේසය මත දැමූ පැන්ස දෙකෙහි හඬට මෙන් මොහොතකින් ඔහු වෙත දුවගෙන ආවේ කිලුටු ඇඳුමක් ඇඳගත් තරබාරු කොලුවෙකි. බූරියානි පීරිසි දෙකක් ගෙනෙන්නට වං ලූං ඔහුට අණ කෙළේය. ඒවා මේසය මත ගෙනැත් තැබූ විට, ඔහු උණපතුරු වලින් කට ට දමාගෙන කෑදර ලෙස රසවිඳිද්දී කොලුවා මේසය මත වූ කාසි දෙක දබරුහිල්ලත් මහපටැහිල්ලත් මත තබා කරකවමින් බලාගෙන සිටියේය.

මේ අතර ''තමුසෙට තව ගේන්න දෑ''යි සේවක කොලුවා නොසැලකිලිමත් ලෙස ඇසුවේය. වං ලූං හිස සොලවා නැවත වටපිට බැලුවේය. මේස වලින් පිරුන කුඩා කාමරයේ ඔහු අඳුනන

කිසිවෙක් නොවීය. කෑම කමින් හා තේ බොමින් එහි සිටියේ නාඳුනන මිනිසුන් ටිකදෙනෙකි. ඒ මිනිසුන් අතර ඔහුට ඔහු පෙනුනේ පොහොසතෙකු මෙනි. ඔහු තරම් හොඳට ඇඳ පැළඳගත් කිසිවෙක් එහි නොවීය. දුප්පත් මිනිසුන් ගෙන්ම ගැවසුන මේ තේ කඩය පසුකර යමින් සිටි හිඟන්නෙක් වං ලුං දෙස බලා මෙසේ ඇයැද සිටියේය.

''පින්සිද්ද වේවි මහත්තයො, කන්න මොකුත් අරගන්න මුදලක් ලැබෙන්න. දවස් ගණනක ඉඳල හාමතේ.''

මෙයට පෙර වං ලුංගෙන් කිසි දිනකත් හිඟන්නෙක් මුදලක් ඉල්ලා නැත. පළමුවරට තමාට ''මහත්තයා''යයි අමතනු ලැබුවේ ද මේ හිඟන්නා විසිනි. මේ ඇමතුමෙන් ප්‍රීතියට පත් වං ලුං සතයක් ගෙන හිඟන්නාගේ භාජනයට වීසිකෙළේය. හිඟන්නා ඔහුට පින් දි දී නොපෙනී ගියේය.

වං ලුං තේ කඩයෙහි ඉඳගෙන සිටිද්දී හිරු ද ක්‍රමයෙන් නැංගේය. නොසන්සුන් බවට පත් සේවක කොලුවා ''තමුසෙ වෙන මොකුත් ගන්නෙ නැත්නම් ඔය පුටුවටත් ගෙවන්න වේවි''යයි නොසැළකිලි ලෙස කීවේය.

එයින් කෝපයට පත් වං ලුං පුටුවෙන් නැගිටීමට සැරසුනි. එහෙත් ''හ්වැං'' නිවාසයට යන ගමන මතක්වුන විට ගතින් සිහින් දහඩිය නැගුනි, නැවතත් ඔහු පුටුවෙහි හරිබරි ගැහී වාඩි වී ''මට තේ කෝප්පයක් ගෙනෙන්!''යයි දුබල හඬින් කීවේය. ඉතාමත් ඉක්මනින් තේ කෝප්පය ද රැගෙන ආ කොළුවා ''පැන්සය කෝ?'' යයි වේගයෙන් ඇසුවේය. තම පටියෙන් පැන්සයක් අතට ගත් වං ලුං ''මේක මංකොල්ලයක් වගේ'' යයි කියමින් තොල් මතුළේය. එදින රැයෙහි තමගෙදර කෑමට ආරාධනා ලැබූ අමුත්තෙක් එවිට තේ කඩයට ඇතුල්වෙනු වං ලුං ට පෙනුනේය.

ඉන්පසු ඔහු පැන්සය මේසය මත දමා තේ කෝප්පය උගුරට දෙකට බී පසු පසෙහි දෙරකින් වහා එළියට පැන වීදියට බැස ගමන් කෙළේ ''කොයි වේලාවෙ උනත් මේ ගමන කළයුතු ය''යි සිතමිනි.

මෙවර ගේට්ටුව වෙත ඔහු යන විට මධ්‍යාහ්නය ද පසුවී තිබුනි. විවෘත වූන ගේට්ටුවෙහි එළිපත මත සිටි මුරකාරයා උණ කූරකින් දත හාරමින් සිටියේ දහවල් භොජනය අවසන්වුන බව අඟවන්නට

මෙන්ය. ඒ මුරකාරයා උස මිනිහෙකි. ඔහුගේ වම් කම්මුලෙහි ලොකු ඉන්නෙකි. කිසිකලෙකින් නොකපනු ලැබූ කෙස් රොදයක් ඒ ඉනිගැටය මත වැඩී තිබුනි. ඔහු, කූඩයක් හිසමත තබාගෙන පැමිණි වං ලුං යමක් විකුණන්නට පැමිණියෙකුයි සිතා, අකාරුණික ස්වරයෙන් ඔහු ඇමතීය.

"උඹ මොකෝ මේ ආවෙ?"

"මම තමයි වං ලුං කියන්නෙ. මම ගොවියෙක්."

"හොඳයි වං ලුං ගොවිය තමයි, මොකද ආවෙ?"

"මම ආවෙ, මම ආවෙ........"

"ඔව් උඹ ආපුබව මට පේනවා"යයි මුරකාරයා කිව්වේ කම්මුලෙහි ඉනි ගැටය මත වූ කෙස් රොද කරකවමිනි.

"මෙහේ ගෑනු කෙනෙක් ඉන්නවද ගොවිරාළ කෙනෙකුට දෙන්න කතා කරපු?"

වං ලුං තතන තතනා විමසනවිට හිරු එළිය වැටීම නිසා ඔහුගේ මුහුනෙන් දහඩිය රූරා ගලන්නට වීය. මුරකාරයා මහ හඬින් සිනා පහළ කෙළේය.

"හො, හෝ, එහෙනං අර මනාමාලය නෙවැ. කූඩයකුත් අරගෙන ආවම කවුද දන්නෙ මනමාලයෙක් බව."

"මේ කෑමට දේවල්"යයි කියමින් වං ලුං එහි නතරව සිටියේ තමා මුරකාරයා විසින් ඇතුළට කැඳවාගෙන යතියි සිතූ නිසාය. එබඳු සූදනමක් මුරකාරයා තුළ නම් නොවීය.

"මම එහෙනං තනියම යන්නං."

"එහෙනං නාකි රදළ නැන උඹව මරාවි"යයි මුරකාරයා කිවේ වං ලුං අහිංසකයෙකු බව දැනගෙනය. ඔහුගේ අහිංසක කමින් ප්‍රයෝජන ගැනීමට අදහස් කළ මුරකාරයා මෙසේ ද කීවේය.

"මේ ගේට්ටුවෙන් ඇතුල්වීමට තියෙන හොඳම යතුර සල්ලි තමයි."

"දුප්පත් මම සල්ලි දෙන්නෙ කොහොමද?"

"හොඳයි අපි ඔය පසුම්බියෙ තියෙන්නෙ මොනවද කියල බලමු"යයි මුරකාරයා යෝජනා කළවිට, වං ලුං සිය කූඩය එළිපත මත තබා පටියෙන් කුඩා පසුම්බියක් ඇද, බඩු මිලට ගෙන ඉතිරිවී එහි දමා තිබුණ කාසි කීපය සිය අත්ලට හෙලුවේය. දත් විලිස්සමින්

එදෙස බලාගෙන සිටි මුරකාරයා, වං ලුං ගේ අතෙහි වූ රිදී කාසිය හා තඹකාසි කීපය දුටුවේය.

වං ලුං විරොධය පළකරන්ටත් පෙර "මම එහෙනම් මේ රිදී කාසිය ගන්නම්" යයි කියමින් මුරකාරයා, රිදී කාසිය ගෙන ගේට්ටුවෙන් පිවිසී ගෘහාභිමුඛව ගමන් කෙළේ, "මනමාලයා! මනමාලයා! මනමාලයා!!" යි මහ හඬින් කෑගසමිනි. මුර කරුවාගේ මේ ක්‍රියාවෙන් කෝපයටත් භීතියටත් ලජ්ජාවටත් පත්වූ වං ලුං වටපිට නොබලා බිම බලාගත්වනම ඔහු පසුපස ගියේ වෙන කිසිවක් කරගත නොහැකිවුන නිසාය.

වං ලුං කිසිකලෙකත් මෙබඳු මහා මන්දිරයකට පැමිණ නැත. ගෙවල් කීපයක් හා මිදුල් කීපයක් පසුකර-ගෙන ගිය ඔහුට සිතුනේ, තමා ගෙවල් හා මිදුල් සිය ගණනක් පසුකර ගෙන ගිය බවකි. දැන් ඔහුට එතැනට පැමිණි පාරවත් මතක නැත. එහෙත් මේ ගමන් කරණ මහ දෙපස වූ මන්දිර වලින් ඇසුන ඉලන්දරින්ගේ කොක් හඬ ද ලමිස්සියන්ගේ ටිකිරි හිනා ද ඔහුට හොඳට මතකය.

මුරකාරයාගේ විහිළු කිරීම නතර වුනේය. ඔහු පසෙක වූ කාමරයක් දෙසට අත දිගුකොට වං ලුං දෙස බැලුවේය. වං ලුං ඒ කාමරයට යද්දී මුරකාරයා ඉදිරියෙහි වූ මහා මන්දිරයට පිවිස මොහොතකින් ආපසු පැමිණියේය.

"අන්න ලොකු නෝනා කතා කරණව."

මුරකාරයාගේ මේ ඇමතීමට වං ලුං කලබල වුනේය. කූඩයත් අතට ගෙනම ඔහු නැගිට්ටේය. එහෙත් මුරකාරයා එය වැළැක්වූයේය :-

"මෝඩය, මෝඩය, සැහෙන කෙනෙක් ළඟට ඔහොම යන්න පුළුවන්ද? මේ කූඩයකුත් ඇරගෙන! කූඩෙත් තියෙන්නෙ හරි ජාති බඩුනෙ! ඌරුමස්! හරක් මස්! ළඹ ඉතින් කොහොමද? ඔය ගෙරි කුනුත් අරගෙන ගිහිල්ල ඒ නෝනට ආචාර කරන්නෙ?"

"ඇත්ත තමා" යයි තරමක් සන්සුන්ව කියූ වං ලුං කූඩයෙහි තිබෙන දේවල් හොරු ගනීවිය යන බියෙන් එය බිම තැබීමට මැලි වූනේය. ඔහු කල්පනා කෙළේ මුළු ලෝකයෙහිම තිබෙන රසවත් ආහාර වර්ගය ඔහුගේ කූඩයෙහි තිබෙන බවත්, ඒවා හොරා ගැනීමට හැමෝම සූදානම් වී සිටිතියි යන්නත්ය. මුරකාරයාට ද ඔහුගේ මේ හැඟුම වැටහුනේය.

''කල්පනා කළා ඔය ඇති ඕකෙ ඔය තියෙන කුනු කන්දල් ගන්න පෙරේතයෙක් මෙහේ නැහැ. ඔය වගේ ආහාර මේ ගෙදර දෙන්නෙ බල්ලන්ට.'' මෙසේ කියූ ගේට්ටුකාරයා කූඩය උදුරා ගෙන කාමරයේ දොර මුල්ලට වීසි කෙළේය.''

''දැන් ඉතින් යමන්! යමන්!!''

වං ලුං, මුරකාරයාත් සමග ගමන් කෙළේ දිග වරණ්ඩයක් දිගේ අලංකාර ශාලාවක් දෙසටය. ඔහු කිසි කලෙකත් මෙබඳු ගෙයකට පැමිණ නැත. තමාගේ ගෙවල් වැනි ගෙවල් සියගණනක් මේ මහා මන්දිරයෙහි දැමිය හැකි යයි වං ලුං ට සිතුනේය. දැන් ඔහුට මේ ගෙය සිහිනයක් වැනිය. මෙහිදී ඔහුගේ දෙනෙත රැඳුනේ වරණ්ඩයෙහි වූ කණුවල කැටයම් වලය. වරණ්ඩය කෙළවර වූ පඩි පෙලෙහි පියගැටයක හැපී වැටෙන්නට ගිය වං යන්තම් එයින් වැළකුනේ ''හා! හා!! මෝඩයා'' යයි කියමින් මුරකාරයා ඉදිරියට පැන අල්ලාගත් හෙයිනි.

ලජ්ජාවෙන් ඉදිරිපස බැලූ වං ලුං ට පියගැට පෙළ පෙනුනේය. මුරකාරයා සමග එහි නගිමින් ශාලාවට පිවිසුන ඔහුට රැජිනක මෙන් වටින අසුනක හිඳගත් මහළු නෝනා කෙනෙකු දක්නට ලැබුනේය. ඇයගේ කුඩා සිරුර විල්ලුද වැනි රෙදි වර්ගයකින් කළ අලංකාර ගවුමකින් සැරසී තිබුනේය. ඇය සමීපයෙහි වූ කුඩා බංකුවක වූයේ ලාම්පුවකින් දැල්වෙමින් තිබුනු ගඩු ගුඩාවකි. ඇගේ තියුණු දෙනෙත වං ලුං දෙසට යොමු වුනේය. වං ලුං ද ඇය හමුවෙහි ඇද වැටී පොළොව මත හිස තබා නමස්කාර කෙළේය.

''මේ මිනිහා නැගිටුවපන්'' යයි අණ කරමින් මහළු නෝනා මුරකාරයා දෙස බලමින් මේ වැඳුම් ඕනෑ කරන්නෙ නැහැ. ඇවිත් ඉන්නෙ අර ගැණි ගෙනියන්න නොවේද''යි ඇසුවාය.

''ඔව් ඔව් නෝන මහත්තයා.''

''එහෙනම් මොකෝ කතා නොකර ඉන්නෙ ?''

''එයා හරි මෝඩයෙක් නෝන මහත්තය.''

වං ලුං මුරකාරයා දෙස කෝපාත්මක බැල්මක් හෙලා තතනමින් කථා කෙළේය.

''අනේ නෝන මහත්තය මම පිටිසර මිනිහෙක් වගක් තුගක් දන්නෙ නැතිව මෙහෙම තැන්වල කතා කරන එක හොඳ නැහැ නෙව.''

Scanned by CamScanner

මහළු නෝනා පරීක්ෂණාත්මක බැල්මක් ඔහු දෙස හෙලා එතෙක් වේලා වහලියක අතෙහි තිබුන ගඩු ගුඩාවේ බටය අතට ගෙන දුම් උගුරක් ඇද්දය. මොහොතකින් ඇයට සියල්ල අමතක වී ගියේය. ඇයගේ ඇසෙහි වූ දීප්තිමත් ගතියද නැතිව එයද පියවී යමින් තිබුනි. යලි දිග නින්දකින් අවදි වූවක මෙන් ඇස් විදහා වං ලූං දෙස බලා ''මොකද මේ මිනිහා මෙතන කරන්නේ'' යයි කෝපයෙන් ඇසුවාය. දුම් උගුරකින් මත්වූ මහළු නෝනාගේ මේ හදිසි වෙනස්වීම මුර කාරයාට අමුත්තක් නොවූයේය. එහෙත් වං ලූං ට එය මහා ප්‍රහේලිකාවකි. කුමක්වුව ද ඔහු යලිත් කතා කෙළේය

''සමා වෙන්න නෝන මහත්තය මම ආවෙ අර කතා කරල තිබුන ගෑණු එක්කෙනා ගෙනියන්න.''

''මොන ගැණියෙක්ද'' යි මහළු නෝනා කියන විට අසල වූ දසියක් ඇයවෙත ලංවී අමතකවූ දෙය මතක් කර දුන්නාය. ''ඔහෝ! මට මේ අමතක වෙලා තිබුනෙ. ඒක සුළු දෙයක්. උඹද මේ ඕලෑං ගෙනියන්න ආ මිනිහ? මට ඔන්න දැනුයි මතක් උනේ. උඹද ඒ ගොවිරාළ''?

''මම තමයි ඒ''

මහළු නෝනා ''ඕලෑං ඉක්මනට කැඳවා ගෙන වරෙන්'' යයි ළඟ සිටි දසියට අණකෙළේ වං ලූං ඉක්මනට පිටත්කොට මේ ගඩු ගුඩාව නිවී සැනසිල්ලේ ඉරීමටය.

ගතවූයේ මොහොතකි. ඒ දසිය පිරිසිදු කළු කබායක් හා කලිසමක් ඇඳගත් තරමක් උස තරුණියක කැටිව ශාලාවට පිවිසියාය. මහළු නෝනා ඇය දෙස බලා යලි වං ලූං දෙසට සියතෙන් යොමු කළාය. වං ලූං ගේ හදවත වේගයෙන් ක්‍රියා කරද්දී මහළු නෝනා මෙසේ කීවාය:-

''මෙහෙ වරෙන් කෙල්ලෙ මෙන්න මොහු තමයි උඹ කැඳවා ගෙන යන්න ඇවිත් ඉන්න මිනිහ.''

ඒ වහල් තරුණිය මේ මොහොතෙහි ඇය හමුවෙහි බිම බලාගත්වනම සිටියේ පිළිරුවක් මෙන්ය.

''දැන් ඉතින් ලෑස්තිද'' යි වහල් තරුණියගෙන් මහළු නෝනා ප්‍රශ්න කළාය. ''ඔව් ලෑස්තියි'' යි ඇය පිළිතුරු දුන්නාය. ප්‍රථම වරට සිය ප්‍රියාවගේ කට හඬට . සවන් යොමු කළ වං ලූං

Scanned by CamScanner

නොඋස් – නොමිටි කඩවසම් ඇයගේ සිරුරට ද පැහඳුනේය. එහෙත් චීනයේ චාරිත්‍රානුකූලව ඇයගේ පා නොවෙළා තිබුනු හෙයින් ඔහුගේ බලාපොරොත්තු කඩ කෙළේය. ඒ පිළිබඳව වැඩි දුරටත් කල්පනා කිරීමට ඔහුට කාලයක් නොතිබුනේ සැණෙකින් මහළු නෝනා මුරකාරයාට ඇමතූ හෙයිනි.

''මේ කෙල්ලගෙ පෙට්ටිය අර ගේට්ටුව ළඟට යනකං ගිහින් දීපන්. කෝ! මෙහෙ වරෙන් වං ලූං මේ ගෑණි අපේ ගෙදරට ආවේ අවුරුදු අටක තරම් වයස ඇති කාලයකයි. දැන් ඇගේ වයස විස්සයි. මේ කාලය තුල හිටියෙ මෙහේමයි. මම ඇය සල්ලි දීල ගත්තෙ මහා සාගත කාලෙක. 'ෂංටුං' නගරයෙන් පැමිණි මැගේ මව්පියවරු මැය මට විකුණල මුදල් ටිකක් ලබාගෙන ගියා. ඇයට ශක්තිමත් කයක් තිබෙනවා. ඇය උඹේ ගොවිතැන් වැඩට උපකාර කරාවි, උඹට කීකරුවත් ඉඳීවි. වරදකට තිබෙන්නෙ ලස්සන නැති එක තමයි. ඒ උනාට උඹේ හැටියට ඇය හොඳටම කැපෙනව. ලස්සන ගෑණු ඕන කරන්නෙ හොඳට කාල බීල විවේකයෙන් ඉන්න මිනි–සුන්ට. ඇය ටිකක් මෝඩයි. ඒ උනාට ඕන වැඩක් කියල කර ගන්න පුළුවන්. ඇයට තරහ නං යන්නෙ නැහැ. මම දන්න හැටියට ඇය තවම තරුණියක්. මේ ගෙදර ඉන්න මගේ පුත්‍රයන් මුනුබුරන් අවනත කර ගැනීමට තරම් හැඩ තිලකුත් ඇයට නැහැ නොවැ. ඉතින් යමක් එහෙම උනානම් ඔය වැඩකාරයන්ගෙන් වෙන්න ඕන. ඒත් එහෙම එකක් වෙන්න ඇතෙයි කියල නම් හිතන්න බැහැ. මේ ගෙදර ලස්සන වැඩකාරියො කොච්චරවත් නිදහස් ලෙස ඉන්නව. ඒක නිසා ඇය එක්කරගෙන පලයන්.''

''ඇය හොඳම වහලියක්. මම නම් කැමතියි, ඈ සැමදම මෙහේ වැඩට ඉන්නව නම්. ඒ උනාට මගේ සිරිත තියෙන්නෙ උන්ගෙත් කල දසාව යන විදියට වැඩ කරන එකයි.''

''ඕලෑං ඔන්න හොඳට මතක තියා ගනින් මේ මිනිහට කීකරු වෙලා ඉන්න. උඹ මේ මිනිහට කීකරු දූ පුතුන් ඇති කරන්න ඕන. ඔන්න නොකිව්වයි කියන්න. එපා ඉස්සෙල්ලම උඹට ලැබෙන ළමය මට ගෙනත් පෙන්වන්න ඕනැ.''

මහළු නෝනාගේ මේ දීර්ඝ දේශනය අවසන් වූයේ ඕලෑංගේ ''හොඳමයි'' යන සිහින් හඬිනි.

මේ නව යුවළ එතැන බොහෝ වේලාවක් බලාගත්වනම

සිටියහ. මී ලඟට කළයුතු කුමක් දැයි ඔව්හු නොදත්හ. වං ලුං යළිත් කලබලයට පත්වුනේය. කියයුතු කිසිවක් හෝ කළයුතු දෙයක් ඔහු නොදත්තේය. ''ඉතින් මෙතන බලාගෙන ඉන්නෙ පලයල්ලා'' යි මහළු නෝනා කී විට වං ලුං ගමනට සැරසුනේ මහළු නෝනාට ආචාර කරමිනි. ඔහුගේ බිරිය ඔහු පසුපස ගමන් කරද්දී ඇයට පසුපස ගමන් කෙළේ ඇයගේ පෙට්ටිය කර ගසා ගත් මුර කාරයාය. මහළු නෝනා හමුවීමට යද්දී නතර වී සිටි කාමරයෙහි දමාගිය කුඩය සෙවීමට වං ලුං ගිය අතර මුර කාරයා පෙට්ටිය ද එතැන දමා පැන ගියේය.

වං ලුං කුඩයත් රැගෙන ආපසු හැරී එන ගමන් පළමුවරට නිදහස්ව ඇය දෙස බැලුවේය. එවිටය ඔහුට පෙනුනේ ඇගේ හතරැස් මුහුණත්, පළල් නාසයත්. ශොකාත්මක බවත් අවංක බවත් ගැබ් වී තිබුන ඇගේ මුහුණෙහි තියුණු කැපුමක් මෙන්ය, ඇගේ මුඛය ඔහුට පෙනුනේ. එතෙක් නිහඬව සිටි ඕලෑං, වං ලුංගේ බැල්මෙන් කලබලයකට පත් නො වූවාය. ඇගේ දුඹුරුවන් ඉවසිලිමත් මුහුණෙහි සුන්දරත්වයක් නොමැති බව දූන් වං ලුංට පැහැදිලිය. එහෙත් ඇගේ ගතෙහි නොකැලල් බව ඔහුට සැනසිල්ලක් ගෙන දුනි. මේ සැනසිල්ල ඔහු තුළ තව තවත් වැඩිවුනේ ඇගේ නොපැලුන තොල්ද, ඇගේ කණෙහි තම පියා විසින් දුන් රත්රන් ගෑ තෝඩු යුගලය ද ඇගේ ඇඟිලි වල තම පියා විසින් දුන් මුදු ද තිබෙනු දුටු විටය. මෙසේ ඔහු රහස් ආස්වාදයක් ලැබූවෙකු මෙන් යලි අහක බලාගත්තේ ''මට මගේ ම භාර්යාවක් සිටින එක කොච්චර හොඳ ද'' යන හැඟුමද ඇතිවය.

''මේ කුඩෙයි, පෙට්ටියයි,'' වං ලුං රළුහඬින් කියන විට මුවෙන් බසකුදු නො තෙපලූ ඇය පහත්වී පෙට්ටියේ කොනක් කරට ගත්තාය. පෙට්ටියේ බරින් මිරිකුණු ඇය යලි නැගිටින්ට සැරසුනේ මහත් ආයාසය කිනි. ඔහු, එදෙස බලාගෙන සිටියේ ''මම, මම ගන්නම් පෙට්ටිය, මෙන්න කුඩය''යි හදිස්සියෙන්ම පැවසුවේය. ඉන්පසු ඔහු තම කරෙහි වූ හොඳම සළුව ගැනවත් කිසිත් සැලකිල්ලක් නොකට සිය බිරියගේ කරින්, ඒ බර පෙට්ටිය තම කරට ගත්තේය. දූන් කුඩය, එතෙක් නිසලව සිටි ඇයගේ අතෙහිය. මෙතරම බරක් කරගසාගෙන මේ මහා මැඳුරෙහි

Scanned by CamScanner

මිදුල් සියගනන් පසුකර යන්නේ කෙසේ දැයි කල්පනා කළ වං ලුං "කිට්ටුපාරක් වත් තියෙනව නම්........" යි තොල් මතුළේය. ඔහුගේ වචන නොතේරුණාක් මෙන් මඳ වේලාවක් නිහඬව කල්පනා කරමින් සිටි ඇය, ඉක්බිතිව හුහ කලකින් ගමන් බිමන් නොකළ, වල් පැලැටිවලින් ගහණවුන, ගෙමිදුලක් මැදින් වැටුන පටුපාරකින් ගමන් ගත්තාය. ඔහු ද ඇය අනුගමනය කෙළේය. මඳ වේලාවක් මෙසේ ගමන් කළ මේ නව දෙමහල්ලෝ "පයින්" ගසක් යට වූ කබල් ගේට්ටුවක් වෙත පැමිණ නතරවූහ. මොහොතකින් ඇය ගේට්ටුව විවෘත කළාය. ඔවුන් වීථියට බැසගත්තේ එතැනින්ය.

වං ලුං තමා ඉදිරියෙන් ගමන් කළ ඇය දෙස වරක් දෙකක් බැලුවේය. නො නැවතී ගමන් කළ ඇගේ පළල් පා දෙස බලා ඔහු සිතුවේ ඇය සුපුරුදු ගමන් කාරියක බවය. එහෙත් ඇයගේ පළල් මුහුණෙහි කිසිම හැඟුමක් ඔහුට දක්නට නොලැබුනි. මෙසේ සිය නව බිරිය සමග ගමන් කළ වං ලුං නගරයට පිවිසෙන දෙරටුව ලඟ නතර වී එක් අතකින් කරගසා ගෙන සිටි පෙට්ටිය රඳවාගෙන අනිත් අතින් ඉතිරි පැන්ස කාසි ටික සොයන්නට ඉණබැඳි පටිය අත ගෑවේය. අනතුරුව එයින් ඇදගත් පැන්ස දෙකකට ඔහු ගත්තේ නිල්පාට ඇටඹ ගෙඩි සයකි.

"මේ ඇටඹ කාපන්කො"යි ඔහු රළුහඬින් කියන විට ඇය පොඩි දරුවෙකු මෙන් ඒවා අතට ගත්තේ කෑදර ලෙසය. තිරිඟු කුඹුරු මැදින් වැටුනු අඩිපාරට පිවිස ගමන් කරන විට නැවතත් ඇය දෙස බැලූ ඔහුට පෙනුනේ "ඇය, පරෙස්සමින්, ඇටඹ වල රස විඳින හැටිය." එහෙත් ඇය, තමා ඔහුගේ දෘෂ්ඨියට ලක්වන බව දුටු විට, අතින් කටවසාගෙන දෙතොල නොසොල්වා ගමන් කළාය.

මෙසේ මේ දෙමහල්ලන් ඒ කුඹුරු මැදින් ගමන් කොට බටහිර දෙසට හැරුනේ "භූමි දේවතාවාගේ දෙවොළට" ද යන අදහසිනි. දුඹුරුවන් ගඩොලින් ගොඩ නැගුන මේ කුඩා දෙවොළ මිනිස් රූපයක් තරම් උස් වූවකි. මෙහි වහළෙහි සෙවිළිකොට තිබුනේ උළුය. මේ දෙවොළ වං ලුංගේ සීයා විසින් ගොඩ නංවන ලද්දකි. මෙහි බිත්තිවල ඇතුල්පැත්තෙහි බදම ගා තිබුනි.

Scanned by CamScanner

එක් සරු සාර සමයෙක මේ බදම මත, ගැමි සිත්තරෙකු විසින් කඳු හා උණ පඳුරු කීපයක දර්ශන ඇඳ තිබුනේ වං ලූං ගේ සීයාගේම නියමයෙනි. එහෙත් පරම්පරා කීපයක සිට වැහිපොදට ගොදුරුවූ මේ බිත්තිවල දැන් දක්නට ලැබෙන්නේ ඒ චිත්‍ර වලින් ඉතිරිවූන කුඩා රේඛා තුනක් පමණකි. එහි ඇඳ තිබුන කඳුවල දර්ශන මැකී ගොස්ය.

දෙවොලෙහි වහලින් ආවරණය ලැබුවේ එක ලඟින්ම හිඳගත් මැටි පිළිම දෙකකි. මේ රූප දෙක අඹා තිබුනේ වං ලූං ගේම කුඹුරෙහි මැටිවලිනි. බිමෙහි සරු බව රකින දෙවියා හා එම දෙවියාගේ බිරිය මේ රූ දෙකින් පිළිබිඹු විය. රතු හා රත්රන් ගෑ කරදසිවලින් සෑදූ ඇඳුම් මේ දෙව් රූ දෙකට අන්දවා තිබුනි. දෙවියාට හිස කෙස්වලින් සෑදූ කුඩා උඩුරැවුලක් තිබුනි. අවුරුදු පතා වැසි පොදිනුත් හිමපතනයෙනුත් ගිම්හානයේ සූර්ය තාපයෙනුත් මේ ඇඳුම් විනාශවී යන නිසා සෑම අළුත් අවුරුදු දිනයකම මේ දෙව් රූ දෙකට රතු කරදසිවලින් මැසූ අලුත් ඇඳුම් ඇන්දවීම, වං ලූං ගේ පියාට අමතක නොවූවකි.

වං ලූං සිය නව බිරියත් සමග දෙවොළට ගියේ අළුත් අවුරුද්ද ගෙවී ගිය ලඟදී ය. එහෙයින් දෙව් රූ දෙකට අන්දවා තිබුන නව වස්ත්‍ර දුටු ඔහුට ඇතිවූනේ සාඩම්බර හැඟීමකි. සිය බිරියගේ අතින් කුඩය ගත් ඔහු එහි බහා තිබුන උරුමස්වලට යටින් පරෙස්සමින් සෙව්වේ තමා විසින් මිලයට ගන්නා ලද සඳුන් කූරුය. කුඩයෙහි වූ සෙසු කුළු බඩු පොදිවලට යට වී ඒ සඳුන් කූරු පොඩිපට්ටම් වී ඇතැයි ඔහු බියවූනේ එය එසේ වූව හොත් අසුබ ලකුණක් ද වන හෙයිනි. නොතැලී තිබුන ඒ සඳුන් කූරු දැක පැහැදුන ඔහු, ඒවා ගැසුවේ, මුළු ගමම මේ දෙවොළට පුද පූජා පවත්වන බව පවසන්නාක් මෙන් එහි පසෙකින් තිබුන සඳුන් කූරු අළු ගොඩෙහිය.

ඔහු ඒ සඳුන් කූරු දල්වූයේ තම පසුම්බියෙහි වූ ගිනිගලින් නිපදවූ ගිනි, පරඩලකට දල්වාගෙනය. මෙසේ සඳුන්කූරු දල් වෙද්දී ඒ දෙමහල්ලෝ ගොවිතැන් සරුසාර කිරීමේ වරම ලැබූ දෙවියන් හමුයෙහි නැගී සිටියහ. වං ලූං ගේ බිරිය, දල්වෙන සඳුන්කූරෙහි ඇතිවූන දල්ල සිය දබරඟිල්ලෙන් තඩා දමමින් බියවූ දෙනෙතින් යුතුව වං ලූං දෙස බැලුවාය. ඔහු ඇගේ මුහුණ

ගැන පැහැදුනේය. ඇගේ ක්‍රියාව ඔහුට ප්‍රීතිදයක වූයේ සඳුන් කූරෙහි අයිතිය දෙදෙනාටම අයත් බව එයින් පැවසුන හෙයිනි. ඒ, ඔවුන්ගේ විවාහයේ ඉතාම වැදගත් මොහොත බව ඒ දෙමහල්ලෝ දත්හ. තමන් ගැසූ ඒ සඳුන්කූරු අළුබවට පත්වන තෙක් ඒ දෙදෙනා එකිනෙකාට ලංව එහි නිසලව සිටියහ.

හිරු බැස යන්නට ලංවෙත්ම වං ලුං පෙට්ටිය කරට ගෙන යලි ගමන් ඇරඹුවේය. ඇයද කූඩය අතටගෙන ඔහු අනුගමනය කළාය.

මහළු පියා සැඳෑ හිරුරැස් පහස ලබමින් ගෙමිදුලෙහි සිටියේය. බිරියක ද කැටුව සිය ගෙමිදුලට පා තබන පුත්‍රයා ඇතදීම දුටුව ද ඔහු ඇයදෙස බැලීම වෙනුවට අහස දෙස බැලුවේ වුවමනාවට වඩා ඇය ගැන සැලකීම තමාට මදිකමක් වෙතැයි සිතූ නිසාය. අහසේ පාවුන වලාකුල් දෙස ඉතා ඕනෑ කමින් බලමින් ඔහු මෙසේද කීවේය.

''අර අළුත් හඳේ වම් පැත්තෙ තියෙන වලාකුල් තමයි වැස්ස අරගෙන එන්නෙ. හෙට රෑට වහින බව නම් සහතිකයි.''

මේ අතර ගෙට ගොඩවුන වං ලුං සියබිරිය අතින් කූඩය ගණිත්ම ''ඒ බාං උඹ සල්ලිත් වියදම් කළාද''යි මහල්ලා ඇසුවේය.

වං ලුං ද කූඩය මේසය මත තබමින් ''අද රෑ කෑමට අමුත්තන් කීපදෙනෙක් එනවා''යයි කොටින් කීවේය. මෙසේ කියා සිය බිරියගේ පෙට්ටිය තම කාමරයට ගෙනගොස් තමාගේ ඇඳුම් දමන පෙට්ටිය ලඟින්ම තබා ඔහු ඒ දෙස විශ්මයෙන් බලා සිටිත්ම දෙරලඟට පැමිණි මහල්ලා ''මෙහෙමත් නාස්තිකාරයෙක්! මේ විදියට සල්ලි නාස්තිකරන්නෙ මොන එහෙකටද''යි කිව්වේ මහ හඬිනි. මෙසේ සිය පුතා විසින් අමුත්තන් කැඳවීම මහල්ලාට ප්‍රීතියකි. එහෙත් ඔහු කන්කෙඳිරි ගාන්නටවූයේ තම අළුත් ලේලිය ගෙදරට පැමිණි දිනයේ පටන් අරපරෙස්සමක් නැතිව වියදම් කරන්නට පෙළඹේය යන භීතිය නිසාය.

වං ලුං කිසිත් නොකියා කූඩයද රැගෙන කුස්සියට යද්දී ඇයද ඔහු පසුපස ගියාය. ඔහු කූඩයෙන් කෑමවර්ග එකින් එක ගෙන උදුන පසෙකින් තැබුවේය.

''මෙන්න ඌරුමස්, මෙන්න හරක් මස්, මෙන්න දූන්තෙල්,

Scanned by CamScanner

රෑ කෑමට හත්දෙනෙක් එනව. උඹට පුළුවන්ද ඕලෑං, කෑම උයන්න? ය''යි වං ලුං ඇයදෙස නොබලාම ඇසුවේ ''ඇය දෙස බැලීම'' නුසුදුසු යයි සැලකූ නිසාය.

''මම ''හ්වෑං ගෙදර'' කුස්සියෙ තමයි වැඩකෙළේ. එහේ හැම කෑමකටම මස් තියෙනවා''යයි ඇය සිහින් හඩින් කියූ විට වං ලුං හිස වනා ඉවත්ව ගියේය. ඉන්පසු අමුත්තන් පැමිණෙන තෙක්ම ඔහුට ඇය නොපෙනුනි.

තමාට නිතර කවට කම් කරණ කෑදර බාප්පාද, පසළොස් හැවිරිදි ඔහුගේ පුතාද ගොයම් වැඩ කාලයේ තමාට උදව්දෙන ගොයිරාල කෙනෙක්ද තම මිත්‍ර අසල්වැසි චිං ද මේ අමුත්තන් අතරවූහ. කුඩා සිරුරක් ඇති චිං නිශ්ශබ්ද මිනිසෙකි.

රෑ කෑමට වේලාව පැමිණෙත්ම ඒ අමුත්තෝ තොල්මතුරමින් එකිනෙකාට රහස් කියා ගනිමින් ආචාර ශීලීව මැද කාමරයේ අසුන් ගත්හ. ඉන්පසුවය වං ලුං යළිත් කුස්සියට ගොස්, කෑම ගෙනත් තබන මෙන් බිරියට කිව්වේ.

''මම ඔයාට මේ දීසි දෙන්නම්. ඔයා ඒව අරගෙන මේසය උඩ තියන්න. මට බැහැ මිනිසුන් ඉදිරියට යන්න''යි ඇය කියූ විට වං ලුං ප්‍රීතියට පත්වුනේ ''ඇය අනිත් මිනිසුන් ඉදිරියට යන්නට අකමැති නමුත් තමා ඉදිරියෙහි ඉන්නට අකමැත්තක් නැතැ''යි සිතූ නිසාය.

ඉක්බිති ඔහු කුස්සියේ දෙරළඟදී ඇයගේ අතින් ඒ දීසි ගෙන මේසය මත තබා කෑම කන්නට අමුත්තන්ට ආරාධනා කෙළේය. මේ අතර කවට කමෙහි නියැලී ඔහුගේ බාප්පා ''ඇයි අපට මනමාලිය පෙන්වන්නෙ නැද්ද''යි ඇසූ විට ''අපි තවම එකට එකතු වුනේ නැහැ. විවාහයේ කටයුතු අවසන් කරන තුරු ඇය පිට මිනිසුන් විසින් බැලීම හරි නැතැ''යි වං ලුං කීවේය. මෙසේ කියා ඔහු, කෑම කෑමට අමුත්තන්ට පෙරැත්ත කෙළේය. පෙරැත්ත කරනු ලැබූ ඔවුන් ආහාර අනුභව කෙළේ එහි පිළියෙළකොට තිබූන මාළු ගැනද ඌරුමස් ගැනද ප්‍රසංසා කරමිනි. එහෙත් වං ලුං පුන පුනා කිව්වේ ''නැහැ නැහැ මේ කෑම ජාතිත් හරිනැහැ. ඒ මදිවට මේව උයල තියන හැටිත් හරි නැතැ''යි යන වචනයි.

ඇත්ත. වසයෙන් වං ලුං මේ කෑම ගැන යටිහිතින් ප්‍රීතිවුනේ, විනාකිරි, වැයින්, නොයෙක් කුළුබඩුවර්ග යොද ඒවා පිළියෙළ කර

Scanned by CamScanner

තිබුනු හෙයිනි. වං ලුං වත් ඔහුගේ මිතුරෝවත් මෙවැනි කැමවර්ග මෙයට පෙර රස බැලුවෝ නොවූහ. එදින රෑ බොහෝ වේලාවක් මේ අමුත්තන් තේ බොමින් කවටකම් කරමින් කල් ගෙවද්දී වං ලුං බිරිය කුස්සියෙහිම සිටියාය.

අන්තිම අමුත්තාද ගෙයින් පිටව ගියපසු වං ලුං ඇයබලන්නට ගියේය. ඇය ගොනාට දැමූ පිදුරු මත ගුලිගැසී නිදසිටින අයුරු ඔහුට පෙනුනේය. ඔහු දැතින් අල්ලා ඇය නැගිටුවන විට, ඇය නින්දෙන්ම පහරක් වළක්වන්නට මෙන් තම අත එසෙව්වාය. එහෙත් අන්තිමේදී ඇය ස්වාභාවිකව ඔහු දෙස බලන විට ඔහුට දැනුනේ කුඩා දරුවෙකු තමාදෙස බලන්නාක් මෙන්ය.

ඔහු අතින් අල්වාගෙන ඇය කැඳවාගෙන ගියේ, ඇය වෙනුවෙන්ම එදින උදයෙහි තමන් ජලස්නානය කළ කාමරයටය. කාමරයට පිවිසුන විගස ඔහු එහි මේසය මත රතු ඉටිපන්දමක් දල්ලුවේය. මේ ඉටිපන්දම් එළියෙන් කාමරය ආලොකවත්වුන විට වං ලුං ට ලජ්ජාවක්ද භීතියක්ද ඇතිවුනේ ''මහ රැයක හුදකලාව ගැහැනියක සමග තමන් සිටිනු'' දුටුවිටය.

''මේ මගේ බිරිය ය''යි සිතත්ම ඔහු තුළ ඇතිවුන ඒ ලජ්ජාවද භීතියද පැනගියේය. ඔහු සෙමින් ඇඳුම් ලිහා තබන්ට පටන් ගත් විට ඇය ඇඳෙහි තිරයෙන් ඔබ්බට ගොස් ශබ්ද නගමින් නිදන්නට පිළියෙළ වුනාය.

''උඹ නිදගන්නකොට ඔය ඉටිපන්දම නිවාදමාපන්''යයි රළු ලෙස කියූ වං ලුං ඇඳෙහි වැතිරී ඝන පොරෝනයක්ද පොරවා ගෙන නිදන බවක් පළ කළේය. ඇත්තෙන්ම ඔහු නිදගත්තේ නැත. ඔහු ගැහි ගැහී ඇඳෙහි වැතිරී සිටිද්දී ඔහුගේ සෑම මස් ගොබ යක්ම පුබුදුවී තිබුනි. බොහෝවේලාවකට පසු එළිය නිවීගියේය. කාමරය අඳුරුවුනේය. බිරියද සෙමින් සෙමින් තමා සමීපයට ඇඳෙන බව ඔහුට දැනුනේය. සියගත දෙදරවන තරම් ආස්වාදයකින් මිරිකී සිටි ඔහු අඳුරට රළු සිනහවක් පා ඇය වැළඳ ගත්තේය.

Scanned by CamScanner



ජීවිතයෙහි මේ සැපත ඔවුන්ට මෙසේ ලැබුණි. ඔහු පසුදින උදයෙහි ඇඳෙහි දිගාවී ගතවුන රැයෙහි තමාට සම්පූර්ණයෙන්ම අයත්වුන බිරිය* දෙස බැලුවේය. ඇයද නිදිගැට හැර ඇඳෙහි පෙරලුනේ නින්දෙහි දී එහේ මෙහේ වී ගිය ඇඳුම් හරි බරි ගස්සා ගැනීමටය. ඇඳෙන් බිමට බට ඇය රෙදි වලින් සැදූ පාවහන් සිය පා වල දමා රෙදි පටි වලින් තද කර ගත්තාය.

මේ අතර, කවුළුවෙන් එබුන හිරු එළිය ඇගේ මුහුණට පතිත වුනි. අඳුරෙහිම සිටි ඔහු ඒ හිරුරැස් දහර අනුව ඇගේ මුහුණ බලා මවිතයට පත්වුනේ, ගතවුන රැයෙහි තමාගේ වෙනසක් ඇතිවුන බව තමාට දැනුනත්, ඇයගේ වෙනසක් ඇතිවුන බවක් ඇයගේ මුහුණෙන් නම් දැනගත නොහැකිවුන නිසාය. ඔහුට පැහැදිලිව පෙනුනේ වෙනද උදයකමෙන්ම මෙදින උදයෙහි ද අමුත්තක් නොමැතිව ඇය පිබිදී සිටින බව පමණකි.

අඳුරු හිමිදිරියේ ම මහළු පියාගේ කැස්ස අඳෝනාවක් මෙන් ඇසෙන්නට වුනි. වං ලුං සිය බිරියට ඇමතුවේය.

''මේ ඇහුනද, තාත්තට දැන් ඉස්සෙල්ල ගෙනත් දෙන්න ඕන බොන්න උණුවතුර ටිකක්.''

''ඒකට තේ කොලත් දන්නද''යි ඇය ඇසුවේ තමාගේ ස්වරූපය මෙන්ම හඬ ද ගතවුන රැයෙහි වෙනස් නොවූයේ යයි හඟවන්නට මෙන්ය.

ඇයගේ මේ ප්‍රශ්නයෙන් ඔහු කලබල වුනේය. ''ඇත්තෙන්ම තේ කොල දන්න ඕන. උඹ හිතන්නෙ අපි හිඟන්නො කියලද''යි

කීමට ඔහුට වුවමනා වුනේ "ග්වෑං" මැදුරෙහි සෑම දසියක්ම නිකං උණුවතුර නොබොන බව ඔහු දන්නා නිසාය. එහෙත් ඔහු එසේ නොකීවේ "මහල්ලාට තේ ගෙන ගියහොත් ඇයට මහල්ලා තර්ජනය කරති" යි සිතමිනි. උදෑසන තේ බීමට තරම් පොහොසත් කමක්ද නැති ඔහු ඉවසිලිමත්ව ඇයට පිළිතුරු දුන්නේය.

"තේ, එපා! එපා! තේ වලින් එයාගෙ කැස්ස වැඩි වෙනව."

ඉන්පසු භාර්යාව කුස්සියට ගොස් ලිප ගිනි මොලවා වතුර උණු කරද්දී ඔහු ඇඳෙහි උණුසුම්ව දිගාවී සිටියේය. දහවල් වෙනකල් ඔහුට නිදගැනීමට පුළුවන් වුවත් දිනපතා උදෑසන පිබිදුන ඔහු මේ උදයෙහිද පිබිදී ඇඳ උඩ දිගාවී කල්පනා කෙළේ තම භාර්යාව ගැන නොවේ; ඔහුට ඇය ගැන සිතනවිට ඇතිවුනේ ලජ්ජාවකි. එහෙයින් මොහොතක් ඇය අමතක කොට කල්පනාකෙළේ සිය කුඹුරු ගැනය, වැසි වැස්සොත් තමාට ලැබෙන අස්වැන්න ගැනය ලාභයට ලැබුනොත් තම මිත්‍ර ව්ං ගෙන් ගැනීමට සිතා සිටින අළුත් රාබු ඇට ගැනය. මේ සිතිවිලි අතර තමන් ඇරඹූ නව දිවිය ගැනද අදහස් පහළ වුනේය.

ගතවුන රැය සිහිවුන ඔහුට "ඇය තමාට කැමතිද?" යන්න ප්‍රශ්නයක් වූයේය. මෙය අළුත් දෙයකි. කලින් ඔහු ප්‍රශ්න කළේ "තමා ඇයට කැමති ද?" යන්නය. ඇගේ මුහුණ වාං වුවත්, ඇගේ අල්ල ඝන වුවත්, ඇගේ පුෂ්ටිමත් සිරුරෙහි පහස සිනිඳුය, නොයිඳුල්ය. ඒ බව සිහි කළ ඔහු ගත වුන රැයෙහි අඳුරට පහළ කළ සිනහව යළි යළිත් පහළ කරමින් "ඒ රදළ තරුණයන්ට ඇගේ වටිනකම පෙනිල නැහැ. ඔවුන්ට පෙනිල තියෙන්නෙ ඇගේ මුහුණෙ වාංකම විතරයි. ඇගේ රවුම් සිරුරෙහි පහස හරිම හොඳ" යයි සිතනවිට ලජ්ජාවක්ද ඇතිවුනේ කාමරයෙහි දොර විවෘතවුන නිසාය.

දුම් දමන උණුවතුර භාජනයක්ද අතැතිව ඕලෑං ඔහුගේ ඇඳ වෙත නිසසලව පැමිණියාය. ඔහු ඇඳෙහි වාඩිවී වතුර භාජනය අතට ගත්තේය. තේ භාජනය මතු පිට පාවුන තේ කැලි දෙස වහා බැලුමක් හෙලා ඇය දෙසද ඔහු දෙනෙත යොමු කෙළේය.

"මම ඔන්න කිව්ව නිසා තාත්තට තේ ගෙනිච්චෙ නැහැ. ඒ උනත් ඔයාට......" යයි බියෙන් මෙන් ඇය කියන විට තමාට ඇය තුළ බියක් ඇති බවද ඔහු වටහාගත්තේ එයින් තුටුපහටු වුනේය.

Scanned by CamScanner

''ඔව් බොහොම හොඳයි. මම ඒකට කැමතිය''යි කියමින් ප්‍රීතිමත්ව තේ උගුරු අදින්නට පටන් ගත්තේය.

''මේ ගැහැණිය මට කැමතිය'' යන අළුත් ආස්වාදය ඔහුගේ හදවතින් පැන නැංගේ මීන් පසුවය.

මෙයින් පසු ගතවී ගිය මාස කීපය තුළම ඔහුට දැනුනේ තමා බිරිය දෙසම බලා සිටීම විනා වෙන කිසිම වැඩක් පලක් නොකරණ බවය. එහෙත් ඇත්ත වසයෙන්ම මේ දිනවලද – මේ මාසවලද ඔහු වෙනද මෙන්ම වැඩ කෙළේය.

ඔහු උදැල්ල කර තබාගෙණ ගොස්, තම ඉඩම් සකස් කොට ධාන්‍ය වැපුරුවේය. ගොණා නගුලෙහි බැඳ බස්නාහිර පැත්තෙහි ඉඩම් හා දමා ලූනු හා සුදු ලූනු වගා කෙළේය. මෙසේ ඔහු ක්ෂිතිජයේ හිරු ගිලෙන තෙක්ම වැඩ කෙළේ වැඩ කිරීම ඔහුට සැපතක් වූ නිසාය.

පෙර දිනවල නම් සවස් කාලයේ කුඹුරෙන් ගෙදර පැමිණිවිට කුස්සියේ කටයුතු ද ඔහුට පැවරුනි. මහල්ලාට කලින් බඩගිනිවී යමක් පිළියෙළ කර තිබුන දිනයක පමණකි ඔහුට සන්ධ්‍යාකාලයෙහි ද විවේකයක් ලැබුනේ. එහෙත් ඒ කරදරය දැන් ඔහුට නැත. කුඹුරෙන් ගෙදර පැමිණි විගස, බඳුන් හා උණ කෝටු තැන්පත් කොට කෑම පිළියෙළ කර තිබෙන ඒ පිරිසිදු මේසය ළඟ පුටුවෙහි වාඩිවී, කෑම කන්ට දැන් ඔහුට පුළුවන.

ඔහු කුඹුරෙහිදී ඇතිවුන විඩාව සංසිඳුවා ගත්තේ අතුපතු ගා තිබෙන ගෙබිම ද ගොඩගසා තිබෙන දර ගොඩ ද දැකීමෙනි. සෑම උදයකම වං ලූං ගෙයින් පිටවී ගියාට පසු උණගසක් හා කඹකැල්ලක් ගත් ඕලෑං එහා මෙහා ඇවිද රෑ කෑම පිසන්නට සෑහෙන පමණ දර ද රැගෙන දහවල් ගෙදර එන්නීය. වං ලූං එයින් සතුටට පත්වුනේ එවක් පටන් ඔහුගෙන් දර සඳහා මුදලක් වියදම් නොවූ නිසාය.

සවස්වරුවෙහි මේ ගැහැණිය, උදැල්ලත් කූඩයත් රැගෙන නගරය බලා වැටුන මහපාර වෙත යයි. ඒ මහ මාවතෙහි අශ්වයෝද බූරුවෝද නිතර බර අදිමින් එහා මෙහා ගමන් කරති. ඕලෑං මේ සතුන්ගේ ගොම එකතු කොට ගෙදරට ගෙණවුත් සිය කුඹුරුවලට පොහොර සාද ගණියි. දවසෙහි කළයුතු සියළුම දෛනික කටයුතු නිමවා රෑයෙහි ඇය නින්දට ගියේ ද ගොණාට තණ කවා වතුරද බොන්නට දීමෙන් පසුවය. කිසිවෙකුගේ අණක් නොලබා ඇය මේ සෑම වැඩක්ම කෙළේ මුවෙන් බසකුදු නොතෙපලමිනි.

Scanned by CamScanner

කුස්සියෙහි ද කුඹුරෙහි ද කළයුතු කටයුතු නිමවූ පසු ගෙදර දොරේ ඇති වෙනත් කුඩුමහත් කටයුතුවලද ඇය යෙදෙයි. උණ පතුරක ආධාරයෙන් නූල් කැට, ඇය තමන්ගේ ඉරුණු ඇඳුම් මසා ගනියි, සීත කාලයේ පාවිච්චි කරණ ඇඳුම්වල ඉරුණු තැන් එලලා ගනියි, කොට්ට මෙට්ට අව්වට දමා කිලිටු කොට්ට උර සෝද නිතර පිරිසිදු ලෙස තබා ගනියි. එහි එක ද මකුණෙකුට වත් ලැගුම් ගැණීමට ඇය ඉඩ නොදෙයි. මෙසේ ඇය දිනපතාම මේ ගෙයි කාමර තුන පිරිසිදු කරයි. එහි ප්‍රතිඵලයක් වසයෙන් ගෙහි දර්ශනය ද සිත් ගන්නා සුලුවිය, මහල්ලාගේ කැස්සද සුව වුනේය. එතැන් පටන් ඒ මහල්ලා ගෙයි දකුණු බිත්තිය සමීපයට වී නිද වැටි වැටී අව්ව තපිමින් ප්‍රීතියෙන් කාලය ගත කෙළේය.

ඕලෑංගේ නිසල බව වං ලුං තුළ ගුප්ත හැඟුම් බහුලවීමට හේතුවක් විය. ඇය කතා කෙළේ අත්‍යවශ්‍ය දෙයක් පමණකි. කාමරයේ එහා මෙහා ඇවිදින ඇගේ පළල් පා දෙසත්, ඇගේ හැඟීම් විරහිත ගුප්ත මුහුණ දෙසත්, ඇගේ බිය රැඳි දෙනෙත දෙසත් වං ලුං නිතර නිතර බැලුවත් ඔහුට ඇය තේරුම් ගත හැකි නොවිය. ඇත්ත වසයෙන්ම ඔහු ඇය පිළිබඳව මෙතෙක් දැනගෙන සිටින්නේ රැයෙහි ලබන ඇගේ සිනිඳු පහස පමණකි. එය ද ඔහුට දවල් කාලයෙහි අමතකවී යන්නේ ''වාම නිල්වන් දළ කබායකිනුත් කලිසමකිනුත් ඇගේ කෝමල ගත ඇය විසින් වසාගෙන සිටිනු'' දකින හෙයිනි.

නිහඬ සේවිකාවක මෙන් ගෙදර දොරේ කටයුතු කළ ඇයගෙන් ''උඹ කතානොකරන්නේ ඇයිද''යි ඇසීමට ඔහු අපොහොසත්වුනේ ඇගෙන් ඉටුවියයුතු කටයුතු අඩුවක් නොමැතිව ඉටුවුන නිසාය.

ඇතැම් දිනයක, කුඹුරේ වැඩ කරන විටද වං ලුං ට ඇය ගැන කල්පනා වෙයි. ''ඒ පොහොසත් ගෙදරදී ඇය කුමක් කරන්ට ඇත්ද? එහි ගතකළ ඇගේ ජීවිතය කෙබඳු එකක් වීද?'' යන ආදී වසයෙන් කල්පනා කරමින් ඔහු, තමන් හා සම්බන්ධ නොවූ ඇගේ යටගියාවට එබෙයි. මෙයින්ද ''ඇය ගැහැණියක බව පමණක් දැන ගැණීම හැර'' වෙන කිසිවක් දැනගත නො හැකිවුන ඔහු ලජ්ජාවට පත්වෙයි.

ධනපති ගෙයක හිමිදිරියෙහි පටන් මහ රෑ වනතුරු වැඩපල කර පුරුදු ඕලෑංට මේ කුඩා ගෙය ශුද්ධ පවිත්‍ර කිරීමට ද දෙවරක් කෑම පිළියෙළ කිරීමට ද ගතවන්නේ දවසෙන් සුළු කාලයකි. ඇය

Scanned by CamScanner

මෙසේ ඉතුරුවන කාලයද තම පවුලෙහි දියුණුව සඳහා යෙදීමට කල්පනා කළාය.

කුඹුරුවල තිරිඟු වැපිරීමට ලංව තිබුණ වකවානුවකි. එහෙයින් මේ දිනවල උදැල්ල අතනොහැර වැඩ කිරීමට වං ලුං ට සිදුවෙයි. මෙසේ දිනක් ඔහු කුඹුර කොටමින් සිටිනවිට තම උදැල්ලෙන් පෙරලූ පස් පිඩෙලි මත උදැල්ලක් කරතියා ගත් ගැහැණියකගේ සෙවනැල්ලක් වැටෙයි. ඒ පැමිණියේ කවුදැයි ඔහු දැනගතිත්ම ''රෑ වෙනකං ගෙදර කරන්න වැඩක් නැහැ''යි කොටින් කියමින් ඕලෑං කුඹුර කොටන්ට පටන් ගත්තේ ඔහුගේ වම්පසට වෙමිනි.

මේ ගිම්හානය බැවින් හිරු රැස ද ඔවුන් මත නොඅඩුව වැටුනි. එහෙයින් ඇගේ මුහුණින් දහඩිය බිඳු ගලන්නට වුනි. වං ලුං වැඩ කළේ කබාය ගළවා තබමිනි. එහෙත් ඇය වැඩ කෙළේ සිනිඳු ඇඳුමක් ඇඳගෙනය. මොහොතක් ගත වන්නට පෙර ඇගේ උඩ කය වසාගෙන තිබුන ඒ ඇඳුම දහඩියෙන් තෙමී ඇඟටම ඇලුනි. පැය ගණනක් වචනයකුදු නොදොඩා ඇය හා වැඩ කළ ඔහුට විඩාවක් ද විවිධ සිතිවිලි පහළ වීමක් ද නොවීය. හිරු එලිය වැටී පස් පිඩෙහි බබලන සේ ඔවුන් සිය උදලු වලින් ඒවා පෙරළා දැමුවේ කලාත්මකව රඟන රැඟුමක දී වත් ඇතිවන තරම් විඩාවක් නොලබමිනි.

ඔවුන්ගේ සිරුරු පෝෂණ වුනේත්, ඔවුන්ගේ දෙවොළෙහි දෙවියන් ඇඹුනේත් මේ සාර භූමියෙහි පයින් බව් ඔව්හු දත්හ. ඔවුන්ගේ උදලුවලින් පොළොවෙහි සරුපස පෙරළෙන විට මතුවුන ලී කැබලිවලින් ඔවුන්ට පැහැදිලි වුනේ, යටගිය දවසෙහි මේ සාර භූමියෙහි යටවී ගිය ගැහැණු–පිරිමින්ගේ සිරුරු හා කැඩී බිඳී මේ පසටම එකතුවුන ගෙවල් දොරවලුත්ය. එළඹෙන දිනෙක තමන් ගේ සිරුරු ද මේ බිමෙහි ම පොහොර බවට පත්වෙන බව දත් ඒ දෙමහල්ලෝ භූමියේ සාරය මතුකරන්නට එක්සත්ව එක්සිත්ව නිහඬව වැඩ කළහ.

හිරු බැස යනවිට ඔහු ඇය දෙස බැලුවේය. දහඩියෙන් තෙමුන ඇගේ මුහුණෙහි පස් ගෑවී තිබුන ද එය ඔහුට එතරම් පැහැදිලි ලෙස නො පෙනුනේ ස්‌වභාවයෙන්ම ඇය දුඹුරුවන් නිසාය. අඳුරු තෙත ඇඳුම ඇයගේ ඇඟටම ඇලී තිබුනි. ඇය, සෙමින් සෙමින් අන්තිම පස් පිඩැල්ල ද සකස් කොට, සන්ධ්‍යා මන්දමාරුත

යට ඇගේ හඬෙහි වාං බව මුසු කරන්නාක් මෙන්, සුපුරුදු සිහින් හඬින් කතා කළාය.

''මට—මට දරු ගැබක් ඇති වෙලා.''

මේ වචනය ද ඇය ඔහුට කිව්වේ සිරිත් පරිදි නිතර කියන, ''මෙන්න ඔයාට තේ ගෙනාව'' වැනි වචන කථා කරන්නාක් මෙන් සාමාන්‍ය හඬිනි. මේ හඬින් වං ලූං තිගැස්සුණු නිසොල්මන්ව නැගී සිටියේ, එය ඇයට සාමාන්‍ය දෙයක් වුවත් ඔහුට බැරෑරුම් දෙයක් වූ නිසා ය. එයට කුමක් කියයුතු දැයි නොදත් වං ලූං ගේ හදවත හැඟීම් වලින් පිරී ඉතිරී ගියේය. අනතුරුව වං ලූං, බිමට නැඹුරුවී කැඩුනු ගඩොල් කැටයක් පස් පිඩැල්ලකින් ඉවතට වීසි කිරීමෙහි යෙදීසිටි ඇය දෙස බලා, වහා ඇයගේ අතින් උදැල්ල ගත්තේය. එසේ උදැල්ල ගනිමින් ''අදට ඔය ඇති. දැන් ඉතින් හවස් උනා. අපි ඒ කාරණේ තාත්තටත් කියමු'' යයි රළු හඬින් කියමින් ඔහු ඇය සමග ගෘහාභිමුඛව ගමන් කෙළේය. ගැහැණියකට සුදුසු පරිදි ඕලැං ගමන් ගත්තේ, ඔහුට පියවර දහයකට තරම් පසුවය.

ඔවුන් ගෙදර යනවිට මහල්ලා දොර ළඟ සිටගෙන සිටියේ දැඩි බඩගින්නෙන් පෙළෙමිනි. වෙනදා සිය ආහාරය සියතින්ම පිළියෙළ කරගන්නා මේ මහල්ලා ඕලැං ගෙදරට පැමිණි පසු කුස්සි යට නොගියේය. බඩගින්නෙන් නොඉවසිලිමත් වුන ඔහු ශබ්ද නගා කෑ ගැසුවේය.

''මොකක් ද බොලං මේ කරන වැඩේ· මගේ වයසෙ හැටියට බඩගින්න ඉවසන්න පුළුවන්ද?''

මේ වචන ගණනට නොගත් වං ලූං පියාත් කැඳවාගෙන කාමරයට ගොස් කථාකිරීමට සැරසුනේය. කියන්නට අදහස් කර ගෙන සිටි දෙය පැහැදිලිව ද රහසිගතව ද කියන්නට ඔහුට වචන නොමැති තරමය. එහෙත් ඔහු අමාරුවෙන් ද ලජ්ජාවෙන් ද කතා කෙළේය.

''ඇයට දරු ගැබක් හටගෙනලු.''

සෙමින් කියූ ඒ වචනය ඔහුට දැනුනේ ශබ්ද නගා කියූවක් ලෙසය.

මහල්ලා, ඒ වචනය නැවත නැවතත් සිහිකරන්නට මෙන් මොහොතක් ඇසිපිය ගසමින් සිනාසිසී, තමන් වෙතින් ගමන් කර මින් සිටි ඇයට ඇමතුවේය.

''හා! හා! හා! බොහොම හොඳයි! බොහොම හොඳයි! දැන් එහෙනං අස්වැන්නත් ලබයි.''

කළුවර නිසා මහල්ලාට ඇගේ මුහුණ නොපෙනුනි. එහෙත් එළියෙන් ඇය කතා කළාය.

''මම මේ— ඉක්මන් කරල කෑම හදන්නම්.''

මහල්ලා ද ''ඔව් ඔව් කෑම'' යයි හිනැකමින් පවසමින් පොඩි දරුවකු මෙන් කුස්සිය දක්වා ඇය පසුපස ගියේය. වරෙක මුණුපුරෙකු පිළිබඳ හැඟීම් නිසා බඩගින්න අමතකවී ගියද යළිත් වරක් මුණුපුරා පිළිබඳ හැඟුමද යටකරගෙන මහල්ලාගේ සිතෙහි අළුත්වී ඉස්මතුවුනේ කෑම පිළිබඳ හැඟුමය. මේ අතර වංලුං මේසය ළඟ බංකුව මත කළුවරේම වාඩිවී මේසය මත තැබූ දෑතෙහි හිස රඳවා ගෙන ''තමාගේ ශරීරයෙහි ශක්තියෙන් ඇතිවන අළුත් ප්‍රාණය ගැන'' සිතුවිලි සිතීමෙහි යෙදුනේය.

Scanned by CamScanner

වංලුං, දරක ප්‍රසූතියට ලංව සිටි ඕලැංට ඇමතුවේය. ''මේ ඇහුනද? දැන් ඉතින් අපි උදව්වට කවුරු හරි ගෑණු කෙනෙක් ගෙන්න ගන්න ඕන නෙවද?'' ඇය ඔහුගේ යෝජනාව ප්‍රතික්ෂේප කෙළේ හිස වැනීමෙනි. එද රෑ කෑමෙන් පසු ද ඇය පිහන් කෝප්ප සේදීමෙහි යෙදී සිටිද්දී මහල්ලා නිදන්නට ගියේය. අවදියෙන් සිටියේ ඒ දෙමහල්ලන් පමණකි. දැල්වුන කුප්පිලාම්පුවකින් කාමරය ආලෝකවත් වුනි.

''ඉතින් එහෙම එපාද'' යි ඔහු යළිත් ඇයගෙන් විමසුවේ ඈ හා කථාකරණ ක්‍රමය ඔහු තේරුම් ගෙන සිටිහෙයිනි. බොහෝ විට ඇය ඔහුගේ කතාවකට පිළිතුරු දුන්නේ හිස හෝ අත සෙලවීමෙනි, එසේ නැතහොත් ඇයගේ පළල් මුවෙන් වචනයක් දෙකක් නිකුත් කිරීමෙනි. ඇයගේ මේ නිහඬබවෙහි අමුත්තක් දැන් ඔහුට නොමැති නිසා ඔහු යළිත් ඇය හා කතා කෙළේය.

''මේ ගෙදර ඉන්නෙත් අපි පිරිමි දෙන්න විතරයි. ඒ නිසා ගෑණු කෙනෙක් කැඳව නොගන්න එක හොඳ නැහැ. අපේ අම්ම නම් මෙහෙම වෙලාවල ගමෙන් ගෑණු කෙනෙක් ගෙන්ව ගන්න. මටත් මේව ගැන කිසිම තේරුමක් නැහැ. හැබැටම අර ''හ්වැං'' මැදුරෙන්වත් ගෙන්නව ගන්න පුළුවන් දසියක් නැද්ද?''

ඇය මේ ගෙදරට පැමිණීමෙන් පසුව, ඇය කලින් විසූ ගෙදර, ඔහු විසින් සඳහන් කළ මුල්වාරය මෙයයි. එහෙයින් ඇය අඳුරු තරහක්,ද ගැබ්වුන කුඩා දෙනෙත විදහා පෙර නොදුටු කෙනෙකු බලන්නියකමෙන් ඔහු දෙස බලා ''මොකොද ඒ ගෙදර කවුරුවත් නැත්තෙ'' යයි හඬනගා කීවාය.

Scanned by CamScanner

වං ලුං පුරවමින් තිබුණ දුම් කෝවයද බිම දමා ඇය දෙස බැලූවේය. ඇගේ මුහුණ යළිත් ප්‍රකෘතිමත් වෙමින් තිබුනි. මුවෙන් කිසිත් නොබිනූ ඇය මේසයේ විසුරුවා හැර තිබුනා ලී කෝටු ටික එකතු කරන්නට පටන් ගත්තාය. ''මේක හරි වැඩක්!''යයි වං ලුං විශ්මයෙන් කියද්දී ඇය නිහඬවුනාය.

ඔහු යළිත් මෙසේ තර්ක කෙළේය. ''අපි පිරිමි දෙන්න විතරයි මෙහේ ඉන්නෙ. ඔය ළමයි හම්බවීම ගැන අපිට දැනීමක් නැහැ. මෙහෙම අවස්ථා දැකල ඇත්තෙ තාත්ත තමයි. ඒ උනාට තාත්ත උනත් උඹේ කාමරේට එන එක හරි නැහැ. අනේ මම නම් අඩු ගණනෙ එළදෙනෙකුවත් පැටව් ගහනව දැකල නැහැ. ඉතින් මට ඔය කාමරයට යන්න එන්න පුළුවන් උනත් මගේ ගොරෝසු අත්වලින් දරුව වඩාගන්න කොට දරුවට කරදරයක් වේවි. ඉතින් අර ''හ්වැං'' මැඳුරෙ දසියො නම් ඕව හොඳට දැකල පුරුදු ඇති. ඉතින් එහෙන් කවුරුවත්............''

ඔහු මෙසේ කතා කරගෙන යද්දී, උණකෝටු පිළිවෙළට අඩුක් කර මේසයද පවිත්‍රකළ ඇය මොහොතක් ඔහු දෙස බලාගෙන සිට කතා කළාය.

''මම ආයි ඒ ගෙදරට යන්නෙ මගේ දරුවත් අරගෙනම තමයි. මම මගේ දරුව ඒ ගෙදරට එක්කරගෙන යනකොට රතු කබායකුත් රතුමල් වැටුන කලිසමකුත් අන්දවනව. රත්තරනෙන් ඇඳපු කුඩා බුද්ධ රූපයක් ඇති කුඩා තොප්පියකුත් හිසට දමනාව, පයට දමනව කොටිහම් සපත්තු දෙකක්. මමත් අළුත් සපත්තු දෙකක් දමාගෙන කළුසැටින් කබායක් ඇඳගෙන දරුවත් අරගෙන ඉස්සෙල්ලම යන්නෙ මම පසුගිය කාලෙ හිටි ඒ මහගෙදර කුස්සියට, ඊළඟට යන්නෙ අර මහා ශාලාවෙ අබිං උර උර ඉන්න නාකි නෝන ළඟට. එච්චර විතරක් නෙවෙයි, මම මගේ දරුව පෙන්වනව මහ ගෙදර ඉන්න කාටත්.''

වං ලුං කිසිදිනක, ඇය මෙතරම් කතාකරනු අසා නැත. සෙමින් සෙමින් වුවද නොකඩවා කතා කරගෙන ගිය ඇය විසින් දරුවාටද තමාටද අවශ්‍ය සියල්ලක්ම තීරණය කර තිබෙන බව ඔහු දැනගත්තේය. ''ඇය මේ සියල්ල තීරණය කරගන්නට ඇත්තේ තමා කුඹුරෙහි වැඩ කරණ කාලය තුළ''යයි ඔහු නිගමනය කරගත්තේය.

Scanned by CamScanner

තමාට උපදින දරුවාට ඇඳුම් පිළියෙළ කරගන්නා අයුරු ද දරුවාත් රැගෙන යන ගමනෙහිදී තමන් වෙනුවෙන් ඇඳුම් සාදගන්න අයුරුද තීරණය කිරීමෙහි යෙදී සිටි ඇය, දවසේ සාමාන්‍ය කටයුතු වලදී වං ලූං ඉදිරියෙහි හැසුරුණේ ''ඉපදෙන දරුවා ගැන'' අමතක කළ එකියක මෙන්ය. ඇයගේ මේ අද්භූත චරිතයෙන් මවිතයට පත්වූන ඔහුට කතා කිරීමට ද වචන නැත්තාසේ දුනුනි. ඔහු දුම්කොල ටික සෙමින් ගෙන සිය ඇඟිලි අතරෙහි රුවා පයිප්පය පිරෙව්වේ ''දැන් ඉතින් උඹට සල්ලිත් ඕනවේවි නොවේ දැ''යි අසමිනි.

''මට රිදී තුනක් දුන්නොත්.........''යයි ඇය බියෙන් මෙන් කීවාය. ඇය මෙසේ කියනවිට වං ලූං සිය පසුම්බියට අත දැම්මේය. පසුගිය දිනක සිය කුඹුරෙන් ලබාගත් පන්කොල කරත්ත බාගය විකිණීමෙන් ලබාගත් මුදලක් එහි තිබුනි. ඒ ඇයට වුවමනා කරණ මුදලටත් වඩා ටිකක් වැඩිතරම් මුදලකි. මෙයින් රිදී ඩොලර් තුනක් ගෙන මේසය මතතබා, මොහොතකින්, උදෑසන කෝපි කඩයට ගියවිට ඔට්ටු ඇල්ලීමට තබාගෙන සිටි ඩොලරයද එයට එකතු කෙළේය.

එසේ තබා සිටි මුත් ඔහු කිසිදිනක සූදුවට නොගියේ පරාජයට තිබුන භය නිසාය. නිතර නිතර ''දදු මේසය'' ළඟ කරකැවුනත් ඔට්ටු වක් නම් ඇල්ලුවේ නැත. ඔහු තමාගේ විවේක කාලය ගතකෙළේ කතන්දර කියන්නාගේ කඩයෙහිය. කථාකාරයාගේ කැටය, අසන් නන් වෙනට පැමිණීවිට එයට දැමිය යුතු පැන්සය පමණකි එහිදී ඔහුට වියදම් වුනේ. එබඳු මුදලක් වියදම් කිරීමට ඔහුට දුෂ්කරද නොවීය.

''උඹ ඉතින් මේ කාසියත් ගනින්'' කියමින් ඉතිරි ඩොලරයද ඇයට දුන් ඔහු කරදසි කැබැල්ලකින් පයිප්පය දල්වා ගත්තේ ''උඹට ඕන නම් දරුවාගේ කබාය සිල්ක් රෙදි කැල්ලකින් මස්සවා ගනින්. කමක් නෑ පළමු එකානොවේදැ''යි කියමිනි.

ඇය එකවරටම ඒ මුදල් ගත්තේ නැත, නිශ්චල මුහුණින් යුතුව මොහොතක් ඒ දෙස බලාගෙන සිටියාය. අනතුරුව ඇය හදිසියෙන් මෙන් ඒ මුදල් රැගෙන මිට මොලවා ගෙන නිදන කාමරයට දිවවේ ''මම මෙච්චර මුදලක් අල්ලපු පළමු වතාව අද ය''යි කොඳුරමිනි. වං ලූං ද දුම් පයිප්පය ඉරුවේ ඇයට දුන් ඒ මුදල් ගැන සිතමිනි.

Scanned by CamScanner

තමාගේ ජීවය මෙන්ම, තමාගේ ශක්තිය මෙන්ම ඒ මුදලද ඔහු ලබාගත්තේ මේ සරු බිමෙනි. සිය දහඩිය බිංදුවෙන් බිංදුව මේ බිමෙහි වගුරා ලබාගත් මුදල් මෙයට පෙර කිසි දිනෙක මෙසේ නොසැලකිලිමත් ලෙස ඔහු කිසිවෙකුට නුදුන්නේය. අනිකෙකුට ණයට හෝ මුදලක් දෙනවිට වෙනද ඔහුට දැනුනේ ඇඟෙන් ඇටයක් ඉවත්වන්නා සේය. ලොකු මුදලක් ඕලෑං අතටගත් පළමුවාරය මෙය වූවාක් මෙන්ම කිසිදු හිතේ අමාරුවක් නොමැතිව වං ලුං සිය මුදලක් අන් කෙනෙකුට දුන් පළමුවාරය ද මෙයයි. තමා ''මේ මුදල් දුන්නේ, නන් නාඳුනන කඩකාරයෙකුට නොව, තම දරුවාගේ ඇඳුම් පැළඳුම් සකස් කිරීම සඳහා සිය අපූරු බිරියට''යයි සිත සිතා ඔහු සැනසුනේය.

ප්‍රසූත කාලයද ලංවුනේය. එහෙත් ඇයට කිසිවෙකුගේ සහායයක් – උපස්ථානයක් වුවමනා නොවූයේ ඒ මොහොත ''එක් රැයකින්ම''කෙළවර වන බව දන්නා නිසාය. කුඹුරුවල හා හේන්වල අස්වැන්න නෙලා ගැනීමේ කාලය ද එළඹ තිබුණි. ගිම්හානයේ වැස්සත් සරත් කාලයේ සූර්යතාපයත් නිසා ගොයම් කෙත් සරු සාරබව පළ කෙළේ පිරුණ, බරවුන, නැමුන රන්වන් ගොයම් කරලිනි. සිය කෙත්වල අස්වැන්න නෙලා ගැනීමට ඇය ඔහු සමග කෙතට ගියේ කොට මිටක් සහිත දැකැත්තක් ද රැගෙනය.

ඇය ගොයම් කැපීමට අමාරුවෙන් පහත්වුනේ ගැබ්බර බව නිසාය. වෙනද සිය සැමියා සමග හරි හරියට වැඩකරණ ඇය මේ දිනයෙහි ගොයම් කැපුවේද ඔහුට වඩා බොහෝ හෙමිනි. සෑම විටම ඔහු ඇය පසුකරගෙන අළුත් ගොයම් පඳුරු පේලියක් කැපූවේය. මෙසේ ඒ දිනයෙහි උදය ද දවාල ද සවස ද ගතවී යද්දී ඇය ගොයම් කැපීමෙහි යෙදුනාය. සවස් වී යත්ම ඔහු ආපසු හැරී ඇය දෙස බැලුවේය. වැඩ නවත්වා නැගීසිටි ඇගේ අතින් දැකැත්ත ගිලිහී තිබුන අයුරුද – ඇගේ මුහුණෙහි අළුත් වෙහෙසක දහඩිය බිඳු මතුවී තිබෙන අයුරුද ඔහුට පෙනුනේය.

''අර වෙලාව ලඟයි. මම ඉතින් ගෙදර යන්නම්. හැබැයි මම කතාකරණ තුරු මගේ කාමරේට නම් එන්න එපා! අළුත් වෙවැලක් දෙකට පළල සුද්ද කරගෙන එන්න ඕන. ඒකෙන් තමයි දරුවගෙ පෙණ මගේ සිරුරෙන් වෙන් කරගන්න තියෙන්නෙ''යයි ඇය තමන් දෙස බලා සිටි සැමියාට කීවාය. මෙසේ කියා ඇය කුඹුරු හරහා

Scanned by CamScanner

ගෘහාභිමුඛව කිසිදු අමුත්තක් නොමැතිව ගමන් කළාය. ඔහුද, එසේ ගමන් කළ ඇය දෙස පේනතෙක් මානයේ බලා සිට කුඹුරෙන් පිටතවූ පොකුණ ළඟට ගියේ එහි වේවැල් පඳුරෙන් සිහින් නිල් වේවැලක් කපා ගැණීමටය. කපාගත් වේවැල පරෙස්සමින් සුද්ද කොට දැකැත්තෙන් දෙකට පලා ගත්තේය. ඔහු එයද රැගෙන වහ වහා ගෙදර ගියේ සරත් කාලයේ කල් ඇතිව අඳුර පැතිරෙන හෙයිනි.

ඔහු ගෙදර ගියවිට, ඔහුගේ කෑම, මේසය මත උණුසුම්ව තබා තිබුණි. මහළු පියාද කෑම ගනිමින් සිටියේය. ප්‍රසූත වේදනාව තිබියදීම ඇය විසින්ම ආහාර පිළියෙළ කොට තිබෙන බව ඔහුට දැනුණි. ''මේ ගැහැණිය හරි පුදුම ගැහැණියක්'' යයි තමාටම කියා ගනිමින් ඇයගේ කාමරය වෙත ගොස් ''මෙන්න වේවැල''යයි හඬ නැගුවේය. ඔහු එහි මොහොතක් නතරව සිටියේ ''වේවැලත් රැගෙන කාමරයට එන්න''යයි ඇය කියතියි සිතූ නිසාය. එහෙත් ඇය එසේ නොකීවාය. දොර ළඟට පැමිණි ඇය දොරේ හිදැස් තැනින් අත දමා වේවැල ගත්තී, වචනයකුදු කථා නොකළාය.

ඇය හතිලනු හඬ ඔහුට ඇසුනේය. එය ඔහුගේ සවණෙහි වැකුනේ දිග දුරක් දිවූ සතෙකුගේ හතියක් මෙන්ය.

මේ අතර මහල්ලා සිය ආහාර භාජනයෙන් හිස ඔසවා කතා කෙළේය.

''කාපන් බන්, කාපන්, මෙව ඇල්වෙච්. දැම්ම බලා පොරෙත්තු උනාට වැඩක් නැහැ. තව හුහක් වෙල ඒකට ගතවෙච්. මට හොඳටම මතකයි අද වගේ මගේ කුළුඳුල් එකා උපන් හැටි. ඒක උපදින කොට එලිවෙන්නත් කිට්ටු උනා. අනේ මට දුව උඹේ අම්මට ලැබුන දරුවන්ගෙන් ඉතුරු උනේ උඹ විතරයි. ඉතින් බලහාන්කො වැඩේ හැටි. විස්සකින් එකයි ඉතුරු උනේ. ගැහැණියෙක් නිතරම ළමයි වදන්න ඕන ඔන්න ඔය නිසයි. ඉතින් හෙට මේ වෙලාවට මටත් පිරිමි දරුවෙකුගෙ ආත කෙනෙක්.''

මෙසේ කියූ මහල්ලා කෑමද නවතා මහ හඬින් සිනාසුනේය. වං. ලූං දොර සමීපයට වී සවන්දීගෙන සිටියේය. හතිලෑමේ හඬත් සමග කාමරයේ දොර අතරින් පැමිණියේ උණුසුම් ලේවල ආඝ්‍රාණයකි. ඒ ආඝ්‍රාණය ඔහුතුළ ජනිත කෙළේ භීතියකි. කාමරයෙන් ඇසුන ඒ හති ලෑම ක්‍රමයෙන් සිහින් කෙඳිරියට පෙරලුනි.

එහෙත් ඇයගෙන් වෙන හඬක් නොඇසුනි. වං ලුං දැන් සිටින්නේ ඉවසිය නොහැකි තත්වයකය.

ඔහු දොර කඩාගෙන කාමරයට පිවිසෙන්නට සැරසෙයි. එවිටම සිහින් හැඬීමක් ඇසී ඒ හැඟීම ඔහු සිතෙන් අතුරුදන්වෙයි.

"මොකෝ මොකෝ! පිරිමියෙක් ද"යි ගැහැණිය ගැන නොවිමසා අවස්ථානුකූලව කෑගසත්ම ඒ සිහින් හැඬුම යලි යලිත් නැගෙයි. "පිරිමියෙක්ද? පිරිමියෙක්ද? මට ඒක විතරක් කියා පන්"යයි ඔහු තවදුරටත් පෙරැත්ත කරයි.

"ඔව් පිරිමියෙක්" යයි ඇය පිළිතුරු දුන්නේ දුබල සිහින් හඬෙහි දෝංකාරයද දෙවමිනි. එවිටය ඔහු මේසය වෙත ගොස් හිඳගත්තේ. එය කොතරම් ඉක්මනින් සිදුවුනත් කෑම ද නිවීගොස් තිබුනි. ඔහු බංකුව මත නිදගත් මහල්ලාගේ උරහිසින් අල්ලා සෙලවූයේ "පිරිමි දරුවෙක්! පිරිමි දරුවෙක්! දැන් ඔබ සීයා කෙනෙක් මම තාත්තා කෙනෙකැ"යි කියමිනි.

වහා පිබිදුන මහල්ලා, පුතා කී දෙය තේරුම් ගෙන, නින්දට යද්දී මෙන්ම, නැවතත් සිනාසුනේ "ඔව්, ඔව් එහෙනං සීයා කෙනෙක්, සීයා කෙනෙක්"යයි කිය කියා සිය සයනය බලා ගමන් කරමිනි.

වං ලුං සීතල වූ බත් පිඟාන ගෙන කන්නට පටන් ගත්තේය. දැඩි බඩගින්න නිසා ඔහුට එහි සීතල බව ද නොදැනුනේය. එහෙත් ඔහුට වුවමනා තරම් ඉක්මනින් ආහාර ගැනීමට නොහැකිවුනේ, ගැහැණිය, අමාරුවෙන් මෙන් එහා මෙහා කාමරයේ ඇවිදින හඬත්, දරුවාගේ හැඬීමත් නොනැවතීම ඇසුන නිසාය. මේ හඬ අසා "මීට පස්සෙ මේ ගෙදර කරදරවලින් අඩුවෙන එකක් නැතැ"යි ඔහු තමාටම කියාගත්තේ සාඩම්බරයෙනි. ඔහු හැකි තරම් අනුභව කොට නැවතත් කාමරයේ දොර ලඟට ගියේය. ඇය ඔහුට කාමරයට ඇතුළුවන්නට කීයේ මෙවිටය. ඔහු කාමරයට පිවිසි මොහොතෙහි ද එහි ඉහිරුණ ලේ වල ආඝ්‍රාණය පැතිරෙමින් පැවතුනි. එහෙත් ලී බාල්දියේ හැරෙන්නට අන්කිසි තැනක ඒවා තිබුනු බවක් ඔහුට නොපෙනුනි. ඇය විසින් වතුර වත්කොට ඇඳ යටට තල්ලුකොට තිබුන ඒ බාල්දිය ද ඔහු දැක්කේ මහත් අසීරුවෙනි. කාමරය පසෙකින් රතුපාට ඉටිපන්දමක් දැල්වෙද්දී ඇය හොඳින් පොරවා ගෙන ඇඳෙහි වැතිර සිටියාය. චීනයේ චාරිත්‍රානුකූලව

තමාගේ පරණ කලිසමක ඔතනු ලැබූ දරුවා මවගේ පසෙකින් සයනය කරවා තිබුනි.

ඔහු ඇයගේ ඇඳවෙත ගියේය. වචනයකුදු ඔහු ගේ මුවෙන් පිට නොවුනි. ඔහුගේ හදවත හැඟීම්වලින් පුරවාගෙන නැඹුරුවී දරුවා දෙස බැලුවේය. හැඞීම නවතා, දෙනෙත් පියාගෙන, වැතිර සිටි දරුවාගේ, රැලි සහිත අඳුරුවන් රවුම් මුහුණ ද, සිනිඳු දිග කෙස් ද දැක දැක, ''ඔහු මගේම පුතා''යයි වං ලුං සැනසුනේය.

අනතුරුව වං ලුං ඇය දෙස බලත්ම ඇය ද ඔහු දෙස බැලුවාය. ඇගේ සෑම ඉන්ද්‍රියයක්ම පළකෙළේ ගතවුන පැයෙහි ඇය වින්ද දුකෙහි ලකුණුය. ඇගේ කොස් තෙත ගතියෙන් යුක්තවුනි. දෙනෙත ගිලී තිබුනි. ඇඳෙහි වැතිර හුන් ඇයගේ මුළු ගතෙහිම මෙසේ දුබල බව පළවුනි. දරුවා හා බිරිය දැක ඔහුගේ හදවත කරුණාවෙන් කුළුගැන්වුණි.

''මම හෙට නගරයට ගොහින් රතු සීනි රාත්තලක් ගෙනැවිත් උණුවතුරෙන් දියකරල උඹට බොන්න දෙන්නම්''යයි ඔහු ඇයට කීවේය. යලි ඔහු දරුවා දෙස බැලීමෙන් ඇතිවුන හැඟීම් මුවට නැංවූයේ ''අපි බිත්තර කූඩයක් අරගෙන රතුපාට පොහවල ගමේ බෙදන්න ඕන. එතකොට මුළුගමම දැනගනීවි අපට පිරිමි දරුවෙක් ලැබුන වග'' යන වචන වලිනි.

Scanned by CamScanner



ම සූතයෙන් පසු දිනයෙහි ද ඇය සිරිත් පරිදි ආහාර පිළියෙළ කිරීම් ආදී ගෙදර කටයුතුවල යෙදුනාය. එහෙත් එද ඔහු කුඹුරට යද්දී ඇය ගෙදර නතරවුනාය. ඔහු මේ දිනයෙහි වැඩ කේළේ මධ්‍යාහ්නය වනතෙක් පමණකි. මධ්‍යාහ්නයෙන් පසු කුඹුරෙන් ගෙදර පැමිණි ඔහු නිල් ඇඳුම් කට්ටලයද ඇඳගෙන සැරසුනේ නගරයට යාමට ය. ඔහු නගරයට ගොස් වෙළඳ සැලින් බිත්තර පනහක් මිලට ගත්තේ එකක් පැන්සය බැගිනි. ඒවා රතු පාට කරන්නට රතු පාට ක්රදසිද මිලදී ගත්තේය. බිත්තර, කුඩයක දමාගෙන අනතුරුව ඔහු ගියේ රසකැවිලි වෙළඳ හලක ටය. රාත්තලකට ටිකක් වැඩියෙන් තමාට රතුසීනි වුවමනා බව වෙළෙන්දට දැන්වූ පසු වෙළෙන්ද දුඹුරුපාට කරදසියක් අතට ගත්තේ සීනි එතීමටය. වං ලුං, වෙළෙන්ද සීනි ඔතන තුරු පරීක්ෂාකාරීව බලා සිටිද්දී, වෙළෙන්ද සීනි ගොටුවෙහි බැදි හණ නූල් පටවල් අතර රතු කරදසියක්ද රුවමින් ''මේව සමහර විට අළුත උපන් දරුවෙකුගෙ අම්මා කෙනෙකුට වෙන්න ඇතැ''යි කිව්වේ සිනහරැල්ලක්ද මුවගට නංවමිනි.

''කුළුඳුල් පුතෙකුට'' යයි වං ලුං පිළිතුරු දුන්නේ සාඩම්බර යෙනි.

''අනේ! හොඳයි බොහොම වාසනාවක්'' යයි වෙළෙන්ද නො සැලකිලිමත් ලෙස එයට පිළිතුරු දුන්නේ හොඳට ඇඳ පැලඳ ගෙන කඩයට ඇතුළුවුන කෙනෙකු දෙස ඇස ගසා ගෙනය.

Scanned by CamScanner

තත් නාඳුනන, කෙනෙකු සමග වුවද සුහද ලීලාවෙන් මිත්‍රත්වයෙන් – අනුකම්පාවෙන් කතාකිරීමට මේ වෙළෙන්දට හොඳ හුරුකමක් තිබුනේය. මේ රසකැවිලි වෙළඳ හලට පැමිණෙන සැම කෙනෙකුටම එබඳු වචනවලින් සංග්‍රහ කිරීම ඔහුගේ සිරිතකි. වං ලුං මේ වෙළෙන්දගේ ආචාරශීලී භාවයට පැහැදුනේය. එහෙයින් ඔහු වෙළඳ සැලෙන් පිටවෙද්දී කීපවරක් නැමී, වෙළෙන්දට ආචාර කොට දුව්ල්ලෙන් ගැවසෙන වීථියට බැස යලිත් ගමන් කෙළේය. තද හිරු එලියෙහි පහස ලබමින් ගමන් කළ ඔහු තමා තරම් වාසනාවන්තයෙක් මුළු ලොවම නැතැයි ප්‍රීතියෙන් සිතා යලි භීතියෙන් ද සැලුනේය.

''වැඩිය වාසනාවන්ත වෙන එකත් ඒ තරම් හොඳ නැහැ. මේ පොළොවත් අහසත් පිරිල තියෙන්නෙ භූතයන්ගෙන්. මේ ලෝකෙ ජීවත්වෙන දුප්පතුන්ගෙ ප්‍රීතිය ඔවුන් ඉවසන්නෙ නැතැ''යි සිතමිනි.

මෙසේ සිත සිතා ඔහු වහාම් ඉටිපන්දම් විකුණන්නාගේ කඩය දෙසට හැරුනේ එහි සුවඳ වර්ග ද විකුණන නිසාය. එහිදී ඔහු ගෙදර සිටින එක් අයෙකුට එක බැගින් හඳුන්කූරු සතරක් මිල දී ගත්තේය. ඉන් පසු ඒ කුඩා දෙවොළට ගොස් සිය බිරියත් සමග පැමිණි දිනයෙහි තමා හඳුන්කූරු ගැසූ අළු ගොඩෙහි ම ඒ සඳුන්කූරු සතර ද ගැසුවේය. ඒවා දැල්වෙන අයුරු මොහොතක් බලා සිට ප්‍රීතිමත් සිතින් වං ලුං ගෙදර බලා පා නැගුවේ මේ කුඩා කුටියෙහි වහළ යට තිබෙන දෙව් රූ දෙකෙහි බලමහිමය මෙනෙහි කරමිනි.

වැඩි කාලයක් ගත නොවුනි. ඇය ද ඔහු සමග යලිත් කුඹුරු වැඩෙහි යෙදුනාය. ඔහු කපාගත් ගොයම් ගොඩගසා තිබුනේ ගෙමිදුලෙහිම කමතෙහිය. සිය බිරියගේ ද සහාය ඇතිව ගොයම් පාගා ගත් වී ශුද්ධ කෙළේ උණපතුරුවලින් සෑදූ කුළුවලට දමා පොලා ගැණීමෙනි.

ශීත ඍතුව ද ලංවෙමින් තිබුනි. නැවතත වරක් කුඹුරු වැපිරීමට කල් යල් එළඹුනේය. වං ලුං නගුලෙහි ගොණෙකු බැඳ කුඹුර හාන විට ඕලැං ද උදැල්ල ගෙන පසුපස ගමන් කර මින් පස් පිඩැලි තුනී කළාය.

කුඹුරු වැඩට යන සෑම විටම ඇය සිය දරුවා ද රැගෙන ගොස් තමන්ට ජේනතෙක් මානයේ සෙවන ඇති තැනක අතුළ

පරණ පොරෝණයක ඔහු සතප්පවයි. මෙසේ දරුවා සතප්පවා ඇය සිය සැමියා සමග කුඹුරු වැඩෙහි යෙදෙයි. මේ අතර දරුවා හැඬුව හොත් ඇය වහා දරුවා වෙත දුව අවුත් ලැම පෙදෙස විවරකොට සිය පියවුරක් බිම බුදියන දරුවාගේ මුවෙහි තබයි. හේමන්තයේ වැහි කුණාටු හමනතුරුම පවතින, ග්‍රීෂ්ම ඍතුවේ ප්‍රචණ්ඩ සූර්ය තාපයෙන් තැවෙන මේ ධෛර්යවත් මාතාවද මේ සියුමැලි දරුවාද කුඹුරෙහි දූවිලි වැදීමෙන් දුඹුරුවන් මැටි රූ දෙකක විලස් ගනිති.

ගැහැණියගේ දුඹුරුවන් ලොකු පියවුරෙන් හිම මෙන් සුදු කිරි දරුවාගේ මුවට ගලා ආවේ උල්පතකින් මෙනි. දරුවා කැදර වුවත් ඔහුට වුවමනාවටත් වැඩියෙන් කිරි එහි තිබුනි. ඇය තම පියයුරුවල ඇති කිරිවල වැඩි කම දැනගෙන එය නිදහසේ ගලන්ට ඉඩහැරියාය. ඇයගේ පියවුරෙන් රුරා වැටුන වැඩිමනත් කිරි දහරින්ද කුඹුරේ කළුවන් පෙදෙසක් ඇතිවුනේය. පුෂ්ටිමත්ව සුවසේ වැඩුන දරුවාද මවගෙන් කෙළවරක් නැතිව ලැබෙන ජීවය තිස්සේම පානය කෙළේය.

සීත ඍතුව එළඹෙන විට ඔව්හු එයටද සූදානම් වූහ. කලින් නො ලැබුන අන්දමේ අස්වැන්නක් මේ වර ඔවුන්ට ලැබුනි. මේ කුඩා ගෙයි කාමර තුනම අස්වැන්නෙන් පිරීගති.

ගෙයි වහල ද ඉස් පාසු බැවින් තොරවුනි. එහි පරාලවල වේලනු ලැබූ නොයෙක් ආහාර ද්‍රව්‍ය එල්වා තිබුනි. මැද කාමරයේත් මහල්ලාගේ කාමරයේත් ඔවුන්ගේ කාමරයේත් ගොඩ ගසා තිබුනේ තිරිඟු වලින් හා වී වලින් පිරවූ විසාල මලුයි. මේ වී මලුවලින් වැඩිහරියක් තිබුනේ විකිණීමටයි. කොතරම් සරුසාර වුනත් වං ලුං අර පරෙස්සම් සහිත වූයේය. සෙසු ගොවියන් මෙන් ඔහු සූදුවට හෝ හොඳ කෑම වර්ග ගැනීමට මුදල් වියදම් නොකෙළේය. එමෙන්ම ඔහු ද්‍රව්‍ය මිල අඩු දිනවල ධාන්‍ය විකිණීමටද අදහස් නොකෙළේය. ඒවා ඔහු ගොඩ ගසා ගෙන සිටියේ හිම වැටෙන්නට පටන් ගත් විට හෝ අළුත් අවුරුදු දිනවල හෝ නාගරිකයන් වැඩි මුදල් ගෙවා ගනිතියි සිතූ නිසාය. එය එසේම වූයේ ය.

ඇතැම් විට ඔහුගේ බාප්පා ධාන්‍ය විකුණාගත්තේ ගොයම් කපා පාගා අවසන්වන්නටත් පෙර කුඹුරෙහිදීමය. ඔහු එසේ

කෙළේ වැඩි මුදලක් ලැබීමට ආසාව නැති නිසා නොව ගොයම් කැපීමේත් පැගීමේත් කරදරයෙන් නිදහස් වෙන්නටය.

බාප්පාගේ භාර්යාව මෝඩය, තරබාරුය, කම්මැලිය. ඇය තිස්සේම කරදර කෙළේ හොඳ හොඳ කෑම වර්ග ගැනීමට හා අළුත් අළුත් ඇඳුම් පැලඳුම් - බඩුමුට්ටු ගැනීමටත්ය. එහෙත් වං ලුං ගේ භාර්යාව ඔහුටත්, මහල්ලාටත්, දරුවාටත්, තමාටත් අවශ්‍යදේ සියතින්ම පිළියෙළ කර ගත්තාය. ඇයට කිසි දිනෙකත් ඔහු සපත්තු මිලට ගෙන දුන්නේ නැත. ඇය මුළු පවුලටම සපත්තු සම්පාදනය කළාය.

තම බාප්පාගේ ගෙයි කබල් වහලෙහි වූ පරාළවල කිසිවක් එල්වා නොතිබුනි. එහෙත් වං ලුං ගේ ගෙයි වහළෙහි ලුනු දමූ ඌරුමස් ගාතයකුත් ලුනු දමූ කුකුළු පැටවුන් දෙදෙනෙකුත් එල්වා තිබුනි. මේ ඌරු ගාතය ඔහුට ලැබුනේ සිය අසල් වැසි චිං ගෙනි. චිං ඒ ඌරා මැරුවේ ඌට ලෙඩක් වැලඳෙන්නට යන්නාක් මෙන් පෙනුන නිසාය. ඌ කෙට්ටු වෙන්නට පළමු මැරූ බැවින් ඌරු ගාතය ද විසාල වූවකි. පිහාටු පිටින්ම ලුණු දමා එල්වා තිබුන කුකුළුපැටවුන් දෙදෙනා වං ලුං ට ම අයත්වූහ. මෙසේ වං ලුං ගේ ගෙය ඉසුරෙන් සපිරුණ තැනක් බවට පෙරළෙද්දී කාන්තාරය හරහා සීත ඍතුවේ සුලඟ හමා ආවේය. ඊසාන දෙසින් හැමූ ඒ සුලඟ දැඩිය, කාවදින සුලුය.

දැන් වං ලුං ගේ දරුවාට තනිවම හිඳගැනීමට ද පුළුවන. වං ලුං දෙමහල්ලෝ දරුවාගේ ජන්මදිනය සිහිකිරීමට උත්සවයක්ද පැවැත් වූහ. මේ උත්සවයට පැමිණි අමුත්තන්ට ඉඳියාප්පවලින් ඔවුන් සංග්‍රහ කෙළේ දරුවාට දීර්ඝායුෂ ද පතමිනි. වං ලුං ගේ මංගල භෝජනයට ආරාධනය ලැබූවෝම මේ සංග්‍රහයටද ආරාධිත වූහ. වං ලුං විසින් උත්සවයට පැමිණි අමුත්තන්ට පාටකළ බිත්තර එකෙකුට දසය බැගින් ද සෙස්සන්ට ඒවා දෙක බැගින් ද බෙද දෙන ලදී.

මවට මෙන්ම උස් හනු ඇට ඇති රවුම් මුහුණක් ඇති දරුවා කෙරෙහි පැමිණි සිටි අමුත්තන් දැක්වූයේ මුදිතාවක් නොව ඊර්ෂ්‍යාවකි

ශීත කාලයේ ඔවුන් කුඹුරට ගියේ දරුවා සිය කාමරයෙහිම සතපප්වමිනි. දරුවාට සෑහෙන තරම් හිරු එළිය ද ඒ කාමරයට වැටුනේ විවෘත කොට තැබූ දකුණු දෙස දෙරටුවෙනි. දරුවා

කාමරයෙහි සයනය කරණවිට නිශ්චල තැතක යෙදෙන්නාක් මෙන් උතුරෙන් හමා ආ සුළඟ, ගෙයි මැටි බිත්තියෙහි වරින් වර හැපුනේය. මේ සුළඟින්, දෙරකඩ ඉදි ගහේ ද කුඹුරු අවටවූ ඇටඹගස්වල ද වේවැල් පඳුරුවල ද කොළ සම්පූර්ණයෙන් ගිලිහී වැටුනි. කුණාටුවට අසුව උණගසක් දෙකක් නැමී ගියද කිසිම හානියකට ගොදුරු නොවූයේ ගෙට නැගෙනහිරින් තිබුන ඒ උණපඳුරු කීපය පමණකි.

මේ වියලි වාතය කුඹුරුවලට පීඩාදයක වීය. වැපිරූ ධාන්‍යවලින් පැල හට නොගත්තේය. එහෙයින් වං ලූං වම්ා පතනය මහත් ආශාවෙන් බලාපොරොත්තු වූනේය. ''හැමද නියං එකද වැස්සකින් ගෙවීයන්නට සැරසුනේ සුළඟින් තොර'' නිසසල දවසක උදවකිනි.

වං ලූං බලාපොරොත්තුවුන පරිදි එද වැසි වැස්සේය. ඉසුරෙන් පිරුණ සිය ගෙය තුළට වී ඔහු වැස්සේ විසිතුරු බලා සිටියේය. සිය ගෙයි වහලයට වැටෙන වැහිපොද පියසි අගින් බිමට පතිත වෙන අයුරුද, යලි ඒවා කානුවලට වැටී උතුරා වෙළට යන අයුරුද, ගෙය අවට ඇතිකුඹුරු මොහොතකින් වැසිදියෙන් පිරී යන අයුරුද දූක දූක ඔහු තුටු සයුරෙහි ගිලෙයි. මේ අතර ගෙයි පියස්සට වැටුන දිය බිඳුවක් පියස්සෙහි සිදුරකින් කාන්දුවී ගේ ඇතුළට වැටෙයි. දරුවා, රිදී දහරක් වැනි ඒ දිය බිඳු දූක, එය අල්ලන්නට මෙන් සිහිති අත් දිගුකොට සිනාසෙයි. සෙස්සෝද මේ සිහිත්තාගේ සිනහවට එකතුවෙති. දරුවා ළඟම වාඩිවී සිටි මහල්ලා ''මේ වාගේ දරු පැටියෙක් මේ ගම් දහයකවත් හොයන්න බැහැ. මගේ මලයගෙ පැටවු ඇවිදින්න ලංවෙන කොටවත් නැහැ ඔහොම වැඩක් කෙළේ'' යයි පැවසුවේ උදන් අනන්නාක් මෙන්ය.

කල් නොයවාම වැස්සේ ඵල ඔවුනට දූකිය හැකිවිය. සෑම කුඹුරකම නෙත පසට උඩින් නිල්වන් පැල නැගී තිබුනි. කිසිත් කරදරයක් නොමැතිව තම කුඹුරුවලට මෙසේ ජලය ලැබෙන්නේ දෙවියන්ගේ බලයෙනැයි සෑම ගොවියෙක්ම සිතීය. දෙවියන් තම කුඹුරු උදෙසා මේ යුතුකම ඉටු නොකළහොත් තම පිටගොඩු බීදෙන තරමට සිය කුඹුරුවලට වතුර අදින්නට සිදුවෙතියි ද ඔවුහු සිතූහ. දූන් ඔවුන් එබඳු කරදරයකින් මිදුනා

Scanned by CamScanner

නිසා එක් එක් ගොවියෙක් තම තම ගෙවලට වී ප්‍රීති වූයේය. උදෑසන ඔවුනතර ඇතමෙක් ගෙවලට රොක්වී තේ බොමින් කල් ගෙවූහ. ඇතමෙක් තෙල් කරදසිවලින් සෑදූ කුඩ ඉහලා ගෙන නිල්වන් ගොයම් පැලපත බලමින් කුඹුරු අතරින් ගමන් කළහ. සකසුරුවමෙහි සූර ගෙවිලියෝ වැස්සේ ගෙවලට වී සපත්තු මැසූහ, ඉරුණු ඇඳුම් සකස්කළහ, අළුත් අවුරුද්දට සූදනම් වූහ.

එහෙත් මේ ගැමියන් අතර ගෙදරින් පිටත ඇවිදින්නට නොගියේ වං ලුං හා ඔහුගේ බිරිය පමණකි. මේ මුළු ගමෙහිම තිබුනේ ගෙවල් දෙළහකි. ඒ හැම ගෙයකටම වඩා ඉසුරෙන් හා සැපතින් පිරී තිබුනේ වං ලුං ගේ ගෙයයි. සෙස්සන් හා කුළුපග බවක් ඇතිකර ගැනීමට වං ලුං අකමැතිවූනේ සෙස්සන් තමාගෙන් ණයතුරුස් ඉල්ලතියි සිතූ නිසාය. අළුත් අවුරුදු උළෙල ළඟ ළඟම එන නිසාත් තමන්ට වුවමනා කරණ ඇඳුම් පැලඳුම් මස්සවා ගැනීම් ආදී කටයුතු සඳහා මුදල් අග හිඟයෙන් පෙලුන ගැමියන් තමාගෙන් ඒකාන්තයෙන් ම ණයතුරුස් ඉල්ලන නිසා ඔවුන් හමුවීමටද ඇති නොකමැත්තෙන් වං ලුං ගෙයිම රැඳුනේය.

මේ කාලය තුළ ඕ ලෑං තමන්ගේ පැරණි ඇඳුම් සකස් කිරීම් ආදී කටයුතුවල යෙදුනාය. වං ලුං ද ගොවිතැනට අවශ්‍යවන උප කරණ පරීක්ෂාකොට ඒවා සකස් කරගත්තේය. ඔහු රේක්ක සාදගෙන තිබුනේ උණපතුරු වලිනි. එහි බුරුල්වුන බැමි ඔහු අළුත්වැඩියා කරගත්තේ තමා ම වගාකළ තෘණ වර්ගයකින් ඇඹරූ නූල්වලිනි. රේක්කවල කැඩීගිය ගෙවීගිය දත් යළිත් සකස් කර ගත්තේ අළුත් උණපතුරු වලිනි.

වං ලුං ගොවිඋපකරණ සකස් කරගත් අයුරින්මය ඕ ලෑං ගෙයි උපකරණ සකස් කරගත්තේ-අළුත්වැඩියා කරගත්තේ. වතුර කාන්දුවෙමින් තිබුන කබල් කළයක් වුවද ඇය වෙන ගැහැණුන් මෙන් වීසි නොකළාය. එය අළුත් කළයක් මෙන් සකස් කර ගත්තේ, ඒ බිඳුන, සිදුරුවුන තැන්වල මැටි අනා ගා පුළුස්සා ගැනීමෙනි.

මේ දෙමහල්ලෝ එකිනෙකාගේ වැඩට සහාය වෙමින් ප්‍රීතිමත් වූහ. එහෙත් ඔවුන් කතාකළේ නම් සීමාසහිත වචන ගණනකි.

Scanned by CamScanner

"උඹ අර ලොකු මල්ලෙ තියෙන වී බිත්තරට තිබ්බද?" නැතහොත් "අපි තිරිඟු පිදුරු විකුණල බෝංචි දඩු ටික විතරක් දරට ගනිමු" යන වචන කීපයක් කලාතුරකින් පැවසූ වං ලුං ඇතැම් විට "මේ ඉඳිඅප්පන් හොඳය"යිද කියන්නේ කෑමට ගිය විටය. "අළුත් හාල්වල පිටිවල හොඳකම නිසා" යයි කියමින් ම ඇයද ඔහුට පිළිතුරු දීමට අමතක නොකරයි.

මේ සම සෞභාග්‍ය වර්ෂයේ අස්වැන්නෙහි සරුසාර කම නිසා වුවමනාවටත් වැඩිතරම් රිදී ඩොලර් කීපයක් ඉතුරු කරන්නට ඔහුට හැකිවිය. ඔහු එය තම පටියෙ ද තබා ගන්නට බියවූයේය. එතරම් මුදලක් තිබෙන බව තම බිරියට හැර වෙන කිසිවෙකුට නොකියා රහසක් මෙන් තබාගත්තේය. මේ දෙමහල්ලෝ එකතුව ඒ කාසි සඟවන අයුරු රහසිගතව සාකච්ඡා කළහ. අන්තිමේදී ඔව්හු කිසියම් තීරණයකට එළඹුනාහ. ඇය කාමරයේ ඇඳ ලඟ බිත්ති මුල්ලෙහි වළක් හෑරුවේ එහෙයිනි. වං ලුං ඒ වළට රිදී කාසි ටික දැමූ පසු ඇය පස් පිඩැල්ලකින් වළ ආවරණය කළාය. ඉන්පසු මේ දෙමහල්ලන්ට පොහොසත් බවෙහිත් අරපරෙස්සමෙහිත් හැඟීමක් ඇතිවුනි. එබඳු හැඟුමක් ඔවුන්ට ඇතිවුනේ තමන් සතුව විශාල මුදලක් තිබුන නිසාය. වං ලුං එතැන් පටන් තම මිතුරන් අතර හැසුරුණේ මහත් සහනයකින් යුතුවය.

Scanned by CamScanner

අලුත් අවුරුද්ද එළඹුනේය. එහෙයින් සැම ගෙයක්ම එයට සැරසුනි. වං ලුං ද නගරයේ ඉටිපන්දම් වෙළෙන්දගේ කඩ යට ගොස් රතු කරදසි ටිකක් මිලදී ගත්තේ මේ දවස්වලය. ඒ කරදසිවල රත්රන් අකුරින් මුද්‍රිතවූ ආශිර්වාදත්මක වාක්‍ය ද තිබුණි. වං ලුං නව වර්ෂයේ සෞභාග්‍යය කැඳවන්නට මේ කරදසි ඇලෙව්වේ සිය ගොවි උපකරණ වලය. නගුලෙහිද වියගසෙහිද කුඹුරට වතුර හා පොහොර ගෙනයන පනිට්ටුවලද එක් එක් කරදසිය බැගින් අලවන ලදී. එසේම ඔහු ගෙයි දොරවලද ආසිරි වැකි සහිත කරදසි තීරු ඇලෙව්වේය. ගෙයි උළුවස්ස මත අලවා තිබුනේ මලක්මෙන් කැපූ රතු කරදසියකි. සිය දෙවොලෙහි දෙව් රූ දෙකටද අලුත් ඇඳුම් පිළියෙළ කිරීමට ඔහු කරදසි මිලදී ගෙන තිබුණි. මහල්ලා සිය අතින් ඒ ඇඳුම් පිළියෙළ කළ පසු ඒවා ගෙනගොස් දෙව් රූ දෙකට ඇන්දෙව්වේ වං ලුං ය. එහිදී ඔහු නව වසර වෙනුවෙන් දෙව් රූ හමුවෙහි සඳුන්කූරු දල්වන්නටද කිසිකලෙකත් අමතක නොකළේය.

ඔහුගේ ගෙදර ද දෙව් රුවක් වෙයි. මේ දෙව් රුව අලවා තිබෙන්නේ මැද කාමරයෙහි තබා ඇති මේසයට ඉහලින් බිත්ති යෙහිය. කලින් දිනයෙහි නගරයට ගොස් රතු ඉටිපන්දම් දෙකක්ද මිලයට ගෙන තිබුනේ අලුත් අවුරුදු ද මේ දෙව් රුව හමුවෙහි දල්වීමටය. ඔහුට යලිත් වරක් නගරයට යන්නට සිදුවුනේ ඌරු තෙලුත් සුදු සීනිත් මිල දී ගැනීමටය.

Scanned by CamScanner

වං ලුං ගේ බිරිය ඒ තෙල් සුදුපාටට සිනිඳුවන සේ සකස් කොට, එයට හාල්පිටිද යොදගත්තාය. මේ පිටි අඹරන ලද්දේ ඔවුන්ගේ සහලින් ඔහුන්ගේම ඇඹරුම් ගලෙහිය. ඔව්හු ඇතැම් විටක මේ පිටි ඇඹරීමට ඔවුන්ගේ ගොණාගේ සහායයද සෙවූහ. මෙසේ අඹරාගත් පිටිවලට සුදුසීනිද කවලම් කොට ඇය එයින් පිළියෙළ කෙළේ ''හඳකැවුම්'' නමින් හඳුන්වනු ලබන අළුත් අවුරුදු කැමකි. ''ත්වෑං'' මැදුරෙහි නම් මේ කැවුම් දෛනික ආහාරයටද ඇතුළත් වෙයි.

ඕලෑං මේ කැවුම් තැම්බීමට සූදනම් කර මේසය මත පෙළට තැබූ විට වං ලුං ගේ හදවත ආඩම්බරයෙන් පිරෙන්නට වූයේ තම බිරිය විසින් පිළියෙළ කළ මේ කැවුම් වර්ගය සෑදීමට මේ ගමෙහි අන් ගැහැණියක සමත් නොවෙතියි සිතූ නිසාය. ඇය විසින් මේ පිළියෙළ කෙළේ උසස්පෙලේ අය අනුභව කරණ කැවිලි වර්ගයකි. මේසය මත පේළියට තැබූ ඒ කැවුම් අතර ඇතැම් කැවුම් රසවත් වන්නටද අලංකාර වන්නටද ඇය යොද තිබුනේ වියලි මුද්දරප්පලම් වැනි දෑත් පාටමුසු පිටියෙන් සෑදූ මල්ලියකමුත්ය. වං ලුං ඒ කැවුම් දෙස බලා,

''මේවා කන්නත් ලෝබය''යි කීවේය.

නොයෙක් පාටවර්ග වලින් තුටුවන දරුවෙකු මෙන් ඒ කැවිලි වර්ගය දූක සතුටට පත් මහල්ලාද මේසය අවට කරකැවුනේ

''උඹේ බාප්පටත්, එයාගෙ දරුවන්ටත් කතා කරහන්කො. ඒගොල්ලොත් බලාපුවාවෙයි'' කියමිනි. පරීක්ෂාකාරීවූන වං ලුං තම පියාගේ ඒ යෝජනාවට අකමැතිවුනේ කෑදර මිනිසුන් කැවිලි වර්ගදෙස බැලීමෙන් සිදුවන දෙය දන්නා නිසාය. එහෙයින් ඔහු ''අළුත් අවුරුද්දට කලින් කැවිලි දිහා බලන එක අගුණය''යි එක වරටම කීවේය. මේ අතර සහල්පිටිවලින් හා තෙලින් වැකුන අත්වලින් යුතුව ඕලෑංද ඔවුන්ගේ ඒ කතාවට එකතු වුනේ ''මේව අපිට කන්න නොවෙයි. ඔය වාමෙට හඳුපු ජ්වයින් එකක් දෙකක් අමුත්තන්ට දෙනව. මේ වගේ කැවුම් කන්න තරම් පොහොසත් කමක් කොයින්ද අපට ? මෙකත් මම මේ හදන්නෙ අවුරුද්ද පහුවෙල දෙවෙනි දවසෙ මේ දරුවන් අරගෙන අර නාකි නෝන ළඟට යන කොට ගෙනියන්නයි.'' යන වචන පවසමිනි.

Scanned by CamScanner

ඇයගේ කථාව නිසා කැවිලි වර්ගවල අගය තව තවත් වැඩිවුනේය. ප්‍රමෝදයට පත් වූන වං ලූං මෙසේ ද සිතුවේය.

''ඇය වරක් දසියක්ව සිටියෙ ඒ මහ ගෙදර. ඒකට මොකද ඇය රතුවතින් සැරසුන තම දරුවත් මේ රස කැවිලිත් අරගෙන අමුත්තෙකු වසයෙන් හෙට අනිද්ද එහේ යාවි.''

මේ අළුත් අවුරුද්දෙහි ඔහුට තිබුන වැදගත්ම ගමන මෙයයි. එහෙයින් ලඟදී මැසූ අළුත් කපු කබාය ඇඟට ද ගනිමින් ඔහු තමාටම මෙසේ කියා ගත්තේය.

''මම ඒගොල්ලන්ව අර මහගෙදරට එක්කරගෙන යනකොට අඳින්නෙ මේක තමයි.''

අළුත් අවුරුද්දේ පළමුවෙනි දිනය එළඹුනේය. වං ලූං ගේ බාප්පාද අසල් වැසියෝද කා බී සැනසී තමාටත් තම පියාටත් සුභපැතීමට එහි පැමිණියහ. ඔවුන්ගේ පැමිණීමට වං ලූං දක්වූයේ මසුරු කමකි. මේ අතර ''මේවා පෙනෙන්නට තිබුනොත් කාට කාටත් දෙන්නට වේය'' යි සිත සිතා වං ලූං බිරිය විශෙෂයෙන් පිළියෙළ කළ කැවුම් පෙට්ටියකට දැමුවේ වං ලූං ගේද උදව් ඇතිවය.

අමුත්තෝ වාමට පිසූ කැවුම්වල රස විඳ විඳ ඒවා සකස් කළ ඕ ලෑං ට මුව නො සෑහෙන සේ ප්‍රශංසා කළහ. එවිට වං ලූං ''උඹල අනික් ඒවත් දැක්ක නම්'' යයි නොකියා සිටියේ මහත් අමාරුවෙනි, මහත් අසීරුවෙනි.

අළුත් අවුරුදු දින අවසානයෙහි හොඳට කාබී ප්‍රීතිමත්ව නින්දට ගිය වං ලූං පවුලෙහි ඇත්තෝ දෙවන දිනයෙහි උදෑසනම පිබිදුනාහ. මෙසේ ඔවුන් නින්දෙන් පිබිද සූදනම් වූනේ එදින යායුතු ගමන යන්නටය. ඕ ලෑං, තමා විසින්ම මැසූ රතු පොඩිති කබායත් කොටි හමින් මැසූ පොඩිති සපත්තු දෙකත් දරුවාට ඇන්දෙව්වාය. පරණ අවුරුද්දේ අන්තිම දවසෙහි වං ලූං විසින් ම දරුවාගේ හිස පළමු වරට මුඩුකරන ලදී.

ඇය ඒ හිස මත රත්රන් නූලෙන් මැසූ බුදුරුවක් සහිත රතු හිස් වැස්මක් දැමුවාය. මෙසේ ඇඳුම් අන්දවනු ලැබූ දරුවා ඇඳ මත තබනු ලැබ සිටිද්දී වං ලූං ද වහ වහා හැඳ පැලඳ ගත්තේය. ඕ ලෑං සිය කෙස් වැටිය පීරා බැඳගෙන සිය සැමියා විසින් මිලයට ගෙන දුන් රිදී ගාපු තඹ කුර ද ගසා ගත්තාය. ඇය හැඳගත්

අළුත් කබාය ද පිළියෙළ කොට තිබුනේ වං ලුං ගේ අළුත් කබාය මැසූ රෙදි වර්ගයෙන්ම ය.

ඉන්පසු වං ලුං සිය දරුවාත් ඕලෑං කැවිලි පෙට්ටියත් ගෙන ගමන් කළෝ ශීත සෘතුව නිසා මුඩුව ගිය වෙල්යාය මැදින් වැටුන අඩි පාර ඔස්සේය. මහ ගෙදර – ''හ්වෑං'' මැඳුරෙහි ගේට්ටුව වෙත ළඟා වුන විට තම අදහස මුදුන් පත් වුනාක් මෙන් වං ලුං ට වැට හුණි. ඕලෑං විසින් විමසනු ලැබූ මුරකාරයා ඔවුන් දෙස මහත්සේ ඇස් විදහා බැලුවේය. ඉනිගැටය මත කෙස් ගස් කරකවමින් මෙසේ ද කැගැසුවේය.

''හා! වං ගොවි මහත්තයෝ! එක්කෙනා වෙනුවට මේ ගමන තුන් දෙනෙක්ම මේ ඇවිල්ල ඉන්නෙ.''

යලි ඔවුන් ඇඳ පැළඳ සිටි අළුත් වස්ත්‍ර ද ඔවුන්ගේ පිරිමි දරුවා ද දෙස බැලූ මුරකාරයා පැවසුවේ ''හා! අපි ඉතින් ඔබට ප්‍රාර්ථනා කරන්නෙ මොනව ලැබෙන්න කියල ද? ඕන කරන සියළුම දේවල් ඔබට ලැබිල තියෙනව'' යන වචනයි. තමාට සමාන නොවන අයෙකුට කථා කරන්නා සේ ''හොඳ අස්වැන්න! හොඳ අස්වැන්න!!'' යයි කියමින් නො සැලකිලිමත්ව මුරකාරයාට පිළිතුරු දුන් වං ලුං ධෛර්‍යමත්ව ගේට්ටුවෙන් ඇතුළු වුණේය. තමා දුටු ඒ සියල්ලෙන් විස්මයට ද සැලකිලිමත් බවට ද පත්වුන මුරකාරයා ''මං එහෙනං ඔබේ බිරියයි දරුවයි ඒ නෝනට පෙන්නල එක්කර ගෙන එනකං ඔබ මගේ මේ දුප්පත් කාමරේට වෙලා වාඩි වෙලා ඉඳගන්න'' යයි වං ලුං ගෙන් ඉල්ලුවේය.

ඔහුගේ ඉල්ලීම අනුව වං ලුං ඒ කාමරයට එකවරටම නො පිවිස සිටියේ පොහොසත් ගෙදරක ප්‍රධානයෙකුට තෑගි බෝගත් රැගෙන මිදුල් හරහා ගමන් කරන තම බිරියත් දරුවාත් දෙස බලමිනි. ඔවුන් දෙස බලා සිටීම පවා ඔහුට ගෞරවයක් විය. මිදුල් කීපයක් පසු කළ ඔවුන් නොපෙනී යත් ම ඔහු මුරකාරයා ගේ ගෙට ගොඩ වුණේය. එහිදී ඔහු මුරකාරයාගේ වසූරි කැළලින් විරූප වූ බිරිය විසින් පෙන්වනු ලැබූ මැද කාමරයේ මේසයේ වම් කෙළවරේ පැන වූ ගෞරවණීය අසුනෙහි හිඳ ගත්තේය. මඳ වේලාවකට පසු ඇය විසින් පිළිගැන් වූ තේ භාජනය ද තිය වනා පිළිගත්තේ ය. එහෙත් ඔහු එය පානය

නොකොට තමා ඉදිරියෙහි තබා ගෙන සිටියේ එහි වූ තේ කොළ වර්ගය "තමාට සුදුසු නැතැ"යි සිතුවාක් මෙනි.

තම බිරිය ද දරුවා ද කැටුව මුරකාරයා ආපසු පැමිණෙන විට බොහෝ වේලාවක් ගතවුනාක් මෙන් ඔහුට දැනුනේය. "සියල්ල යහතින් සිදුවුණාද"යි විමසන්නට ඔහු සිය බිරියගේ මුහුණ දෙස බැලුවේය. ඒ හැඟීම් විරහිත ඇගේ හතරැස් මුහුණෙහි කිසිදු වෙනසක් ඔහුට පළමු වරට දැකිය හැකි නොවීය. එහෙත් එහි සුළු වෙනසක් පිළිබිඹු වී තිබුන අයුරු වැටහුණේ මඳ වේලාවකට පසුවය. එහි පිළිබිඹු වී තිබුනේ ද සෑහීමකට පත්වීම පිළිබඳ හැඟුමකි. එහෙයින් ඔහු එක වරටම නො ඉවසිලිමත් වූයේය. ඉක්බිති ඔහුට වුවමනා කෙළේ "ඒ මහගෙදර ඇත්තන් විසින් ඇය පිළිගනු ලැබුවේ කෙසේද?" යන්න දැන ගැනීමට ය. එම වුවමනාව විසින් මෙහෙයනු ලැබූ ඔහු, පොඩිවුණු කබාය ද හැඳගෙන තද නින්දේ හුන් තම දරුවා ද සියතට ගෙන මුරකාරයාගේ ගෙයින් නික්මෙන්නට සැරසුනේ මුරකාරයාට ද ඔහුගේ කැලැල් සහිත බිරියට ද හිස නමා ආචාර කරමින් ය. සිය බිරිය තමන් පසුපස ගමන් කරද්දී ඔහු "ඉතින්" යයි නො ඉවසිලිමත්ව ආපසු හැරී ඇයට කතා කෙළේය. ඇගේ නො ඉක්මන් කම නිසා ඔහුගේ ඉක්මන්කම තව තවත් වැඩිවුණි. මඳ වේලාවකට පසු ඇය ඔහුට ළංවී ඔහුගේ කණට කොඳුලාය.

"මම නං හිතන්නෙ ඒ මහගෙදරට දැන් නරක දසාවක් ලබල වගෙයි."

මෙසේ ඇය කොඳුලේ ද බියෙන් ගැහෙමිනි. ඇය දුටු ඒ ගෙදර ඒ තත්වය "දෙවිවරුන් කුසගින්නෙන් – අග හිඟයෙන් – දුක් කරදර වලින් පෙළීම තරම්" පීඩාවක් ඇය තුළ ඇති කෙළේය.

"මොකොද එහෙම කියන එකේ තේරුම?" යයි අසමින් වං ලුං ඇය පෙළඹ වූයේය. එහෙත් ඇය එබඳු පෙළඹවීම් වලින් ඉක්මන්වන ගැහැණියක් නොවේ; ඇය මෙසේ වචන කටින් පිට කළේ වචනය නම් එක එක තෝරා අමාරුවෙන් පිට කළ යුතු දෙයක් හැටියට සැලකූ එකියක් මෙනි.

"අර වයසක නෝන, මේ අවුරුද්දෙ ඇඳල ඉන්නෙත් ගිය අවුරුද්දෙ ඇඳල හිටිය ඒවමයි. වෙන මොනම අවුරුද්දකවත් ඒ ගෙදර එහෙම දෙයක් දකින්න ලැබුනෙ නැහැ. දසියොත් ඇඳ

ගෙන ඉන්නව දක්කෙ පරණ ඇඳුම්මයි. ඒ එකියකටවත් තිබුනෙ නැහැ මට තරම් ලස්සන කබායක්. අර මහළු රදළයගෙ එක ගැහැණියකටවත් හිටියෙ නැහැ මගේ දරුව තරම් ලස්සන රූපයක් ඇති හොඳ ඇඳුම් අන්දවපු දරුවෙක්.''

මේ වචන කියාගෙණ යද්දී ඇයගේ මුහුණෙහි කුඩා සිනහ රැල්ලක් ද නැගුනි. වං ලුං ද මහ හඩින් සිනාසී සිය දරුවා ආදර යෙන් තුරුළු කර ගත්තේය. තමා කොතරම් වාසනා වන්තයෙක් ද? යන හැඟීම සමග ඔහු තුළ භීතියක් ද හටගති.

''අනේ මම වගේ මෝඩයෙක්. අහසෙ ගමන් කරණ භූතයන්ටත් පෙනි පෙනී මේ ලස්සන දරුව එලිමහනෙ අරං ඇවිදින එක මහ මෝඩකමක්''යයි ඔහු සිතුවේය. එසේ සිතා ඔහු සිය කබාය විවර කොට, දරුවගේ හිස ලයට තද කර ගෙන යලි ශබ්ද නගා කතා කෙළේය.

''කොච්චර නරකද අනේ මේ දරුව ගෑණු දරුවෙක් උන එක? ඒ මදිවට මේ වසූරියත් හැදිල කැතවෙල බලන්නත් අමාරුයි. අපි දෙවියන්ටවත් කියමු මේක මැරෙන්නෙයි කියල.''

''ඔව්! ඔව්'' යනුවෙන් ගැහැණිය ඉක්මන්ව පිළිතුරු දුන්නී. තම දරුවාට යොමුවිය හැකි වස් දෙස් වළක්වන්නට ඔහු කියූ වචන තේරුම් ගෙනය.

දරුවාගේ ආරක්ෂාව පිළිබඳව මෙපමණකින්ම තෘප්තියට පත් ඔහු යලිත් ඇයගෙන් විමසුවේය.

''ඔය ගොල්ලො ඔහොම දුප්පත් උනේ කොහොම ද? කියල සොයා ගත්ත ද?''

''මට ඒ ගෙදර ඉන්න කුස්සියෙ අම්ම එක්ක කතා කරන්න උනේ ටික වේලාවයි. මේ ගෙදර ඉලන්දරි නිසා වැඩිකල් පල දෙන්නෙ නැතෙයි කියල ඇ කිව්ව. ඒ ඉලන්දරි පස්දෙනා පිටරට වල ඉඳගෙන, අහක දන වතුර වගේ, සල්ලි වියදම් කරනවලු. රටේ ඉන්න ගෑණු ඒ ගොල්ලන්ට මදිලු. ගෙදර ඉන්න නාකි රදළ නැනටත් ගෑණුන්ගෙන් සෑහීමක් නැතිලු. අර නාකි මහගෙත් සපත්තු දෙකක පිරවිය හැකි තරම් රත්තරන් වල වටිනාකමට අබිං කනවලු එක දවසකට.''

''අනේ හැබෑට ඔය ඇත්ත ද?''

''ඉතින් තුන්වෙනි දියණියත් ලබන වසන්තයෙදි කසාද

බඳිනවලු.'' ඇගේ දැවැද්දටත් කුමාරයෙකුට තරම් මුදලයක් ඕනලු. ඇගේ මංගල ඇඳුම් වලට ගන්නෙ සූචොව් හා හැන්චොව් නගර වල වියාපු හොඳම සැටින් තමයි. ඇගේ ඇඳුම් මහන්න ෂැංහයි නුවරින් ඇඳුම් මහන්නෙක් ගෙන්නවනවලු. ඔහුත් සමග තවත් සහකාරයෙකුත් එනවලු. ඈ මේ ඇඳුම් මෝස්තරය සකස් කරන්නෙ ලෝකයේ කිසිම රටක ගැහැණියකගෙ ඇඳුම් මෝස්තරයකට දෙවෙනි නොවන්නලු.''

''ඉතින් ඔච්චර සල්ලි ගොඩක් වියදම් කරල එයා ඔය බඳින්නෙ කාවද''යි වං ලුං විමසුවේ ප්‍රීතියටත්, එතරම් සල්ලි ගොඩක් වියදම් කිරීම ගැන භීතියටත් පත් වෙමිනි.

''ඇය බඳින්නෙ ෂැංහයි නුවර නඩුකාරයෙකුගෙ දෙවෙනි පුතාචය''යි ඇය කීවාය. මේ වචන කීමෙන් පසු බොහෝ වේලාවක් නිශ්ශබ්දව ගමන් කළ ඇය යලිත් කථා කළාය.

''ඔවුන් දැන් දුප්පත් වෙගෙනයි යන්නෙ. අර නාකි නෝන මාත් එක්ක කිව්ව ඒගොල්ලො ඉඩම් විකුණන්නත් සූදනම්ව ඉන්නවයි කියල. ඒ විකුණන්නෙත් ඒගොල්ලන්ගෙ ගෙට දකුණු පැත්තෙ නගරෙ පවුර ළඟම තියෙන ඉඩම්. හැම අවුරුද්දකම ගොවිතැන් කරන ඒ ඉඩම් හරිම සරු සාරයි. නගරෙ පවුර වටේ තියෙන දිය අගලෙන් ඒවට වතුර ගන්නත් හරි ලේසියි.''

''මොනව ඉඩම් විකුණන්න! ඇත්තෙන්ම එහෙනං දුප්පත් වෙලා තමයි. ඉඩම් තමයි මිනිහෙකුගෙ ලේ හා මස්'' යයි විශ්මිතව කියූ ඔහු මොහොතක් කල්පනා කෙළේය. හදිසියෙන් ම ඔහුගේ සිතට අදහස් පැන නැගුණි. ඔහු තම හිසෙහි පසෙකට අත්ලෙන් ගසා ගෙන ගැහැණිය දෙසට හැරුණේය.

''හිත හිතා ඉඳල වැඩක් නැහැ. අපි ඒ ඉඩම සල්ලි වලට ගණිමු''යි ඔහු ශබ්ද නගා කීවේය.

ඉන්පසු ඔහු ප්‍රීතියෙනුත් ඇය විශ්මයෙනුත් එකිනෙකා ඔවුනොවුන් වෙත බැලුම් හුවමාරු කර ගත්හ.

''නමුත් ඉඩම්—ඉඩම්'' යයි කියමින් යලිත් ඇය ගොත ගැසුවාය. ''මම ඒව ගන්නවමයි'' ඔහු උස් හඬින් පැවසීය. ''ඒ ඉඩම් දුර වැඩි'' යයි ඇය කීවෙ ඔහුගේ යෝජනාව ප්‍රතික්ෂෙප කරන්නට මෙන්ය. තව දුරටත් කථාකළ ඇය ''දවසෙන් බාග යක් මේ ඉඩම් වලට යන්නට ගත වේවි'' යයි ද පැවසුවාය. ''මම

Scanned by CamScanner

ඒක ගන්නවාම'' යයි ඔහු නැවතත් කොඳුරමින් කීවේ තමන් සමග අමනාප වූ මවක ගෙන් නැවත නැවතත් යමක් ඉල්ලන පොඩි දරුවෙකු මෙනි.

එහෙත් ඇය ශාන්තව ඔහුගෙන් මෙසේ විමසුවාය.

''සල්ලි මැටි බිත්තිවල දනවට වැඩිය හොඳයි ඉඩම් ගන්න එකනං. ඇයි අර බාප්පගෙ ඉඩම් කෑල්ල ගත්තහම නරකද? අර අපේ බස්නාහිර පැත්තෙ කුඹුරට අල්ලපු එයාගෙ ඉඩම විකුණනවයි කියල කොච්චරවත් කෑගහනව නෙව.''

''අනේ අනේ! බාප්පගෙ ඉඩම් නම් මම ගන්න කැමති නැහැ. පසුගිය විසි අවුරුද්දෙම නිකං ඔහේ අස්වැන්න අරගෙන තියෙනව පෝර ටිකක් වත් දන්නෙ නැතුව. ඒ කුඹුරෙ පස් හරියට හුණු වගෙයි. නැහැ කොහොමහරි ගන්නව නම් ගන්න ඕන අර ''හ්වැං'' මැඳුරෙ ඉඩම තමයි.''

ඔහු ''හ්වැංලගෙ ඉඩම'' යයි කිව්වෙ ''ච්ංලගෙ ඉඩම'' යයි කියන්නාක් මෙන් සාමාන්‍ය වශයෙනි. ඒ අහංකාර – නාස්තිකාර මහගෙදර අයට වඩා තමා උසස් යයි ඔහුට හැඟුණි. එහෙයින් ඔහු රිදී කායි ද රැගෙන මහගෙදරට ගොස් ''මා ළඟ සල්ලි තියෙනව. ඔබ විකුණන ඉඩම් වල මිල කීයද?'' යන ආදී වචන මහළු රදළ තැනගේ නියෝජිතයා ඉදිරියෙහි කියන්නාක් මෙන් ඔහුට ඇසෙන්නට වුනේ ඔහු සිත තුළ නැඟුණු හැඟුම් වල වේගවත් බව නිසා ය.

''මින්පසු ඒ අහංකාර පවුලේ කුස්සියෙහි වහලියක්ව සිටි ඒ ගැහැණිය බිරිය වන්නේ ඒ මැඳුරෙහි ම ඉඩම් මිලදී ගත් ඉඩම් හිමියෙකුට'' යයි ද ඔහු සිතුවේය. ඇය ද ඔහුගේ මේ අදහස් තේරුම් ගත්තා සේ විරුද්ධත්වය එක්වරට ම නවත්වා මෙසේ කීවාය.

''එහෙනං ඒව ගනිමු. කොහොමටත් කුඹුරු හොඳයි නේ. අගලත් ළඟ නිසා වතුර පහසුවත් තියෙනව. හැම අවුරුද්දකම ඒක සහතිකයි.''

නැවත ද මඳ සිනා රැල්ලක් ඇගේ මුහුණෙහි නැගුණි. එයින් ඇගේ අඳුරුවත් දෙනෙත් ආලෝකවත් වුනි. බොහෝ වේලාවක් පැවති නිහඬ බව ඇය යලිත් කඩ කෙළේ ''පසුගිය අවුරුද්දෙ මම ඒ ගෙදර මෙ වගේ දවස්වල දසියක් ය'' යන බසිනි. මෙසේ යලිත් නිහඬවුන ඒ දෙමහල්ලෝ සිතිවිලි වලින් බරව ගමන් කළහ.



වං ලුං ගේ ජීවිතය බොහෝදුරට වෙනස් වුනේ මේ ඉඩම් ඔහුට අයත් වන්නට ගිය නිසාය. ඔහු පළමු කොට කෙළේ බිත්තියට යට කළ රිදී කාසි එයින් පිටතට ගෙන මහගෙදරට ගෙන යාමය. එහිදී රදළ තැන හා සමානව කථා කරන්නට ලැබීමද ඔහුට ගෞරවයක් මෙන්ම ප්‍රීතියකි. ඔහුට තරමක ශෝකී හැඟීමක් ඇතිවුනේ එතෙක් රිදී කාසි වලින් පිරී තිබුන බිත්තියෙහි කපොලු හිස්වෙන බව මතක් වුනා විටය. මේ මුදලෙන් පිට ඉඩම් ගන්නවාට වඩා තමා ළඟම තබා ගැනීම හොඳයයි ද ඔහුට සිතුනි. යළි යළිත් මේ ඉඩම් ගැනීම ගැන ඔහු සිත පසු බාන්නට වුනේ ඒ ඉඩම් වලට මුළු ශක්තියම යොදන්නට සිදුවන නිසාත් සිය බිරිය මතක් කළ පරිදි ඒ ඉඩම් බොහෝ දුරින් පිහිටා තිබෙන නිසාත්ය. ඇත්ත වශයෙන්ම මේ ඉඩම් මිලයට ගන්නට අදහස් කිරීමෙහි දී සිතාහුන් තරම් විජයග්‍රහණයක් ඔහුට නම් අත් නොවුනි.

වං ලුං එද රදළ ගෙදරට ගියේ උදයකය. කල් වේලා ඇතිව එහි ගිය ඔහුට මධ්‍යාහ්නය වනතුරු එහි නතර වන්නට සිදුවුනි. මධ්‍යාහ්නය ළංව තිබෙද්දී ත් රදළ තැන නිදගත්තේය. නොඉවසිලිමත්වූ වං ලුං මුරකාරයා වෙත ගොස් උස් හඬින් කථා කෙළේය.

"අනේ මේ රදළ තුමාට කියන්න මම වැදගත් කටයුත්තකට මුදල් ලැබෙන විදියෙ ජාවාරමකට ඇවිල්ල ඉන්න බව."

"මේ ලෝකය තරමට වටිනා මුදලක් දෙනවයි කිව්වත් මම නම් ඔය නාකි කොටියට කුද්දන්න කැමති නැහැ. එයා ඔය නිදගෙන ඉන්නෙ එයාගෙ අළුත් ගැහැණියත් සමග-අඹමලීත් සමග.

ඒකි ගෙතැවිත් වෙන්නෙ අදට දවස් තුනයි. එයාට කුද්දන එක එතරම් පොඩි වැඩක් නෙවි. ඒක හරි බයානක වැඩක්'' යයි මුරකාරයා වහා උත්තර දුන්නේය. යලිත් ඔහු තම ඉනි ගැටය මත කෙස් රොද කරකවමින් තරහ ගතියක් පාමින් මෙසේද කීවේය. ''හිතන්න නම් එපා ඔය මුදල් වලින් එයා නැගිට්ටෙව්ව හැකියි කියල. එයා උපන් ද සිට සල්ලි අහගාපු මිනිහෙක්.'' අවසාන යේදී ඔහුට මේ කටයුත්ත බේරුම් කරගන්නට සිදුවූයේ රදළයාගේ නියෝජිත තැන සමගය. ඒ නියෝජිතයා මසුරෙකි-කපටියෙකි. ඔහුගේ ඔඩොක්කුව නිතර පිරී තිබුනේ ගණු දෙනු වලදී යටි මඩි ගැසූ මුදල් වලිනි.

අවසාන මොහොතෙහී ද ඉඩම් වලට වඩා මුදල් වටිනා බව වං ලුං ට සිතුනේය. යමෙකුට මුදල් තිබුන හොත් ඔහුට ඒවා දිලිසෙන හැටිවත් බැලිය හැකි නොවේ දැයි යන හැඟුමද ඔහුට පහළ වුනි. කෙසේ වෙතත් ඔහු ඒ ඉඩම් ගත්තේය. දැන් ඒ ඉඩම්වල අයිතිකාරයා ඔහු ය.

ඔහු මේ ඉඩම් බලන්නට පළමු වරට ගියේ අළුත් අවුරුද්දේ දෙවන මාසයේ අඳුරු උදැසනකය. එතෙක් ඒ ඉඩම් ඔහුට අයත් බව කිසිවෙක් දැන නොසිටියහ. ඔහු එහි ගියේද තනිවමය. නගරයේ පවුර වටා එතුන දිය අගල අසළ පිහිටා තිබුන කළු පසින් යුත් දිගු හතරැස් බිම් කැබැල්ල ඔහු පරීක්ෂා කෙළේ පියවරින්ද මනිමිනි. එය දිගින් පියවර තුන් සියයකි, පළලින් පියවර එකසිය විස්සකි. එහි මායිම් සලකුණු කොට තිබුනේ ''හ්වැං'' නිවාසයේ මුද්‍රාව කෙටූ ගල් සතරකිනි. ඒ මායිම් ගල් වෙනස් කොට තමාගේ නාමය කෙටූ මායිම් ගල් තැබීමට ඔහු ඉක්මන් නොවූයේ ''හ්වැං මැඳුරෙන් ඉඩම් ගන්නට තරම් තමන් පොහොසතෙකැ''යි මිනිසුන්ට පෙන්වන්නට දක්වූ අකමැත්ත නිසාය. තමා මහා ධනවතෙකු වූ විට කළ යුතු දේ කිරීමට ඔහු ඉටාගෙන තිබුනි. ඒ දිගු හතරැස් ඉඩම් කැබැල්ල දෙස බලා ඔහු මෙසේ තමාටම කියාගත්තේය.

''ඒ මහ ගෙදර මිනිසුන්ට නම් මේක ගණනක් නැහැ. නිකම් ම පස් ගොඩක් පමණයි. මට නම් මේක හුඟක් වටිනව.''

යලිත් ඔහුගේ සිත වෙනස් වීය. මෙතරම් කුඩා ඉඩම් කැබැල්ලක් ගැන මෙපමණ හිතට ගැනීම ගැන ඔහු තමාටම අවඥ කරගත්තේය. එද නියෝජිතයා ඉදිරියෙහිදී වං ලුං ඉතා ආඩම්බර

Scanned by CamScanner

යෙන් තමාගේ මුදල් හැලූ විට නියෝජිතයා කියූ ''කොහොම උනත් නාකි තෝනට දවස් කීපයකට සෑහෙන්න අඹිං කෑමට මුදල් මෙතන තියනවා'' යන වචනද ඔහුට සිහිවුනි. එයින් ඔහු වටහා ගත්තේ තමාත් මහ ගෙදරත් අතර ඇති පරතරය, තමන් අබියස පිහිටි දිය පිරුණු අගල තරම්ම-තමන් අබියස සෘජුව-ශක්තිමත්ව-උස්ව නැගී සිටි ප්‍රාකාරය තරම්ම ඉක්මවිය නොහැකි දෙයක් ලෙසය. ඔහුගේ හදවතෙහි ක්‍රොධ සහගත අධිෂ්ඨානයක්ද ගැප්වුනේ ''ඒ බිත්ති කපල්ල නැවත නැවතත් පිදියෙන් පුරවා, ''හ්වැං'' මැදුරෙහි ඉඩම් තව තවත් මිලයට ගෙන මේ ඉඩම් ඉතා සුළු දෙයක්සේ පෙනෙන්ට සලස්වමි''යි යන සිතිවිලි වලින්ද මුසුවය.

මෙසේ මේ ඉඩම් කැබැල්ල, වං ලුං ට සංඥවක් බවට-ලකුණක් බවට පත්විය.

එද වසන්තය පැමිණියේ සැඩ සුලඟද ඉහිරුණ වලාකුළුද රැගෙනය. එහෙයින් වං ලුං ට ශීත සෘතුවේ වැඩ අඩු දවස්, යලිත් ඉතා අසීරු වැඩ අධික දින බවට පත්විය. ඔහුගේ සෑම ඉඩමකම වැඩ අධික විය. මහල්ලා සිය දරුවා බලාගන්නා අතර ගැහැණිය-ඕ-ලැං, සිය සැමියා - වං ලුං ද කැටුව කුඹුරට ගොස් පාන්දර පටන් හිරු බැස යන තෙක්ම වැඩ කළාය. මෙසේ කුඹුරු වැඩෙහි යෙදී සිටින දිනක, සිය බිරිය යලිත් ගැබ් ගෙන සිටින බව වං ලුංට පෙනී ගියේය. මේ පෙනීමෙන් ඔහුගේ සිත තුළ පළමු වරට කෝපාත්මක හැඟීමක් හටගත්තේ මේ අස්වැන්න කපා පාගන සමයෙහි ඇයට වැඩ කරන්නට නොලැබෙන නිසාය. විඩාවෙන් තරහට පත් ඔහු ඇයට මෙසේ හඩ නගා කීවේය.

''උඹ එහෙනං ආයිමත් පැටව් දන්න මේ කාලෙම තෝර ගත්ත නේද ?''

''මේ ගමන ඒක සුළු දෙයක්. පළමු එකා තමයි අමාරු'' යයි ඇය කෙලින්ම ඔහුට පිළිතුර දුන්නාය.

මේ සාකච්ඡාව හැරෙන්නට, ඇගේ සිරුරෙහි මහත දුටු දින පටන් දිනක් ග්‍රීෂ්ම සෘතුවේ උදයක ඇය උදැල්ල බිම දමා ගෙට රිංගා ගත් දිනය දක්වා ඔහු මේ දෙවෙනි දරුවා ගැන කිසිත් සඳහන් නොකෙළේය. දිනක් ඔහු දහවල් කෑමට ද ආපසු ගෙදර නොගොස් කුඹුරෙහි වැඩ කළේ අහස ඝන වලාකුළු වලින් බරව තිබුන නිසා වහ වහා පැසුන ගොයම් කපා මිටි වලට බැඳ එකතු කරගත යුතු වූ

Scanned by CamScanner

හෙයිනි. එහෙත් එම දිනයෙහි හිරු බැස යද්දී ඇය ඔහු වෙත පැමිණියාය.

ඇගේ සිරුර ද කුඩාවී වැහැරී තිබුනි. මුහුණෙහි ස්වාභාවික වසයෙන් පැවති නිශ්චල ගතිය ද අභීත ගතිය ද නොඅඩුව පැවතුනි. ඇය කුඹුරට පිවිසෙත් ම ඔහු අදහස් කෙළේ "අදට උඹට ඔය ඇති. ගිහින් ඇඳේ හාන්සි වෙයන්" යයි කීමටය. එහෙත් විඩාවට පත් ඔහුගේ සිරුරෙහි වේදනා වලින් ඔහුගේ සිතෙහි හටගත් මාද්‍රු-මොලොක් හැඟුම් යටපත් වුනි. ඇය දරුවන් වැදීමෙන් මහන්සියට පත්වූනාක් මෙන්ම තමා කුඹුරේ වැඩ කිරීමෙන් මහන්සියට පත්වුන බව ඔහු තමාටම කියා ගත්තේය. එබැවින් ඔහු තම දැකැත්ත එහා මෙහා නගන අතරම"මේ වාරෙ ගැහැණියක්ද එහෙම නැත්නං පිරිමියෙක් ද?" යන්න පමණක් ඇසුවේය. ඇය එයට නිශ්චලව පිළිතුරු දුන්නී "තවත් පිරිමියෙක්" යන බසිනි.

ඒ දෙමහල්ලෝ එතෙකින් නිහඬ වූහ. ප්‍රීතිමත් වං ලුං ට ගොයම් කැපීමට නොකඩවා නැමී කුදු වී සිටීමද අපහසුවක් නැතිසේ දැනුනි. රන්වන් සැන්දෑ වලා ගැබක් මතුයෙහි හඳ නැගී එන තෙක්ම වැඩ කළ ඔව්හු එද එහි සියළු කටයුතු නිමවා ගෙදර ගියහ. එහෙත් වං ලුං තම දෙවෙනි දරුවා බලන්නට ගියේ, හිරු රැසින් දැවුන සිය සිරුර සිහිල් දියෙන් සනහා ගෙන, කෑම කා තේ ටිකක් ද පානය කිරීමෙන් පසුවය. කෑම පිළියෙළ කිරීමෙන් පසු ඕ‍ලෑං ඇඳෙහි වැතිර සිටියේ සිය බිළිඳා ද පසෙකින් තබාගෙනය. ඒ දරුවා සන්සුන් ය, තරබාරු ය, යහපත් ය. එහෙත් ඔහු පළමු දරුවා මෙන් ලොකු නොවූවෙකි. වං ලුං ඔහු දෙස බලා සතුටුව මැද කාමරයට ගියේ "තවත් පුතෙක්! අවුරුද්දෙන් අවුරුද්දට එකා බැගින්. හැමදටම රතු බිත්තර ගැන කරදර වෙන්න බැහැ. පළමුවෙන් එකාට එහෙම කළහම ඇති" යයි පවසමිනි. "ගෙය වාසනාවෙන් පිරෙන්නට" මේ ගැහැණිය තමාට ලැබුනේ වාසනාවක් නිසා යයි සැලකූ ඔහු තම පියාට කථා කෙළේය.

"ඔන්න තවත් මුනුපුරෙක්. දැන් ඉතින් ලොකු එකාට නිදගන්න දෙන්න තියෙන්නෙ උඹේ ඇඳේම තමයි."

මහල්ලා ඒ බසින් ප්‍රීතිමත් වූයේය. බොහෝ කලක සිට මේ දරුවා ඔහුගේ ඇඳෙහි නිදිකරවා ගන්නට ඔහු ආශා කෙළේය. පොඩිත්තාගේ ලා බාල මසින් - ලෙයින් තම වැහැරුණු ශීතල සිරුර

Scanned by CamScanner

උණුසුම් වෙතියි ඔහු සිතුවේය. එහෙත් දරුවා එයට කැමති නොවෙයි. ළදරු පා වලින් අමාරුවෙන් සිය මව ළඟ සිටගෙන සිටින්නට ද දැන් ඔහුට හැකියි. මෙසේ සිටගෙන ඔහු අළුත් දරුවා දෙසද මහත් ඕනෑකමින් බලයි. තමාට අයත් තැන වෙනකෙනෙකු විසින් අත්කරගෙන තිබෙන අයුරු එවිට ඔහුට පෙනෙයි. එයට විරෝධයක් පළ නොකරණ ඔහු සීයාගේ ඇඳෙහි නිදන්නට එකඟ වෙයි.

අස්වැන්න සරු සාර වූ සමයක් යලිත් එළඹෙයි. වං ලුං ද තම අස්වැන්න විකුණාගෙන ලබා ගත් රිදී කාසි වලින් බිත්තියෙහි කපොලු පුරවයි. ''හ්වෑං'' මැඳුරෙන් ගත් කුඹුරෙන් ලැබෙන වී වලින්, අනික් කුඹුරු වලින් ගත් වී වලින් මෙන් දෙගුණයක් පමණ මුදල් ඔහුට ලැබෙයි. ''හ්වෑං'' මැඳුරෙන් ගත් කුඹුරුවල පස නිතරම තෙත ගතියෙන් යුක්තවිය. එහෙයින් එහි ගොයම් වැවුනේ නුවමනා තැන්වල වැවෙන බට පඳුරු මෙනි. වං ලුං ට මේ ඉඩම් අයිති බව ගමේ සියළු දෙනාම දැනගණිති. එබැවින් ඔහු ගමේ ප්‍රධානියා කිරීම ගැන ද කථාවක් ගමෙහි පැතිරී යයි.

Scanned by CamScanner

වං ලුං මුලදී බියෙන් සිතූ පරිදිම ඔහුගේ බාප්පාගෙන් ඔහුට කරදර ඇතිවන්නට පටන් ගත්තේය. මේ බාප්පා අනිකෙක් නොවේ, වං ලුං ගේ පියාගේ බාල සහෝදරයා ය. ඔහුටත් ඔහුගේ පවුලටත් යැපෙන්නට සෑහෙන ආදායමක් නොමැතිවුන විට වං ලුං ගෙන් මුදල් හදල් කෑම් බීම් ඉල්ලන්නට අයිතියක් තිබුනේ ඒ නෑකම අනුවය. වං ලුං හා ඔහුගේ පියාත් දුප්පත්ව යම්තම් ජීවත් වූ කාලයෙහි මේ බාප්පා ද තම ඉඩම් එහෙන් මෙහෙන් සූරාදමා තමාටත් තම බිරියටත් දරුවන් හත්දෙනාටත් සෑහෙන සේ යමක් උපයන්නට යම්තම් තැතක් දැරුවේය, එහෙත් කෑම ලැබුන විට ඔව්හු වැඩ නොකළහ. ඔහුගේ බිරිය තම නිවස අතුගා ගන්නට තරම්වත් ඇඟ සෙලවීමට කම්මැලිවූ එකියකි. ඔවුන්ගේ දරුවෝ මුහුණෙහි තැවරුණු ඉඳුල් පිසදා ගැනීමට තරම්වත් තැතක් නො ගත්හ. වැඩි වියපත් ගැහැණු දරුවෝ ද කසාද බඳින වයස පැමිණෙන තෙක්ම ගමේ එහා මෙහා දුව පැන ඇවිද්දහ. දුඹුරුවන්වූ කෙස් වැටියවත් පීරා නොගත් ඔව්හු ඇතැම් විට පිරිමින් සමග කතාබස් කරමින්ද කල් ගෙවූහ. ඔවුන්ගේ හැසිරීම වං ලුං ට නින්ද සහගත දෙයක් විය.

දිනක් වං ලුං බාප්පාගේ වැඩිමල් දියණිය පිරිමියකු සමග කතාබස් කරමින් සිටිනු දැක එයින් සිය පවුලට සිදුවන අවමානය ගැන සලකා කෝපයට පත්ව බප්පාගේ බිරිය වෙත ගොස් මෙසේ කීවේය.

Scanned by CamScanner

"දකින දකින පිරිමින් සමග යාළුකම් කරන මගේ නංගි වැනි කෙල්ලක් කසාද බඳින්නේ කවුද? ඈ කසාද බඳින්න සුදුසු වයසට පැමුණුනෙ මීට අවුරුදු තුනකට පෙර. ඒ උනාට ඒකි තවමත් එහා මෙහා දුව පැන ඇවිදිනවා. මම ඔන්න දූන් දූක්ක කවුද රස්තියාදු කාරයෙක් ඇගේ අතින් අල්ලාගෙන ඉන්නව. ඈත් මනමාල හිනාවක් පාල ඒ රස්තියාදු කාරයත් එක්ක කතා කරකර හිටිය."

බාප්පාගේ බිරියගේ සිරුරෙහි කඩිසරව ක්‍රියා කළේ එකම එක අවයවයකි. එය අනිකක් නොවේ; ඇගේ දිවයි. ඇය ඇගේ කඩිසර එකම ආයුධය වං ලුං ට පාවිච්චි කරන්නට සැරසුනාය.

"හොඳයි ඉතින් කවුද ඇවැද්ද දෙන්නෙ? කවුද උන්ගෙ මඟුල් තුලාවලට වියදම් කරන්නෙ? කවුද ඔය කපුවන්ට මිලමුදල් ගෙවන් නෙ? කරගන්න දෙයක් නැතුව හුභක් ඉඩ කඩම් තියෙන–ඕනවටත් වඩා තියෙන මුදල් වලින් තව තව ඉඩම් ලොකු ලොකු ගෙවලුත් ගන්න මිනිසුන්ට නම් ඔහොම කතාකරණ එක අමාරු නැහැ. උඹේ බාප්ප මහ අවාසනාවන්ත මිනිහෙක්. මුලහිටම එහෙමමයි. ඒක එයාගෙ වරදක් නොවෙයි. එයාගෙ කරුමෙ – එයාගෙ කාලෙ හොඳත් නැහැ. අනික් අයට හොඳට අස්වැන්න ලැබෙන කොට එයාගෙ බෝග පොළොවෙ දුපු දුපු තැන්වල මැරිල – විනාශ වෙල යනව. එයාගෙ ගොවිපලවල සාරෙට වැවෙන්නෙ බටපඳුරු තමයි. ඉතින් කොපමණ මහන්සි උනත් ඔච්චර තමයි." ඇය කඳුළු සලමින් මේ වචන ලෙහෙසියෙන්ම පැවසුවේ ශබ්ද නගමිනි. ඇය කෝපය ඇතිකරන්නට වෑයම් කළාය.

එහෙයින් ඇය තම කෙස්වැටිය අදිමින් මුහුණට වැටුන කෙස් ඇද දමමින් ඉතා තදින් කෑගසන්නට පටන් ගත්තාය.

"ආ උඹ දන්නෙ නැහැ මේ කරුමෙ හැටි! නරක කාලෙ! නරක කාලෙ! අනික් අයගෙ කුඹුරුවලින් – හේන්වලින් වී, තිරිඟු ලැබෙන කොට අපට ඒවායින් ලැබෙන්නෙ වල් පැලැටි. අනික් අයගෙ ගෙවල් අවුරුදු සීයක් උනත් පවතිනව. ඔන්න අපේ ගෙවල නම් බිත්තිත් පුපුරල යනව. අනික් අයට ලැබෙන්නෙ පිරිමි දරුවො. මගෙ කුසේ පිරිමි දරුවෙක් අහම්බෙන් හරිගියත් උපදිනකොට උපදින්නෙම ගෑණු දරුවො වෙලා. කරුමෙ! කරුමෙ !!"

ඇගේ මේ කෑගැහීම ඇසූ අහළ පහළ ගෙවල ගැහැණු ද රොක්වූහ. වං ලුං ද තමා කියන්නට පැමිණි දෙය අවසාන කිරීමට තැත් කෙළේය.

''කොයි එක උනත් මගේ තාත්තගෙ සහෝදරයට මම අවවාද කරණ එකනං හරි නැහැ. ඒ උනාට මම මේ කාරණය විතරක් කියන්න කැමතියි. කසාද බැඳීමට සූදනම්ව සිටින කෙල්ලෙකු තුළ තියෙන්න ඕන හොඳ ගතියක් නං කන්‍යාභාවය රැක ගැණීමයි. ඔය නාන්නත්තාරෙ ඇවිදින්න ගියහම ඒව රැකේවිද?''

මෙසේ අවංකව කතාකළ ඔහු, කුඩම්මා කෑගසමින් සිටිද්දී සිය ගෙදර බලා පා නැගුවේය.

මේ වසරෙහිද ඔහු තවතවත් ඉඩම් ''හ්වෑං'' මැඳුරෙන් ගන්නට අදහස් කරගෙන සිටියේය. ඔහුගේ අධිෂ්ඨානය වූයේ හැකි තරමින් අවුරුදුපතා එසේ ඉඩම් ගන්නටය. තම පැරණි ගෙයටම අල්ලා කාමරයක් ගොඩනැංවීමටත් ඔහු කල්පනා කරගෙන සිටියේය. තමා ඉඩම් හිමියෙකු බවට පත්වෙද්දී තමාගේ නාමයම ගත් බාප්පා ගේ පවුලෙහි ඇය නැන නැන රස්තියාදුවෙන් නින්දවෙන ලෙස හැසිරීම වං ලුං ගේ කෝපයට හේතු වීය.

එක් දිනක් වං ලුං කුඹුරෙහි වැඩකරමින් සිටිද්දී බප්පා එහි පැමිණියේය. එද ඕ ලෑං කෙතෙහි නොසිටියේ ඇය මේ දිනවල තුන්වෙනි දරු උපතකට සැරසෙමින් සිටි නිසාය. දින කීපයක සිට ඇය වැඩට නොපැමිණියේ මේවර ඇය තරමක් අසනීප ගතියෙන් පෙලුන බැවිනි. එබැවින් වං ලුං තනිවම වැඩ කෙළේය. නියරක් දිගේ කුදු ගැහී පැමිණි බාප්පා ඇඳුම පවා හරිහැටි හැඳගෙන සිටියේ නැත. යන්තම් පටියකින් රඳවාගෙන තිබුණ යටි කයෙහි ඇඳුම තද සුලඟකින් රෑරා වැටෙන තරම් තත්වයකය තිබුනේ. මෙසේ පැමිණි බාප්පා වං ලුං වෙත පැමිණ නිශ්ශබ්දව නැගී සිටියේය. මේ අතර වං ලුං බෝංචි සිටවීමට පාත්තියක් සකස් කිරීමෙහි යෙදුනි. බෝංචි ඇටද ඔහු පසෙකින් තිබුනේය. අන්තිමේදී වං ලුං හිස ඔසවා නොබලාම කෝපයෙන් මෙන් කතා කෙළේය.

''මේ වැඩේ නතර කෙළේ නැතුවට සමාවෙන්න. බාප්පෙ, උඹත් මේ වගේ වැඩ ගැන දන්නව නේ? මේ බෝංචිවලින් පලක් ගන්න නම් දෙවරක් තුන්වරක් වපුරන්න ඕන. උඹ නම් මෙල හකට වපුරල ඉවර ඇති. මම නම් මේ වැඩේ කරන්නෙ හරි

හිමින් තමයි. දුප්පත් මට කවදක්කත් වැඩක් කලින් ඉවර කරන්න බැහැ.''

මෙසේ කතාකිරීම නිසා වං ලුං ගේ කෝපය බාප්පාට ද වැටහුනි. එහෙත් ඔහු මෘදුලෙස කතා කෙළේය.

''මම හරි කරුමක්කාරයෙක්. මේ අවුරුද්දෙ මගේ බෝංචි ඇට විස්සකින් එකයි පැල උනේ. ඉතින් එච්චර නරකට වැවෙන කොට හිටවලත් ඇති වැඩක් නැහැ. අපිට කන්න නම් මේ ගමන බෝංචි ණයට ගන්න වෙනවා''යයි කියමින් බාප්පා තදින් සුසුම් හෙළීය.

වං ලුං ගේ හදවත හැඟීම් වලින් තදබද වූයේ තම බාප්පා ඇවිත් සිටින්නේ යමක් ඉල්ලා ගන්නටයයි වැටහුණු නිසාය. ඔහු උදැල්ල ඔසවා මහත් වැරෙන් බිම කණින්නට පටන් ගත්තේය. පරිස්සමින් පිළියෙළ කළ පොළොවෙහි ඉතා කුඩා පස් කුට්ටිය පවා සමවන සේ ඔහු වැඩ කෙළේය.

අවසානයේදී බාප්පා යළිත් කතා කෙළේය.

''මගේ ගෙදර එක්කෙනා කිව්ව උඹ අර මගේ වැඩිමල් එකී ගැන දක්වන සැලකිල්ල. උඹ කියන එකත් සම්පූර්ණයෙන් ඇත්ත. උඹේ වයසට වඩා උඹට නුවණ තියෙනව. ඇට කසාද බඳින්න සුදුසු වයස පැමිණිල. ඈට දැන් පහළොස් අවුරුද්දක් වෙනව. මට තිස්සේම බයයි ඈ කවුරුහරි රස්තියාදු කාරයෙක් එක්ක සම්බන්ධයක් ඇතිකර ගනීය කියල. එහෙම උනොත් මගේ නමටත් නින්දවක්. බලාපන් ඉතින් එහෙම එකක් උනොත් අපේ වැදගත් පවුලට වෙන්නෙ මොකොද කියල.''

නොනවත්වාම වේගයෙන් වැඩකල වං ලුං ට කියන්නට වුවමනා කෙළේ ''ඉතින් මොකොද උඹ ඇයව බලාගන්නෙ නැත්තෙ? උඹ මොකොද ඇය ගෙදර තියාගෙන වැදගත් විදියට උයන්න, ගෙදර දොර සුද්ද පවිත්තර කරගන්න – ඇඳුම් මහන්න ගෙදර දෙරේ වෙනත් අවශ්‍යදේ කරන්න ඇයට පුරුදු නොකරන් නෙ?'' යන වචනයි. එහෙත් ඔහු ඒ වචන නොකීවේ බාප්පා වැනි මහළු කෙනෙකුට අවවාද දීමට තමා නුසුදුසුයයි සිතූ නිසාය. කුඩා බෝංචි පැලයක් වටේ පස් බුරුල් කළ වං ලුං මොහොතක් බලා ගෙන සිටියේය. බාප්පා නැවතත් කථා කරන්නට පටන් ගත්තේය.

Scanned by CamScanner

''ඉතින් මගෙත් කාලෙ හොඳ උනානම් උඹේ තාත්තට වගේම මටත් හොඳ ගැණියෙක් කසාද බැඳල, වැඩ කරන්නත් පුතුන් ලබන්නත් තිබුන. මගේ ගැණි වගා කරන්නෙ මස් විතරයි. වදන්නෙ කෙල්ලො විතරයි. මට ඉන්නෙ එකම කොළුවයි. ඌත් අලි කම්මැලියෙක්. කම්මැලිකම නිසා ඌත් හරියට කෙල්ලෙක් වගෙයි. වාසනාවන්ත කාලයක් ලැබුව නම් මටත් පෝසත් වෙන්න තිබුන, උඹට වගේම. එහෙම උනා නම් මම සතුටෙන්ම මගේ වස්තුව උඹලත් එක්ක බෙදා ගන්නවා. උඹේ දුවරුන්ව හොඳ මිනිසුන්ට දෙන්න වැඩ පිළියෙළ කරල දෙනව. උඹේ පුතා වෙළෙන්දෙක් ගාව වැඩ ඉගෙන ගන්න නවත්වල එයා වෙනුවෙන් ඇප මුදලක් මම ම බඳිනව. උඹේ ගේ ත් මම අළුත් වැඩිය කරල දෙනව. ඉතින් උඹටත් මාලඟ තියෙන හොඳම දේවල් කන්න දෙනව. ඉතින් මම පොහොසත් නම් උඹේ තාත්තටත් – උඹේ දරුවන්ටත් – උඹටත් අපි එකම පවුලෙ අය නිසා ඔය කියාපු විදියට මම සලකනව. මොකොද කරන්නෙ උඹවගේ මම පොහොසත් නැතිකොට!''

ඉක්බිති වං ලුං කොටින් උත්තර දුන්නේය.

''උඹ දන්නවනේ මම පොහොසතෙක් නොවන බව. මම පස්දෙනෙකුට කන්න දෙන්න ඕන. මගේ තාත්තටත් වයසයි. එයාට වැඩ කරන්නත් බැහැ. ඒ උනාට ඒයාටත් කන්න බොන්න සපයන්න ඕන මම. ඉතින් මේ කතා කරන කොටත් තව එක් කෙනෙක් උපදින්න ඇති මගේ ගෙදර.''

මේ වචනවලින් කෝපයට පත් බාප්පා සිහින් හඬින් කෑ ගසන්නට පටන් ගත්තේය.

''උඹ පොහොසත්! උඹ පොහොසත්! උඹ මහ ගෙදරිනුත් ඉඩම් ගත්ත. ඒව ගත්තෙ කොච්චර මුදලකටද කියල දන්නෙ දෙයියො පමණයි. හොඳයි මේ ගමේ ඉන්නවද ඔහොම ඉඩම් ගන්න හැකි වෙන කෙනෙක්.''

මෙයින් වං ලුං කෝප වීය. ඔහු උදැල්ල ද බිම හෙලා බාප්පා දෙස රවා බලමින් ''මට සල්ලි තියෙනව නම් තියෙන්නෙ මම වැඩ කරණ නිසයි, මගේ ගැණි වැඩ කරණ නිසයි. අපි ඔය වෙන මිනිස්සු වගේ සුදු පිටියෙ රස්තියාදු වෙන්නෙ නැහැ. උළුවස්සක් ගානෙ ඉඳගෙන ඕප දූප කථා කරන්නෙ නැහැ. කුඹුරුවල

Scanned by CamScanner

කැලැවැවෙන්න දෙන්නෙ නැහැ, දරුවන් බඩගින්නෙ තියන්නෙ නැහැ''යි කෑ ගැසුවේය.

බාප්පාගේ කසාවන් මුහුණෙහි ලේ මතුවන්නට වූනි. ඔහු තම ඥාති පුතා වෙත කඩා පැන දෙකම්මුලටම අත්ලෙන් ගැසුවේය–නදින්ම පහර දුන්නේය.

''ඉඳා උඹට තාත්තගෙ පරපුරට ඔහොම කතා කරණවට. උඹට ආගමක් නැද්ද? දරුමයක් නැද්ද? උඹ මොකද ඔච්චර සැල කීමක් නැත්තෙ. වැඩිහිටියන්ට? මිනිහෙක් කවදක්කත් තමාගෙ වැඩිමහල්ලෙකුගෙ වැරදි ගැන කතා කරළ හරිගස්සන එක හරි නැතෙයි කියල ආගමේ පොත්වල තියෙනව උඹ දැකල නැද්ද?''යි ඔහු හඬ නැගුවේය.

වං ලූං බාප්පට නොබැණ – නොසැලී සිටියේ තම වරද වටහා ගැණීමෙනි. එහෙත් ඔහුගේ හදපත්ලෙන්ම ''බාප්පා''යයි කියන මේ මිනිහා කෙරෙහි බලවත් කෝපයක් ඇතිවූනි.

ඔහුගේ බාප්පා යලිත් බණින්නට පටන් ගත්තේ ''මම උඹේ වචන මුළු ගමටම කියනවා''යයි පවසමිනි. ඔහුගේ ස්වරයද කෝපය නිසා උස්ව බිඳී තිබුනි.

''ඊයෙ උඹ මගේ ගෙදරට වැදිල ප්‍රසිද්ධියේම කෑගැහැව්ව මගේ දූව කන්‍යාවක් නොවෙයි කියල. අද උඹ මේ බණින්නේ උඹේ තාත්තව මරුණහම උඹේ තාත්ත වසයෙන් ඉන්න මටයි. මගේ දූල සේරම හොඳ කෙල්ලො නම් නොවෙයි''. ඒඋනත් ''උන් එකෙකුගෙන්වත් මම නම් මේවගේ කතා අහල නැහැ''යි කියූ බාප්පා ''මම ගමටම කියනවා – ඒක මුළු ගමටම කියනවා'' යයි පුන පුනා කියන්නට පටන් ගත්තේය.

අන්තිමේදී වං ලූං නොකැමැත්තෙන් වුවද ''උඹට ඕනෑ කරන්නේ මොනවා ද''යි ඇසුවේ ඔහුගේ කරච්චලය නතර කිරීමටය. මෙය මුළුගමටම කිව්වොත් ඔහුගේ හොඳ නාමයට කැලලක් වෙතැයි ඔහු සිතුවේය. එමෙන්ම ඔහුගේ කෝපය ද අඩුවී ගියේය. බාප්පා ද වහා වෙනස් විය. ඔහුගේ කෝපය ද උණුවී ගියාක්මෙන් වූනි. ඔහු සිනහවක් පා වං ලූං ගේ උරහිස මත අතතබා යලි මෘදුලෙස කතා කෙළේය.

''හොඳ කොළුවා ! හොඳ කොළුවා ! උඹේ නාකි බාප්පා උඹව හොඳට අඳුනනව. උඹ මගේ පුතා ! පුතේ, මට රිදී කාසි ටිකක්

Scanned by CamScanner

දියත්......අටක් උනත් ඇති, එතකොට මගේ අර දුවගැන පිළිවෙළක් කරන්න කපුවෙකුට කියන්න පුළුවන්. උඹ කිව්ව හරි. දූත් කාලෙ හරි – කාලෙ හරි''යයි කියමින් ශාන්ත මුහුණින් අහස දෙස ඔහු බැලුවේය.

වං ලූං උඳැල්ල උස්සා යලි එය බිම දැමුවේය. ''හොඳයි එහෙනං ගෙදරට යමු''යයි ඔහු බාප්පාට කොටින් කිව්වේ මෙසේද පවසමිනි.

''මම කුමාරයෙක් වගේ යන යන තැන රිදී ගෙනියන් නේ නැහැ.''

බාප්පාට පෙරටුව ගමන් කළ වං ලූං ට කතා කිරීමට පවා අසීරුවුනේ ''ඉඩම් ගන්නට ඉතුරුකළ'' මුදලින් කොටසක් බාප්පා ගේ අතට යන බවත් ඒවා රැවෙන්නට පළමු සූදු පිටියට යන අයුරුත් සිහිවූ හෙයිනි. කෙසේ නමුත් ඔහු ගෙදරට පා නැගුවේ දෙරකඩ හිරු එළියේ තග්නව සෙල්ලම් කරමින් හුන් සිය දරු දෙන්නා ද පසෙකට කරමිනි. ඔහුගේ බාප්පා ආදරයෙන් දරුවන්ට අඩගසමින් පොඩිවීගිය කබායෙහි සාක්කුවෙන් තඹකාසි දෙකක් ගෙන ඔවුන්ට දුන්නේය. ඔහු, තරබාරු දිලිසෙන සිරුර තමා දෙස අදිමින් තම නාසය ඔවුන්ගේ දුඹුරුවන් සිනිඳු ගෙල දෙස යවා සෙනහයෙන් සිඹගත්තේය.

''ආ! පොඩි ඉලන්දරි දෙන්නා''යයි ඔහු බිණුවේ දෑතට දරුවන් දෙදෙනා රැගෙනය. එහෙත් වං ලූං නොනැවතුනේය. ඔහු තම බිරිය අන්තිම දරුවාත් සමග සයනය කරණ සිය කාමරයට ගියේය. හිරු එළියේ සිට පැමිණි ඔහුට කාමරයේ තද කළුවරක් දැනුණි. කුඩා සතරැස් සිදුරෙන් වැටුන එළිය හැර වෙන ආලෝකයක් මෙහි නොවීය. එහෙයින් ඔහුට කිසිවක් නොපෙනුනත් හොඳින් පුරුදු උණුසුම් ලේවල අඝ්‍රාණයෙන් ඔහුගේ නාසය පිරුණි.

''මොනව ? උඹේ වෙලාව ආවද''යි ඔහු තියුණු ලෙස විමසුවේය. ඔහු කිසි දිනක නොඇසූ තරම් දුබල හඬකින් ඇය කතා කළාය.

''නව වරක් ඔන්න ඉවර උනා. මේ ගමන දසියක්, කෙල්ලක් මතක්කරන්නවත් වටින්නෙ නැතෑ''යි ඈ දුබල හඬින් කියන විට නොසෙල්වී එයට කන්යොමු කළ වං ලූංට ඇතිවුනේ දුර්භාග්‍යය පිළිබඳ හැඟීමකි.

''මොනව කෙල්ලක්! බාප්පාගේ ගෙදර මෙපමණ කරදර ඇතිකරන්නෙත් කෙල්ලක්! දූත් ඉතින් මගේ ගෙදරටත් කෙල්ලක් ඉපදිලා''යයි ද සිතූ ඔහු මුවින් නොබැණ බිත්තිය දෙසට ගොස් එහි එහාමෙහා අත පත ගා පස් පිඩැල්ල සොයාගෙන එය ඉවත් කෙළේය. ඉන්පසු ඔහු රිදී ගොඩ අත පත ගා කාසි නවයක් ගැන්නේය.

''මොටද ඔය සල්ලි ගන්නේ?''යයි ඔහුගේ බිරිය අඳුරෙහිම හිඳගෙන හදිසියෙන්ම කතා කළාය. ඔහු එයට උත්තර දුන්නේ කෙටියෙනි.

''මේ සල්ලි ටිකක් බාප්පට ණයට දෙන්න සිද්ද උනා.''

ඔහුගේ බිරිය පළමුවෙන් එයට කිසිත් නොකීවාය. එහෙත් පසුව ඈය ඈගේ චාම් හඬින් කතාකළාය.

''ණයට දෙනවයි කියන්නෙ නැත්නම් හොඳයි. ඒ ගෙදරට ණයට දීමක් නැහැ. පිනට දෙනව පමණයි.''

''ඔව්, මම දන්නවා. එයාට දෙනවයි කියන එක මගේ මස් කපනව වගේ වැඩක් අර එක ලේ ඇති මිනිස්සු විතරයි. නැත්නම් මම කොහොමවත් මේ මුදල් දෙන්නෙ – නැහැ''යි ඔහු ඈයට පිළිතුරු දුන්නේ ශෝකී ස්වරයකිනි.

අනතුරුව බිත්ති කපල්ලෙන් මුදල් ගෙන දෙරකඩට ගිය වං ලුං මුදල් බාප්පාගේ අතට දී වහා ආපසු කුඹුරට ගියේය. එහිදී ඔහු පස් උගුල්ලා දමන්නාක් මෙන් වේගයෙන් වැඩ කෙළේ බාප්පාට දුන් රිදී කාසි ගැන සිහි කරමිනි. බාප්පා ඒ මුදල් සුදු පිටියට ගෙනයන අයුරු ද පෙනෙන්නාක් මෙන් දනුණි. ''ඔහුගේ රිදීවලට–තමාගේම ඉඩම්වල පලදාවෙන් ලබාගත් රිදීවලට–නැවතත් ඉඩම් ලබාගන්නට තිබෙන මුදල්වලට යන කලදසාවක හැටිය''යිද සිතමින් යලි යලිත් සුසුම් හෙලුවේය.

ඔහුගේ කෝපය සංසිඳෙන විට සවස් වී තිබුනි. එහෙයින් ඔහු නැගී සිටියේය. ගෙදර ද, කෑම ද ඔහුට සිහිවුනේය. අළුතෙන් ගෙදරට එක්වුන ජීවය ගැනද ඔහුට මතක් වුනේය. යලිදු ශෝක යෙන් ඔහුට සිහිවුනේ තමාට දූවරුන් උපදින්නට පටන් ගත් බවය. එසේ ඔහු තමාට උපදින දූවරුන් ගැන ශොකවුනේ ''දූවරුන් අයත් වන්නේ දෙමව්පියන්ට නොවේ; දෙමව්පියන් ඔවුන් ඇතිදැඩි කරන් නේ වෙන පිට ගෙදරකට යැවීමටය'' යන ආදී වසයෙන් සිතූ නිසාය. තමාගේ බාප්පා කෙරෙහි ඇතිවුන කෝපය නිසා මේ

Scanned by CamScanner

කුඩා අළුත් දරුවාගේ මුහුණදෙස බලන්නටද ඔහුට යලිත් අමතක වී ගියේය.

ඔහු උදලුලලට වාරු දී මොහොතක් බලා සිටියේය. බලවත් කණගාටුවක් ඔහු තුළ ඇතිවුනි. තම ඉඩමට යාබදව ඇති අනික් ඉඩම් කොටසත් ගැණීමට තවත් අස්වැන්නක් පසු කළ යුතු නිසාත් ගෙදරට තවත් කෙනෙකු වැඩිවීම නිසාත්ය ඔහු තුළ නොඉවසිලිමත් බව තව තවත් වැඩිවුනේ.

සන්ධ්‍යාලොකය පැතිරෙද් දී ලා වන් දුඹුරු පැහැති ආකාසය හරහා කපුටෝ පියාඹන්නට වූහ. තදින් කෑගසමින් තමාට ඉහලින් වලාකුලක්මෙන් පියඹා ගිය ඒ කපුටන් තමගෙය අවට ගස්මුදුන්වලට පහත්වී නොපෙනී යන අයුරු ඔහු බලා සිටියේය. යලි ඔහු කෑගසමින් කපුටන් දෙසට උදලුල වනමින් එදෙසට දිව්වේය. කපුටන් කාක්! කාක්! හඬ නගමින් ඔහුට කවටකම් කරන්නාක් මෙන් ඔහු හිසමත කරකැවී අඳුර පැතිරෙන විට යලිත් අහස දෙසට පියාඹා යද්දී ඔහු තදින් කෙඳිරි ගෑවේ ''කපුටන්ගේ ඒ හැසිරීම අසුභ ලකුණකැ'' යි සැලකු නිසාය.

දෙවියන් මිනිසෙකු කෙරෙන් ඉවත් වූනවිට– කෝප වූනවිට යලිත් මිනිසුන් දෙස නොබලති''යි යන හැඟුම ඔප්පු කරන්නට මෙන් ගිම්හානයේ මුල්භාගයේ පැමිණිය යුතු වැස්ස එතෙක් නොපැමිණියේය. දිනෙන් දිනම අහස අලුත් වුනේය. වියලුන පීඩිත පොළොව ගැන ඔවුන් තුළ කිසිදු සැලකිල්ලක් ඇති නොවීය. හිමිදිරියේ පටන් රෑ වන තුරුම අහසෙහි එකද වලාවක් වත් පැන නොනැගුනි. රාත්‍රියෙහි තාරකාවෝ අතිශයින්ම ප්‍රභාවත්ව බබලන්නට වූහ.

වං ලුං කෙතෙක් මහන්සි වී වපුලත්, ඔහුගේ කුඹුරු වියලී පැලී වලං පැලී ගොස් තිබුනි. වසන්තයේදී ධෛර්‍ය්‍යවත්ව පැන නැගී පිදෙන්නට ලංව සිටි තිරිඟු පැල, අහසෙන් හෝ පොළොවෙන් පොෂණයක් නොලැබූ බැවින් නොවැඩී නිශ්චලව පැවතුනි. සිහින්ව කසාවන්ව ගිය ඒ තිරිඟු පැල පළකෙළේ අස්වැන්න පිළිබඳ හිස් බවකි. ඔහු විසින් පළමුව වපුල ගොයම් ලියදි දුඹුරුවන්ව ඔහුට පෙනුනි. තිරිඟු පිළිබඳව උත්සාහය අත්හළ ඔහු ගොයම් ලියදිවලට වතුර ගෙන ගොස් වත් කෙළේය. ඔහු ඒවාට වතුර ඇද්දේ උණ ලීයක දෙකෙළවර එල්ලූ විසාල ලී බාල්දි දෙකක් කරින් ගෙන යමිනි. මේ නිසා ඔහුගේ කරෙහි විසාල දිය බුබුලක්ද පැනනැගුනි. එහෙත් වැස්ස නම් නොනැගුනි.

අවසානයේ දී පොකුණෙහි වතුර ද සිඳී එය මඩ ගොඩක් බවට පත්වුනි. ලිඳේ වතුර ද ඉතා අඩු වීය.

Scanned by CamScanner

''කෑමට බීමට වතුර ගත්තොත් – ළමයින්ට, මේ වයසක තැනට බොන්න වතුර දුන්නොත් පැලෑටි නම් වියලී යාවි'' යයි දිනක් ඕලෑං ඔහුට කීවාය.

''ඉතින් පැල වියලුනොත් අපි ඔක්කොමත් වියලෙන්න ඕනැ'' යයි වං ලුං කිව්වේ කෝපයෙන් වුවද ඔහුගේ ස්වරය ඉකි ගැසීමකින් කෙළවර වුනි.

ඔවුනට අස්වැන්න ලැබුනේ දිය අගල ලඟ ඉඩම්කැබැල්ලෙන් පමණකි. ගිම්හානයේ වැහි නොලැබුන විට වං ලුං අනික් සියල්ලම අත්හැර මේ කුඹුරටම දිනපතා කාලය ගතකෙළේය. ඔහු කැදර පොළොවට දිය අගලින් දිය ඇද වත්කෙළේය.

පළමු වරට ඔහු මේ වසරේ එකතුකළ අස්වැන්න වහාම විකුණා දැම්මේය. එයින් ලැබුන රිදී කාසි මහත් එදිරියකින් මෙන් මිට මොලවා ගත්තේ ''ඉඩෝරය තිබුනත් – දෙවියන් විරුද්ධ වුවත් තමන් අධිෂ්ඨාන කරගත් දෙය කරමි'' යන හැඟුම තමාටම කියා ගනිමිනි. ඔහු එතෙක් දහඩිය වැගුරුවේ – මහන්සි උනේ මේ රිදී කාසි ටික ලැබීමටය. ඔහුට දූන් එය කැමති දෙයක් කළ හැකිය. එහෙයින් ඔහු ඒවාත් රැගෙන ''හ්වැං'' මැඳුරට ගොස් මහළු රදළ තැනගේ ඉඩම් නියෝජිතයා හමුවුනේය.

''අර දිය අගල ලඟ තියෙන මගේ ඉඩම් කෑල්ලට යාබදව තියෙන අනික් ඉඩම් කෑල්ලත් ගන්න මට සල්ලි තියෙනවා'' යයි වං ලුං ඉඩම් නියෝජිතයාට කිව්වේ කිසිත් සැකක් නැතුවය.

මේ, ''හ්වැං'' නිවාසය දිළිඳු බවට පත්වී යන වසරක් බව වං ලුං තැන් තැන්වලදී අසා තිබුනි. තමාට ඇති තරම් අබිං ප්‍රමාණයක් දින කීපයක සිට නොලැබුන නිසා නාකි රදළ නෝනා ද මේ දවස්වල කාලය ගතකෙළේ බඩගින්නෙන් පෙළුන කොටි දෙනක මෙන්ය. ඇය දිනපතාම තම නියෝජිත තැන කැඳවා ඔහුට සාප කරමින් අවන්පතින් මුහුණට ගසමින් කෝපාවිෂ්ටව මෙසේ විමසයි.

''ඉතින් තවත් ඉඩම් කෑලි ඉතුරුව තියෙනව නේද?''

ඇගේ මේ කෝපාවිෂ්ට හැසිරීමෙන් කැලඹීමට පත් නියෝජිතයා පවුලේ ගනුදෙනුවලින් තමාට ලැබෙන කොටස වත් නොගත්තේය – නොගෙන අතහැරියේය. මේ කරදරය මදිවූවාක් මෙන් නාකි රදළ තැන ද තවත් වෙසඟනක් පාවා ගත්තේ මේ දවස්වලමය. මේ අළුත පාවාගත් ගැහැණිය, කලින් මේ රදළයාම

විසිවී යන සෑම බෝංචි ඇටයක්ම එකතුකළ ඔහු සිතා සිටියේ බෝංචි පොතු දර පිණිස ගැණීමටය. එහෙත් එම අදහස ඔහුට අස්කර ගැණීමට සිදුවූයේ ''එපා! එපා! ඒව පුළුවල නාස්ති කරන්න. මට මතකයි මම පුංචි කාලෙ කැංටු නගරයට මේ වගේ පැවුමක් පැමිණි කාලයක, ඔය පොතුත් අඹරල කන්න ගත්ත බව. ඒවා තණකොළ වලට වඩා හොඳ'' යයි ඔහුගේ බිරිය කියූ නිසා ය.

ඇය මෙසේ කී විට දරුවන් ඇතුලු සියළුදෙනාම නිහඬවූහ. දූන් දූන් ඉඩම ද ඔවුනට පිළිසරණ නොවන බව ඔව්හු දත්හ. හිරු එළියෙන් පැහැපත් මේ දිනවල සෑම තැනම තිබුනේ ''තහනම් කිරිමේ'' හඬය. ආහාර හිඟය පිළිබඳ – සාගතය පිළිබඳ – පැවුම පිළිබඳ භීතිය නොදත්තේ ඔවුන්ගේ ගැහැණු දරුවා පමණකි. එහෙත් ඇගේ මවගේ පිරුණ දෙතනෙහි ඇයට වුවමනා තරම් කිරි තිබුනි. ඇය කිරි උරණ විට ඕලෑං තොල් මතුළේ ''කාපන් දුප්පත් මෝඩියේ! කාපන්! කන්න පුළුවන් දේ තියෙන තුරා කාපන්'' යයි කියමිනි.

ටික දිනකට පසු, එළඹි අභාග්‍යයේ අඩුව සපුරන්නට මෙන් ඕලෑංට තවත් දරු ගැබක් හටගති. එහෙයින් ඇගේ කිරි වියලී ගියේය. සාගතයෙන් බිය ගත් ගෙය දරුවා කෑම ඉල්ලා අඩන හඬින් ද පිරිගති.

වං ලුං ගෙන් යමෙකු ''ග්‍රීෂ්ම ඍතුවේ කන්නෙ මොනවා ද''යි ඇසුවහොත් ඔහු උත්තර දීමට සැරසී සිටියේ ''මම දන්නෙ නැහැ. ඔහේ එහෙන් මෙහෙන් ලැබුනොත්ය'' යනුවෙනි. එහෙත් කිසි වෙක් ඔහුගෙන් එය නොඇසුවේය. කිසිම කෙනෙක් තව කෙනෙකු සමග කන බොන අන්දම ගැන කතා කළේ නැත. සියල්ලෝම නිහඬ බවක් පළකළහ.

''අද මම කන්නේ කොහොමද?''

''අපි කන්නේ කොහොමද?''

''දරුවන්ට කන්න දෙන්නෙ මොනවද?'' යන වචන පවා ඇසුනේ ඉතාම කලාතුරකිනි.

වං ලුං ඔහුට හැකි පමණ කල් ඔහුගේ ගොණාට ද කෑමබීම ලබා දුන්නේය. පිදුරු හා වැල් වර්ග අවසන්වුන විට ඔහු ගොණාට කන්න දුන්නේ ගස්වලින් කඩාගත් කොළ වර්ගයි. ශීත ඍතුවෙහිදී ගස්වල කොළද හැලුනි. ඉන්පසු භාන්තවද

වුවමනාවක් නොවීය. වැපිරූ ඇටවර්ග ද වියලී ගියේය. යලිත් වපුරන්නට ධාන්‍ය වර්ග ද ඉතුරු නොවීය. එබැවින් ඔහු ගොණා ලිහා හැර ඌවටම කෑම සපයා ගන්නට ඉඩ හැරියේය. එහෙත් ගොණා සොරු ගනීවිය යන බිය නිසා ඔහු සිය වැඩිමහල් දරුවා ගොණු – පිට හිඳුවා නාස්ලනුවට ගැටගැසූ ලනුවක් ද දරුවා අතට දී පිටත්කර හැරියේය. කලක් ගතවී යන විට මේ ගොණා ගැන ඔහුට ඇතිවුනේ අළුත් බියකි. තමන්ගේ අසල් වැසියන් මේ දරුවා ගැනද නොසලකා ගොණා මරාගෙන කෑවොත් යන්න ඒ බියයි. එහෙයින් ගෙදරම බැඳ තැබූ ගොණා කෑම නොමැති කම නිසා කෘශ වී ඇටසැකිල්ලක් බවට පත්වුනේය.

වං ලුං ලඟ තිබුන වී සියල්ල ම හමාරවුනේය. තිරිඟු ද ඉවර වුනේය. ඉතුරුවුනේ බෝංචි ඇට සුළුපයකුත් ධාන්‍ය සුළුපයකුත් පමණකි. ගොණා ද බඩගින්නෙන් කෑගසන්නට වීය.

''ඊගාවට ගොණා කමු''යයි මහල්ලා යෝජනා කෙළේය. එය ප්‍රතික්ෂේප කරමින් කෑ ගැසූ වං ලුං ට මහල්ලාගේ වචනය ඇසුනේ ''ඉතින් අපි මිනිහෙකුව කමු''යයි කියන්නාක් මෙන්ය. කුඹුරේදී ඔහු හා එකට වැඩකළ–ඔහු හා ගැවසුන එකම සේවකයා මේ ගොණාය. කෙතෙහිදී කමතෙහිදී ඌ පිටු පස ගමන් කළ ඔහු තම චිත්තවේගය අනුව ඌට ප්‍රශංසා ද නින්දා ද කර තිබේ. කුඩා කාලයේ පටන් ඔහු මේ සතා හඳුනයි. ඔහු මේ සතා මිලදී ගත්තේ වසු පැටවා කාලයේදීය.

''අපි කොහොමද මේ ගොණාව කන්නෙ? කාල ඊට පස්සෙ හාන්නෙ කොහොමද?''යයි ඔහු කීය. මහල්ලාද නිශ්චලව උත්තර දුන්නේය.

''අනේ මං දන්නෙ නැහැ. එක්කො උඹේ පණ, නැත්තං සතාගෙ, උඹේ පුතාගෙ පණ, නැත්තං සතාගෙ – මිනිහෙකුට ගොණෙක් නං මිලයට ගන්න පුළුවන්. එච්චර ලේසියෙන් පණක් ගන්න බැරි''යයි කීය.

එහෙත් වං ලුං ට එද නම් සතා මැරිය හැකි නොවීය. දින දෙකක්ම ගතවී ගියේය. ළමයි කෑම ඉල්ලා කෑගැසූහ. ඔවුන් සැනසීමද පහසු කාරියක් නොවීය. දරුවන් ගැන බැගෑපත් වුන–දුක්වුන–සෝකවුන ඕලෑං ඔහු දෙස බැලුවාය. අවසානයේ දී එය කළ යුතුම දෙයක් බව ඔහුට වැටහුනේ ඇයගේ දුක්මුසු බැලීමෙන් පසුවය.

Scanned by CamScanner

''හා! එහෙනං ඌ මරණව. නමුත් මට නං ඒක කරන්න බැහැ''යි ඔහු රළු ලෙස කීවේය.

අනතුරුව ඔහු නිදන කාමරයට ගොස් ඇඳෙහි වැතිර ගෙන සතා මරණ විට උගේ කෑගැසීම නොඇසෙන ලෙස තමාගේ හිස වටා පොරෝණය තදින් වෙලා ගත්තේය.

ඕලෑං එළියට ඇදී කුස්සියේ තිබුන-මන්නය ගෙන ගෙල සිඳ දමා උගේ ප්‍රාණය නිරුද්ධ කළාය. භාජනයක් ගෙන උගේ ලෙය ද එකතුකර තැබුවේ එයද උයන්නට ක්‍රමයක් ඇය දත් නිසාය. ඇය සතා හමගසා උගේ සිරුර කැබලි වලට කපා ගත්තාය. සියල්ල හමාරවී මස් පිස මේසය උඩ තබන තුරුම වං ලුං එළියට ආවේ නැත.

ඔහු තමාගේ ගෝණාගේ මස් කන්නට තැත්කළේය. තැත් කරණ සැම විටකම ඔහුට දැනුනේ ඔහුගේ ඇතුළු කුස පෙරලෙන්නාක් මෙන්ය. ඔහුට ඒ මස් කිසිසේත් ගිලිය නොහැකි විය. ඔහු බිව්වේ සුප් සවල්පයක් පමණකි. ඕලෑං ඔහු ඇමතුවාය.

''මේ ඇහුනද? ගෝණා සතෙක් පමණයි. ඊටත් වඩා මූ දූන් නාකියි. කන්න! කන්න! මෙයට හොඳ දිනයක් ලඟදීම ඒවි''යයි ඇ කීවාය.

එයින් සැනසුන වං ලුං මස් වලින් ඉතා සවල්පයක් අනුභව කෙළේය. සෙසු සියල්ලෝම මස් අනුභව කළහ. අන්තිමේදී උගේ මස්ද ඉවරවිය. ඇට මිදුලු ගැනීමට ඇටද තලන ලදී. සියල්ලම බොහෝ ඉක්මනින් අවසන් වුනේය. අන්තිමේදී උගේ සිරුරින් ඉතුරුවුනේ හම පමණකි. ඕලෑං, උණගස්වලින් තැනූ රාමුවක් මත එය සවිකොට වියලා ගත්තාය.

මුලදී ගැමියෝ වං ලුං සමග සතුරුවූහ. ඔව්හු, වං ලුං මුදල්, කෑම බීම, සඟවාගෙන සිටිතියි සිතූහ. පළමුවෙන්ම යමක් ඉල්ලමින් ඔහුගේ ගෙදරට පැමිණියේ බඩගිනි වූ මහළු බාප්පාය ඇත්ත වශයෙන්ම ඔහුටත්, ඔහුගේ බිරියටත් දරු සත්දෙනාටත් කන්නට කිසිවක් නොවිය. වං ලුං නොකමැත්තෙන්ම ඔහුගේ ඔලගුවට බෝංචි ඇට ටිකක් හා වටිනා ධාන්‍ය සවල්පයක්ද මැනදුන්නේය.

''මට වැඩිපුර තියෙන්නෙ ඔච්චරමයි. දරුවන්ට නොසැලකුවත් මගේ වයසක තාත්තට කන්න දෙන්න ඕන''යයි ඔහු දුඩිවම කීවේය.

Scanned by CamScanner

නැවතත් දිනයක බාප්පා එසේ ඉල්ලාගෙන පැමිණිවිට ''වැඩිහිටියන්ට සැලකීමෙන් අපේ ගෙදර බඩපිරෙන්නෙ නැතැ''යි වං ලුං කෑගැසුවේය. මෙසේ එද බාප්පා වං ලුංගේ ගෙදරින් පිටත්ව ගියේ හිස් අතින්මය.

එද පටන් ඔහු පා පහර ලත් සුනඛයෙකු සේ වං ලුංට එදිරි විය. ඔහු ගමේ ගෙයක් පාසා ගොස් මෙසේ කොඳුලේය.

''මගේ අර ඥතිපුතාට සල්ලිත් කෑමත් තියෙනව. නමුත්, එයා ඒව අපි කාටවත් දෙන්නෙ නැහැ. මටවත් දෙන්නෙ නැහැ. අපිට කරන්න සිද්ධවෙන්නෙ හාමතේ මැරෙන්නයි.''

ගමේ සෑම පවුලකටම අයත්ව තිබුන ධාන්‍ය කොටස් අවසන් වුනි. ගම්මු තමන්ගේ අවසාන කාසියද නගරයේ වෙළඳ පොළෙන් ලැබුන යමකට වියදම් කළහ.

සීතල වියලි වාතය ශීත ඍතුවෙහි දී කාන්තාරය දෙසින් හමා ආවේය. තමන්ගේ බඩගින්න ත් පීඩිතවූ බිරියන්ගේ හා දරුවන්ගේ බඩගින්න ත් නිසා මිනිසුන්ගේ හදවත් දැඩිවුනි. ඒ අතරම කෘශවූ සුනඛයෙකු සේ කෑගසමින් වං ලුංගේ බාප්පා ගෙයක් පාසා ගොස් ''තවම කෑම තියෙන එක්කෙනෙක් ඉන්නවා. තාම තරබාරු දරුවන් ඇති අයෙක් ඉන්නවා''යයි තම වියලුන තොල් මතුරමින් කියන්නට විය.

එක් රැයක, පොලු රැගත් මිනිසුන් කන්ඩායමක් වං ලුංගේ නිවසෙහි දොරට පහර දෙන්නට වූහ. තම අසල් වැසියන් ගේ කටහඬ අසා ඔහු දොර විවෘත කෙළේය. ඔවුන් සියල්ලෝම වං ලුං වෙත කඩා පැන තල්ලුකර දමා බියගත් දරුවන් සියල්ලන්ම එළියට ඇද දමා හැම මුල්ලක් පාසාම ගොස් සඟවනු ලැබූ කෑම සොයමින් ගෙය මුළුල්ලම අවුස්සන්ට පටන් ගත්හ. එහෙත් ඔවුන්ට එහිදී දක්නට ලැබුනේ වියලුන බෝංචි ඇට සවල්පයක් හා ධාන්‍ය භාජනයක් පමණකි. බලාපොරොත්තු කඩවුන ඔව්හු මන්දෝත්සාහීව මහ හඬින් කෑ ගැසූහ. ඉන්පසු ඔව්හු එහි තිබුන බංකුවත් මේසයත් බියෙන් තැතිගත් මහල්ලා වැතිර හුන් ඇඳ ද ගෙනයන්නට සැරසුනාහ.

එවිට ඕලෑං ඉදිරියට අවුත් කතාකළාය. ඇගේ වාම සිහින් වචන මිනිසුන් අතර මෙසේ පැතිර ගියේය.

"ඔව එපා! එපා! අපේ ගෙදරින් මේසෙයි බංකුවයි ඇඳයි ගෙනියන්න වෙලාව තව ආවෙ නැහැ. උඹල අපේ කෑම සේරම ගත්ත. උඹල උඹලගෙ ගෙවල්වල බංකු මේස ආදිය වික්කද? අපේ ඒව අපිට දියල්ල. අපි කවුරුත් එක සමානයි. අපිට වැඩිය උඹලට තියෙනව. අපේ ඒවත් උඹල ගත්ත නේ. වැඩිය ගත්තොත් තොපට ගෙහනගහවී. අපි ඉතින් එකට ගිහිල්ල තණකොළයි ගස්වල පොතුයි කෑමට ගේමු. උඹලගෙ දරුවන්ව උඹල ගෙනිය පල්ල. අපේ දරු තුන්දෙනාටයි ලඟදී ලැබෙන්න ඉන්න මේ හතර වෙනියටයි,................" කියමින් ඇය අතින් බඩ තදකර ගත්තාය.

එයින් ලජ්ජාවට පත්ව ගෙයින් පිටවී ගිය ඒ මිනිස්සු අසත් පුරුෂයෝ නොවෙති, ඔව්හු බඩගින්න නිසාම ජඩ බවට පත් වූවෝය.

මෙ මිනිසුන්ගෙන් එකෙක් පමණක් ගෙහි නැවතුනේය. ඔහු නම් වං නමැති කුඩා මිනිසෙකි. සුභික්ෂ කාලයෙහිද කසාවන්ව තිබුනු ඔහුගේ මුහුණ මේ දුර්භික්ෂ කාලයෙහි ගිලී දියවී ගොස් තිබුනි. ඔහු හිතවත් ලෙස වචන දෙක තුනක් කතාකරන්නට නැත් කෙළේය. යහපත් මිනිසෙකු වූ ඔහු වරදට පෙළඹුනේ බඩගින්නෙන් හැඹූ ඔහුගේ දරුවා නිසාය. එහි කෑම නොගය සොයාගත් වේලේ උදුරාගත් බෝංචි ඇට ටිකක් ඔහුගේ ලයෙහි විය. කතා කළොත් ඒ සියල්ල දෙන්නට සිදුවෙයයි ඔහු බිය වූනේය. එහෙයින් ඔහු ගිලුනු ඇස්වලින් වං ලූං දෙස බැල්මක් හෙලා යන්නට ගියේය.

ජීවත්වීමේ ප්‍රශ්නය වං ලූං ට එන්ට එන්ටම උග්‍රවුනේය. යහපත් වසරවල මහත් අස්වැන්නක් පාගා ගත් භූමියවූ–මාස කීපයක සිට කිසිත් ප්‍රයෝජනයට නොගත් තම මිදුල දෙස බලා වං ලූං සුසුම් හෙලුවේය.

ඔහුගේ බිරියටත් දරුවන්ටත් කන්ට දෙන්ට කිසිවක් දූන් ඔහුට නැත. තමාගේ සිරුර පවා පෝෂණය කිරීමට නොහැකි අවස්ථාවක වං ලූං ගේ බිරියට සිදුවී ඇත්තේ තවත් අළුත් ජීවිතයක් පෝෂණය කිරීමටය. ජීවත්වීමේ සටන සිහිපත් වූන වං ලූං ට බියක්ද හට ගැනුනි. යළි ඔහුගේ ලේ තුළට සැනසීමක් ද ගලා–ආවේය.

"උන්ට මගෙන් ඉඩම් නම් ගන්න බැහැ. මගේ ශරීර ශක්තියත් මගේ ඉඩම්වල තියෙන සාරයයි. මම මගේ සාරය තැන්පත් කළේ කාටවත් ගන්නට බැරි විදියටයි. මට මුදල් තිබුන නම් උන් ගෙනියනවා. මුදල් දී කෑම වර්ග ගෙනත් තිබුනත් උන් ගෙනියනව. මට තවම ඉඩම් තියෙනවා. ඒව තවම මගේ." යයි වං ලුං තමාට ම කියා ගත්තේය.

Scanned by CamScanner

වං ලූං එළිපත මත හිඳගෙන "දැන් ඉතින් යමක් කළ යුතුම ය'' යි තමාට කියා ගත්තේය. මේ හිස් ගෙයි හිඳගෙන මැරෙන්ට නම් ඔහුට නො හැකිය. තමාගේ බඩ පටිය දිනෙන් දිනම තදකර බැඳගත් සිය කෘශ වූ සිරුරෙහි ජීවත්වීමේ අධිෂ්ඨානය තදින් පැවතුනි. මේ අන්දමට, ජීවිතයේ පිරුණු අවධියට පැමිණෙන අවස්ථාවේදීම, දුෂ්ට දෛවය මගින් ජීවිතය පැහැර ගන්නට මෙසේ ඉඩහැරීම ඔහුට නොකළ හැකිය. ඔහු තුළ කියා පෑමට නොහැකි තරම් කෝපයක් ද හට ගෙන තිබුනි. මේ කෝපය සමහර විට ඔහු තුළ උමතුවක් මෙන් නැගුනේය. එවිට ඔහු හිස් කමතට දුවගොස් තම හිස මත සදහටම නිල්වන්ව බැබලුන, වලාකුල් විරහිත ආකාසයට මෝඩයකු මෙන් අත වැනුවේය, අතවනා අපරීක්ෂාකාරිව කෑ ගසන්නට වීය.

"ඕ! දෙව්ලොව ඉන්න නාකියා! අසත් පුරුෂයා!'' යි කියූ ඔහු මොහොතකින් බියට පත්වුනි. එහෙත් නැවත වරක් දුක් මුසු හඬින් "මට වෙලාතියෙන වාට වඩා නරකදෙයක් වෙන්න තියෙන්නෙ මොනවා ද '' යි කෑ ගැසීය.

වරක් බඩගින්නෙන් බෙලහීනවූ ඔහු, පයින් පය අද්දවමින් ස්වකීය දෙවොළ වෙත ගියේය. ගොස් එහි පිහිටි දෙව් රූ දෙකට ඔහු හිතාමතා ම කෙල ගැසුවේය, දෙව් රූ දෙකෙහි මුහුණටත් කෙල ගැසුවේය.

වෙනදා මෙන් මේ දෙව් රූ ඉදිරියෙහි දැල්වූ සඳුන් කූරු නොවීය. මාස කීපයක සිටම එහි සඳුන් කූරු දැල් වූ බවක

ලකුණක් ද දක්නට නොලැබුනි. දෙව් රූ දෙකට ඇන්දවූ කරදඬි ඇඳුම් ද වැරහැලි වී ගොස් තැනින් තැන සිදුරුවී තිබුනි. එම සිදුරු අතරින් දෙව් රූ දෙකෙහි මැටි සිරුරු දිස් වුනේය. කිසිවකින් නොසැලී සිටි දෙව් රූ දෙස අවඥා සහගතව නැරඹූ වං ලුං දත් කුරු කමින් යළි ගෙදර, බලා ගොස් කෙඳිරි ගාමින් සිය ඇඳෙහි වැතිර ගත්තේය.

දැන් මෙහි වැසියන්ට කෑමක් නම් නැත. කෑම වෙනුවට ඔවුන්ට තිබුනේ කඩින් කඩ නිදා ගැණීම පමණකි. කිසිවකු ඔවුන් අවදිකළේ ද කලාතුරකිනි. කුසගින්නෙහි අධික කම නිසා නින්ද ද ඔවුනට හරි හැටි නොලැබුනි. ධාන්‍ය පොතු ද ඔවුන් වියලා කා දැන් හමාරය. ගැමියෝ ගස්වල පොතු ද කැවෝය. ඔව්හු ශීත සෘතුවේ කඳුවල ඉතිරිව තිබුණ තණපත් ද ගෙවලට ගෙණ ගියහ. සතෙක් නම් කිසිම තැනක නොවීය. මීනිහෙකු දිනගණනක් ඇවිද්දත්, ගොණෙකුවත් බූරුවෙකුවත්, කුකුළෙකු වත්, වෙන මොනම සතෙකුවත් ඔහුට දැකගත නොහැකි තරම්විය. නොර තෝන්වියක් නැතිව හිස්වාතය හැමීම නිසා ළමයින්ගේ බඩවැල්ද ඉදිමුනි. ගමේ කෙළිදෙලෙන් කල් ගත කරණ දරුවෙකු නම් කොහිදීවත් දක්නට නොලැබුනේය. වං ලුං ගේ දරු දෙදෙනා වැඩිවසයෙන් දෙරලහට බඩගාමින් හිරු එළියෙහි සිටියහ. කෘර සූර්‍යයාද බැබලීම නැවැත් වූයේ නැත. වරක් රවුම්ව, පුෂ්ටිමත්ව සිටි දරුවන්ගේ සිරුරු, ඇට පෑදී කෘශවී ගොස් තිබුනි. ඔවුන්ගේ බඩවැල් හැරෙන්නට පෙනෙන්නට තිබුනේ ඔටුවන්ගේ මෙන් කුඩා ඇටකටුය. වයස් ගතවී සිටියත් වං ලුං ගේ ගැහැණු දරුවාට තනිවම හිඳගන්නට තවම නො හැකිය. සැම පැයකම, ඇය නොහඬාම පරණ පොරෝණයක ඔතනු ලැබ වැතිර සිටියාය. කලින් නම් කෝපයෙන් මෙන් ඇය නොකඩවා හැඬූ හඬින් ගෙය පිරී පැවතුනි. එහෙත් දැන් ඇය නිහඬය. කිසිවිටකත් ශබ්ද නො නගන ඇය, තමාට දෙන- ලද ඕනෑම දෙයක් උරමින්, කමින් කාලය ගෙව්වාය. ඇගේ ගිලුන දෙනෙත හැම දෙනෙකු දෙසම හැරෙව්වාය. ඇගේ දෙතොල් මැහැලියකගේ දෙතොලක් මෙන් වීය. මෙසේ අද්භූත ක්‍රමයකින් ඇගේ ප්‍රාණය අල්ලාගෙන සිටියේ, ඇය ඇගේ පියාගේ ස්නේහය දිනාගත් හෙයිනි. ඇය අනික් අය මෙන් තරබාරුව ප්‍රීතිමත්ව සිටියා නම් ඇය ගැණු දරු

වෙකු නිසා ඔහුගේ සැලකිල්ල නො ලබන්නීය. සමහර විට චං ලූං ඇය දෙස බලා ''දූප්පත් මෝඩ කෙල්ල! දූප්පත් පුංචි මෝඩී!'' යයි තොල් මතුළේය.

වරින්වර ඇය ඇගේ දත් විරහිත විදූරුමස් විදහා දුබල සිනාහවක් පහළ කරන්නීය. එබඳු අවස්ථාවක ඔහු කඳුළු සල සලා ඇගේ කුඩා අත තම අතින් ගෙන ඇගේ සිනිඳු ඇඟිලිවල මෘදු ස්පර්ශය විඳියි. ඇතැම් විට ඔහු ඇගේ නග්න දේහය උස්සා ඔහුගේ කබාය තුළ උණුසුම් පෙදෙසෙහි තබා ගනියි. මෙසේ තබාගෙන ඇය සමග ගෙහි උළුවස්ස මත හිඳගෙන වියලුන කුඹුරු දෙස බලාගෙන බොහෝවිට සිටියි.

මේ ගෙදර සියළු දෙනාටම වඩා හොඳින් කාලය ගත කෙළේ මහල්ලාය. දරුවනට නැතිවුවත් කන්නට යමක් තිබුනා නම් එය නොවරදවාම ඔහුට ලැබුනි. චං ලූං තම පියාට කළ උවටැන් ගැන ආඩම්බරයට පත්වුනේ ''තමන් සිය පියා අමතක නොකළ කෙනෙකු බව මරණ මොහොතෙදිවත් කවුරු හරි කියාවි'' යයි තමාට ම කියා ගනිමිනි. තමාගේම මස් වලින් වුවත් තම පියා පොෂණය කිරීමට දැඩි අධිෂ්ඨානයක් ඔහු තුළ හට ගති.

මහල්ලා දිවා රෑ දෙක්හිම නිදගත්තේ ඔහුට දෙන ලද යමක් අනුභව කරමිනි. දිවා කාලයෙහි හිරුරැස් පහස විඳුමට දොර ලඟට ඇදී ඒමට තරම් ඔහුට ශක්තියක් තිබුනි. එහෙයින්ම ඔහු ගෙදර අන් සියල්ලන්ටම වඩා ප්‍රීතියෙන් කාලය ගතකෙළේය. දවසක් ඔහු පැළුන උණගස් අතර සුළඟ ගැටෙන හඬ වැනි වූ ඔහුගේ ස්වරයෙන් මෙසේ කීවේය.

''මීට වඩා නරක දවස් තිබුනා. වරක් මම දැක්ක ගෑණු, පිරිමි ළමයින්ව කනව.''

''එහෙම දෙයක් මේ ගෙදර නං වෙන්නෙ නැතැ''යි චං ලූං කිව්වේ මහත් බියෙනි.

මේ දිනයෙහි සිය අසල් වැසියාවූ චිං දිනක් චං ලූං ගේ ගෙදරට පැමිණියේය. ඇත්තවශයෙන්ම ඔහු මිනිස් සේයාවක් මෙන් කෘශවී සිටියේය. ඔහු දුබල හඬින් මෙසේ තොල් මතුළේය.

''නගරෙ ඇයො ඔන්න බල්ලන්ගෙ – අස්සයන්ගෙ මස් කනව ලූ. අපි මෙච්චර දවස් කෑවෙ කුඹුරුවල වැඩගත්තු

සතුන්ගෙ මසුයි, තණකොළයි, ගස්වල පොතුයි තමයි. දැන් ඉතින් මොනවද කන්න ඉතුරුවෙලා තියෙන්නෙ.''

මේ වචන ඇසූ වං ලුං බලාපොරොත්තු රහිතව හිස වැනුවේය. ඒ මොහොතෙහි ද ඔහුගේ පපුවට තුරුළු කොට ගෙන සිටියේ සිය දියණියගේ කුඩා ඇටසැකිල්ලක් වැනි සිරුරය. ඔහු වරින්වර ඇගේ ඇටකටු මතුවුන සිහිඳු මුහුණ දෙස ද බැලුවේය. තම තුරුල්ලෙහි ඉඳගෙන නො නැවත් තම මුහුණ දෙසට යොමු කළ ඇගේ ගිලුන දෙනෙත ඔහුට පෙනුනි. ඇගේ බැල්මට ඔහුගේ බැල්මද එක්වුන විට ඇගේ මුහුණෙහි පහළ වුනේ චංචල සිනහ රැල්ලකි. එයින් ඔහුගේ හදවත ප්‍රීතියෙන් පිරී ගති.

චිං, වං ලුං වෙත තව තවත් ලංවුනේය. ලංව යලිත් තොල් මතුලේය.

''ගමේ මිනිස්සු මිනී මසුන් කනව. තමුසෙගෙ බාප්පයි එයාගෙ ලමයි තමයි ඒව කන්නෙ.

''එහෙම නැත්තං ඒගොල්ල ජීවත්වෙන්නෙ කොහොමද? ඇවිදින්න සත්තිය තියෙන්නෙ කොහොමද? කවුරුත් දන්නව ඒ ගොල්ලන්ට මොකුත් තිබුනෙ නැති බව.''

මෙසේ කිය කියා තමාට ලංවුන චිං වෙතින් වං ලුං ඉවත් වූනේ මරණයෙන් මෙන්ය. තමාට ලංවුන ඒ මිනිසා එතරම් භයංකර ලෙස ඔහු සැලකුවේය. ඔහු පිළිබඳව මෙතරම් බියක් තමාට ඇතිවුනේ කුමක් නිසා දැයි වං ලුං ට ද වටහා ගත නොහැකි විය. තමා අවට පැටලුන අනතුරක් ඉවත් කරන්නාට මෙන් සැරයි ඔහු ශබ්ද නගා කතා කෙළේය.

''අපි මෙතන අතහැරල යන්න ඕන. දකුණු පලාතට තමයි යන්න තියෙන්නෙ. මේ විශාල රටේ, සැම තැනම මිනිස්සු කන්න නැතුව මැරී මැරී යනව. කොච්චර දරුණු වුනත් දෙවියො, වං ගෙ දරුවන් වද කරන්නෙ නැහැ.''

චිං ඔහු දෙස ඉවසිල්ලෙන් බැලුවේය. ''හා! උඹනං තරුණයි. මම උඹට වඩා නාකියි. මගේ ගෑණිත් නාකියි. මට ඉන්නෙ එකම දූවයි. අපිට නම් මැරෙන්න උනත් පුළුවන්'' යයි ඔහු ශෝකයෙන් කීවේය. ''හා! එහෙනං උඹල මට වඩා වසනාවන්ත'' යයි වං ලුං කීවේය. මම කන්න දෙන්න එපායැ වයසක තාත්ත වයි, ලමයි තුන්දෙනෙකුටයි ලඟදී උපදින්න ඉන්න කව එකෙකු

ටයි. අපි නං කොහොම හරි යන්න ඕන. නොගියොත් වෙන්නෙ අපි අපිටම අමතක වෙලා බල්ලො වගේ එකිනෙකා කාගෙන මැරෙන්නයි.''

ඔහු කී දෙය සැබෑ බව ඔහුටම වැටහුනි. ගෙදර දොරේ කළ යුතු කිසිම වැඩක් නැති කමින් - උදුනට කෑමවත් - ලිපලන්ට දරවත් නැති බැවින් දවස් ගණනක්ම ඕලෑං කිසිත් නොකියා ඇඳෙහි වැතිර සිටියාය. මෙසේ වැතිර සිටි ඇයට වං ලූං ඇමතුවේය.

''මේ ඇහුනද? අපි යමු දකුණු පළාතට.'' ඔහුගේ ඒ වචන වල මාස ගණනකින් නොතිබුන තරම් ප්‍රීතියක් ගැබව තිබුනි. දරුවෝද උඩ බැලූහ. මහල්ලාද සිය කාමරයෙන් එළියට ඇදුණේය. ඕලෑං ද දුබල ලෙස සිය ඇඳෙන් නැගිට ඔවුන්ගේ කාමරයේ දොර ළඟට අවුත් උළුවස්සෙහි එල්ලී ''ඔව් ඒක හොඳයි. අඩුගණනේ ඇවිදින ගමන්වත් මැරුණ හැකි'' යයි කීවාය. ඈ සිය කෘශ වූ ශරීරයෙන් දරුගැබ උසුලා සිටියේ මහත් වෑයමින් මෙන්ය. ඇගේ මුහුණෙහි මස් කලදක් වත් නොතිබුනි.

''හෙට වෙනකං ඉඳිමු. මට එනකොට ළමය හම්බ වේවි......'' යයි ඈ යලින් කීවාය.

''එහෙනං හෙට'' යයි පුනරුච්චාරණය කළ වං ලූං බිරියගේ මුහුණ දෙස බැලුවේය. එවිට ඔහු තුළ ඇතිවුනේ කිසි දිනකින් ඇති නොවූ තරම් අනුකම්පාවකි.

''උඹ කොහොමද ඕහොමත් නියාගෙන ඇවිදින්නෙ'' යයි ඔහු තොල් මතුළේය.

එහෙත් දොරට හේත්තු වී සිටි චිං දෙස බැලූ වං ලූං ''උඹ ළඟ කෑම ඉතුරු වෙලා තියෙනව නම් පින් සිද්දවේවි මේ දරුවන්ගෙ අම්මගෙ පණ බේරගන්න ටිකක් දියන්. දවසක් උඹ මගේ ගෙදරට හොරකමට ආ බව මම අමතක කරන්නං'' යයි අකමැත්තෙන් මෙන් කීවේය.

චිං. ලජ්ජාවට පත්ව නිහතමානීව උත්තර දුන්නේය.

''එදට පස්සෙ උඹ ගැන හිතන කොටත් මට කණගාටුයි. උඹ ගාව අස්වැන්න එකතු කරගෙන තියෙනවයි කියල අර බල්ල - අර උඹේ බාප්ප තමයි මට බල කළේ. අනේ! දෙවියන්පා මගේ උළුවස්සෙ ගල යට වළලාල තව වේලපු බෝ-චි ඇට ටිකක් ඇති. මමත් මගේ ගෑනීත් මේව තියාගත්තෙ අපේ අන්තිම මොහොතට

Scanned by CamScanner

ගන්න. අපේ දරුවටයි අපටයි මැරෙණකොට අපේ බඩවැල්වල කෑම පොඩ්ඩක් දගෙන මැරෙන්න ඕන. මම එයින් ටිකක් උඹට දෙන්නං. හෙට පුළුවන්නං දකුණට පලයන්. මම මගේ ගෙදරම නවතිනව. මම උඹට වඩා නාකියි. මට පුත්තුත් නැහැ. මට උන්නත් එකයි මළත් එකයි.''

ඔහු මෙසේ කියා පිටව ගියේය. ටික වේලාවකට පසු, කඩු ලේන්සුවක ඔතන ලද පයින් කළුවූ රතු බෝංචි ඇට ටිකකුත් රැගෙන ඔහු පෙරලා පැමිණියේය. ඒ බෝංචි ඇට දුටු විට ලමයි එක්වූහ. මහල්ලාගේ ද ඇස් දිලිසෙන්නට වූනි. එහෙත් වං ලුං පළමුවරට ඒවා ගෙන ගියේ ඇඳෙහි වැතිර හුන් බිරිය වෙතය. ඇය ඇටයෙන් ඇටය ගෙන ඒවා ටිකක් අනුභව කෙළේ කැමැත්ත කින් නොවේ. එසේ නොකැමැත්තෙන් වුවද ඇය කෑම ටිකක් ගත්තේ නිරාහාරයෙන් සිටියොත් ප්‍රසව වේදනාව ඉවසිය නොහැකිව මැරේ යයි දන සිටි නිසාය.

වං ලුං බෝංචි ඇට කිපයක් අතෙහි සඟවා ගත්තේය. ඔහු ඒවා තම මුවෙහි දමා සියුම් ලෙස විකා, තම දෙතොලින් දියණිය ගේ දෙතොල් මත තබා ඇගේ මුවතුළට තල්ලු කෙළේය. ඇගේ කුඩා දෙතොල් සැලෙනු දුටු ඔහු තමාටද කෑම ලැබුනාක් මෙන් ප්‍රීතිමත් වුනේය.

එදින රැයෙහි වං ලුං සිටියේ මැද කාමරේය. දරුවන් දෙදෙනා මහල්ලාගේ කාමරයෙහි සිටියහ. තනිවම තුන්වන කාමරයෙහි සිටි ඕ-ලෑං දරුවා වැදුවාය. පළමු දරුවා ලැබුන දිනයෙහි මෙන්ම මේ දිනයෙහි ද ඔහු ඇඳෙහි වාඩිවී කන්දීගෙන සිටියේය.

ප්‍රසූත මොහොත ලංවන විට ඇය ඔහුට තමන් වෙත පැමිණීමට ඉඩ නොදීම ඇයගේ සිරිතකි. ඒ සියලුම කටයුතු ඇය තනිව කර ගන්නීය. ප්‍රසූතය සඳහා ඇණ තියා ගැණීමට ලී බාල්දියද ඇය විසින්ම තබා ගනු ලබයි. සතෙකු තම දරු උපතේ ලකුණු සඟවා තබන්නාක් මෙන් ඇය ද ප්‍රසූතයෙන් පසු කාමරය වටා ඇදෙමින් ප්‍රසූතයෙහිදී අවට ඇති වූ සියළුම ලකුණු මකා දැමීමට අමතක නොකරන්නීය.

වං ලුං ඒ රැයෙහි තිඹිරිගෙයට කන් යොමු කෙළේ නව මොහොතකින් ඇයෙතැයි සැලකූ ළපටියෙකුගේ හඬකටය. ඔහු එද බලාපොරොත්තු රහිතව එයට කන් දුන්නේ ''පිරිමියෙක්

උනත් ගැහැණියෙක් උනත් දූන් වැඩක් නැහැ. කන්න දෙන්න තවත් කටක් තමයි එයින් වැඩිවෙන්නෙ'' යයි සිත්විලි සිතමිනි.

''හුස්ම නැතිවුනොත් ලොකු සහනයක්'' යයි ඔහු තමාටම තොල්මතුරා ගත්තේය. ගතවූයේ මොහොතකි. දුබල හැඬීමක් ඔහුට ඇසුනි. රැයෙහි පැවති නිසංසල බව මොහොතකට එයින් බිඳීගියේය. ''මේ දිනවල මොනම සහනයක්වත් කොයින් ද''යි ඔහු තමාටම කියා ගනිමින් යලිත් තිඹිරිගෙය දෙසට කන් දුන්නේය.

දෙවන වර හැඬීමක් නොවීය. ගෙහි නිසල බව තව තවත් දැඩි වුනේය. දින ගණනක සිට කුස ගින්නෙන් මිය ගිය මළ සිරුරු වලින් පිරුණු ගමේ ගෙවල පැවති තරම් නිසංසල බව කින් මේ ගෙය ද යුක්ත වූනාක් මෙන් වං ලුං ට දැනුනි. එහෙයින් මේ නිසංසල බව ඔහුට ඉවසිය හැකි නොවීය. ඔහු බියවී ඇඳෙන් නැගිට, ඕලෑං සිටි කාමරයේ දොර ළඟට ගොස් යතුරු විවරයට මුව තබා කථා කෙළේය. එහෙත් කිසිවෙකුගේ පිළිතුරක් එයට නො ලැබුනේය. ඔහුගේ හඬෙහි දෝංකාරයම ඔහුට සැනසිල්ල ගෙන ආවේය.

''උඹට දූන් සනීප ද''යි ඔහු අසා යලිත් කන් දුන්නේය. ''ඇය එහිම ඉඳගෙන මැරෙන්ට ඇතැ''යි සිතද්දී කාමරය ඇතුළින් සුළු සෙලවීමක් ඔහුට ඇසුනි. ඇය කාමරයේ එහා මෙහා ගමන් කරමින් අන්තිමේදී කථා කළාය.

''එන්න'' යන ඇගේ ස්වරය ඔහුට ඇසුනේ සුසුමක් මෙන්ය.

ඔහු කාමරයට පිවිසුනේය. ඇය ඇඳෙහි වැතිර සිටියාය.

''කෝ දරුවා''යයි ඔහු ඇසුවේය. ඇඳ මත වැතිර සිටි ඇය අතින් සුළු සෙලවීමක් කළා ය. එවිට බිම තිබුන දරුවාගේ මළ සිරුර ඔහුට දක්නට ලැබුනි.

''මැරිලා!''යි ඔහු කීවේය.

''මැරිලා'' යයි ඇයද තොල් මතුළා ය. ඔහු නැඹුරුව කුඩා සිරුර පරීක්ෂා කරමින් ''හා! ඇට හා සම පමණයි! කෙල්ලක් අනේ මේක කැගහනව මට ඇහුනා'' යයි කියන්නට සැරසුනේය. එහෙත් ඔහු කිසිවක් නොකියාම ගැහැණියගේ මුහුණ දෙස බැලුවේය.

ඇගේ ඇස් පියවී තිබුනි. සිරුරෙහි පැහැය සුදු මැලිවී තිබුනි. ඇඟෙහි ඇටකටු මතුවී තිබුනි. සීමාව ඉක්මවා යන තරම් ඉවසූ, ඒ අහිංසක නිශ්ශබ්ද මුහුණ දුටු ඔහුට කිසිවක් කියා ගත හැකි නොවීය. ඇයගේ මේ දුබල සිරුරින් තවත් ජීවයක් දරා සිටීමට ඇය කොතරම් දුකක් විඳින්නට ඇද්දැයි ඔහු සිතුවේය. එහෙත් ඔහු කිසිවක් නො කීවේය.

මළ ලදරු සිරුර අනික් කාමරයකට ගෙන ගිය ඔහු එය බිම තබා එය ඔතන්නට ඉරුණ පැදුරු කැබැල්ලක් සොයා ගත්තේය. එයින් මළ කඳ ඔතන විට මළ සිරුරෙහි ගෙල මත සීරීම් තුවාල දෙකක් ඔහුට දක්නට ලැබුනේය. සිරුරට කළමනා සියළු කටයුතු නිමකළ ඔහු පැදුරු ගොන්න ද කර ගසා ගෙන ශක්තිය ඇතිතාක් දුර ගමන් කොට පැරණි මිනීවළක හැරී ගිය කොටසක එය තැබුවේය. බොහෝ කලකින් කිසිවෙකුගේ සැලකිල්ලට ලක් නොවූ සේදීගිය මේ මිනීවළ, වං ලුං ගේ බස්නාහිර කුඹුරු කෙළවර කඳු අද්දර තිබුන මිනී වළවල් අතරින් එකකි. වං ලුං මේ බර – මේ පැදුරු ගොන්නෙහි දවටූ මළ සිරුර බිම තබන්නටත් පෙර සාදුකෙන් පෙළුන කෘශවූ වෘකයෙක් පසුපසින් පැමිණ කැර කෙන්නට පටන් ගත්තේය. ඔහු ගලක් ගෙන වෘකයාට පහර දුන්නේය. එම ගල හඬ නගමින් වෘකයාගේ ඇඟෙහි වැදුනි. කුස ගින්නෙහි වැඩි කම නිසා එම ගල් පහරින් ද වෘකයා අඩි කීපයකට වඩා ඈතට නො ගියේය.

අවසානයේදී තමාගේ කකුල් පන නැති වේගෙන එන බව වං ලුං ට දැනුනේය. එහෙයින් ඔහු අතින් මුහුණ වසා ගෙන ගෘහාභිමුඛව ගමන් කෙළේය. ගමන් කරමින් ''දැන් හැටියට එහෙම උන එක වඩා හොඳය'' යි ඔහු තොල් මතුළේ බලාපොරොත්තු විරහිත හැඟීමකින් යුතුවය.

පසුදින උදයෙහි ද නිල්වන් අහසෙහි සිරිත් පරිදි හිරු නැග ආවේය. අසරණ දරුවනුත් දුබල ගැහැනියකුත් මහල්ලෙකුත් සමග මේ ගෙයින් පිටවීමට ඔහු කළ සිතුවිල්ල දැන් ඔහුට සිහිනයකි. මේ සිහිනය අනුව කෙළවරක් නැති අහස මෙන් කෙළවරක් නැති සිතිවිලි ද ඔහු හදවතෙහි පහළ වුනේය.

''කොතරම් ආහාර තිබුණත් සැතපුම් සියයක් පමණ පයින් ගමන් කරන්නේ කෙසේ ද?''

''දකුණෙහි කෑම ඇති නැති බව දන්නේ කවුද?''

''තමන්ගේ ඉතිරිව තිබෙන ශරීර ශක්තියත් වියදම් කර ගෙන තවත් බඩගින්නෙන් පෙළෙන නාඳුනන මිනිසුන් සමූහයක් අතරට මේ ගමනින් යන්ට සිදුවුනොත් වන්නේ කුමක් ද?''

''ඊට වඩා ගෙදර නැවතී තම යහනයන්හි මිය යාම වඩා හොඳයි නේද?'' යන ආදී විවිධ සිතිවිලි සිතමින් ඔහු ගෙයි දෙරකඩ මත හිඳගෙන අඳුරු බැල්මක් හෙලුවේ ගත හැකි සෑම දෙයක්ම ගෙණ අවසන් කළ වියලී ගිය කුඹුරු දෙසය.

මේ දවස් වල ඔහු ලඟ මුදල් ද නොතිබුනි. අන්තිම කාසිය ද ඉවර වී බොහෝ කල්ය. මුදල් තිබුණත් එයින් කළ හැකි යමක් නොවීය. මිලදී ගන්නටද කිසිම කෑම වර්ගයක් කිසිම තැනක නොතිබුනි. නගරයේ සමහර පෝසත්තු තමන්ට කෑම සපයා ගෙන ඉතිරි ඒවා වඩාත් පොහොසතුන්ට අධික මිලට විකුණන්ට තබාගෙන සිටින බව ඔහු දැන සිටියේය. එහෙත් ඔහු එයින් කෝප වූයේ නැත. මුදල් නොමැතිව කෑම ගන්නට වුවද නගරයට යන්නට තරම් සිතක් ඔහුට ඇති වූයේ නැත. ඇත්ත වසයෙන් ඔහුට බඩගින්නක් ද නොවීය.

පළමුව ඔහුගේ කුසයේ තිබුන දහය මේ දවස් වන විට නැතිවී ගොස් තිබුනි. , කුඹුරේ එක් තැනක තිබුන පස් ටිකක් ගෙන කලතා, තමා ගැන ආසාවක් නොමැතිව, දරුවන්ට දීමට දැන් ඔහුට පුළුවන. ඇත්ත වසයෙන්ම ඔවුන් ටික දිනක සිට කෑවේ මේ පස් ය. ''අනුකම්පාවේ දෙවිදුවගේ පස්'' යන නාමය ඔවුන් විසින් එයට තබන ලදී. මේ පසෙහි යම්කිසි පොෂ්‍ය ගුණයක් තිබුනත් ජීවත්වීමට තරම් එය ප්‍රමාණවත් නොවීය. දරුවන්ගේ ආසාව මැඩ පැවැත්වීමටත් ඔවුන් ගේ හිස්වූ කුසවල් පිරවීමටත් පමණක් එය වහල් වීය. ඕලැං ඇගේ අතෙහි තබාගෙන හුන් බෝංචි ඇට වලට ඔහු අතවත් නැබුවේ නැත. එහෙත් ඇය ඒවා වරින්වර විකමින් ශබ්ද නගන විට ඔහු තුළ සැනසීමක් හට ගත්තේය.

මෙසේ ඔහු සියළු බලාපොරොත්තු අතහරිමින් එළිපත මතින් ඉවත්ව ඇඳට ගොස් දිගාවී මරණය තෙක් පහසුවෙන් ලැබිය හැකි නින්ද ගැන සිතමින් සිටින විට වෙල්යාය හරහා තම ගෙය දෙස ගමන් කරන කීපදෙනෙකු දුටුවේය. යලි ඔහු ඇඳෙන් නැගිට එහි හිඳගෙන සිටියේ ඔවුන් ළඟාවන තෙක්ය. ඔවුන් ළංවත්ම

Scanned by CamScanner

එයින් එකකු තම බාප්පා බවත් ඔවුනතර නාඳුනන මිනිසුන් තිදෙනෙකු සිටින බවත් ඔහුට පෙනුණේය.

බාප්පා ගෙට ගොඩවුණේ ''මම උඹව දවස් කීපයකින්ම දක්කෙ නැහැ''යි කියමිනි. ඔහුගේ ස්වරයද උස් විය. එහි ව්‍යාජ ප්‍රීතියක් ද ගැබ්ව තිබුණි. ඔහු වං ලූං ට තව තවත් ළංවෙමින් එම උස් ස්වරයෙන්ම කථා කෙළේය.

''අනේ උඹල කොහොමද ජීවත් වෙන්නෙ? කොහොමද උඹේ තාත්තට – මගේ අයියට?''

වං ලූං තම බාප්පා දෙස බැල්මක් හෙලූවේය. කුසගින්නෙන් නොපෙලුනත් ඔහු කෑගවී සිටිනු ඔහුට පෙනුනේය. තම හැකිලුන සිරුරෙහි වූ අවසාන ශක්තිය ද තම බාප්පා කෙරෙහි දරුණු කෝපයක් ඇති කරවන බව ඔහුට දැනුනි.

මේ පැමිණ සිටි අමුත්තන් ගැනවත් ආචාරශීලී බව ගැනවත් නොසලකා ''උඹ කෑවෙ කොහොමද? උඹ කෑවෙ කොහොම ද''යි ඔහු හඬින් කොල් මතුලේය. බාප්පා තම පළල් ඇස් දෙක විවර කොට අහස දෙසට අත් එසවීය.

''කෑවේ!'' යයි ඔහු කෑගැහුවේය. ''උඹට මගේ ගේ බලන්න පුළුවන්නම් කුරුල්ලෙකුටවත් අහුල ගෙන කන්න දෙයක් එහේ නැහැ. මගේ ගෑණි උඹට එනකයි නේද කොච්චර ලස්සන එකියක් ද කියල? ඇගේ සිරුර කොච්චර තරට ද තිබුනෙ? දැන් තිකම්ම වැටක එනාපු රෙද්දක් වගෙයි. දැන් ඇගේ ඉතුරු වෙලා තියෙන්නෙ ඇටකටු විතරයි. අපේ දරුවන් ගෙනුත් ඉතුරු වුනේ හතර දෙනයි. බාල තුන් දෙනාම ගියා – ගියා. බලාපන් මා දිහා'' යයි කියූ ඔහු තම කමිස අතින් දෙ ඇස් කෙලවර පරීක්ෂාවෙන් පිස දැමීය.

''උඹ කාල තියෙනවා''යයි වං ලූං නිශ්චලව කීය.

''මම හිතුවෙ උඹත් උඹේ තාත්තත් ගැන විතරක්'' යයි ඔහු වහා පිළිතුරු දුන්නේය. ඔහු වැඩි දුරටත් කථා කරමින් කීයේ ''මම කෑම ලබා ගත්ත හැටි උඹට කියන්නං. නගරයේ ඉන්න මේ මහත්තැන්ගෙන් මම කෑම ටිකක් ලබාගත්ත. මේ අයට අපේ ගමේ ඉඩම් අරන් දෙන්න පොරොන්දු වෙලයි ඒව ගත්තෙ. ඉතින් මගේ අයියගෙ පුතාගෙ – උඹේ ඉඩම තමයි මම ඉස්සර වෙලා මතක් කෙළේ. ඊගොල්ල මේ ඇවිත් ඉන්නෙ උඹේ

ඉඩම අරගෙන සල්ලි එහෙම නැත්තං කෑම දෙන්න'' යන වචනයි.

මෙසේ කියූ බාප්පා අඩියක් පස්සට තබා ඉරිගිය කිලිටි කබාය සොලවමින් දෙඅත් හකුලා ගත්තේය.

වං ලුං නොසෙල් වුනේය. ඔහු ඇඳෙන් නැගිට්ටේවත් පැමිණ සිටි අමුත්තන් හඳුනා ගත්තේවත් නැත. සවල්ප වේලාව කට පසු ඔහු හිස ඔසවා ඔවුන් දෙස බැලුවේය. ඇත්තෙන්ම ඔවුන් නගරයේ අය බව ඔහුට වැටහුනි.

කිලිටි වූ දිග සිල්ක් ඇඳුම් ඇඳ සිටි ඒ නාගරිකයන්ගේ මෘදු අත්වල නියපොතු දිගට දිගේ වැඩී තිබුනි. ඇත්ත වශයෙන්ම ඔවුන් යමක් කා බී සිටියවුන් බව වටහා ගත හැකි වූනේ ඔවුන්ගේ ඇඟෙහි ලේ පැහැයෙන්ය. ඔවුන් කෙරෙහි ඔහු තුළ ඇති වූනේ තද ද්වේෂයකි.

''මේ නාගරිකයන්ට හොඳට කන්න බොන්න තියෙනව. අපි මේ සාදුකින් පෙළෙනව. යන්තම් පන ගැටගහගෙන ඉන්නෙ පස් කාල. එහෙමත් ඉදිද්දී මුං මේ ඇවිල්ල ඉන්නෙ අපේ ඉඩම් කොල්ලකා ගන්න'' යයි සිතමින් ඔහු ද්වේෂයෙන් ඔවුන් දෙස බැලුවේ ඇටසැකිලි බවට පත් මුහුණෙහි වූ ගිලී ගිය දෙනෙතිනි.

''මම මගේ ඉඩම් විකුණන්නෙ නැතැ''යි ඔහු කීය. මෙය අසා බාප්පා අඩියක් ඉදිරියට තැබුවේය. මේ මොහොතෙහි වං ලුං ගේ පුතුන් ගෙන් බාලයා දනගාමින් දෙර ලඟට පැමිණියේය. දනගාන වයසද ඉක්මවා සිටි මේ දරුවා මෙසේ දන ගෑවේ මන්ද පොෂණයෙන් ශරීර ශක්තිය පිරිහී ගොස් තිබුන හෙයිනි.

''මේ උඹේ කොළුවද? ග්‍රීෂ්ම ඍතුවෙදි මම පැන්සයක් දුන්නෙ මේ කොළුවට නොවේ ද'' යි බාප්පා ඇසුවේය. සියල්ලෝ ම දරුවා දෙස බැලූහ. කිසි දිනක නො හැඬූ වං ලුං එකවරටම හඬන්නට පටන් ගත්තේ ය. ඔහුගේ උගුර වේදනාවෙන් ගුලිවිය.

ඔහුගේ කම්මුල් දිගේ කඳුළු ධාරා ගලා වැටුනේය.

''මටත් මගේ බිරියටත් මේ ඉඩම්වල වළවල් හාරාගෙන එහි මැරෙන්න පුළුවන. ඒ උනාට මේ දරුවන්ටයි මහළු පියාටයි කොහොමහරි කෑම දෙන්න ඕන. හොඳයි උඹේ ගාන කීයද'' යි හැඬූ කඳුලෙන් යුතුව ඔහු විමසුවේය.

නගරයෙන් පැමිණි අයෙක් කථා කෙළේය. ඔහුගේ ඇසක් අන්ධවී මුහුණෙහි ගිලී තිබුනි. ඔහු කථා කෙළේ ද කැළඹීමකින් මෙන්ය.

''මේ බලාපන් මිනිහො! මේ සාගින්නෙන් පෙළෙන පුංචි ඇයො නිසා මේ දවස්වල කොහොමවත් ලබා ගන්න බැරි තරම් ලොකු මුදලක් අපි දෙන්නං. අපි උඹට අක්කරයකට පැන්ස සියයක් විතර දෙන්නං.''

වං ලුං එයට දුක්බර සිනහවක් පළ කෙළේ ''මොනව එච්චර දැ''යි අසමිනි. ''ඒක හරියට මගේ ඉඩම් තෑගි කරණව වගෙයි. මම ඔය ඉඩම් ගන්න විට ඔය වගේ විසි ගුණයක් ගෙව්වා'' යයි ද ඔහු පැවසීය.

''ආ ඒ උනාට ඒව උඹ ගත්තෙ බඩගින්නෙන් මැරුණ – පෙළුන අයගෙන් නොවේ දැ''යි නගරයෙන් පැමිණි වෙනත් මිනිසෙක් ඇසුවේය. ඔහු උස් වූ පොඩි නාසයකින් යුත් කුඩා මිටි මිනිසෙකි. ඒ මිනිසාගෙ හඬ වං ලුං ගේ හඬට වඩා උස්ය, රළුය, තදය.

වං ලුං ඔවුන් තිදෙනා දෙස බැලුවේ ''බඩසයින් පීඩිත දරුවනුත් වයසක පියාත් නිසා මිනිසෙකු කොතරම් පරිත්‍යාගයක් නමුත් කරති''යි සිතූ ඒ නාගරිකයන් වං ලුං ගැන සපීර තීරණයකට එළඹී සිටිද්දීය. එහෙත් වං ලුං ගේ දුබල බවත් බැගෑපත් බවත් තද කෝපයකට හැරුණේය. මෙ බඳු කෝපයක් මින් පෙර කිසි දිනක ඔහුට ඇති නොවීය. සුනඛයෙකු තම සතුරන් වෙත කඩා පනින්නාක් මෙන් ඔහු ඒ මිනිසුන් තිදෙනා වෙත කඩා පැන්නේය.

''මම ඉඩම් විකුණන්නෙ නැහැ. මේ ඉඩම්වල පස් අරගෙන මම ඒව දරුවන්ට කවනව. උන් මළහම මේ ඉඩම් වලම වළලනව. මමත් මගේ බිරියත් මගේ මහළු පියත් අපි උපන් මේ පොළොවෙම – මේ ඉඩම්වලම මැරිල ගියාවෙ.''

මෙසේ කියා ඔහු තදින් හැඬුවේය. වාත වේගයෙන් කෝපය ද නිවී යන්නට වුනි. ඔහු හඬමින් ගැහෙමින් නැගී සිටියේය. ඒ මිනිස්සු ද තම බාප්පා ද තරමක් සිනාසෙමින් නො සැලී සිටියහ. මේ කථාව ඔවුනට පිස්සුවක් මෙන් වීය. ඔව්හු වං ලුං ගේ කෝපය නිවෙන තෙක් බලා හුන්හ. මේ අතර ඕ ලෑං දෙර ළඟට අවුත් කථා කළාය. වෙනදා මෙන්ම මෙ දිනයෙහි ද ඇගේ ස්වර යෙහි පහත් බව නොවෙනස්ව පැවතුනි.

Scanned by CamScanner

''අපි ඉඩම් නම් විකුණන්නෙ නැහැ. දකුණෙ ඉඳල ආයිමත් ආවහම ඉන්නෙ කොහේද? කන්නෙ මොනවද ඉඩම් විකුණල. අපි මේ, මෙසෙයි, ඇඳන් දෙකයි, බංකු හතරයි, උදුන උඩ තියෙන කල්දේරමයි විකුණනව. උදැල්ලවත් රේක්කයවත් නගුලවත් විකුණන්නෙ නැහැ. ඉඩම් ගැන නම් කථා කරන්න ඕන කමක් නැහැ. අපි ඒව නම් විකුණන්නෙ නැහැ.''

ඇගේ ස්වරයේ සන්සුන් බැවින් ඔහුගේ කෝපය නිවී ඔහු තුළ ධෛර්‍ය්‍ය ගැන්වුනේය. ඉන්පසු වං ලුං ගේ බාප්පා අවිනිශ් චිතව කථා කෙළේය.

''ඇත්තටම උඹල දකුණෙ යනවද?'' මේ අතර එකැස් කණා සෙස්සන් සමග සාකච්ඡා කොට ගෙහි බඩු මුට්ටු දෙසට හැරී කතා කෙළේය.

''මේව ඉතින් දරට තමයි හොඳ. රිදී කාසි දෙකක් දෙන්නං. පුළුවන්නං දියන්. නැත්තං තියා ගනින්.''

ඔහු මෙසේ කියමින් අවඥා සහගතව ආපසු හැරෙද්දී ඕලෑං නිශ්චලව කථා කළාය.

''ඒක එක ඇඳක ගානටත් අඩුයි. ඒ උනත් උඹ ලඟ රිදී තියෙනව නම් ඒක මට විගහට දීල මේව අරගනිල්ල.''

එකැස් කණා තම බඳ පටිය අතගා ඇගේ දිගු කළ අතට මුදල් දැමුවේය. යලි ඒ තිදෙනා ගෙට පිවිස ඒ බඩු එළියට ගත්හ. පළමුවෙන්ම ඔවුන් වං ලුං ගේ ඇඳ එළියට ගත්තේ එහි දමා තිබුන ඇතිරිල්ලත් සමග ය. මැටි උදුන මත වූ කල්දේරම ගත්තේ ඉන් පසුව ය. ඔවුන් මහල්ලාගේ කාමරයට යද්දී බාප්පා එළියේ සිටියේ තම අයියා විසින් තමා දැකීම නොරිස්සූ නිසා ය. එමෙන් ම ඔහු බිම දමා ඔහු නිද සිටි ඇඳ ගනු දැකීම ද ඔහුට සිත් නොදුන්නේ ය. අන්තිමේ දී ගෙහි ඉතිරි වුනේ උදලු දෙකත් රේක්ක දෙකත් නගුලත් පමණකි. ඒවා තිබුනේ මැද කාමරයේ මුල්ලකය.

ඕලෑං සිය සැමියාට කථා කළාය.

''මේ රිදී දෙකක් වත් තියෙන වෙලාවෙ අපි යමු. නැත්නම පරාළත් විකුණන්න වේවි. ආයිමත් ආවහම රිංග ගන්න තැනකුත් එපායැ.''

''ඔව් යමු''යයි ඔහු කීයේ මහත් ශෝකයෙනි.

Scanned by CamScanner

තමන්ගේ ගෙහි බඩුත් රැගෙන කුඹුරු හරහා ගමන් කරණ ඒ මිනිසුන් දෙස බලමින් ''අඩු ගානේ වෙන මොකුත් නැතත් මට ඉඩම් තියෙනවා — ඉඩම් තියෙනවා'' යයි වං ලූං තොල් මතුළේය.

Scanned by CamScanner

ගමනට සැරසීමට පෙර, ලී සරනේරු මත වූ දොර තදින් වසා යකඩ අගුල දැමීම හැර ඔවුන් විසින් කළ යුතු අන් කිසිවක් එහි නොවීය. ඔවුන්ගේ සිරුරු මත වූ ඇඳුම් පමණකි ගමනට ගෙනයන්නටද ඔවුන්ට තිබුනේ. ඕලෑං, සෑම දරුවෙකුගේම අතට භාජනයක් ද ලී කැබලි දෙකක්ද දුන්නාය. කුඩා පිරිමි දරුවන් දෙදෙනා කෑම ලැබීමෙහි අනාගත සුභ ලකුණක් මෙන් ඒවා ආසාවෙන් තදින් අල්වා ගත්හ. ඉන්පසු ඔව්හු වෙල්යාය හරහා ගමන් ගත්හ. දුක්බර පෙරහැරක් මෙන් ඔවුන් සෙමින් ගමන් කෙළේ, ''මේ විදියට නම් ඔවුන්ට කිසි දිනකවත් නගරයේ පවුර ළහට ළහාවිය නොහැකි'' යයි ඔවුන්ගේ ගමන දෙස බලාගෙන සිටින්නෙකුට වුවද සිතෙන පරිදිය.

වං ලුං සිය ගැහැණු දරුවා තුරුල්ලෙහි තබාගෙන ගමන් කෙළේය. ඔවුන් හා ගමන් කළ මහල්ලා වැටෙන්නට යනු දුටු වං ලුං තම තුරුල්ලෙහි වූ දරුවා ඕලෑං අතට දී පියා ඔසවා කරට ගත්තේය. මහල්ලාගේ කෘශ වූ සැහැල්ලු සිරුර ද ඔහු කරට ගත්තේ මහත් අමාරුවෙනි. මෙසේ මහත් නිශ්ශබ්දතාවයෙන් ගමන් කළ ඔව්හු, තමන්ගේ දුක ගැන නොබලා නිසලව සිටින දෙව් රූ දෙකකින් යුත් ඒ දෙවොළ ද පසු කළහ.

සීතල වාතය නොකඩවා ඔවුන් වෙත හැමුවත් දුබල බව නිසා වං ලුං ට දහඩිය දමන්නට වුනි. දරුවන් දෙදෙනා සීතලෙන් කෑගැසූහ. එහෙත් වං ලුං ඔවුන් ධෛර්‍යවත් කෙළේය.

Scanned by CamScanner

''හා! හා! අඩන්න එපා! උඹල දූත් ලොකු මිනිස්සු දෙන්නෙක්. අපි මෙ දකුණට යනවා. එහේ හැමදම කැමත් උණුසුමත් තියෙනව. අපි සේරටම එහේදි කෑ හැකි'' යයි ඔහු කීවේය.

මග දිගට නැවති නැවතී ගිමන් හරිමින් අන්තිමේදී නගරයේ තාප්පය වෙත ඔව්හු පැමිණියහ. කලින් මෙහි සීතල ගැන ප්‍රීති වූ වං ලුං සීතලෙන් සැලි සැලී දත් මිටි කැවේය. කඳු බෑවුම් අතරින් ගලා යන අති සීතල දියදහරක් මෙන් සීතල වාතය නගරයේ දොරටුව තුලින් හමා ගියේය. එහි ඝන සීතල මඩ ගොහොරු ඔවුන්ගේ පයට පෑගෙන විට ඔවුන්ට දැනුනේ ඉදිකටු ඇනෙන්නාක් වැනි කටුක වේදනාවකි. දරුවන් දෙදෙනාටද එහි ගමන් කිරීම අපහසු වීය. තමාගේ බරින් ම පීඩිත වූ ඕ ලැං දරුවාගේ බරින් ද මිරිකුණාය. වං ලුං ද මහල්ලා කරගසාගෙන මහත් අමාරුවෙන් ගමන් කෙළේය.

ඔහු පළමු කොට මඩ ගොහොරුවෙන් එහා පැත්තට ගොස් මහල්ලා බිම තබා ආපසු පැමිණ එක් එක් දරුවෙකු රැගෙන එගොඩ කෙළේය. මෙයින් විඩාවට පත් ඔහුගේ ඇඟින් වර්ෂාවක් මෙන් දහඩිය රූරා වැටෙන්ට වීය. දරුවන් එගොඩ කිරීමෙන් ඔහුගේ ශරීර ශක්තිය පිරිහී ගිය නිසා බොහෝ වේලාවක් නගරයේ තෙත තාප්පයට හාන්සි වී සිටින්නට ඔවුන්ට සිදුවිය. ඔහුගේ බිරිය ද දරුවන් ද ඔහු අවට රැස්ව සීතලෙන් ගැහෙමින් සිටිද්දී ඔහු දෙනෙත් පියාගෙන හති දම දමා බලාගෙන සිටියේය.

බොහෝ වේලාවක් එහි නතරව සිටි ඔව්හු යලිත් ගමන් අරඹා කෙසේ නමුත් ''හ්වෑං'' මැඳුරෙහි මහ ගෙදර ගේට්ටුව සමීපයට ලංවූහ. එහෙත් වං ලුං තරම්ම උස්වූ ඒ ගේට්ටු දොර වසා තිබුනි. එහි දෙපස අඹා තිබුන සිංහරූප දෙක ද සීතල සුලඟ හැමීම නිසා අළුවන් පැහැ ගැන්වී තිබුනේය. ඒ අසල මිනිසුන් හා ගැහැණුන් කීප දෙනෙක් ද අප්‍රාණිකව උන්හ. සයින් පීඩිතව සිටි ඔව්හු වසා තිබුන ගේට්ටු දොර දෙස මහත් ආසාවෙන් බලා සිටියහ.

ස්වකීය අවාසනාවන්ත පිරිසත් කැටුව වං ලුං ඒ ගේට්ටුව පසු කර යද්දී ගේට්ටුව අසළ වූ එකෙක් භග්න ස්වරයෙන් මෙසේ කීවේය.

''පොහොසතුන්ගෙ හදවතත්, දෙවියන්ගෙ හදවත වගේම තදයි. මේ පොහොසතුන්ට කන්න තවම හාල් තියෙනව. නමුත් ඔවුන් ඉතුරුවෙන ධාන්‍ය වර්ග වලින් කරන්නෙ වයින් පෙරණ එක තමයි. උන් වයින් පෙරණව අපි මෙ බඩ ගින්නෙ මැරෙණව.''

"මගේ මේ අතේ පොඩ්ඩක්වත් ශක්තියක් තියෙනව නම් මම මේ ගේට්ටුවට යි ගේට්ටුව ඇතුළෙ තියෙන ගෙවල් වලටයි, මිදුල්වල තියෙන අලංකාර ගස් වලටයි ගිනි තියෙනව, ඒ ගින්නෙන් මම මළත් මේ "හ්වැං" මැඳුරෙ ඉන්න ඇයොන්ට හෙන ගහපුවාවෙ" යි තව එකෙක් හඬ නැගුවේය.

වං ලූං මේ කිසිවකට වචනයකුදු නොතෙපළා නිහඬව සිය පිරිසත් කැටුව දකුණ බලා ගමන් කෙළේය.

ඔහු නගරය පසුකොට දකුණු පැත්තට පැමිණි විට කළුවර වැටෙන්නට ලංව තිබුනි. ඔවුන්ගේ ගමන එතරම් සෙමින් විය. එහිදී දකුණට යන තව තවත් මිනිසුන් ඔවුනට මුණ ගැසුනි. රෑ බෝ වේගෙන එන විට වං ලූං කල්පනා කෙළේ ඔවුනට එකට ගුලි ගැහී නිදන්නට හොඳම තැනක් ය. එහෙත් වං ලූං පවුල ජනයා අතරට මැදි වුනේය. තමා ඔවුන් අතර තද බද වූවෙකු මෙන් සිතූ වං ලූං "මේ සේරම මිනිස්සු යන්නෙ කොහේද" යි ඇසීය.

"අපි බඩ ගින්නෙ මැරෙන මිනිස්සු තමයි. අපි මේ යන්න සූදනම් වෙන්නෙ ගිනි ක්රත්තෙ අල්ලගෙන දකුණට. ගිනි කරත්තෙ පිටත් වෙන්නෙ අර තියෙන ගෙයින්. අපිව රිදී කාසියකටත් අඩු ගණනකට දකුණට ගෙනියන්න ගිනි කරෙත්ත එහේ තියෙනවා" යයි ඒ මිනිසුන් අතර වූවෙක් කීය.

"හා ! ගිනි කරෙත්ත !" යයි ඔහු විශ්මයෙන් උච්චාරණය කෙළේ ඒවා ගැන අසා තිබුන හෙයිනි. ඔහු මේ ගිනි කරෙත්ත ගැන අසා තිබුනේ තේ කඩයකදී ය.. එකකට එකක් ඈඳූ මේ කරෙත්ත මිනිසෙකු විසින් නොව සතෙකු විසින් නොව මකරෙකු වැනි යන්ත්‍රයකින් ක්‍රියා කරන්නක් බව ඔහු අසා දැන සිටියේය. නිවාඩු ඇති දිනක මේ ගිනි කරෙත්ත බලන්නට යාමට අදහස් කර සිටි නමුත් නගරයට උතුරු පළාතෙහි වැසි ඔහුට ගොවිතැන් වැඩ අධික වීම නිසා එයට අවස්ථාවක් නොලැබුනි.

තමා නොදන්නා දෙයක් ගැන හෝ නොතේරෙණ දෙයක් ගැන සැකයක් හෝ අවිශ්වාසයක් ඇතිවීම සාමාන්‍ය මිනිසෙකු තුළ ස්වාභාවික වසයෙන් ඇතිවන්නකි. එබඳු අවිශ්වාසයක් ඔවුනතර ඇතිවන්නේ දිනපතා ජීවිතයට අවශ්‍ය වැඩි යමක් ඉගෙණ ගන්නට සාමාන්‍ය මිනිසෙකුට වුවමනාවක් හෝ අවස්ථාවක් නොලැබෙන

හෙයිනි. ගිනි කරත්තය පිළිබඳව සැකයක් ද අවිශ්වාසයක් ද විශ්මයක් ද වං ලුං තුළ හටගත්තේ ද ඒ නිසාය.

ඔහු සිය බිරිය දෙස බලමින් අවිශ්වාසයෙන්මෙන් කථාකෙළේය.

''මේ ගිනි කරත්තෙන් අපිත් යමුද ?''

ඒ දෙමහල්ලෝ, ගමන් කරණ ජනකායෙන් ඉවතට මහල්ලා ද දරුවන් දෙදෙනා ද ඇදගෙන එකිනෙකා දෙස භීතියෙන් හා ආසාවෙන් බැලූහ. තරමක ඉඩකඩ ඇති තැනක් බලා මහල්ලා එහි වැතිර ගත්තේය. ඒ අසලම, පැගෙන අඩි ගැනද නොසලකා දරුවෝ ද හිඳ ගත්හ. ඕලෑ එතෙක් ගැහැණු දරුවා ඔසවාගෙන සිටියාය. එහෙත් ඒ ගැහැණු දරුවාගේ හිස මවගේ උරයට උඩින් පහතට එල්ලෙමින් තිබුනි. ඇයගේ පියවුන ඇස්වල මැරුණ සවභාවයක් පළවුනෙන් වං ලුං ට අන් සියල්ලම අමතක වීය.

''ඔය පුංචි දසිය ! දූන්ම ම මැරිලාද''යි ඔහු ඇසුවේය. ඕලෑං හිස වැනුවාය. ''තවම නැහැ, තවමත් ඇගේ හුස්ම වැටෙනවා. නමුත් අද රෑ ඇයත් අපි සේරමත් මැරේවි. මොකවත්......''යි කීවාය.

ඉන්පසු තවත් වචන කථාකළ නොහැක්කා සේ ඇය ඔහු දෙස බැලුවාය. ඇගේ හතරැස් මුහුණ විඩාවට පත්ව රළුවී තිබුනි. වං ලුං කිසිවක් කථා නොකෙළේය. මේ දිනයෙහි මෙන්ම තවත් දිනක් ඇවිදින්නට වුනොත් තමන් සියළු දෙනාම මැරෙණ බව ඔහු ඔහුටම කියා ගත්තේය. එහෙයින් ඔහුගේ සවරයේ තිබුන සෑම ප්‍රීතිදයක බවක් ම යොද ඔහු මෙසේ කීය.

''නැගිටපන් දරුවනේ ! සීයාවත් නැගිටුවපල්ලා ! අපි ගිනි කරත්තෙ යමු. ඒ කරත්තෙ ඉඳගෙන කතාකර කර දකුණට යමු.''

වං ලුං එසේ කථාකළත් ඔවුනට සෙලවිය හැකිද නැද්ද යනු කිසිවෙක් නොදත්හ. එය දැනගත හැකිවුනේ අඳුර බිඳගෙන මකරෙකු මෙන් ගොරවාගෙන ගිනිවන් ඇස් දෙකක් ද සහිතව දුව ආ යූමක් නිසාය. එය එනවිට සියල්ලෝම කෑගසමින් දුවන්නට වූහ.

මේ කලබලය මධ්‍යයේ එහාට මෙහාට තෙරපුන ඔව්හු එකිනෙකා තදින් අල්වාගෙන සිටියහ. අවසානයෙහි දී කෑකෝ ගැසීම් මධ්‍යයෙහි ඔව්හු විවෘත වූ දෙරකින් පෙට්ටියක් වැනි කාමරයකට කෙසේ හෝ තල්ලු කරනු ලැබූහ. ඉන්පසු නොනැවතී කෙරුන ගර්ජනයෙන් යුතුව ''ඒ කාමරය,'' අඳුරද බිඳගෙන දුවන්නට වූයේ ඒ ජනකාය ද රැගෙනය.

ගේ ගිතිකරත්තයෙන් වං ලුං පවුලට ගමන් කරන්ට සිදුවුනේ සැතපුම් සියයක් පමණ දුර කි. වං ලුං එහි ගාස්තුව වසයෙන් රිදීකාසි දෙකක් ගෙවීය. ඔහුගෙන් මුදල් ගත් නිල ධාරියා ඔහුට පැන්ස කීපයක් ආපසු දුන්නේය. වාහනය නතර කළ තැනක දී, එහි කවුළුවකින් තම බඩු, රිය ඇතුළට දිගුකළ වෙළෙන්දෙකුගෙන් කුඩා පාන්ගෙඩි හතරකුත් කෙල්ලට බත් පීරිසියකුත් වං ලුං ගත්තේ මේ පැන්ස කීපයකිනි. මතක ඇති කාලයකින් ඔවුන්ට මෙතරම් ආහාර ප්‍රමාණයක් නොලැබුනි. ඔවුන් කෑම නැතිකමින් පීඩිතව සිටියත් ඒවා කන්නට සැරසුන විට ආහාර රුචිය නැතිව ගියේය. පිරිමි දරුවන් දෙදෙනා යමක් කෑවේ පෙරැත්ත කිරීමෙන් පසුවය. එහෙත් මහල්ලා පමණක් තම දත් නැති හකුවලින් පාන්ගෙඩිය අල්වාගෙන ඉවසිලිමත්ව ලොඹු කරන්නට වීය.

රිය පැද්දෙන විට, තමාගේ ඇඟට තදවූ සෑම කෙනෙකුටම ඔහු මිත්‍ර ලීලාවෙන් කථා කෙළේය. ''කවුරුත් කන්න ඕනැ''යයි ඔහු කීය. ''මෙච්චර දවස් නිකං හිටල මගේ මේ මෝඩ බඩත් දූන් කම්මැලි වෙලා. ඒකට කමක් නැහැ. ඒකට කොහොමහරි කන්න දෙන්න ඕන''යයි සිනා සෙමින් කොඳුරන තුනී පැසුන රැවුලකින් යුත් මහල්ලා දෙස බලා රියෙහි වූ මිනිස්සු ද සිනා සුනාහ.

තමා ළඟ තිබුන පැන්ස සියල්ලම වං ලුං කෑම සඳහා වියදම් නොකෙළේය. දකුණට ගියවිට කුඩාපැලක් සාද ගැනීම සඳහා පැදුරු ගැනීම පිණිස, ඔහු හැකිතරම් මුදල් ඉතිරිකර ගත්තේය.

Scanned by CamScanner

මේ ගිනිකරත්තයෙහි, මීට පෙර අවුරුදුවලද දකුණට ගිය ගැහැණු පිරිමි සිටියහ. කෑම වියදම ඉතිරි කරගැන්ම සඳහා වැඩ කරන්නටත්, සිහාකන්නටත් දකුණේ ඇති පොහොසත් නගර වලට අවුරුදු පතාම ගිය අය ද එහි වූහ. වංලුං ද තමා වාඩිවී යන කරත්තයට ද එහි කවුළු අතරින් පෙනෙන කරකැවී ගමන් කරණ ගස් කොලන් ආදී දර්ශනවලට ද පුරුදු වුන පසු එහි මගීන්ගේ කථා වලට කන්දෙන්නට පටන් ගත්තේය. කීප වතාවක් මේ රියෙහි ගමන් කළ පුරුදු මගීහු එහි වූ සෙස්සන් මෝඩයන් මෙන් සලකා තමන්ගේ පණ්ඩිත බව පළකරමින් ශබ්ද නගා කථා කළහ.

''පළමු කොටම උඹලට එහේ ගිය හැටියෙම පැදුරු හයක් ගන්නට වේවි''යයි එකෙක් කීය. ඔහුගේ තොල් ඔටුවෙකුගේ මෙන් සනව එල්ලෙමින් තිබුනි. ''ඉතින් උඹල එහේදී ගොඩයො වගේ වැඩකරන්න එපා! ඥනවන්ත විදියට හැසුරුනොත් ඔය පැදුරක් පැන්ස දෙහෙකට ගනහැකි. එහෙම නැති උනොත් පැන්ස තුනක් ගෙවන්න වේවි. ඒක ගාන වැඩියි. මම හොඳට දන්නව. ඔය නගරයෙ ඇයො කොච්චර පොහොසත් උනත් මම නං ඔවුන්ට රවටෙන්නෙ නැහැ''යි කියමින් ඔහු හිස සොලවා අවට සිටියවුන් දෙස ගම්භීර ලීලාවකින් බැලීය.

වංලුං ඒ කතාවට ආසාවෙන් කන්දුන්නේය. ''ඉතින් ඉතින්'' යයි ඔහු යලිත් ඒ මිනිසා උනන්දු කෙළේ කරත්ත තට්ටුවෙහි ඇණ තියාගෙන සිටිමිනි. ලී වලින් සෑදූ ඒ හිස් රිය කුඩුවෙහි හිඳගන්නට තරම් නොවීය. එහි තට්ටුවෙහි තිබුන විවර වලින් සුලඟ ද දූවිලි ද රිය තුළට ඇදී ආවේය.

'ඉතින්' යයි ඒ මිනිහා යලිත් කථාව ඇරඹුවේ පෙරටත් වඩා ශබ්ද නගමිනි. රියෙහි හඬත් යටකරමින් ඔහුගේ හඬ පැතුරුනි.

''ඉතින් උඹ ඒ විදියට පැදුරු එකතු කරගෙන පැලක් හද ගන්න ඕන. ඊට පස්සෙ තමයි එහි නවතින්න ඕන. ඒ ඔක්කො වොමත් ඉස්සෙල්ල උඹලව කාලකන්නි විදියට පේන්න මඩයි කුණුයි ඇඟේ තවර ගනිල්ල.''

ජීවිතයේ කිසිදිනකත් වංලුං සිහා කා නැත. එහෙයින් දකුණේ නාඳුනන මිනිසුන් අතරෙහි ද හිඟා කෑමට ඔහු අකැමැති වීය.

Scanned by CamScanner

''හිඟා කන්න ඕනමද''යි ඔහු ඇසීය. ''ඔව් ඇත්තෙන්ම ඕන'' යයි ඒ ඔටුු තොල් කාරයා කීය. ''නමුත් ඊටත් කලින් උඹල කෑම ගන්න ඕන. මේ දකුණෙ මිනිසුන්ට ඕන තරම් වී තියෙනවා. සෑමදම උදේට එහේ තියෙන බත්කඩයකට ගිහිල්ල පැන්සයකට උඹට ඇතිතරම් සුදුහාල් කෑඳ බීල ආවහැකි. ඊට පස්සෙ උඹලට ලෙහෙසියෙන්ම හිඟාකාල දූන්තෙල්, ගෝව, සුදුලූනු හේම ගන්න පුළුවන්.''

''ඉතින් එහේ මිනිසුන්ට කරන්න වැඩ නැද්ද''යි වං ලුං ඒ මිනිහා දෙසට හැරී ඇසුවේය.

''ඔව් වැඩ'' යයි ඔහු බිමට කෙල ගසමින් අවඥ සහගතව යලිත් කථා කෙළේය. ''උඹට කැමති නම් රික්ෂෝවක පොහොසත් මිනිසෙකු තියාගෙන ඇද ඇවිද්දූකි. එහෙම දුව ඇවිදින කොට උඹේ දඩියට ලේත් පිටවේවි. ඒ දඩිය අයිස් තට්ටු බවට පත් උනායින් පස්සෙ තමයි උඹට නැවතත් සවාරියක් ලැබෙන්නෙ. මට නං හිඟා කෑම ඊටවඩා හොඳ''යයි ඔහු මහ හඩින් කී බැවින් වං ලුං ඔහුගෙන් වෙනයමක් නොඇසුවේය.

එහෙත් ඒ මිනිහා කියූ දෙය අසා ගැනීම ඔහුගේ යහපතට හේතුවිය. ගිනි කරත්තය හැකිතාක් දුරට ඔවුන් ගෙන ගොස් දමන විට වං ලුං ගේ සිතෙහි ඇඳුණ වැඩ පිළිවෙළක් විය.

ඔහු මහා මන්දිරයක තාප්පයක් අයිනේ මහල්ලාද දරුවන්ද නතරකොට සිය බිරියට ඔවුන් බලා ගන්නට පවරා වෙළඳපොල ඇති තැන එක එකාගෙන් අසමින් පැදුරු ගෙන එන්නට ගියේය. පළමුවෙන්ම ඔහුට, හමුවුන කිසිවකු තේරුම් ගන්නට නොහැකි විය. දකුණේ මිනිසුන්ගේ කථාවේ ශබ්දය එතරම්ම තදය තියුණුය. ඔහු එකම වචනය හමුවුන–හමුවුන අයගෙන් නැවත නැවතත් ඇසුවේ ඔවුන්ගේ කථාව තේරුම් ගන්නට ඔහු අසමත්වුන නිසාය. ඔහුගේ මේ කරදරයෙන් ඔහුට හමුවුන නාගරිකයෝ නොඉවසිලිමත් වූහ. එහෙයින් ඔහු විමසිය යුත්තේ කවරෙකුගෙන්දැයි සොයා බැලුවේය. අන්තිමට තීරණය කරගත්තේ කරුණාවන්ත මුහුණක් ඇතියෙකු ගෙන්ම එය විමසීමටය. දකුණෙහි මිනිසුන් ඉතා ඉක්මණින් කිපෙන බව ඔහු වටහා ගත්තේය.

අන්තිමේදී නගරයේ කෙළවරක තිබුන පැදුරු කඩයක් ඔහු කොහොම හරි සොයාගත්තේය. බඩුවල මිළ දන්නා අයකු මෙන්

පැත්ස ටික මේසය මත දමා පැදුරු මිටියද රැගෙන පිටවුනේය. ඔහු සෙස්සන් නවතා සිටි තැනට එන විට ඔව්හු තමන් එන පෙර මග බලාගෙන සිටියහ. ළමෝ ඔහු දැක ප්‍රීතියෙන් කෑගැසූහ. මේ නාඳුනන ස්ථානයෙහි ඔවුන් බියෙන් පිරී සිටින අයුරු ඔහුට පෙනුනේය. මහල්ලා පමණක් සියල්ලන් දෙසම විශ්මයෙන් හා ප්‍රීතියෙන් බලා සිටියේය. වං ලුං ට ඔහු මෙසේ තොල් මතුළේය.

"බලාපන් මේ දකුණේ මිනිස්සු කොපමණ තරද කියල? උන්ගෙ හම කොපමණ ලස්සනද? නොවරදවාම උන් දවසගානෙ ඌරු මස් කනව ඇති."

ඔවුන් නතරවී සිටි ඒ ස්ථානයෙන් බොහෝ මගීහු ගමන් කළහ. එහෙත් කිසිවෙක් වං ලුං හා ඔහුගේ පවුල දෙස නොබැලූහ. ඔවුනට මග දෙපස සිටින හිඟන්නන් දෙස බැලීමට වුවමනා නොවීය. වරින්වර බූරුවෝ ද තවලම් ද ඒ ස්ථානය පසුකර ගියහ. බූරුවන්ගේ පිටින්හා තවලම් වලින් ගෙවල් තැනීම සඳහා ගෙනයන උළු – කුඩා වැනි උපකරණ ද එසේත් නැතහොත් ධාන්‍ය මලුද වීය. සෑම තවලමකම කෙළවර ගමන් කළ සතාගේ පිටඋඩ මිනිසෙක් නැග ගමන් කෙළේය. ඒ මිනිසාගේ අතෙහි දිග කසයක් විය. ඔහු කෑගසමින් සතුන්ගේ පිටමත ඒ කසය පුපුරවන විට එයින් නැගුනේ මහ හඬකි. වං ලුං පසුකර ගිය සෑම තවලම් දක්වන්නෙක්ම ඔහු දෙස අවඥ සහගතව සාඩම්බර බැල්මක් හෙළීය. මග අසල සිට විශ්මයෙන් බලා සිටින මිනිස් සමූහයක් පසුකර යන රළු කබා හැඳගත් ඒ තවලම් දක්කන්නන් තරම් සාඩම්බර එකද කුමාරයෙකු වත් එහි නොසිටි තරම්ය. සෑම තවලම් කාරයෙක්ම ඔවුන් ඒ නගරයට අමුත්තන් බව දැනගෙන ඔවුන් පසුකර යනවිට කසය පුපුරවන්නට. වීය. එයින් නැගෙන හඬින් බියපත් ඔව්හු උඩ විසි වූහ. එය දුටු තවලම් කාරයෝ මහහඬින් සිනාසුනාහ. මෙය දෙතුන් වරක් දුටු වං ලුං කෝපයට පත්වීය. ඔහු හැරී පැලක් සෑදීමට සුදුසු තැනක් සොයන්නට පටන් ගත්තේය.

තමන් හුන් තැනට පිටුපසින්වූ තාප්පය අද්දර තවත් පැලවල් ගණනක් විය. එහෙත් තාප්පයට ඇතුල් පැත්තෙන් තිබෙන්නේ කුමක්දැයි කිසිවෙක් නොදත්හ. ඔවුනට එය දැනගන්නට ක්‍රමයක්ද නොවීය. ඒ තාප්පය අඳුරුවන්ව උසට උසේ දිගට දිගේ විහිදී තිබුනි. එහි පාමුල කුඩා පැදුරු පැලවල් ඇලී තිබුනේ බල්ලන්ගේ ඇඟට

Scanned by CamScanner

ඇලුන මැක්කන් මෙනි. වං ලූං සෙසු පැලවල් දෙස ද බලා තමාගේ පැලද ඒ අයුරින්ම තනන්නට තැත් කෙළේය. එහෙත් මේ පැදුරු පලාපු වේවැලින් තැනුන බැවින් පැලවල් සෑදීම ලෙහෙසි කටයුත්තක් නොවූයේ ඒවායේ තදගතිය නිසාය. එහෙයින්ම ඔහු බලාපොරොත්තු සුන්කර ගත්තේය.

''එය මට කළ හැකි. පොඩිකාලෙ ඕවයින් පැලවල් තැනූ හැටි මට මතක''යයි එකවරම වං ලූං දෙස බලා හුන් ඕ ලෑං කීවාය. එසේ කියා කුඩා ගැහැණු දරුවා බිමතැබූ ඇය නොයෙක් අයුරින් ඒ පැදුරු එහා මෙහා අදිමින් බිමට ගෑවෙන රවුම් වහලක් තැනුවාය. හිස නොගෑවී මිනිසෙකුට හිඳගත හැකි තරම් ඒ පැල උස් වීය. පොළොව මත තිබුන පැදුරු කෙරවල් වල ඇය, වටපිට තිබුන ගඩොල් කැට අහුලා තැබුවාය. තවත් ගඩොල් කැට අහුලන්නට ඇය කොල්ලන් පිටත්කර හැරියාය. එය සාද අවසන්වූ පසු ඔව්හු එහි ඇතුළට ගියහ. ඇය ඉතිරි කරගත් එක් පැදුරක් පැලෙහි බිම එලුවාය. ඔව්හු ඒ මත හිඳගත්හ. දැන් වං ලූං පවුලෙහි අළුත් නිවාසය මෙයයි.

මෙසේ හිඳගත් ඔව්හු එකිනෙකා දෙස බැලූහ. මෙයට පෙර දින ඔවුන් තමගෙය හා ඉඩම් අත්හැර ආබවත් දැන් ඒවාට සැතපුම් සියයක් ඈතින් වෙසෙන බවත් ඔවුන්ට පෙනුනේ සිදුවිය නොහැකි දෙයක් මෙන්ය.

පයින් ගමන් කළා නම් ඔවුනට මේ පෙදෙසට එන්නට සති ගණනක්ම ගතවන්නේය. දැන් ඔවුන් මේ සිටින්නේ එපමණ දුරකය. මෙතරම් දුරක් පයින් ආවානම් අතරමගදී මරුමුවට පත්වන්නටද ඔවුන්ට සිදුවනු ඇත.

මේ ධනවත් රටෙහි ස්වයංපෝෂිත බව – සමෘද්ධිමත් බව ඔවුනටද දැනුනි. එහෙයින් ''අපි දැන් ගොස් මේ නගරයේ කෑම බෙදදෙන 'ප්‍රසිද්ධ කුස්සිය' සොයමු'' යයි වං ලූං කීවිට ඔව්හු ප්‍රීතියෙන් මෙන් නැගී සිට තව වරක් එළියට පැමිණියහ. කොල්ලන් දෙදෙනා ගමන් කරත්ම තමන්ගේ ලී කැබලි වලින් භාජනයට තට්ටු කරන්නට වූහ. ඔවුන් එසේ භාජනවලට තට්ටු කෙළේ ඒවායේ දමන්නට ඉක්මනට යමක් ලැබෙන හෙයිනි. මේ දිග තාප්පයටම අල්ලා පැලවල් තැනීමට හේතුව ඔව්හු සොයා ගත්හ.

Scanned by CamScanner

එහි උතුරු කෙළවරින් මඳක් ඔබ්බට වෙත්ට පිහිටි එක් වීථියකි. මේ වීථිය දිගේ හිස් භාජන පතිට්ටු හා වෙනත් භාජන රැගත් මිනිස්සු බොහෝ ගණනක් ගමන් කළහ. ඔවුන් මේ යන්නේ මේ වීථිය කෙළවර නුදුරින් පිහිටා තිබුන දූප්පතුන්ට වෙන්වූ බොජුන්හල වෙතටය. වං ලූං හා ඔහුගේ පවුලද මේ බොජුන්හල වෙත යන මිනිසුන් කණ්ඩායමට එකතු වූහ. සියල්ලෝම එකතුව් පැදුරු වලින් තැනූ විශාල ගෙවල් දෙකක් වෙත පැමිණියහ. මේ සියල්ලන්ම රොක් වූනේ එහි දෙර විවෘතව තිබුන පැත්තෙහිය.

ඒ සෑම බොජුන් හලක කෙළවර මැටි උදුන් විය. ඒවා වං ලූං පෙර දක තිබුන උදුන් වලට වඩා විසාලය. ඒ උදුන් මත ලිං මෙන් විසාල කල්දේරම් තබා තිබුනි. ඒවායේ ලොකු පියන් ගලවන විට පෙනුනේ උතුරමින් නටමින් තිබුන හොඳ සුදු හාල්ය. සුගන්ධ වත් හුමාලය ද එයින් පැන නැගුනි. මේ ආඝ්‍රාණය ඔවුන්ට දැනුනේ ලෝකයේ ම ඇති උසස්ම සුගන්ධය ලෙසය. ඔවුන් සියල්ලෝම එක රොත්ත පිටින්ම එයට ලංවූහ. එසේ ලංවුන ඔව්හු ශබ්ද නගා කථාකළහ. තම දරුවන් පෑගෙතියි මව්වරු කෝපයෙන් කෑගැසූහ. අත දරුවෝ හැඬූහ.

කල්දේරම විවෘත කල මිනිස්සු— ''හැම දෙනාගෙම වාරය ආවිට හැමෝටම කන්න දෙන්න මෙතැන තියෙනවා''යි මොර දුන්හ. එහෙත් කිසිවකින් මේ සාදුකින් පෙළෙන මිනිසුන් නතර කළ හැකි නොවීය. ඔවුන් සෑම දෙනාම කෑම ලැබෙනතුරු මෘගයන් මෙන් පොර කෑහ. වං ලූං ද ඔවුන්ගේ මධ්‍යයට වැටුනේ, තම පියාත් දරුවන් දෙදෙනාත් අල්ලාගෙන සිටීම විනා කළ හැකි අන් යමක් නොවීය. ඔව්හු කෙසේ නමුත් කල්දේරම ලඟට තල්ලුවුන පසු තම භාජනය දිගුකොට එය පිරුණ විට තම කාසිය එදෙසට දැම්මෝ ය. කාර්‍ය්‍යපූරණයට පෙර තල්ලුවී නොයාම වැළැක්වීම පිණිස ඔවුනට මුළු ධෛර්‍ය්‍යයම යොදන්නට සිදුවීය.

ඉන්පසු ඔවුහු වීථියට අවුත් ආහාර අනුභවයට පටන් ගත්හ. බත් අනුභවයෙන් ඔවුන්ගේ කුස පිරුණි. භාජනයේ තව ස්වල්පයක් ඉතිරිවීය.

''මම මේ ටික සවසට තාත්තාට ගෙනියනවා''යයි ඔහු කීවේය.

නිල් හා රතු වර්ණ මිශ්‍ර වූ විශේෂ ඇඳුමක් ඇඳගත් නිලධාරියෙක් මේ වචනය අසා තදින් කථා කෙළේය.

"බැහැ! බැහැ! බොලාට මොනවත් ගෙනියන්න බැහැ" යි ඔහු කීය.

"මම මගේ පැන්සය ගෙව්ව නිසා ඒව ගෙනිච්චත් ඔබට වරදක් වෙන්නෙ නැහැ නේද?"

"බැහැ! බැහැ! අපට ඒ නීතිය එහෙම ක්‍රියාවෙ යොදවන්න වෙලා තියෙනව. සමහර හිතක් පපුවක් නැති අය දුප්පත් අයට දෙන්න තියෙන මේ කෑම අරගෙන ගිහින් ගෙවල්වල ඉන්න ඌරන්ට කන්න දෙනව. පැන්සයකට මේ වගේ කෑම ගන්න කොතනකින් වත් බැහැ. බත් තියෙන්නෙ මිනිසුන්ට උතුරවන්න නෙවි" යයි ඒ මිනිහා එවිට කීවේය.

වං ලුං විශ්මයෙන් සවන් දී යලි මෙසේ කීවේය.

"හැබැටම එච්චර තද මිනිස්සුත් ඉන්නව ද? ඇයි මේ විදියට දුප්පතුන්ට දෙන්නෙ? කාගෙ වැඩක් ද මේක?"

"ඔය මේ නගරයෙ ඉන්න පොහොසත්තු තමයි මේව දෙන්නෙ. සමහරුන්ගෙ අදහස මේ ආත්මෙ දන් දීල දිව්ය ලෝකෙ යන්න. නවත් සමහරෙක් මේ විදියට දෙන්නෙ හොඳ වැඩක් නිසා, සමහරු දෙන්නෙ තමන්ගෙ හොඳ නම කියව ගන්න" යයි ඒ මිනිහා කීය.

"මොන කාරණයකට උනත් ඒක නම් හොඳ වැඩක්"යයි ඔහු කීවේය. "සමහරු හොඳ හිතින්ම එහෙම කරණවා ඇති"යයි කියා යලිදු ඒ මිනිහාගෙන් උත්තරයක් නොලැබුන නිසා "මේ වගේ ටික දෙනෙක් වත් සිටිනවා නෝ"යි වං ලුං තමාගේ ආරක්ෂාවට මෙන් කීවේය.

වැඩිපුර ඔහු හා කථා කිරීමට නොරිස්සූ ඒ මිනිහා අනික් පසට හැරී සිවුරුවම් හඩ ලන්නට වීය. දරුවෝ වං ලුං ඇල්ලා අදින් නට වූහ. ඉක්බිති ඔහු ඔවුන් සමග ඒ පැල්පත වෙත පැමිණියේය. එහි සියල්ලෝම බිම වැතිරී පසුදින උදය වන තෙක් නිදන්නට වූහ. ගමන් විඩාවත් හුඟ කලකින් කුස පුරා ආහාර ලැබීමත් නිසා ඔවුන්ට වහාම නිදිමත වුනේය.

ඊලඟ දිනය සඳහා මුදල් සෙවීම ඔවුනට අවශ්‍ය වුනේ උදය කෑම සඳහා ලඟ තිබුන අන්තිම කාසිය ද ඔවුන් වියදම් කළ හෙයිනි. කළයුතු දෙය ගැන සැක සහිතව වං ලුං, ඕලෑං දෙස බැලුවේ ය. එහෙත් ඒ බැල්ම තම නිසරු වියලුනු කුඹුරු වලදී ඇය දෙස බැලූ බැල්ම වැනි බලාපොරොත්තු විරහිත වූවක් නොවේ.

හොඳට කා බී පුෂ්ටිමත්වූන මිනිස්සු මේ වීථියෙහි නිතර ගමන් කළහ. මේ නගරයේ වෙළඳ පොලෙහි මස් හා එළවලු පිරී තිබුනි. මාළු වෙළඳ පොලෙහි ඇතැම් තැනක වතුර පිරවූ බාල්දිවල මාළුවෝ පීන පීනා සිටියහ. මෙහි කිසිවෙකුටත් බඩගින්නෙහි මිය යාමට නම් සිදු නොවෙයි. වං ලුං ගේ පළාත හාත්පසින් මෙයට වඩා බෙහෙවින් වෙනස් ය. මුදල් තිබුනත් මිලදී ගැනීමට එහි කෑම බීම වර්ග කොහිදීවත් ලැබිය නොහැක.

හිඟන ජීවිතයට පුරුදු වූවක සේ ඕලෑං නොවෙනස් ස්වරයෙන් වං ලුං ට කථා කළාය.

''මටත් ලමයින් දෙන්නටත් හිඟන්න පුළුවන්. මේ තාත්ත වත් බැරි කමක් නැහැ හිඟා කන්න. ඉතින් මට හිඟමන් නුදුන් නොත් නාකි කමට වත් අනුකම්පා කරල මේ තාත්තට වත් හිඟමන් දේවි.''

මෙසේ කියා ඕලෑං දරුවන් දෙදෙනාට ඇමතුවාය. ඔවුන්ට එය නො ඇසුනේ හුහ කලකින් කුස ගින්න ද නිවාගෙන වීථිය අසළට ගොස් එහි යන එන්නන් දෙස – එහි සිදුවන දේ ගැන බලා ගෙන සිටි හෙයිනි. ඕලෑං ඔවුන්ට යළිත් කථා කළාය.

''උඹල එක එකා මේ භාජනයකුත් අරගෙන මේ විදියට අල්ල ගෙන මෙහෙම කෑගහපල්ල—''

මෙසේ කියූ ඇය හිස් භාජනයක් ද අතින් ගෙන එය ඉදිරියට දිගු කොට ඉතා දුක්මුසු ස්වරයකින්—

''මහත්තයෝ, නෝන මහත්තයෝ, පි—න—ට ය—මක් ලැබෙන්න! අනේ මේ අසරණ අපිට අනුකම්පා කරන්න! ඔබ තුමන්ට දිව්‍ය ලෝකෙ සැප ලැබේවි! ඔය අහක දන සල්ලි ටික, ඔය තඹ සල්ලිය, හාමතේ මැරෙන මේ දරුවෙකුට කන්න මොකුත් ගන්න දෙන්න!''යයි හඬගෑවාය.

දරුවෝ ඇය දෙස බැලූහ ''ඇය මෙසේ හිඟමන් ඉල්ලන්න ඉගෙණ ගත්තේ කෙසේද? තමා නොදන්නා කොපමණ දේ මේ ගැහැණිය තුළ ඇද්ද''යි සිතමින් වං ලුං ද ඇය දෙස බැලුවේය. ඇය ඔහුගේ බැල්මට මෙසේ උත්තර දුන්නාය.

''මම කුඩා කාලෙ මම ඔය විදියට කෑගහල තමයි කන්න හම්බ කර ගත්තෙ. එහෙම ඉන්නකොට මේ වගේම අවුරුද්දක තමයි මාව පොහොසත් ගෙදරකට වික්කෙ.''

නිදහුන් මහල්ලා ද අවදි විය. ඔහුට ද භාජනයක් ලැබුනේය. සතරදෙනා ම සිහන්නට පාරට ගියහ. ඕලැං සැම මගියෙකුට ම කථාකරමින් එදෙස තම භාජනය සොලවන්නට වූවාය. ඇය මෙසේ සිහමන් ඉල්ලුවේ සිය කුඩා දරුවා ද ළය මත හොවාගනිමිනි. ඇය සෙලවෙන විට දරුවාගේ හිස ද ඒ මේ අත සෙලවුනි. ඇය භාජනය ද ඉදිරියෙන් අල්ලාගෙන දරුවා ද පෙන්වමින් එහා මෙහා දුවමින් උස් හඬින් කෑගැවා ය.

''අනේ මහත්තයො, අනේ නෝන මහත්තයො, ඔය මොකුත් නොදුන්නොත් මේ දරුව මැරේවි. අපිත් බඩගින්නෙන් මැරේවි!''

ඇත්ත වසයෙන්ම දරුවා ද මේ අවස්ථාවෙහි සිටියේ මළාක් මෙන්ය. ඇගේ හිසද ඒ මේ අත පැද්දුනි. ටික දෙනෙක් නො කැමැත්තෙන් වුව ද සුළු මුදලක් ඇය වෙත වීසි කළහ.

ටික වේලාවකට පසු දරුවන් දෙදෙනා සිහා කෑම ද ක්‍රීඩාවක් සේ සලකන්නට වූහ. ලජ්ජාවට පත් වැඩිමල් පුතා සිහමින් මගින්ට දත් විරිත්තන්නට ද විය. එය දුටු ඔවුන්ගේ මව ඔවුන් පැල තුළට ඇදගෙන අවුත් කම්මුලට තලමින් කෝපයෙන් බණින්න ටද වූවාය.

''තොපි ගොන්නෙ! ඇයි ගොනෝ මේ බඩගින්නෙ මැරෙණවයි කියන ගමන් ම හිනාවෙන්නෙ? විරිත්තන්නෙ? තොපි එහෙනං බඩගින්නෙ මැරියව්.''

මෙසේ කියමින් ඇය ඒ දරුවාට තම අතටද රිදෙන තෙක්ම තැළුවා ය. දරුවෝ ඉකි බිඳ බිඳ හඬන්නට වූහ. ඔවුන්ගේ ඇස් වලින් කඳුළු ධාරා ගැලුවේය. ඇය ඔවුන් නැවත පිටත්කර හරිමින් මෙසේ ද කීවාය.

''දැන්නම් උඹල හොඳ ළමයි. හිනාකන්න ගිහිල්ල ආයිත් එහෙම හිනා උනොත් බලා ගනිල්ල......''

සිය පවුලෙහි අය සිහා කද්දී වං ලුං, නගරයට ගොස් එහේ මෙහේ විමසා බලා, අන්තිමේ දී රික්ෂෝ රථ කුලියට දෙන තැනක් සොයා ගත්තේ ය. ඔහු එතැනින් දවසකට රික්ෂෝ රථයක් කුලියට ගත්තේ රිදී කාසි බාගයක් ගෙවන්නට පොරොන්දු වෙමිනි. 'මුදල සැන්දෑවෙහි දෙමි'යි සිතමින් රික්ෂෝ රථය ද තමා පසුපස ඇදගෙන වීථියට බැස්සේය. මේ කබල් රික්ෂෝ රථය ද ඇදගෙන යන තමා දෙස සියළු දෙනාම මෝඩයකු දෙස මෙන් බලතියි ද

ඔහුට සිතුනේ ය. පළමුවරට නඟුලට බැඳි ගොණෙකු මෙන් ඔහු ද රික්ෂෝ රථයට නුපුරුදු විය. එය ඇදගෙන ගියේ ද මහත් අමාරුවෙනි. එහෙත් ඔහු කෙසේ නමුත් ජීවත් විය යුතු නිසා රික්ෂෝ රථය ද කොහොම නමුත් ඇදිය යුතු විය. මේ නගරයේ සැම තැනම පාහේ රික්ෂෝ කාරයන් කවුරු හරි පටවා ගෙන දුවන අයුරු ඔහුට පෙනුනි. ඔහු ද රික්ෂෝ රථය ඇදගෙන කුඩා හරස් පාරකට පිවිසුනේය. එහි කඩ සාප්පු නොතිබුනි. පුද්ගලික නිවාසවල වැසුණු දොරවල් පමණකි එහි තිබුනේ. ඔහු එහි පුරුදු වීම පිණිස රික්ෂෝ රථය ඇදගෙන එහා මෙහා ඇවිද්දේ ය. බලා පොරොත්තු විරහිතව එසේ ඇවිදින විට "මීට වඩා හිඟා කෑම හොඳ" යයි ද ඔහුට සිතුනේය.

මේ අතර එහි තිබුන වැසුන ගෙයක දොරක් විවෘත වුනේය. උපනෙතක් පැළඳි ගුරුවරයෙකු මෙන් ඇඳගත් මහලු මිනිසෙක් එයින් එළියට අවුත් ඔහුට කථාකෙළේය.

"අනේ මහත්තයා, මම අළුත් කෙනෙක් මේ නගරයට. පාර වල් පුරුදුත් නැහැ. හයියෙන් දුවන්නත් බැහැ"යි වං ලුං කීවේය. බිහිරෙකු මෙන් ඔහු කියන කිසිවක් නෑසුනා සේ හුන් මහල්ලා තමාට ගොඩවීමට රික්ෂෝ රථය පහත් කරණ මෙන් වාම් සංඥවක් පමණක් කෙළේය. වං ලුං කළයුතු අන් කිසිවක් නොදත්තේ, ඒ සංඥවට කීකරු විය. ඔහු වඩාත් මහල්ලාට පෙළඹුනේ, මහල්ලා ගේ බිහිරි කම හා වැදගත් පෙනීමත් නිසාය. එවිට මහල්ලා එහි ඍජුව හිඳගෙන, "මාව කොන්පියුසියස් දේවස්ථානයට ගෙනියපන්!" යයි කීවේය. මෙසේ කියා යලිත් ඔහු නිශ්චලව ඍජුව හිඳගත්තේ ය. ඔහුගේ මේ සන්සුන්කම නිසා ප්‍රශ්න ඇසීමට ද නොහැකි විය. එහෙයින් වං ලුං කෙළේ සෙසු රික්ෂෝ කාරයන් මෙන් මහල්ලා ද තම රික්ෂෝ රථයෙහි පටවා ගෙන දිවීම ය. "කොන්පියුසියස්" පල්ලිය තිබෙන තැන ගැන නම් අල්පමාත්‍ර හැඟීමක් ඔහු තුළ නොවීය.

එහෙත් ඔහු ගමන් කරමින් ම මාර්ගය අසා ගත්තේ ය. ඔහුට ගමන් කරන්නට සිදුවුනේ අතිශයින් ම ජනාකීර්ණ වීථි මැදිනි. පෙට්ටි පෙට්ටගම් රැගත් වෙළඳුන් ද වෙළඳ පොළ බලායන ගැහැණුන් ද අශ්ව කරත්ත ද රික්ෂෝ රථ ද මේ වීථියෙහි තෙරපෙමින් තිබුන නිසා ඔහුට දුවන්නට ද නොහැකි විය. එහෙත් ඔහු හැකි තරම් වේගයෙන් ගමන් කෙළේය.

Scanned by CamScanner

කරපිටින් බර ගෙන යාමට වං ලුං පුරුදුව සිටියත් බරක් ඇද ගෙන දිවීම ඔහුට නුහුරු – නුපුරුදු කාර්‍යයකි. එහෙයින් කොන් පියුසියස් පල්ලියේ දෙරටුව ලඟටත් පැමිණෙන්නට පෙර ඔහුගේ අත රිදෙන්නට වීය. අතෙහි දිය බුබුළු ද නැගුනි. එහි තගුලෙන් පිඩාවට පත් නොවූ තැන්ද රික්ෂෝ රථය ඇදීමෙන් පීඩාවට පත්වුනි. වං ලුං පල්ලියේ දෙරටුවට ලංවුන විට රථය පහත් කෙළේය. මහළු මහතා එයින් බිමට බැස තම ළය මඬල අතගා කුඩා පසුම්බියක් එළියට ගෙන එයින් කුඩා රිදී කාසියක් ඇද වං ලුං ට දුන්නේය.

"මීට වඩා නම් දෙන්නෙ නැහැ. තවත් ඉල්ලන්න එපා!" යයි කියා ආපසු හැරී ඒ මහතා දේවස්ථානය කරා ගමන් කෙළේය.

තවත් ඉල්ලන්නට වං ලුං ට වුවමනා නොවීය. මේ ලැබූ කාසිය ද ඔහු විසින් මීට පෙර නොදක්නා ලද්දකි. මෙය පැන්ස කීයකට මාරු කළ හැකි දැයි ඔහු නොදනියි.

ඔහු ලඟ තිබුන ඒ මුදල මාරු කරන්නට බත් කඩයකට ගියේය. බත් කඩකාරයා එය රැගෙන ඔහුට දුන්නේ තඹ පැන්ස විසි හයකි. දකුණේ මුදල් ව්‍යවහාරයේ පහසු ක්‍රමය ගැන වං ලුං මවිත විය. ඔහු ඒ මුදල් ගනිද්දී ලඟ හුන් තවත් රික්ෂෝකාරයෙක් කර උස්සා එදෙස බලමින් මෙසේ පැවසුවේය.

"මොනව විසි හයයි? උඹ ඔච්චර දුර අර නාකිය ඇදගෙන ඇවිල්ලත් දුන්නෙ විසි හය ද? ඒ ලෝබ නාකිය උඹට දීල තියෙන්නෙ නියමිත ගාස්තුවෙන් හරියටම බාගයයි."

වං ලුං තමා පිළිබඳව සියළු විස්තර කී පසු "හොඳයි උඹ ගමන් පටන් ගන්න ඉස්සෙල්ල කේවෙල් කළේ නැද්ද?"යි ඒ රික්ෂෝ කාරයා නැවතත් ඇසුවේය.

"මම කේවෙල් කෙළේ නැහැ. එයා වරෙන් කිව්ව. මම ආව" යයි වං ලුං කීය.

යළි ඒ රික්ෂෝකාරයා ඔහු දෙස අනුකම්පාවෙන් බලා අවට සිටි මිනිසුන්ට මෙසේ කීය.

"මෙන්න උඹලට කොන්ඩෙත් එක්ක ගොඩයෙක්. මේක මෝඩයන්ගෙනුත් මෝඩයෙක්! කවුරු හරි වරෙන් කිව්වම මෙයා එනව. ගණනක් අහන්නෙ නැහැ. මෝඩය එහෙම කරන්න එපා! කවුරුහරි ගමනක් යන්න සූදනම් උනොත් ඉස්

Scanned by CamScanner

සෙල්ල පොරොන්දු වෙයන්. ගණන් අහන්නෙ නැතුව ගෙණ යන්න පුළුවන්, සුද්දෙ විතරයි. උන්ගෙ තරහ හරියට හුණු වගෙයි. ඉක්මන්! ඒ උනාට උන් විශ්වාස කරන්න පුළුවන්. උන් හරි ගොන්නු. මොහකවත් හරියට ගණනක් දන්නෙ නැහැ. උන්ගෙ සාක්කු වලින් රිදී ගලන්නෙ වතුර වගෙයි.''

වං ලුං ඔහුට කිසිත් නොකියා තම රික්ෂෝව ද ඇදගෙන යන්නට ගියේය. මේ නාගරිකයන් අතරෙහි දී තමා නිහතමානී මෝඩයෙකු බව ඔහුට හැඟුනි.

''මේකෙන් මට හෙට දරුවන්ට කන්න දෙන්න පුළුවන්'' යයි ඔහු තමාටම කියා ගත්තේය. එහෙත් රියට කුලිය ගෙවිය යුතු බව මතක් වුනේ පසුවය. රියට ගෙවිය යුතු මුදලෙහි බාගය කුදු ඔහු ළඟ නොවීය.

වාසනාවකට මෙන් උදය වරුවේ ඔහුට තවත් මගියෙක් හමුවුනි. ඔහු ඒ මගියා සමග කේවෙල් කොට නියමිත ගාස්තුවක් නියම කර ගත්තේය. සවස් වරුවෙහි ද ඔහුට තවත් මගියන් දෙදෙනෙකු ලැබුනි. සැන්දෑවෙහි ඔහු තමන් ළඟ තිබුන මුදල් ගැන බැලූ විට ඔහුට දැනුනේ රියෙහි කුලිය ගෙවූ පසු ඉතුරු වන්නේ එකම පැන්සයක් බව පමණකි.

''අස්වැන්න කපා ගැන්ම සඳහා කුඹුරෙහි දවසක් වැඩ කරණවාටත් වඩා, අද වෙහෙස උනත් ලැබුනේ එකම පැන්සයක් ය''යි කියමින් ඔහු එද තම පැල කරා ගමන් කෙළේ මහත් දුකිනි.

තම ඉඩම් ගැන නිතරම ඔහු සිත තුළ හැඟීම් පහළ වුනි. එහෙත් මේ රික්ෂෝ රථය ඇදි දිනයෙහි ඒ පිළිබඳව හැඟීම් පහළ නොවූවත් පෙරළා පැලට යද්දී තම ඉඩම් ගැන සිතිවිලි පහළ වන්නට වුනි. මේ ඉඩම් පිළිබඳ හැඟුම් වලින් ඔහුගේ සිතට ඇති වුනේ සමාධියට සමාන තත්වයකි.

වං ලුං පැල්පතට පැමිණි විට, ඕලැං සිහා කෑමෙන් කුඩා කාසි හතළිහක් පමණක් උපයා තිබෙන බව පෙනුනි. ඇත්ත වශයෙන්ම එය පැන්ස පහකටත් වඩා අඩු මුදලකි. එද වැඩිමල් දරුවා කාසි අටක් ද බාලයා කාසි දහතුනක් ද උපයා තිබුනේය. මේ සියල්ලම එකතු කළ විට පසු දින උදයේ කෑමට ගෙවන්නට එය ප්‍රමාණවත්ය. බාලයාගේ කොටස එකතු කරණ විට ඔහු තම කොටස ඉල්ලා හඬන්නට පටන් ගත්තේය. ඔහු තමන් සැපයූ

මුදලට ආසා කෙළේය. ඔහු එද රෑ නිද ගත්තේ ඒ මුදල ද අතෙහි තබා ගෙනය. ඔවුන්ට ඒ දරුවාගෙන් මුදල් ගන්නට නො හැකි වීය. උදෑසන ඒ දරුවා ඒ මුදලින් තම කොටසෙහි මුදල තමාගේම අතින් දුන්නේය.

අවාසනාවක මහත! මහල්ලාට කිසිවක් ලැබී නො තිබුණේ ය. ඕලැං ගේ අණට කීකරු වූ ඔහු, මුළු දවසෙහි ම පාර අයිනේ ඉඳගෙන සිටි නමුත් කිසිවක් ඉල්ලුවේ නැත. ඔහු නිද වැටි වැටී වට පිට සිදුවන දේ බලා ගෙන සිටියා පමණකි. වයස් ගත වූ ඔහුට යමක් කියා ගැණීමට හැකි නොවීය.

තමාගේ අත් හිස් බව දුටු ඔහු මෙපමණක්ම කීවේය.

''මම හී හාල, ඇට වපුරල, අස්වැන්න කපාගෙන තියෙන මිනිහෙක්. ඒ විදියටයි මම බත් පිහාන ලබාගත්තෙ. ඒ මදිවට මට දූන් පුත්තුයි මුණුබුරොයි ඉන්නව.''

මෙසේ කී ඔහු තමාට දූන් පුතුන් හා මුණුබුරන් ඇති බැවින් කෙසේ හෝ කෑම ලැබේවි යයි පොඩි දරුවෙකු මෙන් විශ්වාස කෙළේය.

Scanned by CamScanner



ජාගතයේ දැඩිකම ක්‍රමයෙන් අඩු වී යන්නට වුනි. තම දරුවනට දිනපතා කෑමට යමක් තිබෙන බව ද වං ලුං දනියි. සැම උදයකම බත් ලැබෙන බව ඔහුට වැටහුනි. තම පවුලේ ආහාරය සඳහා තමාගේ ව්‍යායාමයෙන් හා ඕ ලෑං ගේ සිහා කැමෙන් ලැබෙන මුදල ප්‍රමාණවත් බව ද වං ලුං දනියි. ඒ නගරයේ සැම වීථියක් දිගේ ම ඔහු දිනපතාම දිවූ නිසා – ගමන් කළ නිසා එක් ක්‍රමයකට ඔහු නගරය පිළිබඳ හොඳ දැනුමක් ද ඇති කරගෙන සිටියි. එමෙන් ම එහි රහස් පෙදෙස් පිළිබඳව ද හොඳ අවබෝධයක් දැන් ඔහුට වෙයි.

තම රටයෙහි උදය වරුවෙහි නැගී යන අය ගැහැණු නම් ඔවුන් වෙළඳ පොළට යන්නන් බවත් පිරිමි නම් ඔවුන් පාසැල්වලට හෝ ව්‍යාපාර ස්ථානවලට – කර්මාන්ත සාලාවලට යන්නන් බවත් ඔහු වටහා ගනියි. එහෙත් එහි පාසැල් කුමන ඒවා දැයි ඔහු නොදනියි. දැනගන්නට ක්‍රමයක් ද ඔහුට නො තිබුනි. ඒවාට නම් කොට තිබුනේ ද ''බටහිර ඉගැන්වීමෙ ප්‍රධාන පාසැල්, චීනයේ මහා පාසැල්'' යන ආදී වශයෙනි.

ඔහු කිසි දිනක එම පාසැල්වල දොරටු වලින් ඇතුළට ගොස් නැත. එසේ ගියහොත් කවුරු හෝ අවුත් තමාට අවශ්‍ය නැති තැනකට පැමිණියේ කවර කරුණකට දැයි අසන බව ඔහු දනියි. තමා මිනිසුන් ඇදගෙන ගිය කර්මාන්තසාලා ගැන ද ඔහුට දැනුමක් නැත. ඔහු දන්නේ ඒ ඒ තැන්වල දී ගෙවූ මුදල පමණකි.

Scanned by CamScanner

රාත්‍රි කාලයේ ඔහු මිනිසුන් ගෙන ගියේ විසාල භෝජන සාලා වලට හා විනෝදගාර වලටය. මේ විනෝදගාරවල විනෝදය කාටත් පොදුය. එයින් නැගුන සංගීත ශබ්ද ධාරාවෝ වීථිවල පවා රාව පිළිරාව දෙමින් ගලා ගියහ. එමෙන් ම ඇත්දත් කැබලි වලින් හා උණ කෝටු වලින් ලී මේස මත කරණ ක්‍රීඩා ද ඒ විනෝදගාර වල සුලබව පැවතුනි. එහෙත් මේ ක්‍රීඩාව පැවැත්වූයේ රහසිගත වය. නාගරිකයෝ තාප්පවලට මුවහ වී නිශ්ශබ්දව මේ ක්‍රීඩාවෙහි නිරතව සිටියහ. මේ ක්‍රීඩා කිසිවක් ගැන වං ලුං නොදනියි. මේවා ගැන ඔහුට දැනගත හැකි නොවූයේ තමාගේ පැල්පතෙහි එළිපත හැරෙන්නට ඔහු අන් කිසිවක එළිපතක් පසුකොට නොගිය බැවිනි.

ඔහුගේ මාර්ගය සැම විටම කෙළවර වුනේ ගේට්ටුවකින් ය. පොහොසත් ගෙදරක වෙසෙන මීයෙකු මෙන් ඔහු නගරයේ වාසය කළත් ඔහු ඒ නගරයට අමුත්තෙක් වීය. පොහොසත් ගෙයක වෙසෙන මීයා ද අහක ලන ලද කෑම අහුලා කමින් එහේ මෙහේ සැහවී ජීවත් වෙයි. ඌ කිසි දිනකත් එහි අයිතිකාරයා නොවෙයි. වං ලුං මේ නගරයෙහි ජීවත් වූයේ ද එමෙනි.

තම ජන්මභූමියෙහි සිට මේ පෙදෙසට ඇති දුර ප්‍රමාණය වූ සැතපුම් සියය, දහසක් තරම් විශාල දිග ප්‍රමාණයක් නොවූවත්, ගොඩින් යා යුතු දුර ප්‍රමාණය දියෙන් යා යුතු දුර ප්‍රමාණයට වඩා බෙහෙවින් අඩු වුවත්, වං ලුං සහ ඔහුගේ පුත්‍ර දරාවෝ දක්ෂිණ දේශයෙහි පිහිටි මේ නගරයට පිට රටියන් මෙන් වූහ. මේ නාගරිකයනට වඩා ඔව්හු වෙනස් වූහ. එහෙත් මේ නගරයෙහි වෙසෙන මිනිසුන්ගේ රූපාකාරයෙන් ද භාෂාවෙන් ද වං ලුං පවුලෙහි වූවෝ එතරම් වෙනස් නොවූහ. වං ලුංගේ ගමෙහි මිනිසුන්ට මෙන් ම මේ නගරයෙහි මිනිසුන්ට ද කළු හිස කෙස් හා ඇස් තිබුනි. මෙ නගරයෙහි මිනිසුන් කථා කරණ බස අමාරුවෙන් වුව ද ඔවුනට තේරුම් ගත හැකි වීය.

එහෙත් වං ලුං උපන් ගම අසළ තිබෙන අන්හ්වෙි නගරය, මේ කියැංසු නගරයම නොවේ; නැතහොත් මේ දකුණෙහි කියැංසු නගරය සැම අතින්ම අන්හ්වෙි නගරයට අසමාන වේ. අන්හ්වෙි නගරයේ භාෂාව ගැඹුරුය. එය කථා කරන්නේ සෙමින් ය. එය උච්චාරණය කරන්නේ උගුරෙන් ය. එහෙත් කියැංසු නගරයේ

මිනිසුන් කථාකරන්නේ වචන කැබලිය. එද උච්චාරණය කරනුයේ දිවගින් හා තොල් වලිනි.

වං ලුං ගේ කුඹුරුවල, ගොවිපලවල, හේන්වල වී, තිරිඟු, වෙනත් ධාන්‍ය වර්ග හා සුදු ලූනු වැනි බෝග වර්ග සෙමින් වුව ද ලෙහෙසියෙන් වසකට දෙවරක් වගාවුනි. එහෙත් මේ පළාතේ ඉඩම් වලින් ගොවීන් අස්වැන්න ලබාගත්තේ බලයෙන් මෙනි. එහි ඉඩම් වලින්— කුඹුරු වලින් වී වර්ගත් බෝග වර්ගත් එලවලු වර්ගත් ලබාගැනීම සඳහා නිතරම පාගේ මිනිස්සු අසූචි වැනි පෝර වර්ගත් යෙදූහ.

වං ලුං ගේ ගමෙහි මිනිසෙකුට, හොඳ තිරිඟු පාන් කැබැල්ල කුත් එයට ම සුදුළූනු කැබැල්ලකුත් ලැබුනොත් එය සෑහෙන කෑමකි. කෑමට වෙන යමක් ඔවුනට වුවමනා නොවීය. එහෙත් මේ රටේ මිනිස්සු, ඌරුමස්, කොට්ට කිලන්ගු, කුකුළුමස් සමග බදින ලද ඇට වර්ග, තාරා මස් හා නොයෙක් එලවලු ආදී කෑම වර්ග සමග කෑම මේසයෙහි දී ක්‍රීඩා කළහ. සුදුළූනු ගඳ ගස්වමින් මිනිසෙකු ළඟින් යන විට ද ඔව්හු නැහැය හකුලුවා ''මෙන්න ගඳ ගහණ ගොඩයෙක්! මේ මේ උතුරෙ මිනිහෙක්!''යයි කෑගැසූහ. ඇතැම් මිනිසුන් කෙරෙන් සුදුළූනු ගඳ ආඝ්‍රාණය වුන විට ද මේ නගරයෙහි කඩකාරයන් නිල් කපු පිලි වැනි බඩුවල මිළ උස්සන්නේ පිටරැටියන්ට මෙනි.

මේ තාප්පය දිගට තිබුන පැල්පත් සමූහය මේ නගරයට හෝ මේ ප්‍රදේශයට අයත් ඒවා නොවීය. පිට පළාත් වලින් මේ නගරයට පැමිණ සිටි අය ඒ පැල්පත්වල පදිංචි වී සිටියහ.

දිනක් මේ නගරයේ තරුණයෙකු කථාකරමින් ''දැන් චීනයට විප්ලවයක් අවශ්‍ය බවත් මෙහි පදිංචි පිට රැටියන්ට විරුද්ධව නැගී සිටිය යුතු බවත්'' පවසන විට වංලුං බියවී පසුබා සිටියේය. ඔහු එසේ බියවූනේ ''මේ තරුණයා සඳහන් කරණ පිට රැටියා තමා ම ය''යි සිතමිනි. ඒ තරුණයා කොන්පියුසියස් පල්ලිය අසළ මිනිසුන් සමූහයකට ඒ කථාව පවත්වමින් සිටියේය.

මේ ස්ථානය මේ නගරයේ කථාකාරයන් ගැවසෙන තැනකි. සෑහෙන ධෛර්‍යයක් ඇති කාට වුවද එහි කථා කිරීමට තහනමක් නොවීය. එසේම මේ නගරය ''කථා කරණ'' තරුණයන් ගෙන් නොඅඩු වූවකි.

Scanned by CamScanner

නැවතත් දිනක තවත් තරුණයෙකුගේ කථාවක් එම ස්ථාන යෙහිදී ම ඔහුට අසන්නට ලැබුනි. එම කථාවෙන් පැවසුනේ ''චීනයේ ජනතාව එක්සත් විය යුතු'' බවත්, ''චීනයේ ජනතාව මේ කාලයට සුදුසු පරිදි අධ්‍යාපනයක් ලැබිය යුතු'' බවකි.මේ වර නම් ඒ තරුණයා තමාට විරුද්ධව කථා කරන්නෙකැයි හැඟීමක් වං ලුං ට ඇති නොවීය.

දිනක් වං ලුං නගරයේ සේද රෙදි සාප්පු තිබෙන වීථිය දිගේ කුලියක් සොයමින් ස්වකීය රික්ෂෝ රථය ඇදගෙන ගියේය. එහිදී ඔහු දැනගත් අළුත් දෙය නම් තමාට වඩා පිට රැටියන් මේ නගරයේ වෙසෙන බවකි. ඇතැම් දිනක මේ වීථියෙහි දී සාප්පු වලින් පටපිළි මිළයට ගෙන පිටවෙන කාන්තාවෝ වැඩි මුදල් ගෙවා ඔහුගේ රථයෙහි ගමන් කළහ. මේ දිනයෙහි ද ඔහු වෙළඳ සැල් පසුකර ගෙන යන විට කවුදෝ කෙනෙක් ඔහු ඉදිරියට එක වරට ම පැමිණියේය. ඔහු නම් වං ලුං කිසි දිනකත් නොදුටු සත්වයෙකි. ඒ පැමිණි අය ගැහැණියෙක් ද පිරිමියෙක් ද යන බවවත් ඔහුට වටහාගත හැකි නොවීය.

ඒකා ඉතා උස් අයෙකි. කිසියම් තද කළු රෙදි වර්ගයකින් සෑදූ දිග කබායක් ද ඇඳ සිටියේය. මළ සතෙකුගේ හමක් ද ගෙල වටා දමා තිබුනි. ගැහැණියෙක් ද පිරිමියෙක් දැයි හඳුනාගත නොහැකි වූ මේ පුද්ගලයා වං ලුං ඉදිරියට අවුත් රිය පහත් කරණ සේ සංඥාවක් කෙළේය. ඔහු මේ අද්භූත හමුවීමෙන් විශ්මයට පත් වීය. තමා ඉදිරියෙහි නැගී සිටි මේ පුද්ගලයා භග්නස්වර යෙන් - නුහුරු බසින් මොනවාදෝ කථා කෙළේය. මඳ වේලාවකට පසු ''මේ අද්භූත සතා'' අණ කරන්නේ ''පාලම් වීදියට'' යන්නට බව වං ලුං ට වැටහුනේය. කළයුතු කිසිවක් නොදත් ඔහු ''ඒ අද්භූත සතා'' ද පටවා ගෙන දුවන්ට වීය. මෙසේ ටික දුරක් දුවමින් යම්තම් අඳුනන තවත් රික්ෂෝ කාරයෙකු හමුවන විට වං ලුං ඔහුගෙන්, ''මේ බලපන් ! මම මේ ඇදගෙන යන්නෙ මොකෙක් දැ?''යි විමසුවේය. ''උඹ හරි වාසනාවන්තයෙක්! ඔය මිනිහො, ඇමරිකන් ගැහැණියෙක්! දැන් උඹ පොහොසත්'' යයි ඔහු කීය. එහෙත් තමා පසු පස පටවාගෙන තිබෙන ''මේ පුදුම සතාට'' ඇති බිය නිසා වං ලුං හැකි තරම් වේගයෙන් දිව්වේය. පාලම් වීථියට පැමිණෙන විට ඔහු දහඩියෙන් නැහැවී තෙහෙට්ටු වී සිටියේය.

එවිට ඇමෙරිකන් ගැහැණිය රියෙන් බැස නුපුරුදු හඬින් ''උඹ මැරෙණකන් දුවන්න ඕනෑ නැහැ''යයි පවසා රිදී කාසි දෙකක් ඔහුගේ අතට දැමුවාය. එය සාමාන්‍ය කුලිය මෙන් දෙගුණයක් විය.

ඉන්පසු වං ලුං, මේ නම් ඇත්තටම පිට රටියෙකු බවත් – මේ නගරයේ තමාටත් වඩා නුපුරුදු අයවලුන් සිටින බවත් දැනගත්තේය. එමෙන්ම කළු ඇස් හා කළු කෙස් ඇති අය එක් වර්ගයක් බවත් දුඹුරු ඇස් හා කෙස් ඇති අය තවත් වර්ගයක් බවත් ඔහු හඳුනා ගත්තේය. තමා සම්පූර්ණ පිට රටියෙකු නොවන බව ද ඔහු වටහා ගත්තේය.

තමාට ලැබුන රිදී කාසි නොඅල්ලාම – වියදම් නොකොට ම, එදින රැයෙහි පැල්පතට ගිය ඔහු ඕ-ලැං ට ද මේ පුවත කීවේය. ඉන්පසු ඕ-ලැං ඔහුට මෙසේ කීවාය.

''මම උන්ව දැකල තියෙනව. මම උන්ගෙන් කොච්චරවත් හිඟමනුත් ඉල්ලල තියෙනව. උන් තිස්සේම මගේ භාජනයට දමන්නේ තඹ කාසි නොවෙයි – රිදී කාසි.''

මේ පිට රටියන් මෙසේ රිදී කාසි තම භාජනයට දමන්නේ යහපත් හිතකින් නොවන බවත්, ඒ ඔවුන්ගේ නොදන්නා කමින් සිදුවන්නක් බවත්, හිඟන්නන්ට දීමට වඩා සුදුසු, රිදී නොව, තඹ කාසි බව ඒ පිට රටියන් නොදන්නා බවත් වං ලුං දෙමහල්ලෝ ඇත්ත වසයෙන් ම නොදන්හ.

කෙසේ වෙතත් මේ සිද්ධිය නිසා තරුණ කථිකයන් කී දෙය වං ලුං ට වැටහුනි. එයින් ඔහුට වැටහුනේ තමා කළු කෙස් හා කළු ඇස් ඇති වර්ගයට අයත් බව ය.

මේ ධනවත් මහා නගරයේ කෙළවරක මෙසේ ජීවත්වුන ඔවුනට ආහාර හිඟයක් ඇතිවන ලෙසක් නම් නො දැනුනි.

වං ලුං පවුල මෙහි පැමිණියේ සාගතයෙන් පීඩිත වූ පළාතක සිට ය. අකරුණාවන්ත අහසක් යට වූ තම ඉඩම් වලින් පල දැරිය නොහැකි බව ඔහු දන්නේය. අතෙහි රිදී කාසි තිබුනත් එයින්ද ඔහුට ඵලයක් නොවූයේ මිලයට ගන්නට ද්‍රව්‍යයන් කිසිවක් එහි නොතිබුන හෙයිනි.

එහෙත් මේ නගරයේ නම් සැම තැනකම කෑම වර්ග තිබුනි. මාලු වෙළඳ පොලෙහි ශෛල වේදිකා මත පෙළගසා තිබුන විසාල භාජන පිරී තිබුනේ අසල නදියෙන් අල්වා ගත් ලොකු මිදවන්

මසුන්ගෙනි. එමෙන් ම එහි දැල් දමා පොකුණු වලින් අල්වන ලද කුඩා මාලුන් ද විශාල බාල්දිවල බහා තිබුනි. එහා මෙහා පනිමින් විශ්මයෙන් මෙන් යම් යම් දෙය විකා බලන කකුළුවෝ ද ලොකු ලොකු උත්සව සඳහා ගෙන යාමට සූදානම් කොට තිබුන ඇබෙරෙමීන් සිටි ආදෝ ද එහි වූහ.

ඒ නගරයේ ධාන්‍ය වෙළඳ පොල ද එතරම් ම සරු සාරය. එහි ධාන්‍ය පුරවා තිබුනේ කෙනෙකුට සැඟවී සිටිය හැකි තරම් විශාල භාජනවල ය. සුදු හාල් ද තද කහවන් හා දුඹුරුවන් තිරිඟු ද රත්වන් තිරිඟු ද කහවන් බෝංචි ඇට ද කහවන් හා කොළවන් මහත බෝංචි ඇට ද නිල්වන් මුං ඇට ද යන මේ සියල්ලම එහි තිබුනි. සෑම මස් කඩයකම මළ ඌරන්ගේ සම්පූර්ණ සිරුරු බෙල්ලෙන් එල්වා තිබුනි. උන්ගේ ඇලය දිගටම පලා තිබුනේ රතු මස් හා තෙල්මන්ද දැක්වීම පිණිසය. උන්ගේ සම සුදුව ඝනව සිනිඳුව දිස් වුනේය. තාරාවුන් විකුණන කඩවල සිවිලිමේ සහ දෙර මත එල්වා තිබුනේ තාරාවුන් පේලිම ය. උදුනෙහි දමා මඳක් පුළුස්සා ගත් දුඹුරු පාට තාරාවෝ ද ලුනු දැමූ සුදු තාරාවෝ ද තාරා පැටව් ද එහි තබා තිබුනි. කුකුල්ලු කළුකුම් ආදී නොයෙක් සතුන් විකුණන කඩ ද එහි සුලබ වීය.

පොළොවෙන් ලබාගත හැකි අසවල් එලවළු වර්ගය ඒ කඩවල නැතැයි කිය නොහැකි තරම් වීය. දිලිසෙන සුදු හා රතු රාබු, නෙලුම් අල, නිල් ගෝවා, මුං කරල්, බෝංචි, දුඹුරුවන් ගෙඩි වර්ග හා සුවඳ හමන පලා වර්ගද එහි වීය. මිනිසුන් ආසා කරණ සෑම වර්ගයක් ම මේ නගරයේ වීථිවල හා වෙළඳ පොලවල තිබුනි.

එහි සංචාරක වෙළෙන්දෝ ද නොයෙක් කෑම වර්ග වෙළඳාම් කළහ. රස කැවිලි, පලතුරු ගෙඩි වර්ග, උණුසුම් කෑම වර්ග, තෙලෙන් බැදපු අර්තාපල්, හොඳින් පිළියෙළ කළ ඌරු මස් කුට්ටි, පිටියෙන් වසා බදින ලද මස්, සූකිරි, පැනි කැවුම්, හාල් පිටි කැවිලි ආදිය ඔවුන්ගෙන් මිලට ගත හැකි වීය. නගරයේ ළමයි මේ වෙළෙන්දන් දකින විට පැන්ස වලින් පිරුණ අත් ඇතිව දුවගොස් හැකි තරම් ඒවා මිලට ගෙන කැවෝය. එහෙයින් ඔව්හු තර වී මනා පැහැ ඇත්තෝ වූහ.

මේ නගරයෙහි බඩ සයින් පෙළෙන එකෙකුවත් නැති තරම් යයි කිය හැකි වීය. එහෙත් වං ලුං පවුලෙහි වූවෝ සෑම

හිමිදිරි පාන්දරක ම භාජන ද ලී කැබලි ද රැගෙන පැල්පතෙන් එළියට අවුත් අඩු මිලට ආහාර දෙන ප්‍රසිද්ධ බොජුන් හලට යන ජනකායට එකතු වූහ. මේ සියල්ලන් ම තම තම පැල්පත් වලින් නික්ම පෙරහැරක් මෙන් ගමන් කරන්නේ සීතලෙන් ගැහෙමින් ය. ගඟ දෙසින් ආ සීතල වාතයෙන් ප්‍රවේසම් වීමට ඔවුන්ගේ තුනී ඇඳුම් ප්‍රමාණවත් නොවීය. ඒ නිසා ඔවුන්ට ගමන් කරන්නට සිදුවුණේ සීතලෙන් කුදු ගැහෙමින් ය. ඒ බොජුන් හලට ගිය ඔවුනට පැන්සයක මුදලින් කැඳ භාජනයක් ලබාගත හැකි වීය.

වං ලූං නම රික්ෂෝ ටිය ඇදගෙන කොතරම් දිව්වත් ඕලැං කොප මණ නිහමන් ලැබුවත් තමන්ගේ පැලෙහි දිනපතාම බත් උයන්නට මුදලක් ඔවුනට නොලැබුනි. දුප්පතුන්ට ම වෙන්ව තිබුන බොජුන් හලෙන් යමක් ගෙන ඉතිරි වූ මුදලකින් ඔව්හු ගෝවා ටිකක් මිලට ගත්හ. එහෙත් ගෝවා ඉතා වියදම් යන ද්‍රව්‍යයකි. එය පිසනු සඳහා දර ගෙනෙන්ට දරුවන් යැවීමට සිදු වීය. ඕලැං ඒවා පිසුවේ ගඩොල් කැට වලින් සාද ගත් උදුනක් මතය. දරුවන් එයට අවශ්‍ය දර සපයන ලද්දේ ගොවියන් නගරයට විකිණීමට ගෙන යන පිදුරු වලින් හා ලී කෝටු වලින් යමක් සොරා ගැනීමෙනි. ඇතැම් විට මේ සොරකමට අසුවුන දරුවෝ ගොවීන්ගෙන් ගුටි බැටද කෑහ.

එක් රැයක බිය සුළු වැඩිමල් දරුවා තමාගේ ක්‍රියාවකින් ලජ්ජාවට පත්ව ගෙදර පැමිණියේ පහර ලැබ ඉදිමී පියවුන ඇසක් ද ඇතිවය. බාල දරුවා වැඩිමල් දරුවාට වඩා ශූරයෙකි. ඔහු සිහා කැමට වඩා ශූර වූයේ කුඩා සොරකම් වලටය.

ඕලැං දරුවන්ගේ මේ සොරකම් එතරම් වරදක් කොට නොතැකුවාය. විහිළු තහළු නොමැතිව සිහා කන්නට දරුවන්ට නොහැකි නම් - අපහසු නම්, සොරකමින් හෝ ඔවුන් බඩ පුරවා ගත යුතුය යනු ඇයගේ හැඟීම වීය. වං ලූං ඇයට යමක් නොකීවත් තම දරුවන් සොරකම් කරණ විට ඔහුට ඇතිවූනේ මහත් පිළිකුලකි. එහෙයින් වැඩිමල් දරුවාගේ අසමත් කම ගැන වං ලූං දෙස් නොකීවේය. තාප්පය අද්දර ගත කළ මේ ජීවිතයට ඔහු ප්‍රිය නොකෙළේය. ඔහු සැම විටකම කල්පනා කෙළේ ද ආසා කෙළේ ද සිය ඉඩම් ගැන ය.

එක් දිනක් ඔහු පැල්පතට පැමිණියේ මදක් රෑ වෝ වීය. ඒ රැයෙහි කෑමට පිළියෙළ කළ ගෝවා තැම්බුමෙහි තිබුන ලොකු මස්

Scanned by CamScanner

කැබැල්ලක් ඔහුට දක්නට ලැබුනි. සිය හරකා මරා කෑවාට පසු මස් කන්නට සැරසෙන වං ලූං ගේ දෙනෙත් මහත් සේ විකසිත වුනි.

"උඹට අද පිට රටියෙකුගෙන් වත් හිඟමනක් ලැබුන දෑ"යි ඔහු ඕලැං ගෙන් ඇසුවේය. එහෙත් ඇය සුපුරුදු ලෙස නිහඬ වූවාය–කිසිත් නොකීවාය. නොදත් කම නිසා මාන්නයෙන් පිරී සිටි බාල දරුවා මෙසේ කීය.

"මේ මස් මගේ–මමයි ගත්තෙ. මේසෙ උඩ තිබුන ලොකු මස් ගොඩෙන් මේ කැල්ල කපල තියල මස් කඩ කාරය අහක බැලුව, එතකොටම මස් ගෙනියන්න ආපු නාකි ගෑණිගෙ අත යටින් රිංගල මේ මස් කැල්ලත් අරගෙන පැනල් දිව්ව. ඉතින් එහෙම දුවල අර පාර අද්දර තිබුන වතුර බාල්දියක් අස්සට වෙලා අයිය එනකං හැංගිල හිටිය."

"මම මේ මස් කන්නෙ නැහැ. අපිට හිඟන්න හරි සල්ලි වලට ගන්න පුළුවන් හරි මස් මීසක් හොරකම් කරපු මස් අපි කන්නෙ නැහැ. අපි හිඟන්නො උනත් හොරු නොවේ" යයි කෝපයෙන් කියමින් හැලියේ තිබුන මස් ඇඟිලි දෙකින් ගෙන බිමට විසි කෙළේය. මෙසේ මස් විසි කරද්දී බාලයාගේ කෑගැහීම ද ඔහු ගණනට නොගත්තේය.

ඕලැං සුපුරුදු ගමනින් ඉදිරියට අවුත් මස් ටික අවුලා ගෙන වතුර ටිකකින් සෝද නැවතත් හැලියට ම දැම්මාය.

"මස් කොයිවත් මස්ම මය"යි ඇය නිශ්චලව කීවාය. එවිට වං ලූං නිහඬ වුනේය. එහෙත් ඔහුගේ හද තුළ කෝපයක් හා බියක් ඇති වුනේ තම දරුවන් හොරුන් වෙතියි යන හැඟුම නිසා ය.

ඕලැං බුරුල් මස් කුට්ටිය, ඇගේ ලී කැබලි වලින් ගෙන කැබලි වලට කඩා එයින් ලොකු කැබැල්ලක් මහල්ලාටත් දරුවන් දෙදෙනාටත් දී කුඩා දූරියගේ මුව තුළද කොටසක් දමා ඇයද එයින් කොටසක් කද්දී ඔහු කිසිත් නොකීවේය. එහෙත් එයින් කිසිවක් ඔහු නොගත්තේය. තමා මිලට ගත් ගෝවා වලින් ඔහු තෘප්තියට පත්වුනේය. කෑම කා අවසන් වූ පසු වං ලූං බාල දරුවාද කැටුව පාරට බැස්සේය. පාරට බැස ගැහැණියට නො ඇසෙන තරම් දුරට ගොස් ගෙයක් පිටු පසට ගෙන දරුවාගේ හිස තම අත යට ට හිර කරගෙන ඒ මේ අතට තදින් තැලුවේය. දරුවා ද කොපමණ හැඩුවත් ඔහු එයින් නොනැවතුනේය.

"ඉදා! ඉදා!! ඉදා!!! උඹට හොරෙක් උනාට මෙන්න" යයි කියා කෑගසමින් ඔහු දරුවා අතහැරියේය. දරුවා නාසයෙන් හඩ හඩා ගෙදර බලා දුවද්දී වං ලූං "අපි ආපහු ගමට යන්න ඕන" යයි තමාට ම කියාගත්තේය.

ශ්‍රී ඉසුරුමත් නගරයෙහි එදිනෙද ජීවිතය ගතකළ වං ලුං ජීවත් වූනේ ඒ නගරයෙහි පිහිටා තිබුන දිළිඳු බවෙහි පදනම මතය. එහි වෙළඳ පොළවල් කෑම වර්ගවලින් – නොයෙක් බඩු මුට්ටුවලින් පිරී පැවතුනේය. නා නා වර්ණවත් ධජ සෑම කඩයකම ලෙලදුන්නේ ඒවායේ ඇති වෙළඳ බඩු කියා පෑමට මෙන්ය.

මෙහි ධනවත් මිනිස්සු විල්ලූද හා සැටින් රෙදි ඇඳගෙන සිටියහ. සියුමැලි සිරුරු ඇති ඇතැම් ධනවත්තු පටපිළි වලින් සිය සිරුරු ආවරණය කරගෙන සිටියහ. සියුමැලි බව ද සුවඳවත් බව ද පැහැපත් බව ද නිසා ඔවුන්ගේ අත් මල් වැනි වීය.

ඒ මහා නගරය එතරම් සෞභාග්‍ය පෙනුමකින් යුක්තවුවත් වං ලුං විසුම්ගත් පෙදෙසෙහි දුගී පැල්පත්වල විසූ අය කුසගින්නට කෑමත් විළි වසා ගැන්මට සෑහෙන වස්ත්‍රත් ලබාගත්තේ මහත් වැයමෙනි. සාමාන්‍ය මිනිස්සු, පොහොසත් අය සඳහා පාන් හා කැවිලි වර්ග පිලිස්සීමට මුළු දවස පුරාම වෙහෙස වූහ. එමෙන්ම දරුවෝද උදේ පටන් මධ්‍යම රාත්‍රිය දක්වා වෙහෙසවී තෙල් හා දූවිලි වැකුණු සිරුරින් යුතුව රළු පැදුරු මත බිම නිද ගෙන සිට පසු දින උදයෙහි නැවතත් උදුන් වෙත ගියහ.

පොහොසතුන් සඳහා පිළියෙළ කරණ මේ කෑම වර්ග මිලදී ගන්නට ඒ සාමාන්‍ය ජනයාට නො හැකි වීය. එහි සාමාන්‍ය ජනයා අතර ගැහැණු මෙන්ම පිරිමි ද එකතුව වෙහෙසවෙමින් වෙළඳ සැල්හි තිබුන ප්‍රණීත කෑම අනුභව කළ ධනවතුන් උදෙසා ශීත කාලයට සණ ලොම්ත් ද උෂ්ණ කාලයට තුනී ලොම්ත් ද ඇඳුම් පිළියෙළ

Scanned by CamScanner

කළහ. එහෙත් මේ ඇඳුම් පිළියෙළ කළ දුප්පත් මිනිසුන් තමන්ගේ නග්න බව වසාගත්තේ එහෙන් මෙහෙන් ලබාගත් නිල්වන් කපු රෙදි කැබැල්ලක් ගෙන යන්තමට වසා ගනිමිනි.

අනුන් පෝෂණය කිරීමට වෙහෙස වූ මිනිසුන් අතර වෙහෙස වුන වං ලුං ට ඉතා අද්භූත දේ අසන්නට ලැබුනි. එහෙත් ඔහු ඒවා නො සැලකුවේය. වයස්ගත ගැහැණුද පිරිමිද කිසිවක් කිසිවෙකුට නොකීහ. හිස නිකට පැසුණ මිනිසුන් අතර රික්ෂෝරථ අදින්නෝද අවන්හල්වලට හා මාලිගාවලට අඟුරු හා දරකරත්ත අදින්නෝ ද වූහ. මාර්ගයන්හි බඩු පැටවූ කරත්ත ඇදීමත් තල්ලු කිරීමත් නිසා ඔවුන්ගේ පිටේ මස්ගොබ කඹ මෙන් ඇදී තිබුනි. ඔව්හු ලැබුන යන්තම් ආහාරයකින් පොෂිත වූහ. ඔවුන් සෑම රැයකම ලැබුවේ කෙටි නින්දකි. ඔවුන් කාලය ගත කළේද නිශ්ශබ්දතාවයෙනි. ඔවුන්ගේ මුහුණුද ඕලැංගේ මුහුණ මෙන්ම හැඟීම් විරහිතව ගොළුවී තිබුනි. කිසිවෙක් ඔවුන්ගේ සිත්තුළ ඇතිදේ නොදන්හ. ඔවුන් කථාකළේ කෑම ගැන හෝ පැන්ස ගැන පමණකි. ''රිදී'' යන වචනය ඔවුන්ගේ මුවෙන් කිසිදිනක පිට නොවීය. ඔවුන්ගේ අත්වලට රිදී කාසි ලැබුනේ ඉතා කලාතුරකිනි.

විශ්‍රාමයෙන් පසුවන විටද ඔවුන්ගේ මුහුණු කෝපයෙන් විරූප වුනි. බොහෝ විට එසේ වුනේ කෝපයම නිසා නොව තමන්ගේ තරමට වැඩි වූ බර අවුරුදු ගණනක සිට උස්සමින් වෙහෙසට පත්වූ බැවින් ඔවුන්ගේ උඩුතොල උස්වී දත් එළියට මතුවී රෞද්‍ර බැල්මක් මතුවුන නිසාය. මෙසේ අධික වෙහෙසට පත්වීම නිසාම ඔවුන්ගේ ඇස් ගිලී මුව වටා රැළි නැගී තිබුනි. ඔවුන් කෙබඳු වර්ගයේ මිනිසුන් දැයි ඔවුන්ටම දැනගත හැකි නො වීය. වරක් ඔවුන්ගෙන් එකෙක් ගෘහභාණ්ඩ ගෙනියන කරත්තයක තිබුන කැට පතකින් තමාගේ රුව දැක ''අන්න කැත මිනිහෙක්'' යයි හඩ නැගුවේය. අවට සිටියවුන් ඔහු දෙස බලා සිනාසෙන විට ඔහුද වේදනාවකින් මෙන් විරිත්තුවේය, සිනාසුනේය. සෙස්සන් තමාට සිනාසුනේ කුමට දැයි ඔහු නොදත්තේය. එහෙයින් ඔහු තමාගෙන් කිසිවෙකුට වරදක් සිදුවුනා දැයි වට පිට බැලුවේය.

වං ලුං ගේ පැල්පත අවට ගොඩ නැගුන සෙසු පැල්පත්වල ගැහැණු වැරහැලි මසාගෙන තමන් නිතර ප්‍රසූත කරන දරුවන්ට ඇඳුම් පිළියෙළ කළහ. ඔවුන් ගේ දරුවෝ ගොවීන්ගේ කෙත්

Scanned by CamScanner

වලින් ගෝවා සොරකම් කළහ. ධාන්‍ය ගබඩාවලින් සහල් සොරකම් කළහ. ඔව්හු එහි කඳු මුදුන්වල තිබුන පලාවර්ග අවුරුද්ද පුරාම නෙලා ගත්හ. අස්වැන්න කපන කාලයේ දී කුකුළන් මෙන් ගිජු ඇසින් බල බලා අස්වැන්න කපන්නන් පසුපස යෙමින් අතපසුවන සෑම ඇටයක්ම කරලක්ම අහුල ගත්හ.

මෙ පැල්පත්වල ළදරු මරණ සුලබ වූනි. එහෙත් මෙහි දරුවෝ නිතරම පාගේ ඉපදුනාහ, මැරුණාහ, යලි තව තවත් දරුවෝ ඉපදුනාහ. ඔවුන්ගේ දෙමව්පියෝවත් උපන් දරුවන්ගේ හා මළ දරුවන්ගේ ගණනද නොදත්හ. තම දරුවන් ගණන දැනගත්තේ කන්නට දියයුතු කටවල් ගණන සිතූ විටය.

මෙහි ගැහැණු ද පිරිමි ද ලමයි ද වෙළඳපොලේ එහා මෙහා යමින් රෙදිකඩ පසු කරමින් නගරය වටා සැරිසරමින් කල් ගත කළහ. පිරිමි පැන්ස කීපයක් සඳහා වැඩ කළහ. ගැහැණු ද ලමයි ද සොරකම් කළහ, හිඟා කෑහ. කොල්ලකාගත්හ. වං ලුං හා ඔහුගේ බිරියත් ලමයිත් මේ දුගී ජනතාව අතරවූහ. මේ පැල්පත්වල මහළු ගැහැණු ද පිරිමි ද තමන්ට ලැබුන දිවියක්ම ගතකළහ. එහෙත් ඔවුන්ගේ පිරිමි දරුවෝ හැදී වැඩී එක්තරා වයසකට පත්වුන විට ළමා වයස අවසන් වන විට තරුණ වයස ලංවුන විට තමන්ගේ ජීවිතය ගැන අතෘප්තිමත් වූහ. තරුණ මිනිසුන් අතර කෝපාවිෂ්ට දරුණු කථාද ඇතිවූනි. පසුව ඔවුන් වැඩිහිටියන් වී විවාපත් වීමෙන් පසු ඇතිවුන අධික ජනගහණය නිසා ඔවුන්ගේ හද තුළ ඇතිවුනේ ශෝකයකි. තරුණ කාලයේ ඔවුන්ගේ හද තුළ පැවති කෝපය වයස්ගතවත්ම දරුණු බලාපොරොත්තු කඩවීම්වලට පෙරලෙමින් පැවතුනි. මෙසේ ඔවුන් තුළ ඇතිවුනේ වචනයෙන් කිය නොහැකි තරම් විප්ලවයකි. ඔවුන්ගේ මුළු ජීවිතය තුළම සතුන්ගේ ජීවිත වලට වඩා වෙහෙසවන්නට ඔවුනට සිදු වූණි. දිනපතා ඔවුනට කුස පුරවා ගන්නට ලැබුනේ ද ආහාර ස්වල්පයකි.

දිනක් මේ දුගී ජනතාවගේ කථාවලට කන්දුන් වං ලුං ට, පළමු වරට තමන් ඇලී හුන් ඒ තාප්පයේ අනික් පස තිබුනු දේ ගැන දැනීමක් ලබාගත හැකි විය.

මේ දැනුම ඔහුට ලබාගත හැකි වුනේ සීත සෘතුවේ අන්තිම දිනයෙහි ද අවසානයෙහිය. වසන්තයේ පැමිණීම සිදුවිය හැකි දෙයක් බැව් වැටහෙන්නට වූයේද මේ දිනවලය. පැල්පත් වටා බිම දියව

යන හිමෙන් මඩවී තිබුනි. සෑම පැල්පතකටම වතුර ගලා ආ බැවින් සෑම පවුලකටම නිදගැන්ම සඳහා එහේ මෙහේ ඇවිද ගඩොල් කැට සොයන්නට සිදු විය. එහෙත් තෙත පොළොවේ අපහසු කම හැරෙන්නට මෙන් මේ රාත්‍රියෙහි වාතයේද යම්කිසි ලිහිල් බවක් පැවතුනි. මේ ලිහිල් බව නිසා තදින් නොසන්සුන් බවට පත් වංලූංට නිදගැන්මද අපහසු වීය. වෙනද නම් ඔහුගේ පුරුද්ද කෑම ගත් වහාම නින්දට යාමය. එහෙත් මේ දිනයෙහි ඔහු වීථියේ කෙළවරට ගොස් කම්මැලිව එහි බලා සිටියේය.

බිත්තියට හාන්සි වී ඔහු ඒ හිඳගෙන හුන් ස්ථානය සිය මහලු පියා පුරුද්දක් වශයෙන්ම ඇණතියාගෙන හුන් ස්ථානය මැයි. මේ දිනවල දරුවන්ගේ කෝලාහල හඬින් පැල්පත පිරී තිබුන නිසා මහල්ලා සිය ආහාර බඳුන ද රැගෙන ගොස් එය අනුභව කෙළේ ඒ ස්ථානයෙහි හිඳගෙනය.

මේ දවස්වල මහල්ලාට පැවරුණ කාර්‍යයක් නම් ඕලෑං තම බඳ පටියෙන් ඉරා සකස් කරගත් වලල්ලක තැබූ දූරිය බලා ගැනීමයි. රෙදි වලල්ල ආධාර කරගෙන ඇ ඇවිදින්නට පුරුදු වූවාය. මෙසේ මේ කුඩා දූරිය රැක බලා ගැනීම නිසා මහල්ලාට කාලයද ගෙවී යනු නො දැනිණ. රෙදි දරණුවෙන් දූරිය වැටෙන අයුරුද, නැගිටින අයුරුද, යළි වැටෙන අයුරුද මහල්ලා දරණු කෙළවර අදින අයුරු ද වංලූං බලා සිටියේය. දූරිය බලාගැන්ම මහල්ලාට පැවරුණු හෙයින්, තවත් දරක ප්‍රසූතියකට ළංව හුන් ඕලෑංට, එය මහත් පහසුවක් විය. මෙසේ තම පියා හුන් තැනට ගිය වංලූංට, රාත්‍රි වාතයේ ලිහිල් බව මැනවින් දැනුනි. තමා සිතතුළ ආපසු ඉඩම්වලට යාමේ ආසාව දැඩි වුනි. එහෙයින් ඔහු තම පියාට කථා කෙළේය.

''මේ වගේ දවස්වල, කුඹුරු පෙරලල තිරිඟු වපුරන්න ඕන'' යයි ඔහු ශබ්ද නගා කීවේය.

''හා! මම දන්නව උඹේ හිතේ තියෙනදේ. මගේ ජීවිත කාලෙ දෙවරක්ම මට ඔහොම සිද්දඋනා. කුඹුරු අත්හැරල යන්න උනා. නැවත වරක් වපුරන්න බෝග ජාතිත් නැතුව ගියා'' යයි මහල්ලා නිශ්චලව පිළිතුරු දුන්නේය.

''ඒ උනාට තාත්තෙ, උඹ හැමදම ආපහු ගියානේ?''

''ඔව් දරුව! තිස්සෙම ඉඩම ඉතුරු උනා'' යයි මහල්ලා කීවේය.

''හොඳයි මේ අවුරුද්දෙ බැරිවුනොත් ලබන අවුරුද්දෙවත් ආපසු යනවා'' යයි වං ලුං තමාටම කියා ගත්තේ තමා එනතුරු වසන්තයේ වර්ෂාවෙන් පෝෂිතව පවතින තම ඉඩම ගැන සිහි කරමිනි. ඔහු යලිත් පැල තුළට ගොස් තම බිරියට රළුහඬින් කථා කෙළේය.

''මට විකුණන්න යමක් තියෙනව නම් ඒකත් විකුණගෙන ආපහු ගමට යනව. මේ තාත්ත නැත්නම් අපට බඩගින්නෙ උනත් පයින්ම යන්න පුළුවන්. මේ කුඩා දරුවයි තාත්තයි සැතපුම් සිය ගණනක් පයින් යන්නෙ කොහොමද? උඹ උනත් යන්නෙ කොහොමද ඔය බරකුත් උස්සාගෙන.''

එසේ කියන විට ඕලෑං සිටියේ භාජන වගයක් සෝදමින්ය. ඇය ඒ භාජන පැල්පතෙහි කෙළවරක ගොඩගසා ඇනතියාගෙන හුන් තැනම සිට ඔහු දෙස බැලුවාය.

''කෙල්ල මිසක් වෙන විකුණන්න දෙයක් නැතැ''යි ඇය සෙමින් කීවාය.

වං ලුං ගේ හුස්ම හිරවුනි. ''මම දරුව විකුණන්නෙ නැතැ''යි ඔහු ශබ්ද නගා කීය.

''ඇයි එහෙම කියන්නෙ. මාවත් ඔහොම විකුණුනා නේ. මන්වත් විකුණුවෙ මගේ මවට ගමට යන්න ඕන උනාම තමයි.''

''හොඳයි ඉතින් ඒක නිසා උඹත් දරුවව විකුණනවද? ''

''ඉතින් මගේ තනිකර වැඩක් නම් මම ඒක එහෙම කරන්නෙ නැහැ............ඔබට ආපහු යන්න ඕන නම් මම ඇව විකුණන්නම්.''

''නැහැ නැහැ මමත් කැමති නැහැ ඇව විකුණන්න. අපිට කැලේක ජීවත් උනත් කමක් නැහැ. මම ඇව විකුණන්නෙ නැහැ. ඔහු නැවතත් පැල තුළින් පිටවී ගිය විට දරුවා පිළිබඳ ''ඒ සිතුවිල්ල'' ඔහුට විරුද්ධව යළිත් ඉදිරිපත් වූතේය. සීයා අල්වා ගෙන හුන් වළල්ලේ කෙළවරකට වී සන්සුන්ව ක්‍රීඩා කරණ කුඩා දූරිය දෙස ඔහු බැලුවේය. ඇයට දිනපතා හොඳ කෑම ලැබුන නිසා ඇය පුෂ්ටිමත්ව සිටියා ය. එහෙත් ඇය වචනයකුදු කථා නොකළාය. කථාකළ හැකි බවක්ද පළ නොකළාය. ඇගේ රතුවත් දෙතොල නිතරම සිනහ රැල්ලකින් බරවී තිබුනි. කිසිවෙකු ඇය දෙස බැලූ විට සිනහ පහළ කිරීම ඇයගේ සිරිත විය.

Scanned by CamScanner

''ඇය මගේ තුරුල්ලට වී ඔහොම හිනා උනේ නැත්නම් මට ඒක කරන්න තිබුනා'' යයි කියූ ඔහු කල්පනා කරන්නට විය. යලි ඔහු තම ඉඩම ගැන සිතමින් මෙසේ ශෝකයෙන් කෑගැසුවේය.

''අනේ මට ඒව කවදක්කත් බලන්න බැරිද? මේ කොච්චර වැඩ කළත් හිඟා කැවත් අපිට කන්නට වැඩිය යමක් ලැබෙන්නෙ නැහැ.''

ඔහුගේ ඒ වචනවලට පිළිතුරු දුන්නේ කළුවර ද විනිවිදගෙන ආ ගැඹුරු කටහඬකි.

''ඔය තත්වය උඹට විතරක් නොවෙයි. උඹ වගේ සීයක් උනත් මේ නගරයෙහි ඉන්නවා'' යයි ඒ ගැඹුරු හඬ ඔහුට පැවසුවේය.

එයට අනතුරුව ඔහුට දක්නට ලැබුනේ උණ ලී පයිප්පයක්ද උරමින් ඉදිරියට ආ මිනිහෙකි. ඔහු නම් වං ලුං ගේ පැලට, පැල්පත් දෙකකට එහා පැලෙහි පවුලේ ප්‍රධානයා ය. දහවල් කාලයේ ඔහු පෙනෙන්නට සිටියේ කලාතුරකිනි.

ඔහු දහවල් දවස ගත කෙළේ නිදා ගැනීමෙනි. ඔහුට රක්ෂාව කරන්නට සිදුවී තිබුනේ රාත්‍රි කාලයෙහිය. බඩු පිරවූ විසාල කරත්ත ඇදගෙන යාම ඔහුගේ රක්ෂාවයි. මේ කරත්ත දහවල් කාලයෙහි ඇදගෙන යා නොහැකි වුනේ වෙනත් රථවාහන වලට අයින් කිරීමට නොහැකි තරම් ඒ කරත්ත විසාලව තිබුන හෙයිනි. ඒ කරත්ත ඇද නිමවා සමහර දිනක උදෑසනක මොහු ගෙදරට ඇදෙනු වං ලුං දැක තිබුනේය. විඩාවෙන් හතිලමින් පැමිණි මොහු ගේ විසාල උරහිස් එල්ලා වැටුනේ ඔහු බර අදින්නෙකු බව පවසන්නට මෙන්ය.

බොහෝවිට සෑම උදයකම වං ලුං ට මේ මිනිසා හමුවුනේ රික්ෂෝරථය ඇදීමට සිය පැල් පතෙහි සිට යනවිටය. ඇතැම් දිනක සවසක වැඩට යනවිට ද පෙරලා පැල්පතට එන වං ලුං ට ඔහු හමු වුනේය.

''හොඳයි ඉතින් මේක හැමදාටම මෙහෙම ද''යි වං ලුං දුකෙන් ඇසුවේය.

මිනිහා දුම් කෝච තෙවරක් උරා කෙළ ගසා යලි මෙසේද කීය.

''නැහැ නැහැ හැමදාටම නොවෙයි. ධනවත්තු හුඟක් ධනවත් වූ විටත් මගක් තියෙනව. දුප්පත්තු හුඟක් දුප්පත් වූ විටත් මගක් තියෙනව. පසුගිය සීත කාලය ගෙවුන්න අපි කෙල්ලො

Scanned by CamScanner

දෙන්නෙක් වික්ක. මේ සීත කාලයේ ත් මගේ ගෑණිට ලැබෙන්නේ ගෑණු දරුවෙක් නම් අපි ඒකත් විකුණනව. පළමුවෙනි එකාව අපි තියාගත්ත. අනික් එව්වො මරා දමනවට වඩා හොඳයි විකුණන එක. අනේ ඒ උනාට සමහරු උන් හුස්ම අදින්නත් පෙර මරා දමනව. අන්න ඒක තමයි දුප්පත්තු හුඟක්ම දුප්පත් උනහම කරණ විදිය. පොහොසත්තු හුඟක්ම පොහොසත් උනහමත් කරණ විදියක් තියෙනව. ඉතින් මට වැරදිල නැත්තං මම හිතන්නෙ ඒක ලඟදිම පෙනේවිය කියල.''

ඒ මිනිසා හිස වනා තම පයිප්ප මිටින් තමත් පිටිපස ඇති තාප්පය පෙන්වූයේ ය.

''තමුසෙ දුටුවද මේ තාප්පයෙ ඇතුල් පැත්ත?''

වං ලුං එදෙස බලමින් හිස වැනුවේය. ඒ මිනිසා කියාගෙන කියාගෙන ගියේය.

''මම දරුවෙක් විකුණන්න ගිය වෙලාවෙ ඒක දැක්ක. ඒ ගෙදරට සල්ලි එන යන විදිය මම කිව්වොත් තමුසෙ විශ්වාස කරණ එකක් නැහැ. ඔන්න මේ කාරණයෙන් විතරක් තේරුම් ගන්නව!. ඒ ගෙදර වැඩකාරයො පවා කන්නෙ ඇත්දත් මිටදපු රිදී කෝටුවලින්. දසියො පවා පළඳින්නෙ මැණික් ගල් අල්ලපු කඩුක්කන්. උන්ගෙ සපත්තුවලට අල්ලල තියෙන්නෙ මුතු ඇට. ඒ සපත්තුවල යම්තම් මඩ ගෑවුනොත් උන් ඒව මුතුත් සමග වීසි කරනව.''

මෙසේ කථාකරගෙන ගිය මිනිහා යලිත් තදින් දුම්කෝවය ඉරුවේය. වං ලුං මුව අයාගෙන ඔහුට සවන් දුන්නේය. මේ තාප්පයට එපිට ඇත්ත වශයෙන්ම එවැනි දේවල් තියෙනවා''යයි කියූ ඔහු යලිත් කථාකරගෙණ ගියේය.

''පොහොසත්තු පොහොසත් උනත් විදියක් තියෙනවා''යයි කියූ ඒ මිනිසා ටික වෙලාවක් නිශ්ශබ්දව සිට කලින් කිසිත් නොකීවාසේ නොසැලකිල්ලෙන් මෙන් ''හොඳයි ආයිත් වැඩ කරන්න''යයි පවසා අඳුරෙහි නොපෙනී ගමන් ගත්තේ ය.

වං ලුං ට ඒ රැයෙහි නින්දක් නම් නොවීය. තමන්ගේ සිරුර සතප්පවාගත් මේ තාප්පයට ඔබ්බෙහි ඇති රන් හා මුතු මැණික් ගැන ඔහු සිතන්නට පටන් ගත්තේය. ඔහු රැයෙහිද පොරවා ගෙන සිටියේ – ඇඳ සිටියේ දිනපතා අදින ඇඳුමය. ඇත්ත

Scanned by CamScanner

වසයෙන්ම පොරෝණයක් පවා ඔහුට නොවීය. නිදගන්නට ද තිබුනේ ගඩොල් කැට මත ඇතුරුණු පැදුරු කබලක් පමණකි.

යලිත් වරක් දරුවා විකිණීමේ ආසාව ඔහු තුළ හට ගත්තේය. එවිට ඔහු තමාට ම මෙසේ කියාගත්තේය.

''ඇයව පොහොසත් ගෙදරකට විකුණන එක වඩා හොඳ වෙන්නත් පුළුවන්. ඈට හොඳ කෑම කාල රත්තරන් පැලඳල සිටිය හැකි. ලස්සන වැඩිඋනොත් ලොකු උනොත් රදළ කෙනෙක්ව සතුටු කරන්නත් පුළුවන් වේවි.''

තමාගේ සිතට විරුද්ධව උත්තර දී ගත් ඔහු නැවතත් මෙසේ සිතුවේය.

''නමුත් මම ඇය වික්කත් ඇය ඇගේ බරට රත් රන් හෝ මැණික් තරම් වටින්නෙ නැහැ. ඉතින් ඇය විකුණල ලැබෙන මුදලින් අපිට ආපහු ඉඩම්වලට යා ගන්න පුළුවන්වුනත් අපට ගොණෙක් මේසයක් ඇඳන් හා බංකු ගන්න සල්ලි කෝ? මෙතැනින් එතෙන්ට ගිහිල්ලා හාමතේ ඉන්නට අපි මේ දරුවා විකුණමුද? කුඹුරෙ ඉහින්න ධාන්‍යජාතියක්වත් අපට නැහැ.''

කොතෙක් සිතුවත් ''පොහොසත්තු හුහක්ම පොහොසත් උනහම විධියක් තියෙනවා'' යන අර මිනිසාගේ කියමන වං ලුං ට නම් තේරුම් ගත හැකි නොවීය.

Scanned by CamScanner



ගම් පැල්පත් සමූහයට වසන්ත සමය උදාවෙත්ම එහි කඳු බෑවුම් හා සොහොන් බිම් ගොටුකොළ ගෙඳ වැනි පලා වර්ග වලින් නීලවර්ණ වුනේය. මේ නිසා නගරයේ එළවළු සොරකම් අඩුවන්නට වූයේ සිඟාකන අයටද සිඟානොකා මුදල් නොදී පහසුවෙන් පලා වර්ග සපයාගන්නට හැකිවුන නිසාය. සෑම දිනකම පැල්පත් වලින් නිකුත්වූ වැරහැලි ඇඳගත් - කැඩුනු පිහියා, ගල් පතුරු, වේවැල් කූඩ රැගත් ගැහැණු හා ළමයි කඳු බෑවුම්වල ද සොහොන් බිම්වල ද ඇවිදිමින් පලා වර්ග - අල වර්ග–ආහාර ද්‍රව්‍ය සොයන්නට උත්සුක වූහ. මෙසේ ආහාර සොයා යන දුගී ජනතාව අතර ඕලෑං හා ඇයගේ පිරිමි දරුවන් දෙදෙනා ද වූහ.

ගැහැණුන් හා ළමයින් එළවළු වර්ග සොයමින් තැන තැන ඇවිදින අතර එහි පිරිමින් වැඩ කළ යුතු වීය. දිවාකාලයෙහි හිරු රැස් ද හදිසි වැසි ද නිසා සෑමදෙනා තුළ ම ආශාව හා මන්දෝත්-සාහී බව ඇතිවුව ද වං ලුං පෙර මෙන්ම වැඩකරගෙන ගියේය.

ශීත සෘතුවේදී ඔව්හු නිශ්ශබ්දව වැඩ කළහ. ඔවුන් පිදුරු සෙරෙප්පු ලාගත් පාවලින් හිම ඉවසාගත්තේ මහත් වෑයමෙනි. රැයෙහි පැල්පත් තුළ රිංගා ගත් ඔව්හු හිඟාකෑමෙන් හෝ වැඩ කිරීමෙන් ලබාගත් මුදලෙන් සකස් කරගත් ආහාරයක් නිහඬව අනුභව කළහ. ඉන්පසු ගැහැණු ද ළමයි ද පිරිමි ද එකට ගුලිගැහී තද නින්දට වැටුනාහ. ඔවුන් එසේ නිදාගත්තේ උෂ්ණය ලබාගැනී-මට ය. තම පැල්පතෙහි දිනපතා පවතින මේ තත්වය සෙසු පැල්පත්වල ද එසේම යයි වං ලුං දත්තේය.

වසන්තය එළඹෙන විට මේ පැල්පත්වල වැසියන් පළකෙළේ දෙඩමලු බවකි. සෑම එකෙකුගේම දෙතොල වචන පිටවීමේ හඬින් දෙදරුම් කන්නට විය. සවස් කාලයේ සන්ධ්‍යා ලොකය පැතිරෙන විට ඔව්හු පැල්පත්වලින් එළියට අවුත් එක්රැස්ව සාකච්ඡා කරන්නට ද වූහ.

සීත කාලයෙහිදී තම අසල් වැසියන් ගැන කිසිත් නොදැන සිටි වං ලුං දැන් ඔවුන් ගැන දනියි. ඔහුට ඒ දැනුමද ලැබුනේ ''අර සාකච්ඡා'' වලිනි. ඔහුගේ බිරිය – ඕලැං දෙඩමලු එකියක් වූවානම් ඒ පිළිබඳ එයට වඩා කරුණු ඔහුට දැනගත හැකිව තිබුනි. එහෙත් ඇය ''අර මිනිහ අද භාර්යාවට තැලුව, අසවලාට ලාදුරු රෝගය වැළඳිල තියෙනවා – අසවලා සොරමුලක ප්‍රධානයෙක්'' යන ආදී ඕපා දූප කථාකරණ එකියක් නොවේ. ස්වාභාවික වසයෙන් නිහඬ වූ ඇය හදිසියෙන් කථා කෙළේ ද ප්‍රශ්නයක් අසන්නට හෝ ප්‍රශ්නයකට උත්තර දෙන්නට පමණකි. එහෙයින් වං ලුං අවිශ්වාස යෙන් යුතුව ඔවුන්ගේ සාකච්ඡාවලට ඇහුම්කන් දුන්නේය.

මේ වැරහැලි හැඳගත් මිනිසුන්ගෙන් බොහොමයකට එදිනෙදා වැඩවලින් හා හිඟා ගැනීමෙන් ලද දෙයට වැඩියමක් නොතිබුනි. එයට වැඩි යමක් තමාට ඇතැයි සැලකූ වං ලුං තම පවුල ඒ යාචක ගණයට නොවැටේ යයි ද සිතුවේය. එබඳු සිතිවිල්ලක් ඔහුට ඇතිවූනේ ඔහු සතුව තිබුන ඉඩම් නිසාය.

මේ පැල්පත්වල වැසි සෙස්සන් කල්පනා කෙළේ ''හෙට මාලු ටිකක් ගන්නේ කෙසේද? ටිකක් විවේක ගන්නේ කෙසේද? පැන්සයක් දෙකක් සූදුවෙහි යොදන්නේ කෙසේද?'' යන ආදියයි. ඔවුන්ගේ ජීවිත–ඔවුන්ගේ හදවත් සැමවිටම පිරී පැවතුනේ එක් වැනිවූම එබඳු වුවමනා වලින්මය. බලාපොරොත්තු විරහිත ජීවිත ගත කළ ඔව්හු ක්‍රීඩාකාමී ද වූහ.

මේ අතර වං ලුං තම ඉඩම් ගැන සිතමින් නොයෙක් හැඟුම් පහළ කරන්නට වූනේය. ඔහු සෑම මොහොතකම කල්පනා කෙළේ තම ඉඩම්වලට ආපසු යන අන්දමය.

වං ලුං පොහොසතෙකුගේ ගෙයි තාප්පයට ඇලී සිටියත් එහි කසල ගොඩට අයත් නොවූවාක් මෙන්ම ඔහු එම පොහොසක් ගෙයට ද අයත් නොවූවේය, ඇත්ත වසයෙන්ම ඔහු අයත් වූයේ ඔහුගේම ඉඩම්වලටය.

තම පාදයන්ට ඒ ඉඩම්වල පහස දැනෙනතුරු – වසන්ත සමයෙහි, නඟුලක් පසු පසට වී ගමන් කරන තුරු – අස්වැන්න කාලයෙහිදී දැකැත්තක් අල්ලනතුරු ඔහුට තෘප්තිමත් ජීවිතයක් නම් ගත කළ හැකි නොවීය.

අන්‍යයන්ගෙන් වෙන්ව නිතරම සවන්දී සිටි ඔහුගේ හද තුළෙහි තැන්පත්ව තිබුනේ ''තමන්ට ඉඩම් අයිතිය යන හැඟීමය – තම මුතුන් මිත්තන්ගෙන් ලැබුන හොඳ තිරිඟු ඉඩම් – මිලයට ගත් සාරවත් කුඹුරු – යන ආදිය'' ගැනය.

ඒ පැල්පත්වල විසූ මිනිසුන් නිතරම සාකච්ඡා කෙළේ මුදල් ගැනය–රෙදි රියනකට ගෙවන පැන්ස ගණන ගැනය – මිනිසෙකුගේ ඇඟිල්ලක් තරම් දිග ඇති කුඩා මසෙකුට ගෙවූ මුදල් ගණන ගැනය නැතහොත් දිනකට සපයා ගත හැකි මුදල් ගණන ගැනය. තාප්පයට එහා පැත්තෙහි ගෙදර මිනිසාගේ පෙට්ටිවල ඇති මුදල් ගැන ද සාකච්ඡා කළ ඔවුන් කථාව අවසන් කෙළේ ''එයාට තියෙන රත්තරන් මට තිබුන නම් එයාගෙ පටියෙ තියෙන රිදී මගේ අතේ තියෙනව නම් එයාගෙ වේස ගැණු පළඳින මුතු ඇට මට තිබුන නම් එයාගෙ භාර්‍යාව පළඳින රතු කැට මට ලැබුනොත්..........'' යන ආදී වචනවලිනි.

''ඒ පොහොසතා කොපමණ කොයි විදියට කන බොනවාද? කෙසේ නිද ගන්නවාද? තමන් කිසි කලෙකත් නොකෑ විදියේ ප්‍රණීත ආහාර ඒ පොහොසතා කෙසේ කනවාද?'' යන ආදිය ගැන ද ඒ පොහොසතා ප්‍රසිද්ධ භෝජනාගාරවලට ගොස් සූදු කෙළින හැටිද, ඔහු සිය කාමය සංසිඳුවා ගැනීමට ලස්සන ලමිස්සියන් පාවා ගන්නා සැටිද ඒ මිනිසුන්ගේ කථාවලින් වං ලුං ට අසන්නට හැකි වීය.

වං ලුං එය අසා මෙසේ කෑ ගසන්නට වීය.

''මට ඔය රත්තරන්, රිදී, මැණික් තියෙනව නම් මම ඒවයින් ඉඩම් ගන්නව. ඉඩම් අරගෙන ඒවයින් හොඳ අස්වැන්න ලබාගන්නව.''

මෙසේ කීවිට ඔවුන් සියල්ලෝම ඔහුට නින්ද කරන්නට එකතුවූහ.

''මෙන්න මෙන්න බොලේ! ගොඩයෙක්! මෙයා නගරයේ ජීවිතය ගැන දන්නෙ නැහැ. සල්ලිවලින් කරණ දේවල් දන්නෙ

නැහැ. මිනිහට ඕන කරන්නෙ දසයෙකුවගේ ගොණෙකුගෙ හරි බූරුවෙකුගෙ හරි පස්සෙන් යන්න.''

වං ලුං ට නින්ද බස් පැවසූ ඔවුන් අදහස් කෙළේ තමන් මුදල් වියදම් කරන අඳුම දන්නා නිසා වං ලුං ට වඩා ඔවුන් මුදල් ලැබීමට සුදුස්සන් බවය.

ඔවුන්ගේ නින්ද බස්වලින් වං ලුං ගේ සිත වෙනස් නොවීය. ඔහු ශබ්ද නගා කථා නොකෙළේය. තමාටම මෙසේ කියාගත්තේය.

''කොහොම උනත් මම නම් රත්තරන් රිදී මැණික් සේරම හොඳ ඉඩම්වලට යොදවනවා.''

මෙසේ සිතූ ඔහු තමාට අයිතිව තිබුන ඉඩම් ගැන වඩ වඩාත් තොඉවසිලිමත් වීය. තමාගේ ඉඩම් ගැන සිතිවිලිවලින් නිතර මඩනා ලද වං ලුං තමා අවට නගරයේ සිදුවන දේ සිහිනයක් මෙන් බලාගත්තේය. ඔහු මේ සියළු දේ ගැන කිසිදු ප්‍රශ්නයක් නොඅසා පිළිගත්තේය.

එක් දිනක ඔහුට මෙබඳු දෙයක් සිදුවිය. එනම් මිනිසුන් එහා මෙහා බෙදන පත්‍රිකාවක් ඔහුට ද ලැබීමය.

වං ලුං කුඩා කාලයේ පාසැල් නොගිය කෙනෙකි. අකුරු නොදගත්තෙකි. එහෙයින් නගරයේ දෙරටුවල අලවා තිබුන කලුවන් සටහන් වලින් යුත් කරදසිවලින් කිසිවක් ඔහුට තේරුම් ගත හැකි නොවීය. බිත්තිවල අලවා තිබුන හෝ තොග ගණනේ විකුණනු ලැබූ හෝ බෙද දෙනු ලැබූ ඒ පත්‍රිකා ඔහු කෙසේ තේරුම් ගන්නද? දෙවරක්ම මෙවැනි පත්‍රිකා ඔහුට බෙද දෙනලදී. පළමුවන වර එබඳු පත්‍රිකාවක් ඔහුට දෙන ලද්දේ පිටරැටියෙකු විසිනි. මොහුද තමා වරක් රික්ෂෝ රථයක දමා ඇදගෙන ගිය පිටරැටියාට සමානය. ඔහුට වඩා ඇති එකම වෙනස නම් මොහු පිරිමියෙකු වීම ය.

මොහු උස්ය, සිහින්ය, කෙට්ටුය, වාතයෙන් පීඩිත ගසක් වැනිය. ඔහුගේ ඇස් දුඹුරුවන්ව පිහිටියේ ය. මුහුණෙහි වූයේ දළි රැවුලකි. මේ පිටරැටියා පත්‍රිකාවක් තමාට දෙනවිට ඔහුගේ අත් රතුවන් රෝමයෙන් ගැවසීගත් බව වං ලුං ට පෙනුනේය. කම්මුල්වලින් පෙරට නැගී සිටි තියුණු නාසයක් ද ඔහුට තිබුනි. එය නෞකාවක ඉදිරි කොටස මෙන් විය.

ඔහුගේ අතින් යමක් ලබාගැනීමට වං ලුං අකමැතිවුව ද මිනිහා ගේ නුපුරුදු ඇස් හා බියකරු නැහැයද දුටු ඔහු එය ප්‍රතික්ෂෙප කිරීමට වඩාත් බියවීය. එහෙයින් ඔහු තමාට දුන් දෙය වහා ගත්තේය. ඔහුට දුන් දෙය බලන්නට ධෛර්‍යයක් ලැබුනේ ඒ පිටරැටියා ආපසු ගමන් ගත් පසුය.

ඒ කරදසියේ තිබුනේ ලී කුරුසියක එල්වෙන සුදු හමැති මිනිසෙකුගේ පිළිරුවකි. ඔහුගේ ඉනවටා රෙදි කැබැල්ලක් දවටී තිබුනි. සෙසු කය පැවතුනේ නග්නවය. මළ මිනිසෙකුගේ ස්වභාවයක් ඒ ඡායාරූපයෙහි දිස්වුනි. ඔහුගේ ඇස් පියවී තිබුනේය, දෙතොල වැසී තිබුනේ ඝන රැවුලකිනි, හිස පසෙකට කඩාවැටී පැවතුනි.

වං ලුං මේ පින්තූරය දෙස භීතියෙන් හා විශ්මයෙන් බැලුවේය. පින්තූරයට යටින් ලියා තිබුන අකුරු ඔහුට තේරුම් ගත හැකි නොවීය.

ඔහු පින්තූරය ගෙදර ගෙන ගොස් රාත්‍රියෙහි මහල්ලාට පෙන්නුවේය. ඔහුට ද එය කියවිය නොහැකි වූයෙන් ''එහි තේරුම කුමක් විය යුතුද?'' යන්න ගැන වං ලුං ද මහල්ලා ද දරුවන් දෙදෙනාද සාකච්ඡා කළහ. දරුවන් දෙදෙනා ප්‍රීතියෙන් හා භීතියෙන් ''බලපන් එයාගෙ ඇහෙන් ලේ ගලන හැටි''යයි කියමින් කෑගැසූහ.

''මේ විදියට එල්ලල තියෙන්නෙ මෙයා හරිම හරි හොරෙක් වෙන්න ඇති'' යි මහල්ලා කීය. මේ පින්තූරය ගැන වං ලුං ට ඇතිවුනේ භීතියකි. ''මෙය තමාට දුන්නේ කුමක් නිසා දැ''යි ඔහු නැවත නැවතත් කල්පනා කෙළේය. ඔහුට සිතුනේ මේ පිටරැටියන්ගේ සොහොයුරෙකුට සිදුවුන මෙබන්දකට ඔවුන් පළි ගන්නට සැරසෙති''යි යන්නය. එබැවින් ටික දිනක් ගතවන තුරු වං ලුං ඒ පිටරැටි මගියා හමු වූ වීථිය මග හැර සිටියේය.

දින කීපයකට පසු ඔහුට ඒ කරදසිය ගැන අමතක වී ගියේය. ඕලෑං එහෙන් මෙහෙන් අහුලාගත් කරදසි කැබලිවලට අර රූපය සහිත කරදසිය ද එකතුකොට සපත්තු අඩියක් සකස් කළාය.

වං ලුං ට නැවතත් වරක් නොමිලේ කරදසි බෙද දුන් අවස්ථාවක් වීය. මේවර කරදසි බෙදුවේ හොඳින් හැඳ පැළඳගත් නගරයේම තරුණයෙකි. ඔහු ශබ්ද නගා කථා කරමින් අළුත් අමුතු දේවල් දක්නට වීථියට රැස්වන ජනකාය මධ්‍යයෙහි පත්‍රිකා බෙදුවේය. මේ

Scanned by CamScanner

පත්‍රිකාවල තිබුනේ ද ''ලේ හා මරණය'' පිළිබඳ දර්ශනයකි. එහෙත් මේ වර පත්‍රිකාවල තිබුන රුව සුදුහමැති රෝම සහිත මිනිසෙකුට අයිති වූවක් නොව වං ලූං ට සමානවූම මිනිසෙකුට අයත් වූවකි. ඒ රුවෙහි කෙස් හා ඇස් කළුය. ඇඳ සිටියේ නිල්වන් වැරහැලිය. සිරුර ද කසාවන්ය. එබඳු ලකුණු වලින් යුත් මළගිය ඒ මිනිසාගේ ඇඟ උඩ නැග ගත් තරබාරු මිනිසෙකු ඒ මියගිය මිනිසාට උල් පිහියකින් ඇණගෙන ඇණගෙන යන දර්ශනයකි ඒ පත්‍රිකාවෙහි වූ පින්තූරය කියා පෑවේ.

සැබවින්ම එය කණගාටුදයක දර්ශනයකි. වං ලූං එදෙස බලන්ම එහි යටින් ලියා තිබුන අකුරු කියවීමට ආසාවක්ද ඔහුතුල හට ගත්තේය. ඔහු තමාලඟ හුන් මිනිසා දෙසට හැරී ''මට මේකෙ තේරුම කියල දෙන්න තරමට ඔබ අකුරු දන්නවාද''යි ඇසුවේය.

''නිශ්ශබ්දව ඔය තරුණ ගුරුවරයා කියාදෙන දේට ඇහුම් කන් දෙන්න. එයා සේරම කියාදේවි''යයි ඔහු කීවේය.

ඉක්බිති වං ලූං ඒ ගුරුවරයාගේ හඬට සාවධානව සවන් දුන්නේය. ඒ කථාවෙන් ඔහුට අසන්ට ලැබුනේ මින් පෙර නො ඇසූ විරූ දෙයකි.

''ඔය මළමිනිහ අනිකෙක් නොව උඹලාමයි. මැරුණයින් පසුත් පිහියෙන් අනින - මළ බව නොතේරෙණ මිනීමරුව තමයි පොහොසත් ධනපතිය. උන් උඹල මළහමත් පිහියෙන් අනිනව. උඹල දුප්පත් වෙලා පිඩිනව ඉන්නෙ පොහොසතුන් උඹලගෙ සැම දෙයක්ම සූරා කන නිසා'' යයි ඒ තරුණයා උස් හඬින් කීවේය.

තමා දුප්පත් බව නම් වං ලූං හොඳහැටි දනියි. එහෙත් ඔහු මෙතෙක් ඔහු ඒ ගැන දෙස් නැගුවේ සුදුසු කාලයට වැස්ස නොදුන් අහසටයි. නොකඩවා වසින වැස්සටද ඔහු දෙස් කීවේය. කුඹුරෙහි වපුළ ධාන්‍යවලට - අස්වැන්නට පිඩාවක් නොවන ලෙස වැස්සත් ඉඩෝරයත් නිසිලෙස ලැබුනොත් තමා දුප්පතෙකැයි ඔහු නොසිතූ වේය. එහෙයින් නියමිත කාලයට වැසීව නොලැබීම ගැන පොහොසතුන්ට කළ හැක්කේ කුමක්දැයි දැන ගැණීමට ඔහු මේ දේශනයට ආසාවෙන් සවන් දුන්නේය. වේගයෙන් කථාකරගෙන ගිය කථිකයා තම ආසාව ගැන යමක් නොකී හෙයින් වං ලූං ධෛර්‍යවත්වී මෙසේ ඇසුවේය.

Scanned by CamScanner

''ඉතින් මහත්තයෝ, ඔය අපිට පීඩා කරණ පොහොසතුන්ට පුළුවන්ද වැහිවස්සවල මේ කුඹුරුවල වැඩ කිරීමට පහසුකම් සලස්සන්න. ඇත්තටම ඒ ගොල්ලන්ට එහෙම පුළුවන්ද?'' මෙ ඇසූ තරුණයා ඔහුදෙස අවඥා සහගතව හැරී මෙසේ උත්තර දුන්නේය.

''උඹ කොච්චර මෝඩද? උඹේ කොන්ඩෙත් දිග වල්ගයක් වගෙයි. වහින්නෙ නැතිවෙලාවට වස්සවන්න කාටවත් බැහැ. වැස්සවීමෙන් අපිට ඇති වැඩේ මොකක්ද? පොහොසතුන්ගෙ දේවලුත් අපට සමසේ බෙදගන්න පුළුවන්නම් වැස්ස නැතත් කාටවත් කරදරයක් නැහැ. හැමෝටම ඕන කරන්නෙ සල්ලි තමයි.''

ඒ කථාව ඇසුවන් අතුරෙන් මහ හඬක් ඇසුනි. ''ඔව් තවමත් ඉඩම් තියෙනවා. කෑමත් සල්ලිත් තමයි නැත්තෙ. පමණට ඉඩෝරයත් වැස්සත් නැති උනොත් බඩගින්නෙන් තමයි ඉන්න සිද්ද වෙන්නෙ''යයි සිතූ වං ලුං තරුණයා දුන් කරදසි ද සතුටින් ගෙන අතෘප්තිමත්ව ආපසු හැරී ගමන් කෙළේය. ඔහු ඒ කරදසි සතුටින් අතට ගත්තේ ඕලැංට සපත්තු අඩි සඳහා සෑහෙන තරම් කරදසි නොතිබුන බව දත් නිසාය. එබැවින් ඔහු ගෙදර ගිය විට ''මෙන්න සපත්තු අඩි හදන්න කරදසි''යයි කියමින් ඒ සියල්ල ඇයට දුන්නේය.

තමා සන්ධ්‍යා කාලයේ කථාබස් කළ පැල්පත් වල වැසි මිනිසුන් අතුරින් බොහෝ දෙනෙක් ඒ තරුණයාගේ කථාවට ආසාවෙන් කන්දුන්හ. ඔවුන් එසේ කන්දුන්නේ තාප්පයට එහා පැත්තෙහි ධනවතෙකු වෙසෙන බව දත් හෙයිනි.

ඔවුන්ගේ පැල්පත්වලටත් ඒ ධනවතාගේ ගෙයටත් අතර වූ මේ ගඩොල් පවුර ඔවුන්ට සුළු දෙයකි. ඔවුන් බඩුබාහිරාදිය කරපිට තබාගෙන යාමට පාවිච්චි කරණ වර්ගයේ ලොකු පොල්ල කින් දෙන පහර කීපයකින් මේ තාප්පය ලෙහෙසියෙන්ම බිඳහෙලිය හැකි වූවකි.

වසන්තයේ අසන්තෝෂී බවට තවත් අසන්තුෂ්ට බවෙක් එක් වුනි. ඒ අළුත් අසතුටු බවට හේතුවූනේ අර තරුණයාත් එවැනි තවත් අයත් මේ පැල්පත් වාසීන්ගේ සිත්තුළ පහළ කළ අළුත් හැඟුමය. තමන්ට අයිති නැති අනුන්ගේ දෙය අයුතු ලෙස අයත් කර ගැනීමට

Scanned by CamScanner

කළ උසිගැන්වීමය. මේ පිළිබඳව දිනපතා සිතන විට ද සන්ධ්‍යාවේ එක්රැස්ව සාකච්ඡා කරණ විට ද දිනපතා තමන්ගේ ව්‍යායාමයෙන් වැඩිපුර ආදයමක් නොලැබෙන විට ද ඒ හැඟුම, ගඟක ප්‍රවාහයක් මෙන් තරුණයන්ගේ හදතුළ පහළවන්නට වූයේ අමානුෂික ආසාවන් ගෙන් ද ආවිෂ්ටවීමෙනි.

වං ලූං මේ සියල්ලක්ම දුටුවේය. මේ සියළු කථාවකටම සවන් දුන්නේය. අපූරු නොසන්සුන් කමකින් යුක්තව ඔවුන්ගේ කෝපය ද තේරුම් ගත්තේය. එහෙත් ඔහු ආසා කෙළේ අන් කිසිවකට නොව ඔහුගේ ඉඩම් වලට ය.

සෑම කෙනෙකුටම දිනපතා අළුත් අළුත් දෙයක් හමුවන මේ නගරයෙහිදී වං ලූං දිනක් තමාට ද තේරුම් ගත නොහැකි අළුත් දෙයක් දුටුවේය. ඔහු කුලියක් සොයමින් රික්ෂෝ රථයද වීථියක් දිගේ ඇදගෙන යමින් සිටිත්දී ආයුධ සන්නද්ධ යුද්ධ භටයන් සමූහයක් විසින් මිනිසෙක් අල්වාගනු ලැබුවේය. ඒ අහිංසක මිනිසා ඔවුන්ට විරෝධය පළ කළ විට භටයෝ සිය ආයුධ ඔහු ඉදිරියෙහි අමෝරාගත්හ. මෙසේ වං ලූං විස්මයෙන් බලා සිටිද්දී භටයෝ තව තවත් මිනිසුන් අල්වාගත්හ. මේ අල්වාගන්න ලද සියළු දෙනාම ස්වශක්තියෙන් වැඩකළ මිනිසුන් බව ඔහුට වැට හුනි. ඔහු බලා සිටියදීම තවත් එකෙක් අල්වාගනු ලැබුවේය. අල්වා ගනු ලැබූ ඒ මිනිසා වං ලූං ගේ පැල්පතට යාව තාප්පය අද්දරම තිබුන ඊලඟ පැල්පතේ මිනිසා ය.

කැමැත්තෙන් හෝ නොකමැත්තෙන් අල්වාගනු ලබන ඒ මිනිසුන් දෙස ඔහු විස්මයෙන් බලාගෙන සිටියේ එසේ අල්වා ගැනීමේ හේතුව නොදත් නිසාය. මීලඟට තමා ද අල්වා ගනිතියි බියපත්වූ වං ලූං රික්ෂෝරථය හරස් පටුමාවතකට තල්ලුකොට දමා උණුවතුර විකුණන කඩයකට ගොඩවැදී සොල්දදුවන් යනතුරු කඩයේ කල්දේරමට පිටුපසින් ගුලිවී සැඟවුනේය. ඉන්පසු ඔහු උණුවතුර කඩය අයිතිකරුගෙන් තමා දුටුදෙයෙහි අදහස විමසුවේය.

තමාගේ ව්‍යාපාරයට අයත් මේ කල්දේරම තුළින් නිතර නික්මෙන වාෂ්පයට වියලීගිය මහල්ලෙකු වූ ඒ කඩකාරයා නොසැලකිල්ලෙන් මෙන් මෙසේ උත්තර දුන්නේය.

''කොහේහරි තව යුද්ධයක් ඇති. අනේ කවුද දන්නෙ මේ නිතර එහා මෙහා කෙරෙන කලකෝලාහල ගැන. මම කොලුව

කාලෙත් එහේ මෙහේ කෙරෙන කලකෝලාහල ඔහොම මයි. මම මැරුණට පස්සෙත් ඒව එහෙමම වේවි. මම නම් ඒක හොඳටම දන්නව.''

''හොඳයි ඒගොල්ලො මොකද මගේ අසල්වැසියව අල්ල ගත්තෙ? එයත් මම වගේම අහිංසකයෙක්. එයා මේ යුද්ධය ගැන අහලවත් නැතුව ඇතැ''යි වං ලුං භීතියෙන් පැවසුවේය.

මහල්ලා කල්දේරම් පියනින් ශබ්දයක් නංවමින් යලිත් පිළිතුරු දුන්නේය.

''ඒ හේවායො කොහේහරි යුද්ධයකට යනව. උන්ගෙ රෙදි-පිළි තුවක්කු වෙඩි බෙහෙත් ආදිය ගෙනියන්න උන්ට මිනිස්සු ඕන. ඉතින් ඔවුන් උඹවගේ මිනිසුන් බලෙන් අල්ලගන්නව. ඇත්තටම උඹ මේ කොයි පලාතෙ ඉඳලද? ඕක මේ නගරයට අළුත් දෙයක් නොවෙයි.''

''ඉතින් ඉතින් ඊට පස්සෙ මොකද වෙන්නෙ ඒගොල්ලන්ට? පඩියකුත් හම්බ වෙනවද? ඒගොල්ලන්ට ඇති ප්‍රයෝජනය මොකක්ද?'' යයි වං ලුං මහත් කලබලයෙන් යුක්තව ඇසුවේය.

ඉතාම වයස්ගතවුන–තමාගේ කල්දේරමට හැර වෙන කිසිවකට ආසා නොකළ ඒ කඩකාරයා සුපුරුදු නොසැලකිලිමත් ගතියෙන් පිළිතුරු දුන්නේය.

''පඩියක් නම් නැහැ. දවසකට පාන්පෙති දෙකක් විතර ලැබෙනව. ලිඳෙන් වතුර බොතහැකි. හේවායන්ට වුවමනා නැනට ලහාවුනහම කකුල්වල පන තියෙනව නම් ආපහු ගමට එන්නත් පුළුවන්.''

''අයියෝ! ඒ මිනිහගෙ පවුල''යයි වං ලුං භීතියෙන් කීවේය.

''උන් මොනවටද ඒව ගණන් ගන්නෙ?'' යයි මහල්ලා අවඥ වෙන් පවසා වතුර උණු වෙනවාදැයි බැලීමට ඔහු ලඟම තිබුන කල්දේරමෙහි පියන උස්සා බැලුවේය. එවිට කල්දේරමෙන් නැගුන වාෂ්ප පටලයෙන් ඔහු වැසී ගත්තේය, කල්දේරමට එබුණු ඔහුගේ හැකුලුන මුහුණ නොපෙනී ගියේය.

කෙසේ වෙතත් මේ මහල්ලා කරුණාවන්තයෙකි. වාෂ්ප පටලයෙන් ඉවත් වූ ඔහුට සැබවී සිටි වං ලුං ට නොපෙනුන දෙයක් පෙනුනේය. සැම ශක්තිමත් මිනිසෙකුම පැනගිය වීථියෙහි මිනිසුන්

Scanned by CamScanner

සොයමින් නැවත වරක් පැමිණෙන ඒ යුද සෙබළුන් දුටු මහල්ලා "තව ටිකක් පාත් වෙයන්! ඔවුන් ආයිත් එනවා!"යි වං ලුං ට කීය.

වං ලුං තව තවත් කල්දේරම පසුපසෙහි නැඹුරු වුනේය. හේවායෝ වීථියෙහි ශබ්ද නගමින් බටහිර දෙසට ගමන් කළහ. ඔවුන්ගේ හම් සපත්තුවල ශබ්දය නැතිව ගියාට පසු එළියට ඇදුන වං ලුං තම රික්ෂෝව ද ඇදගෙන පැල්පත වෙත දිව්වේය.

තමන් සොයාගත් පලා ටිකත් උයාගැන්ම සඳහා පාරේ සිට එකෙණෙහිම පැල්පතට පැමිණි ඕලෑංට ඔහු සිදුවූ ත්‍රාසජනක දෙයත් එයින් ගැළවුන අයුරුත් විස්තර කෙළේ හතිදමමින් ද භග්නස්වරයෙන් ද යුක්තවය. ඒ පුවත සිය බිරියට විස්තර කරද්දී ඔහු තුළ අළුත් බියක් හට ගැනුනි. මේ බිය තව දුරටත් තහවුරු වුනේ "තමාටත් යුද බිමකට යන්නට සිදුවේද?"

"එසේවුවහොත් තම පවුලටත් පියාටත් බඩගින්නෙන් මැරෙන්නට සිදුවෙනවා නොවේද?."

"තමන්ට ද මැරෙන්නට සිදුවන්නේ තමන්ගේම ලේ ගලාගිය රණ බිමක නොවේද?"

"තමන්ගේ ඉඩම් නැවත වරක් දක්නට නොලැබේවිද?" යන ප්‍රශ්න වලිනි.

මේ ප්‍රශ්න සිතින් නග නගා ඔහු බියෙන් බියෙන් ඕලෑං දෙස බැලුවේය.

"දැන්නම් මට හිතෙනව අපේ කුඩා දරුවව විකුණල උතුරට– අපේ ඉඩම්වලට යන්න."

එහෙත් ඇය එයට සවන් දී මඳක් කල්පනාකර සුපුරුදු නොවෙනස් ස්වරයෙන් මෙසේ කීවාය.

"ටිකක් දවස් බලමු. තව තව පුදුම කථා අහන්න තියෙනව."

කෙසේ වෙතත් වං ලුං ඉන්පසු නම් සිය පැල්පතින් දවල් කාලයෙහි බැහැරට නොගියේය. ඔහු වැඩිමල් පුතා අත කුලියට ගත් රික්ෂෝරථය අයිතිකරු වෙත යැව්වේය.

එතැන් පටන් ඔහු රාත්‍රි කාලයෙහි කළහැකි රක්ෂාවක් සොයාගත්තේය. රාත්‍රිය එළඹෙනතුරු බලා සිටි මේ මිනිසා ප්‍රසිද්ධ වෙළඳ පොලට ගොස් විසාල පෙට්ටි පැටවූ කරෙත්ත අදිමින් තමා කලින් සැපයූ මුදලින් අඩක් දිනපතා ලබාගත්තේය. පෙට්ටි පැටවූ සෑම කරත්තයක්ම වෙහෙසෙන් කොඳුරන මිනිසුන් දෙළොස්

Scanned by CamScanner

දෙනෙකු විසින් අදින ලදී. ඒ පෙට්ටි පුරවා තිබුනේ කපු සේද හා සුවඳ දුම්කොළ ආදියෙනි. එහි සුගන්ධය කොතරම් ද කිවහොත් එය ලී පෙට්ටි තුලින් ද ඉවතට ආවේය. එසේම තෙල් වර්ග හා වයින් වර්ග පුරවන ලද විශාල භාජන ද ඒ කරෙත්තවල පටවා තිබුනි.

රාත්‍රි සේවයෙහි යෙදුන කම්කරුවෝ ස්වකීය අර්ධනග්න සරීරවලින් දහඩිය රුරා වැටෙද්දී–වැසි වැටීමෙන් මඩගොහොරුවුන අඳුරු වීථිවල පාවහන් රහිත පා ලිස්ස ලිස්සා ඒ බර කරෙත්ත අදිමින් වෙහෙසුනාහ. සැමවිටම ඔවුනට ඉදිරියෙන් මඟ පෙන්වීම සඳහා දැල්වෙන පන්දමක් රැගත් කුඩා දරුවෙක් දිවවේය. ඒ පන්දම් එළියෙන් විඩාපත් මිනිසුන්ගේ මුහුණු ද සිරුරු ද ගොහොරු බවට පත්වුන වීථි ද එකසේ දිලිසුනි. එලිවෙන්නට පළමු වං ලුං හති දමමින් පැල්පතට පැමිණියේ නිදගන්නට ද කෑම කන්නට ද බැරි තරම් වෙහෙසකිනි.

දීප්තිමත් දිවාකාලයෙහි සොල්දුදුවන් වීථිවල මිනිසුන් සොයා ඇවිදින විට ඔහු පැල්පතේ එහාම කොණටවී ආරක්ෂාසහිතව නිදගත්තේය. ඕලැං සිය සැමියා ආරක්ෂාකිරීම සඳහා තමා එකතුකරගත් පිදුරු ගොඩගසා ආවරණයක්ද තැනුවාය.

''මේ යුද්ධය මොනවියියේ එකක්ද? එහි සටන් කළේ කවුද? කා සමගද?'' යන ආදී කිසිවක් වං ලුං නොදත්තේය.

වසන්තය ගතවී යත්ම නගරය යුද බියෙන් නොසන්සුන් බවට පත් විය. සැම දිනකම පාහේ නගරයේ ධනවත්තු අශ්වයන් යෙදූ කරෙත්ත වලින් ඔවුන්ගේ ඇඳුම්, සේද යෙදූ මෙට්ට, ඔවුන්ගේ රූමත් ස්ත්‍රීන්, ඔවුන්ගේ ආභරණ ආදිය ගංගාතීරයට ගෙනගොස් වෙන වෙන තැන්වලට ගෙනගියහ. සමහරෙක් ගිනිකරෙත්තය පැමිණෙන ස්ථානයට ද ගියහ. එහෙත් වං ලුං කිසිදිනක දහවල් කාලයෙහි වීථිවල ඇවිදින්නට නොගියේය. ඔහුගේ දරුවෝ දිලිසෙන ඇසින් යුතුව මෙසේ කෑගසමින් පැමිණියහ.

''අපි දැක්ක මේ–මේ වගේ මිනිස්සු. දේවාලෙ ඉන්න දෙවියො තරම් මහත ලොකු මිනිහෙක් දැක්ක. එයාගෙ ඇඟ සේරම වහල තිබුනෙ සිල්ක්වලින්. එයාගෙ ඇඟිල්ලෙ තිබුන මුද්දෙ අල්ලල තිබුන නිල්පාට ගල හරියට වීදුරු කෑල්ලක් වගෙයි. එයාගෙ හමත් හරි ලස්සණයි.''

Scanned by CamScanner

ඔවුනතර සිටි වැඩිමහළු දරුවා මෙසේ කෑගැසුවේය.

"අපි දැක්ක පුදුම පෙට්ටිවගයක්. මම ඇහැව්ව ඒව ඇතුළෙ තියෙන්නෙ මොනවද කියල. එක්කෙනෙක් කිව්ව 'මේවයි ඇතුළෙ තියෙන්නෙ රිදී රත්තරන්. ඒ උනාට පොහොසත් අයට තමන්ගෙ ගෙවල තියෙන ඔක්කොම ගෙනියන්න බැරි නිසා ටික දවසකින් ඒවත් අයිතිවෙන්නෙ අපට තමයි' කියල. ඉතින් තාත්තෙ මොකක්ද එයාගෙ ඒ කතාවෙ තේරුම?"

"කාටද දරුව ඔය කම්මැලි නගර වැසියො කියන ඒව තේරෙන්නෙ?" යයි වං ලුං කොටින් උත්තර දුන්නේය. දරුවා යළිත් මෙසේ කීය. "ඒව අපේ නම් මම දැම්මම ගිහිල්ල ඒව ගන්න හිතයි. මම කැමතියි කේක් කෑල්ලක් කන්න. මම කවදක්කත් කාල නැහැ තල දමාපු රස කේක් කෑල්ලක්."

මෙවිට මහල්ලා නින්දෙන් පිබිද තමාටම කියා ගන්නාක්මෙන් කථාකරන්නට පටන් ගත්තේ ය.

"අපට සරුසාර කාලවල ඒවගේ කැවිලි තිබුන. අපි ඒ දවස් වල තල ඇට වෙන් කරල විකුණන්න ඉස්සර කැවිලි හදන්න ටිකක් ඉතුරු කර ගත්ත."

මහල්ලාගේ මේ කථාවෙන් වං ලුං ට සිහිවූයේ අළුත් අවුරුදු උත්සව කාලයක ඕ ලෑං විසින් සාදන ලද කැවිලි ගැනය– ඇය විසින් හාල් පිටි සීනි හා තෙල් යොදා තැනූ කැවිලි වර්ග ගැනය. මේ සිතිවිලි අනුව ඔහුගේ කටට කෙල ද ඉනුවේ ය. පසුගිය කාලය පිළිබඳ මහත් ආසාවක් ඔහු තුළ හටගත්තේ ය.

"අපි ආපහු ඉඩම්වලට ගියා නම්..." යයි ඔහු තොල් මතුළේය. එවිට එක වරට ම ඔහුට වැටහුනේ තව එක දිනක් වත් මේ කාල කන්නි පැලේ වසන්නට බැරි බව ය. පිදුරු ගොඩට පිටුපසින් තමාට දිගා වීමට ඉඩකඩක් වත් එහි නොතිබුනේ ය. එමෙන් ම තව එක් රැයක් වත් වෙහෙස වන්නට තරම් ධෛර්‍යයක් ද ඔහු තුළ නො වීය. බරකරත්තයෙහි බැඳි කඹය තම සිරුරෙහි බැඳ ගෙන වීථියෙහි ගල්වල හැපි හැපී අදින විට ඒ කඹයට ඔහුගේ සිරුර තුවාල වී ද තිබුනි. එහෙයින් වීථියෙහි සෑම ගලක් ම ඔහුට සතු රෙකු මෙන් විය. බොහෝවිට මේ වීථියෙහි ගලක් මගහැර යාමට සෑම කපල්ලක් ම ඔහු දැන සිටියේ එයින් තම ශක්තියෙන් ස්වල්ප යක් වත් ඉතිරිවන හෙයිනි. ඇතැම් කළුවර රැයක වැසි වැසීමෙන්

වීථී තවත් තෙත ගතියෙන් යුක්ත වූන විට ඔහුගේ මුළු ක්‍රොධයම යොමුවුනේ මේ ගල් දෙස ය. එසේ මේ ගල් උඩින් මිනිසෙකුට ඉසිලිය නොහැකි තරම් බර පැට වූ කරත්තය ඇදගෙන යනවිට ඔහුට වැටහුනේ මේ රියෙහි රෝදවල ඒ ගල් ඇමිනී එල්ලෙන්නාක් මෙන් ය.

''ආ! ලස්සන ඉඩම්'' යයි ඔහු නිතැතින් කෑ ගසා හඩන්නට පටන් ගත්තේ ය. දරුවෝ එයින් බිය වූහ. මහල්ලා තම පුත්‍රයා දෙස කැලඹීමෙන් යුතු ව බැලුවේ ය. තම මව හඬනු දකින දරුවෙකුගේ මෙන් ඔහුගේ මුහුණ ද තුනී රැවුළ තුළින් එහා මෙහා ඇඹරී ගියේය.

ඕලෑං නොවෙනස් චාම් සවරයෙන් මෙසේ කීවාය.

''තව ටිකක් ඉවසමු. අපිට මොකුත් දකින්න පුළුවන්. දැන් හැම තැනම ඔන්න කථාවෙනව.''

මෙතෙක් කෙරුණ සියල්ලන්ගේ ම කථාබස් වලට වඩා පැල් පතෙහි සැඟවී හුන් වං ලුං ට ඇසුනේ පැයක් පාසා ඒ ස්ථානය පසු කර ගෙන ගිය අඩි ශබ්දයි– යුද්ධයට ගමන් කළ හටයන්ගේ අඩි වල ශබ්දයි. ඒ ගමන් කළ යුද සෙබළුන්ටත් තමාටත් අතර තිබුන පැදුර මඳක් උස්සා එහි විවරයට ඇස තැබුවහොත් ඔහුට මේ ගමන් කරණ අය දැක ගත හැකි වීය– එසේම ඔහු ඔවුන් දැක්කේ ය. හම් සපත්තු දමාගත් රෙදි පටිවලින් වැසූ කකුල් යුවල යුවල බැගින් එකක් පසු පස එකක් ගමන් කරණ අයුරු ඔහුට පෙනුනේ ය. මෙසේ සිය ගණන් දහස් ගණන් සෙබල මුළු ඒ වීථියෙහි නොකඩවා ගමන් කළහ.

රාත්‍රියෙහි තමා වැඩෙහි යෙදී සිටිය දී තමා ඉදිරියෙන් ඇති පන්දම පසුකර ගෙන යන ඔවුන්ගේ මුහුණු අඳුර මැදින් දිලිසෙන අන්දම ඔහු දැක්කේ ය. එහෙත් ඔහු මේ අය ගැන කිසිත් අසන්නට බිය වීය. ඔහු තම බර අමාරුවෙන් අදිමින් පසුව තම බත් කොටස වහා කා දමමින් දහවල් කාලයේ පැල්පතෙහි පිදුරු ගොඩේ පසු පසට වී කඩින් කඩ නිදගත්තේ ය. මේ දිනවල කිසිවෙක් කිසිවෙකු හා කථා නොකළහ. සියළුදෙනාම තම තමන්ගේ කටයුතු වහා නිමකොට පිටත නොගොස් දෙරවල් වසා ගත්තේ මුළු නගරයම තද බියකින් ඇලලී ගිය හෙයිනි.

පැල්පත් අවට ද වෙනද සන්ධ්‍යාලෝකයේ කෙරෙන කථාබස් ද අසන්නට නොලැබුනි. වෙළඳ පොළෙහි නොයෙක් කෑම වර්ග

Scanned by CamScanner

පුරවා තිබුන මැසි ද හිස්වුනි. එහි සෑම සාප්පුවක් ම සුරක්ෂිත ලෙස වසා තිබුනේ ය. මධ්‍යාහ්නයේ වුව ද නගරය හරහා යන්නෙකුට හැඟුනේ මුළු නගරය නිදිගත් ස්වභාවයකි.

සතුරා එන බව සෑම තැන ම කොඳුරා කියනු අසන්නට ලැබුනේ ය. යමක් කමක් ඇති සෑම කෙනෙක් ම බියට පත් වූහ. එහෙත් වං ලූං ඇතුළු මේ පැල්පත් වැසියෝ බිය නොවූහ. එක් අතකින් ඔව්හු "මේ සතුරා කව්ද?" යන වග නොදත්හ. බිය නොවන්නට තවත් හේතුවක් නම් රැක ගත යුතු වස්තුවක්- ධනයක්- දේපලක් ඔවුන් සතුව නොතිබීමයි. තම ජීවිතය නැති වුවත් ඔවුන්ට එය එතරම් පාඩුවක් නො වීය. දැන් ලබා තිබෙන තත්වයට වඩා අන්ත තත්වයක් තවත් නොලැබිය හැකි බැවින් ඔව්හු සතුරාගේ පැමිණීම ගැන කලබල නොවූහ. සියළු දෙනාම තම තමන්ට අහිමත පරිදි කටයුතු කළහ. කිසිවෙක් කිසිවෙකු සමග ප්‍රසිද්ධියේ කථා නොකළහ.

ලොකු වෙළඳ පලවල කළමනාකරුවෝ ගංගා තීරයේ සිට පෙට්ටි ගෙන ආ කම්කරුවන්ට නැවතත් එන්නට වුවමනා නැති බව දැනුම් දුන්හ. ඔවුන් එසේ බඩු ගෙන්වීම නතර කෙළේ සාප්පු වලින් බඩු ගන්නට ජනයා නො පැමිණෙන නිසා ය. නගරයෙහි කළයුතු රැකී රක්ෂාවක් නොමැති නිසා වං ලූං කම්මැලිව රෑ දවල පැලටම වී කාලය ගත කෙළේය. පළමුවෙන් ඔහු මේ තත්වය ගැන සතුටු වුනේ ය. එහෙත් තම සිරුරට අවශ්‍ය ව්‍යායාමය නොලැබුන නිසා ඔහු මේ දිනවල මළාක් මෙන් නිදගත්තේ ය. වැඩ නොකළ නිසා ආදයමක් ද ඔවුනට නොවීය. ටික දිනකින් ඔවුන් සතුව තිබුන පැන්ස කීපය ද වියදම්ව ගිය නිසා වං ලූං බලාපොරොත්තු රහිතව රැකියාවක් සොයමින් එහා මෙහා ඇවිද්දේ ය.

එළඹ සිටි අභාග්‍යය මදිවාට මෙන් දූප්පතුන් සඳහා තිබුන ප්‍රසිද්ධ බොජුන් හල් වල ද දොරටු වසා දමන ලදී. ඒ බොජුන් හල් වල ආහාර සැපයුවන් ගෙවලට වී දොරටු වසාගෙන සිටී හෙයින් ඒ දූප්පතුන්ට රක්ෂාවක් මෙන් ම කෑමක් ද නොවී ය. ජන ශූන්‍යව ගිය ඒ වීථිවල හිඟමන් ඉල්ලන්නට ද කිසිවෙක් ගමන් නොකෙළේ ය. එහෙයින් වං ලූං තම දූරිය ද අතට ගෙන ඇය සමග පැල් පතට වී හිදගෙන සිටියේ ය. ඔහු ඇය දෙස බලා ,මෘදු ලෙස මෙසේ ද කීවේ ය.

Scanned by CamScanner

''පුංචි මෝඩියේ, උඹ ආසා නැද්ද පොහොසත් ගෙදරකට යන්න. එහේ හොඳට කන්න බොන්නත් තියෙනව. උඹේ ඇඟට සැහෙන රෙදිත් ලැබේවි.''

එවිට ඇය සිනාසුණාය. එහෙත් ඔහු කී දෙය ඇයට නොවැට හුනේ ය. ඇය ඔහුගේ තියුණු දෙනෙත් ස්පර්ශ කිරීමට ඇයගේ කුඩා අත් එසෙව්වා ය. ඔහුට එය ඉවසුම් දෙන්නක් නොවූ හෙයින් සිය බිරියට කථා කෙළේය. කථාකොට ඇගෙන් මෙසේ ඇසුවේ ය.

''ඒ බාන්! අර පොහොසත් ගෙදරදි උඹට තැළුව ද?''

''හැමදම වගේ මට තැළුම් කන්න සිද්ද උනා ''යයි ඇය පිළිතුරු දුන්නේ කනස්සලු ගතියෙන් ද යුතුව ය.

''හොඳයි උඹට තැළුවෙ රෙදි පටියකින් ද? උණ පතුරකින් ද? නැත්තං කඹයකින් ද?''

''බූරුවන් බඳින්න පාවිච්චි කරපු හම් පටියකින් තමයි මට තැළුවෙ. ඒක නිතරම එල්ලල තිබුනෙ කුස්සියෙ බිත්තියෙ.''

තමා සිතූ දෙය ඇය තේරුම් ගත් බව ඔහුට වැටහුනි. එහෙයින් අන්තිම බලාපොරොත්තුව ද අතහැර මෙසේ ඇසුවේ ය.

''දූන් උනත් අපේ දරුව ලස්සන කෙල්ලක්! හොඳයි ඉතින් කියාපන් ලස්සන කෙල්ලන්ටත් තළනව ද කියල?''

''ඔව්! එක්කො තැළුම් කන්න සිද්දවෙනව එහෙම නැත්තං ඒ ගෙදර ඉන්න තරුණ රදළ ගොල්ලන්ගෙ කරදර වලට ගොදුරු වෙනව. ඉතින් තරුණ රදළ ගොල්ලන්ගෙන් බේරිල ගියහම ගොදුරු වෙන්නෙ ඒ ගෙදර ඉන්න තරුණ පිරිමි වැඩකාරයින්ට. ඉතින් කෙල්ලක් ලස්සන නම් ඒ රදළ තරුණයො ඇගේ ළදරු වයසවත් ගතවෙන්න ඉඩ දෙන්නෙ නැහැ''යි ඇය නොසැලකිල්ලෙන් පිළිතුරු දුන්නේ මේ දුගී ජීවිතයත් පොහොසත් ගෙදරක දසියක් වීම ත් එක සේ සිතමිනි.

ඕලැංගේ ඒ බසට වං ලුං කෙඳිරි ගෑවේ ය. ඔහු දරුවා තුරුළු කොට ගෙන නැවත නැවතත් ඇයට මෘදු ලෙස මෙසේ කීවේය.

අනේ දුප්පත් පුංචි මෝඩී! අනේ දුප්පත් පුංචි මෝඩී! උඹ රැක ගන්න වෙන කිසිම විදියක් නැහැ! අනේ මොනව කරන්න ද?''

මෙසේ දුකින් හඬ හඬා වං ලුං වාඩිවී සිටින විට හදිස්සියෙන් ම අහස ගොරවන්නාක් වැනි ශබ්දයක් ඇසුනේ ය. එහි සියල්ලෝ ම

Scanned by CamScanner

කිසිත් කල්පනා නොකර ම බිම පතිත වී තම මුහුණු සඟවා ගත්හ. තමන් තලා දමන්නට ගැසූ පහරක් මෙන්ය මේ ශබ්දය ඔවුන්ට ඇසුනේ. මේ භයානක ශබ්දයෙන් තමන්ට කුමන විපතක් සිදුවේදෝයි නොදත් වං ලූං සිය අතින් දූරියගේ මුහුණ වසා ගත්තේ ය. මහල්ලා සිය මුව වං ලූං ගේ කණට තබා "මගේ උපන් ආත්මෙකට මෙහෙම හඬක් නම් ඇසුවෙ නැතැ"යි කීවේය. පිරිමි දරුවන් දෙදෙනා භීතියෙන් බෙරිහන් දෙන්නට පටන් ගත්හ.

සැනෙකින් නිහඬ බව පැතිරෙත් ම ඕලෑං හිස ඔසවා "මම අහපු දෙය තමයි ඔය පටන් අරගෙන තියෙන්නෙ. සතුරො නගරයෙ දෙරටු කඩා ගෙන ඇතුල් වෙලා"යයි කීවාය. එක් අයෙකු වත් ඇයට පිළිතුරු දෙන්නට පෙර යලිත් නගරය දෙසින් මහ හඬක් ඇසෙන්නට වුනි. එය මිනිසුන්ගේ ඝෝෂාවකි. මේ ඝෝෂාව නගරයේ වීථියක් පාසා පැතිරෙන්නට වූනේ කුණාටුවක් මෙන් ක්‍රමයෙන් නැග නැග ඒමෙනි. ඒ ඝෝෂාව මහ හඬින් ඇසෙත් ම වං ලූං පැල තුළ ඍජුව නැගී සිටියේ ය. ඔහුගේ මස් තුළ ද නොපුරුදු බියක් මෙන් එය පැන නැගුණි. ඒ බිය තම රෝමයන් හිමූලයන්ට ද වැදෙනු ඔහුට දැනුනේ රෝමෝද්ගමනය වීමෙනි. සැම දෙනාම ඍජුව නැගී සිට තමන් නොදත් දෙයක් දැනගන්නට මෙන් එකිනෙකාගේ මුහුණු දෙස බලන්නට වූහ. නමුත් එහි ඇතිවුනේ මිනිසුන් රැස්වෙන හඬත් ඔවුන් කෑගසන ශබ්දයත් පමණකි.

ගත වූයේ මොහොතකි. තාප්පයට උඩින් නැගී ආවේ සර තේරු මත හඬ දෙවමින්– කොඳුරමින් නොකැමැත්තෙන් මෙන් විවෘත වුන දෙරක හඬකි. මේ අතර වරක් උණ පතුරු වලින් සෑදූ දුම් කෝවයක් උරමින් වං ලූං සමග සාකච්ඡා කළ මිනිසා හදිසියෙන් ම පැල්පතේ විවරයෙන් හිස එළියට දමා–

"හා! උඹ තවම මෙතැන ඉඳ ගෙන ඉන්නව ද? දැන් වෙලාව හරි! ධනවතුන්ගෙ දෙරටු අපිට ඇරිලා" යයි කෑගැසුවේ ය. කිසියම් ඉන්ද්‍ර ජාලයකින් මෙන් ඕලෑං එසේ කථාකළ මිනිහාගේ අතයටින් රිංගා අතුරුදන් වූවා ය.

එකෙනෙහිම විස්මයට පත් වං ලූං හෙමින් නැගිට දූරිය බිම තබා එළියට ගියේ ය.

ධනවතාගේ ගෙයි නිල්වත් යකඩ දෙරටුව ඉදිරිපිට කොලහල කරණ මිනිසුන් සමූහයක් ඉදිරියට තෙරපෙනු ඔහුට පෙනුනේය.

Scanned by CamScanner

මෙයට පෙර ඇසුනු භයංකර ශබ්දය තරම් රෞද්‍ර හඩක් ඒ මිනිස් සමූහයෙන් ද නික්මුනේය. සෑම ධනවතෙකුගේ ගෙදර දොරටුවකම හාමත් වූන– සිර කරනු ලැබූවන් මෙන් සිටි එහෙත්– දැන් තමන්ට කැමති පරිදි කටයුතු කරන්නට අවසර ලත් ගැහැණු පිරිමි රැළක් මෙසේ කෑගසමින් තෙරපෙන බව ඔහුට දැනුනේ ය.

ඒ ධනපති මැදුරෙහි විසාල දොරටු විවෘත වී තිබුන හෙයින් මිනිස්සු එදෙසට ගමන් කරමින් තද බද වූහ. ඔවුහු තදින් එකට හිරවී අඩියක් අඩියක් පාසා එකට හිරවෙමින්– සිරුරක් බැගින් එක ගොඩේ තෙරපුන හෙයින් එක ගොඩක් මෙන් තල්ලු වූහ. පසුපසින් ඇවිත් තද බද වුන මිනිස්සුන් වං ලුං ද මේ මිනිස් ගොඩට තල්ලු කළ බැවින් කැමැත්තක් ඇතිව හෝ නැතිව වුව ද ඔහු ද ඉදිරියට ගමන් කරණ ඒ මිනිස් සමූහයට තල්ලු වුනේ ය– එකතු වුනේ ය. මෙතෙක් සිදුවූ සියල්ලෙන් ඔහු විස්මයට පත් ව සිටි නිසා "ඊලඟට තමා කළයුත්තේ කුමක් ද?" යන්න වං ලුං ට වටහා ගත හැකි නොවී ය.

කෙසේ නමුත් ඔහු ඒ විසාල දොරටුවේ එළිපත උඩින් තල්ලුවී ගියේ ය. ඔහු එසේ තල්ලු වුනේ ද මිනිසුන්ගේ තද බදය නිසා ඔහුගේ පාද පොළොවෙහි නොගැවෙමිනි. මේ මිනිස් සමූහයෙන් නික්මුන හඩ සම කළ හැකි වූයේ කුපිත වූ වල් සතුන්ගේ ගෙරවුම් වලට පමණකි.

මිදුලක් මිදුලක් පාසා තෙරපෙමින් – ඇතුල් මිදුල තෙක් ඔහු තල්ලු වුනේය. එහෙත් මේ ගෙදර වැසියන්ගෙන් එකෙකුවත් ඔහුට දක්නට නොලැබුනි.

මේ ස්ථානය– මේ මන්දිරය බොහෝ කලකට පෙර මියගිය– නටබුන් වී ගිය මාලිගයක් මෙන් දිස් වුනේ ය. මෙහි අවට දක්නට ලැබුනේ කල් ඇතිව පිපී පරවී ගිය මල් පොකුරු වලින් යුත් බුත් සරණ පඳුරු කීපයකුත් වසන්තයේ කොළ රහිත අතුවල පිපුන රන් වන් මලින් යුක්ත වූන ගස් කීපයකුත් පමණකි. එහෙත් මෙහි කාමරවල මේස මත කෑම තබා තිබුනි. කුස්සියෙහි ද ගිනි ඇවිලෙමින් තිබුනේ ය.

මේ මැඳුර ආක්‍රමණය කළ ජනතාවෝ ධනවතුන්ගේ මැඳුරු ගැන හොඳින් දැන සිටියහ. එහෙයින් දාසි දස්සන් වාසය කළ ගෙවල් හා කුස්සිය පිහිටා තිබුන ඉදිරි පස පසු කර ගෙන ගිය ඒ

Scanned by CamScanner

මිනිස්සු ඇතුල් කාමරවලට පිවිසුනාහ. මේ කාමරවල රදළ ගැහැණුන්ගේ හා පිරිමින්ගේ අනර්ඝ සයන ද ඔවුන්ගේ රෙදිපිළි දමා තිබුන කැටයම් සහිත වර්ණවත් අල්මාරි ද කැටයම් සහිත පුටු මේස ද සිතියම් කරණ ලද බිත්ති ද තිබුනි.

ඒ මිනිස්සු මේ වටිනා වස්තු මත කඩා පැන සෑම අල්මාරියක්ම පෙට්ටියක් ම කඩා විවර කරමින් එහි තිබුන දෑ එකිනෙකාගෙන් උදුරා ගනිමින් කොලහල කරන්නට වූහ. ඇඳ ඇතිරිළි, ඇඳුම්, තිර රෙදි, පිහන් බඩු යන ආදිය අතින් අතට මාරුවී ගියේ ය. සෑම විටම එක් අතක තිබුන දෙය අනික් අතකින් උදුරා ගනු ලැබුවේය. තමා අතෙහි ඇත්තේ කුමක් දැයි බැලීමට වත් කිසිවෙක් නො නැවතුනාහ.

මේ කලබලය මධ්‍යයේ වං ලුං පමණක් කිසිවක් නොගත්තේ ය. ඔහු කිසි දිනක අනුන්ට අයත් දෙයක් සොරෙන් නොගත් කෙනෙකි. එහෙයින් ඔහුට පළමුවෙන් සිදුවුනේ මේ සමූහයා මැද එහාට මෙහාට තල්ලුවීම පමණකි. එසේ තල්ලුවීමෙන් පසු සිහි එළවා ගත් ඔහු මහත් වෑයමින් මිනිස් සමූහයේ කෙළවරට පැමිණ එහි සිට ගත්තේ ය. ජලප්‍රවාහයක කෙළවර ඇති කුඩා දිය සුලියක් මෙන් තල්ලුවීම් වලින් තරමක් දුරුවී එහි සිටියත් ''මේ දක්වා තමා සිටින්නේ කොහි ද?''යි ඔහුට දැනගත හැකි නොවීය.

ඇත්ත වසයෙන් ම ඔහු සිටියේ ධනවත් ස්ත්‍රීන් වාසය කළ ඇතුල් කාමරවල පිටුපස කොටසෙහි ය. එහි පසු පස දෙර ද විවෘතව තිබුනි. ධනවතුන් ශතවර්ෂ ගණනක සිට මෙවැනි අවස්ථාවක දී – හදිසි අවස්ථාවක දී පැන යන්නට යොදා ගෙන තිබුන මේ දෙරටුවට නම් කොට තිබුනේ ''සාමයේ දෙරටුව'' යනුවෙනි. නිසැකයෙන් ම මේ දිනයෙහි ද ඔවුන් සියළුමදෙනා මේ දෙරටුවෙන් පැන ගොස් වීථියේ එහා මෙහා සැඟවී තමන්ගේ ගෙය තුළ සිදු වන කෝලාහලයට කන් දී සිටියහ. එහෙත් ඔවුන්ගෙන් එකෙක් සිරුරෙහි මහත කම නිසාදෝ නැතහොත් පැන යන්නට නොකැමැති නිසාදෝ එහිම සැඟවී සිටියේය. මිනිසුන් සමූහය ඇතුළුව පිටවී ගිය කාමරයක දී ඒ මිනිසා වං ලුං ට හමුවුනේ ය. එසේ හමුවුනේ ද මුල්ලක සැඟවී මිනිසුන්ට නොපෙනී හුන් ඒ මිනිසා තමා දැන් තනියම යයි සිතමින් පැන යන්නට සැරසෙන විටය.

ඔහු මැදුම් වියෙහි සිටි තරබාරු මිනිහෙකි. වං ලුං ට හමු

වන්නට පෙර මේ මිනිසා රූමත් තරුණ කාන්තාවක සමග නග්නව ඇඳක දිගා වී සිටියේ ය. සිරුර වසාගෙන තිබුන සිනිඳු සේද ඇඳුමෙන් ඔහුගේ නග්න දේහය විනිවිද පෙනුනි. ඔහුගේ විශාල කහ වන් මස් කුට්ටි පපුවෙහි ද බඩෙහි ද කම්මුල් වල ද හැපී ගැවසී තිබුනේ ය. ඔහුගේ ඇස් ඌරෙකුගේ මෙන් කුඩාව ගිලී තිබුනි. වං ලුං දුටු විට ඔහු වෙව්ලමින් දරුණු පිහිය පහරක් ලැබුවෙකු මෙන් බෙරිහන් දුන්නේ ය. නිරායුධව සිටි වං ලුං මෙයින් මවිතයට පත් වුනි. ඒ නිසා ඔහුට සිනාසෙන්නට ද හැකි වුනි, එහෙත් තරබාරු ඒ මිනිසා ගඩොල් බිමෙහි දනින් වැටී හිස ඔබා ගෙන "අනේ මගේ ජීවිතය බේරපන්! අනේ මගේ ජීවිතය බේරපන් මාව මරන්න එපා! මම උඹට සල්ලි දෙන්නං ඕන තරම" යයි කෑ ගැසුවේ ය.

"සල්ලි" යන වචනය ඇසුන විට වං ලුං ගේ සිතෙහි මහත් පිරිසිදු බවක් හටගත්තේ ය. "සල්ලි! ඔව් සල්ලි! දැන් ඕන කරන්නෙ සල්ලි තමයි. දරුව මේ වාරෙත් බේරුණා! හා! ඉඩම්!" යන වචන කිසිවෙකු පවසන්නාක් මෙන් ඔහුට ඇසුනි. මෙතෙක් විශ්මිතව සිටි ඔහු රළු හඬින් මෙසේ කථා කෙළේය.

"එහෙනම් මට දීපන් සල්ලි!"

තරබාරු මිනිසා ඉකිබිඳිමින් කොඳුරමින් දණ දෙකෙහි වාරු වෙන් නැගී සිටියේ ය. එසේ නැගිට තම ඇඳුමේ සාක්කුවලට අත යවා රනින් පිරුණ අත් පිටතට ගත්තේ ය. වං ලුං තම කබායේ කෙළවර ඒ මිනිසා ඉදිරියට අල්ලා ඒ රන් කාසි ගත්තේ ය. නැවතත් වරක් අමුතු අධිපති බවක් ආරූඪ කර ගත්තාක් මෙන් නුපුරුදු හඬින් මෙසේ කෑගැසුවේ ය.

"මට තව– තව දියන්!"

යලිත් වරක් තරබාරු මිනිසාගේ අත් රන් වලින් පිරී එළියට ආවේය.

"දැන් ඉතින් තවත් ඉතුරු නැහැ. මට මොකුත් නැහැ. ඉතුරු වෙලා තියෙන්නෙ මගේ මේ කාලකන්නි ජීවිතය විතරයි" කියමින් ඒ මිනිසා කොඳුර කොඳුරා හඬන්නට පටන් ගත්තේ ය. ඔහුගේ පිරුණ දෙකම්මුලින් තෙල් බිඳු වැනි කඳුළු ධාරා රූරා වැටුනේය.

මෙසේ වෙව්ලන වැලපෙන හඬන මිනිසා දෙස බැලීමෙන් තම ජීවිතයේ කිසි දිනක හට නොගත් පිළිකුලක් වං ලුං තුළ පහළ වුනි.

Scanned by CamScanner

තමන් තුළ ඇතිවුන මේ පිළිකුලෙහි ආවේගය නිසා ඔහු මෙසේ කෑගැසුවේ ය.

"පලයන්! පලයන්!! මගේ ඇහැට නොපෙනී! නොගියොත් උඹව තරබාරු පනුවෙකු වගේ මරා දමනව."

ගොණෙකු මරන්නට තරම් වත් දැඩි හිතක් නොමැති වං ලුං මෙසේ කෑගැසූවිට ඒ මිනිහා බල්ලෙකු මෙන් කොඳුරමින් ඉවත්වී නොපෙනී ගියේ ය.

වං ලුං ඒ මිනිසාගෙන් ගත් රත්රන් සමග එහි තනි වුනේ ය. එහෙත් ඔහු එය ගණින්නට නැවතුනේ නැත. රත්රන් කාසි ළයට තුරුළු කර ගත් ඔහු විවර වූ "සාමයේ දෙරටුවෙන්" පිටවී කුඩා හරස් වීථියක් දිගේ ගොස් සිය පැල් පතට පිවිසුනේ ය. තරබාරු මිනිසාගේ සිරුරෙහි උණුසුමෙන් එතෙක් රත්ව තිබුන ඒ කාසි ඔහු ද තම ළයට තුරුළු කර ගෙන නැවත නැවතත් මෙසේ කීවේ ය.

"අපි ආපහු ඉඩම්වලට යනව! හෙට අපි ආපහු ඉඩම් වලට යනවා!"

දින කීපයක්ම ගතවී ගියේය. ''තමන් කිසි දිනක සිය ඉඩම් වලින් පිට ගොස් සිටියේ නැත'' යන තරම් හැඟුමක් මේ දිනවල වං ලුං ට ඇතිවුනි. ඇත්ත වසයෙන් ඔහු කයින් තම ඉඩම් වලින් වෙන්ව සිටියත් කිසි දිනක සිතින් නම් සිය ඉඩම් වලින් වෙන් නො වූයේය – බැහැර නො වූයේය.

ඔහු රත්රන් කාසි තුනක් වියදම් කොට දකුණෙහි තිබෙන වටිනා ඇට වර්ග මිලදී ගත්තේය. ඉරිඟු ඇට, වී හා වෙනත් ධාන්‍ය වර්ග මිලට ගත් ඔහු පොහොසත් කමින් අපරීක්ෂාකාරී වූයේ මින් පෙර කිසි දිනක ගොවිතැන් නොකළ ධාන්‍ය වර්ගවල ඇට ද ගත්තේය. මෙසේ මිලට ගත් ඇට වර්ග හා බෝග වර්ග අතර සැල්දිරි හා නෙළුම් අල ද උත්සවයන්හිදී ඌරුමස් සමග තැම්බීමට රාබු වර්ග ද සුවඳ හමන රතුවන් බෝංචි වර්ගයන් ද විය.

තම ඉඩම්වලට යන්නට පෙර ඔහු කුඹුරක් හාමින් සිටි ගොවියෙකුගෙන් ගොණෙකු මිලදී ගත්තේය. ඔහු සීසාන ගොවියෙකු දැක නැවතුන විට මහල්ලා ද ගැහැණිය ද දරුවෝ ද නැවතුනාහ. නැවතී ගමට යාමට මහත් ආසාවෙන් ගමන් කළ ඔව්හු ගොණා දෙස බැලූහ.

ගොණාගේ මසින් පිරුණු බෙල්ල නිසාම සතා ගැන ආසාවක් ඇතිකර ගත් වං ලුං, ලී වියගස අදින උගේ කරෙහි ශක්තිමත් විලාසය ද දැක කථා කරමින් ''මෙක තම කිසි වටින කමක් නැති සතෙක්. කමක් නැහැ රිදී හරි රත්තරන් හරි කීයකට උඹ මූව

Scanned by CamScanner

විකුණනව ද? මට ගොනෙකුත් නැහැ. වැඩිය සල්ලිත් නැහැ. නමුත් ඔනකම විසාල නිසා මේක උනත් මට හොඳ'' යයි පැවසුවේය.

''මූට තාම අවුරුදු තුනයි වෙන්නෙ. හොඳ වයස. මම මගේ ගැණිව වික්කත් මූව නම් විකුණන්නෙ නැහැ''යි ගොවියා හඩ නගා වං ලුං ගැන කිසිදු සැලකිල්ලක් නොදක්වා සීසෑමෙහි යෙදුනේය.

''මුළු ලෝකයේම සිටින ගොණුන් අතුරෙන් මේ ගොණාම ලබා ගත යුතු'' යයි හදිසියෙන්ම වං ලුංට සිතුනේය. එහෙයින් ඔහු ඕලැංට හා පියාටත් කතාකොට – ''කොහොමද මේ ගොණා හොඳ දැ''යි ඇසුවේය. මහල්ලා නැඹුරු වී බලමින් ''මූ හොඳට කප්පාදු කරපු සතෙක්'' යයි කීවේය.

''එයා කියනවට වැඩිය මූට අවුරුද්දක් වැඩිවෙන්න පුළුවන්'' යයි ඕලැං කීවාය. එහෙත් වං ලුං ඔවුන්ට කිසිත් උත්තරයක් නොදුන්නේය. ගොණාගේ ශක්තිමත් බර ඇදීම නිසාත් උගේ කහවන් සිනිඳු හම නිසාත් පිරුණ කළුවන් ඇස් නිසාත් ඔහුට සතා ගැන ආසාවක් ඇතිවුනි. ''මේ ගොණාගෙන් කුඹුරු සීසා ගත හැක. මේ ගොණා ඇඹරුම් ගලට බැඳ ධාන්‍ය අඹරා ගත හැකි යයි ද, සිතූ ඔහු ගොවියා වෙත ගොස් මෙසේ කීය.

''මම උඹට වෙන සතෙක් ගන්න තව වැඩියත් එක්ක සල්ලි දෙන්නං නමුත් මට මේ සතා ඕන.''

අන්තිමේදී කේවෙල් කරමින් රන්ඩු කරමින් ගෙදර යන්නට තතනමින් ගොවියා ඒ පළාතෙහි ගොණෙකුගේ වටිනාකමින් එකහ–මාරකට – රිදී කාසි පහකට ගොණා විකුණන්නට කැමති වුනේය. එහෙත් ගොණා දෙස බැලූ වං ලුං ට මුදල් ගැන ආසාවක් ඇති නොවීය. එහෙයින් ඔහු මුදල් ගොවියා අතට දී සතා නගුලෙන් ලිහන තුරු නො ඉවසිල්ලෙන් බලා සිටියේය. ඉන්පසු උගේ නාස් ලනුවට ගැට ගසා තිබුන කඹයෙන් ඌ දක්කා ගෙන ගිය වං ලුං ගේ හද වතෙහි මේ ගොණා අයිතිවීම ගැන බලවත් හැඟීමක් පහළ වුනේය.

ගොණා ද දක්කා ගෙන ගමට පැමිණි ගෙටද ළඟාවුන ඔවුනට දකින්ට ලැබුනේ ගෙයි දොර ද වහලෙහි සෙවිල්ල ද නො මැති බවය. ගෙය ඇතුළෙහි තබා ගිය රේක්ක උදළු ආදිය ද එහි නොවීය. එහි ඉතුරුව තිබුනේ පරාළ හා මැටි බිත්ති පමණකි.

Scanned by CamScanner

මැටි බිත්ති ද සීත ඍතුවේ හිම හා වැස්සද වසන්තයේ මඳ වැසි ද නිසා කඩින්කඩ දියවී ගොස් තිබුනි. එහෙත් ප්‍රථම වරට විස්මයට පත් වං ලුං මේ සියල්ල ගණනකට නොගත්තේය.

ඔහු නගරයට ගොස් තද ලීයෙන් සෑදූ අළුත් නගුලක් ද රේක්ක දෙකක් ද උදළු දෙකක් ද සෙවිලි කරන්නට ලබන අස් වැන්නෙන් පිදුරු ලැබෙන තෙක් වහළ වසා තබන්නට පැදුරු ද මිලට ගත්තේය.

සන්ධ්‍යා කාලයෙහි ඔහු එළිපත මත හිඳගෙන ඉඩම් දෙස – තමාගේ ඉඩම් දෙස බැලුවේය. සීත ඍතුවෙහි දිය මිදීමෙන් පසුව ඒවා අලුත්ව බුරුල්ව පැල සිටුවීමට සකස් වී තිබුනි. වසන්ත කාලය බැවින් නොගැඹුරු ජලයෙහි විසුම් ගත් මැඩියෝ නිදිමතෙන් මෙන් බක බක ගා හඬ තලන්නට වූහ. වත්තෙහි කෙළවර තිබුන උණගස් සන්ධ්‍යා මන්දමාරුතයට අසුව සෙමින් සෙමින් සිරි සිරි ගා සෙලවුණේය. සන්ධ්‍යාලෝකයෙන්, ලඟ තිබුන කුඹුරෙහි මායිම් ගස් වැටිය ද ඔහුට අඳුරු ලෙස දක්නට හැකි විය. ඒ අතර ලාවන් පැහැති සිනිඳු මල් දරණ ඇටඹගස් ද ලා දළුලන වේවැල් පඳුරු ද තිබුනි. බලාපොරොත්තු සහගත කුඹුරු වලින් නැගී ආ තුනී මීදුම සඳ කැලුම් මෙන් රිදීවන්ව ගස් වල කඳන් වෙලා ගන්නා අයුරු වං ලුං ට පෙනුනේය.

පළමුවෙන් ම බොහෝ දිනක් ගතවන තුරු, වං ලුං කිසිවෙකු දක්නට නොකැමැත්තා සේ තම ඉඩම්වලටම වී තනිවම කල්ගත කෙළේය. ඔහු ගමෙහි එකද ගෙයකට වත් ගියේ නැත. සීත ඍතුවෙහි සාගතයෙන් නොමැරී ඉතිරි වූවකු තම ගෙයට ආ විට ඔහු ඔහුත් සමග තරමක් නො සතුටු ගතියෙන් මෙසේ කථා කෙළේය.

"උඹලගෙන් කවුද මගේ දොර ගලව ගත්තෙ? කොයි එක්කෙනාද මගේ උදැල්ලයි රේක්කෙයි අර ගත්තෙ? මගේ වහළ කඩාගෙන ලිපේ දැම්මෙ කව්ද?"

ඒ කථාව ඇසුවන් ගෙන් බොහෝ දෙනෙක් හොඳ හිතින්ම හිස වැනූහ.

"ඒ උඹේ බාප්පා" යයි ඔවුනතර එකෙක් කීය. තව කෙනෙක් "නැහැ. නැහැ! මේ සාගතයෙ – යුද්ද දවස්වල හැම තැනම හොරුයි මංකොල්ල කාරයොයි ගැවසුනා. ඉතින්

Scanned by CamScanner

කොහොමද අහවලා හොරකම් කළයි කියන්නෙ? බඩගින්න නිසා හැමෝම හොරු වෙනවා'' යයි කීවේය.

ඉන්පසු චිං – චං ලූං ගේ අසල්වැසියා – චං ලූං බලන්නට තම පැල්පතේ සිට ඇදී අවුත් මෙසේ කීවේය.

''ශීත කාලයේ හොරු කණ්ඩායමක් උඹේ ගෙදර ඉඳගෙන පුළුවන් තරම් ගමත් නගරයත් මංකොල්ල කෑව. අනික් අය උන් ගැන දන්නවාට වැඩි දේවල් උඹේ බාප්ප දන්නවලු. අනේ කවුද දන්නෙ මේ දවස්වල ඇත්ත නැත්ත මොකක් ද කියල. මම නම් කොයි කෙනෙකුටවත් වරද පමුණුවන්න අකමැතියි.''

මේ කථා කළ මිනිසා මිනිස් සේයාවක් මෙන් දිස් වුනේය. ඔහුගේ හම ඇටවලට තදින් ඇලී තිබුනි. ඔහුගේ හිස කෙස් ද තුනීව පැසී ගොස්ය. එහෙත් තවමත් ඔහු සතළිස් පස්වන විය පසු නො කළ කෙනෙකි.

මේ පුද්ගලයා දෙස බැලූ චං ලූං ලෙහි හටගත් මහා අනුකම්පා වකින් ''උඹල අපිට වැඩිය දුක් විඳල තියෙනව. මොනවද මේ දවස්වල උඹල කෑවෙ'' යයි හදිසියෙන් ඇසීය. මිනිහා තොල් මතුරන්නාක් වැනි කුඩා හඬකින් උත්තර දුන්නේය.

''මොනවද මම නො කෑවෙ? නගරයෙ හිඟා කනකොට බල්ලො වගේ වීදීවල තිබුන කුණුත් කෑව. අපි මැරිච්ච බල්ලන් වත් කෑව. මැරෙන්න ඉස්සර මගේ ගෑණි මොනවද මස් ජාතිය කින් සුප් එකක් හදල දුන්න. මට අහන්නත් බය හිතුන ඒ මස්–ජාතිය මොනවද කියල? ඇට මොකෙකුවත් මරන්න තරම් ධෛර්යයක් තිබුනෙ නැහැ. අපි යමක් කෑව නම් ඒව, ඈ සොයා ගත් දේ තමයි. ඇයට මට තරම් දුක් දරා ගැනීමෙ ශක්තියක් තිබුනෙ නැති නිසා අනේ ඇය පසුව මළා. ඇය මළාට පස්සෙ කෙල්ලව හේවායෙකුට දුන්න. එහෙම හේවායෙකුට දුන්නෙ ඇයත් හාමතේ මැරෙණ හැටි බලාගෙන ඉන්න බැරි නිසයි.''

මෙසේ කථා කරගෙන ගොස් මඳක් නැවතී නිශ්ශබ්දව සිට යලිත් කථා කරමින් ''මට බෝග ජාතියක් තිබුන නම් මම ආයින් ගොවිතැන් කරණව. නමුත් බෝග ජාති කොයින්ද මට?'' යයි කීය.

''මෙහෙ වරෙන්'' යයි රළු ලෙස කී චං ලූං ඔහුගේ අතින් අල්වා ගෙට ඇදගෙන ගොස්, මිනිහාට ඔහුගේ කබල් කබායේ

කෙළවර ඇල්ලීමට නියම කොට තමා දකුණෙන් ගෙණ ආ ධාන්‍ය ගොඩෙන් කොටසක් එයට හැලුවේය. තිරිඟු ද වී ද ගෝවා ඇට ද ඔහුට දී ''හෙට මම ඇවිල්ල මගේ අළුත් ගොණාගෙන් උඹෙ ඉඩම් හීහාල දෙන්නම්'' යයි ද කීවේය. එවිට විං හදිසියෙන් ම හඬන්නට පටන් ගත්තේය. වං ලුං තමාගේ ද ඇස් පිසදමමින් මෙසේ කෑගැසුවේය.

''උඹ හිතුවද උඹ මට අර එද බෝංචි ඇට ටික දීපු වග මට අමතක වුනා කියල?''

විං ට කිසිත් උත්තරයක් දෙන්නට හැකි නොවීය. ඔහු නොනවත්වාම හඬමින් වැලපෙමින් යන්නට ගියේය.

තම බාප්පා ගමෙහි මේ දවස්වල නැති බව දැන ගන්නට ලැබීම වං ලුං ට මහත් ප්‍රීතියක් වීය. ඔහු කොහි සිටීද, යනු කිසිවෙක් හරි හැටි නොදත්හ. ඔහු නගරයකට ගිය බව ඇතමෙකු කී අතර තව කෙනෙක් ඔහු තම බිරියත් පුතාත් සමග ඈත පළාතකට ගොස් ඇති බව කීහ. වං ලුං බලවත් කෝපයට පත් වූනේ තම බාප්පා සිය දූරියන් ලැබුන ලැබුන මුදලකට විකුණූ බවත් රූමත් දියණිය හේවායෙකුට විකුණා පැන්ස කීපයක් ගත් බවත් අසාය.

එතැන් පටන් වං ලුං මුළු ධෛර්‍යයම ඉඩම් වෙනුවෙන් යොදවන්නට පටන් ගත්තේය. කෑමටත් නින්දටත් ගෙදර ගත වෙන කාලය ගැනත් ඔහු ලෝභ කෙළේය. ඔහු වඩා ආසා කෙළේ කුඹුරට ගෙනගිය පාන්පෙත්තක් හා සුදුලූනු සවල්පයක් එහිදීම අනුභව කරමින් ''මම මෙතන කළුපාට බෝංචි හිටවනව, මෙතන අළුතෙන් වී වපුරණවා'' යයි සිතමින් ගොවිතැනෙහි නිතරම යෙදෙන්නටය. ඔහු කුඹුරෙහි දී වෙහෙසට පත් වුවහොත් නියරකට හාන්සි වී තම සරුසාර භූමියෙහි පහස විඳිමින් නිද ගත්තේය.

කුඹුරෙහි වැඩ කළ වං ලුං මෙන්ම ගෙහි වැඩ කළ ඕ-ලෑං ද කඩිසර වූවාය. ඇය සියතින්ම පැදුරු පරාළ වලට සවිකොට තම ඉඩම් වලින් ගෙණ ආ පස් වතුරත් සමග අනා ගෙයි බිත්ති අළුත් වැඩියා කළාය. ඇය නැවත උදුන ගොඩ නගා වැස්ස නිසා ගෙයි බිම සෑරී තිබුන වළවල් ද වැසුවාය, කැඩුම් බිඳුම් ද සකස් කළාය.

Scanned by CamScanner

දින කීපයකට පසු ඒ දෙමහල්ලෝ නගරයට ගොස් ඇඳක් ද මේසයක් ද බංකු හයක් ද විසාල යකඩ කල්දේරමක් ද ගෙනාවෝය. තවද ප්‍රීතිය උදෙසා ම කළු මල් වැටුන රතු තේ පෝච්චියක් ද එයට සරිලන බඳුන් හයක් ද මිලට ගන්නට ඒ දිනයෙහි ඔව්හු අමතක නොකළහ. අවසානයේදී සුවඳ බඩු විකුණන කඩයකට ගිය ඔව්හු ධනයට අධිපති දෙවියාගේ පිළිරුවක් ද මිලට ගත්හ. ඔවුන් අදහස් කෙළේ එය මැද කාමරයේ මේසයට ඉහළින් බිත්තියෙහි එල්ලා තබන්නටය. හඳුන්කූරු ගැසීමට ලෝහමය බඳුනක් ද දෙවියා ඉදිරිපිට දල්වීමට ඉටිපන්දම් දෙකක් ද මිලට ගත්හ. මේ ඝන රතු ඉටිපන්දම් වර්ගය සාදන ලද්දේ ගව තෙලිනි. එහි දල් වෙන්නට දමා තිබුනේ පන් ගසකි.

මේ බඩු ගන්නා අතර වං ලුං ට කුඹුරෙහි පිහිටි දෙවොළෙහි කුඩා දෙව් රූ දෙක ද සිහිවුනි. පෙරලා ගෙදර යන විට ද එතැන නැවති කර පොවා බැලුවේය. ඔවුන්ගේ දර්ශනය සැබවින්ම දුඃඛ දයක විය.

ඒ දෙව් රූ දෙකෙහි මුහුණ වැස්සට සේදී ගොස් තිබුනි. එහි ඉරුණ කරදසි ඇඳුම් තුළින් නග්න මැටි සිරුරු පෙනුනේය. දුර්භාග්‍යවත් අවුරුද්දෙහි ඔවුනට කිසිවෙක් සැලකීමක් නොකළ හෙයින් වං ලුං ඒ දෙව් පිළි රූ දෙක දෙස කෝපයෙන් බලා සෑහීමකට පත්ව දඬුවම් දෙනු ලැබූ දරුවෙකුට කථා කරන්නාක් මෙන් ශබ්ද නගා ''ඔහොම තමා මිනිසුන්ට වරද කරණ දෙවියන්ට වෙන්නෙ'' යයි කීවේය.

කෙසේ වෙතත් නැවත ගෙය ප්‍රකෘතිමත් කළ විට– දිලිහෙන ලෝහමය ඉටි පහන් කනුවල රතු ඉටිපන්දම් දල්වෙන විට– තේ පෝච්චිය හා බඳුන් මේසය මත තබා, ඇතිරිලි යෙදූ ඇඳන් සුදුසු තැන්වල තබා පිළියෙළ වුන විට – ඔවුන් නිදගත් කාමරයේ සිදුරු ආවරණය වන සේ අලුත් කරදසි අලවා අලුත් දෙර පියන් ලී සරනේරු මත සවිකළ විට වං ලුං තමාගේ ප්‍රීතිය ගැන නො ඉවසිලිමත් විය. ඕලැං ද මීලඟ දරුවා ලබන්නට ලංව සිටියාය.

ඔවුන්ගේ දරුවෝ දුඹුරුවන් සුනඛ පැටවුන් මෙන් ගෙයි එළිපත මත පෙරලෙන්නට වූහ. මහල්ලා දකුණු දිග බිත්තිය අද්දර හිඳගෙන නිදි කිරා වැටුනේය– නිද වැටෙමින් සිනාසුනේය. වං ලුං ගේ කුඹුරු වලද අළුත් ගොයම් පැන නැගුනේ කොළපාට

Scanned by CamScanner

මැණික් මෙන්ය. කුඩා බෝංචි පැලද දවසට දෙකට ඒ හිස් පොළොවෙන් මතුවුනි. පිරිමසා ගතහොත් ලබන අස්වැන්න කාලය වනතුරු ආහාර සඳහා මුදල් ද ඔවුන් ළඟ තිබුනේය. තමාට ඉහලින් තිබුන නිල්වන් අහස දෙස ද එය හරහා තල්ලු වී යන සුදුවන් වලාකුල් දෙස ද බලමින් තමාගේම සිරුරෙහි මස් මතු පිටට මෙන් තමා වගා කළ කෙත් වතු වලට සුදුසු පමණට වැටෙන හිරු එළිය හා වැස්සේ පහස විඳිමින්, වං ලුං නොකමැත්තෙන්ම මෙසේ තොල් මතුරන්නාට වූයේය.

''අර දේවාලෙ ඉන්න දෙන්න ඉදිරියෙ මම සුවඳ ටිකක් පුච්චන්න ඕන. කොහොම උනත් ඔවුන්ට මේ මහ පොළොවේ– මේ සාර භූමියෙහි බලය තිබෙනවා.''



එක් රැයක වං ලුං තම බිරිය ද සමග සයනය කරද්දී මිනිසෙකුගේ මිට මෙලවූ අතක් පමණ ගුලියක් බිරියගේ පියයුරු අතර තිබෙනු ඔහුට දැනුණි.

"උඹේ ඇගේ තිබෙන ඕක මොකක් ද" යි වං ලුං ඇගෙන් ඇසුවේය. ඉන්පසු ඔහු එය අතින් ඇල්ලූ කල දැනගන්නට ලැබුනේ එය රෙද්දක බඳිනු ලැබූ පොදියක් බවය. ඒ පොදිය තද වුනත් අල්ලන විට එහා මෙහා සෙල වුනේය. පළමුවෙන් ම ඔහු අත පොවත්ම ඇය වැරෙන් ආපසු ඇදගත්තාය. එහෙත් ඔහු එය කඩාගන්නට සැරසෙත්ම ඇගේ විරුද්ධත්වය නවතා "හොඳයි මෙන්න ඔයාට ඕන නම් බලන්න" යයි කියා ඒ පොදිය තම කරෙහි බැඳි ලනුවෙන් කඩා ඔහුට දුන්නාය.

එය දවටා තිබුන පාන්කඩ කැබැල්ල ඔහු ඉරාදැම්මේය. එවිට හදිසියෙන් ම එයින් ඔහු අතට වැටුනේ මැණික් සමූහයකි. වං ලුං විශ්මයෙන් නෙත් අයාගත්තේය. එක් තැනක ඇතැයි ඔහු සිහිනෙනුදු නොසිතූ මැණික් සංඛ්‍යාවක් එහි වීය. ජම්බෝල මද වැනි රතු මැණික් ද තිරිඟු වැනි රන්වන් මැණික් ද වසන්තයේ අළුත් කොළ වැනි කොළ පාට මැණික් ද පොළොවෙන් උනන වතුර මෙන් පැහැදිලි මැණික් ද ඒවා අතර දක්නට ලැබුණි. තම ජීවිතයේ කිසිම දිනක එබඳු මැණික් ගොඩවල් ගැන අසා හෝ දැක නැති වං ලුං ට ඒවායේ නම් කියන්නට ද අපහසු වීය. එහෙත් තමාගේ දළ දුඹුරුවන් අත්ලෙහි ඒවා තබාගෙන හුන් ඔහු අඳුරෙහි දිලිසුන මැණික් දැක දැක තමාට ධනය ඇති බව දැනගත්තේය.

Scanned by CamScanner

මැණික්වල පැහැයෙන් හා හැඩයෙන් වශීකෘත වූ ඔහු නිශ්ශබ්දව නිශ්චලව ඒවා අල්වාගෙන සිටියේය. ගැහැණිය ද නෙත් අයාගෙන එදෙස බලාගෙන සිටියාය. අවසානයේ දී ඔහු මහත් විස්මයෙන් මෙසේ කෙඳුරුවේය.

"කොහෙන් ද........කොහෙන් ද ?"

"අර–අර පොහොසතාගෙ ගෙදර ධනපති ගැහැණියකට අයිති එකක් වෙන්න ඇති. ගෙයි බිත්තියෙ ගඩොල් කෑටයක් බුරුල් වෙලා තියෙනව දැකල මම නොසැලකිල්ලෙන් වගේ එතෙන්ට ඇඳුන, අනිකෙකු ට නොපෙනෙන්න. පෙනුනොත් කොටසක් දෙන්න වෙන හින්ද. මම ගඩොල ඇද්ද. දිලිහෙන සේරම අරගෙන මගේ ඇඳුම් අස්සෙ සඟවා ගත්ත" යයි ඇය මෘදු ලෙස කීවාය.

"උඹ කොහොමද දන්නෙ ?" යයි ඔහු විස්මයෙන් යුතුව යලිත් කෙඳුරුවේය. ඇය ඇගේ තොල් මත රැඳුන, එහෙත් ඇස් වලින් නොදැනුන සිනහවකින් යුතුව උත්තර දුන්නාය.

"ඔයා හිතන්නෙ මම පොහොසත් ගෙදරක හිටියෙ නැතෙයි කියලද ? පෝසත්තු තිස්සේම බයයි. වරක් එක නරක අවුරුද්දකදි මම දැක්ක මහ ගෙදර–හ්වෑං මැඳුරෙ ගේට්ටුවට හොරු කඩාගෙන පනිනව. දසියොයි වෙස ගෑනුයි වෙන එකක් තියා වයසක නෝනයි එහේ මෙහේ දුවල තම තමන්ට අයිති වස්තුව කලින් පිළියෙළ කරල තිබුන තැන්වල හැංගුව. ඒ හින්ද මම දන්නව, බුරුල් වෙච්ච ගඩොලක් තියෙන කොට ඒකෙ තේරුම."

යලිත් ඔව්හු නිශ්ශබ්දව විස්මයෙන් එදෙස බලා සිටියහ. බොහෝ වේලාවකට පසු වං ලුං දිග හුස්මක් ඇද සපීරවම මෙසේ කීවේය. "මේ වගේ වස්තුවක් කෙනෙකුට තියාගන්න බැහැ. ඒව විකුණල ආරක්ෂා ඇති පිළිවෙළකට හරව ගන්න ඕන. ඉඩම් හැර වෙන මොකුත් ආරක්ෂා සහිත නැහැ. කවුරුත් මේක ගැන දන්නව නම් අපි හෙට වෙනකොට මරාවි. හොරෙක් මේ මැණික් ගල් ටික ගෙන යාවි. ඉක්මනට මේ මැණික් ගල් ටික ඉඩම් වලට හරවන්න ඕන. මේ නිසා මට අද රෑට නින්ද නම් යන්නෙ නැහැ."

ඔහු මෙසේ කථා කරමින් ම යලිත් මැණික් ගල් පාන්කඩයේ ඔතා තද කොට ලනුවෙන් බැඳ තම කබාය විවර කොට ලය පෙදෙසෙහි තබාගනිද්දී හදිසියෙන් ම ගැහැණියගේ මුහුණ දුටුවේය.

ඇය ඇඳ කෙළවරෙහි එරමිණිය ගොතා වාඩිවී සිටියාය. කිසිවක් ගැන කථා නොකළ ඇගේ මුහුණ ඉදිරියට නැඹුරුවී තිබුණි, ඇගේ මුව විවර වී තිබුණි.

''හා! ඉතින් මොකද ?'' යයි ඔහු විස්මයෙන් මෙන් ඇසුවේය.

''ඔයා සේරම විකුණනවා ද''යි ඇ රළු ලෙස තොල්මතුළාය.

''ඇයි මොකොද නැත්තෙ ? මේ වගේ මැණික් මොටද මේ වගේ මැටි ගේක තියාගන්නෙ ?'' යයි ඔහු පැවසුවේය.

''මම ආසයි මා ගාව ඔයින් දෙකක් තියාගන්න'' යයි ඇය බැගෑපත් ලෙස කීවාය. ඇය එසේ කීවේ ඇයට එයින් කිසිවක් නොලැබේය යන භීතියෙනි. තමාගේ දරුවෙකු කෙළි බඩුවක් හෝ පැනි රස දෙයක් ඉල්ලන කලෙක මෙන් ඔහු තුළ එයින් හැඟීමක් ඇති වූනේය.

''හා! ඉතින්!'' යයි ඔහු විස්මයෙන් ඇසුවේය.

''මට එයින් දෙකක් ඇත්නම්'' යයි ඇය නිහතමානීව කීවාය.

''පුංචි ඒව දෙකක්–අර පුංචි සුදු මුතු ද''යි ඔහු මුව අයාගෙන ඇසීය.

''මම ඒව තියාගන්නම්. මම , ඒව පලඳින්නෙ නැහැ. තියාගන්නව විතර'' යයි කී ඇය යලි ඇස් හෙලාගෙන ඇඳ ඇතිරිල්ලෙහි බුරුල් වූ නූලක් කරකවන්නට වූවාය–පිළිතුරක් බලාපොරොත්තු නොවන්නක මෙන් ඉවසිල්ලෙන් බලා සිටියාය.

මේ නිශ්ශබ්ද විස්වාසවත් සත්වයාගේ නොතේරෙණ හදවතට වංලුං තම බැල්ම මොහොතකට යොදන්නට වීය. මුළු ජීවිතයෙහි ම ඇය වෙහෙසුනේ ත්‍යාගයක් නොලැබුන වැඩවලය. මහ ගෙදර දී අනික් අය මැණික් වර්ග පලඳිනු දක තිබුනත් ඇය නම් කිසි දිනකත් මැණික් නොපැලැන්දය. එහෙත් මේ මැණික් වරක් තම අතෙහි තිබුන බව නම් ඇයට අමතක නොවන්නකි. එහෙයින් ඇය කල්පනාවකින් මෙන් මෙසේ ද කීවාය.

''ඔය මැණික් මගේ අතින් අල්ලගෙන ඉන්නත් පුළුවන්'' ඔහුට ම නොතේරෙන හැඟීමකින් මඩනා ලද ඔහු තම ලය පෙදෙසින් මැණික් පොදිය ඉවතට ඇද ලිහා නිශ්ශබ්දවම ඇයට දුන්නේය. ඇගේ ඝන දුඹුරුවන් අතින් නොයෙක් පාටින් යුත් රත්නයන් එක එක පෙරලමින් ඇය අන්තිමේ දී සුදු පාට මුතු ඇට දෙක සොයා ගත්තාය. ඉක්බිති ඇය එය රැගෙන අනික් කොටස

Scanned by CamScanner

ගැටගසා . ඔහුට ආපසු දුන්නාය. යලි තම කබායෙන් කොටසක් ඉරා මුතු ඇට එහි ඔතා තම පියයුරු අතරෙහි සඟවා ගෙන සැනසුනාය.

වං ලුං විස්මයට පත්ව අඩක් තේරුම් ගෙන ඇය දෙස බලා සිටියේය.

දින කීපයක් ගතවී ගිය පසු ද ඔහු ඇය දෙස බලා තමාට ම මෙසේ කියා ගත්තේය.

''හා ඉතින් මම හිතන්නෙ මගේ ගෑණි ගාව අර මුතු ඇට ඇතෙයි කියලයි'' එහෙත් කිසි දිනක ඇය ඒ මුතු පිටතට ගනු ඔහු දුටුවේ නැත. ඒ ගැන ඔවුන් අතර කථාබහක් ද ඉන්පසු නොවීය. ඔහු නිතරම කල්පනා කෙළේ අනික් මැණික් ගැනය. අන්තිමේ දී ඔහු තීරණය කරගත්තේ ඒවා මහ ගෙදරට ගෙනගොස් ඉඩම් ගන්නටය. එහෙයින් ඉන්පසු ඔහු ගියේ මහ ගෙදරටය. මේ දිනවල නම් මහ ගෙදර ගේට්ටුව ළඟ හිඳගෙන ඉනිගැටය මත වැඩුන කෙස් රොද කරකව කවා තමාට අවඥ කළ ගේට්ටු කාරයා නොවීය. එහි විසාල දෙරවල් වසා යතුරු දමා තිබුනි. වං ලුං ගේට්ටුව වෙත ගොස් අත් දෙකින්ම ගේට්ටුව ට ගැසුමුත් කිසිවෙක් ආවේ නැත. වීථියෙහි ගමන් ගත් මිනිස්සු ඔහු දෙස බලා මෙසේ කෑගැසූහ.

''ගහපන් ගහපන් හයියෙන් දෙරට. නාකි රදළයට ඇහැ ඇරිල නම් ඒවි. එහෙම නැත්තම් ඔය කිට්ටුව ඉන්න දසියකට හෝ දසයෙකුට හිතුනොත් ඒවි. ඇවිල්ල දෙර අරීවි.''

මඳ වේලාවකට පසු කවුදෝ එන හඬක් ඔහුට ඇසුනි. සෙමින් අවිනිශ්චිතව ආ මේ අඩි ශබ්දය නැවති නැවති කඩ කඩව ඇසුනේය. යලි හදිසියෙන් ම ඔහුට ඇසුනේ ගේට්ටුව නවතා තිබුන විසාල යකඩ පොල්ල එහා මෙහා යන හඬකි. ඉන්පසු ගේට්ටු දෙර මඳක් හඬ නගමින් විවෘත වුනේය. එවිට ම ''ඔය කවුද ?'' යන හග්නස්වරය ඔහුගේ සවණෙහි වැකුනි.

''ඒ මම වං ලුං'' යයි ඔහු විස්මිත වුවද ශබ්ද නඟා කීවේය.

''කව්ද ඔය හෙන ගහව්ව වං ලුං! කියාපන්'' යයි ඒ භග්නස්වරය ම යලිත් රැව්දුන්නේය.

ඒ හඬෙහි තත්වයෙන් ම මේ නම් මහළු රදළයා බව වං ලුං ට වැටහුනි. වැඩකාරයන් ට හා දසයන් ට අමතා පුරුදු හඬින්ම

Scanned by CamScanner

කථාකරමින් පැමිණි මහළු රදළයාට මේවර වං ලුං පිළිතුරු දුන්නේ කලින්ට වඩා නිහතමානී විලාසයෙනි.

''මහත්තයො, රදළ මහත්තයො, මම ආවෙ පොඩි ජාවාරමකටයි. ඔය රදළ තුමාට කරදර කරන්න නොවෙයි. ඔබ තුමාගෙ අර නියෝජිත තුමා එක්ක ජාවාරමක් ගැන කථාකරගන්න'' යයි ඔහු කීවේය.

එවිට රදළ තැන දෙර තවත් විවර නොකොටම කපල්ලට තම මුව තබා ''උඹට හෙන ගහන්න ඕන! ඒ බල්ල මෙහෙන් ගියේ මාස ගණනකට ඉස්සර. දූන් උඹ මෙතන නැහැ'' යි උත්තර දුන්නේය.

මේ උත්තරයෙන් පසු කුමක් කළ යුතු දැයි වං ලුං නොදත්තේය. කථා කාරයෙකු නොමැතිව කෙළින් ම රදළ තැන සමග කථා කරන්නට ද ඔහුට නොහැකි වීය. තවත් දුෂ්කරතාවයක් නම් ළය පෙදෙසෙහි තිබුන මැණික් ගිනි මෙන් වැටහීමයි. ඉඩම් වුවමනා වූවාක් මෙන්ම මේ මැණික් වලින් නිදහස් වෙන්නට ද ඔහුට වුවමනා වූයේය.

මේ දිනවල වං ලුං ළඟ බෝග වර්ග ද මහත් රැසක් තිබුනි. දූනට තිබෙන ඉඩම් මෙන් තවත් ඉඩම් කොටස් ඇතහොත් එහි ද වගා කරන්නට තරම් ඒ බෝග රැස ප්‍රමාණවත් වීය. හ්වැං මැඳුරෙන් තව තවත් සරු සාර ඉඩම් ගන්නට ඔහු අදහස් කෙළේ එහෙයිනි. හ්වැං මැඳුරෙහි ප්‍රධාන රදළයා සමග කථා කළ වං ලුං ''මම ආවෙ සුළු මුදලක් ගැන'' යයි තතනමින් කීවේය. මේ වචනය අසා රදළ තැන දෙර වසන්නට සැරසෙමින් මෙතෙක් කථා කළාට වඩා ශබ්ද නගා මෙසේද කියන්නට වීය.

''මේ ගෙදර නම් සල්ලි නැහැ. අර නියෝජිත යයි කියන හොරා–මංකොල්ල කාරයා මා ගාව තිබ්බව සේරම ගෙන ගියා. ඒකට උගේ පරම්පරාවට ම හෙණ ගහන්න ඕන. දූන්නම් ණය ගෙවන්නත් විදියක් නැහැ.''

''නැහැ, නැහැ, මම ආවෙ ගෙවන්න. ණය එකතු කරන්න නොවෙයි'' වං ලුං කඩිනමින් කීවේය. මේ අවස්ථාවෙහි දී වං ලුං ට මෙතෙක් අසන්නට නොලැබුන සිහින් කටහඬක් ඇසුනේය. ඒ හඬෙහි ප්‍රතිඵලයක් මෙන් ගැහැණියක් සිය මුහුණ දෙරටුව අතරින් එළියට දැමුවාය.

Scanned by CamScanner

''හා ! ඒක මම හුඟක් කාලයකින් ඇහුවේ නැති දෙයක්''යයි ඇය තදින් කීවාය. තමා දෙස බලන රූමත් දබර කරණ සුලු මුහුණක් වං ලූං දුටුවේය. ''ඇතුලට එන්න'' යයි ඇය කඩිසරව කියා ඔහුට ඇතුළුවන්නට තරම් ද්වාරය විවෘත කළාය. ඔහු ඇතුළුව විස්මයෙන් බලා සිටිද්දී ඇය යලිත් ද්වාරය වසා අගුල ද දැමුවාය.

මහළු රදළ තැන කහිමින් බලා සිටියේය. ඔහු ඇඳ සිටි කිලිටි සේද ඇඳුමේ කෙලවරකින් මතුවුන නූල් කැබලි ද එල්ලෙමින් තිබුනි. වරක් එය හොඳ ඇඳුමක් බව ඕනෑම කෙනෙකුට වටහාගත හැකි විය. ඔහු ඇඳ සිටි රෙද්ද තවමත් බරය, සිනිඳුය. එහෙත් එය කහට පැල්ලම් වලින් වැසී තිබුනි. එසේම නින්දෙහිදී එය ඇඳගෙන සිටි බව කියන්නට මෙන් තැලී පොඩි වී ගුලිගැහී තිබුනේය.

වං ලූං විස්මිතව එහෙත් බියෙන් ඒ මහල්ලා දෙස බැලුවේය. ඔහුගේ මුළු ජීවිතයෙහි ම මහ ගෙදර අයට තරමක බියක් ද සැලකිල්ලක් ද ඇතිව සිටියේය. ඔහු නොයෙක් විට අසා ඇති ''මහළු රදළ තැන'' ''මේ නාකියා ද ?'' යනු ඔහුට අදහාගත නොහැකි තරම් විය. මේ නාකි රදළයා වං ලූං ගේ පියා තරම්වත් බියකරු පෙනුමකින් යුක්ත නොවූයේ ය. ඇත්තෙන්ම වං ලූං ගේ පියා නම් පිරිසිදු ප්‍රීතිමත් මහල්ලෙකි. මේ නාකි රදළ තැන ද වරක් තරබාරු වී සිටියත් මේ වන විට අතිශයින් ම කෘශ වී සිටියේය. ඔහුගේ හම ඇඟෙහි එල්ලෙමින් තිබුනි. ඔහුට අපිරිසිදු වැඩුනු රැවුලක් ද තිබුනේය. ඔහුගේ අත් කහ පාට විය. තමාගේ නිකට අතගාමින් එල්ලෙන තොල් අදින ඔහුගේ අත් තදින් ගැහුණේය.

ඒ ගැහැණිය නම් පිරිසිදුව සිටියාය. ඇගේ මුහුණ තුළ රළු පෙනීමක් දිස්වුනේය. තියුණු කළුවන්ව දිලිසෙන ඇස් නිසාත් උස් වූ නාසය නිසාත් ඇගේ ලාවන් සම කවු. මතුයෙහි තදින් ඇදී තිබුන නිසාත්–රතුවන් ඝන දෙතොල නිසාත්–ඇය රූමත් වුවත්– ලිහිණියෙකුගේ පෙනීමක් ඇගේ මුහුණෙහි තිබුනේය.

සිනිඳු දිලිසෙන කළු පැහැය නිසා ඇගේ කෙස් කලඹ කැටපතක් මෙන් විය. එහෙත් ඇය රදළ පවුලට අයත් කෙනෙකු නොවන බවත් එහි දසියක් බවත් කෙනෙකුට කිය හැකි වුනේ තියුණු වූ ද අවලක්ෂණ වූ ද ඇගේ ස්වරයෙනි. මේ ගැහණියත් රදළ තැනත්

හැරෙන්නට එහි කිසිද සත්වයෙක් නොවීය. පෙර නම් මේ නිවස නා නා කටයුතු සඳහා එහා මෙහා දුවන ගැහැණුන් ගෙන් ද පිරිමින් ගෙන් ද ළමයින් ගෙන් ද පිරී පැවතුනි.

"දැන් ඉතින් මුදල් ගැන" යයි ගැහැණිය තියුණු ලෙස කීවාය. එහෙත් වං ලුං පසුබට වුනේය. ඔහුට නාකි රදළ තැන ඉදිරිපිට හොඳින් කථාබස් කළ නොහැකි වීය. මේ බව ගැහැණියට වැටහුනේ ඉක්මනින් යමක් වටහා ගැනීමේ ශක්තිය ඇයට තිබුන නිසාය. එහෙයින් ඇය සිහින් සවරයෙන් රදළ තැනට මෙසේ කීවාය.

"ඔහේ ඉතින් යන්න! ඉතින් යන්න!"

මහළු රදළ තැන වචනයකුදු නොදෙඩා නිශ්ශබ්දව යන්නට ගියේය. කඟිමින් යන ඔහුගේ විල්ලූද සපත්තුවල අඩි වලින් ශබ්දයක් ද නිකුත් වීය.

මේ ගැහැණිය සමග තනි වූ වං ලුං කළ යුත්තේ කුමක් දැයි නොදත්තේ පැතිර පවත්නා නිශ්චලතාවයෙන් විස්මිත වූයේය. ඔහු මිදුල දෙස බැලූ මුත් එහි ද කිසිවෙක් නො වීය. මිදුල අවට ගොඩ ගසා තිබුන කුණු රොඩු වලින් ද විසිරීගිය වියලුන උණ කොල වලින් ද පිදුරු ගස් වලින් ද පත් වර්ග වලින් ද මල් පෙති වලින් ද ඔහුට වැටහුනේ එහි කිසිවෙකු නොමැති බවය.

"ඉතින්" යයි ගැහැණිය හදිසියෙන් කී විට වං ලුං උඩ වීසි වුනේ බලාපොරොත්තු නොවූ ඇගේ තියුණු හඬිනි. යලිත් ඇය "මොකක් ද උඹේ ජාවාරම? සල්ලි තියෙනව නම් ගිහින් බලන්න" යයි කීවාය.

"නැහැ මම සල්ලි තියෙනවයි කිව්වෙ නැහැ. මට ජාවාරමක් තියෙනවා" යි වං ලුං ප්‍රවේශමින් කීය.

"ජාවාරම් කියන්නෙ සල්ලි. එක්කො මෙහාට එන මුදල් එහෙම නැත්තං මෙහෙන් යන මුදල්! මේ ගෙදරින් නම් පිට යන්න සල්ලි නැතැයි" ඒ ගැහැණිය උත්තර දුන්නාය. ඇයගේ ඒ වචන වලට වං ලුං විරෝධය පළ කෙළේ "මට බැහැ ගැහැණු එක්ක කථා කරන්න" යයි කියමිනි. තමා සිටි තත්වය ගැන ද වැටහීමක් මේ වන තුරුත් නොලබා සිටි ඔහු විස්මයෙන් වටපිට බැලුවේය.

"හොඳයි මොකොද බැරි? ඇයි මෝඩයො උඹ අහල නැද්ද මෙතන කවුරුත් නැති බව?" යයි ඇය කියූ විට "කෝ එහෙනම්?" යයි වං ලුං විමසුවේ කථාකරන්නට බැරි තරම් බියකිනි.

ඉක්බිති ඒ ගැහැණිය යලිත් මෙසේ කථාකරන්නට පටන් ගත්තාය.

"අර නාකි නෝන නම් මැරිල. ඇයි උඹ නගරයෙදි ඇහුවෙ නැද්ද මංකොල්ල කාරයො මේ ගෙදරට වැදිල උන්ට පුළුවන් තරම් ගැණුයි බඩුයි ගෙන ගිය බව. උන් නාකි රදළ තැන මාපට ඇඟිලි වලින් එල්ලල නොසෑහෙන්න තැලුව. නාකි හාමිනේව පුටුවක බැඳල කටේ පාන්කඩ එබුව. ගෙදර සිටි සේරම පැනල දිව්ව නමුත් මම නැවතුන. මම බාගයක් වතුර පිරුණ බාල්දියකට බැහැල හිටිය. මම ඒකෙන් එළියට ආවෙ උන් ගියාට පස්සෙ. නාකි හාමිනෙත් නිකම්ම බයටම පුටුව උඩ මැරිල හිටිය. අබිං බීල බීල ඈ මේ දවස්වල හිටියෙ පත් ගහක් වගේ දිරලයි. බය උහුලගන්නත් ඇට බැරිවෙලා තියෙන්නෙ ඒ නිසයි."

"එතකොට සේවකයො? දසියො? වැඩකාරයො?" යයි වං ලුං තොල් මතුළේය.

"ආ! ඒගොල්ල ද? ඒගොල්ලත් ගිහින් හුඟක් කල්! කකුල්වල පණ තිබුන හැම එකෙක් ම පැන ගියා. සීත කාලය මඳක් ගත වී යනකොට කෑමත් නැතිව ගියා, මුදලුත් නැතිව ගියා. ඇත්තටම ඒ හොරු අතරෙ වැඩකාරයොත් හුඟක් හිටිය. මම දැක්ක ඒ දෙරටුපාලයයි කියන බල්ල හොරුන්ට මග පෙන්වනව. රදළ තැන ඉදිරියට ආවහම ඌ මූන හරව ගත්ත. ඒ උනත් උගේ ඉනිගැටය උඩ තිබුන කෙස්ගස් වලින් මම මිනිහ හඳුන ගත්ත. ඒ විදියෙ තව හුඟක් අය හිටිය. මෙතැන හිටිය පරණ පුරුදු මිනිස්සු මිසක් මැණික් හංගපු තැන් වෙනත් වටිනා දේවල් හංගල තිබුන තැන් දන්නෙ වෙන කවුද? අර නාකි නියෝජිතයවත් මට නම් විස්වාස නැහැ. ඒක මේ පවුලෙ ඈත නෑයෙක් නිසා මේ වැඩේට ප්‍රසිද්ධියේ ම සම්බන්ධවන එක නම්බුවට කැලලක් කියා සිතන්න ඇති" යි කියමින් යලිත් ගැහැණිය නිශ්ශබ්ද වූවාය. ඉන්පසු එහි පැතිර ගියේ මිනී වළක් තුළ පවතින තරම් නිහඬ බවකි. එහෙත් මේ නිහඬ බව වැඩි වේලාවක් නොතිබුනේය. ගැහැණිය කථා කළාය.

"මේ සේරම හදිසියෙන් සිද්ද වෙච්ච දේවල් නොවෙයි. නාකි රදළයගෙ කාලයෙත් එයාගෙ තාත්තගෙ කාලයෙත් මේ පිරිහීම පටන් අරගෙනයි තිබුනෙ. පසුගිය පරම්පරාවෙදි රදළ

Scanned by CamScanner

ගොල්ල ඉඩම් කඩම් ගැන සොයා බැලීම නවත්වල නියෝජිතය දෙන සල්ලි අරගෙන වතුර වගේ වියදම් කරන්න පටන්ගත්ත. දැන් ඒ ඉඩමුත් නැති වෙන්නයි පටන්ගෙන තියෙන්නෙ.''

''එතකොට කෝ ඒ තරුණ රදළ ගොල්ල?'' යයි වං ලුං විමසුවේ ඇය කී සියල්ලම තේරුම් ගන්නට ද විස්වාස කරන්නට ද නොහැක්කෙකු මෙන් වටපිට බලමිනි.

''ඒ ගොල්ලො ඉන්නෙ අතන මෙතන තමයි. මේක සිද්ද වෙන්න ඉස්සෙල්ල කෙල්ලො දෙන්න දීපු එක කොච්චර වාසනාවක් ද ? වැඩිමල් රදළ පුතා අම්මටයි තාත්තටයි සිද්ද වෙච්ච දේවල් අහල නාකි රදළය එක්කරගෙන යන්න පණිවුඩ එවල තිබුන. ඉතින් ගියහම ගැහැණියෙක් මෙහේ තනියම ඉන්නෙ කොහොමද කියල මම බලකළා.''

ඇය මේ වචන කියන විට ද, තම ගුණවත් කම පළකරන්නට මෙන් සිහින් රතු දෙතොල තද කරගත්තාය. එසේම ඇස් බිමට හරවාගෙන තරමක් නිහඬව සිට යළිත් කථා කරන්නට පටන් ගත්තාය.

''ඒ නැතත් මම මේ අවුරුදු ගණනක් ම රදළ තැනගෙ කීකරු සේවිකාවක් ව හිටිය. ඒ නිසා මට යන්න තැනක් ඉන්න ගෙදරක් නැහැ.''

වං ලුං ඇය දෙස ලංවී බලා යළි වහා ඉවතට හැරුනේය. මේ තත්වය කුමක් දැයි ඔහුට නොවැටහුනේය. එහෙත් මඳ වේලාවකට පසු ''මේ ගැහැණිය මැරෙන්නට ලංව සිටින මහළු රදළයාගෙන් අවසානයේ ලැබෙන යමක් උදෙසාම බලාපොරොත්තුව සිටින එකියක් බව'' තීරණය කරගත් ඔහු ''උඹ දසියක්! උඹ එක්ක මොන ගනු දෙනුවක් දැ''යි අවඥ සහගතව කීවේය.

''එයා මම කියන දෙයක් කරාවි'' යයි එවිට ඇය කැගසා කීවාය.

''හොඳයි කොහොම උනත් ඉඩම් නම් තියෙන්න පුළුවන්. තමා ඒව නොගත්තොත් කවුරු හරි ගනීවි'' යයි සිතමින්, ''හොඳයි කොච්චර ඉඩම් තිබෙනවා දැ''යි වං ලුං නොකැමැත්තෙන් මෙන් ඇසුවේය. ඔහුගේ අදහස එකවරටම තේරුම්ගත් ඇය වහා පිළිතුරු දුන්නාය.

''උඹ ආවෙ ඉඩම් ගන්න නම් ඉඩම් තියෙනව. බස්නාහිර පැත්තෙ අක්කර සීයකුයි දකුණු පැත්තෙ අක්කර දෙසීයකුයි විකුණන්න තියෙනව. හැබැයි ඒව සේරම තියෙන්නෙ එකට

නොවෙයි. නමුත් ඒ ඉඩම් කැලි ලොකුයි. ඒව අන්තිම අක්කරේ වෙනකං වික්ක හැකි.''

ඇය මෙසේ කියන විට වං ලූං ට වැටහුනේ නාකියා ඉතුරු කළ ඉඩම් සියල්ල ගැනම අන්තිම අහල දක්වා ම ඇය දත් බවයි. එහෙත් ඔහු ඒ ගැන විස්වාසයක් නොතැබුවේය. ඇය සමග ගනු දෙනු කරන්නට මැලිවුනේය. ''ඉතින් පුත්තුන්ගෙ කැමැත්තක් නැතුව නාකි රදළය මේ ඉඩම් සියල්ල විකුණන එකක් නැහැ''යි ද සිතමින් ඔහු පසුබට වුනේය. මේ අතර ගැහැණිය ඔහුගෙන් උත්තරයක් ගන්නට ආසාවෙන් තව තවත් කථා කළාය.

''ඒ ගැන පුත්තු කියල තියෙනව, එයාට පුළුවන් වෙලාවක විකුණන්නෙයි කියල. ඒ ඉඩම්වල පුත්තු කිසිකෙනෙක් ඉන්න කැමති නැහැ. මේ සාගත කාලයේ රට හැම තැනම මංකොල්ල කාරයො ගැවසෙනව. ඒ ගොල්ලො සේරම කිව්ව 'අපිට ඔය ඉඩම්වල ඉන්න බැහැ. අපි ඕව විකුණල සල්ලි බෙදගම්මු' කියල.''

''හොඳයි මේ සල්ලි දෙන්නෙ කාගෙ අතට ද''යි වං ලූං සැක සහිතව ඇසුවේය.

''නාකි රදළ තැනගෙ අතට නේ? වෙන කාගෙ අතට ද''යි ගැහැණිය මෘදු ලෙස කීවාය. රදළ තැනගේ අත් වලින් ගැහැණියගේ අත් වලට ඒ මුදල් යන බව වං ලූං ට වැටහුනේය. එහෙයින් ඔහු වෙන කිසිවක් කියන්නට ක්‍රමයක් නොමැතිව ''වෙන දවසක-වෙන දවසක'' යයි කියමින් ආපසු හැරුණේය. හැරී ගේට්ටුව දෙසට ගමන් කෙළේය. ඇය ඔහු පසුපස ගමන් කරමින්, ඔහු වීථියට බට පසු ද කෑගැසුවාය.

''හොඳයි හෙට මේ වෙලාවට – මේ වෙලාවට නැත්නම් අද සවස. කොයි වෙලාවත් එකයි.''

නිරුත්තරව වීථියට බට ඔහුට ඇය කියූ දෙය ප්‍රහේලිකාවක් වුයෙන් ඒ ගැන සිතන්නට ද කාලයක් අවශ්‍ය විය. ඔහු කුඩා තේ කඩයකට ගොඩවී තේ කෝප්පයක් ගෙන එන්නට අණ කෙළේය. සේවක කොලුවා එය ගෙණවුත් මේසය මත දක්ෂ ලෙස තබා එයට ගෙවුනු පැන්සය ද ගෙන සාවඥව උඩ වීසි කරන්නට විය. වං ලූං ඒ පවුලෙහි පිරිහීම ගැන සිතමින් එම පරිහානිය තුච්ඡ දෙයක් හැටියට සලකමින් ''ඒක එහෙම සිද්ද උනේ ඔවුන් ඉඩම් අත්හළ නිසා'' යයි තමාට ම කියා ගත්තේය.

මේ අතර හදිසියෙන් ම ඔහුට සිහිවුනේ වසන්තයේ උණ කොපිලිමෙන් වැඩෙන තම දරුවන් දෙදෙනාය. ඔවුන්ගේ ඇට හා ලේ වලට තම ඉඩම පිළිබඳ හැඟීම්–මේ සාර භූමිය පිළිබඳ හැඟීම ඇතිකිරීම පිණිසත් උදැල්ලේ පහස ඔවුන්ගේ අත් වලට දැනවීම පිණිසත් අද ම හිරු රැසින් නැහැවී නැහැවී ක්‍රීඩා කරණ ඔවුන් කුඹුරු වැඩවල යෙදවීමට අදහස් කෙළේය, ඉටාගත්තේය. හැම විටම මැණික්වල ස්පර්ශයත් බරත් දැනෙන්නට වූයෙන් ඔහු තුළ බියක් ද ජනිත වුනි. එම මැණික්වල පැහැය තම වැරහැලි තුළින් දක්නට ලැබේ දෝ යන හැඟුමක් ද ඔහුට පහළ වුනි. එය කිසිවෙකු දුටුවහොත් ''මෙන්න මෙන්න දුප්පතෙක් අධිරාජයෙකුගේ වස්තුව ගෙණියනවා'' යයි කෑගසතියි ද ඔහුට සිතුනි. එහෙයින් ඒවා ඉඩම් බවට පෙරළෙන තුරු ඔහුට විවේකයක් නම් නොවීය. ඔහු කඩකාරයා නිකම් සිටින අවස්ථාවක් බලා කථා කෙළේය.

''මෙහේ එනවකො මාත් එක්ක තේ එකක් බොන්න. මට මේ නගරයෙ ආරංචි ටිකක් කියනවකො! මම මේ සීත කාලෙ පිට ගිහින් හිටිය නේ'' යයි වං ලුං ඔහුට කීවේය.

කඩකාරයා මෙවැනි කථා වලට කවදත් සූදනම් වූවෙකි. විශේෂයෙන් තමාගේ. තේ පන්ගුව අනුන්ගෙන් නොමිලයේ ලැබේ නම් ඔහු එයට වඩාත් කැමතිය. කුඩා මුගටි මුහුණක් හා විරූප වූ ඇසක් ඇති ඒ මිනිසා වං ලුං ගේ මේසය ළඟ වාඩි වුනේය.

මේ කඩකාරයා ඇඳ සිටියේ සණ ඇඳුම් කට්ටලයකි. කබායේ සහ කලිසමේ ඉදිරි කොටස කුණු තැවරීමෙන් කලු වී ගොස් තිබුනි. තේ වතුර මෙන්ම තමා ම සෑදූ කෑම වර්ග ද විකුණන ඔහු ''හොඳ කෝකියෙකු ට පිරිසිදු කබායක් නැත'' යන ප්‍රස්තාව පිරුළ නිතරම කියන්නට පුරුදුව සිටියේය. එහෙයින් කිලිටුව සිටීම යුක්ති සහගත බවත් අවශ්‍ය බවත් ඔහුගේ හැඟීම විය. වං ලුං ළඟ වාඩි වී ඔහු එකවරටම කථාවට වැටුනේය.

''හා! මොනවද මිනිසුන්ගෙ හාමත හැරෙන්නට මේ නගරයෙ තියෙන ලොකුම ආරංචිය හ්වෑං මැඳුරෙ මංකොල්ලය තමා'' යයි ඔහු කීවේය. වං ලුං අසන්නට බලාපොරොත්තු වුනේ ද එය මැයි. කඩකාරයා ද කැමැත්තෙන් ම එය කියන්නට වූයේය. ඉතිරි වූ දසියන් කෑගැසූ අයුරු, ඔවුන් ගෙනගිය අයුරු, වෙසඟනන් දූෂ්‍ය කොට පන්නා දැමූ අයුරු, සමහරෙකු ඔවුන් ගෙන ගිය අයුරු, දුන්

කිසිවෙකු එහි වසන්නට අකමැති හැටි යන ආදී සියල්ලක් ම ඔහු විස්තර කෙළේය. ඔහු මේ විස්තරය අවසන් කෙළේ "එහේ දැන් කවුරුවත් නැහැ ඉන්නෙ නාකි රදළය විතරයි. දැන් එයත් කෝකිලා කියන දසියකුට යටත් වෙලයි ඉන්නෙ. ඈ හරිම හරි කෛරාටික ගෑණියෙක්. අවුරුදු ගණනක සිට රදළයගෙ කාමරයේ මයි ඉන්නෙ" යන වචන පවසමිනි.

"එතකොට මේ ගෑණිට බලයක් එහෙම තියෙනවාද්ද"යි කඩකාරයාගේ කථාවට ආසාවෙන් කන්දුන් වං ලුං ඇසුවේය.

"දැනට නම් ඇයට ඕනම දෙයක් කරන්න පුළුවන්. මේ දිනවල ඇය අල්ලගන්න හැකි සේරම අල්ලගන්නව. ගිලින්න හැකි සේරම ගිලිනව. නමුත් තරුණ රදළගොල්ල පිට පළාත්වල වැඩ පිළියෙළ කරගෙන කවද හරි ආපසු ඒවි. එතකොට ඈ පිටවී යාවි. දැන් ඈ අවුරුදු සීයක් ජීවත් වුනත් මුළු ජීවිත කාලයටම සෑහෙන්න හරිහම්බ කරගෙන තියෙනවා" යයි කඩකාරයා පිළිතුරු දුන්නේය.

"එතකොට ඉඩම්?" යයි වං ලුං අන්තිමේ දී ඇසුවේ ආසාවෙන් ගැහෙමිනි. "ඉඩම්?" යයි කඩකාරයා ද හිස් හඬින් පුනරුච්චාරණය කෙළේය. ඇත්තවසයෙන්ම කඩකාරයාට මේ "ඉඩම්" යන්න කිසිම වැදගැම්මකට ඇති දෙයක් නොවිය.

"මොකෝ ඒව විකුණන්න දල ද"යි වං ලුං නොඉවසිලිමත්ව ඇසුවේය. "ඕ! ඉඩම් ද"යි කඩකාරයා යළිත් නොසැලකිල්ලෙන් පිළිතුරු දුන්නේය. එවිටම තවත් අයෙකු බඩු ගන්නට කඩයට ගොඩ වූ හෙයින් කඩකාරයා අසුනෙන් නැගිට යන ගමන්ම "මේ පසුගිය පරම්පරා හයේම මිනී වළලපු කොටස් ඇරෙන්න අනිත්ව ඔක්කොම විකුණන්න දල" යයි කීවේය.

වං ලුං ද අසාගන්නට පැමිණි දෙය ඇසූ හෙයින් එතෙක් වාඩි වී සිටි පුටුවෙන් නැගිට කඩයෙන් වීථියට බැස ආපසු අර විසාල ගේට්ටුව වෙත ගමන් කෙළේය. ඔහු එසේ ගේට්ටුව වෙත ළඟා වෙත් ම ගැහැණිය දෙරටුව විවෘත කළාය. එහෙත් ඔහු දෙරටුවෙන් ඇතුළු නොවීම මෙසේ කීවේය.

"මට කලින්ම කියාපන් විකුණුම් ඔප්පුවට නාකි රදළය එයාගෙ මුද්‍රාව තියාවිද කියන එක."

වං ලුං ඒ වචන කියන විට ගැහැණියගේ ඇස් ඔහු වෙත යොමුවී තිබුනි. ඇය ආසාවෙන් උත්තර දුන්නාය.

''ඔව්! එයා ඒක කරාවි! එයා ඒක කරාවි! මගේ පණ උනත් ඇපයට තැබිය හැකි'' යයි ඈ කීවාය.

''උඹ ඉඩම් විකුණන්නෙ රත්තරන් වලට ද, රිදී වලට ද, මැණික් වලටද?'' යි එවිට වං ලුං කෙළින්ම පිළිවිසියේය.

එයට උත්තර දුන් ගැහැණියගේ ඇස් දිලිසෙන්නට වුනි. ඈ මෙසේ කීවාය.

''මම ඒව මැණික් වලට විකුණන්නම්.''

Scanned by CamScanner

ඒක් නගුලක් ඇති එක් මිනිහෙකුට හාන්නට හැකි පමණට වැඩි තරම් ඉඩම්, දූන්, වං ලුං ට තිබේ. ඔහුට ලැබුන අස්වැන්න ද එක මිනිහෙකුට අටුවේ තබන්නට හැකි ප්‍රමාණයට ද වැඩි තරම්ය. එහෙයින් ඔහු තමාගේ ගෙට තව කාමරයක් එකතු කෙළේය, බූරුවෙකු ද මිලදී ගත්තේය.

දිනක් ඔහු තම අසල් වැසි වීං ට කථාකොට "උඹේ ඔය පුංචි ඉඩම් කොටස මට විකුණල, උඹේ ඔය පාලු ගේ අත්හැරල, මගේ ගෙට ඇවිල්ල මගේ ගොවිතැන් වැඩට උදව් දියන්" යයි කීවේය. වීං ද එසේ කෙළේ මහත් සන්තෝෂයෙනි.

ඉන් පසුව නාම් කලට වැසි ලැබුණි. එබැවින් ගොයම් පැලද වැඩුනේය. තිරිඟු කපා, කරල් විසාල මිටිවලට බැඳගත්තාට පසු වතුරෙන් පිරුණ කුඹුරුවල ඒ දෙමහල්ලෝ එකතුව ගොයම් පැල සිට වූහ. තමන් කිසි දිනක නොසිට වූ පැල සංඛ්‍යාවක් වං ලුං ට මේ අවුරුද්දේ සිටවන්නට හැකි වීය. මේ වාරයෙහි වර්ෂාව ඉතා තදින් ලැබුන නිසා මෙයට කලින් වියලී තිබුන ඔහුගේ ඉඩම, මේ වසරෙහි පැල සිටවන්නට සුදුසු තත්වයක පැවතුනේය. එහෙයින් ම මේ වතාවේ අස්වැන්න වීං ට හා වං ලුං ට තනිවම කපාගත හැකි නොවීය. කුලියට ගත් ගම් වැසියන් දෙදෙනෙකුගේ ද සහාය ලැබ ඔවුහු අස්වැන්න කපා පාගා ගත්හ.

"හ්වෑං" නිවාසයෙන් මිලයට ගත් කුඹුරුවල වැඩ කරද්දී, ඒ පිරිහුණු විසාල පවුලේ කම්මැලි රදළ තරුණයන් ගැන වං ලුං ට සිහි වුනේය. එම සිහිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහු, සෑම උදයකම

Scanned by CamScanner

තමා සමග කුඹුරට පැමිණෙන ලෙස තම පුතුන් දෙදෙනාට ද අණ කෙළේය. ඔවුන්ගේ කුඩා අත්වලින් කළහැකි අත්දමේ බුරුවා හෝ හරකා දක්කාගෙන ඒම වැනි වැඩක් ඒ දරුවන්ට පවරණ ලදී. වැඩක් කළ නොහැකි වුවත් තමන්ගේ සිරුරට වැටෙන හිරු රැස් වල උෂ්ණය ත්, හිච්ච දිගේ එහාට මෙහාට යෑමේ මහන්සියත් ඔවුන් විසින් වටහාගත යුතුය යනු වං ලුං ගේ අදහස විය.

දුන් තමා දුප්පතෙකු නොවන නිසාත් මේ අවුරුද්දේ තරම් යහපත් අස්වැන්නක් කොයිම කලකවත් නොලැබුන නිසාත් වුවමනා නම් දුන් තමාට වැඩකරුවන් කුලියට ගත හැකි නිසාත් ඔහු, ඕලැංට කුඹුරෙහි වැඩ කරන්නට ඉඩ දුන්නේ නැත.

අස්වැන්න ගොඩගැසීමෙන් ගෙයි ඇවිදීමට තරම්වත් ඉඩ කඩ නොමැති වී ගිය හෙයින් ගෙට තවත් කාමරයක් එකතු කිරීමට ඔහුට සිදුවුනේය. අස්වැන්න එකතු කරණ විට විසිරියන ධාන්‍ය වර්ග කා දැමීම සඳහා ඔහු ඌරන් තිදෙනෙක් ද කුකුළු රංචුවක් ද මිලදී ගත්තේය.

එතැන් පටන් කුඹුරට නොගිය ඕලැං ගෙදර සියළුම වැඩ කළාය. ඇය එහි සැම කෙනෙකුටම අළුත් ඇඳුම්, සපත්තු ආදිය සකස් කළාය. ගෙහි සැම ඇඳකටම අළුත් පුළුන් පිරවූ මල් මැසූ කොට්ට උර සහිත කොට්ට පිළියෙළ කළාය. මෙසේ ඔවුහු ඇඳුම් වලින් හා ඇතිරිලි කොට්ට මෙට්ටවලින් ද පෙර කිසි කලෙකත් නොවූ තරම් පොහොසත් බවක් ද ලැබූහ. මේ අතර ඇය තම ඇඳෙහි වැතිර දරක ප්‍රසූතියක් ද කළාය. ඇය එසේ කෙළේ වෙනද මෙන්ම කිසිවෙකුගේ උපකාරණයක් – පිහිටක් – සාත්තුවක් නොලබාය. මේ වාරයේ මේ සඳහා ගැහැණියක තෝරාගැනීමට ඇයට හැකිව තිබුනේය. එහෙත් වෙනද මෙන්ම මේ වරද තනිවම දරක ප්‍රසූතිය කිරීමේ ක්‍රමයම ඇය තෝරා ගත්තාය.

මේ වර ඇයගේ ප්‍රසූතියට බොහෝ වේලාවක් ගතවුනේය. එදින සවස වං ලුං ගෙදර එන විට තම පියා දෙරකඩ හිඳගෙන සිනා සෙමින් ඔහුට කථා කොට ''මේ වර කහමද දෙකේ බිත්තරයක්'' යයි කියමින් සිනාසුනේය. පියාගේ ඒ වචන අසමින් කාමරයට ඇතුළුවුන වං ලුංට දක්නට ලැබුනේ අළුත උපන් දරුවන් දෙදෙනාද සමග ඇඳෙහි දිගාවී සිටි සිය බිරියයි. පිරිමි දරුවෙකු හා ගැහැණු දරුවෙකු වූ මේ දෙදෙනා ඔහුට පෙනුනේ එකට සමවූ ධාන්‍ය ඇට දෙකක් මෙන්ය.

Scanned by CamScanner

ඔහු ඇගේ මේ කාය්‍යීය ගැන – මේ ප්‍රසූතිය ගැන දහකාර සිනහවක් පහළ කෙළේය. ඉන් පසු ඔහු කවට කමක් කරන්නට සිතමින් ''එක තමයි උඹ අර මුතුඇට දෙක පපුවෙ තියාගත්තෙ'' යයි කීවේය. එසේ කියා ඔහු සිනහ පහළ කෙළේය. ඕලැං ද ඔහුගේ ප්‍රීතිමත් විලාසය දැක වේදනා සහගතව සිනහවක් පහළ කළාය.

මේ වර නම් කිසිම කණගාටුදයක සිදුවීමක් ඔවුනට නොවීය. වැඩිමහළු දියණියට එතෙක් කථාකිරීමට හැකියාවක් නොමැති වීමත් ඇය වයසට සුදුසු දේවල් නො කිරීමත් පමණකි. මේ දවස් වල ඔවුන් තුළ පැවති කණස්සල්ලට හේතුවන එකම කාරණය. ඒ වැඩිමහළු දියණියට කළහැකි එකම කාය්‍යීය වූයේ තම පියා තමන් දෙස බලන විට ළදරු සිනහවක් පහළකිරීම පමණකි.

ඇයට මෙබඳු ජීවිතයක් ගතකරන්නට සිදුවුනේ ජීවිතයේ පළමු වසර බියකරුවූ නිසාය – හාමතෙන් ගතකරන්නට වූ නිසා ය. මෙසේ දෛවොපගත ඇගේ මුවෙන් වචන පිටවෙන තුරු මසක් මසක් පාසාම වං ලුං බලාපොරොත්තුව සිටියේය. අනික් දරුවන් මෙන් ඇය ද ''තාත්තේ'' යයි තමාට අමතන දිනය ගැන ඔහු නොඉවසිලිමත් වූයේ ය. එහෙත් කිසිම ශබ්දයක් ඇය පිට නොකළාය. ඇය සැම විටම කෙළේ ඇගේ මිහිරි බොල් සිනහව පමණකි. එබැවින් ඇය දෙස බලන වං ලුං ''පුංචි මෝඩි, මගේ දුප්පත් පුංචි මෝඩි!'' යයි කෙඳුරුවේය.

''මම මේ පුංචි පැටියව වික්ක නම්, උන්ට මේ බව තේරුම් ගියවිට ඇය මරා දමාවි'' යයි ඔහු තමාටම කියා ගත්තේය. ඔහු, මේ දරුවා නිතරම ආශ්‍රය කෙළේ ඇය සැනසීමටය; තමා සමග කුඹුරටද ඇය ගෙන ගියේය. සමහරවිට ඇය එහිදී නිශ්ශබ්දව ඔහු පසුපස ගමන් කළාය. ඔහු ඇය ගැන සඳහන් කොට කථා කළ විට ඇය සිනහ පහළ කළාය. වං ලුං ද ඔහුගේ පියා ද ඔහුගේ පියාගේ පියා ද තම තමන්ගේ මුළු ජීවිත කාලය ගතකළ මේ ප්‍රදේශය අවුරුදු පහකට පමණ වරක් සාගතයකට ගොදුරු වීම සිරිතක් වසයෙන් පැවතුනේය. දෙවිවරු කරුණාවන්ත වුවහොත් – කලට වැසි වට හොත් අවුරුදු හතකට අටකට හෝ සමහර විට දහයකට වරක් මේ සාගතය සිදුවෙයි. බොහෝ විට මේ සාගතය සිදුවන්නේ වැසි වැඩි වීමෙන් හෝ නැති වීමෙනි. එසේ නො වුවහොත් උතුරේ ගංගා ඉතිරීමෙන් ද ඈත කඳුවල හිම පතනයෙන් ද මෙය

Scanned by CamScanner

සිදුවෙයි. එසේ ගලන ගංවතුර රටපුරා පැතිරී යන්නේ ශතවර්ෂ ගණනක සිට ජල ප්‍රවාහ වේගය නතර කිරීමට බැඳ තිබෙන බැමි ද බිඳගෙන ඒවා යට කරගෙන කුඹුරුවලටය.

එහෙයින් එහි ගොවියෝ ඉඩම් වලින් කලින් කල පැන ගොස් යලි ආපසු එති. එහෙත් වං ලුං නම් මින්පසු එන නරක අවුරුදු වලදී ඉඩම් අත්හැර නොගොස් යලිත් හොඳ අවුරුද්දක් එනතුරු යහපත් අවුරුදුවල ලැබුනු ප්‍රතිඵල විඳිමින් කල්ගත කරන්නට හැකි වනසේ තමාගේ කටයුතු සකස් කර ගැනීමෙහි යෙදුනේය. ඔහුගේ මේ ව්‍යායාමයෙහිදී දෙවියෝ ද ඔහුට ආධාර දුන්හ. අවුරුදු හතක් ගතවන තුරුම ඔහුගේ අස්වැන්න සරු වූනේය. සැම අවුරුද්දකම වං ලුංට හා ඔහුගේ සහකාරයින්ට කපාගන්නට නොහැකි තරම් අස්වැන්නක් ඇතිවුනේය. ඔහු සැම වසරකම තම කුඹුරුවලට තව තවත් මිනිසුන් කුලියට ගත්තේය. අන්තිමේදී ඔහු කුලීකරුවන් හයදෙනෙකු ගත්තේය. ඔහුගේ පරණ ගෙයට පිටුපසින් අළුත් ගෙයක් ද සෑදුවේය. ඒ ගෙය මිදුලට පිටුපස විසාල කාමරයකින්ද මිදුල දෙපස තවත් කුඩා කාමර දෙකකින්ද යුක්ත වීය. වහලෙහි උළු සෙවිල්ලන ලදී. බිත්ති බඳිනු ලැබුවේ තම කුඹුරුවලින් ම ගත් මැටිවලිනි. ඒවා සුදුවට පිරිසිදුවට තුබුනේ සුදුහුණු ගෑවූ බැවිනි.

මේ අළුත් ගෙයි කාමරවලට ඔහුත් ඔහුගේ පවුලත් පදිංචියට ගිය හෙයින් චිං ප්‍රමුඛකොට ඇති කුලීකරුවෝ පරණ ගෙයි වාසයට ගියහ.

මේ කාලය වන විට වං ලුං, චිං ගැන හොඳ අවබෝධයක් ඇතිව සිටියේය. අන්තිමේ දී ඔහු, චිං තම වැඩ කරුවන් අතර කංකානම වසයෙන් පත්කොට සෑහෙන වැටුපක් ද දුන්නේය. ඔහු චිංට ගෙවූයේ මසකට කෑමත් දී රිදී දෙකක් පමණකි. වං ලුං, චිං ට පෙරැත්ත කර කර කෑවූ නමුත් චිං තර නොවූයේය. එහෙත් කෘශවූ කුඩාවූ ඔහු කල්පනාකාරී මිනිසෙකි. ඔහු නිතරම සතුටින් වැඩ කෙළේය - උදේ පටන් සවස් වන තෙක්ම එහේ මෙහේ දුව ඇවිදිමින් කියන්නට යමක් වෙතොත් එය දුර්වල හඬකින් කියමින් ඔහු වැඩ කෙළේය. ඔහු කථා කිරීමට වඩා නිශ්ශබ්දව සිටීම ප්‍රිය කෙළේය. ඔහු පැයක් පැයක් පාසා තම උදැල්ල උස්සමින් හෙලමින් වැඩ කෙළේය. එසේම සැම උදයක මෙන්ම සවසද ඔහු වතුර හා පෝර පිරවූ බාල්දි කුඹුරට ඇද්දේය.

Scanned by CamScanner

වං ලූං ගේ වැඩට පැමිණි කිසියම් කුලී කරුවෙකු රුක් සෙවනක් යටට වී වැඩි වේලාවක් නිදගතහොත් නැතහොත් පොදුවේ බෙද දෙන කෑම වර්ග වලින් තමාට අයිති ප්‍රමාණයට වඩා ගතහොත් එසේත් නැතහොත් ධාන්‍ය රැස් කරණ කාලයේ යමෙකු තමාගේ බිරියට හෝ දරුවාට රහසේ එන්නට කියා සුද්ධකරනු ලබන ධාන්‍යවලින් සවල්පයක් ගෙනයන්නට දුනහොත් අවුරුද්ද අන්තයේ දී ස්වාමියා ත්, වැඩ කරුවාත් එකට කන බොන විට–

''අසවල් අසවල් අය ලබන අවුරුද්දේ කැඳවන්නට එපා'' යයි විං, තමාගේ කණට කොඳුරා කියන බව වං ලූං දැන සිටියේය.

ගතවුන අග හිඟ කාලයේ දෙදෙනා අතර හුවමාරුවූ බෝංචි ඇට හා ධාන්‍ය සවල්පය නිසා ඔවුන් දෙදෙනා සහෝදරයන් මෙන් වූහ. වෙනසකට පැවතුනේ දෙදෙනාගෙන් බාලයාවූ වං ලූං වැඩිමල් තැන ගැණීම පමණකි. එසේම විං, තමා කුලියට ගත් අයෙකු බවත් ජීවත්වන්නේ වෙන අයෙකුගේ ගෙදරක බවත් සම්පූර්ණයෙන් අමතක නොකෙළේය.

පස්වෙනි අවුරුද්ද අවසන්වෙන්නට කාලය ආසන්න වෙමින් තිබුනි. මේ දිනවල වං ලූං කුඹුරුවල වැඩ කෙළේ ඉතා අඩු වශයෙනි. ඉඩම් ප්‍රමාණය අධිකවූ නිසා ඔහුගේ මුළු කාලය විඩංගු වූයේ ධාන්‍ය වර්ග වෙළඳ පොළට ගෙනයන්නටත් කුලීකරුවන්ට අණ දෙන්නටත්ය. ඔහුට මහත් පාඩුවකට පැවතුනේ පොතපත කියන්නට හා ලියන්නට නොහැකිවීමය. මේ පාඩුව ඔහුට වඩාත් දැනුනේ ධාන්‍ය වෙළඳ පොළේදී කිසියම් ප්‍රමාණයකට තිරිඟු හෝ වී කොන්ත්‍රාත්තුවක් ලියූ විට එහි තේරුම කුමක් දැයි දැන ගන්නට නගරයේ උඩඟු වෙළඳුන් වෙත ගොස් මෙසේ කියන්නට සිදුවූ විටය.

''මහත්තය! කරුණාකරල මේක කියවන්න! මම හරිම මෝඩයෙක්!''

එසේම කිසියම් කොන්ත්‍රාත්තුවකට ස්වකීය නම ලියන්නට සිදුවූ විට ඔහු වෙනුවෙන් තීන්තෙහි එබූ බුරුසුවක් ගෙන ආඩම්බර ලීලාවෙන් කවුරු හෝ ලිපි කරුවෙකු ඔහුගේ නම ලියන විට අනිත් ලිපිකරුවෝ ඔහු දෙස බලා අවඥාවෙන් තළලෙහි රැලි නැංවූහ. ඒ හැමටම වඩා ඔහු ලජ්ජාවට පත්වුනේ එසේ තමා වෙනුවෙන් ලියන ලිපිකරුවා කවට කම් කරමින් මෙසේ කියන විටය.

Scanned by CamScanner

''ලූං කියල ලියන්නෙ මකර ලයන්නෙන්ද? එහෙම නැත්තං බීරි ලයන්නෙන්ද?''

මෙහිදී ඔහුට කියන්නට සිදුවුනේ ''ඒක නමුසෙට කැමැත්තක්! මම මගේ නම දන්නෙ නැති තරමට මෝඩයෙක්!'' යන වචනයි.

එක් අස්වැන්න සමයක, මෙවැනි දිනක, ධාන්‍ය වෙළඳ පොළෙහි ලිපිකරුවන්ගේ සිනහ හඬක් ඔහුට විඳින්නට සිදු වීය. එසේ සිනහ හඬ නැගුවන් අතර අනුන්ගේ ඕප දූප දෙසීමටම කල්ගෙවන කම්මැලි රස්තියාදුකාර මිනිස්සුද, වං ලූං ගේ පුත්තුන්ට වඩා වැඩිමල් නොවූ කොල්ලෝද වූහ. ඔවුන්ගේ සිනහ හඬ අසා තම ඉඩම් උඩින් ගෙදර යන ඔහු කෝපයට පත්ව තමාටම මෙසේ කියාගත්තේය.

''ඔය නගරයෙ ඉන්න එක මෝඩයෙකුටවත් එක ඉඩම් අඟලක් නැහැ. නමුත් උන්ට හිනහ වෙන්න හැකිවෙලා තියෙන්නෙ මට ඔය කරදසි කොලවල අඳින ලකුණු කියවන්න බැරි නිසයි.''

මෙසේ කීමෙන් පසු ඔහුගේ කෝපය නිවී ගියේය. ඔහු එදින ගෙදර ගියවිට තම වැඩිමහල් දරුවා තමාවෙත කැඳෙව්වේ ''මට ලියන්න කියන්න බැරිකම ලජ්ජාවට කරුණක් තමා. මම–මගේ වැඩිමල් පුතා කුඹුරු වැඩෙන් අස්කල්ල ඉස්කෝලෙකට යවනව ඉගෙන ගන්න. ඊට පස්සෙ වෙළඳ පලට ගියහම මා වෙනුවෙන් ලියකියමන් වැඩ එයා කරාවි. එතකොට ඉඩම් හිමියෙකු වන මට කරන ඔය විකාර නවතීවි''යයි සිතමිනි.

ඔහුගේ වැඩිමල් පුතා දෙළොස් හැවිරිදි වයසැති උස දරුවෙකි. මවට සමාන පළල් මුහුණකුත් ලොකු අතුත් පියාට සමාන තියුණු බැල්මකුත් ඇති ඒ දරුවා තමන් ඉදිරියෙහි සිටින විට වං ලූං මෙසේ කීවේය.

''අද හිටන් කුඹුරෙන් වරෙන්! කොත්තරාත් කියවන්නයි මගේ නම ලියන්නයි ඉගෙන ගත්ත එකෙක් මගේ පවුලට ඕන. එතකොට මම නගරයේදී ලජ්ජාවට පත්වෙන්නෙ නැහැ.''

පියාගේ මේ වචනවලින් දරුවාගේ මුහුණ ප්‍රබෝධයෙන් පැහැපත්වීය. ඔහුගේ ඇස් දිලිසෙන්නට වුනේය. දරුවා මෙසේ ද කීවේය.

''තාත්තෙ, පසුගිය අවුරුදු දෙකේම මගේ හිතෙත් ඒක තිබුන. නමුත් අහන්න බයෙන් හිටිය.''

Scanned by CamScanner

මේ කථාව ඇසූ බාල දරුවා හඬන්නටද දෙස් පවරන්නටද පටන් ගත්තේය. හැඬුම ද දෙස් පැවරීම ද ඔහුට පහසුවෙන් කළ හැක්කකි. ඔහු කථාකරන්නට පටන්ගත් කාලයේ පටන්ම කෑ ගසන, ශබ්ද නගන දරුවෙකි. තමාගේ කොටස අනුන්ගේ කොටසට වඩා අඩුනම් ඔහු නිතරම හඬන්නට – ගතු කියන්නට සූදනම්ව සිටියේය. මේ පුරුද්ද නිසා එදිනද ඔහු පියා ඉදිරියට හඬමින් අවුත් මෙසේ කීවේය.

''හා! මටත් බැහැ කුඹුරෙ වැඩ කරන්න. මගේ අයියා පුටුවක් උඩ ඉඳගෙන පහසුවෙන් මොනවත් ඉගෙන ගනිද්දි මම හරකෙක් වගේ වැඩ කරන එක හරි නැහැ. එයත් මමත් දෙන්නම ඔබේ දරුවො!''

වං ලුං ට ඔහුගේ කරච්චලය ඉවසන්නට නොහැකි විය. ඔහු හයියෙන් හඬනවිට ඕනෑම දෙයක් දෙන්නට වං ලුං සූදනම් වූයේය. එහෙයින් ඔහු ඉක්මනින් මෙසේ කීවේය.

''හොඳයි හොඳයි උඹල දෙන්නම පලයල්ල. ඉතින් දේව කෝපයකින් එකෙකුට මොකුත් උනොත් මගේ ජාවාරම් කරගන්න තවත් දනුම තියෙන එකෙක් ඉතුරු වේවි නෙව.''

ඉන්පසු ඔහු දරුවන් දෙදෙනාගේ ඇඳුම්වලට රෙදි ගෙනෙන්ට දරුවන්ගේ මව නගරයට පිටත්කර හැරියේය. ඔහු ද කරදසි කඩයකට ගියේ කරදසි ද බුරුසු දෙකක් ද තීන්ත කුඩු දෙකක්ද මිල දී ගැනීමටය. කඩකාරයා තමා ඉදිරියට අවුත් පෙන්වූ සෑම එකක් ගැනම ඔහු සැකකෙළේය. එහෙත් අන්තිමේදී ඔහු දරුවන්ට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය එම කඩයෙන් මිලට ගෙන පිළියෙළ කරගත්තේය.

ඔහු දරුවන් දෙදෙනා පිටත් කරන්නට අදහස් කෙළේ නුවර දොරටුව අසළ තිබුන කුඩා පාසැලකට ය. මේ පාසැල පවත්වනු ලැබුවේ පසුගිය අවුරුදුවල ආණ්ඩුවේ විභාගවලට ගොස් අසමත් වූ මහළු මිනිසෙකු විසිනි. මේ මහළු මිනිසා ජීවත්වූ ගෙයි මැද කාමරය ඉගැන්වීම සඳහා වෙන්කොට තිබුනි. ඔහු සෑම අවුරුදු දිනයකම යෙදෙන උත්සවයට අවශ්‍ය මුදල් සපයා ගත්තේ එසේ දරුවන්ට අකුරු ඉගැන්වීමෙනි. මෙහි ඉගෙන ගන්නා ලමයින් කම්මැලි වුවහොත් නැතහොත් උදේ සිට සවස් වනතුරු පාඩම් කළ පාඩම කියන්නට බැරිවුවහොත් තමාගේ හකුලන ලද අවානෙන් පහර දීම ඔහුගේ සිරිතකි. මෙහි ලමයින්ට විවේකයක්

ලැබුණේ වසන්තයේ හා ගිම්හානයේ උණුසුම් දිනවල පමණකි. එබඳු දිනවල මහල්ලා දහවල් කෑමෙන් පසු නිදගනියි. එවිට ඒ කුඩා අඳුරු කාමරය ඔහුගේ නින්දේ ශබ්දයෙන් පිරීයයි. මේ අතර එහි ළමයි එකට එකතුව කොඳුරමින් ක්‍රීඩා කරමින්, අතන මෙතන විකාර රූප අඳිමින් කල් ගෙවති. ඇතැම් විටක ඔව්හූ මහල්ලාගේ එල්ලෙන විවරවූ හනුපෙදෙසෙන් ඉගිලී යන මැස්සෙකු දක සිනාසෙති; මේ මැස්සා මහළු ගුරුතුමාගේ මුඛ විවරයට ඇතුළු වේද නැද්ද යන ආදී ප්‍රශ්න නගමින් ඔට්ටු ඇල්ලීමෙහි ද යෙදෙති. එහෙත් හදිසියෙන්ම ඇස් ඇර බලන මහල්ලාට කොල්ලන්ගේ ඔලමොලකම් අසුවෙයි. එවිට ඔහු උන් සියළු දෙනාම අල්ලා ගෙන එකිනෙකාගේ ඔළුවලට තම අවානෙන් පහර දෙයි.

ඔහුගේ අවානේ හඬද දරුවන් අඬන ශබ්දය ද අසා අසල් වැසියෝ ''අන්න හොඳ ගුරුවරයෙක්'' යයි කියති. වං ලුං ද තමාගේ දරුවන් ඒ පාසැලට යැවිය යුතුයයි තීරණය කළේ ඒ මේ කරුණු නිසාය.

ප්‍රථම දිනයෙහි දරුවන් පාසැලට එක්කරගෙන ගිය වං ලුං දරුවන් ඉදිරියේ ගමන් නොකෙළේ පියා ද පුතුන් ද එක පේළියට යෑම නුසුදුසු වූ හෙයිනි. ඔහු එද නිල් ලේන්සුවක පිරවූ බිත්තර වගයක් ගුරුතුමාට තෑගි වශයෙන් දුන්නේය. මහළු ගුරුතුමාගේ විශාල තඹ කන්නාඩි කුට්ටමටද දිග කළුවන් ලිහිල් කබායටද විශාල අවානටද බිය වූ වං ලුං ඔහුට ආචාරකොට මෙසේ කීවේය.

''මහත්තය, මෙන්න මගේ මොකුත් නොදන්න පුත්තු දෙන්න. ඉතින් මුන්ගෙ හිස් ඔළුවලට යමක් දන්න නම් මුන්ට තළන්නම ඕන. ඔබතුමාට මාව සතුටු කරන්න ඕන නම් උන්ට තළල මොනාව හරි උගන්වන්න.''

ඔහු මෙසේ කියද්දී ඔහුගේ දරුවන් දෙදෙනා බංකුවල වාඩිවී හුන් සෙසු ළමයින් දෙස බලා ඉඟි මැරුහ – විරුත්තුහ – උසුළු විසුළු කළාහ. සෙසු ළමයිද ඔවුන් දෙදෙනාට එසේ කළහ. දරුවන් දෙදෙනා පාසැලෙහි නවතා පෙරළා ගෙදර යන වං ලුං ගේ හදවත ආඩම්බරයෙන් පිපිරෙන්නාට තරම් ලංවූයේ පන්තිකාමරයෙහි සිටි ළමයින් අතර උසින්ත් ශක්තිමත් කමින්ත් පැහැපත් කමින්ත් තම දරුවන් දෙදෙනාට සමවන එකෙකුවත් එහි නැතැයි ඔහුට හැඟුන හෙයිනි. නගරයේ දෙරවුව පසුකරන විට ගමෙහි සිට

පැමිණෙන අසල් වැසියෙක් ඔහුට මුණගැසුනේය. අසල් වැසියාගේ විමසීම්වලට උත්තර දුන් වං ලූං, ''මම එන්නෙ මගේ දරුවන් ඉගෙන ගන්න ඉස්කෝලෙ ඉඳල'' යයි කීවේය. අසල්වැසියාගේ විශ්මයාකූල ස්වභාවය දුටු ඔහු ''මගේ කුඹුරුවලට උන් දුන් මීත කරන්නෙ නැහැ. උන් ඔන්න ඔහේ පුළුවන් තරම් අකුරු ඉගෙන ගන්නාවෙ'' යයි කීවේ මහත් නොසැලකිල්ලෙන් මෙනි.

එහෙත් ඔහු පසුකර යන්ම ඔහු තමාටම මෙසේ කියාගත්තේය. ''වැඩිමලා නම් ඔහොම ඉගෙන ගෙන ලොකු උගතෙක් වෙන එකත් මට නම් පුදුමක් නොවෙයි.''.

එතැන් පටන් ඒ දරුවන් දෙදෙනා ''වැඩිමලා'' හා ''බාලයා'' යනුවෙන් ප්‍රකට නොවූහ – හඳුන්වනු නොලැබූහ. ගුරුතුමා විසින් ඔවුනට නම් තබන ලදි. මහළු ගුරුතුමා ඔවුනට නම් තැබුවේ පියාගේ රැකීරක්ෂා ආදිය ගැනද අසා දැන ගැනීමෙන් පසුවය. ''නුන් එං'' හා ''නුන් වෙං'' යනු ඔවුන් දෙදෙනාට තබනු ලැබූ නම් ය. මේ දෙදෙනාගේ නම් වල මුලට යෙදූන ''නුන්'' යන්නෙහි අදහස වූයේ ''තමාගේ ධනය පොළොවෙන් ලබාගන්නා'' යනුයි.

Scanned by CamScanner

මෙසේ වං ලුං තම භාග්‍යය තමා විසින්ම ගොඩනගා ගනු ලැබුවේ සත්වසරක් ඇතුළතදීය. සත්වන වසරෙහිදී උතුරේ මහා ගංගාව ගලායන්නට පටන් ගත්තාය. තද වර්‍ෂාවත් හිම පතනයත් නිසා සියළුම බැමි බිඳගෙන කුඹුරු වතුපිටි ආදිය යටකරගෙන ඒ ගංගාව උතුරා යද්දී ද වං ලුං බිය නොවී ය. ඔහුගේ ඉඩම් වලින් එකක් දෙකක් මිනිසෙකුගේ කරවට පොවනතෙක් වතුරෙන් යටවී යද්දී ඔහු නොසැලී සිටියේ ය.

වසන්තයේ අවසානයෙහිත් ගිම්හානයේ මුල් භාගයෙහිත් ගඟෙහි ජලමට්ටම තව තවත් නගින්නට වුනි. අවසානයේ එය මහ මුහුද මෙන් පැතිර සිටියේ දූකුම්කලු–නිශ්චල දියට යටවූ උණ ගස් හා පන් වර්ග ද ආකාශය හා සඳ ද වලාකුල් ද පිළිබිඹු කරගනිමිනි. මිනිසුන් විසින් තැන් තැන්වල අත්හරින ලද මැටි ගෙවල් වතුරෙහි ගැලී තිබුනි. එහෙත් ටික දිනකින් ඒවා ද වතුරට සේදී ගියේ ය. වං ලුං ගේ ගෙය මෙන් කඳුගැට මත සෑදූ ගෙවල් හැරෙන්නට අන් හැම ගෙයකටම සිදුවුනේ එයයි. එබඳු කඳුගැට වතුරෙහි නැගී සිටිනු පෙනුනේ දූපත් මෙන්ය.

මේ ජලගැල්ම පවත්නා කාලය තුළ මිනිසුන් ගමනා ගමනය කෙළේ ඔරු පාරු වලිනි. පෙර මෙන්ම සාගතයෙන් පෙළුන අය ද ඇතිවූහ. එහෙත් වං ලුං බිය නොවූයේ ධාන්‍ය ගබඩා ඔහුට ණයව සිටි නිසාත් පසුගිය දෙවසරේ අස්වැන්න වලින් ඔහුගේ අටුකොටු පිරී තිබුන නිසාත්ය. ඔහුගේ ගෙය ද ජලගැල්මට බොහෝ දුරින් පිහිටා තිබුනේය.

Scanned by CamScanner

තම ඉඩම් වලින් වැඩි කොටසක් ජලගැල්ම නිසා වගා කරන්නට නොහැකි වූ හෙයින් ජීවිතයේ කිසි දිනකටත් වඩා කම්මැලි ජීවිතයක් මේ දවස්වල වං ලුං ට ගතකරන්නට සිදුවුනි. කම්මැලිව යහපත් ආහාර ගනිමින් කල් ගෙවූ ඔහු හැකිතරම් නිදගෙන හැකි සෑම වැඩක්ම කෙළේය. ඔහු වඩාත් ම නොසන්සුන් බවට පත්වුනේ මුළු අවුරුද්දකටම සෑහෙන්න එකවරකට මුදල් ගෙවා ගත් කුලීකරුවන් රැසක් ද එහි සිටි නිසාය. තමාගේ බත් කමින් සිටින මේ අය වතුර බැස යන තුරු කම්මැලි කමින් කාලය ගත කරද්දී තමා වැඩ කිරීම ද මෝඩ ක්‍රියාවක් ලෙස වං ලුං ට වැටහුනේය. එහෙයින් වං ලුං ඔවුනට පැරණි ගෙයි වහළය අළුතෙන් සෙවිලි කරන්නට ද අළුත් ගෙයි වහළෙහි දිය කාන්දුවන තැන්වල උළු සකස් කරන්ට ද උදළු–නගුල් ආදිය අළුත් වැඩියා කරන්ට ද හරකුන් කවන්නට ද තාරාවුන් ඇති කරන්ට ද කඹ අඹරන්නට ද අණ කෙළේය.

ඔහු කුඹුරු වැඩ කළ කාලයේ දී නම් ඒ සියළුම වැඩ කරණ ලද්දේ ඔහු විසිනි. මේ දිනවල ඒ සියල්ලක්ම ඔහුගේ සේවකයන් විසින් කරණු ලැබූ හෙයින් ඔහු විසින් කළයුතු කිසිවක් නොවීය.

මිනිසෙකුට සෑම දිනකම හිඳගෙන වතුර විලක් දෙස බලා–ගෙන සිටීම කළනොහැකි වැඩකි. එමෙන්ම වරකට සෑහෙන පමණට වඩා කෑම ද කළ නොහැකි වැඩකි. සීමාවක් ඇතිව නිදගන්නා මිනිසෙකුට නිද ගැණීමෙන් ද කාලය ගතකළ නොහැකිය. එබඳු දුෂ්කරතාවලට මැදිවුන වං ලුං ට ද තමාගේ උණුසුම් ශක්තිමත් රුධිරයට තම ගෙයි නිශ්ශබ්ද බව වැඩි තරම් යයි වැටහුණි.

මේ දවස් වන විට මහල්ලා ද ජීවත්වුනේ අතිශයින්ම දුබල තත්වයකිනි. අඩක් අන්ධ වූ ඔහු සම්පූර්ණයෙන්ම බිහිරිය. ''කොහොමද දූන් සීතලද? කෑම ලැබුණද? තේ වුවමනාද?'' යන ආදී වචන හැර වෙන කිසිවක් එහි වැසියෙකු ඔහු හා කථාකරන්නට අදහස් කෙළේ නැත. එමෙන්ම වං ලුං නොඉවසිලිමත් වූයේ ''තමා කොතරම් පොහොසත් ද'' යි තම පියාට නොවැටහීම ගැනය.

පසුගිය කාලයේ මෙන්ම මේ දවස්වල ද මහල්ලාගේ බඳුනෙහි තේ කැබලි තිබෙනු දුටුවහොත් මහල්ලා සෑමවිටම තොල් මතුළේ ''මට වතුර ටිකක් ඇත්නම් ඇති. තේකොළ හරියට රිදී වගේ''යයි කියමිනි.

Scanned by CamScanner

ඔහුට මොහොතකින් කියූ දෙය වහා අමතක වී යන හෙයින් යමක් කියා අවබෝධ කරවීම ද එතරම් පහසු කාර්‍යයක් නොවීය. ඔහු තමාගේම ලෝකයට පිවිස තමාගේම තරුණ කාලය ගැන හා ශක්තිමත් කාලය ගැන සිහින දකිමින් කාලය ගතකළ නිසා වර්තමානයේ සිදුවන දේවලින් ඔහු දුටුවේ ඉතා ස්වල්පයකි.

මේ දින වල වං ලුං ගේ වැඩිමහළු දියණිය ද කිසිවක් කථා නොකර, සෑමවිටම තම සීයා සමීපයට වී හිඳගෙන, රෙදි පටියක් අඹරමින් යලි යලිත් එය නමමින්, එයට සිනා සෙමින් කාලය ගත කළාය.

මේ දෙදෙනාටම ධනවත් කාර්‍යශීලී මිනිසෙකුට කියන්නට තරම්–සාකච්ඡාකරන්නට තරම් දෙයක් නොතිබුනි.

මහල්ලාට තේවතුර භාජනයක් ගෙනවුත් දී බොහෝ විට වං ලුං කෙළේ තම වැඩිමහළු දැරියගේ කම්මුල අතගෑමය. එයින් ඔහුට දැකගත හැකිවුනේ ඇගේ මුහුණෙහි ඉක්මනට පැන නැගී ඉක්මනට මැකීයන දුක්බර සිනහ රැල්ලත් ඇගේ අඳුරු දෙනෙතත් පමණකි. ඇගේ නිසල බව ඇගේ දුකෙහි ලකුණක් බව ඔහුට වැටහුනි.

ඉන්පසු ඔහු බලන්නේ කුඩා දරුවන් දෙදෙනා දෙසය. එනම් ඕලැංගේ නිවුන් දරුවන් දෙසය. මේ දිනවල ඒ නිවුන් දරුවන් දෙදෙනා ගෙයි එහා මෙහා ප්‍රීතියෙන් දුවපැන–ඇවිද්දහ.

ටික වෙලාවක සිනාසීමකින් හා කරදරයකින් පසු නැවතත් දරුවෝ ඔවුන්ගේම ක්‍රීඩාවල යෙදෙති. එහෙයින් මිනිහෙකුට දරුවන්ගේ ක්‍රීඩාවලින්ම සෑහීමකට පත්විය නොහැක.

දරුවන් තමාගෙන් වෙන්ව ක්‍රීඩාවන්හි යෙදෙන්නට වූ විට තනි වූ වං ලුං ගේ හිතෙහි යලිත් යලිත් නොසන්සුන් බව ඇති වන්නට වුනි. එබඳු සෑම මොහොතකම ඔහු ඕලැං දෙස බැලුවේ පිරිමියෙකු ගැහැණියක දෙස බලන ආකාරය නොපිරිහෙලමිනි.

ඔහු දැන් ඇය ගැන හොඳටම දනියි. ඇය ගැන ඔහු නොදන්නා කිසිවක් නොමැත. ඇය පිළිබඳව අළුත් දෙයක් ගැන සිතන්නට හෝ බලාපොරොත්තු වන්නට ඔහුට දැන් කිසිවක් නොමැති තරම්ය.

එහෙත් මේ මොහොතෙහි තමා ඕලැං දෙස බලන්නේ "තම ජීවිතයේ පළමු වරටය" යන හැඟුමක් වං ලුං ට ඇතිවුනි. වෙනයම්

Scanned by CamScanner

කිසි පිරිමියෙකුට මෙන්ම ඔහුට ද ඇය මෙතෙක් පෙනුනේ "ඇය සාමාන්‍ය නිශ්චල ගැහැණියක්" යන බව පමණකි. "ඇය තමා අන්‍යයන්ට පෙනෙන්නේ කොයි අයුරකින් ද යන්න ගැන සැලකිල්ලක් නොදක්වන වර්ගයේ ගැහැණියකු" බව ඔහු පළමු වරට දුටුවේ මෙ ද ය–එමෙන්ම ඇගේ හිසකෙස් රළුබවත් දුඹුරු බවත් එහි කිසි කලෙකත් තෙල් නොගෑ බවත්, ඇගේ මුහුණ මහත බවත් පැතලි බවත් දළ සමින් වැසුනු බවත් ඔහු පළමු වරට දුටුවේද මෙද ය. ඇගේ වුවමනාවට වඩා විශාලවූ අඟ පසඟ වල කිසිම රූමත් බවක් ද ඔහුට නොපෙනුනි. ඇගේ ඇහි බැම මෙන්ම හිස කෙස්ද පිහිටා තිබුනේ තුනීයට ය. ඇගේ උඩු තොල ද පිහිටා තිබුනේ අතිශයින් ම පළල්වය. ඇගේ අත් පාද මහත්ව තිබුනේ ප්‍රමාණයට වැඩි තරම්ය.

මෙසේ නුපුරුදු ඇසින් ඇය දෙස බැලූ ඔහු "උඹ දිහා බලන ඕනම කෙනෙක් කියාවි උඹ නිකම්ම සාමාන්‍ය–මිනිසෙකුගෙ බිරියක්ය කියල. ඉඩම් හිමියෙකුගෙ–ඉඩම්වල වැඩට කුලීකාරයන් ගන්න මිනිහෙකුගෙ බිරියක් ය කියල උඹ දිහා බලල නම් හිතාගන්න බැරි"යයි කීවේය.

තමාට ඇය පෙනෙන අයුරු ගැන වං ලුං කථාකළ ප්‍රථමවාරය එය මැයි. දුක්බර බැලුම් පමණකින් ප්‍රථමකොට ඔහුට පිළිතුරු දුන් ඇය ඒ මොහොතෙහි බංකුවක් මත හිඳගෙන දිග ඉදිකටුවකින් සපත්තු අඩියක් මසමින් සිටියාය. යළි ඇය මැසීම නවත්වා ඉදි කටුව ද අතින් අල්ලාගෙන අඳුන්වන් දසන් පෙළ විදහා වං ලුං දෙස බලමින් "ඔහු තමා දෙස බලන්නේ පිරිමියෙකු ගැහැණියක දෙස බලන අයුරින් බව" වටහා ගත්තාය. එසේ වටහා ගනිද්දී ඇගේ උස්වූ කම්මුල් රතු පාටින් වැසී ගියේය. අනතුරුව ඇය මෙසේ කෙඳුරුවාය.

"අර අන්තිම දෙන්න උපන් ද ඉඳල මට සනීප නැහැ. මගේ ඇඟ ඇතුළේ තද ගින්දරක් තියෙනව."

ඇය එසේ සිය සැමියාට පිළිතුරු දුන්නේ සැමියා කියූ දෙය තේරුම් නොගෙනය. ඔහු තමාට දෙස් නැගුවේ තම බොලඳ බව නිසා අවුරුදු හතකින් දරුවන් නොවැදීම ගැන යයි ඇය වටහා ගත්තාය. ඇයගේ වැරදි වැටහීම තේරුම් ගත් වං ලුං පෙරටත් වඩා රළුලෙස කථාකරමින්–

Scanned by CamScanner

''මම කියන්නෙ ඒක නෙවි. අනික් ගෑණු වගේ උඹේ කොන්ඩෙට තෙල් ටිකක් ගාගන්න බැරිද? ඔය උඹ අඳින සපත්තු ඉඩම් හිමියෙකුගෙ බිරියකට සුදුසු නැහැ. දූන් උඹ එවැනි එකියක්'' යයි පිළිතුරු දුන්නේය.

මෙයට කිසිම පිළිතුරක් නොදුන් ඇය කෙළේ ඔහු දෙස නිහතමානීව බැලුවා පමණකි. එසේ බලා ඇය කළ යුතු කිසිවක් නොදත්තී පය පිට පය දමා බංකුව මත හිඳ ගත්තා ය. වං ලුං ද සුනඛියක සේ තමන් අනු ගමනය කරමින් කීකරුව සිටි ඒ අහිංසක බිරියට කළ අවඥුව ගැන ලජ්ජාවට පත්වුවත් තමා කුඹුරු වැඩ කළ දිනවල දරුවා ප්‍රසූත කළ දිනයෙහි පවා ඇය තමාට උදව් කළ බව සිහිකළත් සිතෙහි හටගත් කෝපය නම් සංසිඳීමට පත් නොවූයේය. එහෙයින් ඔහු සිතට විරුද්ධව වුව ද මෙසේ අකාරුණිකව කථා කෙළේය.

''මම මහන්සි උනා ඒ වගේම පොහොසත් උනා. ඒ නිසා මම මගේ ගෑණි හරකියක් වගේ ඉන්නවට කැමති නැහැ. ඔය උඹේ කකුල්...............''

ඔහු කියාගෙන ගිය දෙය හදිසියෙන්ම නතර කෙළේ ඇය සම්පූර්ණයෙන් ම අවලක්ෂණ බව වටහා ගෙනය. අන් හැමටම වඩා අවලක්ෂණ වුනේ බුරුල් කපු සපත්තු වලින් වැසුන ඇගේ විසාල පාද යුවලයි. ඔහු එදෙස කෝපයෙන් බලනවිට ඇය පා යුවල බංකුව යටට රිංගෙව්වාය. අවසානයේ දී ඇය තොල් මතුළේ ''මාව පුංචි කාලෙදිම විකුණපු නිසා අපේ අම්ම ඒව බැඳල නැහැ. නමුත් කෙල්ලගෙ කකුල් මම බඳින්න ඕන. පුංචි කෙල්ලගෙ කකුලුත් එහෙම බැඳල හරිගස්සන්න ඕන'' යන වචන මුවෙන් පිටකරමිනි.

වං ලුං තමා ගැනම කෝපයට පත්වුනේය. ඔහු ඇය කෙරෙහි කෝපය පහළ කළත් ඇය ඔහු හා කෝප නොවූ නිසා ඔහුට ඇති වුනේ ලජ්ජාවකි. එහෙයින් ඔහු ගැහෙමින් තම කළු කබාය ද පොරවා ගෙන – ''හොඳයි මම තේ කඩයට ගිහින් බලන්න ඕන අළුත් ආරංචි මොනවද කියල. මගේ ගෙදර ඉන්නෙ මෝඩයෝයි, මහල්ලෙකුයි දරුවන් දෙන්නයි විතරය''යි කිවේය.

මෙසේ කියා නගරයට ගමන් ගත් ඔහුට තව තවත් කෝපය වැඩිවුනේ තමාගේ මේ ඉඩම සියල්ල, ඕලැං ධනවත් ගෙදරින්

Scanned by CamScanner

ගෙන ආ මැණික් ටික නොමැති නම් මුලු ජීවිත කාලයේදීවත් මිලයට ගන්නට නොහැකි වන බවත්, එම මැණික් තමා ඉල්ලූ විගස ඇය දුන් බවත් සිහි වීමෙනි.

එසේ මෑත අතීතය ඔහුට සිහිවනවිට නැග ආ කෝපය නිසා තමා ගේම හදවතට උත්තර දෙන්නාක් මෙන් ඔහු මෙසේ කියා ගත්තේය.

"නමුත් ඇය දන්නෙ නැහැ ඇය කෙළේ කුමක්ද කියල. ඇය ඒව අරගෙන තියෙන්නෙ ආසාවට. පොඩි දරුවෙකු රතු පාට–නිල්පාට සීනිබෝල ටිකක් අල්ල ගන්නව වගේ මම ඒව සොයාගත්තෙ නැත්නම් ඇය සදහටම ඒව ඇගේ ළයේ සඟව ගෙන සිටීවි."

ඉන්පසු ඔහු කල්පනා කරන්නට වූයේ ඇය තවමත් අර මුතු ඇට දෙක තම පියයුරු අතර සඟවාගෙන සිටී ද යන්න ගැනය. කලින් ඔහුට එය, අපූරු, එහෙයින්ම වරින් වර හිතා–බැලිය යුතු, සිත්හි මවා දැකිය යුතු දෙයක් වුව ද දැන් ඔහු ඒ ගැන සිතන්නේ අවඥ සහගතවය.

මේ කාලය වන විට පියයුරු වල තිබුන දැකුම් කළු බව ද නොමැතිවුනේ දරුවන් වැදීම නිසා ඒවා වැහැරී එල්ලෙමින් තිබුන හෙයිනි. එම වැහැරුණ පියයුරු අතර තිබුන මුතු ද නිරර්ථක සේ ඔහුට වැටහුනාක් වැන්න.

වං ලුං තවමත් දුප්පතෙකු නම් එසේත් නැතහොත් ඔහුගේ ඉඩම් වලට වතුර නොගැලුවා නම් මේ කිසිත් කරදරයක් ඔහුට ඇති නොවන්නේය. ඔහුගේ සිත කරදර වලින් පිරුණත් ඔහුට මුදල් තිබුනි. ඔහු රිදී කාසි සඟවා තිබුනේ සිය ගෙයි බිත්ති වලය. අළුත් ගෙයි ගඩොල් යට ද සඟවා තිබුන රිදී කාසි ගෝණියකි. තමා බිරිය සමග නිදගන්නා කාමරයෙහි ද තබා ඇති පෙට්ටියෙහි ද රෙද්දක ඔතනු ලැබූ රිදී කාසි පොදියකි. තමන්ගේ ඇඳ යට තිබුන කළාල යට තබා වසන ලද තවත් රිදී කාසි තොගයකි. ඔහුගේ පටිය ද රිදියෙන් පිරී තිබුනේය. මුදල් වලින් කිසිත් අග හිඟයක් නැති ඔහුගෙන් මුදල් වියදම් වුනේ තුවාලය කින් ගලන ජීව රුධිරය මෙන් නොවේ. පෙර තම පටියෙහි තිබෙන මුදල්–රිදී, අත ගෑවෙන විට ද ඔහුට දැනුනේ ඔහුගේ ඇඟිලි දැවී යන්නාක් මෙන්ය. දැන් ඔහු මුදල් ඒ මේ අත වියදම් කරන්නට කැමතිය. එහෙයින් රිදී ගැන–මුදල් ගැන නොසැලකිලි

Scanned by CamScanner

මත් වූ වං ලුං තමාගේ ශක්තිමත් කාලය ප්‍රීතියෙන් ගත කිරීමට කළ හැකි දේවල් ගැන සිතන්නට විය.

දැන් කිසිවක් පෙරදී මෙන් යහපත් නොවන බවත් ඔහුට වැටහුනි. පෙර ඔහු නිහතමානීව ඇතුළු වූ තේ කඩය, දැන් ඔහුට දැනෙන්නේ පහත් නුසුදුසු එකක් හැටියට ය. පෙරදී නම් එහි කිසිවෙක් ඔහු හඳුනාගෙන සිටියේ නැත. එහි සේවකයෝ ද ඔහුට අවනත නොවූහ—සැලකිල්ලක් නොදැක්වූහ. එහෙත් මේ දිනයෙහි ඔහු කඩයට ඇතුළු වන විට එහි මිනිස්සු එකිනෙකා වැලමිටෙන් ඇන ගත්හ. එක් අයෙකු තවෙකෙකු ට මෙසේ කොඳුරනු ද ඔහුට ඇසුනි.

"ඔන්න ඔය ආවෙ අර වං කියන ගමේ වං ලුං කියන මිනිහ. ඔයා තමයි අර මහ සාගත කාලෙදි–අර නාකි රදළ තැන මරණයට පත්වුන ශීත කාලෙදි "හ්වැං" මැඳුරෙ ඉඩම් මිල දී ගත්තෙ. එයා දැන් හරි පොහොසත්!"

මේ කථාව ඇසූ වං ලුං නොසැලකිල්ලෙන් මෙන් හිඳ ගත්තේය. එහෙත් ඔහුගේ තත්වය ගැන ඇතිවූ උඩගු කම නිසා ඔහුගේ හදවත ප්‍රීතියෙන් පිරුණි. තම බිරියට පරිභව කළදිනයෙහි ම ලැබූ මේ වෙනස ඔහුගේ ප්‍රීතිය වැඩි වේලාවක් පැවතීමට හේතු නොවීය. එහෙයින් ඔහු අසතුටුව හිඳගෙන තේ බොමින් තමා සිතාහුන් තරම් මේ ජීවිතයේ කිසිවක් තුෂ්ටිදායක නොවේයයි කල්පනා කෙළේය.

"මොටො ද මම මේ කඩෙන් තේ බොන්නෙ? මෙතැන අයිතිකාරයා වපර මුගටියෙක්, එයාගෙ ආදායම මගේ කුලී කාරයෙකුගෙ ආදායමටත් අඩුයි. මට ඉඩම් තියෙනව, මගේ පුත්තුත් ඉගෙන ගන්නවා"යයි ඔහු තමාටම කියා ගත්තේය. තේ බී අසුනෙන් නැගිට්ට ඔහු කිසිවෙකු කථාකරන්නට පෙර තම මුදල් මේසය මතට වීසිකොට කඩයෙන් පිටවී ගියේය.

මේ දිනවල නගරයේ අළුත් විසාල තේ කඩයක් ද විය. එහි අයිතිකරු වූයේ වෙළඳාම ගැන හොඳ දැනුමක් ඇති "දකුණු පළාතේ" මිනිසෙකි.

මීට පෙර වං ලුං මේ තේ පැන්හල පසුකර ගමන් කෙළේ මෙහිදී සූදුවට ද සෙල්ලමට ද වෙසඟනන්ට ද වියදම් කරන්නට සිදුවන මුදල් සංඛ්‍යාව ගැන මහත් බියෙනි.

Scanned by CamScanner

එහෙත් මේ දිනයෙහි කම්මැලිකම නිසා ඇතිවුන නොසන්සුන් කමෙනුත්-- තම බිරියට අයුක්ති සහගත වූ බව හැඟීමෙනුත් මඩනා ලද ඔහු ඒ තේ පැන්හල කරා ගමන් කෙළේය. තමාගේ නොසන් සුන්කම නිසා ඔහුට එහිදී වුවමනා කෙළේ අළුත් දෙයක් ඇසීම හෝ දැකීමයි. එහෙයින් ඔහු මේ විසාල තේ පැන් හලෙහි එළිපත ද පසුකොට වීථියට පවා පෙනෙන ලෙස මේස වලින් පුරවා තිබුන, දර්‍ශනීය කාමරයට ඇතුළු වුනේය. ඔහු තමාගේ තත්වය නිසා අභීත වූයේ එහි තව තවත් ඇතුළටම ගියේය. සසල බවට පත් හදවතක් ඇති ඔහු අභීත වන්නට තැත් කරණ විට මීට අවුරුදු කීපයකට උඩදී තමා රිදී කාසි එකක් හෝ දෙකක් ඇති දුප්පතෙකු වූ බව ද තමා දකුණෙහි රික්ෂෝ අදිමින් වෙහෙස වෙමින් කල් ගත කළ බව ද සිහි වුනේය.

මෙබඳු සිතිවිලි නිසා පළමු කොට ඔහු මේ තේ කඩයෙහිදී කිසිවෙකු හා කථා නොකෙළේය. ඔහු නිශ්ශබ්දව ම තම තේ කොටස මිලයට ගෙන බොමින් විස්මයෙන් අවට බැලුවේය.

මේ තේ පැන්හල පැවැත් වුනේ විසාල මන්දිරයක ය. එහි සිවිලිම ස්වර්‍ණාලිප්ත කොට තිබුනි. මෙහි බිත්ති වල එල්වා තිබුනේ ස්ත්‍රී රූප ඇඳි සුදුවන් සේද රෙදි වලින් සාදන ලද සිතුවම්ය. වං ලුං රහසින් හා උනන්දුවෙන් මේ ස්ත්‍රී රූප දෙස බැලුවේය. ඒ සිතියම්වල තිබුන ගැහැණුන්ට සමාන ගැහැණුන් ඔහු මිහිපිට දී කිසි කලෙකත් නොදුටු හෙයින් "මේ සිහින ලොවෙහි වෙසෙන ගැහැණු" යයි ඔහු තනිවම නිගමනය කෙළේය.

මෙසේ පළමු වෙනි දිනයෙහි ඔහු මේ ස්ත්‍රී සිතුවම් දෙස බලා තමාගේ තේ කොටස වහා බී යන්නට ගියේය.

දිනෙන් දිනම තමාගේ ඉඩම්වල වතුර රඳා සිටි නිසා ඔහු ඒ විසාල තේ පැන් හලට ගොස් තේ රැගෙන නිශ්ශබ්දව හිඳගෙන තේ පානය කරමින්, රූමත් ගැහැණු රූප දෙස බලන්නට පුරුදු වුනේය. ඔහු සෑම දිනකම වැඩි වේලාවක් එහි හිඳගෙන සිටියේ ගෙදර හෝ කුඹුරුවල කරන්නට කිසිත් වැඩක් නොමැති වුන විටය. කීප පොළකම සඟවන ලද රිදී කාසි තිබුනත් ඔහු තවමත් ගොඩේ මිනිසෙකුගේ පෙනුමක් ඇත්තෙකු නිසා අවසානයක් නොමැතිව දින බොහෝ ගණනක් මේ අන්දමට ගෙවන්නට සිදුවන තත්වයක ඔහු සිටියේය.

Scanned by CamScanner

මේ ධනවත් තේ පැන් හලෙහි සිටි සියල්ලන්ම ඇඳ ගෙන සිටියේ සේද රෙදිය. එහෙත් දළ කපු රෙදි ඇඳ සිටියේ වං ලූං පමණකි. මේ නගරයෙහි කිසිවෙකුට නැති අන්දමේ දිග කෙස් වැටියක් තිබුන එකම තැනැත්තා ද ඔහුය.

දිනක් සවසක ඔහු තේ පැන්හලෙහි කෙළවර මේසයක් ළඟ හිඳගෙන තේ බොමින් සිටින විට කෙළවර බිත්තිය අද්දර උඩු මහලට යොමු වූ පිය ගැට පෙළ දිගේ පහළට කිසිවෙක් ආවේය.

බටහිර දෙරටුවට පිටින් පිහිටි පස් මහල් බටහිර දේව මන්දිරය හැරෙන්නට මේ නගරයෙහි පිහිටි ඉතා උස මන්දිරය වූයේ මේ තේ පැන් හලයි. තේ පැන් හලට වඩා ඒ දෙව් මැඳුර උස වුවත් එහි උඩුමහල් ක්‍රමයෙන් පටු වීය. එහෙත් මේ තේ පැන් හලෙහි උඩුමහල පාතමාලය තරමම විසාල වීය. සන්ධ්‍යා කාලයෙහි මෙහි උඩුමහලින් නිකුත් වූනේ ගැහැණුන්ගේ ගීත ගායනයනුත් සිනාහවත් දැරියන්ගේ කෝමළ අතින් වැයුන වීණාවල මිහිරි හඬත්ය. විශේෂයෙන් මධ්‍යම රාත්‍රිය පසුවුන විට මේ හඬ වීථිවල ද ගලා යන හෙයින් – පැතිරී යන හෙයින් එහි සිට ද සංගීත රසය විඳිය හැක.

වං ලූං වාඩි වී සිටි ස්ථානයෙහි තේ පානය කළ මිනිසුන්ගේ ඝෝෂාව හා දදුකැට ගැටෙන ශබ්දයත් නිසා වෙන කිසිම ශබ්දයක් වං ලූං ට නො ඇසුනි. තමා පිටුපස තිබුන සෝපානයෙන් පහළට බැසගෙන ආ ස්ත්‍රියගේ පියවර හඬ ද ඔහුට නො ඇසුනේ ඒ නිසයි. එහෙත් කවුදෝ කෙනෙක් අවුත් ඔහුගේ පිටට තට්ටු කළ විට ඔහු මහත් සේ වකිතයට පත් වුනේය. ඔහු එසේ වකිතයට පත් වුනේ මෙහිදී කිසිවෙකු ඔහු හඳුනා ගනීවි ය යන බලාපොරොත්තුවක් ඔහු තුළ නොවූ නිසාය. වහා හැරී බැලූ ඔහුට පෙනුනේ පටු රූමත් ස්ත්‍රී වක්ත්‍රයකි. එනම් කෝකිලා නම් ස්ත්‍රියගේ මුහුණයි. ඔහු අර ඉඩම මිලයට ගත් දිනයෙහි මැණික් සමූහය බාර දුන්නේ මේ ස්ත්‍රියගේ අතටයි. එද මහළු රදළ තැනගේ ගැහෙන අතට වාරු දෙමින් විකුණුම් ඔප්පුවට ද මුද්‍රාව තබන්නට උදව් වුනේ ද තමාගේ පිට ට තැබූ මේ හස්තය මැයි.

ඇය ඔහු දෙස බලා සිනාසුනාය. ඇය ගේ සිනාහව තොල් මැතිරීමක් වැනි වීය.

Scanned by CamScanner

''හා! කොහොමද චං කියන ගොවියා'' යයි ඇය කීවේ ගොවියා යන වචනය ඊර්ෂ්‍යාවෙන් සලකමිනි.

''තමුසෙට මෙතැනදී දකින්න කවද බලාපොරොත්තු වෙන්නෙ?'' යයි ඇය යලිත් විමසූ විට ඔහුට සිතුනේ ''කෙසේ හෝ තමා නිකම්ම ගොඩයෙක් නොවන බව'' මේ ගැහැණියට ඔප්පු කරන්නටය. එහෙයින් ඔහු සිනාසී ශබ්ද නගා මෙසේ කීවේය.

''මොකෝ මගේ සල්ලිත් වෙන අයගෙ වගේ වියදම් කරන්න තරකද? මට මේ දවස්වල සල්ලි හිඟ නැහැ. මට දැන් වාසනා වන්ත කාලයක්!''

නයෙකුගේ මෙන් කුඩා තියුණු ඇස් ඇති කෝකිලා මෙහිදී මඳ වේලාවක් නිහඬව සිට භාජනයකින් ගලන තෙල් වැනි සුසිනිඳු කටහඬ පතුරවමින් යලිත් මෙසේ කථා කළාය.

''කවුද ඒ වග අහල නැත්තෙ! මිනිහෙකුට තමාගෙ ජීවිත යට ඕනවට වැඩිය තියෙන මුදල් මේ වගේ තැන්වලදී තමයි වියදම් කරන්න ඕන. මේ තැන්වල තමයි පොහොසත්තු විනෝද වෙන්නෙ, නව පන්නයෙ රදළ ගොල්ල එකතු වෙලා කාල බීල විනෝද වෙන්නෙ. අපේ වයින් තරම් හොඳ වයින් කොහේවත් නැහැ. හොඳයි තමුසෙ ඒව බීල බැලුව ද?''

''මම මෙච්චර කලකට බීල තියෙන්නෙ තේ වතුර විතර''යයි පිළිතුරු දුන් චං ලුං'' මම තවම වයින්වත් දුදු කැටයක්වත් ඇල්ලුවෙ නැතැ''යි ලජ්ජාවෙන් පැවසුවේය.

සිහින් සිනහවක් පා ''තේ!'' යයි ඔහුට අනුවම පුනරුච්චාරණය කළ ඇය ''අපි ගාව කොට්ට කටු වයින්, උදැසන වයින්, සුවඳ හැල් වයින් ඒ වගේ නොයෙක් ජාතිවල වයින් තියෙනව. ඉතින් තමුසෙ තේ විතරක් බොන්නෙ ඇයි දැ''යි ඇසුවාය. චං ලුං බිම බලාගෙන සිටිද්දී ඇය මෘදු හඬින් උපහාසාත්මකව මෙසේ ද කීවාය.

''මට හිතෙන හැටියට තමුසෙ වෙන යමක් දිහා බැලුවෙ නැතුව ඇති. ආ? ඇයි ලස්සන පුංචි අත්, ලස්සන සුවඳ වහනය වන කම්මුල් හෙම දැක්කෙ නැද්ද?''

චං ලුං තම හිස බිම දෙසට තව තවත් ඔබා ගත්තේය. රත් වන් ලෙය ද ඔහුගේ මුහුණට නැගුනි. ඔහුට දැනුනේ අසළ සිටින

සෑම කෙනෙකුම ඔහු දෙස බලමින් ගැහැණියගේ කථාවට කන් දී ගෙන සිටින්නාක් මෙන්ය. එහෙත් ඔහු ධෛර්‍ය්‍යය ගෙන ඇහි බැමට යටින් අවට බැලූවිට මේ ගැන කිසිවෙකු සැලකිල්ලක් නො පෙන්වන බව දුටුවේය. දදු කැටයේ හඬ තව වරක් නැගී එද්දී ඔහු කලබල වී මෙසේ කීවේය.

''නැහැ! නැහැ!! මම නැහැ!!! තේ විතරයි'' එවිට ගැහැණිය යලිත් සිනාසී සිතුවම් දෙසට අත දිගු කළාය.

''අර ඉන්නෙ! ඒ තමයි ඒ ගොල්ලන්ගෙ පින්තූර. තමුසෙ බලන්න කැමති කෙනෙකු තෝරා ගෙන මගේ අතට රිදී කාසි දෙනව! මම ඇය තමුසෙ ඉදිරිපිට තබන්නම්'' යයි ඇය කීවාය.

''අර මම හිතුවෙ හීනෙන් දකින ගැහැණුන්ගෙ රූපෙයි කියලයි. අර කතන්දර කාරයො කියන ක්වේන්ලේන් කඳුවල සිටින දේවතාවියන්ගෙ රූප වෙන්න ඇතෙයි කියල මම මෙච්චර දවස් සිතාගෙන සිටියා'' යයි වං ලූං විස්මයෙන් කීවේය.

''ඔව් ඒගොල්ල සිහිනෙන් පෙනෙන ගැහැණු තමා''යයි කවට කම් කළ කෝකිලා ''ඒ සිහින රිදී ටිකක් වියදම් කළහම හැබෑ වෙනවා'' යයි කියා යන්නට ගියාය. යන ගමන් ඇය වට පිට සිටි වැඩකරුවන්ට හිස වනමින් ඉඟි මැරුවාය. එමෙන්ම ඇය වැඩකරුවන් අමතා ''අන්න මෝඩ ගොඩයෙක්!'' යයි කියන අයකු වෙත මෙන් ඔහු වෙත අත දිගු කළාය. එහෙත් වං ලූං අළුත් ආසාවකින් යුතුව ඒ සිතුවම් දෙස බලන්නට පටන් ගත්තේය.

''ඇත්තටම මේ ගැහැණු ඉන්නව ඇත්තෙ මගේ හිසට උඩින් තිබෙන මේ උඩුමහලෙ තියෙන කාමරවලම තමයි. මා හැර අනික් මිනිස්සු උන් ළඟට යනව ඇති. හොඳයි ඉතින් තමා තමාම නොවේනම් – වැඩපල බහුල ගොවියෙකු නොවේනම් – පවුල් කාර යෙකු නොවේ නම් තමා තෝර ගන්නෙ මෙයින් කොයි ගෑණිගෙ පින්තූරෙ ද?'' යි තර්ක කරමින් ඔහු ජීවමාන දෙයක් දෙස බලන්නාක් මෙන් ඒ පින්තූර දෙස මහත් ආසාවෙන් බැලුවේය.

පෙර දිනවල නම් ඒ පින්තූරවල තිබුන ගැහැණු රූප සියල්ලම එක සේ රූමත් යයි ඔහුට දැනුනි. ඔහුට එසේ දැනුනේ ඒ දවස්වල එයින් එකියක තේරීම ගැන අදහසක් ඔහුට පහළ නොවූ නිසාය. දැන් නම් ඇත්ත වසයෙන් ඔහුට වැටහෙන්නේ ඔවුන් අතුරෙන්

Scanned by CamScanner

සමහරෙකු අනිකෙකුට වඩා රූමත් බවය. මේ සමූහය අතුරෙන් ඔහුට වඩාම රූමත් යයි හැඟෙන තිදෙනෙකු ඔහු තෝරා ගත්තේය. අන්තිමේදී එයිනුත් වඩාම රූමතිය ඔහු විසින් තෝරා ගනු ලැබුවාය.

එසේ තෝරා ගත් ඇය කුඩා සිහින් එකියකි. ඇගේ සිරුර ද උණ ගසක් මෙන් සැහැල්ලු වූවකි. බලල් පැටියෙකුගේ මෙන් ඇගේ මුහුණ ද උල්ය. එම සිතුවමෙහි ඇය දිස්වුනේ– පෙනී සිටියේ එක් අතකින් නෙළුම් පොහොට්ටුවක් ද අල්වා ගෙනය. ඇගේ දෙ අත්ලද සුකුමාර මල් පෙති වැනි වීය.

ඔහු ඇයගේ රුව දෙස බලා සිටිත්ම වියින් වැනි උණුසුමක්. සිය නහර දිගේ දුවන්නට වීය.

''ඇය රෝස මලක් වගේ'' යයි ද ඔහුට හදිසියෙන්ම කිය වුනේය. තමාගේ කට හඬ ඇසූ ඔහු ඔහුටම බියවී– ලජ්ජාවී වහා නැගිට තම මුදල වහා මේසය මත දමා අඳුරු වීථියට බැස ගෙදර බලා ගමන් ගත්තේ කුඹුරු වලට හා ගංවතුරට උඩින් රිදී මිහිදුම් පටලයක් මෙන් සඳ කිරණ පැතිරෙන විටය – ඔහුගේ සිරුරෙහි ලෙය රහසිගතව උණුසුම්ව ධාවනය කරන්නට පටන් ගත් විටය.

Scanned by CamScanner

වං ලුං තේ පැන් හලෙහිදී ඇතිවුන අළුත් ආසාවන්ට පෙලඹුනේ සති කීපයක් ගත වන තෙක් ගං වතුර බැස නොයාමෙනුත් සිරිත් පරිදි ගෙදර දොරේ කරදරයක් කලකින් නොවීමෙනුත් ලත් අධික විවේකය නිසාය. කාර්‍ය්‍ය බහුල ජීවිතයට පුරුදු වුන මිනිසෙකුට අධික විවේකය ද අහිතකර ය.

වං ලුං ගේ ගෙය අවට වූ කුඹුරුවල බැස නොගිය නිශ්චල ජලය සන්ධ්‍යා මන්දමාරුතයෙන් මඳක් සෙලවුනේ ය. මන්දමාරුත යෙන් සැනසුම් ලත් මහල්ලා නිදි කිරමින් ඉස්තෝප්පුවෙහි ලත වුනේය. උදෑසන පාසැලට ගිය ලමයින් දෙදෙනා සවස්වන තුරු ම ගෙදර නොපැමිණිය හ. සන්ධ්‍යා වෙත් ම නොසන්සුන් බවක් පළ කළ වං ලුං සිය බිරිය තමා දෙස බැලූ දුඃඛිත බැල්ම ද ගණන් නොගත්තේ ය. ඔහු ගෙයි එහාට මෙහාට සක්මන් කරමින් මොහොතක් පුටුවක ද වාඩි වී සිට සිය බිරිය පිළියෙළ කොට දුන් තේ කෝප්පය ද පානය නොකොට දල්වා ගත් දුම් කෝව ද නො උරා යලි නැගිට ගෙයින් එලියට බැස්සේ ය. නැවතත් ගෙට ගොඩවුන ඔහු සිය බිරිය විසින් උත්සව අවස්ථාවල ඇඳීමට මසා දුන් කබාය ඇඳ ගත්තේ ය. මෙසේ ඇඳගත් ඔහු ගෙදර කිසිවෙකුට නොකියා අඳුරෙහිම සෙමින් සෙමින් ගමන් කෙළේ නගරයේ අළුත් තේ පැන් හල වෙතට ය. තේ පැන් හලෙහි දල් වූ පහන්වල ආලෝකයෙන් අවට පැතිරී තිබුන අඳුර පැනයමින් තිබුණි. රෑ බෝ වෙමින් එමින් තිබුන ද මෙහි සෑම අසුනක් ම ජනයා ගෙන් පිරී පැවතුනි. සන්ධ්‍යා ඇඳුම් වලින් සැරසී සිටි මෙහි ජනී ජනයා කමින් බොමින්

Scanned by CamScanner

සිනාසුනා හ, ගී ගැයූ හ, කෙළි කවට කම් කළහ, පුවත් පත් නැරඹූ හ.

තේ පැන් හලෙහි විවර වූ දෙරටුවෙහි වං ලුං මඳ වේලාවක් නතර වී සිටියේ ඔහුගේ බියසුලු කමත් අහිංසක ගතියත් නිසා ය. ඔහු ආපසු හැරී යන්නට හිතත් ම දෙරකඩට හේත්තු වී සිටි ස්ත්‍රියක් ඔහු වෙත පැමිණියා ය. ඒ පැමිණියේ කලින් ඔහු අඳුනන කෝකිලා නම් තැනැත්තියයි. තේ පැන් හලට එන්නවුන් පිළිගැණීමත් තේ පැන් හල ඇතුළෙහි සිටින ස්ත්‍රීන්ට වාසි සැලැස්වීමත් ඇය නොකඩවා කළා ය. වං ලුං දුටු විට ඇයගේ මුවට නැගුනේ ''ආ! මේ අර ගොවියා නේ!'' යන වචනයි. ඇගේ මේ නොසැලකිලීමත් වචන වලින් වං ලුං කෝපයට පත් වුනේ ය.

''හොඳයි ඉතින් මම ගෙට ගොඩ වෙන්න ද එපා ද? වෙන අයට වගේ මට මෙහි දී සැලකිලි ලැබෙන්නෙ නැද්ද?''

ගැහැණිය උරය හොල්ලා සිනාසෙමින් මෙසේ කීවා ය:–

''ඉතින් උඹටත් අනිත් අයට වගේ සල්ලි තියෙනව නම් ඇයි බැරි සැලකිලි කරන්න.''

වං ලුං ට උවමනා කෙළේ තමා මහා පොහොසතෙකු බව ඇයට පෙන්නීමට ය. එහෙයින් ඔහු පටියට යැවූ අත රිදී කාසි වලින් පුරවා ගෙණ එලියට ගත්තේ ය.

''හොඳයි මේ ටික ඇද්ද මදි ද?''

රිදී කාසි දෙස ගිජු ඇසින් බැලූ ඇය ''හා! හොඳයි ඇවිල්ල කියනව තමුසෙට හොඳ කොයි එකා ද?''යයි කීවාය.

වං ලුං ට මේ ගැන කිසිවක් කියා ගත නොහැකි වීය. මෙබඳු වැඩ වලට නොපුරුදු බවම බල පෑ හෙයින් ඔහු තොල් මැතුරුවා පමණකි.

''මම දන්නෙ නැහැ හොඳ මොකක් ද කියල. අර අර පින් තුරෙ තියෙන රතු රෝස මලක් වගේ මුහුණක් ඇති නෙලුම් මලක් අතේ ඇතිව සිටින පුංචි එකී තමයි මට......'' අනතුරුව ගැහැණිය හිස වැනුවා ය; යලි වං ලුං ට සංඥවක් කරමින් ආහාර ගනිමින් සිටි ජනයාගෙන් පිරුණ හෝටලය මැදින් ගමන් කළා ය. ඇය පසුපස ගමන් කළ ඔහුට ලජ්ජාව ද සැකය ද ඇති වුනේ එහි සිටි සියළුදෙනාම තමා දෙස බලතියි සිතූ නිසා ය. බිම බලා ගෙණ ගමන් කළ ඔහු සැලකිල්ලෙන් ඇහුම් කන් දෙමින් හොර ඇහින්

වටපිට ද බැලුවේ ය. එහි සිටි සියළු දෙනාම ඔහු ගැන සැලකිල්ලක් නොදැක්වුව ද ඔවුනතර දෙතුන් දෙනෙකු පමණ මෙසේ කථා කරණු ඇසුනේ ය :–

''පුදුම මිනිහෙක් නෙව! හරියට රැ වෙන්නත් පළමු ගෑණු දිහාවට බඩ ගාන හැටි!........''

ඔවුන් කෙසේ කථාකළද වං ලුං උඩුමහලට යාමට පියගැට පෙලට නැගුනේ ය. පියගැට පෙල නැගීම ද ඔහුට දුෂ්කර කාර්‍ය්‍යයක් වූයේ පෙර මෙබඳු පිය ගැට පෙලක ඔහු නැග නොතිබුන හෙයිනි. කෙසේ වුව ද ඔහු මුදුනට ම නැංගේ ය. අනතුරුව ඔහු එහි අඳුරු ශාලාවක් මැදින් ගැහැණියගේ මග පෙන්වීම අනුව ගමන් කරමින් නතර වුනේ, ගැහැණිය ශබ්ද නගා ''මේ අද රෑ පළමු අමුත්තා''යයි කී පසුව ය. එහි සියලු ම කාමරවල දොරවල් විවෘත වීම ගැහැණියගේ ඒ හඬෙහි ප්‍රතිඵලය වීය. කාමරවල දොරවල් විවෘත වෙත් ම එයින් දිස්වුනේ සූර්‍ය්‍යාලොකයෙන් විකසිත වුන නෙලුම් මල් වැනි මුහුණු ය. එහෙත් කෝකිලා නැමති ඒ ගැහැණිය කාමර කීපයක් පසු කර යමින් ''නැහැ නැහැ උඹ නෙවෙයි– උඹ නෙවෙයි'' කියූව ද එක් කාමරයක් ලඟ නතර ව ''කෝ කෝ අර 'සූචෞ' නගරයේ සිට ආපු කෙල්ල පද්මා!'' යි රළු ලෙස ඇමතුවා ය.

තිසංසල දිග ශාලාවෙහි නොපැහැදිලි අවඥා සහගත හඬක් පැතිරී ගියේ ය. රතු දෙළුම් ගෙඩියක් මෙන් පැහැපත් වූ ගැහැණියක විසින් නැගූ ඒ හඬ වං ලුං ට ඇසුනේ මෙසේ ය :–

''හරි මිනිහෙක් තමයි දූන් එයාට ලැබෙන්න යන්නෙ! සුදු ලූනු ගඳ යි – හරක් ගඳ යි – මඩ ගඳ යි මිනිහා ලඟ.''

මේ වචන වං ලුං ට ඇසුන නමුත් එයට පිළිතුරු දීමට තරම් නිර්භීත බවක් ඔහුට නොවූයේ ය.

ඒ වචන ඔහුට කිනිසි පහරක් වැනි වුවත් තම ධනවත් කම සිහි කරමින් ඉවසුවේ ය. ඒ මොහොතෙහි පටියෙහි වූ රිදී කාසි කීපය ඔහුගේ සිතට නිර්භීත බව ගැන්වූයේ ය. අන්තිමේ දී තමා සමග ගමන් කරමින් සිටි ඒ ගැහැණිය වසා තිබුන කාමරයක දොරක් තල්ලු කර ගෙණ ඇතුළට ගියා ය. ඇය පසු පස ගිය ඔහුට එහි ඇඳක් මත දිස්වූනේ රතු මල් වැටුන රෙද්දක් පොරවා ගෙන හිඳින යන්තම් සොළොස් විය ඉක්ම වූ යුවතියකි.

Scanned by CamScanner

ඇයගේ සිහින් දේහය වං ලූං ගේ සිත් ගත්තේ ය. මල්දම් යුවලක් බඳු ඇයගේ කෝමල දෑතෙහි උල් කර තිබුන නිය පොතු, ලා රතු පාටින් ආලේප කොට තිබුන නිසා රතු මල් කැකුළුවල සිරිය සිහියට නැංවූයේ ය. චීනයේ චාරිත්‍රානුකූලව කුඩා කාල යෙහි පටන් ම සකස් කොට තිබුන ඇයගේ පොඩිති පා අලංකාර පාවහන් යුවලකින් වැසී තිබුනේ ය. එවැනි සුකුමාල දේහනියක්, සියැසින් නොදුටු, එවැන්නියන් ලොව ඇතැයි විශ්වාස කරන්නට අසීරු තරම් ය.

රළු ලෙස ඇය දෙස බැලූ වං ලූං ඒ යුවතිය සයනය කළ යහනෙහි පසෙකින් වාඩි ගත්තේ ය. තමා පෙර දුටු පිළිරුවට ඇය හොඳට ම සමාන බව දුන් ඔහුට පැහැදිලි ය. ඇඳෙහි වාඩි ගත් මොහොතෙහි වං ලූං පළ කෙළේ එද පින්තූරය දෙස බැලූ දිනයෙහි දක්වූ සවභාවය මැයි. ඔහු මේ කෝමල දේහය එක වරටම ස්පර්ශ කිරීමට අදහස් නොකෙළේ ය. පිළිරුවක් නරඹන්නෙකු මෙන් ඔහු ඒ දෙස බලාගත් වන ම සිටියේය. එවිට ඒ සුකුමාර තරුණිය – ඒ මියුලැසිය– ඇයගේ මල්දමක් වැනි කෝමල දකුණත ගෙණ ඔහුගේ උරය මත තැබුවා ය. යලි එසේ තැබූ අත ඔහුගේ අත දිගේ ලිස්සා වැටුනේ කිසි කලෙකත් නොවිඳි සුව පහසක් ඔහුට ඇති කරවමිනි. ඇය යලිත් වරක් ඇයගේ අත ඔහුගේ උරය මත තබත්ම, ඔහු භීති යෙන් මෙන්, ඒ අත, තම සිරුර මත තිබෙනු බලා සිටියේ ය. ඇය කිංකිණි හඬ පරයමින් සිනාසී සිහින් සවරයෙන් කතා කළා ය :–

''අනේ ඔයා වගේ මෝඩයෙක්. ඔයා හරි මිනිහ! ඉතින් ඔහොම ම මුළු රැයම ගෙවන්න ද බලාපොරොත්තුව?''

ඇය තමාට මෙසේ කියූ පසු ඔහු සිය දෙ අතින් ම ඇයගේ අත අල්වා ගත්තේ මහත් බියෙනි. බිඳෙන සුළු දෙයක් අල්ලන්නාක් වැනි බියකිනි.

''අනේ මට දැනෙන්නෙ නෑ! මට උගන්වන්න''යි හේ ආයාචන සවරයෙන් කීය. එවිට ඈ ඔහුට ඉගැන්නුවා ය.

ජීවිතයේ විවිධ කම්කටොලු වලට මුහුණ පෑමෙන් ලත් අත් දැකීම් ඇති වං ලූං ට විඳිය නොහැකි දුකක් නැති තරම් ය. අධික සූර්ය තාපයෙන් තැවී තැවී පැය ගණන් කුඹුරු වැඩ කිරීම ඔහුට එතරම් දුකක් වශයෙන් නොදැනුනේ ය. ඇඟ වසා ගැනීමට හරි හැටි වස්ත්‍රයක් නොමැතිව සීතලෙන් ගැහි ගැහී වැඩ කිරීම ඔහුට

එතරම් දුකක් වසයෙන් නොදැනුනේ ය. සාගත සමයෙහි සති ගණන් බඩගින්නෙන් ජීවත් වීම ඔහුට එතරම් දුකක් වසයෙන් නොදැනුනේ ය. දකුණේ නගරයකට ගොස් ඇල් වතුර බි බී තරබාරු ගැහැණුන් හා පිරිමින් පටවා ගෙණ රික්ෂෝ රථ මුළු දවසෙහි ම ඇදීම එතරම් දුකක් වසයෙන් නොදැනුනේ ය. මේ සැම දුකකට ම වඩා දැන් ඔහුට ඇති විශාල දුක නම් අර තේ පැන්හලෙහි යුවතිය නිසා ලැබෙන දුකයි.

ඔහු සැම රැයකම එහි ගියේ ය. ඒ තරුණිය ද ඔහුගේ තෘප්තිය නිමාවට පත් නොවන ලෙස සැම දිනයක ම ක්‍රියා කළා ය. ඇය සැම රැයක ම මේ ගොඩයා පිළිගත්තේ ඔහුට ඇති ආලයකින් නොව ඔහුගේ මුදලට ඇති ආසාවෙන්ය. ඔහු අතෘප්තිකර ස්වභාව යක් පළ කෙළේ ද එහෙයිනි. සැම රැයක ම අවසානයෙහි රිදී කාසි ගොඩක් ඇයට පුද කිරීමෙන් පසු ඇය විසින් උරයෙන් අල්ලා තල්ලු කරණු ලැබූ මේ මිනිහා මුහුදෙහි ගිලුනෙකු පිපාසය නිසා ලුනු වතුර බි බී යලින් පිපාසය අධික කර ගන්නාක්මෙන් ග්‍රීෂ්ම ඍතුව අවසන් වන තෙක් ම මේ ගමන නතර නොකෙළේ ය; ඇයට ආලය කෙළේ ය. එහෙත් ඇය කිනම් එකියක් ද? කා ගේ කවු ද? යන ආදියක් ඔහු නොදත්තේ ය. සැම රැයක ම ඇය ඔහුට හමු වුව ද ඇය හා මේ තොරතුරු ඇසීමට තරම් ඉවසිලි බවක් ඔහු තුළ නොවීය. ඔහු දවල් කාලය ගෙදර ගතකෙළේ වියරුබවට පත්වූවෙකු ලෙසය. ඔහුට ගෙදර සිය ඇඳෙහි නිදගත හැකි නොවීය. කාමර යේ උෂ්ණය වැඩියයි කියමින් වත්ත පහළ උණපඳුර යට පැදුරක් දමාගෙණ එහි කඩින් කඩ නිදගත්තේය.

මේ අතර ඔහු ගේ බිරිය හෝ දරුවන් හෝ චිං හෝ පැමිණ "කුඹුරුවල වතුර විගහට බැහැල යාවී. බෝග ජාති කොහොමද පිළියෙළ කරන්නේ?" යයි ඇසුවොත් ඔහු කෝපයෙන් මෙසේ පිළිතුරු දුන්නේය:-

"උඹ මොකොද ඕකට මට කරදර කරන්නෙ?"

ඔහු මුළු දවසම ගත කෙළේ අර තරුණිය ගැන කල්පනා කරමිනි. ගෙදර කිසිවෙකුගේ මුහුණක් දැකීමට දැන් ඔහුට රුචියක් නැත. චිං ලූං ගේ වෙනස් කම මහල්ලාට පෙනෙන තරම් ප්‍රකට එකක් වූයේය. එහෙයින් මහල්ලා ඔහුට මෙසේ කීවේය:-

Scanned by CamScanner

''මොකද ළමය, උඹට හැදිල තියෙන ලෙඩෙ? ඇයි උඹ තිස්සේම තරහයෙන් පිපිරෙන්න හදන්නෙ?''

මහල්ලා ගේ මේ වචන ඔහු ගණනටවත් නොගත්තේය. ඔහු මුළු දවසම ගතකෙළේ තරුණිය සතුටු කිරීම සඳහා අළුත් පන්නවලින් සැරසී සිටීමටය. නිතර නිතර පිරිසිදු කරගත් කොණ්ඩය ගොතාගෙණ ඇය වෙත ගියත් එයට ඇය කෙළේ නිග්‍රහයකි.

''අපේ පළාතේ පිරිමින්ට නම් මේ වගේ වඳුරු වලිග නැතැ''යි ඇය කළ නිග්‍රහයක් නිසා දවසක් ඔහු කුඩාකල පටන් වවාගෙණ තිබුන දිග කෙස් වැටිය කපා දැමුවේය. ඔහුගේ මේ ක්‍රියාව නොරිස්සූ ඕලෑං ''අනේ මේ මොකොද ප්‍රාණය කපාගත්තේ?'' යයි බියෙන් කෑගැසුවාය. ''ඉතින් උඹ කියන්නෙ මට හැමදම පරණ මිනිහෙක් වගේ ඉන්නෙයි කියලද? මෙ නගරයෙහි එකම තරුණයෙක් වත් කොන්ඩෙ බඳින්නෙ නැහැ'' යි ඔහු ඇයට වේග යෙන් පිළිතුරු දුන්නේය. ඔහු වචනයෙන් එඩිතර වුව ද මේ ක්‍රියාව ගැන හදපත්ලෙන් බිය වූයේය. එහෙත් අර තරුණියට වුවමනා වුනා නම් බෙල්ල පවා කපා ගැණීමට ඔහු බිය නොවන්නේය.

වෙන දවස්වල වං ලුං ඇඟ සෝදන්නේ ඉතා කලාතුරකිනි. මෑතක සිට ඔහු දිනපතා ඇඟ සෝදන්නේය. ඕලෑං මේ ගැනද සැලකිලිමත් වූවාය – කියයුතු දෑ කිව්වාය.

''ඔච්චර මිනිහෙක් නාන්න පටන් ගත්තොත් මැරේවි'' යයි දිනක් ඈ කීවාය. ඔහු ඇඟ සේදීමෙහි දී ඇඟ ගල්වන්නේ ද පිට රටින් ගෙන්වන ලද සුවඳ හමන සබන්ය. වෙනද ඉතා රුචි ලෙස කෑ සුදු ලූනු දැන් ඔහු අතින්වත් අල්ලන්නේ නැත. ඔහු සුදු ලූනු කෑම අත්හැරියේ ඒ තරුණිය ඉදිරියෙහි සුදු ලූනු ගඳ ගැස්වීම තමාට අවාසියක් යයි සැලකූ නිසාය.

මොහුගේ මේ මහා විපර්‍යාසයට හේතුව කුමක් දැයි තවම ගෙදර කවුරුවත් නොදනිති. ඔහු දැන් නිතර නිතර ඇඳුම් මැහීමට අලුත් වටිනා රෙදි මිලදී ගනියි. පෙර නම් ඔහුගේ ඇඳුම් මැසුවේ ඕලෑං ය. ඇය සියතින්ම පෙර ඔහුගේ ඇඳුම් ශක්තිමත් ලෙස සකස් කළාය. ඔහු දැන් ඇගේ මැහුම් සිනහවට ලක්කරයි. ඔහු තම ඇඳුම් නගරයේ මහන්නන් වෙත ගෙන ගොස් වැඩි මුදල් ගෙවා මස්සවා ගත්තේ නාගරික පන්නයට ගැලපෙන පරිදිය. ඔහු

පෙර පය ලූයේ ඕලෑං විසින් සකස් කළ පාවහන් යුවළක්ය. එහෙත් ඔහු මෑතක දී ජීවිතයේ පළමුවරට සාප්පුවෙන් පාවහන් යුවළක් මිලදී ගත්තේය.

වං ලුං මේ නාගරික පත්නයට මැසූ ඇඳුම් සිය භාර්‍යාව හා දරුවන් ඉදිරියෙහි නො ඇන්දේය. ඔහු ඒ නව ඇඳුම් කට්ටලය සුරක්ෂිතව තබා තිබුනේ තේ පැන් හලෙහි හඳුනන ලිපිකරුවෙකු ළඟය. ඒ ලිපි කරුවා ද සුළු මුදලකට ඒ ඇඳුම් ඇඳීම සඳහා පොඩි කාමරයක් ද ඔහුට වෙන් කොට දී තිබුනි. ඔහු උඩු මහලට නගින්නේ මේ කාමරයට ගොස් නවපන්නයේ ඇඳුම් කට්ටලය ද ඇඳ ගෙනය. මේ ළඟදී රන් ආලේප කළ රිදී මුද්දක් ද ඔහු මිලට ගත්තේය. ඔහුට පොඩි කරදරයක්ව පැවතුනේ චීනයේ පෞරාණික චාරිත්‍රානු කූලව බූගා දමූ නළල් තලයට උඩ පෙදෙසෙහි වූ කෙස් තවම නො වැඩීමය. මෑතක සිට පිටරටින් ගෙන්වන ලද වටිනා සුවඳ තෙල් වර්ගයක් හේ එයට භාවිතා කරයි.

ඔහුගේ මේ වෙනස් කම් වලින් ඕලෑංගේ සිතට ඇතිවුනේ මහා විශ්මයකි. දවසක් දහවල් භොජනය ගණිමින් සිටිද්දී ඕලෑං වං ලුං දෙස බලා මෙසේ කීවාය:–

''ඔයා දිහා බලන මට සිහිවෙන්නේ අර මහ ගෙදර හිටපු රදළ වරු.''

''ඇයි බන්, දූන් අපට සෑහෙන්න යමක් කමක් තියෙන නිසා ගොණෙක් වගේ ඉන්නෙ මොටද?''

මෙසේ උපහාසාත්මකව ඔහු කථා කළ ද එද ඇය කෙරෙහි — ඕලෑං කෙරෙහි — කරුණාවන්ත බවක් පළ කෙළේය.

දූන් වං ලුං ගේ අතින් ඉමක් කොනක් නොමැතිව මුදල් ගලා යන්නේය. ඔහුට ඒ තරුණිය ඉදිරියෙහි හරි හරියට කථා කරන්නට ද දූන් හොඳට හුරුය. වරක් ඒ තරුණිය ඔහුට ඇසෙන ලෙස මෙසේ කෙඳිරි ගෑවාය.

''අයියෝ මම වගේ දුප්පත් කෙල්ලක.

''ඇයි ඔයා එහෙම කියන්නෙ?''

''මට නම් කිසිම සතුටක් නැහැ. මේ අල්ලපු කාමරේ ඉන්න එකීට එයාගෙ යාලුව ගෙනත් දීල තියෙනව කොන්ඩෙ ගහන්න රත්රන් කූරක්. මට කොයි එකටත් තියෙන්නෙ මේ රිදී කූර

පමණයි'' ඉක්බිති ඔහු ඇයගේ නිල්වන් කේස කලාපය පසෙකට තල්ලුකොට කණට මුව තැබුවේය:-

''එපා! රත්තරන් මැණිකෙ, කනගාටුවෙන්න, මම රත්තරන් කුරක් ගෙනත් දෙන්නම්.''

පෙර වං ලුං දැන සිටියේ උදැල්ල, හරක, කුඹුර, අස්වැන්න, වැපිරීම, නඟුල, ඉර හා වැස්ස යන ආදී සීමාසහිත වචන කීපයකි. එහෙත් දැන් ඔහු පෙම්වතියක සැනසීමට තරම් බාහිර වචන මාලාවක් ද ඒ තරුණියගෙන් ඉගෙණගෙන සිටියි. පෙර වං ලුං සැහ වූ තැන්වලින් රිදී කාසි ගන්නාවිට ඕලැං ඔහු දෙස තර්ජනාත්මකව බැලුවාය. එහෙත් දැන් ඇය එම අවස්ථාවල ඔහු දෙස බලන්නේ කණගාටුවෙනි.

තමාගෙනුත් ගොවි ජීවිතයෙනුත් වෙන්වූ ජීවිතයක් ඔහු ගත කරණ බව ඕලැං දැනගෙන බොහෝ දවස් ය. ඇය මෙතෙක් නො දැන සිටින්නේ ඒ වෙනස් වීමට හේතුවයි.

දිනක් වං ලුං කුඹුරු උඩින් ගමන් කරමින් වත්තට පිවිසුනේ ඕලැං පොකුණෙහි රෙදි සෝදමින් සිටිද්දී ය. ඔහු පොකුණ ළඟ නතර වී රළලෙස ඇයගෙන් මෙසේ ඇසුවේය:-

''කෝ අර උඹ ළඟ තිබුන මුතු?'' පොකුණ අයිනෙහි ඉඳ රෙදි ඇපිල්ලූ ඇයට මේ හඬ ඇසී හිස ඔසවා බැලුවාය. ඔහුගේ ප්‍රශ්නාත්මක මුහුණ ඇයට පෙනුනේය. බියරැඳි මුහුණකින් ඔහු පිළිගත් ඇය ''මුතු? ඔව් ඒව මාලඟ තියෙනවා'' යි කීවාය.

''ඒව නිකම් තිබුනට වැඩක් නැහැ.''

''මම හිතාගෙණ සිටීයෙ ඒව කවද හරිඅරුංගල් වලට අල්ලන්න ඒව අපේ බාල දුව බඳිනකොට ඇයට දෙන්න පුළුවන්.''

''කළුපාට ඇට මේ මුතු මොනවට ද? ඒව ඕන ලස්සන ගෑණුන්ට ඔන්න ඒව මට දියන්කො.'' ඕලැං ඇගේ තෙමුන අත ලැම පෙදෙසට යවා ඒ කුඩා බඩු පොදිය ගෙණ ඔහුගේ අතට දී ඒවා දිගහරින හැටි බලාසිටියාය. ඔහුගේ අල්ලමත වූ ඒ මුතුවලින් හිරු රැස් වැදී - කැලුම් විහිදෙන විට ඔහු සිනාසුනේය. යලි ඇය රෙදි ඇපිල්ලීම පටන් ගත්තාය. ඇයගේ දෙනෙතින් නොකඩවාම කඳුළු ධාරා රූරා වැටෙන්නට වුනි.

Scanned by CamScanner



දිනක් වං ලුං පවුල උදෑසන භෝජනය ගනිමින් සිටිද්දී වලා කුලකින් වැටුනෙකුමෙන් දොරකඩ දිස්වුන මහළු මිනිහෙකි. එහෙත් මෙහෙත් එල්වෙන ලෙස වැරහැලි ඇඳ සිටි ඔහුගේ මුහුණ හිරුරැස් වැදීමෙන් සණවී කාලවණීව තිබුනි. කෑම ගනිමින් සිටි ගෙවැසියන් දෙස දොරෙන් එබී බලමින් හේ විරිත්තුවේය. මේසය පසෙකින් වාඩිවී ආහාර අනුභව කරමින් සිටි මහල්ලා නළල රැළිගන්වා දෙනෙත විදහා මේ පැමිණී අමුත්තා හඳුනා ගැනීමට වෑයම් කෙළේය. වං ලුං මුව අයාගෙණ මේ අමුත්තා දෙස බලමින් කල්පනා කරන්ට වූයේ ය. අමුත්තා ද කිසිම වකිතයක් නොමැතිව ගෙට ඇතුළුවෙමින් ''අයියෙ, පුතේ, දුවේ, මුණුබුරේ'' යයි ආචාර ශීලීව ඇමතුවේය.

වං ලුං පුටුවෙන් නැගී සිට මේ මැරුණායයි කියූ බාප්පා කොයින්දැයි සිතමින් කතා කෙළේය.

''හා! බාප්පෙ උඹ උදේට කෑවද?''

''නැහැ! නැහැ!'' යයි කියූ බාප්පාට මේසය අසලින් වාඩිවීමට පුටුවක් පිළියෙළ කෙළේය. එහි වාඩිගත් ඔහු භාජනයක් ද ලී කෝටු කෑබලි ද ගෙණ කරවල ද ලුණුදපු එලවලු ද වේලපු බෝංචි ද සමග බත් පිඟන් කීපයක් ඉක්මනට හිස් කෙළේය. මෙසේ කෑම අවසන් කළ ඔහු ''දැන් ඉතින් මට ඕනා නිදා ගන්න එකයි. රෑ තුනක්ම නිදගත්ත නැතුවයි මේ ඉන්නෙ'' යයි කීවේය. ඔහුගේ මේ කථාවට වං ලුං ගේ ඔළුව අවුල්වී ගියේය. එහෙත් වං ලුං බාප්පාත් කැටුව පියාගේ ඇඳ වෙත ගියේය. වං ලුං විසින් පියා

Scanned by CamScanner

සඳහා මිලයට ගත් ඇඳ ද මේසය ද පුටුව ද බැලූ බාප්පා මෙසේ කීවේය:– "මටත් ආරංචිවුනා උඹ පොහොසතෙකු බව. ඒ වුනාට මෙච්චර පොහොසතෙක් බව මම දන්නෙ නැහැ."

ඉක්බිති ඔහු ඇඳෙහි වැතිරී, එහිවූ පොරෝණයද දෙවුර මත දමාගෙණ නිදගන්නට සැරසුනේය.

මහත් කැලඹීමට පත් වං ලුං මැද කාමරයට ගියේය. බාප්පා පිටමං කර නොගතහොත් තමා ඔහුටත් කෑම සැපයිය යුතු බව ඔහු කල්පනා කෙළේය. ඔහුගේ බිය වැඩිවුනේ බාප්පාගේ බිරිය ගැන සිහිවුන විටය. "ඔහුගේ බිරියත් දරුවනුත් ආවොත්" යන්න ඊලඟට ඔහුගේ සිතෙහි මතුවුනේය.

මධ්‍යාහ්නය පසුවී යත්ම ඇනුම් කීපයක් හරිමින් එළියට ආ බාප්පා උරය නටවා වං ලුං ට මෙසේ කීවේය:–

"දැන් ඉතින් ගෑණියි පුතයි එක්කර ගෙණ එන්නත් තියෙනව. අපේ මේ කටවල් තුනට මේ ගෙදරදි අග හිඟයක් වෙන එකක් නැහැ."

වං ලුං මෙයට කිසිත් කථා නොකෙළේය. මොවුන් පන්නා දැමීමත් ඔහුට කළ නොහැකි වීය. එවැන්නක් කළහොත් දූනට රටේ ධනවතෙකු වසයෙන් තමාට තිබෙන සැලකිල්ල නැතිවන බව ඔහු දැනගත්තේය. එහෙයින් වැඩකාරයන් නැවතී සිටි කාමර කීපයක් හිස් කිරීමට එහි නැවතී සිටියවුන්ට පරණ ගෙට යන ලෙසද අණ කෙළේය. එදම බාප්පා සිය බිරියත් පුතාත් සමග අවුත් ඒ හිස්ව තිබුන කාමරයක පදිංචි වුනේය. වං ලුං ට මේ නෑයන් පිළිගන්නට සිදුවුනේ සිත තුළ තබාගත් කෝපයෙන් ද යුතුවය. බාප්පාගේ බිරියගේ මුහුණත් ඇයගේ පුතාගේ මුහුණත් ඔහුගේ කෝපය තව තවත් ඇවිස්සුවේය. මේ කෝපය නිසා ඔහු තෙදින කින් නගරයට ද නොගියේය.

වං ලුං ගේ මේ තත්වය දුටු ඕලෑං "තරහ ගන්න එපා! මේකත් අපි විඳගන්න ඕන"යයි කීවාය. බාප්පා ඇතුළු මේ පිරිස ලද දෙයින් සතුටු වී ආචාරශීලීව සිටින බව දුටු වං ලුං ගේ කෝපය තරමක් සන්සිඳුනේය. යළිත් නාගරයට යෑමේ ආශාව ඔහු සිත තුළ පැන නැංගේය.

ඕලෑංගේ මෝඩකම නිසාත් මහල්ලාගේ දුබල කම නිසාත් චිං ගේ මිත්‍රත්වය නිසාත් වං ලුං පිළිබඳ ඔවුන්ට නොපෙනුන දේ බාප්පා ගේ බිරියට එකවරටම පෙනුනේය.

Scanned by CamScanner

දිනක් ඇය සිනාසෙමින් ඕලෑංට මෙසේ කීවාය:-

"දූන් වං ලූං සැරසෙන්නෙ කොහේද තියෙන මලක් කඩන්න වගෙයි" ඕලෑංට මෙය නොවැටහුනේය. යලිත් බාප්පාගේ බිරිය කතා කළාය.

"දෙහි ගෙඩියේ ඇට බලන්න ඕන නම් එය පලා බැලිය යුතුයි. හොඳයි එහෙම නෙවද? කොටින්ම කියනව නම් දූන් උගේ මිනිහ වෙන ගෑණියක ගැන පිස්සුවෙනුයි කාලය ගත කරන්නෙ."

ඔවුන් මේ සාකච්ඡාව කෙළේ උදෑසනකය. ජනේලය ළඟ පුටුවක නිදි කිරමින් සිටි වං ලූං ට මේ කථාව මිදුල දෙසින් ඇසුනේය. නිදිගැට හැර ඒ කථාවට කන්දුන් නමුත් බාප්පාගේ බිරිය වේගයෙන් කියාගෙන කියාගෙන ගිය ඒ වචන ඔහුට තේරුම් ගත නොහැකි වීය.

"මම ඔය වගේ පිරිමි ඕනතරම් දැකල තියෙනව. කවුරු හරි කෙනෙක් හිටිහැටියෙ ඔය විදියට හැඩවැඩ වෙන්න ගියොත් සහතිකෙන්ම එයාට නම් තවත් ගෑණියෙක් ඉන්නවමයි. උඹ දන්නෙ නැහැ එයාගෙ හැටි. උඹ දන්නෙ එයාගෙ වැඩ එළ-දෙනෙකු වගේ කරන්න තමයි. එයාට මිල මුදල් තියෙනව නම් තවත් එකියක් ගෙණාවට උඹට මොකද? මගේ නාකියට උනත් පුළුවන්නම් කරන්නෙ එහෙම තමයි. නමුත් ඒ මිනිහට කවදක්කත් එහෙම පුළුවන් කමක් තිබුනෙ නැහැ. නමුන්ට යැපෙන්න තරමට වත් එයාට හම්බකරගන්න බැරිවුනා."

ඇයගේ මේ කථාව වං ලූං ට තේරුම් ගතහැකි වූයේ යන්තමිනි. ඔහු අර තරුණිය ගැන යලි යලිත් කල්පනා කෙළේය. කල්පනාකොට කිසියම් තීරණයකට ද බැස්සේය. වෙන කෙනෙකුට ද අයිතිවාසිකම් කිය නොහැකි පරිදි ඇය මිලයට ගෙන ගෙදර නතර කරගැණිම වඩා සුදුසු බව ඔහුට වැටහුනේය. අනතුරුව ඔහු පුටුවෙන් නැගිට බාප්පාගේ බිරියට ද සංඥවක් කරමින් මිදුලෙහි වූ ඉඳිගස යටට ගියේය. ඇයද ඔහු අනුගමනය කළාය. වං ලූං රහසින් කුඩම්මාට මෙසේ කීවේය:-

"උඹ අර මිදුලෙදි කථා කරපු දේවලට මම ඇහුම් කන් දුන්නා. උගේ කතාවූ ඇත්ත. මම කැමතියි තවක් එකියක් එක්කර

Scanned by CamScanner

ගෙණ එන්න. මට කන්න අඳින්න දෙන්න පුළුවන් නම් ඇති වරද මොකක්ද?''

''ඔව මං කිව්වෙ බොරුවක් නෙවි. පොහොසත් උන කොයි මිනිහත් වැඩ කරන්නෙ එහෙම තමයි. දුප්පතා තමයි එක කෝප්පයකින් විතරක් වතුර බොන්නෙ.''

''ඒ උනාට කවුද ඉතින් ඕව ගැන කතා කරල පිළිවෙළක් කරන්නෙ? මට පුළුවන්ද ගෑණියකු ළඟට ගිහිල්ල මගේ ගෙට වරෙන් කියල කථා කරන්න.''

''හොඳයි මට බාර දීපන් ඒක. මම ඒක පිළිවෙළක් කරළ දෙන්නම්. හොඳයි කවුද කියාපන් ඔය උඹ කැමති ගෑණි.''

ඔහු එයට පිළිතුරු දුන්නේ බියෙනි. ඒ තරුණියගේ නම ඔහු පළමුවරට ශබ්දනගා කිව්වේය:–

''අර අර පද්මා නමැති කෙල්ල''

''ඉතින් ඈගේ ගේ කොහේද තියෙන්නෙ?''

''අර නගරයෙ ප්‍රධාන වීථියෙහි තියෙන විශාල තේ පැන් සාලාව තමයි ඈගේ නවාතැන.''

''මොකක්ද අර 'පුෂ්ප නිවාසෙ' ද ඔය කියන්නෙ?''

''ඔව් ඔව් ඒක තමයි''

බාප්පාගේ බිරිය පියවුන යටිතොල ඇඟිල්ලෙන් පිරිමදිමින්ම මොහොතක් කල්පනා කළාය, යලි ඇය කතා කළාය.

''මම එතන කිසිකෙනෙක් අඳුනන්නෙ නම් නැහැ. කවුද ඔය ගෑණිගෙ බාරකාරි?''

''ඇයගේ බාරිකාරිය මහ ගෙදර දසියක්ව සිටි කෝකිලා'' යයි කියූ පසු ඇය සිනාසුනාය.

''හා! එයාද? නාකි රදළය ඇගේ ඇඳේම මැරුණට පස්සෙ පටන් අරගෙණ තියෙන රස්සාව නම් කදිමයි. ඒකිට හොඳ එහෙම රස්සාවක් තමා''යයි කියමින් ශබ්ද නගා තව තවත් සිනාසුනාය.

''එතන ඉන්නෙ කෝකිලා නම් ඒ වැඩේ කරගන්න හරි පහසුයි. ඒකිට ඕන කාසි විතරයි.''

මෙයින් ඉක්මන් වූ වං ලුං රහසින් මෙසේ කීවේය:–''එහෙනම් රිදී කාසි ඕන නම් රිදී කාසි රත්රන් කාසි ඕන නම් රන් කාසි දෙන්න පුළුවන්.''

Scanned by CamScanner

මේ සාකච්ඡාවෙන් පසුව වං ලුං තීරණය කරගත්තේ "ඒ කටයුත්ත" ඉටුකර දෙනතුරු ඒ තේ පැන් සැලට නොයාමටය. "ඇය මගේ ගෙදරට අවුත් මටම හමුනොවූවොත් බෙල්ල කැපුවත් ඇය වෙත නොයමි"යි ඔහු තමාටම කියා ගත්තේය. එහෙත් ඔහුට "ඇය නාවොත්" යන වචනය සිතන විට ඇතිවුන බිය හදවත ද නවතින තරම්ය. එහෙයින් ඔහු නිතරම දූවගොස් කුඩම්මාට පෙරැත්ත කෙළේය.

"සල්ලි මදිකමකින් නම් ඒ වැඩේ අත්හරින්න ඉඩ දෙන්න එපා! මට තියෙන පොහොසත්කම් ගැන කෝකිලාට කියාපන්! මෙහාට ගෙනා පසු ඇගෙන් කිසිම වැඩක් නොගන්නා බවත් හොඳ හොඳ ඇඳුම් පැලඳුම් ඇඳිය හැකි බවත් කැමති නම් සෑමදම උනත් බලමාලුත් එක්ක කන්න දෙන බවත් කියාපන්!"

"ඇති ඇති ඔය! උඹ හිතුවද මම මෝඩියෙක්ය කියල. ඔය විගේ දේවල් කරණ පළමුවෙනි වතාව නොවෙයි මේ කරදර නොකර ඉඳපන් මම ඒව ඔක්කොම කරල දෙන්නම්."

ඉන්පසු නිශ්ශබ්ද වූ වං ලුං ලඟදී එන ඒ තරුණියගේ පැමිණීම නිමිති කොට ගේ දොර සුද්ද පවිත්‍ර කිරීමේ කටයුතුවල යෙදුනේය. ඔහු ඇඳ පුටු මේස ආදිය සේදෙව්වේ ඕලැං ලවාය. ඇයද ඔහු කිසිවක් නොකීවත් සිදුවන්නට යන දෙය දැන දැනත් බියෙන් බියෙන් තම යුතුකම් ඉටු කළාය. ඔහු අළුත් බිරිය වෙනුවෙන් තවත් කාමර තුනක් කරවා එයට අළුත් මිදුලක් ද සකස් කෙළේ ඇය හා විවේකයෙන් කාලය ගෙවීමටය. මේ මිදුල සකස්වුනේ ගෙයි මැද කාමරයට ඉදිරිපිටය. කාමර තුන ගොඩ නැගුනේ ඒ මිදුල වටාය.

ඔහු මේ කාමර තැනීම ගැන වං සමගවත් කිසිවක් කතා නොකෙළේය. දින කීපයක් ඇතුළත මේ කාමර තුනෙහි උළු තැබ්බවීමට ද ඔහුට හැකි වීය. නව බිරිය සඳහා පිළියෙළ කළ මේ කාමරවල බිම සකස් කෙළේ ගඩොල් වලිනි. එහි දොර ජනෙල් සඳහා ඔහු මැස්ස වූයේ රතු රෙදිය. අළුත් මේසයක් ද කැටයම් කළ පුටු දෙකක් ද මිලට ගත්තේය. බිත්තියෙහි එල්වීමට ගත් පිංතූර දෙකෙහි සිත්තම් කොට තිබුනේ කඳු ගැටයක් පාමුල වූ ජලාසයකි. වණ්වත් වීදුරු භාජන දෙකක් ද ඔහු මිලයට ගත්තේ රස කැවිලි පුරවා මේසය මත තැබීමට ය. කාමරයට සරිලන

පළල් ඇඳක් ද පිළියෙළ කළ ඔහු එය වටා එල්ලීමට රතු මල් වැටුන තිර රෙදි ද පිළියෙළ කෙළේය. මේ සියල්ලක්ම ඔහු කෙළේ ඕලැංට නොකියාය. බාප්පාගේ බිරිය අවුත් දෙර රෙදි දැමීම ආදී ගැහැණියක විසින් කටයුතු වැඩ කළාය.

මෙසේ ගෙයි කටයුතු නිමාවී මාසයක්ම ගත වුනේය. තව මත් මේ අලුත් මිදුලෙහි ඔහු කාලය ගෙවන්නේ තනියමය. මේ අතර මේ මිදුලෙහි කුඩා පොකුණක් කිරීමට ඔහුට සිතුනේය. එසේ සිතූ ඔහු වැඩ කරුවන් ලවා ඉතා ඉක්මනට හතරැස් පොකුණක් කප්පවා එය වටා ගඩොලින් තාප්පයක් ද බැන්ද වූයේය. ඉන්පසු ඔහු නගරයට ගොස් රත් මාලු කුරියන් කීප දෙනෙකු මිලයට ගෙණ ඒ පොකුණට දැම්මේය. ඔහු විසින් කළයුතු සියළුම කටයුතු නිමවා අවසථාව පැමිණෙන තුරු නොඉවසිල්ලෙන් බලා සිටියේය. මේ කාලය තුළ ඔහු කිසිවෙකු හා කිසිවක් කතා නොකෙළේය. එහෙත් හොටු පෙරාගෙණ කිලුටු ඇඳ ගෙණ දුව පැන ඇවිද්ද තම දරුවන්ට බැණ වැදුනේය.

දිනක් උදෑසන ඔහු ඕලැංට ද බැණ වැදුනේ ඔලුව නොපීරා ගැණීමේ වරදට ය. ඈ එද ඉකි ගසමින් හැඬුවාය. විවිධ කම් කටුලු වලට මුහුණ පාමින් ඝාම සෙවනැල්ල මෙන් ජීවත්වුන ඇය හඬනු දුටු පළමු වාරය ද මෙය මය. ඔහු රළු ලෙස යලි යලිත් කතා කෙළේය.

"ඇයි ගෑණියෙ මම කිව්වෙ වරදක්ය. ඔය අස්ප – වල්ගය වගේ තියෙන කොන්ඩය පීරා ගන්න එක උඹට ඔතරම් අමාරුය."

ඇය ඒ ගැන කිසිත් නොකියමින් හඬ හඬා මෙසේ කීවාය.

"මම උඹට පුත්තු ලබා දුන්න එක මදි ද?"

වං ලුං නිශ්ශබ්ද වුනේය. තමාට ම තොල් මතුරා ගත්තේය. ඔහුට ඇය නිසා ලජ්ජාවක් ඇති වුනේය. එහෙයින් ඇයට කැමැත්තක් කරන්ට ඉඩ හැරියේය. ඇත්ත වසයෙන් අතෘප්තිකර ඔහුගේ ආසාව හැර අන් කිසිවකින් ඇයට දෙස් පැවරීමට කිසිම හේතුවක් නොවීය.

මේ සියල්ලම සිදුවී දින කීපයක් ගත වුනේය. කුඩම්මා ඔහු වෙත පැමිණ මෙසේ කීවාය.

"වැඩෙ දූන් ඔක්කොම සම්පූර්ණයි. බාරකාර ගෑණි එන වෙලාවක ඒක කරාවි. රිදී කාසි සියයක් ඇගේ අතේ – තියෙන

එක තමයි තියෙන්නෙ. මැණික් අල්ලපු කරාබු ජෝඩුවකුත් රත් රත් මුද්දකුත් සේද රෙදි වලින් මැසූ ඇඳුම් ජෝඩු දෙකකුත් පට රෙදි වලින් මැසූ ඇඳුම් ජෝඩු දෙකකුත් සපත්තු ජෝඩු දෙකකුත් ඇයට දෙන එක විතරයි තියෙන්නෙ.''

ඇය කියූ මේ වචන වලින් ඔහුට ඇසුනේ ''වැඩේ දැන් ඔක්කොම සම්පූණයි'' යන වචනය පමණකි. ඉක්මණින් ගෙට ගිය ඔහු රිදී කාසි ගොඩක් ගෙනවුත් ඇයගේ අතට හලා ''උඹත් රිදී කාසි දහයක් ගනින්'' යයි කීවේය.

''නැහැ නැහැ මට එපා! උඹ මගේ පුතා, උඹෙන් ගත්තහම කොහොමද සල්ලි. මේ වැඩේ කරන්නෙ සල්ලි බලාගෙණ නොවෙයි.''

කුඩම්මා මෙසේ කිව්වේ අත දිග හැරගෙණ නිසා ඇගේ අතට ඒ මුදල ඔහු දැමුවේය.

ඔහු ඇය ගැන – බාප්පාගේ බිරිය ගැන – හොඳටම විශ්වාස කෙළේය. අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ද සියළුම රසවත් මස් මාංශ වර්ග ද රැස්කොට නොඉවසිලිමත්ව නියම දිනය එළඹෙන තෙක් බලාගෙණ සිටියේය. එහෙත් එය දවසකින් දෙකකින් නො එළඹියේය.

ග්‍රීෂ්ම ඍතුවේ අන්තිම දිනය එළඹුනේය. වෙල්යාය දෙස බලාගෙණ සිටි ඔහුට මිනිසුන් විසින් කර ගසා ගෙන එන දෝලාවක් දිස් වුනේය. මේ දෝලාව පසුපස ගමන් කෙළේ කෝකිලා නැමැත්තිය බව ඇතදීම ඔහු ඇඳින ගත්තේය. අනාතුරුව ඔහු සිත තුළ ඇති වුනේ බියකි. ඔහු වහ වහා ගෙට ගොඩවී මෙතෙක් දවස් ඕලැං සමග ගත කළ කාමරයට වැදී දොර වසා ගෙණ එහි අඳුරු මුල්ලක ගැන්නී කල්පනා කෙළේය. ගතවූයේ මොහො තකි. කුඩම්මා පැමිණ දොරටුව ලඟ හමුවීමට කවුදෝ කෙනෙකු සිටින බව ශබ්ද නගා පැවසුවාය.

ඉක්බිති ඔහු එළියට ආවේ මෙයට පෙර මේ තරුණිය නො දැකපු එකෙකු මෙනි.

''හා! මම හිතුවෙ නැහැ මේ වගේ ජාවාරම් අපට කරන්න වේය''යි කෝකිලාව කිව්වාය. මෙසේ කියූ ඇය මිනිසුන් විසින් බිම තබනු ලැබූ දෝලාව වෙත ගොස් ''ඉතින් බහින්න පද්මා මැණිකෙ, මෙන්න ඔබේ සවාමියා'' යයි කියද්දී දෝලා වාහකයින්

Scanned by CamScanner

එකිනෙකාගේ මුහුණු බලමින් සිනාසුනේ වං ලුං තුළ කුහුලක් ද ඇති කරමිනි. ඔහු තමාටම මෙසේ කියා ගත්තේය.

"මේ නගරයේ වීථිවල රස්තියාදු කාරයො වගයක්. ඒකට කමක් නැහැ. උන්ගෙ හැටි ඔහොම තමයි."

ඔහු දෝලාව වෙත ගොස් එහි තිරය එසෙව්වේ ඉන් පසුවය. කරන්නේ කුමක් දැයි කිසිත් නොදත් ඔහු දෝලාව ඇතුළත පරීක්ෂා කොට බැලුවේය.

එවිට ඔහුට පෙනුනේ දෝලාවෙහි සිහිල් සෙවනට වී ඕලු මලක් මෙන් සිටි ඒ තරුණියයි. ඔහුට සියල්ලම අමතක වුනේය. සිනාසෙන – විරිත්තන – උසුළු විසුළු කරණ ඒ දෝලාව උසුලා ගෙන ආ මිනිසුන් ගැන ද අමතක වුනේය. ඔහු කල්පනා කෙළේ මේ තරුණිය තමා මිලයට ගත් බවත් දැන් ඇය සදහටම මෙහි වසන බවත්ය. මලකට සුලභ වැදූන කලක් මෙන් ඒ තරුණිය නැගී සිටියාය. වං ලුං නොඉවසිලිවන්ව බලාගෙණ සිටිද්දී ඇය කෝකිලාවගේ අත අල්ලා ගෙණ දෝලාවෙන් එළියට බැස්සාය. නැමුනු හිසින් – පියවුන නෙත්වලින් යුතුව ඇ කෝකිලාගේ වාරු වෙන් පාවහන් පැලඳ ගමන් කෙළේ වැති වැතීය. මෙසේ ඇය ඔහු පසුකර යද්දී ඇ කථා කළාය.

"කොහේද මගේ කාමරේ?"

ඉදිරියට පැමිණි කුඩම්මා අනිත් පසින් සිට ගත්තේ ඉන් පසුවය. දෙදෙනා අතරට පැමිණි වං ලුං කාමරය දෙසට අත දිගු කෙළේය.

මේ සිද්ධිය නැරඹීමට ඔහුගේ ගෙදර ඒ මොහොතෙහි කිසිවෙක් නොසිටියේය. කුලීකරුවෝ ද ඈත කුඹුරුවල වැඩට ගොස් සිටියහ. චිං ද සිටියේ ඔවුන් සමගය. පොඩි ලමයින් දෙදෙනා ද පාසැල් ගොස්ය. මහල්ලා ද බිත්තියට හාන්සි වී නිදගෙණ සිටියේය. පුංචි කෙල්ල එහි සිටිමුත් ඇය යන එන කිසිවෙකු නොහැඳින්නාය.

පද්මා කාමරය ඇතුළට ගිය විට කෝකිලා තිර රෙදි ඇද වසා දැමුවාය. ටික වේලාවකට පසු සිනාසෙමින් අත පිස දමමින් එළියට ආ කුඩම්මා "උඹ හිතා සිටින තරම් තරුණ නැහැ ඒකි. දනට ඇගේ වයසෙ හැටියට තව ටික කලකින් ඇය දිහා කිසිම පිරිමියෙක් බලන එකක් නැහැ. එහෙම අඩුපාඩුවක් නැත්නම්

Scanned by CamScanner

කොච්චර සල්ලි තිබුනත් මෙහෙම ගොවිරාළ කෙනෙකුගෙ ගෙදර කට එන එකක් නැහැ.''

වං ලුං මෙයට කිසිවක් නොතෙපලා ගෙයි එහාට මෙහාට සක්මන් කෙළේය. අන්තිමේදී ඔහු ධෛර්‍යවත්ව ඇය හුන් අඳුරු කාමරයට ගොස් රැවනතුරු ඇය සමීපයට වී සිටියේය.

ඒ වනතුරුත් ඕ-ලෑං ගෙදර නොපැමිණියාය. හිමිදිරියේම උදැල්ලත් රැගෙණ දරුවනුත් අඬගසා ගෙන ගෝවා කොළයක එතූ හීල් කෑම ටිකකුත් ගෙණ ගිය ඇය ගෙදර පැමිණියේ රෑ බෝවූ පසුවය. ඇය කිසිවක් නොකියාම කුස්සිය බලා ගොස් රෑ කෑම පිළියෙළ කොට මේසය මත තැබුවාය. යලි මහල්ලාට ද කන්ට දී වං ලුං ට ද කෑමට අමතා ඇය ගෑණු දරුවාට බත් කැවීමෙන් පසු සෙසු දරුවන් සමග කෑම කෑවාය. වං ලුං මේසය ලඟ කල්පනා කරමින් සිටිද්දී කෑම කා අවසන් කළ ඇය ඇඟපත සෝදගෙණ සිය සයනෙහි වැතිරී හුදකලාවම නිදා ගත්තාය.

වං ලුං ට අළුත් බිරිය හා සතුටු වීමට හොඳටම නිදහසක් ලැබුනේය. ග්‍රීෂ්ම ඍතුවේ කිසිම දිනක පද්මා එළියට නාවාය. ඒ තරුණියගේ වැඩ කටයුතු කිරීමට කෝකිලා ද නතර වූවාය. ඒ වෙනුවෙන් කෝකිලාට විශාල මුදලක් ද ලැබුනේය. පද්මා සිය සැමියා වන වං ලුං හා කෝකිලාත් සමග ඒ කාමරයෙහි වෙන්ව විසුවාය. මෙසේ සීතල අඳුරු කාමරයෙහි වෙසෙමින් ඇය පලතුරු වර්ග හා රස කැවිලි අනුභව කළාය. උෂ්ණ දිනවල ඇය ඇන්දේ කොළපාට තුනී රෙද්දකි. ඇය නැහැවීමත් ඇයට කෑම පිළියෙළ කර දීමත් ඇඳුම් පැළඳුම් ඇන්දවීමත් කෝකිලාව විසින් කෙරුණේය. සවස් කාලයෙහි මිදුලෙහි සක්මන් කළ ඇය එහි වූ පොකුණට එබී රන්වන් මාලුවන් දෙස බලා සතුටු වූවාය. ඇය පසෙකින් සිටි වං ලුං ඇය දෙස නරඹමින් ඔහුගේ අත්‍යාප්තිකර ආසාව සන්සිඳුවීමට තැත් කළේය.

වං ලුං ගේ නිවසට පද්මාගේත් කෝකිලාගේත් පැමිණීම එතරම් සතුටුදායක දෙයක් නොවූයේ එහි සාමය කඩවී යන බවත් දිනෙන් දින පෙනෙන්නට වූ හෙයිනි. එක වහල යට එකම හිමියෙකුට අයිතිවාසිකම් කියන ගැහැණුන් දෙදෙනෙකුගේ වාසය කිසිදිනක සාමය පිණිස හේතු නොවීම සිරිතකි. වං ලුං මේ ගැන මුලදී කල්පනා නොකෙළේය. ඕලැංගේ අඳුරු බැල්මෙන් ද කෝකිලාගේ තියුණු බවෙන් ද යම්කිසි ඝට්ටනයක් ඇති බව ඔහුට දැනුනේය. එහෙත් ඒ කිසිවක් ඔහු ගණනට නොගත්තේ ආසාවේ අන්ධ බවෙන් එතෙක් වැසී සිටි හෙයිනි.

කාලයක් මෙසේ ගතවී යත්ම වං ලුං ගේ නිවසෙහි ඝට්ටනද ක්‍රමයෙන් වැඩි වන්නට වූයේය. ඕලැං නිශ්ශබ්ද ගැහැණියක් වීම මේ ඝට්ටනය ඇවිලුන ගින්නක් බවට පත් නොවීමට හේතුවක් වීය. ඕලැං තමාට විරුද්ධව වචනයක්වත් කථා නොකරණ බවට වං ලුං ට සහතිකය. ඇය පද්මාකෙරෙහි දක්වූයේ මෞන ව්‍රතයකි. ඇය ඇගේ කෝපය කෝකිලා කෙරෙහිද නොදක්වතියි ඔහු සිතුවේය.

වරක් පද්මා වං ලුං ගෙන් මෙබඳු ඉල්ලීමක් කළාය:–

"මම තනියම ජීවත්වන කෙනෙක්. ඒ නිසා අර ගැහැණී මගේ මෙහෙකාරිය වසයෙන් තබා ගැණීමට ඉඩ හරින්න. මගේ දෙමව්පියන් මැරුණෙ කතා කරන්නත් බැරි තරම් කුඩා කාලයක මා ජීවත්වන විටයි. මගේ මාම එකල මා විකුණුවෙ අද මා වගේම ජීවත්වන කෙනෙකුටයි."

Scanned by CamScanner

ඇය මෙසේ කීවේ දෙනෙතින් වැගිරෙණ කඳුළු බිඳු එක් අතකින් පිසදමමිනි. හඩ හඩා තමා දෙස බලමින් කරණ මේ ඉල්ලීම වං ලුං ට කොහෙත් ම ප්‍රතික්ෂේප කළ නො හැකි විය. ඇයට සේවය කිරීමට කිසිම කෙනෙකු නැතත් ඈ ඉල්ලන පරිදි ඕලෑංගෙන් ඒ කාරිය ඉටු නොවන බවද ඔහු දනියි. ඔහු එවැන්නක් බලාපොරොත්තු වූයේ ද නැත. ඕලෑං ද පද්මා සමග කතාබස් කිරීම තබා ඇයගේ ඉඳීම ගැන කිසිම සැලකිල්ලක් නො දක්වූවාය. මේ සේවාවට ගතහැකි කෙනෙකු වසයෙන් එහි සිටියේ කුඩම්මා පමණකි. එහෙත් කුඩම්මා එබිකම් කරමින් ඇය වෙත ගොස් තමා ගැන නිතර නිතර කතාබස් කර කර ඉඳීම ඔහු නොරිස්සුවේය. අන්තිමට ඔහු කල්පනා කෙළේ කෝකිලා ඇයගේ සේවිකාව වසයෙන් තබා ගැණීමටය.

කෝකිලා දුටු දවසේ පටන් ඕලෑං තුළ ඇතිවුන අඳුරු ගතිය වං ලුං දනියි. කෝකිලා ද වං ලුං ගෙන් ලැබෙන වැටුප් නිසා ඔහු වෙනුවෙන් ඕනෑම වැඩක් කිරීමට අකමැති නොවන්නියකි. තමා අර මහ ගෙදර – හ්වෑං මැඳුරෙහි–සිටිද්දී රදළ තැනගේ කාමර යෙහි සිටි බවත් ඕලෑං කුස්සියෙහි වැඩ කළ බවත් කෝකිලා අමතක නොකළාය. ඇයට ඕලෑං ප්‍රථම වරට හමුවුන ද මෙසේ කීවාය:–

''හා! කොහොමද යාළුව? ආයිමත් අපි හමුවුනා නේ. දැන් ඔබ තමයි මේ ගෙදර පළමු ස්වාමිදුව. මගෙ අම්මෝ පුදුම වෙනස් වීමක් නෙව මේක.''

කෝකිලාගේ මේ වචනවලට ඕලෑං කිසිත් කතා නොකළාය. කෝකිලා මෙහි වෙසෙන්නේ කුමක් නිසා දැයි ඇය දැනගත්තාය. ඒ මොහොතෙහි කිරි භාජනයක් ගෙනයමින් සිටි ඇය එය පසෙකින් තබා මැද කාමරයෙහි විවේකයෙන් සිටි වං ලුං වෙත ගොස් මෙසේ කීවාය:–

''මොකොද අර දස ගෑණි අපේ ගෙදර කරන්නෙ?''

''ඒකෙ වගක් උඹට මොටද?''

''අර මහ ගෙදර ඉඳිද්දිත් බේරෙන්න බැරුව හිටියෙ මේ කෝකිලා කියන ආඩම්බර කාර හැතිරිගෙන් තමයි. ඒ දවස්වල දවසට කීපවාරයක් කුස්සියට දුවගෙණැවිත් රදළ තැනට අරක ඕන මේක ඕනෙයි කියල කෑගහනව. මොනව හදල දුන්නත් උණු

වැඩියි සීතල වැඩියි එහෙමත් නැත්නම් ලුණු වැඩියි කියල කැගහනව. මම හැරුණත් ඇට ඒ දවස්වල හරි නැතිලු.''

වං ලූං කිසිවක් කතා නොකෙළේය. ඕලෑං ද පිළිතුරු බලාපොරොත්තු වෙන් නතරව සිටියාය. ඇය ගේ දෙනෙතට උණු කඳුළු කැට නැග එන්නට වුනි. ඇය කඳුළු නැවැත්වීමට ඇසිපිය ගැසුවාය. අන්තිමේ දී අතින් කඳුළු පිස දමමින් මෙසේ කීවාය:–

''මේක මගේම ගෙදර වෙලත් ඉන්න නැහැ නෙව දූකක් නැතුව. මොකොද කරන්නෙ. අම්ම කෙනෙක් ඉන්නව නම් මෙහෙම දුක් විඳ විඳ මෙතන ඉන්නෙ නැහැ.''

නිහඬවූ වං ලූං දුම් කෝව ගෙණ දැල්වූවේය. මඳ වේලාවක් ඔහු දෙස බලා සිටි ඇය හැඬූ කඳුලෙන් යුතුව ඔහුගෙන් ඉවත්ව ගියාය. එසේ ඉවත්ව යන ඇය දෙස බලමින් ඔහු මෙසේ කීවේය:–

''මම කරුණාවන්ත වුනා වැඩියි. මට වඩා නරක පිරිමි ඉන්න බව උඹ දන්නෙ නැහැ. ටිකක් ඉවසපන් ඕලෑං!''

ඕලෑං මේ වචනවලින් තෘප්තිමත් නොවූවාය. ඇයගේ ප්‍රතිපත්තිය ඇය කඩ නොකළාය – ඇයගේ යුතු කම් ඇය ඉටු කළාය. මහල්ලාට කරණ සත්කාරය ද වං ලූං වෙනුවෙන් කළ යුතු කටයුතු ද ඇය අත් නොහැරියාය. එහෙත් කෝකිලාට මුහුණ පාන්නට වුනේ දුෂ්කරතාවයකට ය. සිය සවාමිදූවට උණුවතුර ගෙනෙන්නට කුස්සියට ගිය කිසිම විටක එහි වතුර තිබුනේ නැත. ඇය ඇසූ කිසිම ප්‍රශ්නයකට ඕලෑං ගෙන් පිළිතුරු ලැබුනේද නැත. එහෙයින් කෝකිලාට සිදුවුනේ තම සවාමිදූව සඳහා අමුතුවෙන් වතුර උණු කර ගැණීමටය. වතුර උණුකර ගැණීමට ද උදුන ඉඩ කඩ නොවූයේ ඕලෑං උදය ආහාර පිළියෙළ කිරීමට සැරසුන හෙයිනි. කෝකිලා නොයෙක් ප්‍රශ්න අසද් දී ඕලෑං උයමන් කටයුතු වල යෙදුනාය.

''අනේ හාමිනේ, අර නෝනට වතුර ටිකක් වත් තවම දුන්නෙ නැහැ. ඉතින් වතුර ටිකක් උණු කරගන්නෙ කොහොමද?''

ඇයගේ හඬ නො ඇසුනාක් මෙන් ඕලෑං ලිපට දර දමමින් ගිනි මෙලෙව්වාය. තව දුරටත් බලා සිටිය නොහැකිව කෝකිලා ඇයට දෙස් තගමින් වං ලූං වෙත ගියාය. ''ඉතින් ඔය කල්

දේරමට තව වතුරටිකක් වැඩිපුර දැමුව නම් මොකොද වෙන්නෙ?'' යයි වං ලුං ද කෑගැසීය.

''මොකෝ උඹ මට කියන්නෙ මේ ගෙදර දසියන්ගෙත් දසියක් වෙන්නද මට?'' යයි ඕලෑං එයට පිළිතුරු දුන්නේ කෝපාත්මකවය.

මේ වචන ඇසූ වං ලුං ඇය වෙත පැමිණ දෙඋරෙන් අල්ලා සොලවමින් ''මෝඩවෙන්න එපා බාන් මෝඩවෙන්න එපා! ඒ වතුර දසිට නෙවි; මේ ගෙදර ස්වාමිදුවට '' යයි කිව්වේය.

''හා! හා! මම දන්නව, අර මගේ මුතු දුන්නෙ ඒකිට වෙන්න ඇති.''

වං ලුංට කතාකරගත හැකි නොවීය. ඔහුගේ කෝපය ලජ්ජාවට පෙරලුනේය. ඔහු කුස්සියෙන් ඉවතට ගොස් කෝකිලාට මෙසේ කීවේය:–

''අපි තව කුස්සියක් හද ගනිමු. මම උදුනක් බැඳ දෙන්නම්. අර ගෑණි දන්නෙ නැහැ මේ මලක් වැනි පද්මාගෙ සරීරයට දෙන්න ඕන සැප පහසුකම්. වෙනම කුස්සියක් හදගත්තහම උඹට ඕන කරන දෙයක් පිළියෙළ කරගන්න පුළුවන්.''

මෙසේ කියා දවස් කීපයකට පසු වං ලුං කුලී කරුවන් ලවා කුස්සියක් සාද උදුනක් ද බැන්ද වූයේය. එයට කල්දේරමක් ද වෙනත් අවශ්‍ය උපකරණ ද මිලදී ගෙනාවේය. එහි කටයුතු ද නිමවුන පසු වං ලුං ''ඔන්න දූත් උඹට ඕනෑම දෙයක් පිළියෙළ කරගන්න පුළුවන්'' යයි කියමින් කෝකිලාට කුස්සිය - භාර දුන්නේය.

මෙයින් පසු නියම ලෙස ප්‍රීතිමත් කාලයක් ගත කළ හැකියයි ඔහු සිතුවේය. පද්මා තමා දෙස බලන සෑම මොහොතකම ඔහු කෙරෙහි ඇතිවුනේ අළුත් පෙම් හැඟුමකි.

එහෙත් වැඩි කල් ගතවන්නට පෙර මේ අළුතෙන් තැනූ කුස්සිය ඔහුට කරදරයක් වීය. කෝකිලා දවස් පතා නගරයට ගොස් නොයෙක් වියදම් අධික කෑම වර්ග ගෙනාවාය. වං ලුං කිසි කළෙකත් නොදුටු පලතුරු වර්ග සීනි කෑම වර්ග මස් හා මාළු වර්ග මේ අතර වීය. මේ සඳහා අධික මුදලක් ඔහුගෙන් වියදම් වුවත් ''මේ බඩු හරි ලාභය''යි කෝකිලා කියූ විට ඔහුගේ සිත තරමක් සැහැල්ලු වීය. වරින් වර අධික ලෙස මුදල් වියදම් වීමෙන් නැඟුන හැඟීම් ඔහුට කිය හැකි නොවූයේ ඔවුන් අමනාප වෙතියි සිතූ නිසාය.

මේ වෙනුවෙන් ඔහුට කළ හැකි එකම කාර්‍ය්‍යය වූයේ මුදල් ඉල්ලන විට අමනාපයෙන් පටියට අත යැවීම පමණකි.

මේ අතර ඔහුගේ සිතට කරදරයක් බවට පත්වූ තවත් දෙයක් පැවතුනි. එය අනිකක් නොවේ; රසවත් කෑම් බීම් වලට මහත් ආශාවක් දක්වූ කුඩම්මා පද්මාගේ කාමරයට පැමිණ නිතර නිතර කතාබස් කරමින් හා කෑම් බීම් කරමින් කාලය ගත කිරීමය. පද්මා කුඩම්මාට ඇලුම් කිරීම වං ලුං ගේ සිත් නොගත්තේය.

දිනක් වං ලුං පද්මාට මෘදු ලෙස කතා කරමින් මෙසේ කීවේය:–"ඔයා අර නාකි තරබාරු ගෑණි – මගේ කුඩම්මා – යාලුකර ගෙන ඉන්න එක නම් හොඳ නැහැ. ඒකී මහ නරක ගෑණි."

පද්මා කෝප වූවාය. අසතුටු ගතියක් පළ කළාය. ඇය තම හිස ඔහු වෙතින් ඉවතට හරවා දෙතොල ගුලිකර ගත්තාය.

"මේක නේ හරි වැඩේ. ඉතින් ඔබ විතරයි මට ආශ්‍රය කරන්න තියෙන්නෙ. වෙන කෙනෙකු සමග කථා කරන්නවත් නරකයි. මට නිතරම පුරුදු නිතර ප්‍රීතියෙන් ඉන්නයි. ඔය උඹේ ගැහැණියි – දරුවනුයි මට මහ කරදරයක්."

ඇය ඇයගේ සෑම ආයුධයකම බලය යෙදවීමට අදහස් කළාය. එද රැය ඔහුට සිදුවුනේ ඇයගෙන් වෙන්ව විසීමටය. ඇය මෙසේ ඔහුට මැසිවිලි කිව්වාය:–

"ඔබ මට ආදරයක් ඇති කෙනෙක් නොවෙයි. ඉතින් මට ආදරේ තියෙනව නම් මම ප්‍රීතියෙන් ඉන්නවට කැමති වෙන්න ඕන."

මේ වචනවලින් වං ලුං ගේ හිත උණු වුනේය.

"හොඳයි හොඳයි ඔයාට ඕන එකක් කරන්න."

පද්මා ජයග්‍රාහක රැජිනියක් බවට පත්වූවාය. දැන් වං ලුං ඇයගේ අණසකින් බැඳලූවෙකි.

ඉන්පසු ඇයට කුඩම්මා සමග කතාබස් කිරීමට ද කුඩම්මා වෙනුවෙන් සංග්‍රහ පැවැත්වීමට ද සම්පූර්ණ නිදහසක් ලැබුනේය. එහෙත් වං ලුං ට ඉවසිය නොහැකි වූයේ පද්මා වෙනුවෙන් මිලයට ගන්නා කෑම වර්ග කුඩම්මා විසින් අනුභව කිරීමය. මේ නිසාම ටික කලකට පසු කලින් ඔහු තුළ වූ පද්මා කෙරෙහි ආලය ක්‍රමයෙන් ලිහිල් වන්නට වුනේය. ඕලැං හා තමාත් අතර තිබුන සම්බන්ධතාවයද දුදුරු වී ගොස් තිබුන නිසා තමාගේ කරදර ගැන ඇය සමග ද කථා කිරීමට ඔහුට නොහැකි වුනේය.

Scanned by CamScanner

මහළු කම නිසාම ගෙයි මුල්ලකට වී සිටි වං ලූං ගේ පියා මේ කිසිවක් නොදනියි. බිහිරිකම නිසා ගෙදර දෙරේ කෙරෙණ කතාබහ ඔහුට නොඇසෙයි. හුඟ දවසකින් එළියට නොබැස්ස නිසා මෙතෙක් සිදු වී තිබෙන වෙනස් කම් ද ඔහු නොදත්තේය. දිනක් ඔහුට එළියට බැස විපරම් කිරීමට සිතුණේය. එසේ සිතා සිය පුතා විසින් මිලයට ගෙණදුන් මකර හිසක් සවිකළ සැරයටියේ වාරුවෙන් එළියට අවුත් වට පිට බැලුවේය. මහල්ලා මෙසේ බලද්දී වං ලූං සිටියේ පද්මා සමග පොකුණෙහි වූ මාලුවන් නරඹමිනි. තම පුතා සායම් කළ ගැහැණියක සමග සිටිනු දුටු මහල්ලාගේ මුවෙන් මේ වචන මහත් රළු හඬින් ගිලිහුණි.

"මේ ගෙයි වෙසඟනකුත් ඉන්නව, වේස ගැණියක්! වේසියක්!"

වං ලූං මෙයට බියවුනේ අනිකක් නිසා නොවේ; මෙය ඇසුනොත් පද්මා කෝපයට පත්වෙතියි සිතූ නිසාය. ඔහු වහ වහා පියා වෙත ගොස් පසෙකට කැඳවාගෙණ යමින් "අනේ තාත්තෙ, මේ ඉන්නෙ වෙසඟනක් නොවෙයි; මගේ දෙවෙනි භාර්‍ය්‍යාවයි ඒ".

මෙයින් ද ඔහුට වෘද්ධයා නිහඬ කළ හැකි නොවීය. වෘද්ධයා නැවත නැවතත් මෙසේ කීවේය. මට හිටියෙත් එක ගැණියි. අපේ තාත්තට හිටියෙත් එකයි. අපි ගොවිතැනෙන් ජීවත් වුණ අය. දැන් ඒ වගෙ නොවෙයි. වෙසඟනක් නම් මෙහේ ඉන්නවාමයි."

මීලඟ වාරයේ සටන වෙන දෙයකින් ඇරඹුන බව වං ලූං ට වැටහුණේය. වැලැක් විය නොහැකි මේ සටන දිගටම කෙරී ගෙන ගියේය. මහල්ලා කපටි කෝපයකින් ආවේශ වී පද්මාගේ දොරටුව වෙත ගොස් නිතර නිතර මෙසේ කීවේය. "පුදුම විකාරයක් මේක! මම හිතුවෙ නැහැ මේ ගෙදරත් වෙසඟනකට නවාතැනක් වේය කියල."

මහල්ලා මෙපමණකින්ම නිශ්ශබ්ද නොවූයේය. ඇතැම් විට පද්මාගේ කාමරයෙහි දොරටුව වෙත ගොස් දොරෙහි තිරය ඉවත් කොට කාමරය ඇතුළට "ථූ" කියමින් කෙල ගැසුවේය; කුඩා ගල් කැට පොකුණට දමමින් තොල් මතුර මතුරා එහිවූ මාලුවන් ද බිය ගැන්වූයේය.

මෙයින් වං ලූං ට ඇතිවුනේ ලොකු ලජ්ජාවකි. මහල්ලාගේ මෙ ක්‍රියා වලින් ඇය කෝපයට පත්වීම වළක්වා ගැණීමට ඔහු වෑයම් කෙළේය.

Scanned by CamScanner

දිනක් වං ලූං ට පද්මාගේ කාමරය දෙසින් කෑ ගසන හඩක් ඇසුනි. ඔහු එහි ගිය විට ඒ පද්මාගේ කටහඩ බව දැනුනේය. මේ කෑගැසීමට හේතුව වී තිබුනේ වං ලූං ගේ නිවුන් දරුවන් දෙදෙනා ඔහුගේ වැඩිමල් ගැහැණු දරුවා ද මැදි කොට ගෙන ඇයගේ කාමරයට ගොස් තිබුන හෙයිනි.

වං ලූං ගේ වැඩිමල් පිරිමි දරුවන් දෙදෙනා පද්මාගේත්, පියාගේත්, සම්බන්ධය දනිතත් ඔහුගේ බාල දරුවෝ එය නොදත්හ. මේ බාල දරුවන් ඇයගේ කාමරයට වරින් වර පිවිස එහි තිබෙන සුවඳ වර්ග, අත පත ගෑමත් කෑම වර්ග වලට ඇඟිලි ගැසීමත් ඇයට කරදරයක් විය. මේ කරදරය ගැන ඇය වං ලූං ට කීවිට ඔහු ඇයට මෙසේ කීවේය.

''උනුත් කැමති ඇති තාත්ත වගේම ලස්සන මූණක් බලන්න''.

ඇයගේ බල කිරීම නිසා ඔහු තම දරුවනට ඒ කාමරයට නොයන ලෙස කීවේය. එතැන් පටන් ඔව්හු පියා සිටින විට පමණක් එහි නොගියහ. එහෙත් පියා නොමැති සෑම විටකම ඔව්හු එහි ගියහ. නිතරම මේ කාමරයට ඇදුනේ කුඩා පිරිමි දරුවන් දෙදෙනාය. වැඩිමහළු ගොළු ගැහැණු දරුවා මිදුලේ හිරු එලිය තපිමින් සෙල්ලම් කළාය.

දිනක් සවස් කාලයක කුඩා දරුවන් දෙදෙනා වැඩිමල් ගැහැණු දරුවා ද ඇද ගෙණ කාමරයට පිවිස පද්මා ඉදිරියෙහි සිටියහ. පද්මා ද මේ හදිසියෙන් පැමිණි ගොළු ගැහැණු දරුවා දෙස බලමින් සිටියාය. පද්මාගේ දිලිසෙන ආභරණ හා වණ්වත් ඇඳුමට සතුටු වුන ගොළු ගැහැණු දරුවා ශබ්ද විරහිත සිනහවක් පා පද්මා ඉදිරියට බඩගා ගෙණ අවුත් ඇය අල්වන්නට මෙන් අත දිගු කළාය. එවිට පද්මා සිනාසෙන අහිංසක කෙල්ලට ඇඟිල්ලක් දිගු කරමින් මෙසේ කීවාය.

''මෙකී එහෙම මගේ ළඟට ආවොත් මම නම් මේ ගෙදර ඉන්නෙ නැහැ. මේ වගේ මෝඩ–කාලකන්නි ජරා දරුවන් රැළක් ඉන්න බව දත්තව නම් මම මේකට එන්නෙ නැහැ.''

වං ලූං දරුවන්ට ආදරය ඇති මිනිහෙකි. ඇය දරුවන්ට කළ නිග්‍රහය ඔහුට ඉවසිය නොහැකි විය.

''හා! හා! ඔහොම කතා කරන්න එපා මගේ දරුවන්ට. මම නම් ඒකට කැමති නැහැ''යි කියූ ඔහු දරුවන් තමා ළඟට ගෙන්වා ගනිමින් වැඩි දුරටත් කතා කෙළේය. ''එන්න පුංචි දූ, එන්න පොඩි පුතා, එන්න ලොකු දූ, ඔය ගෑණිගෙ කාමරයට යන්න එපා! ඕකි උඹලට ආදරේ නෑ. ඉතින් ඒකි උඹලගෙ තාත්තට ආදරේ වෙන්නෙ කොහොමද?''

මෙය සිදුවී දවස් දෙකක් ගතවන තෙක්ම ඔහු පද්මා වෙත නොගියේය. නගරයෙන් රස කැවිලි වර්ග ගෙණවුත් දරුවන්ට දී ඒ දවස් කීපය ඔවුන් හා ප්‍රීතියෙන් ගත කෙළේය.

දවස් දෙකකට පසු ඔහු යළිත් ඇය වෙත ගියේය. ඇය ද ඔහු සතුටු කිරීමට මහත් පරිශ්‍රම දැරුවාය. එහෙත් ඔහු තුළ ඈ ගැන පෙර තරම් ඇලුම් බවක් එවක් පටන් ඇති නොවීය.

මෙසේ ගිම්හානය ද ගෙවී ගියේය. අහස ද වළාකුලින් තොරව පිරිසිදු බවක් පළ කෙළේය. පවිත්‍ර මන්ද මාරුතය ඉඩම් හරහා හමා ගියේය. වං ලුං ද දිග නින්දකින් පිබිදුනාක් මෙන් තම ගෙයි දෙරටුව වෙත ගොස් වෙල්යාය දෙස බැලුවේය. චණ්ඩ සූර්‍ය තාපයෙන් වියලී ගිය වෙල්යාය ඔහුට පෙනුනේය. දැන් ආලය කළ යුත්තේ මේ ඉඩම් වලට බව ඔහුට වැටහුනේය, ඇඳ සිටි දිග කබාය ගළවා දැම්මේය. විල්ලුද සපත්තු ද සුදු මේස් ද ඉවත් කෙළේය; දිග කලිසම් දනහිස් දක්වා නමා ගත්තේය; සේවකීය මිත්‍ර චිං ට මෙසේ ඇමතුවේය.

''කෝ උදැල්ල? කෝ නගුල? චිං එන්න! එන්න! කෝ මේ ඉඩමට බෝග? අනික් මිනිසුන්ටත් කතා කරන්න. අපි යමු යමු ඉඩම් වලට.''



ජගතයේ රෝගයෙන් පෙලුන වං ලූං දකුණු පළාතේ නගරයෙහි දී විඳි දහදුක් යලි ගමට අවුත් සරුසාර පසෙහි පහස විඳිමින් අමතක කළාක් මෙන් මෙද ඇතිවුන ආලයේ රෝගය ද ඔහුට අමතක කළ හැකිවූයේ සිය සරු සාර කුඹුරුවල වැඩ කරමිනි. පයට පෑගෙන තෙත පසෙහි පහස විඳ විඳ මුළු දවස පුරාම කුලී කරුවන් සමග ඔහු ද වැඩ කෙළේය. ඔහු ගොවිපලෙහි සෑම කාර්‍යයකම යෙදුනේය. ඇතැම් විටක ඔහු නගුල පසුපසද ඇතැම් විටක උදලුලෙන් පිඩෙලි පෙරලමින්ද කෙතෙහි ඔහුගේ කාලය ගෙවූයේ කුලීකරුවන් මදිකම නිසා නොවේ; එයින් ඇඟට ව්‍යායාමයකුත් සිතට ප්‍රීතියකුත් ඇතිවන නිසාය. මේ සාර භූමියේ පහස ලැබිය හැක්කේ මහන්සියෙන් එහි වැඩ කොට මඩ ඇඟ තවරා ගැනීමෙන් බව ඔහු දත්තේය. මෙසේ වැඩ කළ සෑම දිනකම ඔහු ගෙදර ගියේ හිරු බැස යන විටය.

මහන්සියෙන් ජනිත වේදනාවලින් පෙලුනත් ජයග්‍රාහී සවභාවයක් පළ කළ වං ලූං ගෙදර ගිය විගස ඇඟ සෝදගෙණ සේද ඇඳුම් කට්ටලය ඇඳගෙන පද්මා වෙත ගියේ–

''දැන් උඹේ ස්වාමියා ගොවියෙක්. උඹ දැන් ගොවියෙකුගේ බිරියක්''යයි සිනාසිසී කියමිනි.

''මම ගොවියෙකුගේ බිරියක් නොවෙයි. ඔබ ඔබට කැමති එකෙක් උනාට මට මොකද?''යයි කියූ ඇයගෙන් ඔහු ලෙහෙසියෙන්ම වෙන්ව ගියේය.

Scanned by CamScanner

ඔහු රෑ කෑම ගනිද්දී සිරුරෙහි මඩ හරියට නොසේදුන බව වැටහුණි. එහෙයින් නින්දට යන්නට පෙර යළිත් වරක් ඇඟ සෝදා ගත්තේ නොකැමැත්තෙන් මෙන්ය.

ගතවූන කාලයෙහි ඉඩම්වල වැඩ වලින් වෙන්ව සිටීමේ විපාක ක්‍රමයෙන් දැනෙන්නට වූයේ ඔහු විසින් කළ යුතු කාය්‍ය රාශියක්ම වූ හෙයිනි. සෑම කුඹුරක්ම සී සා පැල සිටුවන්නට කියන්නාක් මෙන් සැරසී තිබුනි. දිනපතා ඔහු ඒ සඳහා වෙහෙසුන නිසා ගතවූන කාලයෙහි හමෙහි ඇතිවූන සියුමැලි ගතිය හිරු රසට වේලී යළි කළුවත් බවට පෙරලුනේය.

ආලය නිසා ඇතිවූන කම්මැලිබවෙන් දිගුකලක් වැඩකට නොයෙදූ කරගැට ගැලවී ගිය ඔහුගේ සියුමැලි අත් යළිත් කරගැට වලින් ගැවසුනේය.

දහවලෙහිත් රැයෙහිත් ඔහු ගෙදර එන විට ඕලැං කෑම පිළියෙළ කර තැබුවාය. ඇය විසින් පිළියෙල කළ සිහින් මුතු ඇට වැනි බත් හා ගෝවාත් බෝංචිත් පාන් පිටි දවටන ලද සූදුලූනුත් සමග ඔහු අනුභව කෙළේ මහත් ප්‍රීතියෙනි.

සූදුලූනු ගඳ ගස්වමින් පැමිණෙන ඔහු පද්මා විසින් පිළිගනු ලැබුවේ නාසයද එක් අතකින් අල්ලාගෙණය. ඒ කිසිවක් ගණනට නොගත් ඔහු ශක්තිමත් සුසුම් ඇයවෙත හෙලුවේය. දැන් ඔහුට පද්මා වෙනුවෙන් තම ක්‍රියා හා තම ආහාර පාන නතර කිරීමට තරම් පිස්සුවක් නැත. දැන් ඔහුට ඔහුගේ කටයුතු අනුන්ගේ ගුණ දෙස් විවේචන ගණන් නොගෙණ නිදහස්ව කළ හැක.

වං ලුං ගේ නිවසෙහි ඒ ගෑණු දෙදෙනාම තම තමන්ට අයත් තැන් ලැබූහ. එහි සිටි පද්මා වං ලුං ගේ විනෝදය හා ප්‍රීතිය සඳහා ක්‍රියා කළාය. ඕලැං දරුවන් තැනීම ද ආහාර පිළියෙළ කිරීම ද ගෙදර දොරේ වෙනත් කටයුතු ද කළාය. කාමරය ඇතුළට වී රැජිනියක් මෙන් කල්ගෙවන පද්මා ගැන ගැමියන් කතා කරණවිට වං ලුංට ඇතිවූනේ සාඩම්බර හැඟීමකි. (කල්යාමකින් පද්මා ඔහුගේ ධනවත් කමේ ප්‍රධාන ලක්ෂණය හැටියට ගැමියෝ සැලකූහ.) වං ලුං ගේ ධනවත්කම කතා කරණ මිනිසුන් අතර මුල්තැන ගත්තේ ඔහුගේම බාප්පාය. තමාගේ ජීවත්වීමට වං ලුං ගෙන් ලැබෙන ආධාරය නිසා සුනඛයෙකුමෙන් කීකරුවූ ඔහු වං ලුං ගැන හඬ

Scanned by CamScanner

නගත ගමේ හොරණෑව බවට පත් විය. ඔහු නිතර මෙසේ කීවේය:–

"මගේ අයියගෙ පුතාට දූන් ඉතින් අග හිඟයක් නැහැ. දූන් ඔහු නඩත්තු කරන්නෙ විසාල පවුලක්. ඕන වීදියට කන්න බොන්න අඳින්න පලඳින්න එයාට දූන් පුළුවන්."

බාප්පාගේ මේ ගුණවැනීම නිසා ගැමියන් වං ලූං කෙරෙහි මහත් සැලකිල්ලක් ද භක්තියක් ද දැක්වූහ. ඉන්පසු පොලියට මුදල් ගන්නවුන් මෙන් ම දූ පුතුන්ගේ විවාහ මංගල අවස්ථාවලදී උපදෙස් ගන්නෝ ද නිතර නිතර ඔහු වෙත පැමිණියහ. ඉඩම් ආරවුල් වැනි ගැමියන්ගේ භෙද ද සමථයට පත් කිරීමෙහිදී ද වං ලූං ගේ සහාය නොමඳ ව ලැබුනේය. ඔහුගේ තීරණය කෙබඳු වුවද ගැමියෝ අවිවාදයෙන් පිළිගත්හ.

ආලයටම සීමිතවුන සිතිවිලි දූන් වං ලූං ට නැත. ඔහුගේ සිතිවිලි විවිධ කටයුතු සඳහා විහිදී ගියේ ආලයෙන් තෘප්තියට පත්වූ හෙයිනි.

කලට වැසි ද ලැබුනේය. ගොවිතැන්ද සරුසාර වුනේය. සීත සෘතුවද එළඹෙමින් තිබුනේය. ධාන්‍ය වර්ගවල මිල අධිකවූ විට වං ලූං රැස්කරගෙන සිටි ධාන්‍ය වර්ග වෙළඳ පොළට ගෙන ගියේ සවකීය ජ්‍යෙෂ්ඨ පුත්‍රයා ද කැටුවය.

ඔහුගේ පුතා කරදසියෙහි ලියන ලද අකුරු කියවන විට ද කරදසියෙහි අකුරු ලියන විට ද මිනිසුන් ඔහු දෙස බලා සිටියේ විශ්මයෙන් හා ආඩම්බරයෙනි. මේ ගැන වං ලූංට ද ඇතිවූනේ අසීමිත ආඩම්බරයකි. පෙර තමාට අකුරු බැරිකම නිසා සමච්චල්කළ වෙළඳුන් මෙද සිය පුත්‍රයා ගැන මෙසේ කියනු වං ලූං ට ඇසුනේය.

"ළමයගෙ අකුරු හරි ලස්සනයි. මේ ළමයා නම් ඥණවන්ත යෙක් වගෙයි."

ඔවුන් කියූ මේ වචනවලට වං ලූං සිනාසුනේ නැත. මෙහිදී ඇතැම් ගිවිසුම් පත්වලට අත්සන් කරන්ට සැරසෙමින් "මේක ලියල තියෙන ක්‍රමය වැරදියි. මේක ලියන්න ඕන මෙහෙමය"යි පුතා කියන විට වං ලූං ට ඇතිවූනේ හදවත පුපුරන්ට තරම් වන ප්‍රීතියක් හා ආඩම්බරයකි. වෙළඳුන් මේ ළමයාගේ නුවණැති බව ගැන කසු කුසු ගාමින් සිටිද්දී පසෙකට වී කහිමින් හා කෙල ගසමින් සිටි වං ලූං මෙසේ කීවේය.

''ඔව් ඔව්, ඔය වැරදි ඒවයි අපේ නම අත්සන් කරන්න එපා!''

වං ලූං ගේ පුතා විසින්ම එහි වැරදි තැන් සකස් කරණ ලදි. අනතුරුව ඔහු පියාගේ නියමය පරිදි ධාන්‍ය විකිණීමේ ඔප්පුවටත් මුදල් ගැණීමේ කුවිතාන්සියටත් අත්සන් කොට පියාත් කැටුව ගෙදර ගියේය.

වං ලූං සවකීය ජ්‍යෙෂ්ඨ පුත්‍රයාගේ අනාගතය ගැණ කල්පනා කරන්ට වූයේ පුත්‍රයාගේ යොවුන් බවත් නුවණැති බවත් දකිමිනි. ධනපතියෙකුගේ පුත්‍රයෙකු වන තම පුතාට සුදුසු විවාහයක් කරදිය යුතු බව ඔහු කල්පනා කෙළේය. සවකීය පුත්‍රයාගේ භාර්‍යාව වීමට සුදුසු තරුණියක් සෙවීම එතරම් සුකර නොවන බව ඔහු දන්නේය.

ගොවිතැන් පිළිබඳ කටයුතු මෙන්ම ගෙදර දෙරේ කටයුතු ගැන ද වං ලූං විවේක ඇති අවස්ථාවල සාකච්ඡා කෙළේ චිං සමගය. චිං වැඩි වයස් ඇත්තෙකු වූවද වං ලූං ට දක්වූයේ මහත් කීකරුකමකි.

එක් රැයක මේසය ලඟ පුටුවක වාඩිවී වං ලූං කතා කරන විට එයට ඇහුම්කන් දෙමින් චිං ඒ අසල බිම වාඩි වී සිටියේය. මේ රැයෙහි ඔහු කතා කෙළේ තම පුත්‍රයාට බිරියක් සොයා ගැණීමේ ප්‍රශ්නය ගැනයි. මෙයට සවන් දුන් චිං සුසුමක් හෙලමින් ''මගේ අර කෙල්ල හිටියනම් ඔය කාරණේ එතරම් අමාරු වෙන්නෙ නැහැ. නමුත් දූන් ඇය කොහේද කියල මම දන්නෙ නැහැ. සමහරවිට මැරෙන්නත් ඇති. අනේ මන් දන්නෙ නැහැ''යි කීවේය.

වං ලූං, චිං ට ඒ අවස්ථාවෙහි කියයුතු දෙය නොකීවේය; තමා ඔහුගේ දියණියට වඩා උසස් තරුණියක් පුතා වෙනුවෙන් සොයන බව ඔහුට නොකීවේය. චිං හොඳ මිනිහෙකු වූවත් ඔහු වැනි කුලී කරුවෙකුගේ දියණියක් තම පුතාට විවාහකර දීමට ඔහු කිසිවිටකත් කල්පනා නොකෙළේය.

වං ලූං ආත්ම විශ්වාසයම සවකීය අනුශාසකයා වශයෙන් තෝරා ගත්තේය. ඔහු තේ කඩවල ද කෝපි කඩවල ද වෙනත් තැන්වල ද ඉඳ තරුණියන් ගැන කරණ සාකච්ඡාවලට කන් දුන්නේය. ඔහු සිත තුළ තිබෙන මේ අදහස තවමත් කුඩම්මාට රහසකි. ගතවූන කාලයෙහි තේ පැන් සාලාවෙන් ගැහැණියක් ගෙන ඊමේ කාර්‍යයට [illegible] පුත්‍රයාගේ විවාහ මංගල කාර්‍යයට [illegible]

කර ගැනීම හෝ ඒ පිළිබඳ කරුණු ඇයට කීම සුදුසු යයි ඔහුට නොසිතුනේය.

ශීත ඍතුව එළඹියේය. හිම පතනය ද පටන් ගැණුනි. මේ ඍතුවේ කටුක බව මැඩගෙන අවුරුද්ද එළඹුණේය. ඔවුහු කා බී ප්‍රීති වූහ. වං ලුං බැලීමට ගමේ මිනිසුන් මෙන්ම නගරයේ මිනිස්සු ද පැමිණියහ. ඔවුන් එසේ පැමිණියේ අළුත් අවුරුද්ද වෙනුවෙන් වං ලුං ට සුභ පැතීමටය.

වං ලුං නිවාසය ද උත්සවශ්‍රීය උද්වහනය කෙළේය. ඔහුගේ නිවසෙහි දොරවල් හා ජනෙල්වල අලංකාර ලෙස රතු කරදසි අලවා තිබුනි. සේද ඇඳුම් කට්ටලයකින් සැරසුන වං ලුං අළුත් අවුරුදු ඇඳුමෙන් සැරසුන පුත්‍රයන් දෙදෙනා ද මැදි කර ගෙන සිත් ගන්න ලෙස පිළියෙළ කොට තිබුන කෑම මේසයට වාඩි වී මිහිරි ආහාරයක් ගත්තේය.

එළඹ තිබුනේ මුළු රටම සෞන්දර්යයෙන් සැරසුන සමයකි. මලින් හා පලින් බර රුක් ලිය ගොමු සෑම තැනම දිස් වුනේය. සීතල මන්දමාරුතය රුක් ලිය ගොමුවල සුපිපුන කුසුම් සුවඳ ඇද ගෙන රට පුරා හමා ගියේය. කෙත්වත් අස්වැන්නෙන් බරව පැවතුනේය. ළදරු බව ඉක්මවා සිටි වං ලුං ගේ පුතා හදිසියේ වෙනස් බවට හැරුණේය. අධික ලෙස කල්පනා කිරීමත් අධික කෝපයත් මේ වෙනස් බවෙහි ලකුණු වීය. බොහෝ විට ඔහු ආහාර ද වර්ජනය කෙළේය. පාසැල් යාම ද, පොත පත කියවීම ද අමතක කෙළේය. පුත්‍රයාගේ මේ වෙනස් වීම ගැන බියට පත් වං ලුං වෙදෙකු ගෙන්වීමට ද කතා කෙළේය.

දරුවාගේ වැරදි ඔහුට කිසිම විධියකින් හරිගැස්සිය හැකි නොවීය. කෑම නොගෙණ සිටින ඔහුට ''පුතා, අනේ මේ මසුයි බතුයි කාපන්'' කිවහොත් එය ද පුතාගේ කෝපයට හේතු වීය. එබඳු අවස්ථාවල වං ලුං මෘදු මොළොක් බසින් මෙසේ කීවේය.

''අනේ පුතා, කියන්න උඹට වෙලා තියෙන දේ.''

පුතා එයට පිළිතුරු දුන්නේ ඉකි බිඳ බිඳ හැඬීමෙන් පමණකි. පෙර ඔහු මහළු ගුරුවරයාට දැක්වූයේ මහත් හරසරකි. එහෙත් මේ දවස් වල පියාගේ අණ ලැබෙන තෙක් පාසැල් යාමට ඇඳෙන් නොනැගිට්ටේය. ඇඳෙන් නැගිට ද ඔහු පාසැල් ගියේ මහත් අකමැත්තෙනි. ඇතැම් දිනක පාසැල් යාමට ගෙදරින් පිටවුන

Scanned by CamScanner

ඔහු මුළු දවසම රස්තියාදු වුනේ නගරයේ වීථිවලය. ඒ බව වං ලූං රාත්‍රි කාලයෙහි දැන ගත්තේ "අද අයියා පාසැල් ගියේ නැතැ"යි බාල දරුවා කී පසුවය.

මෙයින් කෝපයට පත් වං ලූං ඔහුට බැණ වැදුනේ "මම ඉතින් නිකරුණේ මේ ළමයට මුදල් වියදම් කරන්නෙ මොනවට ද"යි කියමිනි.

දිනක් වං ලූං පාසැල් නොයෑමේ වරදට දෙවු පුතාට උණ පතුරකින් තැලීමට සැරසුනේය. ඕලෑං මෙය අසා කුස්සියේ සිට දුවගෙණැවිත් දරුවාට ත් තාත්තාට ත් අතර සිට ගත්තාය. පහර වල් කීපයක් ඇයගේ ඇඟට මෙන්ම පුත්‍රයාගේ ඇඟට ද වැදුනේය. එහෙත් වචනයක් වැරදුනත් අඬන මේ දරුවා උණ පතුරු පහර කමින් ද නොහැඬුවේය. එය වං ලූං ගේ විස්මයට හේතු විය.

එදින ඊ කෑමට පසු වං ලූං සවකීය පුත්‍රයා ගැන කල්පනා කරමින් සිටිද්දී කාමරයට යමින් සිටි ඕලෑං ඔහු ඉදිරියෙහි නතර වූවාය. ඇය යමක් කියන්නට සැරසෙන බව ඔහුට වැටහුනි.

"මොකෝ? මොනවද කියන්න තියෙන්නෙ?"

"ඔය පුතාට ඔය විධියට ගහල හරියන්නෙ නැහැ. මම දැකල තියෙනව අර මහ ගෙදර ඉඳිද්දි එහේ රදළ තරුණයන්ටත් හැදුන් ඔය වගේ ලෙඩක්. නාකි රදළය ඒකට කෙළේ ඔවුන්ට දසියො සොයා දීමයි. නැත්තම් දසියන් සොයා ගන්න ඉඩ හැරිය. ඉන් පස්සෙ ඔවුන්ගෙ ඒ ගති නැතුව ගියා."

"නැහැ නැහැ මගේ කොල්ලන්ට එහෙම වෙන්න කාරණයක් නැහැ. කෝ ඔය කාලෙදි මටත් ඔහොම දෙයක් වෙන්න එපායැ."

"ඔව් මමත් ඒක දැකල තියෙන්නෙ රදළ වරුන් අතර පමණයි. ඔයා කුඩා කාලෙ නම් නොයෙක් වැඩ කටයුතු තිබුන නෙව. මේ අපේ පුතා ජීවත් වන්නෙ රදළයෙකුගෙ පුතෙක් වගේ."

වං ලූං නිහඬ වුනේ ඇගේ වචනවල සත්‍යතාවය වැටහීම නිසාය. තම තරුණ කාලය ගෙවී ගිය හැටි ඔහුට කල්පනා වුනේය. එකල ඔහුට හිමිදිරියේ පිබිද ගොණා ද දක්කා ගෙන නගුල ද රැගෙන ගොවිපලට යාමට සිදු විය. ගොයම් කපා පැගෙන දවස් වල පිටකොන්ද කැඩෙන තුරුම වැඩ කරන්ට සිදු විය. ඔහුට

Scanned by CamScanner

වූවමනා නම් අඩන්නටද කෝප වන්නටද ඉඩකඩ ද කරුණු ද එමට තිබුනේය. එහෙත් බාධාවකට තිබුනේ ඇඩුම හෝ කෝපය භාර ගැණීමට කෙනෙකු එදා ඔහුට නොවීමය. එහෙයින් ඔහු නොහඩා කෝප නොවී වැඩ කෙළේය. තම පුතා පාසැලෙන් පැන ගියාක් මෙන් ඔහුට ද එදා ගොවි පලෙන් පැන යන්ට තිබුනි. එහෙත් ඔහු ගොවි පලෙන් පැන නොගියේ ආපසු පැමිණි විට නිරාහාරයෙන් සිටින්නට සිදුවන හෙයිනි.

එසේ සිය අතීතය සිහිකළ වං ලුං

"මගේ පුතා සුකුමාළව වැඩුන එකෙක්. මගේ තාත්ත දුප්ප-තෙක්. එයාගෙ තාත්ත ඉඩම් හිමියෙක්. එයාට වෙහෙස වෙන්න කිසිම කාරණයක් නැහැ. ඒ වගේම මගේ පුතා වගේ උගත් කෙනෙක් කුඹුරු වැඩවල යොදවන්නෙ කොහොම ද?"

"ඔව් එයා තරුණ රදළ කෙනෙක් උනත් කමක් නැහැ. එයාට දඩියන් අරන් දෙන්න මට බැහැ. ඉක්මනට විවාහයක් කර දෙමු"යි කියා එතැනින් නැගිට පද්මා වෙසෙන කාමරයට ගියේය.

Scanned by CamScanner

වං ලුං ගේ චිත්තව්‍යාකූල භාවය ඒ රැයෙහි පද්මාට දැනුනි ඔහු කාමරයට පිවිසුන විගස ඇය මුහුණ උල්කර ගත්තේ එහෙයිනි.

"ඔය විධියට මාං අමතක කොට වෙන වෙන දිහාවල ඔබේ සිත යොදවනව නම් මට කියෙන්නෙ ආයිමත් හිටි තැනටම යන එක" යයි කියමින් ඇය නෙත් කොනින් බැලූවිට වං ලුං ඇයගේ අත තම මුවට ලංකොට එහි මිහිරි සුවඳ වින්දේය. යළි ඔහු ඇය හා ආදරයෙන් කථා කෙළේය.

"මිනිහෙකුට තම කබායෙ සවිකරල තියෙන මැණික ගැන නිතරම කල්පනා කර කර ඉන්න බැරි බව ඔයා දන්නෙ නැද්ද? එහෙම උනාට යම් විදියකින් ඒ මැණික නැති උනොත් ඔහුට ඒක ඉවසන්න බැරි දෙයක් වෙනව. මේ දවස්වල මම කල්පනා කරන්නෙ මගේ වැඩිමහල් පුතා ගැනයි. එයාට කසාදයක් බන්දල දෙන්නයි මගේ දැන් කල්පනාව. ඒකට කවුරු සොයා ගන්නවද කියල තවම තීරණයක් නැහැ. මේ ගමේ ගොවිරාල කෙනෙකුගෙ දුවක් බඳිනවට මම නම් කැමති නැහැ. කපු කම් කරණ ගැණියෙකුට මේ කාරණේ කියන්නත් මම කැමති නැහැ. ඉතින් එහෙම කෙනකුට කිව්වොත් ඒකි කරන්නෙ ඔය කොහේද නැති මෝඩ කෙල්ලක් අල්ලල දීල ලාභ ගන්න එකයි."

වං ලුං ගේ මේ කතාව පද්මාගේ ද සැලකිල්ලට භාජන වූයේ එහි කථා නායකයා වූ පුත්‍රයා හොඳින් වැඩී සිටි තරුණයෙකු වූ

Scanned by CamScanner

නිසාය. ඇයට ද ඔහු කෙරෙහි ඇතිව තිබුනේ ආසාවකි. ඔහු වෙනුවෙන් කථා කරන්නට ද ඇය කැමති වූවාය.

''අර තේ පැන් හලේ ඉඳිද්දි මා ළඟට නිතර නිතර මිනිහෙක් ඇවිත් ඇවිත් හිටිය. ඒ මිනිහ කිව්ව මා වගේම ලස්සන දුවෙක් ඔහුටත් ඉන්නවයි කියල. ඒ හන්ද ම එයා වෙන ගෑණියෙක් ළඟට ගියා.''

''ඉතින් ඒ මිනිහ කොයි විදියෙ මිනිහෙක් ද?''

''ඒ මිනිහ හොඳ කෙනෙක්. නිතර සල්ලිත් අතේ තිබුන. අප ළඟට පැමිණි අනිත් මිනිසුන්ට වඩා හොඳ හැදිච්ච ගතියක් ඔහුට තිබුන.''

සවකීය පුත්‍රයාගේ විවාහය පිළිබඳ හොඳ ප්‍රවෘත්තියක් ඇයගේ කථාවෙහි ගැබ් වුවත් ඔහු එයට ඇහුම්කන් දීමට මැලි කෙළේ පද්මා පෙර ගත කළ ජීවිතය එහි පසුබිම වූ හෙයිනි. එහෙත් ඔහු ඇයගෙන් මේ ප්‍රශ්නයද ඇසුවේය:-

''ඉතින් ඔච්චර සල්ලි තියෙන මිනිහගෙ රස්සාව මොකක්ද?''

''මම හරියට දන්නෙ නැහැ ඒක. මේ ඔක්කොම තොර තුරු දන්නව ඇති කෝකිලා. මම හිතන්නෙ එයා ධාන්‍ය වෙළඳ පොලක අයිතිකාරයෙක් කියලයි. හොඳයි අපි එයාගෙන් අහල බලමු.''

මෙසේ කියන විට කෝකිලා කුස්සියෙහි සිට දුවගෙණ ආවාය. ඇයගේ කම්මුල් ගින්දරෙන් රතුවී තිබුනි.

''කවුද අර ඒ දවස්වල මා ළඟට ඇවිත් මා එයාගෙ දුව වගේය කියල වෙන එකියක් ළඟට ගිය පොහොසත් මිනිහ?''

''ඔය කියන්නෙ අර ලියූ කියන මිනිහ වෙන්න ඇති. ඒ මිනිහ ධාන්‍ය වෙළෙන්දෙක්. එයා හොඳ සල්ලි කාරයෙක්.''

''එයාගෙ වෙළඳ පොල තියෙන්නෙ කොහේ දැ''යි වං ලුං බලාපොරොත්තු රහිත ලෙස ඇසුවේ මෙය ගැහැණුන්ගේ කථාවක් වූ හෙයිනි.

''අර ගල් පාලම් වීදියෙ''යයි කෝකිලා වචන අවසන් කරන්නට පෙර වං ලුං අත්පොලසන් දුන්නේය.

''හා එතෙනට තමයි මගේ ධාන්‍ය විකුණන්නෙත්. ඒක හොඳ වැඩේ. ඒක නම් කරගන්නත් පුලුවන්'' යයි ඔහු කීවේ ඔහුගේ දුව හා විවාහ වීම වාසනාවන්ත දෙයක් ලෙස සැලකූ නිසාය. යමක්

Scanned by CamScanner

සිදුකරන්නට තිබෙන විට කෝකිලාවට මුදල්වල ඉව වැටීම නම් වැළැක් විය නොහැකිය. එහෙයින් කෝකිලා ඇගේ අත් ඇඳුමෙන් පිසදමමින්,

''ඔව් ඔව් ඒ වෙනුවෙන් ඕනෑම දෙයක් මට කළ හැකි'' යයි කීවාය.

''ඇත්ත තමයි. කෝකිලාට ඒ මිනිහගෙන් මේ කාරණය ගැන අහන්න පුලුවන්. මේක හරියටම හරි ගියොත් කෝකිලාටත් වාසියක් වේවි''යි පද්මා කීවේ මහත් ප්‍රීතියෙනි.

''හා! ඒකනම් වරදින්නෙ නැහැ. මම දූන් උනත් යන්නම්. ඔන්න මස් මාලු එලෝලු එක්කෝම සූදනම් කරළයි ඇත්තෙ. ලිපේ තියන්න විතරයි තියෙන්නෙ.''

''නැහැ නැහැ ඉක්මන් වෙන්න කාරණයක් නැහැ. තාම මේ ගැන මම තීරණයක් කළෙත් නැහැ. මම තීරණයක් කල්ල කියන්නම්.''

මෙසේ පුතාගේ විවාහය ගැන තීරණයක් දීමට වං ලුං ට දින කීපයක්ම ගතවී ගියේය. එක් දිනක් උදයක කවුදෝ ඇද වැටෙන ශබ්දයක් වං ලුං ට ඇසුනේය. කලබලයට පත්ව වට පිට බැලූ ඔහුට පෙනුනේ මිදුලේ ඇද වැටී සිටි වැඩිමහළු පුතාය. ඔහු ඕලැංට ද කතා කරමින් එහි දුව ගියේය. වමනය ගොඩක ඇද වැටී සිටි ඔහුගේ මුහුණ රතුවී තිබුනි. පුතාගේ මුවෙන් නොකඩවා පැමිණි වයින් ගඳ වං ලුං වළකා ගත්තේ නාසයද එක් අතකින් අල්වා ගෙනය. වං ලුං ඕලැංගේ ද සහාය ඇතුව දරුණු රෝගී සවභාවයකින් පසුවුන පුත්‍රයා ඔසවා ගෙණවුත් ඇඳක තැබීය. ඇඳෙහි තැබූ විගස ඔහු නිදන්නට පටන් ගත්තේය. එහෙත් පියා ඇසූ කිසිම ප්‍රශ්නයකට පිළිතුරු නොදුන්නේ කතා කරගත හැකි ශක්තියක් ඔහුට නොවූ හෙයිනි.

අනතුරුව වං ලුං පිරිමි ලමයින් දෙදෙනා නිදගන්න කාමරයට ගියේය. බාල පිරිමි ළමයා නින්දෙන් නැගිට ඇනුම හරිමින් පාසැල් යාමට සිය පොත් ගොඩ ලේන්සුවක ඔතමින් සිටියේය.

කාමරයට පිවිසුන වං ලුං මෙසේ ඇසුවේය.

''ඊයෙ රෑ ලොකු එකා මෙහෙ නිද ගත්තෙ නැද්ද?''

''නැහැ''යි බාල පුතා පිළිතුරු දුන්නේ අකමැත්තෙන් භාවියෙනි.

''එහෙනම් ඊයෙ රෑ කොහේද ගියේ?''

මේ ප්‍රශ්නයට නිහඬ වුන බාල පුතාගේ බෙල්ලෙන් අල්ලා සෙලවූ වං ලුං ''කියාපිය, ඇත්ත'' යයි කෑගැසුවේය.

මෙයින් ලමයා බියපත් වුනේය, අඬමින් හා ඉකි බිඳිමින් මෙසේ ද කීවේය:-

''අයිය මට කිව්ව කියන්න එපයි කියල. කිව්වොත් ඉදිකටුවකින් අනිනවයි කියල සහතික වුනා. නොකිව්වොත් පැන්සයක් දෙනවයි කියල පොරොන්දු වුනා.''

''එහෙනම් මූ මරන්නයි තියෙන්නෙ කියාපිය ඇත්ත.''

''එයා රෑ තුනකින් මෙහේ නිදාගත්තෙ නැහැ. මොනව කරණවද කියල මම නම් දන්නෙ නැහැ. තාත්තගෙ බාප්පගෙ පුතත් එක්කයි එයා යන්නෙ.''

කොළුවා මෙසේ කී විට කොළුවාගේ බෙල්ල අත හැර වං ලුං බාප්පා පදිංචිව සිටින කාමරයට ගියේය. මත් පැන් පානයෙන් වෙරි වී සිටි බාප්පාගේ පුතා ඔහුට හමුවුනේය.

''උඹ මගේ ලොකු එකා එක්කර ගෙන ගියේ කොහේද?''

''එයා එක්කර ගෙන යන්න මම ඕනද? එයාට බැරිද තනියම යන්න?''

මෙයින් වං ලුං ගේ කෝපය ඇවිස්සුනේය. එහෙයින් බිය කරු හඬින් කතා කෙළේය.

''හොඳයි ඒකට කමක් නැහැ. ඒක ඊයෙ රෑ කොහේද ගියේ?''

''එයා ඊයෙ රෑ හිටියෙ අර මහ ගෙදර ගණිකාවකගෙ කාමරයක.''

මෙය ඇසූ විගස වං ලුං උදෑසන කෑමද නොගෙණ ගේට්ටු වෙන් පිටවී කුඹුර හරහා ගමන් කෙළේය. වෙනද කුඹුර හරහා ගමන් කරණ විට ගමනට වඩා ඔහු සැලකිලිමත් වූයේ සිය කුඹුරු නැරඹීමටය. එහෙත් මේ දිනයෙහි සිය කුඹුරුවල අස්වැන්නෙහි සරු සාරත්වය ඔහුට නොපෙනුනේය. බිම බලාගෙණ ගමන් කරමින් නගරයේ දොරටුවෙන් ඇතුළුවී ''මහ ගෙදර'' බලා පා නැගුවේය.

පෙර මෙන් මෙහි ගේට්ටුව වසා නොතිබුනි. මුරකාරයෝ ද නොවූහ. වුවමනා කෙනෙකුට ඇතුල් වීමට ද පිටවීමට ද හැකි

Scanned by CamScanner

තත්වයකි එහි පැවතුනේ. ඔහු නිදහස් ලෙස ගේට්ටුවෙන් ඇතුළු වුනේය. එහි මිදුල් ද කාමර ද සාමාන්‍ය මිනිසුන්ගෙන් ගැවසී තිබුනි. සෑම කාමරයක්ම සාමාන්‍ය පවුලක් විසින් කුලියට ගෙන තිබුනි. මිදුලෙහි අලංකාරය සඳහා වවා තිබුන ලොකු ලොකු ගස් එද එහි නොතිබුනි. එහි සෑම මිදුලක්ම කසළින් පිරී පැවතුනි.

ගේට්ටුවෙන් ඇතුළුවුන හැටියේම හමුවුන කාමර පේලියෙහි ප්‍රථම කාමරය ලඟ සිට ගනිමින් ''යෑං'' නැමති වෙසඟන වසන කාමරය ගැන විපරම් කෙළේය.

''අර යෑං නමැති වෙසඟන වසන්නේ කොහිද''යි ඔහු ඇසුවේ කකුල් තුනක් ඇති බංකුවක වාඩි වී සපත්තු මසමින් සිටි ගැහැණියකගෙනි. දකුණු පැත්තෙහි වූ දෙරක් දෙසට ඔලුව දිගු කිරීම පමණකින්ම ඇය එයට පිළිතුරු දුන්නාය. නැවත සපත්තුව මැහීමෙහි යෙදුන ඇය දෙස බැලූ ඔහුට සිතුනේ තමා ඇසූ ප්‍රශ්නයම අද තවත් කීප දෙනෙකු විසින්ම අසන්නට ඇත යන්නය.

කෙසේ වුවද ඔහු ඒ ගැහැණිය විසින් පෙන්වූ දෙර වෙතට ගොස් එයට ගැසුවේය. කාමරය ඇතුලෙන් කෝපාත්මක හඬක් ඇසුනි.

''මොන කරදරයක්ද මේ? අද මුළු රෑම වැඩකළ මම මේ හදන්නෙ නිද ගන්නයි. අද රෑට වැඩ භාරගෙන හමාරයි.''

එහෙත් ඔහු නැවතත් දෙරට ගැසුවේය. යළිත් පෙර ඇසුනු හඬම ඔහු සවණට පැමිණියේය.

''කවුද ඔය?''

උත්තරයක් නොදී යලිත් ඔහු දෙරට ගැසුවේය. ටික වේලාවකට පසු දෙර වෙත එන අඩි හඬක් ඇසුණේය, දෙර විවෘත වුනේය. එයින් එළියට ආ ගැහැණිය තරුණියක් නොවේ. ඇයගේ මුහුණෙහි විඩාපත් බව පිළිබිඹු වී තිබුනි; සන යටිතොල එල්ලෙමින් තිබුනි. තොල්වලද කම්මුල්වලද රතු සායම් ගා තිබුනි. නළලෙහි ගා තිබුනේ සුදු සායමකි.

ඇය ඔහු දෙස බලමින් මෙසේ කීවාය.

''වෙන දවසක වරෙන්. දූන් නම් නිදගන්න ඕන, ඕන නං අද හවසට වරෙන්.''

Scanned by CamScanner

වං ලුං ඇයගේ මේ කතාවට බාධා කෙළේය. පුතාගේ මෙහි පැමිණීම තව තවත් ඔහුගේ කෝපයට හේතුවූනේ ''ඇයගේ පිළිකුල් දර්ශනය'' නිසාය.

''මම ආවෙ මට වුවමනාවකට නෙවි. මගේ පුතා ගැන කාරණයක් දැනගන්න.''

''පුතා ගැන මොන කාරණයක් ද?''

''එයා ඊයෙ රෑ මෙහේ ආවද?''

ඊයෙ රෑ මිනිස්සු නම් කොච්චරවත් ආව. මම දන්නෙ කොහොමද මොකාද කියල?''

''හොඳට කල්පනා කරපන්! පුංචි හීන්දෑරි තරුණ කොල්ලෙක් ආවෙ නැද්ද කියල, හැබැයි වයසට වැඩිය උසයි.''

''ඔව් ඔව් මට මතකයි ඒවගේ කෙනෙක් ආව තමයි''

''ඔව් ඔව් එහෙනම් ඒ මගේ පුතා තමයි''

''ඉතින් මොකොද මෙච්චර සොයන්නෙ?''

''එයා ආයිමත් ආවොත් පන්නා ගනින්! කියාපන් උඹ කොල්ලො බාරගන්නෙ නැතෙයි කියල. එහෙම පන්නන හැම වාරයකටම දෙගුණයක් ගාස්තු මම දෙන්නම්''

එවිට වං ලුං දෙස ඉහි බිහි කළ ඇය සිනාසෙමින් ''ඔව් එහෙම නම් ඒක බොහොම හොඳයි. නිකන් ඉඳලත් සල්ලි ලැබෙනව නම් ඒකට නරකෙයි කියන්නෙ කවුද?'' යයි කීවාය.

''ඔව් එහෙම හොඳ''යයි කියමින් ඔහු ගෙදර බලා ගමන් කෙළේ යැං නැමති වෙසඟනගේ දර්ශනයෙන් ඇතිවූන පිළිකුල නැතිකර ගන්නට මෙන් කෙල ගසමිනි.

මෙසේ ගෙදර පැමිණි විගස ඔහු කෝකිලාව කැඳවා ''උඹ එද කියාපු විදියට අර ධාන්‍ය වෙළෙන්ද ලඟට ගිහිල්ල ඒ වැඩෙ කරපන්. හැබැයි දැවැද්දත් සෑහෙන ගණනක් ඕන. කෙල්ල ලස්සන නම් දැවැද්ද ටිකක් අඩුවූනත් කමක් නැහැ''යි කීය.

මෙසේ අණකොට ඔහු කාමරයට ගොස් නිදන පුතා ලඟ වාඩිවී කල්පනා කෙළේය. රූමත් පුතාගේ තාරුණ්‍යය ඔහුට පෙනුනේය. මේ අතර ඕලැං කාමරයට පිවිස දහඩියෙන් තෙමුන පුත්‍රයාගේ මුහුණ විශාකිරි මිශ්‍ර උණු වතුරෙන් සේදූවාය. මෙබඳු සේදීම මහ ගෙදර රදළ තරුණයන් මත්වූ විට ද කළ බව ඇයට හොඳට මතක තිබුනි. මෙයින් ද ඔහුගේ

Scanned by CamScanner

මත් ගතිය පහව නොගිය බව දුටු වං ලූං තම බාප්පා ගේ කාමරයට ගියේ කෝපයෙන් සැලි සැලීය. බාප්පා ඔහුගේ තාත්තා ගේ සහෝදරයා බව ද අමතක වූයේය. ඔහුට මතක් වූයේ මේ මිනිහා තම පුතා කෙලෙසූ කම්මැලි අතිකරු තරුණයාගේ පියා බව පමණකි. කාමරය ඇතුළටම ගිය ඔහු මෙසේ කීවේය:-

"මේ ගුණේ නැති සර්පයෝ රැළක් තියාගෙන මට ඇති කරදරයක මහත! ඔන්න උන් දූන් මාව දෂ්ටකළා!"

මේසයට හේත්තු වී උදය ආහාර ගනිමින් සිටි බාප්පා කම්මැලි ලෙස හිස ඔසවා "මේ මොකද" යයි ඇසුවේය.

එවිට වං ලූං කෝපයෙන් තතන තතනා සිදුවූ සියල්ල විස්තර කෙළේය. බාප්පා මහත් ලෙස සිනාසී මෙසේ කීවේය:-

"හා! උඹට පුළුවන්ද කොළුව ඉලන්දාරියෙක් වෙන එක වළක්වන්න. ඕවයි හැටි ඔහොම තමයි."

බාප්පාගේ මේ වචන වලින් ඔහුට සිහිපත් වූයේ ගතවූන කාලයෙහි බාප්පා නිසා විඳින්නට සිදුවූන නොයෙක් ගැහැටය. පෙර දිනක බාප්පා තමාගේ ඉඩකඩම විකිණීමට බල කළ හැටිද ඔහුත් ඔහුගේ බිරියත් පුතාත් කමින් බොමින් තම ගෙදර ජීවත් වන හැටිද කෝකිලාව විසින් පද්මාගේ ප්‍රයෝජනයට පිළියෙළ කරණ රසආහාර බාප්පාගේ බිරිය කන හැටිද තම දෙටු පුතා බාප්පාගේ පුතා විසින් කෙලෙසනු ලැබූ බව ද ඔහුට සිහිවූයේය. ඔහු දත්වලින් තම දිව සපාගෙන බාප්පාට මෙසේ කීවේය:-

"පලයන් මගේ ගෙයින් එළියට. උඹ ඕනත් නැහැ. උඹේ හැතිකරේ ඕනත් නැහැ. අද ඉඳල මෙහෙන් නම් බත් කන්න අදහස් කරන්න එපා! උඹල මේ ගෙයි තියාගන්නවට වඩා හොඳයි මේ ගේ පූච්චල දමන එක."

වං ලූං ගේ මේ කතාව අස අසා උදය ආහාරය නිම කළ බාප්පා ඔහුගේ කතාව ගණන් නොගත්තේය. එහෙයින් වං ලූං අතක් ඔසවාගෙණ ඔහු ඉදිරියට යන විට "උඹ බය නැත්නම් මාව පන්න දමාපන්" යයි බාප්පා කීවේය.

"හා! ඒ මොකද? ඒ මොකොද?"

බාප්පා කබාය විවර කොට එහි වාටියෙහි ගසාගෙණ තිබුන කිසිවක් පෙන්නුවේය. එකෙණෙහි වං ලූං නිශ්චල වූයේය. රතු

කෙස් වලින් තැනූ බොරු රැවුලක් හා රතු රෙදි කැබැල්ලක් බාප්පා ළඟ තිබෙනු ඔහු දුටුවේය.

මේ රතු රැවුල හා රතු රෙදි කැබැල්ල වයඹ දිග ප්‍රදේශයේ කොල්ල කෑමෙහි යෙදුන හොර කණ්ඩායමෙහි ලකුණු ය. ඔහු මේවා දෙස මොහොතක් බලා සිට වචනයකුදු නොදොඩා කාමර යෙන් එළියට ආවේය.

එවක් පටන් වං ලුං කාලය ගත කෙළේ භීතියෙන් හා සැක යෙනි. අභිමත පරිදි බාප්පා නිතර ගෙදරට ආවේය–ගියේය. එහෙයින්ම බාප්පාගේ දර්ශනය වං ලුං ට බිය ගෙණ දෙන්නක් වූයේය. ඔහු බාප්පාට විරුද්ධව වචනයකුදු එතැන් පටන් කතා නොකෙළේය. සොරුන් ගැන මහත් බියක් දක්වූ ඔහු රාත්‍රියෙහි ඇසෙන ශබ්දයන්ට කන් දෙමින් සෙව්ල්ලෙන් සිටියේය. එහෙත් ඔහුගේ ගෙදරට සොරු නාවෝය. දෛවයෙන් තම ආරක්ෂාව සැලසෙන බව ඔහු සිතුවේය. එතැන් පටන් සියලුදෙය ගැනම පරීක්ෂාකාරීවූ ඔහු දෙවියන්ට පුදන සුවඳ දුමෙහි පවා නොසැලකිලිමත් වූයේය. සුවඳ දුම් නැතත් දෙවියන් තමාට සලකන බව ඔහුට සිතුනේය. කුඹුරුවල – ඉඩම්වල කටයුතු ගැන හැර වෙන දෙයක් ගැන ඔහු කල්පනා නොකෙළේය. වරින්වර ඔහු තුළ බියක් ඇතිවුනේ බාප්පා ලය පෙදෙසෙහි සඟවා ගෙණ හුන් දේවල් ගැනය.

ඔහු ඉන්පසු ගෙයින් පිටවන්නට යයි බාප්පාට කිසි දිනක නොකීය. බාප්පාගේ බිරියට ද ඔහු පෙරැත්ත කෙළේ මෙසේය:–

"උඹට කැමති දෙයක් මේ ඇතුළු කාමරවලට ගිහින් කාපන්. වියදමට සල්ලි ඕන නම් මගෙන් ඉල්ලපන්."

ඔහු බාප්පාගේ පුතා ද අමතක නොකෙළේය. "මෙන්න උඹටත් සල්ලි. ඉලන්දරින්ට සෙල්ලම් කරන්න ඕන නොවැ" යි කියමින් ඔහු බාප්පාගේ පුතා ඇමතුවේ එතරම් කරුණාවකින් නොවේ.

දුන් මහා රැකවරණයක යටතේ වං ලුං ගේ දෙවු පුතා වෙසෙයි. හිරු බැස ගිය පසු ගෙයින් බැහැර යාමට ද ඔහුට ඉඩකඩ නොමැත. ගෙදරින් බැහැර යාමට නොහැකි වූ නිසා දරුවාගේ කෝපය පෙරට වඩා අධික වුනේය. එහෙයින් ගෙදර සිටි සෙසු දරුවන්ට ඔහුගෙන් නිතර නිතර ගුටිබැට කන්ට සිදුවුනි. මෙසේ යලිත් වං ලුං අවිවේකයට හා කරදරයට වැටුනේය. කරදර ගැන සිතමින්

කාලය ගෙවූ ඔහුට මේ සියලුම කරදර වලින් වෙන්ව නගරයේ වාසයට යන්නට ද සිතුනේය. මහ ගෙදරට සිදුවූ දේ සිහි කළ ඔහුට තවත් වරක් වැටහුනේ නාගරික වාසය ද එතරම් ආරක්ෂා සහිත නොවන බවකි.

ඔහුට නගරයට ගොස් ''මගේ බාප්පා රතු රැවුල් කාර හොරෙකැ''යි පොලිසියට පැමිණිලි කල හැකිව තිබුනේය. එය අන්‍යයන් නොපිළිගතහොත් තමාටම සිදුවන ගැහැට දැන දැන එසේද නොකෙළේය.

ධාන්‍ය වෙළෙන්දා වෙත ගොස් පැමිණි කෝකිලා ගෙණ ආ පුවත ද ඔහුට එතරම් සැනසිලි දයක නොවීය. ඇයගෙන් ඔහුට අසන්නට ලැබුනේ මේ වචනයි:–

''මංගල කටයුත්ත නම් කෙරේවි. ඒ උනාට දූනට ලිපි ලේඛන හුවමාරු කර ගැණීමට වැඩි යමක් කරන්න ඒ වෙළෙන්ද කැමති නැහැ. ඒ ගැණු ළමයට තවම දහතරවත් සම්පූර්ණ නැහැ. තව අවුරුදු තුනක් බලා ඉන්නයි වෙන්නෙ.''

වං ලූං අධෛර්‍ය්‍යයට පත්වූයේ තව අවුරුදු තුනක් සිය දෙටු පුතාගේ විකාර ඉවසන්නට සිදුවන හෙයිනි. එද රාත්‍රී කෑම ගණිමින් වං ලූං ඕලෑංට මෙසේ කීවේය:–

''මේ දරුවන්ගෙ මංගල කටයුතු ඉක්මනටම කරදෙමු. ඒ කටයුතු ඉවර උනාම කිසි කරදරයක් නැහැ.''

එද රෑ ඔහු නිදගත්තේ ද ස්වල්ප වේලාවකි. පසුව ද හිමිදිරි–යේම නැගිට උදූල්ලත් රැගෙන ඔහු කුඹුර දෙසට ගමන් කෙළේය. සිතට කරදර වැඩිවුන විට උදූල්ලත් කරගසාගෙණ කුඹුරට යාම ඔහුට ලොකු සැනසිල්ලකි. ඔහු මිදූල උඩින් ගමන් කරද්දී එහි සෙල්ලම් කර කර සිටි ඔහුගේ වැඩිමල් ගැණු දරුවා ඔහුට සිනාහ වකින් සංග්‍රහ කළාය. ඇයගේ අහිංසක සිනාහව දුටු ඔහු පැවසුවේ ''මගේ මේ පුංචි මෝඩීගෙන් මට ලැබෙන සැනසීම අනිත් සේරමගෙන්වත් නෑ'' යනුයි.

මෙසේ ඔහු දිනපතාම බොහෝ දිනක් කුඹුරට ගියේය. ඔනෑම කරදර කාලයක වං ලූං සොයා ගියේ සාර භූමියේ – සිය කුඹුරුවල බලයයි. ඒ රම්‍ය භූමියෙහි දී වැටෙන හිරු එළිය ද ඔහුට ගෙණ දුන්නේ සුව පහසකි. එයින් ඔහුට සාමය හා සුවය ලැබුණි. ගිමහානයේ උණුසුම් සුළඟ ඔහු වටා යත්ම සාමය ද ඔහු වෙත

ලඟාවූයේය. තමාගේ ගෙදර කරදර පිළිබඳ අඛණ්ඩ සිතුවිලි දමය සහමුලින්ම කඩන්නට මෙන් දිනක් දකුණු දිගින් කුඩා වලාකුලක් පැන නැංගේය. පලමුකොට එය ක්ෂිතිජයේ මීදුමක් මෙන් එල්බ ගෙන සිටියේය. එහෙත් අන්‍ය වලාකුලක්මෙන් මේ වලාකුල එහා මෙහා ගමන් නොගත්තේය. එය නිශ්චලව සිට අවානක් මෙන් අහසෙහි පැතුරුනේය.

ගැමියෝ ඒ දෙස බැලූහ, ඒ ගැන කථාකළහ. මෙයින් ඔවුන් තුළ බියක් ද පැවතුනේය. තම කුඹුරුවල වපුරා තිබෙන දෑ විනාශ කිරීමට දකුණෙන් පලහැටි රංචුවක් පැමිණෙන බැව් දුටු ඔව්හු බියවූහ. වං ලුං ද එහි සිට උන් දෙස බැලුවේය. අන්තිමේ දී සුලඟ, ගැමියන්ගේ පාමුලට යමක් දැමුවේය. එකෙක් එය අහුලා ගත්තේය. එය අනිකක් නොව මැරුණු පලහැටියෙකි. ඉක්බිති වැල නොකැඩී පලහැටි රංචුව එන්නට වූහ.

මෙතෙක් පැවති ගෙදර දෙරේ කම්කටොලු වං ලුං ට අමතක වුනේය. ගැමියන් වෙත දුවගිය ඔහු මෙසේ කෑ ගැසුවේය:–

''මේ ඉඩම් වෙනුවෙන් දත් දෑත්ම කරන්න තියෙන දෙයක් කරමු. මේ සතුන් විනාශ කරන එකයි තියෙන්නෙ.''

ඒ ගැමියන් අතර ඔහුගේ කතාව අනුමත කළ අය ද වූහ; බලාපොරොත්තු කඩකරගෙන නිහඬවූවෝ ද වූහ.

''නැහැ නැහැ කරන්න නම් දෙයක් නැහැ. මේ අවුරුද්දෙ නම් හාමතේ ඉන්නයි අපට වෙන්නෙ. මේක දෙවියන්ගෙ බලයෙන් වෙන එකක්. ඉතින් මොනවටද බඩගින්නෙ මැරෙන්න වන බව දැන දැන මේ පලහැටියන් විනාශ කරන්න දඟලන්නෙ?'' යයි කියන්නෝ ද ඒ මිනිසුන් අතර වූහ.

ගැමි ගැහැණු අඩ අඩා නගරයට ගොස් සුවඳ වර්ග ගෙණවුත් වෙල්යාය මැදවූ දෙවොළෙහි දෙවියන්ට පූජා කළහ. ඇතැම්හු ආරක්ෂාව පතා නගරයේ මහ දේවාලයට ද ගොස් ඇප කැප වූහ.

කොතෙක් ඇප කැප වුවත් පලහැටියන්ගේ පැමිණීම නම් නතර නොවූයේය. ගොඩ මඩ සෑම ඉඩමක් ම පලහැටියන්ගෙන් වැසී ගති.

වං ලුං පලහැටියන්ට විරුද්ධව සටන ආරම්භ කිරීමට ඔහුගේ සියළුම කුලී කරුවන් එකතු කර ගත්තේය. චිං ද ඔවුන් අතර විය. ඔව්හු කැපීමට ලංව තිබුන කරලින් බර තිරිඟු හේනක්

Scanned by CamScanner

ගිනි තබා විනාශ කළහ. එහි විශාල ඇලවල් හාරා ලිං වලින් වතුර ගෙනත් පිරවූහ. ඔවුන් මෙහි වැඩ කෙළේ නින්දට වත් නොගොස්ය. දිවා රෑ දෙක්හිම වැඩකළ ඔවුන්ට ඔවුනොවුන්ගේ භාර්‍යාවෝ ආහාර ගෙණ ආහ.

අහස කාලවණී වී ගියේය. අහසෙහි පියාඹා යන පලහැටියන් ගේ පියාපත් ගැටෙන හඬින් මුළු අහස ගුම් ගත්තේය. මොහොතක් ගත වී යත්ම අවට සෑම ඉඩමකටම පලහැටියන් පතිත වන්නට විය. එසේ පතිත වූ සත්තු අවට වූ ඉඩම් වලට බැස එහි ධාන්‍ය කා දැමූහ. ඒ දුටු ගැමියෝ ''මේ දෙවියන්ගේ සාපයකැ''යි සුසුම් හෙලූහ.

වං ලුං ගේ කෝපය තව තවත් අධික වුනේය. අසුවුන අසුවුන තැනදී පලහැටියන් ගසා හෝ පාගා මැරුවේය. පලහැටි යන්ගෙන් කොටසක් පිලිස්සී මළ අතර තවත් කොටසක් වතුරෙන් පිරුන අගල්වල වැටී පා වෙමින් තිබුනි. කෝටි ගණනක් පල-හැටියන් මළ නමුත් නොමැරී ඉතුරු වුන සංඛ්‍යාව ඊටත් වැඩිය.

කෙසේ වුවත් ඔහුගේ මේ සටන නිෂ්ප්‍රයෝජනයයි කිය නොහැක්කේ ඔහුගේ හොඳම කුඹුරු කීපයක් පලහැටියන් ගෙන් බේරා ගත හැකි වුන නිසාය.

බොහෝ ගැමියෝ බැදපු පලහැටියන් අනුභව කළහ. එහෙත් වං ලුං ඒවා අනුභව නොකෙළේය. උන්ගෙන් තම ඉඩම් වලට සිදුවුන විනාසය නිසා උන්ගේ මසද තමාගේ විනාසය පිණිස වේයයි සිතුවේය. ඕලැං පලහැටියන් තෙලින් බදිද්දී වං ලුං නිශ්ශබ්ද වුනේය. කුලී කරුවෝ බැදපු පලහැටියන් දත් වලින් සපා කෑහ. දරුවෝ පලහැටියන්ගේ භයංකර ඇස් දෙස බලමින් හෙමි හෙමින් උන්ගේ රස වින්දහ.

එක් අතකින් පලහැටියන් කෙළේ ලොකු උදව්වකි. පිට පිටම දින හතක්ම ඉඩම් ගැනම සිතන්නට වුන නිසා ඔහු තුළ එතෙක් තිබුන බිය ද කරදර ද අතුරුදන් වූයේය. ඔහු නිශ්චලව මේ වචන තමාට ම කියා ගති.

''ඔව්! හැම මිනිහටම කරදර තියෙනව. මමත් මා පිට පැටවෙන කරදර විඳගෙන ජීවත් වෙන්න බලන්න ඕන. මගේ බාප්ප මට වැඩිය නාකි හන්ද විගහට මැරේවි. අවුරුදු දෙකක් යනකොට පුතාගෙ කටයුතුත් පිළියෙල වෙයි. මේ කරදර හන්ද මම. මොටද පන තහ ගන්නෙ?''

ඔහු තම ධාන්‍ය කපා ගත්තේය. යලිත් වර්ෂාව ද පැමුනුණි. ජලයෙන් පිරුණු කුඹුරුවල පලාවන් ළපටි ගොයම් පැල සිට වන ලදී. යලිත් ගිම්හානය ද උදා වීය.

Scanned by CamScanner

ඒ නම් තීව්‍රතර සාමය උදෙසා සමයකැයි ඩං ලූං මිනු දිනක මයිකෝස්නාගේ කුඹුරෙන් ගෙදර පැමිණි විටක වැඩිමල් පුතා ඔහු වෙත පැමිණ මෙසේ කීවේය

"තාත්තෙ මට තව ඉගෙන ගන්න ඕනා. අර නාකි ගුරුතුමා ගෙන් තවත් ඉගෙන ගන්න දෙයක් නැහැ."

ඩං ලූං පුතාගේ මේ කතාවට ඇහුම්කන් දුන්නේ කුස්සියේ කල් දෙමින් උණුසුම් සුප්පයත් බොනවට ගෙණ මිනුණ තව බොද ගැණීමට සැරසෙමින් ය.

"ඉතින් මොකෝ කියන්නෙ?" යයි ඔහු ඇහුවේය පුතුයා තනා තනා කතා කොළේය.

"මට තවත් ඉගෙන ගන්න ආසයි. මේ පාසැලේ නම් හිමිල්ලේ වැඩක් නැහැ. ලොකු නගරයක ලොකු පාසැලයකට යන්න ඕනා තවත් ඉගෙන ගන්න."

"මොනා විකාරද මේ? මේ ගෙදරට හොඳටම ඇති උගත් දැනුම. මිය තගයේ වෙලට යන්න ඕනා කමක් නැහැ" යි ඩං ලූං කීවේ බොනවට දමා බොකේරා ගත් සුප්ප මිරිකමින්.

මියා දෙන තෝරගෙන් මුල් සැලසුම් මෙන්නමගේ නො ඇහෙන්නට කෙඳුරුවේ ය. ඩං ලූං ගේ කෝපය ඇවිස්සුනේ එවිට ය.

"මොනවද කෙඳුරන්නෙ? කියන්න තියෙන දෙයක් කියාගෙන ඉන්නේ."

''හොඳයි කොච්චර එපයි කිව්වත් මම නම් යනව යනවා මයි දකුණෙ නගරයකට. මේ මෝඩ ගමේ මෝඩ ගෙදරටම වෙලා ඉන්න එකේ තේරුම මොකක්ද?''

වං ලුං තම පුත්‍රයා දෙසත් තමා දෙසත් බැලුවේය. ඔහුගේ පුතා ග්‍රීෂ්ම කාලකට සුදුසු සිහිල් තුනී රෙදි වලින් මැසූ ලා දුඹුරු පාටැති දිග ඇඳුමක් ඇඳගෙණ සිටියේය. ඔහුගේ තොල්වල තාරුණ්‍යයයේ ලකුණු දිස්වුනේය. ඔහුගේ හම සිනිඳුය, පැහැපත්ය. දිග කමීස අත් වලට වැසී තිබුන අත් ගොබ තරුණියකගේ මෙන් සියුමැලිය, පැහැපත්ය. මෙසේ පුතා නරඹා අනතුරුව තමාදෙස ඔහු බැලුවේය.

පස් වැකුණ ඔහුගේ සිරුර රළුය. ඔහු ඇඳ සිටියේ නිල්වන් දළ කපුරෙදි වලින් මැසූ කලිසමකි. එ ද දණහිස දක්වාය. උඩුකය නග්නව තිබුනේය. බැලූ බැල්මට ම පෙනෙන්නේ තමා මේ දරුවන්ගේ පියා නොව වැඩ කරුවෙකු බවය. තමාගේ පෙනීම ගැනත් පුත්‍රයාගේ පෙනීම ගැනත් සිතුණු හෙයින් ඔහු තව තවත් රළු වුනේය–කෝප වුනේය.

''ඔය ඉගෙණ ගැණීම් හරියන්නෙ නැහැ. කුඹුරට බැහැල සාරවත් පස් ටිකක් ඇඟේ ගා ගණින්. නැත්නම් මිනිස්සු උඹට ගැණියෙකැයි කියාවි. උඹ කන බත් වලටවත් සෑහෙන්න වැඩ කරන්න ඉගෙන ගන්නෙ නැත්නම් ඔය පොත් පාඩම් කිරීමෙන් ඇති වැඩේ මොකොද?''

වං ලුං මේ වචන කිව්වේ තම දෙටු පුතාගේ නැණවත් කම ගැනත් පොත්වල දැනුම ගැනත් පසුගිය කාලයේ ආඩම්බර වූ බව අමතක කොටය. යලි ඔහු එතැනින් ඉවතට ගියේ පා වහන් විරහිත අඩි පොළවෙහි හප්පමින් බිමට කෙල ගසමිනි.

එද රැයෙහි ද වං ලුං පද්මාගේ කාමරයට ගියේය. කෝකිලාව විසින් පවන් සලනු ලබමින් පද්මා ඇඳෙහි දිගා වී සිටියාය. කාමරයට පිවිසි වං ලුං ඇඳෙහි පසෙකින් වාඩිගත් පසු කියන්නට දෙයක් නැති කමින් කුමක් හරි ඔහුට කිය යුතුයයි සිතූ පද්මා මෙසේ කීවාය.

''අන්න ලොකු පුතා දකුණු පළාතට යන්න ආසාවෙන් දඟලනව.''

Scanned by CamScanner

''ඉතින් ඔයාට මොකෝ ඒ ගැන ඇති අමාරුව. එයා ගැන කතා කරන්න ඔයාට වැඩක් නැහැ. එයාගෙ තරුණ වයසෙ හැටියට මේ කාමරයට එන්න සුදුසු නැහැ.''

''අනේ මට මොකෝ ඕන කෙනෙක් ඕන දෙයක් කරගම. මෙන්න මේ කෝකිලයි ඔන්න ඔය කාරණෙත් කිව්වෙ'' යයි පද්මා වහා කීවාය.

''කවුරු නොකීවත් ඒ බව ඕනෑ කෙනෙකුට පේන්න තියෙන්නෙ''යයි වහා කීවේ කෝකිලාය. ''එයාට ඒ විධියට ඕන ඕන නගරවල යන්න දෙන්න බැහැ. එයා හදන්නෙ නිකරුණේ සල්ලි නාස්ති කරන්න''යි වං ලුං කීය.

මෙසේ එහි පැවැත්වුන සාකච්ඡාව එද රැයෙහි කෙළවර වුනේ කෝකිලා කාමරයෙන් බැහැර ගිය පසු, තමාත් පද්මාත් තනිවූ විටය.

වං ලුං නිවස දින ගණනක් සාමයෙන් පැවතුනේය. තරුණයා ද සතුටට පත් වූවා සේ පෙනුනි. දහඅට වියෙහි සිටි ඔහු පාසැල් ගමන ද අත්හළේය. තම පියා කුඹුරෙන් ගෙදරට එන සැම විටකම ඔහු කාමරයට වී පොත් පත් කියවීමෙහි යෙදුනේය. එයින් සැහීමට හා සතුටට පත් වං ලුං මෙසේ කල්පනා කෙළේය.

''ඒක එයාගෙ තරුණ කාලයෙ සිතුවිලි වලින් එකක්. තමාට ඕනෑ දෙය පවා හරි හැටි නොදැනීම තරුණ කාලයෙ ලක්ෂණයක්. අර කටයුත්තටත් තියෙන්නෙ තව අවුරුදු තුනයි. සල්ලි වැඩිපුර වියදම් කළහම ඒ අවුරුදු තුනත් අඩුකර ගන්න පුළුවන්. සල්ලි තමයි සැහෙන්න රැස්කර ගන්න ඕන. මේ වාරයෙ ගොවිතැන් වැඩ ඉවරවුනායින් පසුව ඒ ගැන සොයා බලන්න ඕන.''

දින කීපයක ඇවෑමෙන් ජ්‍යෙෂ්ඨ පුත්‍රයා ගැන ඔහුට අමතක වුනේය. පලගැටියන් විසින් විනාශ කර දැමූ ගොවි පලවල් හැර ඔහුගේ සෙසු ගොවි පොලවල් සරු සාර වීය. එහෙයින් පද්මා සඳහා වියදම් කළ මුදල් ද යළිත් ඔහුට ලබාගත හැකි වීය. රිදී වලට හා රත්රන් වලට ඔහු නැවත වරක් මහත් ආසාවක් දක්වූයේය. තරුණ ගැහැණියක උදෙසා මෙතෙක් කළ වියදම ගැන ද ඔහු වරින්වර පශ්චාත්තාප වුනේය.

බාප්පාගේ බිරිය පද්මා ගැන කියූ දෙය දූන් වං ලුං ට විශ්වාසය. පද්මා පෙනීමට වඩා වයස් ගතවූ එකියක යන්න දූත්

Scanned by CamScanner

ඔහුට ද රහසක් නොවේ. ඔහු වෙනුවෙන් ඇයට දරු ඵලයක් ද නොවීය. ඔහු ඒ ගැන කනස්සලු නොවූයේ දූ පුතුන් ගෙන් ඔහුට හිභයක් නොවූ නිසාය. හුදෙක් වං ලුං පද්මාගෙන් බලාපොරොත්තු වූයේ තමා ප්‍රීතිමත් කිරීම පමණකි.

පද්මා වයසින් වැඩී යත් ම රුවින්ද වැඩුනේය. පෙර ඇගේ සිරුරෙහි වූ ඇතැම් අඩු පාඩු කම් ක්‍රමයෙන් සම්පූර්ණ වුනේය. පෙර හැකිලී තිබුන කම්මුල් ඇඟ තරවීමෙන් පිරීගිය නිසා පද්මා ළාබාල බවක් පළ කළාය.

යලිත් වං ලුං මැඳුරට සාම සමයක් උද වුනේ තරුණ පුත්‍රයා සැහීමට පත් බවක් පළකළ නිසාය. ඕලෑං වයසින් වැඩී යත් ම වැහැරී ගියාය. ඇගේ මුහුණෙහි ඇටකටු මතුවී තිබුනි, ඇස් ගිලී තිබුනි. යමෙකු ඈ ගැන විමසුව හොත් ඇය කියන්නේ ''තමාගේ ඇඟ ඇතුලේ මහා ගින්දරක් තිබෙන බව'' පමණකි. ගතවුන අවුරුදු තුනෙහිම ඇයට දරු උපතක් නොවූවත් ගර්භිනියකගේ මෙන් උදරය වැඩී තිබුනි. මෙසේ ඇයගේ සිරුර දුබල වුනත් උදෑසන නැගිට ගෙදර දෙරේ කටයුතු කිරීම ඇය කිසිම දිනක අමතක නොකළාය. වං ලුං ද ඇය ගැන සෙවිල්ලක් නොකෙළේය. හිස කඩා එල්ලා ගෙණ සිටින ගොණෙකු හෝ කෑම නොකා සිටින ඌරෙකු හෝ දුටු විට මහත් සැලකිල්ලක් දක්වන වං ලුං ක්‍රමයෙන් වැහැරී ගිය ඕලෑං දක මුවෙන් වචනයකුදු කථා නොකෙ-ළේය. කිසිම කනස්සලු බවක් පළ නොකළ ඕලෑං තනිව නිහඬව වැඩ කළාය.

බාප්පාගේ බිරිය සමග ඇය කථා කළේ ඉතාමත් කළාතුරකිනි. ඇය කෝකිලා සමග කිසිම විටකවත් කථා නොකළාය. ඇය පද්මාගේ කාමරයට කිසිම දිනක වත් අඩිය නොතැබුවාය. ඇතැම් විටක පද්මා කාමරයෙන් එළියට පැමිණිය හොත් ආපසු කාමරයට යනතුරු ඕලෑං සවකීය කාමරයට වැදී සිටියාය.

ඇය ශීත ඍතුවෙහි දිය මිදුන සමයෙහි පවා පොකුණට ගොස් ඇඳුම් සේදුවාය. ''මෙතරම් මුදල් තියෙද්දීත් වැඩ කාරයෙකු නොගන්නේ කුමක් නිසාදැ''යි ඇයට පවසන්නට වුවමනා බවක් වං ලුංට ද නොවැටහුනේය. ඌරන් බූරුවන් තාරාවන් බලා ගැණීමට ඔහු නොයෙක් විට කුලී කරුවන් ගත්තේය. තම කුඹුරු

වල කටයුතු වලදී තමාට උදව් වන්නට කුලී කරුවන් ගත්තේය. එහෙත් ඇය ගැන ඔහු නොසැලකිලිමත් වීය.

එක් සන්ධ්‍යාවක විසිත්ත කාමරයෙහි මේසයක් මත රතු ඉටිපන්දමක් දල්වෙද්දී වං ලුං සුවපහසු කමින් යුක්ත පුටුවක හිඳගෙණ අතෙහි ඇඟිලි ගණිමින් සිටියේ සවකීය ධාන්‍ය විකිණීමෙන් ලැබිය හැකි මුදල් ගැන සිතමිනි. මෙසේ ඔහු හිඳගෙණ සිටින විට නිශ්ශබ්දව කාමරයට පිවිසුන ඕලැං ඔහු ඉදිරියෙහි නැගී සිටියාය. මිනිත්තු කීපයක් ඈත මෑත බැලූ ඇය අන්තිමේදී මෙසේ කීවාය.

''මට කියන්න දෙයක් තියනව''

වං ලුං විශ්මයෙන් ඇය දෙස මොහොතක් බලා සිට මෙසේ උත්තර දුන්නේය.

''හොඳයි කියන්න දෙයක් තියෙනව නම් කියාපන්!''යි වං ලුං කීය. ඇය රහසින් මෙන් මෙසේ කීවාය.

''ඔහේ ගෙදර නැති වෙලාවට වැඩිමහල් පුතා අර ගෑණිගෙ කාමරවලට යනවා.''

''මොනව කිව්ව ගෑණිගෙ?''යි හේ ඇසුයේ මුවද අයාගෙන ඉදිරියට නැඹුරු වෙමිනි.

ඇය වචනයකුදු නොකියා, පුතාගේ කාමරය දෙසට ඇඟිල්ල දිගුකොට යලි පද්මාගේ කාමරය වෙත තම මුහුණ යොමු කලාය.

''උඹට ඔය හීනපෙනිල වෙන්න ඇති'' යි ඔහු කීය. ඇය හිස වැනුවාය. යලි අමාරුවෙන් මෙසේ කීවාය.

''නැහැ නැහැ හීනයක් නෙවි'' පුතා පිටපලාතකට යවනව නම් හොඳයි. දකුණු පලාතට උනත් හොඳයි.''

වං ලුං එයට පිළිතුරු නොදී නිශ්ශබ්ද වූයේය. මේ අතර ඕලැං එතෙක් ඇල්වෙමින් තිබුන ඔහුගේ තේ භාජනය හිස්කොට යලි උණු තේවතුරෙන් පුරවා නිශ්ශබ්දවම කාමරයෙන් පිටව ගියාය.

සවකීය වැඩිමහළු පුතා ගැන ඕලැං කියූ කථාව ඔහු විශ්වාස නොකෙළේය. සිරිත් පරිදි එද රැයෙහිද ඔහු පද්මාවෙත ගියේය. ඔහු පද්මාගේ ඇඳෙහි වැතිර ගෑණීමට සැරසෙන විට ඇය අවිනීත ලෙස ඔහු තල්ලුකර දැමුවාය.

''හරි ග්‍රීෂ්මයි අද. ඔයා හරියට ගඳ ගහනව. මෙහේ නිදගන්න එනව නම් ඇයි ඇඟ සෝදගෙණ නාවෙ?'' මෙසේ

කියමින් ඈ තම ක්‍රියාවලින් ද ඔහු නොරුස්සන බව තදින් ම පළ කළාය.

එලෑං සැන්දෑවේ කියූ වචන වං ලුං සිහි කෙළේය, වහා ඇඳෙන් නැගී සිටියේය. පසුගිය දිනවලදී පද්මා තමා පිළිගත්තේ මහත් නොකමැත්තෙන් බව ඔහුට සිහිවිය.

''හොඳයි එහෙනම් තනියම නිදගනින්! තවත් මම......... මගේ බෙල්ල කපාපන්!''

මෙසේ කියූ ඔහු ගෙයි මැද කාමරයට ගොස් පුටුදෙකක් එක ළඟින් තබාගෙන එහි දිගාවුනේය. එහෙත් ඔහුට නින්ද ගියේ නැත. එතැනින්ද නැගිට ගෙයින් පිටතට ගිය ඔහු වත්තෙහි උණ පඳුර අසළට ගොස් සක්මන් කෙළේය. එහිදී රාත්‍රියෙහි හමා ආ සීතල මාරුතය ළඟ ළඟ එන ශීත ඍතුවේ පණිවුඩය ඔහුට කිව්වේය. මෙසේ සීතල මාරුතයේ, පහස විඳි ඔහු තුළ මේ ප්‍රශ්න පැන නැඟුනේය.

''ලොකු පුතා දකුණට යන්න හදන බව පද්මා දැනගත්තේ කෙසේද?''

''දැන් ලොකු පුතා ඒ ගමන ගැන කතා නොකරන්නේ කුමක් නිසාද?''

''ඔහු දැන් කිසි කලබලයක් නොමැතිව සතුටින් කාලය ගතකිරීමට හේතුව කුමක්ද?''

කෙළවරක් නැති ප්‍රශ්න ඔහුගේ සිත තුළට ගළා එද්දී රැය කෙළවර වුන බව ඔහු දැනගත්තේ එතෙක් මිහිඳුම් පටලයෙන් වැසී තිබුන සිය වතුපිටි උඩින් අරුණාලෝකය විහිදෙන්නට වූ විටය. ලහිරු රැස් පැතිරෙද්දී ඔහු ගෙදර ගොස් කෑම කෑවේය. කෑම කා ඔහු සිරිත් පරිදි වතුපිටිවලද ඇවිද ගෙදර අවුත් ගෙදර හැමට ඇසෙන සේ ශබ්ද නගා මෙසේ කීවේය :–

''මම දැන් අර නගරයෙ ඇල ළඟ තියෙන කුඹුර බලන්න යනව. හුඟ වෙලාවකට එන්නෙ නැහැ.''

මෙසේ කියා ඔහු ගමන් කෙළේ දේවාලය තෙක් පමණකි. දේවාලයට මුහුණලා පිහිටි කුඩා කඳු ගැටයක් මත වාඩිවුන ඔහු බර කල්පනාවක යෙදුනේය. තමාට මුහුණලා සිටින දෙවිවරුන් දෙදෙනා ගැන ඔහු කල්පනා කෙළේය. පෙර තමා මහත් බියක් හා භක්තියක් දක්වූ මේ දෙවියන් ගැන දැන් එබඳු හැඟුමක් හා

සැලකිල්ලක් නොමැත්තේ පොහොසත්කම නිසායයි ඔහු සිතුවේය. පෙරලා ගෙදර යන්ට සිතත්ම පද්මා රැයෙහි තමා තල්ලුකර දැමූ හැටි සිහියට නැඟුනේ කෝපයද ඔහු තුළ ඇතිකරවමිනි. කෝපයේ බලයෙන් මෙන් නැගී සිටි ඔහු ගෙදර බලා ගමන් ගත්තේය. රහසේම ගෙට ඇතුල්වූ ඔහු පද්මාගේ කාමරයේ ඇතුල්වන දොරටුවේ එල්වා තිබුන තිරය ලඟ නතරවී "කාමරයෙන් ඇසුන පිරිමි කටහඬට" සවන් දුන්නේය. එවිට ඔහු තුළ ඇතිවුනේ ජීවිතයේ කිසි දිනකත් හට නොගත් කෝපයකි. මේ සමගම ලොකු පිළිකුලක් ද ඔහු තුළ ඇතිවුනේ තම ප්‍රියාව සොරකම් කිරීමට සැරසෙන්නේ තම පුතාම යයි පැහැදිලිව දැනගත් හෙයිනි.

වං ලුං මුව තද කරගෙන පිටතට ගොස් උණ පඳුරෙන් උණ කෝටුවක් කපාගෙණ ආපසු එනාවිට මැද මිදුලෙහි පොකුණ ලඟ පුටුවක වාඩිගත් පද්මා ඔහුගේ පුත්‍රයා සමග අල්ලාප සල්ලාපයෙහි යෙදී සිටියාය. පලාවන් සේද ඇඳුමක් ඇය ඇඳ සිටියාය. පෙර කිසිදිනක ඇය මෙබඳු ඇඳුමක් අඳිනු ඔහු නොදුටුවේය. සිනාසිසී කවට කම් කරමින් සිටි ඔවුන් දෙදෙනා තමන් වෙතට වං ලුං එන බව නොදත්හ. ඔවුන් පසුපස උණ කෝටුවක් රැගත් වං ලුං සිටිත්ම එය දුටු කෝකිලා කෑ ගැසුවාය. වං ලුං ඉදිරියට පැන පුතා අල්වා ගත්තේය, අල්වාගෙණ ලේ ගලන තෙක්ම උණ කෝටුවෙන් තරුණයාට තැලුවේය. පද්මා කෑගසමින් ඔහුගේ අතෙහි එල්ලුනාය. අතගසා දමමින් ඇය පසෙකට කළ ඔහු යලිත් තරුණයාට තැලුවේය. දෙවන වරටද අතෙහි එල්ලුන පද්මාටද උණකෝටු පහරවල් කීපයක් කන්නට සිදු වීය. ඇය කෑගසමින් ඉවතට පැන දිව්වාය.

තැලීම නතර කළ වං ලුං රැ රා වැටෙන දහඩියද පිසදමමින් උණකෝටුව වීසිකොට හති දම දමා මෙසේ කීවේය:–

දූන් උඹ උඹේ කාමරයට පලයන්. මම උඹගෙන් නිදහස් වන තෙක් එළියට එන්න නම් එපා! ආවොත් මරණව.''

තරුණයා වචනයකුදු නොතෙපළා නැගිට පිටව ගියේය. වං ලුං ද කෝපය නිවී යනතෙක් පද්මා වාඩිවී සිටි පුටුවෙහි හිඳ ගෙන කල්පනා කරමින් සිටියේය; ඔහුවෙත කිසිවෙක් නොපැමිණියේය. යලි ඔහු විඩාපත් ස්වභාවයක් පළකරමින් පද්මාගේ කාමරයට ගියේය.

පද්මා ඉකිබිඳ බිඳ හඩමින් ඇඳෙහි වැතිර සිටියාය. වං ලුං ඇය ලඟින් වාඩිවී අතින් අල්වා හැරෙව්වේය. ඇය ඔහු දෙස බලමින් හඩ හඩා ඇඳෙහි වැතිර ගත්තාය. ඇගේ මුහුණෙහිවූ උණ කෝටු පහරවල් ඔහුට පැහැලිදිව පෙනුනි.

''කොච්චර කළත් උඹට උඹේ රස්සාව අතහරින්න බෑ නේද? ඒකට අල්ලගෙන තියෙන්නෙ මගේ පුත්තුන්ව''යි ඔහු කීයේ මහත් දුක්මුසු හඬිනි. ශබ්ද නගා හැඬූ ඇය මෙසේද කීවාය :–

''නැහැ නැහැ සැක කරන්න එපා! ඔහු තනියට මෙහේ ඇවිල්ල කතා කර කර හිටිය විතරයි. ඔන්න බොරුනම් ඔය කෝකිලාගෙන් අහල බලන්න.''

ශොකාත්මක බැල්මක් හෙළූ ඇය ඔහුගේ අත තම මුහුණෙහි වූ තුවාල මත තබා ගනිමින් ''අනේ බලන්න ඔයා මට නිකරුනේ තැලූ හැටි! ඔයාට තරම් ආදරයක් මේ ලෝකයෙ කිසිම කෙනෙකුට මම පවත්වන්නෙ නැහැ.''

මෙසේ කියමින් ඇය ඔහු දෙස බැලුවාය. කඳුලෙන් පිරිනු නෙත් සහිත ඇය ඔහුට වඩාත් රූමත්ව පෙනුනේය. පශ්චාත් තාපයට පත් ඔහු පද්මාගේ කාමරයෙන් නික්ම පුතාගේ කාමරයට පිවිසී ''හා! උඹේ කලමනා දමාගනින් පෙට්ටියක. හෙට උදේ උඹට කැමති දිහාවකට පලයන්. මෙහාට නැවතත් පැමිණීමට කාලය දන්වන තුරු එන්න එපා!''යයි කියමින් මැද කාමරයට ගියේය. ඕලෑං වාඩිවී වං ලුං ගේ ඇඳුමක් මහමින් සිටියාය. වං ලුං තමා පසුකර යත් ම ඇය කිසිවක් නොකීවාය. ගතවුන මොහොතෙහි ඇතිවුන කලබල නොඇසුනාක් මෙන් නොදන්නාක් මෙන් ඇය සිටියාය. ඔහු ගෙයින් පිටව මධ්‍යාහ්නයේ කුඹුර බලා ගමන් ගත්තේය. දවසෙන් හරි අඩක් පමණ ඒ දිනයෙහි වැඩ කළද ඔහුට දැනුනේ මුළු දවසෙහිම ඔහන්සිවූවාක් මෙන්ය.

Scanned by CamScanner

වැඩිමහළු පුතා ගෙදරින් පිටව ගිය විට, යම් කිසි අපවිත්‍ර දෙයක් ගෙදරින් ඉවත් වූවාක් මෙන් වං ලුං ට දැනුනේය. එවක් පටන් ඔහු තුළ ලොකු විවේකයක් හා සාමයක් පැවතුනි. පසුගිය කාලයේ ඇතිවුන විවිධ කරදර නිසා සෙසු දරුවන් ගැන ඔහුට සොයන්ට ලැබුනේ කලාතුරකිනි. එහෙයින් මේ ලැබූ විවේකයෙන් ඔහු බලාපොරොත්තු වුනේ සෙසු දරුවන් ගැනද සොයා බැලීමටය. බාල පුත්‍රයාට ද තරුණ කමේ පිස්සුව වැළඳෙන් නට පෙර පාසැලෙන් අස්කොට කිසියම් රක්ෂාවකට ඔහු පුහුණු කළ යුතුයයි තීරණය කෙළේය.

බාල පුත්‍රයා වැඩිමහළු පුත්‍රයාට වඩා රූපාකාරයෙන්ද වෙනස් වූයේය. ඔහු මිටිය, සිහින්ය, කහවන් පාටය, බෙහෙවින් වං ලුං ට සමානය. ඔහුගේ දෙනෙතෙහි සිනහ උපදවන කපටි බැල්මක් ද වීය. වං ලුං බාල පුත්‍රයා ගැන තමාට ම මෙසේ කියා ගත්තේය.

''හා! මේ කොලුව හොඳ වෙළෙන්දෙක් වේවි! මෙයා ඉස්කෝලෙන් අස්කරල ධාන්‍ය වෙළඳ පලක පුහුණුවට දමන්ට පුළුවන්ද කියල බලන්න ඕන. මගේ ධාන්‍ය විකුණන තැන මගේම පුතෙකු සිටීම මට ලොකු පහසුවක්. එතකොට මගේ වාසියට ධාන්‍ය කිරීමත් කෙරේවි.''

දිනක් වං ලුං කෝකිලාට ඇමතුවේය.

''මගේ මැඩිමල් පුතා කසාද බඳින්න ඉන්න තරුණියගෙ තාත්තට කියාපන් එයාට කියන්න දෙයක් මට තියෙනව යි කියල

Scanned by CamScanner

එහෙම හමුවුනොත් අපි දෙන්නට එකට වයින් බොන්නත් පුළුවන්.''

එකෙණෙහිම පිටවී ගිය කෝකිලා ආපසු ඇවිත් මෙසේ කීවාය. ''එයා ඕන වෙලාවක හමුවන්න පුළුවන්. ඔබ කැමති නම් එයා මෙහාට උනත් ඒවි.''

වං ලුං නගරයේ වෙළෙන්ද තම නිවෙසට ගෙන්වා ගැනීමට අකමැති වූයේ ඔහු වෙනුවෙන් නොයෙක් දේ පිළියෙළ කරන්ට වන හෙයිනි. ඉක්මනට ඇඟපත සෝදගත් වං ලුං සේද කබායද හැදගෙණ ස්වකීය ඉඩම් හරහා ගමන් කෙළේය. පළමුකොටම පාලම් වීථියට ගිය ඔහු එහි ලියූ නම ලකුණු කළ ගේට්ටුවක් ලඟ නතර වුනේ ''මෙහි තිබෙන අකුරුවලින් කියන්නේ ඒ ලියූ නම වෙන්නට ඇතැ'' යි අනුමානයෙන් සලකාගෙණය, එසේ නතරවුන ඔහු ගේට්ටුවට අතින් ශබ්ද නැගෙන පරිදි තට්ටු කෙළේය. වහා විවෘතවුන ගේට්ටුවෙන් සේවිකාවක් ඉදිරියට අවුත් තෙත රෙදි කැබැල්ලකින් අත පිසදමමින් ''ඔබ කවුද''යි ඇසුවාය. ඔහු ස්වකීය නම කී විට සේවිකාව සැලකිලිමත් ලෙස බැල්මක් හෙලා ඒ මහා මන්දිරයෙහි ඉදිරිපස වූ කාමරයකට කැඳවා ගෙන ගොස් වාඩිවන්නට අසුනක් ද පිළිගැන්නුවාය, ඔහු පුටුවෙහි හිඳ ගනිද්දී සේවිකාව පිටතට ගියේ ''මේ පුංචි නෝනා විවාහ කල්ල දෙන්න කථා කරගෙන ඉන්න මහත්තයගෙ තාත්ත ඇවිල්ල ඉන්නවා''යයි ගෙදර ස්වාමියාට කියන්නටය.

හුදකලාව එහි වාඩි වී සිටි වං ලුං ගේ, දෙර ගැන පරීක්ෂා කර බැලුවේය. ඔහු කොතරම් සැලකිලිමත් ලෙස එය පරීක්ෂා කරාද කියතහොත් එහි දෙර ජනෙල්වලට දමා තිබුන රෙදි පවා අතගා බැලුවේය. අලංකාර ලෙස ඇතිරිලි දමා මල් පෝච්චි තබා සරසා තිබුන මේස වැනි ගෘහභාණ්ඩවල ලී වර්ගය ගැනද සෝදිසි කෙළේය. ඔහු ඒ සියල්ලකින්ම සතුටට පත්වුනේය.

එහි වඩාත් ධනවත් ලකුණු නොමැති බව දැක දැකත් ඔහු සෑහීමකට පත්වූයේ ධනපති ලේලියක් බලාපොරොත්තු නොවූ නිසාය. ධනපති ලේලියකගෙන් ඇතිවන හිරිහැර ඔහු කල්පනා කරමින් යළිත් ඔහු පුටුවෙහි හිඳගත්තේය. මෙසේ හිඳගත් විටම ඔහුට කවුදෝ කෙනෙකුගේ අඩි ශබ්දයක් ඇසුනි. අනතුරුව තරබාරු වයසක මිනිහෙක් කාමරයට පිවිසුනේය. වං ලුං පුටුවෙන්

Scanned by CamScanner

නැගිට ඔහුට ආචාර කෙළේය. සමාන පුටු දෙකක හිඳගත් ඔවුන් දෙදෙනා සේවිකාවක විසින් ගෙණ ආ උණුසුම් වයින් පානය කරමින් නොයෙක් දේ ගැන සාකච්ඡා කළහ. අන්තිමේදී වං ලුං මෙසේ කීවේය.

"මම ආවෙ එක්තරා කාරණයකට. ඉතින් ඒ ගැන ඔබ අකමැති නම් අපි වෙන වෙන දේවල් ගැන කතාකරමු. ඔබේ වෙළඳ පොළට සේවකයෙකු වුවමනා නම් මගේ දෙවෙනි පුතා එවන්න පුළුවන්! එයා කල්පනාව ඇති කෙනෙක්!"

"ඔව්! ඔව්! මටත් එහෙම කල්පනාකාරී තරුණයෙක් වුවමනා කරල තියෙනව. ඔහුට ලියන්න කියන්න පුළුවන් නේද?"

"මගේ පුත්තු දෙන්නටම හොඳට ලියන්න කියවන්න පුළුවන්!"

"එහෙනම් බොහොම හොඳයි. එයාට කැමති දවසක එන්න කියන්න. වැඩ ඉගෙණ ගන්නතුරු ලැබෙන්නෙ කෑම විතරයි. අවුරුද්දක් වැඩ ඉගෙණ ගත්තහම වැඩ හොඳනම් මාසයකට රිදී කාසියක් දෙන්නම්. අවුරුදු තුනක් ගතවුනාම මාසයකට රිදී කාසි තුනක් දෙන්නම්. අපේ පවුල් දෙක අනාගතයෙ සම්බන්ධවන නිසා ඇපයක් ඕනකරන්නෙත් නැහැ."

"අපි දූන් යාළුවො. මගේ දෙවෙනි දුවට සෑහෙන පුතෙක් ඔබට නැද්ද?"යි වං ලුං ඇසුවේ සිනා සෙමිනි.

"ඇයි නැත්තෙ මගේ දෙවෙනි දරුව පුතෙක්. වයස අවුරුදු දහයක් විතර ඇති. ඔබෙ දුවට වයස කීයද?"

"ඇටත් එන ළපන්දුට වයස දහයයි. ඇ හරි ලස්සනයි." වං ලුං සිනාසුණි.

එහෙනම් අපි, "දෙපොට ඇති කඹයකින් බැඳෙමුය"යි ලියූ නැමති ඒ ධනවත් වෙළෙන්ද කියද්දී වං ලුං නිශ්ශබ්ද වූයේ මේ අවස්ථාවේදී ඒ ගැන වැඩි කතා නුසුදුසු හෙයිනි. ඉන්පසු ඔහු වෙළෙන්දට ආචාරකොට ප්‍රීතියෙන් පිටත්ව ගියේය. ගෙදරට පැමිණිවිට ඔහු තම කුඩා දියණිය දෙස බැලුවේය. රූමත් ඇගේ පා වීනයේ චාරිත්‍රානුකූලව හොඳින් වෙලා තිබුනේ ඇගේ මව විසිනි. එසේ සිහින් කළ පා වලින් ගමන් කරණ විට ඇයගේ ගමනෙහිවූ චලිත බව දක්නවුන්ගේ ද ලාලනයට හේතුවක් වීය. ඇය දෙස බැලූ වං ලුං ට ඇගේ දෙනෙත කඳුලින් පිරී තිබුන බව

වැටහුනි. ඔහු ඇය තමාවෙතට ලංකර ගනිමින් "ඇයි උඹ ඇඬුවෙ?"යයි ඇසුවේය. එවිට ඇය හිස පහත් කරගෙණ ඇඳුමෙහි වූ බොත්තමක් අතපතගාමින් ලජ්ජාශීලීව මෙසේ කෙඳුරුවාය.

"අම්ම හැමදම මගේ පා රෙදි කෑල්ලකින් වෙලනව. මේ වෙලීමේ තදකම නිසා රෑට නිදගන්නත් බැහැ."

"ඒ උනාට උඹ කවදක්කත් අඬනව නම් දක්කෙ නැහැ."

"අම්ම කිව්ව මට හයියෙන් අඬන්න එපාය කියල, ඉතින් හයියෙන් අඬනව දැක්කොත් තාත්ත මේ විදියට රෙදිපටි වෙලීම නතර කරන්න පුළුවන් කිව්ව. එසේ නතර කළහොත් තාත්ත අව ලක්ෂණකම නිසා අම්මට ආදරය නොකරන්න වගේ මටත් මගේ ස්වාමියා අනාගතයෙහි පිළිකුල් කළ හැකි බවත් අම්ම මට කිව්ව හින්ද මෙපමණ දවස් ඇහෙන්න – පෙනෙන්න ඇඬුවෙ නැහැ."

සිහින් හඬින් ඇය කියූ මේ කතාවට ඔහු සැලකිලිමත් වූයේය. එයින් ඔහුගේ හදවත දැදුරුව ගියේ තමා ඕලෑංට ආලය නොකරණ බව දෙවන දියණියටද ඇය විසින් කියන්නට ඇතැයි සිතූ නිසාය.

"හා! අන්න උඹේ වයසටම ගැලපෙන ස්වාමියෙකු ගැන අද මට දැනගන්න ලැබුන. කෝකිලාගෙ මාර්ගයෙන් ඒකත් පිළියෙළ කරගන්න පුළුවන්ද කියල බලන්නම්."

ඒ කථාවෙන් ලජ්ජිත බවක් පළකළ දූරිය සිනාසී බිම බලා ගත්තේ තරුණ වියට පා තබමින් සිටි නිසාය. එදින සන්ධ්‍යා සමයෙහි පද්මාගේ කාමරයට ගිය වං ලූං කෝකිලාවට කථාකොට මෙසේ කීවේය:–

"කෝකිලා, ගිහින් බලාපන් මේ දෙවන දියණියගෙ කාරණෙත් කරගන්න පුළුවන්ද කියල."

ඔහු එද රැයෙහි නින්දට ගියේ මහත් නොසන්සුන් කමකිනි. වරින් වර ඇහැ ඇරුණ ඔහුට ස්වකීය අතීත ජීවිතය සිහියට නැඟුනේය.

ඔහුගේ ජීවිතයෙහි පළමුවරට හමුවුනු ස්ත්‍රිය ඕලෑංය. ඇය ඔහුට කීකරු සේවිකාවක මෙන් කටයුතු කළාය. දියණිය කියූ දෙය සිහියට නැඟුන ඔහුගේ හදතුළින් ශොකී බවක්ද වරින් වර මතුවුනි. ඕලෑං කොතරම් අදූරදර්ශී වුවත් තමා පිළිබඳ සත්‍යය ඇය දැනගෙණ තිබෙන බව ඔහුට දැන් හොඳටම පැහැදිලිය.

දිනකීපයක ඇවෑමෙන් ඔහු දෙවන පුතා නගරයට පිටත්කර හැරියේය. දෙවෙනි දියණියගේ විවාහය පිළිබඳ මූලික කටයුතු ද මේ දවස්වලම සිදුවුනේය. කොහොම නමුත් ඇයගේ දයාදයත් ඇයගේ ඇඳුම් පැලඳුම් ආභරණ ආදියත් තීරණය වූයේය.

වං ලූං යුද්දයකින් ජයගනු ලැබූවෙකු මෙන් ''හා, මගේ සියළුම දරුවන්ට කටයුතු පිළියෙළකර දුන්නා''යයි සිතමින් සැන සුනේය. එතෙක් කිසිවක් කථාකරගත නොහැකිව අවාසනාවන්ත තත්වයක සිටි වැඩි මහළු දියණිය ගැන ඔහු විසින් සිතිය යුත්තක් නොවීය. බාලම පුතා පාසැල් නොයවන්නට ඔහු අදහස් කෙළේ ඔහු ගොවියෙකු වනු දැක්මෙහි ආසාව නිසාය. පළමුවෙනි පුතාටත් දෙවෙනි පුතාටත් ඉගැන්වීමෙන් තෘප්තියට පත් ඔහු ''දෙදෙනෙකුට ඉගැන්නුව හොඳටම ඇතැ''යි තමාටම කියාගත්තේය. ඔහු සවකීය පුතුන් තිදෙනා ගැන ආඩම්බරවූනේ පළමුවැන්නා උගතෙකුත් දෙවැන්නා වෙළෙන්දෙකුත් තෙවැන්නා ගොවියෙකුත් විය හැකි නිසාය. පුතුන් ගැන ඔහු සෑහීමට පත්වී ඔවුන් ගැන සිතීම එතෙකින් නතර කෙළේය. ඊලඟට ඔහු සිතතුළ බලපවත්වන්නට වූයේ මේ දරුවන් ලබාදුන් ඕලෑං පිළිබඳ හැඟීම්ය. වෙනදට වඩා ඕනෑකමින් ඔහු ඕලෑං දෙස බැලුවේ ආසාවකින් හා ආදරයකින් නොව අනුකම්පාවෙනි. ඔහුගේ දෙනෙතට දිස්වුන ඇගේ දුර්වල දිරාපත් සිරුර වං ලූං ගේ සිත වෙඩරු පිඩක් බවට පත් කෙළේය

පෙරමෙන් ඕලෑං කුඹුරු වැඩට සහභාගී නොවූයේ ශාරීරික දුබලකම් නිසා නොවේ; ''උඹ මෙච්චර පොහොසතෙකු වෙලත් උඹේ බිරිය තවම කුඹුරු වැඩ කරනවාද?'' යන අපවාදය ඇසීමට නොකැමති වං ලූං විසින් ඇය වැලැක්වූ හෙයින් අවුරුදු කීපයකින් ඔහු හා කුඹුරටද නොගියාය. කෙසේවුවත් ඇය කැමැත්තෙන්ම කුඹුරු වැඩට නොගොස් ගෙදර නතරවීම ගැනත් ගෙදර දොරේ ඇතැම් කටයුතු පමා කිරීම ගැනත් මුලදී ඔහු කල්පනා නොකෙළේය. එහෙත් දැන් ඇය ගැන කල්පනා කරණ ඔහුට ඒ පසුගිය දේවල්ද සිහියට නැගුනේය. උදෑසන ඇඳෙන් නැගිටින විටද ලිප ලඟ පහත්වී ගිනිදල්වන විටද ඈ නැගු කෙඳිරිය අස අසා ''හා! ඔය මොකද්ද''යි අසන විට ඇය කෙඳිරිගෑම නවතා නිහඬ

වූවාය. ඇයගේ දුබල ශරීරය දුටු ඔහු කණගාටුවට පත්වෙමින් නිතර නිතර තර්කද කෙළේය.

"පද්මාට මෙන් ඕලෑංට ද මා ආලය නොකළ එක වරදක්. ඒ උනාට මගෙන් ඇයට කිසිම වරදක් උනේ නැහැ. ඇයට උවමනා ලෙස කෑම් බීම් ඇඳුම් පැලඳුම් මම දුන්නෙමි"යිද සිතූ ඔහුට එද දෙවෙනි දියණිය කී දෙය අමතක කළ නොහැකි විය. එය සිහිවන සෑම විටකම ඔහුට ඇතිවූනේ වේදනාවකි. ඇය පිළිබඳව ඔහු තුළ ඇතිවූන නොසන්සුන්කම මගහරවා ගත හැකි නොවූ නිසා පෙරට වඩා ඔහු ඇය දෙස බැලුවේය.

දිනක් ආහාර ගැණීමෙන් පසු ගේ අතුගාමින් සිටි ඕලෑංගේ මුහුණ වේදනාවෙන් මිරිකී යන අයුරුත් ඇය හතිදමමින් උදරය අතගාන අයුරුත් වං ලුං ට පෙනුනේය.

"මොකද බත්"යි වං ලුං ඇසීය.

"නෑ මේ මගේ ඇඟ ඇතුලෙ තියෙන වේදනාව"යි ඈ කීවාය.

"පොඩී දූ, පොඩී දූ, මෙහෙ එන්න! අම්මට සනීප මදි. මේ කොස්ස අරන් අතුගාන්න"යි කී වං ලුං, ඕලෑං අමතා,

"හා! ඉතින්ගිහිල්ල නිදගන්න. ඕන දෙයක් කිව්වහම අර කෙල්ල ගෙනත්දේවි. මහන්සි වෙන්න ඕන නැහැ."

ඕලෑං ඔහුගේ අණට කීකරුවූනාය-නිශ්ශබ්දව සිය කාමරයට ගියාය. ඇඳට ගිය ඇයගේ කෙඳිරියද ක්‍රම ක්‍රමයෙන් වැඩිවෙමින් ඔහුට ඇසුනි. ඉන්පසු ඔහු වෙදෙකු සොයා නගරයට ගියේය. එහිදී ඔහු බෙහෙත් හලක් සොයාගත්තේ දෙවෙනි පුතා වැඩකරණ වෙළෙඳ පොලෙහි ලිපි කරුවෙකුගේ මග පෙන්වීම අනුවය. ඔහු බෙහෙත් හලට ගොඩවෙන විට වෙදමහතා සිටියේ තේ බොමින්ය. දිගට දිගේ වැඩුන වෙදමහතාගේ රැවුලෙන් වං ලුං ට ඔහුගේ වයස වැටහුනේය. වෙදමහතාගේ විශාල ඇස් තඹ කන්නාඩි කුට්ටමකින් වැසී තිබුනි. වෙදමහතා ඇඳ සිටියේ අත්දිග කිලුටු කබායකි. වං ලුං ස්වකීය බිරියගේ රෝගය ගැන වෙද මහතාට කීවේය. එවිට වෙදමහතා තොල් තද කරගෙණ හිඳගෙණ හුන් මේසයේ ලාච්චුව විවෘත කොට කළුපාට රෙදි කැබැල්ලක එතූ කිසියම් පොදියක් අතට ගෙණ "මම දැන් එන්නම්"යයි කීවේය.

වං ලුං වෙදමහතාත් කැටුව එනවිට ඕලෑං සැහැල්ලු නින්දකට වැටී සිටියාය. වෙදමහතා ඇගේ උඩු තොලෙහි හා තළලෙහිවූ

පිඞිබිඳු වැනි දහඩිය බිඳු දක හිස වැතුවේය. ඉක්බිති ඔහු ඇගේ නාඩි පරික්ෂාකර බැලුවේය. බොහෝ වේලාවක් ඇගේ අත අල්වාගෙණ උන් ඔහු ගැඹුරු ලෙස මෙසේ කීවේය.

''මේක සුළු අසනීපයක් නෙවි. ඇලදිවත් පහත් වෙලා, පිත්නාසෙත් ලෙඩ වෙලා. උදරයත් ගැලවිලා. පපුවත් ගැහෙන්නෙ හිමින්. ඒකෙ පනුවො ඉන්නව වගෙයි, මට පේන හැටියට ගර්භාෂයෙ ලොකුම ගෙඩියක් තියෙන්න ඕන. මිනිහෙක්ගෙ ඔලුව විතර ලොකු එකක්.''

සචකීය හදවතද නවතින්නාක් මෙන් වං ලුං ට දැනුනේය. භීතියෙන් හා ශෝකයෙන් ඔහු තැවෙමින් ''හොඳයි ඇයට බෙහෙත් දෙන්න, එය ඔබට පුළුවන්නේ ද''යි වෙදමහතාගෙන් ඇසුවේය. ඔහුගේ කථාවෙන් පිබිදුන ඕලැං සචකීය සවාමියා දෙස ද වෙදමහතා දෙස ද බැලුවාය. එහෙත් වං ලුං කී දෙය ඇයට නොතේරුනි. මහළු වෙදමහතා මෙසේ කීවේය.

''මේක අමාරු අසනීපයක්! සනීප කිරීම ගැන නම් පොරොන්දුවක් වෙන්න මට බැහැ. උඹ කැමති නම් බේත් වට්ටෝරුවක් ලියල දෙන්නම්, හැබැයි රිදී කාසි දහයක් ගෙවන්න ඕන. හැබැයි සනීප කරනවය කියල පොරොන්දු වෙන්නම් රිදී කාසි පන්සීයක් ගෙවනව නම්.''

''රිදී කාසි පන්සීය යන වචනය ඕලැංගේ කණෙහි වැටුනවිට ඇය දුර්වල හඬින් මෙසේ කීවාය.

''නැහැ! නැහැ! මගේ ජීවිතය එතරම් වටින්නෙ නැහැ! රිදී කාසි පන්සීයක් ඇත්නම් ඉඩම් කෑල්ලක් ගන්න බැරිය.''

''ඒකට කමක් නැහැ. මම මගේ ගෙදර මරණයක් නම් සිදුවන්ට දෙන්නෙ නැහැ. ඔය මුදල මට එතරම් දෙයක් නෙවි''යි වං ලුං ඇය වළක්වමින් කීවේය.

ආසාවේ මහත්කම නිසා රිදී කාසි පන්සීයක් ඉල්ලුවත් ලෙඩ සුව කළ හැකි නොවුවහොත් නීතියෙන් සිදුවන කරදරය ගැන සලකා මහලු වෙද මෙසේ කීවේය.

''මම මුලින් එහෙම කිව්වෙ වැරදීමකින්. මේ ඇස්වල සුදු ඉංගිරියාවෙ හැටියට නම් පේන්නෙ මේ ලෙඩේ සනීප කරන්න රිදීකාසි පන්දහසක් විතර නැතුව බැරි බවයි.''

Scanned by CamScanner

වං ලුං වෙද දෙස මවිත වී බැලුවේය. මෙතරම් විසාල මුදලක් සපයා ගන්නට නම් ඉඩම් සියල්ලම විකිණිය යුතු බවත් එසේ මුදල් වියදම් කොටත් රෝගය සුවකරගත හැකි නොවන බවත් වං ලුං ට වැටහී ගියේය. වෙදගේ මේ වචනවලින් පැහැදිලි ලෙස ම කියැවුණේ ''මේ ගැණි මැරෙනවා'' යන්න බව ඔහුට පැහැදිලි ය.

එබැවින් ඔහු වෙද කැටුව එළියට අවුත්, ඔහුට රිදී කාසි දහය ගෙවීය. ඔහු පිටත්ව ගිය ඉක්බිති වං ලුං තම බිරිය, ඇගේ ජීවිතයේ වැඩි කොටසක් ගත කළ ගිනිහල් ගෙය වෙත පා නැගීය. දැන් ඉතින් ඈ එහි නොවන බැවින්, ඔහු දෙස බැලීමටවත් කෙනෙක් එහි නොවීය. ගිනිහල් ගෙයි කලුවන් වූ බිත්තිය දෙසට මුහුණ හරවාගත් ඔහු, කුඩා දරුවෙකු මෙන් ඉකි බිඳ බිඳ හඬන්නට පටන් ගති.

Scanned by CamScanner



ජීවිත කාලයෙන් අර්ධයකට වඩා ගෙවා නැති ඕලෑං කෙරෙන් ප්‍රාණය නිරුද්ධවීම ඉක්මණින් සිදු නොවූයේ ය. මරුවාට ලංවෙමින් ඇය මාස ගණනක් ම ඔත්පලව සිටියාය. ශීත සෘතුව ද ගතවී ගියේය.

මේ කාලය තුළ ඕලෑං ගේ ඔත්පල වීම කොතරම් පාඩුවක් ද යන්න වං ලූං ට දැනුනේය. ගෙදර දෙරේ කටයුතු වෙනුවෙන් ඕලෑං කොතරම් මහන්සි වූවා ද යන්න ඔහු දැනගත්තේ ඕලෑං ලෙඩ ඇඳට ගිය පසු ය. ගෙදර දෙරේ කටයුතු පිළිබඳ කිසිම දැනුමක් වං ලූං ට හෝ දරුවන්ට නොවීය. යටත් පිරිසෙයින් ඔව්හු තිසි ලෙස ලිප ගිනිමොලවන්නට ද නොදත්හ. එහෙත් ඔව්හු කොහොම හරි මොනවා හරි තම්බාගෙණ කැවෝය. දින ගණනකින් කුස්සිය හා කෑම කාමරය පිරිසිදු නොකළ නිසා තැන තැන වැටුන ඉඳුල් ආහාර කුණු වීමෙන් මුළු ගෙය ම දුගඳින් පිරුණි.

මේ දුගඳ ඉවසිය නොහැකිවූන විට වං ලූං කෙළේ ගෙයින් පිටත හැසිරුණ බල්ලෙකුට අඩගසා ඉඳුල් අවුලා කන්නට සැලැස් වීම හෝ බාල දූවනියට අමතා ඒවා ඉවත්කර දැමීමට නියම කිරීම පමණකි,

හුන් තැනින් නැගිට ගන්නට ද බැරි තරමට දුබල වී සිටි මහළු පියාට සාත්තු සප්පායම් කිරීමද බාලම පුතාට පැවරුණි. පෙර මෙන් ඕලෑං තම සාත්තුවට නොපැමිණෙන්නේ කුමක් නිසා දැයි මහල්ලා නොදන්නේය. තමා ළඟ තබා ගිය තේ කෝප්පය පොවන්නට යයි කියමින් ඕලෑං ට කීප වාරයක් අමතා නොපැමිණෙන විට කෝප්පයට පත් මහල්ලා බොහෝ විට තේ කෝප්පය

Scanned by CamScanner

පෙළොවේ ගැසුවේය. තමාට උණු වතුර ගෙනෙන්නට හෝ තමා නැගිටුවන්නට උදව් දීම සඳහා හෝ ඕලෑං නොපැමිණීම ඔහුට තේරුම්ගත නොහැකි විය.

අන්තිමේ දී වං ලුං, ඔහු, ඇය වැතිර සිටින ඇඳ ළඟට ඔසවා ගෙණ ගොස් පෙන්නුවේය. මහල්ලා පටල බැඳුන අන්ධ වූ ඇසින් ඇය දෙස බලා කොඳුර කොඳුරා හඬන්නට පටන් ගත්තේ යමක් වැරදී ඇති බව තේරුම් ගත් හෙයිනි.

ඕලෑං ගේ ඔත්පල වීම ගැන ''පුංචි මෝඩි'' යයි වං ලුං විසින් හඳුන්වනු ලැබූ ඔහුගේ ලොකු දියණිය පමණක් කිසිත් නොදත්තාය. කථා කරන්නට ද හරි හැටි ඇවිදින්නට ද නොහැකි වුන ඇයට කවුරු හෝ උදව් කළ මනා ය. ගෙයින් බැහැර යන්නට හෝ බැහැරින් ගෙට එන්නට ඇයට අන්‍යයන්ගේ උදව් අවශ්‍ය විය. දිනක් දවල් කාලයේ එළිමහනෙහි තැබූ ඇය ගෙට ගන්නට වං ලුං ට අමතක වුනේය. ''පුංචි මෝඩිය'' ගෙට ගන්නට ඔහුට අමතක වුන බව වැටහුනේ උදෑසන ''ඒ අසරණ දැරිය සීතලෙන් ගැහි ගැහී අඬ අඬා සිටිනු'' දුටු විටය. මෙයින් කෝපයට පත් වං ලුං සෙසු දරුවන්ට බැණ වැදුනේය. එහෙත් ඔවුන් ගැන ද පසුව ඔහු තුළ උපන්නේ අනුකම්පාවකි.

මුළු සීත සෘතුව වං ලුං ට ගතකරන්නට වූයේ ගෙදර කටයුතු සඳහා ය. මේ කාලය තුළ ගොවිතැන් වැඩ පිළිබඳ කටයුතු ඔහු චිං ට පැවරුවේය. චිං භාරගත් කටයුතු අවංකව ඉටු කෙළේය. සෑම උදයක හා සන්ධ්‍යාවක ඕලෑං ගේ කාමරයේ දොරකඩ ළඟට ගොස් ඇයගේ සුව දුක් විමසීම හේ අමතක නොකෙළේය. මේ විමසීම ද වං ලුං ට මහත් කරදරයක් මෙන් දැනෙන්නට විය. අන්තිමේ දී ඔහු චිං ට අණ කෙළේ ඇය ගැන සෙවීමට කාලය ගත කිරීම අනවශ්‍ය බවත් ඉඩම් ගැන යලිත් සැලකිල්ලෙන් කටයුතු කිරීම පමණක් අවශ්‍ය බවත් ය. එහෙත් ඇයගේ ආරක්ෂාවට මුළු දවසෙහි වැඩි කාලයක් වං ලුං ලෙඩ ඇඳ ළඟ වාඩි වී සිටියේය. ඇයගේ උණුසුම සඳහා මැටි භාජනයක ලූ අඟුරු දල්වන විට ඕලෑං සිහින් හඬින් කොඳුරමින් ''හා! ඔච්චර අඟුරු පුළුස්සා වියදම් කරන්න එපා'' යයි කීවාය.

''නැහැ, නැහැ උඹ වෙනුවෙන් මගේ ඉඩකඩම් උනත් විකුණල වියදම් කරණව.''

Scanned by CamScanner

''මම කවදක්කත් ඒකට නම් ඉඩ දෙන්නෙ නැහැ. මොනව කළත් කවද හරි මැරෙන මා වෙනුවෙන් මුදල් නාස්ති කිරීමෙන් ඇති තේරුමක් තියනවයි?'' යනුවෙන් එවිට ඇ භග්න ස්වරයෙන් කොඳුළාය.

ඇය මරණය ගැන කථාකරනු ඇසීම ඔහුගේ බලවත් ශෝකයට හේතු විය. එබඳු අවස්ථාවල ඔහු කාමරයෙන් පිටව ගියේය.

ඕ ලෑං ගේ මරණය ඉතා ආසන්න වූ බව වං ලුං ට වැටහුනේය. ඊලඟට ඔහු විසින් කළ යුතුව තිබුනේ කල් ඇතුව අවසාන කටයුතු පිළියෙළ කොට තැබීමය. ඒ සඳහා ඔහු පළමුකොට ම මිනී පෙට්ටි සාදන්නෙකු වෙත ගියේය. එහි සාද තිබුන සෑම මිනී පෙට්ටියක් ම පරීක්ෂා කළ ඔහු හොඳ ලීයකින් කළ කළු මිනී පෙට්ටියක් තෝරා ගත්තේය.

මිනී පෙට්ටි කාරයා වං ලුං දෙස පරීක්ෂාවෙන් බලා සිට මෙසේ කීවේය :–

''මිනී පෙට්ටි දෙකක් ම ගන්නව නම් මුදලෙන් තුනෙන් එකක් අඩුකරගෙන දෙන්න පුළුවන්. ඔබ වෙනුවෙනුත් එකක් අරන් තියාගත්තට වරදක් නැහැ. කවුද නොමැරෙන්නෙ?''

''නැහැ. නැහැ! ඒක මගේ පුත්තු කරා වි'' යයි කියූ වං ලුං ට මහළු පියා ගැන ද සිහිවුනේය. පියා වෙනුවෙනුත් මිනී පෙට්ටියක් අරන් තැබීමට අදහස් කෙළේය.

''හොඳයි කමක් නැහැ. පෙට්ටි දෙකක් ම ගන්න ඕන. මගේ පියත් කොයි මොහොතෙද දන්නෙ නැහැ.''

මිනී පෙට්ටි කාරයාගේ යෝජනාව ඉටුවුනේය. මිනී පෙට්ටි දෙක යලිත් ඔප දමා ගෙදරට ම එවීමට ඔහු පොරොන්දු විය.

තමාගේ අවසාන කටයුතු පිළිබඳව සියල්ල ම සූදනම් බව දැනගත් ඕ ලෑං එයට පළකෙළේ භීතිය නොව ප්‍රීතියකි. ඇය අන්තිම හුස්ම හෙළමින් සිටි මේ දවස් කීපයෙහි වං ලුං දවසෙහි වැඩි කාලය ගතකෙළේ ඇයගේ ලෙඩ ඇඳ ළඟය. එහෙත් දෙදෙන කතා කළේ ස්වල්පයකි. ඇයගේ සිහිය ක්‍රමයෙන් අඩු විය. අතරින් පතර කෙඳිරි ග ගා හිතෙන් මෙන් ඇය කථා කළේ ද කුඩා කාලයේ තොරතුරුය–කුඩා කාලයේ සිදුවීම ය. වං ලුං ගේ හදවත තවදුරටත්

ඇය කෙරෙහි ඇදී යන–ඇය සම්බන්ධ ව තවත් අලුත් දේ සිහියට නංවන ඒ දුබල වචන සෙමින් පිට වීය.

"මම කෑම ගේන්නෙ දෙර ළඟට පමණයි. මම හුඟක් කැත බවත්, ලොකු රදළ තුමා ඉදිරියට එන්න බැරි බවත් මම දන්නව–අනේ මට ගහන්න එපා! ආයි කවදක්කත් දීසියෙන් නම් කන්නෙ නැහැ."—"අම්මේ, අම්මේ, තාත්තෙ"—"ඔව් මම දන්නවා කැත හන්ද මට ආදරේ නැති බව."

ඇයගේ මේ වචන වලින් වං ලුං ගේ හදවත ශෝකයෙන් බර වීය. එකෙණෙහි ඇතිවුන කරුණාව පෙන්වන්නට වං ලුං අප්‍රාණික වෙමින් පැවතුන ඇගේ අත ගත් විට පද්මා ගේ අතෙහි පහසින් ලබන ආශ්වාදය ඉන් තමාට නොලැබෙන බව දැනුණු ඔහු තුළ උපන්නේ තමාට ම දෙස් පවරා ගැනීමකි. තමාගේ කරුණාව පවා මෙයින් අඩු වීය. එහෙත් ඔහු තමා විසින් ඇයට කළ හැකි සෑම සත්කාරයක් ම ඉටු කෙළේය. ඕලෑං විදින දුඃඛ වේදනාව නිසා කම්පාවුන හදවත වා වා ගැණීමට වං ලුං පද්මා වෙත ගියත් ඔහුට එය අමතක කළ නොහැකි වීය.

මරණාසන්නයෙහි සිටි ඕලෑං දිනක් කෝකිලා ට අඬගැසුවාය. එයින් මහත් විශ්මයට පත් වං ලුං "ඒ ගැහැණිය" කැඳෙව්වේය. කෝකිලා ඇයගේ ලෙඩ යහන වෙත පැමිණි විට ඇය ගැහි ගැහී වෙව්ල වෙව්ලා යන්තම් අතේ වාරුවෙන් නැගී සිට ඉතා පැහැදිලි හඬින් මෙසේ කීවාය :–

"හා! උඹ ඒ දවස්වල නාකි රදළ තැනගෙ කාමරයෙ තමයි සිටියෙ. උඹ ඒ දවස්වල හිතාගෙන හිටියෙ උඹ හරි ලස්සන ගැණියෙක් ය කියල යි. ඒ උනාට උඹ තවමත් දසියක්. මම මිනිහෙකුගෙ බිරියකුත් වෙලා දූ පුතුනුත් ලැබුව." මෙයින් කෝපයට පත් කෝකිලා ඇයට පිළිතුරු දීමට සැරසුනාය. වං ලුං එය වැළැක් වූයේ "එයාට දැන් වචනවල තේරුම් දැනෙන්නෙ නැතැ"යි කියමිනි. කෝකිලා පිටත යවා යලිත් වං ලුං, ඕලෑං ගේ කාමරයට ගියේය. අත් මත හිස රුවාගෙණ සිටි ඇය මෙසේ කීවාය:–

"මම මළාට පස්සෙ ඔය ගැණිට වත් කෝකිලාට වත් මගේ කාමරයට ඇවිත් මගේ කාමරවල තිබෙන දේ වලට අත ගසන්ට දෙන්න එපා! එහෙම කළොත් මගේ අවතාරය ඔබට සාපයක් වේවි!"

Scanned by CamScanner

මේ වචන ක්‍රමයෙන් නතර වූයේ යලිත් ඇය නින්දට වැටුන විටය.

දුල්වී අවසන් වීමට ලංව තිබුණ ඉටිපන්දමක අලෝකය දීප්තිමත් වන්නාක් මෙන් ඕ ලෑං ද සුව බවක් පළ කෙළේ අළුත් අවුරුද්ද ලැබීමට පෙර දිනක ය. හොඳ සිහියෙන් ඇඳෙහි නැගී සිටි ඇය කෙස් වැටිය සකස් කර ගනිමින් බීමට තේ වතුර ගෙණෙන්නට කීවාය. වං ලුං කාමරයට පැමිණි විට ඇය ඔහු හා කථා කළාය :-

''දුන් ඉතින් අළුත් අවුරුද්දත් ලඟයි, නමුත් ගෙදර කිසි දෙයක් සූදානම් නැතුව ඇති. අර කෝකිලාට නම් මගේ කුස්සියට එන්න දෙන්න එපා! අර මගේ වැඩිමල් පුතාට පොරොන්දු වී සිටින ලේලිය කැඳෙව්වහම නරකද? මැරෙන්න කලින් ඇය දැක ගන්නත් ඕන. ඇය ආපු විටක මේ ගෙදර කරන්න තියෙන වැඩ මම කියා දෙන්නම්.''

ඇය සුව බවක් පළකරමින් කථා කිරීම වං ලුං ගේ සතුට ට හේතුවක් විය. මෙවර අවුරුදු උත්සවය ගණනකටවත් නොගත් ඔහු නගරයේ වෙසෙන ලියූ නැමති ධාත්‍ය වෙළෙන්ද වෙත කෝකිලා පිටත් කර හැරියේය. ඕ ලෑං සිත සෑතුව ද ගත කළ නොහැකි තත්වයක වෙසෙතියි කියා යැවූ නිසාත් සිය දියණිය ද සොලොස් වියට පා තබමින් සිටි නිසාත් ඇය වං ලුං ගේ ගෙදරට යවන්නට ලියූ කැමති විය.

වං ලුං මැඳුරෙහි මෙන් ම ලියූ මැඳුරෙහි ද උත්සවයක් සිදු නොවූයේය. තරුණිය නිශ්ශබ්දවම දෝලාවකින් වං ලුං මැඳුරට පැමිණියාය. ඇය සමග ඇගේ මවත් ඇගේ මහළු සේවිකාවකුත් පැමිණියහ. කතාබස් කිරීමෙන් පසු ඇගේ මව පෙරලා ගියේ මහළු සේවිකාව ද ඇගේ සේවයට එහි නතර කොට ය.

තරුණියගේ වාසයට සුදුසු කාමරයක් ද ලැබුනේය. සිදුවිය යුතු සියල්ලක් ම යහතින් සිදු වූනේය. තරුණිය වං ලුං හා වචනයකුදු කථා නොකෙළේ එසේ කථා කිරීම නුසුදුසු යයි සිතූ නිසාය. එහෙත් ඇය ඔහුට නැමී ආචාර කරණ විට වං ලුං ද මහත් සැලකිල්ලකින් හිස නමා ඒ ආචාරය පිළිගත්තේය. ගෙදර වැඩ පිළිබඳව වං ලුං විසින් ඇයට කිසිත් කියයුතු නොවීය. පළපුරුදු ගෘහිණියක මෙන් ඇය එහි වැඩ කළ නිසාත් බිමට හැරවූ නෙතින්

Scanned by CamScanner

යුතුව සන්සුන්ව ගමන් කළ නිසාත් ඇය කෙරෙහි වං ලුං අතිශයින් ම පැහැදුනේය.

ඇය තරමක් රූමත් ය, එහෙත් නිරහංකාරය. කිසිවෙකුගේ මෙහෙයීමක් නොමැතිව ම ඕලැං ගේ යහන වෙත ගොස් ඇයට කළ යුතු උපස්ථාන ද කළාය. වං ලුං මෙන් ම ඕලැං ද එයින් තෘප්තියට පත් වූවාය.

ඕලැං එයින් තෘප්තියට පත් වුනේ තෙදිනක් පමණකි. ඉන්පසු ඇය තවත් දෙයක් ගැන කල්පනා කළාය. සිව්වෙනි දින උදයෙහි සිය කාමරයට පැමිණි වං ලුං ට කථා කොට ''මැරෙන්න ඉස්සරවෙලා තවත් දෙයක් කියන්න තියනවා'' යයි කීවාය.

එවිට ''උඹට මරණය ගැන කථා කරල මාව සතුටු කරන්න නොහැකි''යයි වං ලුං කීයේ කෝපයෙනි. සිනාසෙමින් ඇය යළිත් කථා කළාය :– ''මගේ මරණය වැළැක්විය නොහැකියි. නමුත් මගේ ලොකුම හිතේ අමාරුව මේ තරුණිය හා එක්ව වාසය කිරීමට මගේ ලොකු පුතා මෙතෙක් නොපැමිණීම ගැනයි. ඈ හොඳ කෙල්ලක්. කිසිම අහංකාරයක් නැහැ. මේ දවස්වල මගේ සාත්තුව කරන්නේ ඉතාමත් ඕනෑකමින්. මා මැරෙන්න ඉස්සර වැඩිමල් පුතා කැඳවා ගන්නයි තියෙන්නෙ. මට අනාගතයේ මුනුපුරෙකු ලැබෙන්නට සලස්වා මැරුණොත් ඒකත් සැනසීමක්.''

මෙසේ ඇය කථා කිරීම වං ලුං ට ලොකු සැනසීමකි. සනීප යෙන් සිටි දවස්වල ද මාසයකටවත් මෙබඳු වචන සමූහයක් ඇයගේ මුවින් පිට නොවුනි. සවකීය වැඩිමල් පුතාගේ මංගල්‍යය සඳහා තරමක කාලයක් ඔහුට අවශ්‍ය වුනත් ඕලැං ගේ ඉල්ලීම ප්‍රතික්ෂෙප කළ නොහැකි වීය. එහෙයින් ඔහු ඇයගේ සිත සැනසුවේය :–

''හා! හොඳයි! එහෙනම් ඒ කටයුත්ත අපි කරමු. මම අදම මිනිසෙකු දකුණට පිටත් කරන්නම්. ඒ මිනිහ මගේ පුතා එක්කර ගෙන ඒවි. හැබැයි උඹ පොරොන්දු වෙන්න ඕන ඔය කොච්චරවත් මැරෙනවයි කියන කථාව මෙතැන් පටන් නොකිය ඉන්න. කෙහොම හරි සනීප වෙන්න මහන්සි ගණින්. බලාපන් උඹ ලෙඩවීම නිසා මේ ගෙදර වල් සතුන්ගෙ ගුහාවක් වගෙයි.''

අභිමත පරිදි වං ලුං ගේ ඒ කථාවට ඕලැං සතුටු වූවාය. ඇය මඳක් සිනාසෙමින් ඇඳෙහි ඇලවී නෙත් පියාගෙණ නිදන්නට වූවාය.

Scanned by CamScanner

වං ලුං ද කාමරයෙන් පිටත අවුත් සේවකයෙකුට කථා කෙළේය. ඔහු තමා වෙත පැමිණි සේවකයාට මෙසේ කීවේය:-

''උඹ දන් මගේ ලොකු පුතා ඉන්න දිහාවට ගිහිල්ල කියාපන් එයාගෙ අම්ම මරණාසන්නව සිටින බව. එයාගෙ අම්මට මැරෙන්න ඉස්සෙල්ල පුතාත් පුතාගෙ මංගලයත් දැකගන්නයි ඕන කම තියෙන්නෙ. තාත්තටත් අම්මටත් ගෙදරටත් ආදරේ ඇත්නම් කියාපන් මගේ පුතාට ඉක්මනට එන්නෙයි කියල. අදින් තුන්වන දවසෙ මම මංගල්ලෙ සූදනම් කරනව. අමුත්තන්ට හෙම ආරාධනා කරනව.''

වං ලුං කී ලෙසම ක්‍රියා කෙළේය. අනතුරුව වං ලුං කෝකිලාට නියම කෙළේ ඉතා උසස් ලෙස භෝජන සංග්‍රහයක් පිළියෙළ කරන්නටය. ඇයට අත් උදව්වට නගරයෙන් කෝකියෙකු ගෙන්වන්නට ද සිදුවුනි.

''මංගල අවස්ථාවල දී මහ ගෙදර භෝජන සංග්‍රහ පිළියෙළ කරණ අන්දමටම මෙයද පිළියෙළ කිරීමට'' නියම කළ වං ලුං මුදල් ගොඩක් කෝකිලාගේ අතට දී අවශ්‍ය නම් තවත් මුදල් ඉල්ලන ලෙස නියම කෙළේය.

ඉන්පසු ඔහු ගම්මානයට ගියේ තව දවස් තුනකින් පැවත්වෙන භෝජන සංග්‍රහයට අමුත්තන් ට ආරාධනය කිරීමටය. වං ලුං දන්නා හඳුනන ගමේ සැම ගැහැණියෙක් ම පිරිමියෙක් ම මේ සංග්‍රහයට ආරාධනා ලැබූහ. ඔහු නගරයේ මිත්‍රයන්ට හා හඳුනන අයට ද ආරාධනා කෙළේය. බාප්පාට ද තමන් දන්නා හඳුනන අයට ආරාධනා කරණ ලෙස නියම කෙළේ ස්වකීය බාප්පා කෙබඳු කෙනෙක් දැයි ඔහු දන සිටි නිසාය.

ස්වකීය විවාහ මංගලයට පෙර දින රාත්‍රියෙහි වං ලුං ගේ පුතා ගෙදර පැමිණියේය. වං ලුං ලැසි ගමනින් ගෙට පිවිසුන පුත්‍රයා ආදරයෙන් පිළිගත්තේ ගතවුන කාලයේ පුත්‍රයා ගෙන් සිදුවුන කරදර සියල්ලම අමතක කොටය. අවුරුදු දෙකකට පමණ පසු හමුවුන ස්වකීය වැඩි මහළු පුතා ''දන් ළමයෙකු නොව තරුණයෙකැ''යි ඔහු සිතුවේ තෙල් ගෑමෙන් දිලිසුන කොටකර කැපූ කාලවණ් හිස කෙස් වලිනුත් රන්වන් පැහැයෙන් දිලිසුන පිරුණ කම්මුලෙනුත් යුක්තවුන තරුණයාගේ තරබාරු තරුණ උස් දේහය දැක දැකය. මේ තරුණයා ඇඳ සිටි තද රතු ශේද ඇඳුම කවටලය නිසා තරු

දේහයෙහි ප්‍රෞඪ භාවය වඩාත් පැහැදිලි ලෙස ප්‍රකට වූණේය. වං ලූං සවකීය වැඩි මහළු පුත්‍රයා රෝගීව සිටින ඕලෑං වෙත කැඳවා ගෙණ ගියේ මහත් ආඩම්බරයෙනි.

මෙසේ සවකීය පියා සමග ගමන් කළ පුත්‍රයා මවගේ ඇඳ පසෙකින් හිඳගත්තේය. මවගේ තත්වය දුටු ඔහුගේ නෙතට කඳුළු ඉනුවේය. එහෙත් ඔහු ඇය හා කථා කෙළේ මෙබඳු ප්‍රීතිමත් වචනයි.

''මට ආරංචි වුනේ අම්මට මීටත් වඩා අමාරුයි කියලයි. මම හීනෙකින් වත් හිතුවෙ නැහැ අම්මට මෙපමණවත් සනීපෙයි කියල.''

''මට උඹේ විවාහය බලල මැරෙන්න ඕනෑ'' යයි සිහින් හඬින් ඕලෑං කීවාය.

ගෙදරට පැමිණ පැය කීපයක් ගත වුවද තරුණයා තමා හා විවාහයට සූදානම්ව සිටින තරුණිය නොදුටුවේ විවාහයට පෙර තරුණයා විසින් තරුණිය නොදැකීම චාරිත්‍රයක් වීම නිසාය. විවාහ මංගල දිනය එළඹියේය. එදින එහි වැදගත් ම කාර්‍ය්‍යය පැවරුනේ පද්මාටත් කෝකිලාට හා කුඩම්මාටත් ය. ඔවුන්ට පැවරුණ මේ මහා කාර්‍ය්‍යය නම් මනමාලිය සැරසීමයි. මේ කාර්‍ය්‍යයට ඔවුන් තරම් සුදුස්සන් මෙහි නොමැති බව කවුරුත් පිළිගත්හ.

ඔවුන් උදෑසනම මේ කාර්‍ය්‍යය ඇරඹුවේ තරුණිය හිස පටන් නහවා පිරිසිදු කිරීමෙනි. අනතුරුව ඔව්හු ඇගේ පිරිසිදු පාද යුග්මය අළුත් සුදු රෙදි වලින් වෙලූහ. මේ අතර පද්මා තමාගේ පාච්චියට තිබුන සුවඳ තෙල් භාජනයක් ගෙනවුත් එයින් සවල්පයක් ඇගේ ඇඟෙහි ගැල්වූවාය. සුදු රෙදි වලින් වෙළූ පා යුවල අළුත් මේස් වලින් සරසා ගෙදරින්ම ගෙන ආ අළුත් ඇඳුම් ඇයට ඇන්ද වූහ. මේ ඇඳුම් අතර සුදු මල් වැටුන පට රෙද්දක් ද සිහින් රැළි වැටුන ලොම් කබායක් ද රතු සේද රෙද්දක් ද වීය.

මේ සියළුම ඇඳුම් ඇන්ද වූ පසු නළල් තලයෙහි දෙහි ගල්වා ඇගේ ඇහි බැමවල අළුත් රෝමයන් ගලවා දැමීම ද ඔව්හු අමතක නොකළහ. රතු වත්සුනු ගා ඇගේ වත ඔප ලූ ඔව්හු රෝම උගුලා දැමූ ඇගේ ඇහි බැමවල පින්සලයකින් මනහර

Scanned by CamScanner

හුෑ රේඛා ද තැබූහ. ඇගේ හිසට ඔටුන්නක් ද මුතුවැල් එල්බුන 'වේල්' එකක් ද ඇගේ කෝමල පා යුවළට අලංකාර සපත්තු කුට්ටමක්ද වැටුනේ ඉන් පසුවය. ඇගේ අත්ලෙහි සුවඳ වර්ග ගැල්වීමෙනුත් ඇගේ නියපොතු පාට කිරීමෙනුත් මේ සැරසිල්ලෙහි නිමහම් කම ඔවුහු දුටහ. මේ සෑම සැරසිල්ලකටම අවනත වුන ඇය පළකෙළේ මහත් ලජ්ජා ස්වභාවයකි.

මනාලියගේ සැරසීම නිමවෙද්දී වං ලුං ද ඔහුගේ බාප්පා ද ඔහුගේ තාත්තා ද අමුත්තෝ ද මැද සාලයේ අසුන් ගත්හ. ගතවූයේ මොහොතකි. මංගල ඇඳුමෙන් සැරසුන තරුණිය ස්වකීය සේවිකාවන් කුඩම්මාත් කැටුව මැදසාලයට සෙමින් සෙමින් පැමිණියා ය. ඇයගේ නිහතමානී ගමන් විලාසය දුටු වං ලුං ප්‍රීතියෙන් පිනාගියේය. වං ලුං ගේ වැඩිමහලු පුතා ද රතු කබායක් හැඳගෙණ ඔවුනතරට පැමිණියේ ස්වකීය සොහොයුරියත් සොහොයුරාත් කැටුවය.

මහල්ලාට – වං ලුං ගේ පියාට මේ දවසෙහි සිදුවීම් ගැන කිසිම අවබෝධයක් ඇති නොවීය. වං ලුං ඔහුගේ කණ ළඟට කට තබා කීපවරක් ම කෑ ගසා ''අද වැඩිමහල් පුතාගේ මංගල දිනය''යි කී නමුත් එය ද මහල්ලාට නොඇසුනේය. අන්තිමේ දී තම පුත්‍රයා කණට කොඳුරා කථා කිරීමේ හේතුව කල්පනා කළ ඔහුට කාරණය වැටහුනේය.

''කොපමණවත් මඟුල් කෑම්! කොපමණවත් මඟුල් කෑම්! මඟුල් කෑම් කියන්නෙ දරුවන්ට හා මුනුබුරන්ටය''යි කියමින් මහල්ලා සිනාසුනේය. මහල්ලාගේ සිනහව දුටු අමුත්තෝ ද සිනාසුන හ. ඕලෑං ද මංගලෝත්සව කටයුතු වලට සහභාගි වූවා නම් මේ දිනය ඇත්තවශයෙන්ම ප්‍රීතිමත් එකක් වන බව වං ලුං ගේ අදහස විය.

මේ අතර වං ලුං තරුණ පුත්‍රයාගේ මුහුණ දෙස හොරැහින් වරින්වර බැලුවේ ඔහු තරුණිය සමග පෙම් බැලුම් හුවමාරු කර ගන්නවාද, යන්න දැන ගැනීමටය. හෙමි හෙමින් ඔහු ඒ කාර්‍යයෙහි යෙදී සිටින බව හා ප්‍රීතිමත් වන බව දැනගත් ඔහු ''හා! හරියටම හරි! මම තෝරගෙන තියෙන්නෙ එයා කැමතිම කෙනෙක්'' යයි සිතුවේය.

විවාහ මංගලයේ සිරිත් විරිත් පවත්වන කාලය එළඹියේය. මනාලයා මනාලිය හා එකතුව පියාට ද සීයාට ද ආචාර කෙළේය. ඉන් පසු මේ නව යුවළ පිවිසුනේ ඕලැංගේ කාමරයටය. රෝගී ඇය ඔවුන් පිළිගන්නට ඇඳෙහි නැගිට හිඳගෙන සිටියේ අළුත් කලු කබායක් ද ඇඳගෙනය. නව යුවළ සමග කාමරයට පිවිසුන වං ලුං ''සමහර විට ඇයට සනීප වෙන්නත් පුළුවන්'' යයි කීවේ ඇයගේ මුහුණෙහි දැවෙමින් තිබුන රතු ලප දෙක රෝගය සුවවීමේ ලකුණකැයි සැලකූ නිසාය.

තරුණ යුවළ ඇඳට ලං වෙමින් ඇයට ආචාර කළ පසු ඇය ඇඳට අතින් තට්ටු කරමින් මෙසේ කීවාය:-

''උඹලගෙ මංගල කටයුතු හරියන්න ඕන. ඔය කටයුත්ත දකල මැරෙන්නයි මට ඕනකම තිබුනෙ. දැන් ඉතින් මට ඕන කරන්නේ මේ ඇඳ උඹලගෙ මංගල යහන වසයෙන් ගැණීමට ඉක්මනට මැරෙන්නයි.''

ඇය මෙසේ කියත් ම කිසිවෙකුට පිළිතුරු දියහැකි නොවීය. එහෙත් ඔවුන් දෙදෙනා ලජ්ජා සහගතව නිශ්ශබ්දව එක ලඟින්ම වාඩිවූහ.

විවාහ මංගලයේ වැදගත්ම කොටස එළඹියේය. අවසථාවට සුදුසු පරිදි සැරසී වං ලුං ගේ කුඩම්මා උණුසුම් වයින් භාජන දෙකක් ද රැගෙන කාමරයට පිවිස ඒවා වෙන – වෙනම නව යුවළට පිළිගැන්නුවාය. පළමු කොට ඔව්හු ඒවා වෙන වෙනම පානයකොට පසුව භාජන දෙකින්ම ටික ටික ගෙණ කවලම් කොට පානය කළහ. එයින් අදහස් කෙළේ ඔවුන් දෙදෙනා එක්වූ බවය. ඒ අන්දමට ම ඔව්හු තනි තනිව හා යළි කවලම් කොට බත් සවල්පයක් ද කෑහ. මෙසේ මිශ්‍ර කරගෙන කෑමෙන් අදහස් කෙළේ ඔවුන්ගේ ජීවිත දෙකම එකක් බවය. මෙතෙකින් විවාහ මංගලොත්සවය සමාප්තවූන පසු නව යුවළ යළිත් වං ලුං ට නැමී ආචාරකොට එළියට ගොස් අමුත්තන්ට ද හරසර දක්වූහ.

ඉක්බිති ඇරඹුනේ අමුත්තන් සඳහා භෝජන සංග්‍රහයයි. වං ලුං මැදුරෙහි කාමරද මිදුල් ද කෑම මෙසවලින් පිරීගියේය. ආහාර වර්ගවල සුවඳ ද අමුත්තන්ගේ සිනාහඬ ද මුළු වත්තෙහි පැතිරී ගියේය. පැමිණ සිටි අමුත්තන් අතර ඈත පළාත්වල අය ද වූහ. වං ලුං ගේ ආරාධනා ලැබූ අය සමග පැමිණි වෙනත් අය ද වූහ.

Scanned by CamScanner

වං ලුං ධනවතෙකු නිසා මෙබඳු අවස්ථාවක කෑම බීම්වලින් හිඟයක් නොවන බව අමුත්තෝ දැනගත්හ.

මේ භෝජන සංග්‍රහය පිළියෙල කිරීමට කෝකිලා විසින් ගෙන්වා ගනු ලැබුවේ කෝකියන් පමණක් නොවේ; නොයෙක් කෑම වර්ග සෑදීමට භාජන ද ඇය තේ පැන්හලින් ගෙන්වා ගත්තාය. මේ භාජන රැගෙන තේ පැන්හලින් පැමිණි සේවකයෝද ඉතා කැමැත්තෙන් එහි එහේ මෙහේ කරකැවෙමින් කල්ගෙවූහ. පැමිණි අමුත්තෝ ද හැකි තරම් කා බී සතුටු වූහ.

ඕලැං ද කෑම වර්ගවල සුවඳ ආඝ්‍රාණය කිරීමටත් අමුත්තන් ගේ ප්‍රීති සෝභාව ඇසීමටත් සිය කාමරයෙහි දොරවල් හා ජනෙල් විවෘත කරවා එහි දොර රෙදි ද පසෙකට කෙරෙව්වාය. එපමණ කින්ම නොසෑනසුන ඇය වරින්වර තම කාමරයට පැමිණි වං ලුං ගෙන් මෙසේ විමසුවාය.

''කොහොමද ඔය ඔක්කොටම සෑහෙන්න වයින් තියෙනවද? ඔය පිළියෙළ කරල තියෙන කෑම් බීම් කන්න පුළුවන් තාලෙට පිළියෙළ කරල තියෙනව ද කියල මම දන්නෙ නැහැ.''

''ඔව් ඔව් ඒව ඔක්කොම හරි''යයි වං ලුං කී විට ඇය එයට සතුටින් කන්දීගෙන සිටියාය.

මෙලෙසින් විවාහ මංගලය නිමවුනෝය. අමුත්තෝ නව යුවළට ආසිරිපතා පිටව ගියහ. රාත්‍රිය එළඹියේ ය. ගෙහි නිසසල බව ද පැතිරී ගියේය. ගෙවැසියන්ගේ ප්‍රීති ප්‍රමෝදය අඩුවී යත්ම ඕලැංගේ ශක්තිය ක්‍රමයෙන් පිරිහී ගියේය. විඩාවට හා ක්ලාන්ත බවට පත් ඇය නව යුවළ කැඳවා මෙසේ කීවාය:-

''දූන් ඉතින් මට හරි සන්තෝෂයි. කොයිවෙලාවෙ මේ පණ ටික ගියත් කමක් නැහැ. අනේ මගේ පුතේ, තාත්තාටත් සීයටත් සලකපන්! අනේ මගේ දුවේ, උඹේ ස්වාමියාටත් මාමටත් සීයටත් අර 'පුංචි මෝඩිය'ටත් සලකන්න මතක තියා ගනින්. උඹේ සැලකිල්ල ලබන්න මේ ගෙදර ඉන්නෙ ඔය කියාපු උදවිය විතරයි.''

ඈ පසුව මේ වචන එකතු කළේ පද්මා සිහිකරමිනි. නව යුවළ තවදුරටත් ඇය කියන දෙයට සැලකිල්ලෙන් කන් දුන්හ. එහෙත් ඇයගේ කථාව හදිසියෙන් නතරවුනේ ඇය නින්ද වැනි තත්වයකට වැටුන නිසාය. මොහොතකින් ඉන් යලිත් පිබිදුන ඇය

Scanned by CamScanner

නව යුවළ එහි සිටින බව තබා තමා සිටින තැන ගැනත් හැඟීමක් නොමැතිව ඒමේ අත හැරෙමින් දෙනෙත් පියාගෙන මෙසේ තොල් මතුළාය:–

''හා! මම කැත උනත් පුතෙකු ත් වැදුව. කොහොමද ඒකි මම වගේම ඔහුට සලකාවිද? ලස්සන වුන තරමට පුතුන් හදන්න බැහැ.''

ඇය කිසිම සම්බන්ධයක් නැති වචන කථා කරණ බව දත් වං ලුං නව යුවළට කාමරයෙන් පිටතට යාමට සංඥා කළේය. ඔහු වරින්වර නිද ගනිමින් ද පිබිදෙමින් ද සිටි ඇය ලඟින් හිඳගත්තේය. ඇය වරක් තදින් දෙනෙත විදහා බැලුවාය. විශ්මයට හා භීතියට පත්වූවාක් මෙන් වරින්වර ඇය ඔහු දෙස මෙසේ බැලුවේ නාඳුනන කෙනෙකු දෙස බලන්නාක් මෙන් ය. හදිසියෙන්ම ඇගේ හිස කොට්ටයෙන් පිටතට වැටුනේය. ඇඹරී ගිය අත පය ක්‍රමයෙන් දරදඬු බවට පත් වීය. ඉන්පසු ඇය වරක් තදින් වෙවුලා සදාකාලික නින්දට පිවිසියා ය.

ඇයගේ ප්‍රාණය නිරුද්ධ වූ පසු ඔහුට එහි සිටිය නොහැකි වීය. ඔහු කුඩම්මාට කථාකොට අවමංගල්‍යය සඳහා මළ සිරුර පිරිසිදු කරන්නට නියම කෙළේය. ඔහු යලිත් කාමරයට පිවිසුනේ මෘතදේහය පිරිසිදු කිරීමේ කටයුතු නිමවුන විටය. තමා කලින්ම මිලයට ගෙන තිබුන මිනීපෙට්ටියෙහි මෘතදේහය තැන්පත් කිරීමට කුඩම්මාට ත් පුත්‍රයාට ත් ලේලිට ත් ඔහු නියම කෙළේය.

ඔහු පෙට්ටියෙහි ඇණ ගැසීම් ආදී කටයුතුවලට නගරයෙන් කුලීකරුවන් කැඳෙව්වේය. චාරිත්‍රානුකූලව අවමංගලොත්සවය කිරීමට නැකතක් ද ඔහු විසින් සොයාගත යුතු වීය. නගරයේ නැකත් කරුවෙකු ඔහුට කිව්වේ ''තව තෙමසකින් එයට සුදුසු දිනයක් එළඹෙන බවය.''

ඉන්පසු නැකැත්කාරයාට ගාස්තුව ගෙවා නගරයේ දේවාලයට ඔහු ගියේ එහි භාරකාරයා සමග කථාකොට ඉදිරි තෙමස තුළ එහි මිනීපෙට්ටිය තැබීමට අවකාශයක් ලබා ගැනීම සඳහාය. භාරකාර යාගේ කැමැත්ත පරිදි භූමදාන කරන දිනය එළඹෙන තෙක් මිනී පෙට්ටිය එහි තැන්පත් කරනලදී. එසේ කරන ලද්දේ තම ගෙදර තබා ගෙන, පෙට්ටිය දෙස බලා සිටීමට හැකියාවක් වං ලුං තුළ නොපැවති හෙයිනි.

Scanned by CamScanner

වං ලූං මියගිය තැනැත්තිය වෙනුවෙන් කළයුතු සියල්ලම සිදු කිරීමට මහත් උනන්දුවක් දැක්වූයේ ය. එබැවින් ඔහු තමාටත් දරුවන්ටත් අවමඟුල් ඇඳුම් පිළියෙළ කෙරෙව්වේය. ඔවුන්ගේ පා වහන් පිළියෙළ වුනේ රළු සුදු රෙදි වලිනි. ශෝකයේ වර්ණය හැටියට ඔවුන් භාවිත කෙළේ සුදු පාටයි. සෑම කෙනෙක්ම වළලු කරෙහි සුදු රෙදි පටියක් බැඳගත්හ. ගදර ගැහැණු සවකීය කෙස්වැටි සුදු නූලකින් බැඳගත්හ.

මින්පසු ඕලෑං මළගිය කාමරයෙහි වං ලූං නොනිදගත්තේය. එහෙයින් ඔහු සවකීය බඩු බාහිරාදිය ද රැගෙන සපීරලෙසම පද්මා ගේ කාමරයට ගියේය. පද්මාගේ කාමරයෙහි පදිංචිවුන වං ලූං පුත්‍රයාට අමතා මෙසේ කීවේය:-

"උඹේ බිරියත් සමග උඹේ මව සිටිය කාමරයට පලයන්. ඈ උඹ වැදූවෙත් හැදූවෙත් ඒ කාමරයේම තමයි. උඹත් එහිදීම උඹේ දරුවන් හද ගනින්!"

ඔහුගේ වචනය මුදුනින් පිළිගත් නව යුවළ මව මළගිය කාමරයේ පදිංචියට ගියහ. ඔව්හු එයින් සතුටට පත්වූහ.

මරණය යම් තැනකට කෙසේ හෝ පැමිණියොත්, පහසුවෙන් එතැන අත හැර නොයන බවක් පෙනුණි.

ඕලෑංගේ මළ සිරුර මිනීපෙට්ටියෙහි බහාලන දිනයෙහි පටන් සිහි විකල් වී ගිය වං ලූං ගේ පියා දිනක් නිද ගැණීම පිණිස සවකීය ඇඳෙහි වැතිර ගත්තේය. පසු දින උදයෙහි තේ ගෙන ගිය වං ලූං ගේ දෙවෙනි දියණිය දුටුවේ තුනී රැවුල අහසට යොමුවූන දර ලීයක් මෙන් ඇතිව ඇඳෙහි වැතිරී තිබුන මහල්ලාගේ මළ සිරුර ය. ඇය මේ දර්ශණය දැක බිය වී කෑගාගෙන පියාවෙත දිව්වාය. මහල්ලාගේ වියලි සිරුර සීතල වී තිබුනි. එයින් පළවුනෝ පැය ගණනකට පෙර ඔහු මියගිය බවකි.

වං ලූං සවකීය පියාගේ මළ සිරුර නහවා පිරිසිදු කොට මිලයට ගෙන තිබුන අනිත් මිනී පෙට්ටියෙහි මහත් ගෞරවයෙන් තැන්පත් කොට ඇණ ගසා මෙසේ කීවේය:-

"දැන් ඉතින් මේ මළ සිරුරු දෙකම එක තැන වළලන්න අර කන්දෙ පිහිටි ඉඩමෙන් කොටසක් තෝරගන්න ඕන. මා මැරුණමත් එතනයි වළලන්න ඕන."

වං ලූං සිතාගත් සෑම දෙයක්ම එසේ ඉටු කෙළේය. ඔහු වෛද්‍යයාගේ මිනීපෙට්ටියට ඇණ ගැසූ පසු භූමදාන දිනය එළඹෙන තෙක් තැන්පත් කෙළේ මැද කාමරයෙහි තැබූ බංකු දෙකක් මතය. මේ මෘතදේහය මැද කාමරයේම තැන්පත් කෙළේ මරණයෙන් පසුත් මෘතදේහය මෙහි තැන්පත් කිරීම පියාට හිතවත් වේයයි වං ලූං සිතූ නිසාය. මහල්ලා එතරම්ම මේ ගෙයට ආසා කෙළේය. පියාගේ මරණයෙන් වං ලූං ට එතරම් ශෝකයක් හට නොගත්තේ ඔහු මහළු වී මිය ගිය නිසාත් කලක් ඔත්පලව සිටි නිසාත් ය.

භූමදානය සඳහා නැකැත්කරුවා නියම කළ දිනය එළඹුනේ වසන්ත සමයකය. වං ලූං භූමදානයේ ආගමික කටයුතු කිරීමට දේවාලයෙහි පූජකවරුන් ද පන්සලෙහි භික්ෂූන් ද කැඳවන ලදී. පූජකවරු කාසාය වස්ත්‍ර හැඳගෙන කෙස් වැටි හිස් මුදුනෙහි බැඳගෙන එහි පැමිණියහ. භික්ෂූහු ඉඳිපන්දම් ගැසීමෙන් පිළිස්සුන ඉද්ධවූ කැලැල් පෙනෙන ලෙස හිස මුඩු කරගෙන දුඹුරු පාට ලෝගු හැඳගෙන එහි පැමිණ බෙර වයමින් මුළු රැයෙහිම මළගිය දෙදෙනා වෙනුවෙන් පිරිත් සජ්ඣායනා කළහ – මන්ත්‍ර ජප කළහ. ඔවුන් මේ මන්ත්‍ර ජපකිරීම නතර කළපසු වං ලූං ඔවුන්ගේ අත්වලට රිදී කාසි හැලුවේය. එවිට ඔව්හු නැවතත් හුස්ම අල්ලා එලිවන තෙක් ජප කළහ.

වං ලූං මිනීවලවල් හෑරීමට තෝරාගත්තේ කඳු ගැටයක් මත ඉඳි ගසක් යට බිමකි. ඒ එහි වලවල් හාරවා එය වටා මැටි ප්‍රාකාරයක් ද ගොඩනැංවූයේ ය. මේ පවුර ඇතුළත වං ලූං පවුලෙහි සියල්ලන්ගේම මෘත ශරීර භූමදාන කිරීමට තරම් ඉඩකඩ තිබුණේය. සරුසාර ලෙස තිරිඟු වැවෙන මේ සාර භූමියෙහි මැරුණ පසු ද තම තමන්ගේ සිරුරු තැන්පත්වනු දැකීම මරණයේ වියෝගයෙන් ඇති වන චිත්තපීඩාව නැතිවී යාමට තරම් ප්‍රබල හේතුවක් කරගත්තේ වං ලූං ය. තම පවුල මේ නිසා නිත්‍ය වශයෙන්ම සාර භූමියට අයත් වන හෙයිනි.

ඕලෑංගේ හා මහල්ලාගේ මළගමෙහි අවසාන රාත්‍රිය භික්ෂූන්ගේ සජ්ඣායනා සමග කෙළවර වූනේය. භූමදානයේ නියමිත දිනය එළඹුන බැවින් වං ලූං සුදු අමුරෙද්දක් ඇඳගත්තේය. ඔහු විසින් සපයන ලද එබඳුම වස්ත්‍රවලින් ගෘහවාසී සෙස්සෝ ද සැරසුනහ. තමා ධනවතෙකු නිසා සොහොන්පල දක්වා ගෙනවිත්

පයින් ගමන් කිරීම නුසුදුසු යයි වං ලුං සැලකුවේය. එහෙයින් ඔහු නගරයෙන් දෝලා ගෙන්වා ගත්තේය. ඉන්පසු වං ලුං, ඕ ලෑං ගේ මිනීපෙට්ටියට පසුපසින්, මිනිසුන්ගේ කරපිටින් – දෝලාවෙන් පෙරටුව ගමන් ගත්තේය. පියාගේ පෙට්ටියට පසුපසින් පෙරටුව දෝලාවක නැගී ගමන්කෙළේ වං ලුං ගේ බාප්පාය. ඕ ලෑං ජීවත්ව සිටි කාලයේ ඇය හා හොඳහිතක් නොදක්වුවත් අසල් වැසියන්ගේ අපවාදයෙන් බේරෙන්නට මෙන් පද්මා ද දෝලාවක නැගී ගමන් කළාය. දෝලාවල නැග ගමන් කළ අය අතර වං ලුං ගේ වැඩිමහළු දියණිය වන ''පුංචි මෝඩිය'' ද වූවාය. ගෘහවාසියෙකු විසින් දෝලාවක තැබූ පසු ඇය වැලපීමට සුදුසු මේ අවස්ථාවෙහි විශ්මයට පත්ව සිනා සුනාය. සෙස්සෝ මහ හඩින් වැලපෙමින් සොහොන් බිම කරා ගමන් ගත්හ. චිං ඇතුළු කුලීකරුවෝ සුදු පා වහන් පැළඳ නිහඬව ඔවුන්ට පසු පසින් ගමන් කළහ.

අවමඟුල් පෙරහැර සොහොන් බිමට ළඟාවී වං ලුං දෝලාවෙන් බිමට බැස මිනීවලවල් දෙක පසෙකින් සිටියේ මෘතදේහ එහි තැන්පත් කරනතෙක්ය. සෙස්සන් මෙන් ඔහු නොහැඬුවේය. සිදුවිය යුතු දෙයක් සිදුවූයේයයි සැලකූ ඔහුගේ හදවත සිතිවිලි වලින් බරවිය. මිනීපෙට්ටි දෙක වලවල් දෙකෙහි තැන්පත් කළ පසු ඒවාට උඩින් පස්දැමීමට ඔහු ද සහභාගි වුනේය. ඔව්හු පස් දමා වලවල් දෙක මට්ටම් කළහ. වං ලුං දෝලා ආපසු නගරයට යවා නිශ්ශබ්දව පයින්ම ගෙදර බලා පා නැගුවේය. මෙසේ ගමන් කරත්ම සොවින් බරවූ හදවත තුළින් එක්තරා ශෝකාත්මක සිතිවිල්ලක් ඔහු තුළ තදින් ම පැන නැගුනි.

එද ඕ ලෑං තමාගේ රෙදි සෝදමින් පොකුණ ළඟ සිටි දිනයෙහි ඇගෙන් ඒ මුතු ඇට ඉල්වා නොගත්තා නම් හොඳයයි ඔහුට සිතුනි. පද්මා එය දෙකනෙහි පැළඳ සිටිනු දැකීම පීඩාදායක යයි සැලකූ ඔහු තවදුරටත් මෙසේ කල්පනා කරමින් ගමන් කෙළේය.

''දැන් මගේ ඒ ඉඩමෙ වළලා තියෙනව මගේ ජීවිතයේ හොඳම දෙකෙන් පංගුව. මට දැනෙන්නෙ මගෙනුත් බාගයක් එහි තැන්පත් කළා වගෙයි. අනේ ඉතින් මගේ ගෙදර ජීවිතය අද පටන් අමුතු එකක් වේවි!''

මෙසේ සිත සිතා ඔහු වැලපුනේය. දෙනෙතින් කඩා හැලුන උණු කඳුළු කැට, පොඩි දරුවෙකු මෙන් ඉකි ගසමින් අතින් පිසදමා ගත්තේය.

Scanned by CamScanner

ප්‍රීතිය ලුහුබඳවා ගිය ශෝකයෙනුත් මංගලය ලුහුබඳවා ගිය අව මගුලෙනුත් පීඩාවට පත් වං ලුං ට ගොවිතැන් ගැන හෝ ඉඩකඩම් ගැන යෙදෙන්නට හුභ කලකින් අවස්ථාවක් නොලැබුන බැවින් දිනක් වීං, වං ලුං වෙත පැමිණ මෙසේ කීවේය.

''දැන් මගුල් අවමගුල් ඉවර නිසා ඉඩකඩම් ගැන මතක් කරන්න කාරණයක් තියනව.''

''හොඳයි හොඳයි කියාපන්. මේ දවස්වල මළවුන් වළලෑමට වඩා කාලයක් මට තිබුනෙ නැහැ.''

වං ලුං ට දැක්වූ සැලකිල්ල නිසා වීං සවල්ප වේලාවක් නිශ්ශබ්දව සිට යලිත් සිහින් හඬින් කථා කෙළේය.

''දෙවියන්ගෙ පිහිටෙන්වත් ඒක නවතින්න ඕන. වෙන කිසිම අවුරුද්දක නැති තරම් ගංවතුරක් ගලන්න වගෙයි සූදනම්-වෙන්නෙ. දැනටමත් කුඹුරු කීපයක් වතුරෙන් යටවෙල.''

''මොන දෙවියෙක්ද? ඔය දෙවියන්ගෙන් කවදක්කත් මට නම් පිහිටක් ලැබුනෙ නැහැ. කොච්චර පුද පූජා පැවැත්තුවත් ඔය දෙවියො ඔහොම තමයි. දෙවියන්ගෙන් කාරියක් නැහැ. අපි යමු කුඹුරු බලන්න.''

වීං බියගුලු මිනිසෙකි. ඔහු දෙවියන්ට විරුද්ධව කථා කිරීමට වං ලුං මෙන් අසමත් වූයේය. වැස්ස ද, නියඟ ද, ගංවතුර ද දෙවියන්ගේ කැමැත්තෙන් සිදුවෙතියි වීං සිතුවේය. දෙවියන්ගේ බලයට වඩා සවකීය ශ්‍රම ශක්තියේ බලය කෙරෙහි විස්වාසය තැබූ වං ලුං, වීං සමග ගොස් කුඹුරු පරීක්ෂාකර බැලුවේය. දිය අගල

Scanned by CamScanner

හා ඇල අසල ඔහුගේ කුඹුරු ජලයෙන් යටවී තිබුන නිසා වැඩීගෙන ආ තිරිඟු පැල තැම්බී තිබුනි. ජලයෙන් පිරී තිබුන දිය අගලෙහි හා ඇලෙහි තැන තැන දියසුළි නැගෙමින් තිබුනි. එතෙක් ගිම්හානයේ වර්ෂාව නොපැමිණි නිසා මේ අවුරුද්දේ මහා ජල ගැල්මක් කවුරුත් බලාපොරොත්තු වූහ.

වං ලුං ස්වකීය කුඹුරුවල එහා මෙහා ඇවිදිමින් සොයා බලද්දී චිං ඔහු පසු පස සෙවනැල්ලක් මෙන් ගමන් ගත්තේය. අතාතුරුව ඔවුන් දෙදෙනා කවර කුඹුරක පැල සිටවිය යුතුද කවර කුඹුරක් පැල සිට වන්නට පෙර ජලයෙන් යටවේද යනා ආදිය ගැනද සාකච්ඡා කළහ. මුව විට දක්වා ජලයෙන් පිරුණ ඇලවල් දුටු වං ලුං ශාප කරමින් ''මේ දෙවලොව ඉන්න අය බිම බලල මිනිසුන් ගිලින හැටි! මිනිසුන් හාමතෙන් සිටිනු දැකීම ඔය දෙවියන්ට ප්‍රීතියක්'' යයි කීවෙය. වං ලුං ගේ මේ කථාවෙන් චිංගේ ගත වෙව්ලා ගියේය.

''ඒ උනාට දෙවියන් අපට වඩා බලවත් නිසා එහෙම කියන එක හොඳ නැහැ''යි චිං කියද්දී ධනවත් කම නිසා අහංකාරයට පත් වං ලුං එය ගණනකටවත් නොගෙන කොඳුර කොඳුරා ස්වකීය ගෘහය බලා ගමන් ගත්තේය. තමාගේ කුඹුරු වල ගොයම් පැල යටකරමින් ගලාගිය ජලය දුටු ඔහු නව දුරටත් කල්පනා කෙළේය.

වං ලුං සිතූ සියල්ලම සිදුවුනේය. උතුරෙහි ගංගාවක් බැමි කඩාගෙන ගලන්නට වුනේය. වේලි කඩා බිඳගෙන ගංගා ජලය ගලන්නට වූ විට මිනිස්සු එහා මෙහා දුවමින් ඒවා ප්‍රකෘතිමත් කිරීමට මුදල් එකතු කළහ. සෑම කෙනෙක්ම තම තමන්ට හැකි පමණ එයට ආධාර කළහ. මෙසේ එකතු කළ මුදල ඔවුන් තැන්පත් කෙළේ පළාතේ නඩුකාර මහතා වෙතය. මේ නඩුකාර මහතා මේ පදවියට පත්වූයේ ළඟදීය. ඔහු දුප්පත් පවුලක උපත ලැබූ කෙනෙකු බැවින් ඒ මිනිසුන් තමාවෙත තැබූ මුදල තරම් මුදලක් ඔහු කිසි කලෙකත් නොදැක තිබුනි. ඔහු ද නඩුකාර පදවියට පත්-වුනේ ස්වකීය පියාගේ මාර්ගයෙනි. ඔහුගේ පියා විශාල මුදලක් එකතුකොට මේ තනතුර පුතාට අරන් දුන්නේ පදවියෙන් ලැබෙන ලොකු ලොකු වාසි බලාගෙනය. ගමේ මිනිසුන්ට තමන් වෙත තැන්පත් කළ මුදලින් කැඩී බිඳී ගිය වේලි ප්‍රකෘතිමත් නොකළ හැකි වුනේ ඒ නිසාය.

Scanned by CamScanner

තවත් වේල්ලක් ගංවතුරෙන් කැඩීගිය පසු ''අර මුදල තැන්-පත් කළ මිනිස්සු'' කෑ කෝ ගසමින් නඩුකාර බංගලාව වෙත දිවූහ. රිදී කාසි තුන්දහක් පමණ ඒ මුදල තමාට වියදම් වුන නිසා මිනිසුන් කෝලාහල කිරීමට එන විට, නඩුකාර මහතා සැඟවුනේය.

කෑකෝ ගසමින් නඩුකාර බංගලාවට පැමිණි මිනිස්සු අරමුදල නැති කිරීමේ වන්දියට ස්වකීය ජීවිතය පූජාකරණ ලෙස ඉල්ලූහ. ඔවුන්ගෙන් පැන ගිය නඩුකාරයා ගංවතුරට පැන ගිලී මළේය. එයින් ජනතාවෝ සෑහීමට පත්වූහ.

උතුරෙහි ගංගාව තව තවත් උතුරා ගියේ මුළු ප්‍රදේශයම මහ මුහුදක් බවට පත්කරමිනි. මේ ගංවතුරට යට නොවුන එකද කුඹුරක් හෝ ගොවිපොලක් නොවීය. වේලි තිබුන තැනවත් සොයා ගන්නට නොහැකිව සේදීගිය කුඹුරුවල තිරිඟු පැල හා ගොයම් පැල මුහුදු පත්ලටම ගසාගෙණ ගියේය.

මේ මහා ජලගැල්ම නිසා සෑම ගම්මානයක්ම දූපත් බවට පත්වුනේය. ජලගැල්ම නැග නැග එන අයුරු දූපත් බවට පත්වුන ගම්මානවල ඉඳගෙන ගැමියෝ බලා සිටියහ. ගංවතුර ස්වකීය ගෙවලට අඩි දෙකක් හෝ තුනක් තරම් පැමිණි විට ගැමියෝ තමන්ගේ මේස හා ඇඳන් ද එකට බැඳ එහි දෙර ලෑලි දමා පහුරු සාදගත්හ. ඔව්හු මේ පහුරුවලට අවශ්‍ය ගෘහ භාණ්ඩ ද දමා ගැහැණුන් ද දරුවන් ද නංවා ගත්හ. මැටි ගැසූ ගෙවලට ගංවතුර වැටෙන්නට වූ විට එහි බිත්ති දිය වී ඇද වැටුනේ පෙර එම ගෙවල් තිබුන තැන්වත් බලාගන්නට නොහැකිවන පරිදිය. ඉන්පසු දිනපතාම ධාරානිපාතයෙන් වැස්සේය.

වං ලුං ස්වකීය ගෘහයෙහි දෙරකඩ ළඟ හිඳගෙන ජලගැල්ම නැරඹුවේය. උස්වූ පළල් කඳු ගැටයක ඔහුගේ ගෘහය පිහිටා තිබුන හෙයින් එතෙක් ගං වතුර පැවතුනේ ගෙයට ඈතින්ය. ස්වකීය ඉඩම් ගංවතුරෙන් යටවෙනු දුටු ඔහු බියවූයේ අළුත් මිනී වළවල් ද වතුරට යටවේදෝ යන සැකයෙනි. එහෙත් එය එසේ නොවීය. මඩපාට ගංවතුර ඒ කඳු ගැටය අවට පෙන සහිතව සිසාරමින් පැවතුනා පමණකි.

ඒ අවුරුද්දේ කොයිම වර්ගයක අස්වැන්නක්වත් නොවීය. සෑම මිනිසෙක්ම බඩගින්නෙන් කාලය ගත කළේය. සමහර කෙනෙක්

තවත් වරක් සාගතයකට ගොදුරු වීම ගැන කෝපයට පත්වූහ. සමහරු දකුණ බලා ගියහ. සමහරු රටේ ඒ ඒ තැන්වල පැතිරී සිටි සොරමුල් වලට එකතු වූහ. මේ අය වරින් වර නගරය පවා කොල්ල කෑමට තැත්කළහ. මේ කාලය තුළ නාගරිකයෝ දෙරටු වසාගෙන සෙවිල්ලෙන් කාලය ගත කළහ.

විවෘත කොට තිබුන නගරයේ බටහිර දෙරටුවද යුද්ධ භටයන් විසින් මුර කරණ ලදී. එයද යන්තම් ඇඳිරි වැටුන පසු වසාදමන ලදී. ගතවූ සාගත කාලයෙහි මෙන් දකුණට ගොස් සිහා කෑමෙහි යෙදුන අය ද තණකොළ අනුභව කරමින් ජීවත් වූ අය ද කුසගින්න ඉවසාගත නොහැකිව මැරුණ අය ද ජලයෙහි වැටී මරුමුවට පත්වූ අය ද සුලබ වූහ.

කිසි දිනකත් මේ පොළොවෙහි නොපැතුරුණ අන්දමේ සාගතයක් පැතිරී තිබෙන බව වං ලුං ට වැටහුනේය. ශීත ඍතුවට තිරිඟු පැල සිටුවීමට කල්වේලා ඇතිව වතුර බැස නොයන බවත් ලබන අවුරුද්ද තුළ ද අස්වැන්නක් නොලැබෙන බවත් ඔහුට දැනුනේය.

ඔහු ගෙදර වියහියදම් ගැන කල්පනා කාරීවූයේ එහෙයිනි. දිනපතා නගරයේ සිට මස් ගෙන ඊම ගැන ඔහු කෝකිලා සමග කෝලාහල කරන්ට වූයේ බොහෝ කලක පටන්ය. නගරයටත් වං ලුං මැදුරටත් අතර ඇති ප්‍රදේශය ජලයෙන් යටවීම නිසා වං ලුං සතුටු වූනේ මස්ගෙන ඊම ඉබේටම නතරවන හෙයිනි. ඔරු ගමනා ගමනය කෙළේද වං ලුං ගේ අණ ලැබුන විට පමණකි. ඔරු භාරව සිටි වීං ද අවනත වූනේ කටසැර කෝකිලාට නොව අරපරෙස්සමින් වියදම් කිරීමට ඉටාගත් වං ලුං ටය.

සීත කාලය පැමිණියේය. මේ කාලය තුළ කිසිවක් විකිණීමට හෝ කිසිවක් මිලට ගැනීමට වං ලුං ඉඩ නොදුන්නේය. ගෙයි තිබුන සියල්ලක්ම පරෙස්සමෙන් පාවිච්චි කෙළේය. සෑම දිනකම වං ලුං ගෙන් ලේලියට ලැබුනේ දවසට වුවමනා කරණ ප්‍රමාණය පමණකි. කම්කරුවන්ට අවශ්‍ය දේ බෙදා දීමට භාරකෙළේ වීං ටය. කම්මැලිව කාලය ගත කරන්නවුන්ට ඔහු කෑම දුන්නේ මහත් වේදනාවකිනි. ශීත ඍතුවෙහි දිය මිදෙන්නට පැමිණි විට ඔහු සෑම කම්කරුවන්ට අණකෙළේ වසන්ත කාලයේ නැවතත් කම්මාගේ වැඩට පැමිණෙන තුරු දකුණට හෝ ගොස් සිහා කා

ජීවත්වන ලෙසය. ඔහු පද්මාට පමණක් රහසිගතව හොඳ හොඳ ආහාර වර්ග ලබාදුන්නේය. අවුරුදු දිනයෙහි පවා ඔහු කෑමට සපයා ගත්තේ විලකින් තමන්ම අල්වාගත් මාලුවෙකුත් ගොවිපලකින් මරා ගත් ඌරෙකුත් පමණකි.

තමා දුප්පතෙකැයි පෙන්වීම වං ලුං ට අවශ්‍ය වූ නමුත් ඇත්ත වසයෙන් ඔහු දුප්පතෙක් නොවීය.

ඔහු රිදී කාසි සඟවා තිබුනේ පුතාත් ලේලියත් නිදගත් කාමරයේය. එහෙත් ඔවුහු එය නොදත්හ. ඔහු රත්රන් භාජනයක් සඟවා තිබුනේ අසළ වූ විලකය. ඔහු තවත් කාසි කොටසක් සඟවා තබා තිබුනේ උණ පඳුර යට ය. පසුගිය අවුරුද්දේ අස්වැන්නෙන් කොටසක් ද ඔහු ඉතිරි කරගෙන තිබුනි. එබැවින් ඔහු සාගතයේ අනතුරු වලින් නිදහස් වීය.

එහෙත් සෑම පෙදෙසකම ජනතාවෝ සාගතයෙන් පීඩිත වූහ. වං ලුං ට වරක් තමා මහගෙදර දොරටුව පසුකර යද්දී එතැනදී ඇසුන හාමත් වූවන්ගේ හඬ සිහියට නැගුනේය. තමාටත් තම පවුලේ අයටත් සෑහෙන තරම් ආහාර තිබෙන බැවින් සෙස්සන් ද්වේෂ කරන බව වං ලුං ට වැටහුනේය. නාඳුනන අයගේ පැමිණීම වැළැක්වීමට ඔහු ගේට්ටු වසා තැබුවේ එහෙයිනි.

සොරුන් හා අයුතු ක්‍රියාවලින් ගහණ මේ කාලයේ බාප්පා තමා හා සමගිව සිටීමත් ඔහු බලයෙන් පිරිහී සිටීමත් වං ලුං ගේ සිතට අස්වැසිල්ලකි. අරපරිස්සම ගැන මෙන්ම ගෙදර සාමය ගැන ද වං ලුං සැලකිලිමත් වූයේය. බාප්පාටත් බාප්පාගේ බිරියටත් බාප්පාගේ පුතාටත් ඔහු ආචාරශීලී වූයේ. එහෙයිනි.

බාප්පා හා ඔහුගේ බිරියත් මෙහිදී සංග්‍රහ ලැබුවේ අමුත්තන් දෙදෙනෙකු මෙන්ය. තේ පානය කරණ අවස්ථාවලදී ගෙදර කාටත් වඩා පළමුව ඔවුන්ට තේ ලැබුනේය. කෑම වේලාවලදී ද ඔවුන් දෙදෙනාගේ බඳුන් සෙස්සන්ගේ බඳුන්වලට පළමුව ආහාරයෙන් පිරුනේය.

වං ලුං තමන්ට බිය බව මේ තිදෙනා දැනගත්හ. එහෙයින් උඩඟු බවට පත් ඔව්හු නොයෙක් දෑ වං ලුං ගෙන් ඉල්ලූහ. කන බොන දෑ ගැන මැසිවිලි ද කීහ. මේ මැසිවිලි කීම ඔහු රුචි නොකෙළේය. දිනක් වං ලුං දොරටුව අසළ සිටින විට ඒකීය පුත්‍රයා විසින් මැසිවිලි කීමට බාප්පා පොළඹවන බව ඔහුට මෙසේ ඇසුනේය.

Scanned by CamScanner

"හොඳයි එයාට සල්ලිත් කැමත් තියෙනව. අපි එයාගෙන් සල්ලි ඉල්ලමු."

අනතුරුව බාප්පාගේ බිරිය ද මෙසේ කීවාය.

"අපට මේ වගේ අවස්ථාවක් නම් නැවත ලැබෙන්නෙ නැහැ. එයා දන්නවා උඹ එයාගෙ බාප්ප නිසා නොවෙනම් එයාගෙ ගේ මෙලහකටත් රතු රැවුල් කාරයො ඇවිත් කොල්ලකාල ඉවර බව."

රහසිගතව කළ මේ සාකච්ඡාවට සවන් දුන් වං ලුං ට ඇති වූයේ කෝපයකි. ස්වකීය හෘදයවස්තුව පුපුරන්නට තරම් වේගයක් ඇතිවුන නමුත් මහත් ආයාසයෙන් ඉවසුවේය. මේ තිදෙනාට කුමක් කළයුතු දැයි කල්පනා කළ ඔහුට කිසිවක් තීරණය කරගත හැකි නොවීය. ඊළඟ දිනයෙහි බාප්පා මෙසේ කියමින් වං ලුං වෙත ආවේය.

"අනේ පුතා මට පයිප්පයක් ගන්න සල්ලි ටිකක් දියන්! දුම්කල ටිකකුත් ඕන කරල තියෙනව. මගේ ගෑණිත් දූන් අඳින්නෙ වැරහැලි. ඇට අළුත් කබායකුත් ඕන කරනව."

වං ලුං ට කිසිවක් කියාගත හැකි නොවීය. ඔහු තම පටියෙහි තිබී රිදී කාසි පහක් බාප්පාට දුන්නේ රහසින් දත්මිටි කමිනි. මුදල් නොතිබුන දිනවල පවා එකම දවසක්වත් තම බාප්පාට මෙසේ අකමැත්තෙන් මුදල් දුන් අවස්ථාවක් නොවීය.

දෙදිනක් ගතවන්නට පෙර බාප්පා යළිත් පැමිණ මුදල් ඉල්ලූ විට වං ලුං—

"මොකෝ අපි සේරම බඩගින්නෙ මරන්නද හදන්නෙ"යයි මහ හඬින් ඇසුවේය.

බාප්පා සිනා සී නොසැලකිල්ලෙන් මෙන් කථා කෙළේය. "උඹ වගේ කෙනෙක් ඔහොම කථාකරණ එක වැරදියි. උඹට වඩා පොහොසත් කමින් අඩු අය තම තමුන්ගෙ ගෙවල පරාලවල එල්ලෙනව මම දැකල තියෙනව."

මෙය ඇසුන විට වං ලුං ගේ සිරුරෙන් දහඩිය වැටුනේය. වචනයකුදු කථා නොකොට බාප්පාට මුදල් දුන්නේය. ගෙදර සෙස්සන් මස් අනුභව නොකළත් බාප්පාගේ පුත්‍රයාත් බාප්පාගේ බිරියත් මස් අනුභව කළහ. වං ලුං දුම් බිව්වෙ නැතත් බාප්පා දුම් පයිප්පය නොකඩවා ඉරුවේය.

අළුත විවාහවූන වං ලුං ගේ වැඩිමහළු පුතාට සවකීය ගෘහයෙහි මෙතෙක් සිදුවුන කිසිම දෙයක් ගැන සෙවීමට අවස්ථාවක් නොවීය. ඔහු සෑම විටම සැලකිල්ලෙන් සිටියේ බාප්පාගේ පුතාගේ ගිජු ඇසින් සිය බිරිය රැක ගැණීමටය. වං ලුං ගේ වැඩිමහළු පුතාට සවකීය ඥතියා දුන් පෙනෙන්නේ සතුරෙකු මෙන්ය. ඔහු සිය බිරියට එළියට එන්ට ඉඩ සැලැස්සුවේ ද සන්ධ්‍යා කාලයේ පමණකි. එම අවස්ථාව ද ඇයට ලැබුනේ ''බාප්පාගේ පුතා සෑම සන්ධ්‍යාවකම ගෙදරින් බැහැර ගිය'' හෙයිනි. දහවල් කාලය ඇය ගත කෙළේ දෙරවල් වැසූ කාමරයකය.

බාප්පාගේ පවුලට මෙසේ තමන්ගේ ගෙදර කැමති ලෙස හැසිරෙන්නට ඉඩදීම ගැන වං ලුං ගේ වැඩිමහළු පුතා කෝපවීය. දිනක් ඔහු සවකීය පියාට මෙසේ කීවේය.

''ඔබේ පුතාටත් ඔබේ මුනුබුරන්ගේ මව වන මගේ බිරියටත් වඩා මේ කොටි තුන්දෙනාට ඔබ තව දුරටත් සලකනවනම් අපි අපේ ගෙය වෙන තැනක හදාගන්න ඕන.''

වං ලුං කෝපයට පත් පුතා සනසමින් මෙතෙක් කිසිවෙකුට නොකී අදහස් පළ කළේය.

''මේ තුන්දෙනා සමග තිබෙන කෝපය කියන්නට වචනත් නැහැ මට මොකද කරන්නෙ? මුං එක්ක විරුද්ධවෙලත් බැහැ මේ බාප්පයි කියන මිනිහ හොරමුලක නායකයෙක්. මේ කන්න දී දී සාත්තු කරන්නෙ හොරුන්ගෙන් ප්‍රවේශම් වෙලා ඉන්න ඕන නිසයි.''

වඩාත් කෝපයෙන් ඇවිස්සුනු වං ලුං ගේ පුතා දෙනෙත් විදහාගෙන මොහොතක් සිට මෙසේ කීවේය,

''අපි මුන් එක රැයක වතුරට තල්ලුකර දමමු. තාත්තයි මමයි විනුයි එකතු වුනාම මේ වැඩේ කරන්න බැරිකමක් නැහැ. හොඳයි මම බාප්පගෙ පුතා ගඟට තල්ලුකර දමන්නම්. මෙකගෙන් නම් බේරිල ඉන්න අමාරුයි. මට තිස්සේම වෙලා තියෙන්නෙ මගේ ගෑණි ආරක්ෂාකරන්නයි. ඒක, දවස තිස්සේම ඉන්නෙ මගේ ගෑණී දිහා බලාගෙනයි.''

''බැහැ ලමය, ඒ වැඩේ නම් කොහොමවත් කරන්න බැහැ. මගේ තාත්තගෙ සහෝදරය මට පුළුවන් ද ඔය විදියට මරන්න. එහෙම එකක් කරන්න පුළුවන් වුනත් කරන්න හොඳ නැහැ

ඒ මිනිහ මරාපු හැටියෙ අපට සිද්දවෙන්නෙ හොරුන්ට මුහුණ පාන්නයි.''

වං ලුං මෙසේ කී විට පුත්‍රයා නිශ්ශබ්ද වූනේය. යළි ඔවුන් දෙදෙනා කළයුතු දේ ගැන තදින් කල්පනා කළහ. පියාගේ කල්පනාව හරිබව අවසානයේදී පුත්‍රයාට ද වැටහුනේය. මිනීමැරීම තමන් වෙත කරදරය කැඳවන්නක් වන නිසා ඔහු ඊලඟට අදහස් කෙළේ වෙන ක්‍රමයක්ය. අනතුරුව වං ලුං පුත්‍රයාට මෙසේ කීවේය:–

''ඒ තුන්දෙනාට කිසිම අනතුරක් නොකර සිතිවිලි නැති අය මෙන්–ආසාව නැත්තවුන් මෙන් තියාගන්න ක්‍රමයක් තියෙනව නම් ඉතාම හොඳයි.''

ඉක්බිති වං ලුං ගේ පුත්‍රයා දෙතොල එකිනෙක ගටා මෙසේ කෑගැසුවේය:–

''හා! මම දන්නව ඕකට කරන්න ඕන දේ. අපි ඒගොල්–ලන්ට අබිං අරන් දෙමු. මම ආයිමත් බාප්පගෙ පුතාත් එක්ක යාළුවෙලා නගරයේ තේ පැන් හලට එක්කර ගෙන ගිහිල්ල උර උරා ඉන්න අබිං අරන් දෙන්නම්. එයාගෙ තාත්තටත් අම්මටත් අබිං ගෙනත් දෙන්න ඕන.''

''ඒකට හරි වියදමක් යාවි ලමයො! අබිං මැණික් වලටත් වඩා ගණන්'' යයි වං ලුං කීවේ පුතාගේ යෝජනාව සාර්ථක නොවෙතියි සිතූ නිසාය.

පියාගේ ප්‍රතික්ෂෙපයට පටහැණි වෙමින් පුත්‍රයා යළිත් කථා කෙළේය :–

''ඒ උනාට ඒගොල්ල මෙහේ තියාගෙන ඉන්න එක මැණික් මිලට ගන්නවටත් වඩා වියදම් වන එකක් බව තාත්ත දන්නෙ–නැද්ද? ඊටත් වඩා ඒගොල්ලන්ගෙ උඩගු කමත් ඒ ඉලන්දරිය මගේ ගෑණි දෙස බැලීමත් මට ඉවසන්න අමාරුයි.''

පුත්‍රයා කොතෙක් තර්ක කළද වං ලුං එයට කැමති නොවූයේය. පුත්‍රයාගේ යෝජනාව ක්‍රියාත්මක කිරීම පහසු වැඩක් නොවේ යයි ද එයට සල්ලි ගොඩක් වියදම් වේ යයි ද ඔහු සැලකුවේය. කරුණු මෙසේ හෙයින් මේ දිනවල සිදුවූ එක් සිද්ධියක් නිසා නොවේ නම් මේ අදහස කිසිසේත් ක්‍රියාත්මක නොවන්නට තිබුණි.

Scanned by CamScanner

කෙසේ හෝ දිනක් වං ලූං මැදුරෙහි මෙතෙක් පැවති පිළිවෙළ වෙනස් වීමට තරම් සිදුවීමක් ඇතිවූනේය. මේ සිදුවීම වං ලූං ගේ බාල දියණියත් බාප්පාගේ පුත්‍රයාත් පිළිබඳ වූවකි.

වං ලූං ගේ බාප්පාගේ පුතා සිය ගිජු නෙත් බාල දියණිය කෙරෙහි යොදන්නට මැතක සිට පුරුදුව සිටියේය. වං ලූං ගේ බාල දියණිය අතිශයින් රූමත් තරුණියකි. කුසුමක් මෙන් පැහැපත් කෝමල ඇයට මිටි නාසයක් ද රතු දෙතොලක් ද තිබුනි. ඇගේ පාද ද කුඩාය.

ඇය එක් රැයක තනියම මිදුලේ සිට කුස්සියට ගමන් කරමින් සිටිද්දී බාප්පාගේ පුතා ඇය තදින් අල්වා ගත්තේය. රළුලෙස අල්වා ඔහුගේ පපුවට තදකරගනු ලැබූ ඇය කෑගැසුවාය. වං ලූං දුවගෙන අවුත් ඔහුගේ හිසට තදින් පහර දුන්නේය. මස් කැබැල්ලක් සොරෙන් ඩැහැගත් බල්ලෙකුගේ ස්වභාවයක් පළ කළ ඒ තරුණයාගේ අතින් ඇය නිදහස නොලැබූවාය. එහෙයින් වං ලූං ට සිදුවූනේ තරුණයා වෙත කඩා පැන ඇය උදුරා ගැනීමටය. මෙසේ වං ලූං විසින් තරුණයාගේ ගොදුර උදුරාගත් විට තරුණයා වියරුවැටුනෙකු මෙන් ශබ්ද නගා සිනා සෙමින් මෙසේ කීවේය:–

''ඒ නිකම් සෙල්ලමට. මගේ සහෝදරීට ඒ විදියෙ අඩන් තේවටමක් මට කරන්න පුළුවන්ද?''

ඔහු කථාවෙන් කුහකත්වය පළ කළ ද ඔහුගේ දෑසෙහි අවංකව පිළිබිඹු වූනේ කාමුකත්වයේ සේයාවයි. වං ලූං කොඳුර කොඳුරා ඔහුගෙන් උදුරාගනු ලැබූ තරුණිය ඇයගේ කාමරයට පිටත්කෙළේය.

එදින රාත්‍රියේ සිදුවූ සියල්ලම තම පුත්‍රයාට වං ලූං කිව්වේය. එයට සවන් දුන් පුත්‍රයා මහත් බැරෑරුම් ස්වභාවයකට පත්ව මෙසේ කීවේය:–

''අපි නංගි ඇගේ මනාලයාගේ ගෙදරට පිටත් කරමු. ලී යූ නමැති වෙළෙන්ද මේ අවුරුද්ද විවාහ මංගල වලට හොඳ නැතෙයි කිව්වත් අපි ඇය එහාට පිටත් කරමු. මේ කොටිය මේ ගෙදර ඉඳිද්දී ඇගේ කන්‍යාභාවය ආරක්ෂා කරගන්න එක එතරම් පහසු වැඩක් නොවෙයි.''

වං ලූං පුත්‍රයාගේ යෝජනාවට එකඟවූනේය. එහෙයින් පසුදින වෙළෙන්දගේ ගෙදරට ගිය ඔහු ලී යූ නමැති වෙළෙන්ද සමඟ සාකච්ඡා කරමින් මෙසේ කීවේය:–

"මගේ බාල දුවට දැන් අවුරුදු දහතුනක් වෙනව. දැන් කසාද බැඳීමට වයසත් සම්පූර්ණයි."

"කිසිම ලාභයක් නැති අවුරුද්දක් මේක. මේ ගෙදර තව පවුලක් නවත්වා ගන්ට තරම් ශක්තිය මට මේ අවුරුද්දෙ නම් නැහැ"යි ලි යූ කීවේ මඳක් විස්කල් ගසමිනි.

තමාගේ ගෙදර කොටියෙකු වැනි තරුණයෙකු සිටින බව වං ලුං නොකියා මෙසමණක්ම කීවේය:-

"තරුණියගේ ආරක්ෂාව බාර ගන්නට මට පුළුවන් කමක් නැහැ. ඇගේ අම්මත් මැරිල, මේ ලස්සන තරුණියගෙ වයසත් හරි. මගේ ගෙදරත් කිසිම ඉඩ කඩක් නැහැ. ඇය පරිස්සම් කිරීමටම කාලය ගත කරන්නත් මට පුළුවන් කමක් නැහැ. ඇය ඔබේ පවුලට සම්බන්ධ වෙන්න ඉන්න නිසා මෙහේදීම ඇගේ කන්‍යාභාවය ආරක්ෂා වුනොත් හොඳයි. ඇයගේ කසාදය නම් ඔබට කැමති දවසක සිදුකලත් කමක් නැහැ."

"හොඳයි එහෙම නම් ඇය මෙහේ පිටත් කරන්න. මම පුතාලයි අම්මත් එක්ක කතාකරල බලන්නම්. ඇයට මෙහේ ඇවිල්ල ඇගේ නැන්දම්මත් සමග මේ ගෙදර ප්‍රවේසමින් ඉන්න පුළුවන්. ලබන අස්වැන්න පහුළනාම විවාහයත් සිදුකල හැකි"යයි කරුණාවන්තයෙක් වූ ධාන්‍ය වෙළෙන්ද පැවසීය.

අදහස ඉටුවුන බැවින් ප්‍රීතියට පත් වං ලුං, ලි යූ ට ආයුබෝවන් කියා ගමනාරම්භ කෙළේය. ඔරුවකුත් තබාගෙන නගරයේ පවුරු දොරටුව අසළ වූ ඇළ ලඟ නතර වී සිටි චිං වෙත ගමන් ගත් වං ලුං කඩයකට ඇතුළු වුනේ සිය පයිප්පයේ දැමීමට දුම්කොළයක් ගැණීම සඳහාය. වෙළඳ සේවකයා දුම්කොළයක් තරාදියේ දමා කිරන්නට සැරසෙත්ම ඔහු නොකමැත්තෙන්ම වෙළඳ සේවකයාගෙන් මෙසේ ඇසුවේය:-

"තමුසෙල ළඟ අබිං තියෙනව නම් ඒවයි මිල කොහොමද?"

"ඒව මේ දවස්වල ප්‍රසිද්ධියෙ විකුණන්න තහනම්. හොරෙන් තමයි විකුණන්න වෙලා තියෙන්නෙ. අවුන්සයක මිල රිදී කාසි එකයි."

වැඩිපුර කිසිවක් ඔහු කල්පනා නොකෙළේය.

"මට එයින් අවුන්ස හයක් ඕනෑ"යයි ඔහු වහා කීවේය.

Scanned by CamScanner



වං ලුං ගේ සිතෙන් සියළුම කරදර බැහැර වුනේ බාල දියණිය මනාලයාගේ ගෙදරට පිටත් කර හැරීමෙන් පසුවය. දිනක් ඔහු බාප්පා අමතා මෙසේ කිවේය:–

''මේ බාප්පෙ, මෙන්න වැඩිය හොඳ දුම්කොළ ජාතියක්.'' බාප්පා වං ලුං ගේ අතෙහි වූ අබිං හෙප්පුව දෙස ගිජුලෙස බැලුවේය. එහි පියන විවෘත කළ විට සුගන්ධවත් ඇලෙනසුලු, ඒ ද්‍රව්‍යය දෙස බලා බාප්පා ප්‍රීතියට පත්ව සිනාසුනෝය.

''හා! ඕව නම් මම ඉස්සරත් ටිකක් උරල තියෙනව. ඕව හරි ගණන්. ඔය ජාතිය උරන්න ඇත්නම් බොහොම හොඳයි.''

''මේ පොඩ්ඩ මම ගෙනාවෙ එක වාරයක් අපේ තාත්තට ඕන වෙලා. එක සන්දියක් උන්දූට නින්ද යන්නෙ නැතුව තිබුන. පස්සෙ මෙයින් ටිකක් දුන්නහම නිදිමත උනා. අදයි මේ ඉතුරු වෙච්ච ටික හම්බ වුණෙ. මට නම් මේකෙන් වැඩක් නැහැ. බාප්පටත් මේව ගුණ ඇති. ඇඟේ වරින්වර ඇතිවන වේදනාවල් නැති කර ගන්න මේක කදිම බෙහෙතක්.''

බාප්පා වං ලුං ගේ අතින් අබිං ටික පිළිගත්තේ මහත් කෑදර කමිනි. එහි සුවඳින් ඔහුගේ කෑදරකම වඩාත් ඇවිස්සුනෝය. ධනවත් පංතියේ අය පාවිච්චි කරණ අබිං ලැබීම ගැන ඔහු ආඩම්බරයට ද පත් වුනෝය.

දුම් පයිප්පයක් ද මිලයට ගත් බාප්පා මුළු දවස පුරාම ඇඳෙහි වැතිරී එය ඉරුවේය. ගෙදර සෑම තැනම වාගේ දුම් පයිප්පය ගෙනවුත් තබමින් තමා ද අබිං උරණ බව වං ලුං, බාප්පාට

Scanned by CamScanner

හැමෙහවෙ බාප්පාගේ අබිං ආසාව දෑඩි කරන්නටය. අබිං ගණන් වැඩියයි කියමින් සවකීය දරුවන් දෙදෙනාටත් පද්මාටත් අබිං පානය තහනම් කෙළේය. එහෙත් ඔහු බාප්පාත් බාප්පාගේ පුතාත් බාප්පාගේ බිරියත් අබිං වලට හැකිතාක් පෙළඹුවේය. ඔවුන් මෙසේ අබිං ඉරීම නිසා මුළු ගෙය ද මිදුල ද නිතර අබිං දුමෙන් සුවඳවත් වුනි.

ඔවුන් සඳහා අබින් වලට වියදම් වන විසාල මුදල ගැන වං ලුං එතරම් සැලකිල්ලක් නොදැක්වූයේ අවසානයේදී එයින් ඔහු ගෙදර සාමයක් බලාපොරොත්තු වූ හෙයිනි.

සීත සෘතුව ද අවසන් වූයේය. වතුර ද ඉඩම් වලින් බැස ගියේය. වං ලුං ට ද ඔහුගේ ඉඩකඩම්වල එහාමෙහා ඇවිදීමට හැකි විය. දිනක් ඔහුගේ වැඩිමල් පුතා පිටුපසින් අවුත් මෙසේ කීවේය:–

''හා! ළඟදීම ඔන්න තව කටක් එකතු වෙව්! ඒක තමයි ඔබෙ මුණුපුරෙකුගෙ කට.''

පුත්‍රයාගේ සාඩම්බර වචනයෙන් ප්‍රමුදිත වූ වං ලුං ආපසු හැරී සිනාසෙමින් දෙ අත්ල එකට මදිමින් ''හා! අද ඇත්තටම හොඳ දවසක්'' යයි කීවේය.

ඉක්බිති ඔහු විං ලවා හොඳ කෑම වර්ග නගරයෙන් ගෙන්වා ඒවා පුතාගේ බිරිය වෙත යවමින්,

''හොඳට කාල මගේ මුණුබුරාගෙ සරීරය ශක්තිමත් කරන ලෙස කියාපන්'' යයි නියම කෙළේය.

මේ සුභාරංචිය මුළු වසන්ත කාලයේම සිත සැනසීමට ඔහුට ප්‍රමාණවත් විය. මේ කාලය තුළ සිතට කරදරයක් ඇතිවුන සෑම විටම ඔහු සිත සනසා ගත්තේ අනාගත මුණුබුරා ගැන ආරංචිය සිහියට නගමිනි. ඒ සිතිවිල්ලෙන් ඔහු සෑම විටම ලැබුවේ සැපතකි.

වසන්තය ගෙවී ගියේය. ගිම්හානය එළඹුනේය. මේ අතර ජල ගැල්ම නිසා ගමෙන් බැහැරව සිටි මිනිස්සු පෙරළා පැමිණියහ. සමූහ වසයෙන් පැමිණි ඔව්හු ශීත සෘතුවෙන් විඩාවට පත්ව සිටියහ. එහෙත් ඔවුන් පෙරළා පැමිණියේ මහත් ප්‍රීතියෙනි. ඔවුන්ගේ ගෙවලින් ඉතුරුව තිබුනේ ගරා වැටුන බිත්ති පමණකි. එහෙත් ඔවුන්ට යලිත් සවකීය ගෙවල් සකස් කරගත හැකි විය.

Scanned by CamScanner

ඔවුන් වහළවල් සෙවිලි කර ගත්තේ පැදුරු වලිනි. ඔවුන් අතර මුදල් අගහිඟය ද බහුල වීය. බොහෝ දෙනෙක් මුදල් ඉල්වා ගැණීමට වං ලුං වෙත පැමිණියහ. ඔහු ද ණය දුන්නේ ඉහළ පොළියකටය. පොළිය පොඩ්ඩක්වත් ඔහු අඩු නොකෙළේ රටෙ පැවති මුදල් අගහිඟය නිසාය.

මුදල් දීමෙහි දී ඇප වසයෙන් තැබීමට ඔහු නියම කෙළේ ඉඩම්ය. මෙසේ අතමාරුවට ගත් මුදලින් මිනිස්සු ජල ගැල්ම බැස ගිය සාරවත් පොළොවෙහි යලිත් ගොවිතැන් කළහ. මිනිසුන් තමන්ට අවශ්‍ය හරකුන් ද බෝග වර්ග ද නගුල් ද වෙනත් උපකරණ ද සපයා ගැණීමට බොහෝ විට මුදල් ලබා ගත්තේ තමන් සතු ඉඩමෙන් බාගයක් විකුණමිනි. ඔවුන් වගා කෙළේ ඉතිරිවූ ඉඩම් කොටසෙහිය. මෙසේ විකුණනු ලැබූ ඉඩම් වලින් වැඩි කොටසක් ගත්තේ වං ලුං ය. ඒවා ද ඉතා අඩු මුදලට ඔහුට ගත හැකි වීය.

මේ අතර ඉඩම් විකිණීමට අකමැති අය ද වූහ. ඔවුන් තමන්ට අවශ්‍ය දෑ සපයා ගැණීමට මුදල් ලබා ගත්තේ සිය දූවරුන් විකිණීමෙනි. සමහරු වං ලුං ට ද දරුවන් විකිණීමට පැමිණියහ. එසේ පැමිණි අය වං ලුං ධනවතෙකු මෙන්ම කාරුණික හදවතක් ඇත්තෙකු ලෙසද සැලකූහ.

වං ලුං තමාට ලැබෙන්නට සිටින මුණුබුරා ගැනද අනික් දරුවන් විවාහවූවිට ඔවුන්ට ලැබෙන දරුවන් ගැනද සිතමින් දසියන් පස් දෙනෙකු මිලයට ගත්තේය. මේ දසියන් පස්දෙනා අතර දෙදෙනෙක් අවුරුදු පහළොවක තරම් වයස්වූ ශක්තිමත් දේහධාරිණියෝය. සෙසු දසියන් තිදෙනා වයසින් ද ශක්තියෙන් ද අඩු වූවෝය. මෙයින් එක දසියක යෙදවූයේ පද්මාගේ උපස්ථානයටය. කෝකිලා මහළුවී සිටි නිසාත් දෙවන දියණිය ගෙදර නොමැති නිසාත් එක් වරටම මේ දසියන් පස්දෙනා ඔහු විසින් මිලට ගනු ලැබුවේය. දසියන් පස් දෙනෙකුම එකවරට ගැණීමට ඔහුට තීරණ කළ හැකි වූයේ තමා එතරම් ධනවතෙකු වී සිටි නිසාය.

මේ දසියන් ගැණීමෙන් දින ගණනක්ම ගතවී – ගිය පසු එක්තරා මිනිහෙක් විකිණීම සඳහා හත් හැවිරිදි දූරියක වං ලුං වෙත ගෙණ ආවේය.

Scanned by CamScanner

වං ලුං ඇය මිලට ගැණිම ප්‍රතික්ෂෙප කෙළේ ඇය කුඩා නිසාත් දුබල නිසාත්ය. එහෙත් පද්මාට ඇය ගැන ආසාවක් ඇති වුනේය. පද්මා ඔහු වෙත ලංවෙමින් මෙසේ කීවාය:-

''අනේ මෙක හුඟක් ලස්සන නිසා මට අරන් දෙන්න. අර දූන් අරන් ඉන්න එකා හරි රළුයි, එළුවෙකු වගේ ගඳයි. මම ඒකිට නම් කැමති නැහැ.''

ඇයගේ මේ කීම අනුව වං ලුං යලිත් දූරිය දෙස බැලුවේය. ඇයගේ රූමත් බව ද අහිංසක බව ද ඔහුට පෙනුනේ ඉන් පසුවය. එහෙයින් ඔහු ඇයගේ ඉල්ලීමට මෙසේ ඉඩ දුන්නේය:-

''හොඳයි උඹට ඕන නම් ඒකා ගනින්!''

කෙසේ නමුත් ඔහු ඒ දූරිය රිදී කාසි විස්සක් ගෙවා මිලට ගත්තේ විශේෂයෙන් පද්මා සතුටු කරනු සඳහා ය. එතැන් පටන් පද්මාගේ කාමරයෙහි වාසය කළ ඒ දූරිය නිද ගත්තී පද්මාගේ ඇඳ පාමුලය.

මින්පසු ගෙදර සාමය ඇති වේ යයි වං ලුං බලාපොරොත්තු වූයේය. ගංවතුර බැස ගිය පසු ගිම්හානය උදාවුන පසු සවකීය ඉඩම්වල ධාන්‍ය වර්ග වැපිරීමට කාලය එළඹුනේය. වං ලුං එහා මෙහා ඇවිදිමින් සෑම ඉඩමක්ම සෑම කුඹුරක්ම පරීක්ෂා කර බලමින් චිං සමග සාකච්ඡා කෙළේ කුඹුරුවලට දමන පෝර ගැන හා කුඹුරුවල වපුරණ ධාන්‍ය වර්ග ගැනය. ඔහු කුඹුරුවල ඇවිදින සෑම විටකම බාල පුතා ද එක්කරගෙන ගියේ ගොවිතැන පිළිබඳ පුහුණුවක් ඔහුට ද ලබා දෙන අදහසිනි. එහෙත් මේ දරුවා තමන් ගේ සාකච්ඡා ගැන සැලකිල්ලක් දක්වනවාද නැද්ද යන්න වං ලුං සොයා නොබැලුවේය. මේ දරුවාද බරවූ හිසින් යුතුව ඔවුන් පසු පස ගමන් කෙළේය. සවකීය පුත්‍රයා තමන් පසු පස ගමන් කරණ බව පමණක් ඔහු දැන සිටියේය; වෙන දෙයක් ඔහු නොදත්තේය. එහෙත් වං ලුං පෙරළා ගෙදර ගියේ ඉතා සන්තෝෂයෙනි. එසේ ගෙදර යන ගමන් ඔහු තමාටම කියා ගත්තේ ''මම දූන් වයසක මිනිහෙක්. මම දූන් කුඹුරුවල වැඩ කරණ එක හොඳ නැහැ. මේ වැඩ කරන්න දූන් සේවකයොත් ඉන්නව; පුත්තුත් ඉන්නව. ගෙදර සාමයත් පවතිනව'' යන වචනයි.

Scanned by CamScanner

ගෙදර සාමය පිළිබඳව ඔහුගේ සිතිවිලි, සිහිනවලට දෙවෙනි නොවේ. එහි සාමයක් නොමැති බව ඔහුට පෙනුනේ ගෙදර ගිය විටය. ඔහු තම පුතාට බිරියක් ගෙනැවිත් දුන්නේ ගෙදර සාමය රැක ගැණීම සඳහාය. ඔහු බාප්පාටත් බාප්පාගේ බිරියට හා පුතාටත් අඹිං ගෙනැවිත් දුන්නේ එහි සාමය රැක ගැණීම සඳහාය. එහෙත් මේ එකකින්වත් සාමය-නොරැකුනේය. එයට හේතු වූයේ බාප්පාගේ පුතාත් සවකීය වැඩිමල් පුතාත් ය.

වං ලුං ගේ වැඩිමල් පුතාට ඔහුගේ ඥති සහෝදරයා ගැන ද්වේෂය හෝ සැකය කිසිවිටකත් සිතින් අස්කරගත හැකි නො විය. බාප්පාගේ පුත්‍රයාගේ දරුණු ක්‍රියා ඔහුට නිතර නිතර පෙනෙන්ට වුනි. දූන් දූන් වං ලුං ගේ පුත්‍රයා ද ගෙයින් පිටතට යන්නේ සවකීය ඥති සහෝදරයා ගෙදරින් බැහැර වූ විට පමණකි. ගෙදර වෙසෙන දසියන් සමගත් පද්මා සමගත් බාප්පාගේ පුත්‍රයා අයුතු සම්බන්ධතාවය ඇති කරගෙන ඇතැයි ඔහු සැක කෙළේය.

පද්මා පිළිබඳව ඔහු මෙසේ සැක කළ ද දූන් ඇය ක්‍රම යෙන් මහළු බවට පා තබමින් සිටි ගැහැණියකි. කෑම වර්ග හා වයින් ගැන ආසාව හැරෙන්නට වෙන වෙන දේවල් ගැන ආසාව ඇය අත්හැර දැමුවේ මෙයට බොහෝ කලකට පෙරය. ඇය ඔහු වෙත පැමිණියත් ඔහු ඇය දෙස නොබලන තත්වයකය ඇය මේ දවස්වල සිටියේ.

දිනක් බාල පුත්‍රයාත් කැටුව කුඹුරේ සිට පැමිණි පියා පසෙකට කැඳවා ගෙන ගොස් වැඩිමල් පුතා මෙසේ කීවේය:-

"අර කොටිය මේ ගෙදර ඉඳීම මට නම් කොහොමවත් රුස්සන්නෙ නැහැ. එයා තිස්සෙම ලජ්ජාව රැකෙන ලෙස ඇඳුම් තබා ගන්නෙත් නැතුව දසියන් දෙස නිතර නිතර එබිකම් කරනව."

ඔහුගේ සිතෙහි තිබුන අනිත් කරුණ ඔහු නොකීවේ හේතු කීපයක් නිසාය. පද්මා ගැන සැකය පියාට කිව්වොත් පෙර පද්මා පිළිබඳව තමාට තිබුන චෝදනාව යලිත් සිහියට නැගෙන බව ඔහු දත්තේය. මේ අවස්ථාව වන විට ඒ සිදුවීම ඔහු අතිශයින්ම පිළිකුල් කෙළේය. වයස් ගතවූ ඇය ගැන මෙබඳු චෝදනාවක් කොට එය සත්‍යයක් බවට පත්කර ගැණීම

Scanned by CamScanner

අමාරු දෙයක් හැටියට ද ඔහු සැලකුවේය. එහෙයින් දූසියන් පිළිබඳ චෝදනාවම බාප්පාගේ පුතාට ආරෝපනය කෙළේය.

කුඹුරු වලින් වතුර බැස යාම නිසාත් කුඹුරු හරහා හැමූ වියලි වාතය නිසාත් ඔහු තුළ ඇතිවුන ආත්ම විශ්වාසය හා ප්‍රීතිය පහව ගියේ පුත්‍රයාගේ මේ කථාව නිසාය. ස්වකීය ගෙදර ඇතිවූ මේ අළුත් කරදරවල තොරතුරු වලින් වං ලුං කෝපයට පත් වුනේය.

''මේව ගැන නිතර නිතර හිතන ඔබ මහ මෝඩ දරුවෙක්. උඹ උඹේ බිරියට ආදරය කරනව වැඩියි. ඒක එතරම් හොඳ දෙයක් නෙවි. තම දෙමව්පියන් විසින් තමන්ට පාවා දුන්න ගෑනි ගැන ලෝකයේ සෑම දෙයකටම වඩා ආදරේ කරණ එක හොඳ නැහැ''යි වං ලුං කීවේ උපහාසාත්මකවය. පියා තමා වෙත එල්ල කළ මේ උපහාසය ඔහුට තදින්ම වැදුනේය. ස්වභාවයෙන්ම වං ලුං ගේ පුතා ස්වකීය හැසිරීම ගැන නගන අස්ථාන චෝදනා වලට බියවන සුලු මිනිසෙකි.

''එය මගේ භාර්යාව නිසා නොවෙයි කීවෙ තාත්ත, ගෙදරට කැලලක් වෙන නිසා''යයි පුතා පියාට පිළිතුරු දුන්නේ පාපොච්චාරණයක යෙදෙන්නෙකු ලෙසය. එහෙත් ඒ වචන පියාට නොඇසුණේය. කෝපයෙන් කල්පනා කරමින් සිටි ඔහු මෙසේ ද කීවේය:-

''ඉතින් මේ ගෙදර ගැණු පිරිමි කරදරය ඉවර වෙන්නෙ නැති හැටි. මම වයස් ගත මිනිහෙක්. ඔය වල්පල් ගැන හිත යොදන්න මට ඕන කමක් නැහැ. මට දැන් ඕන කරන්නෙ නිවී සැනසිල්ලෙ ඉන්න එක පමණයි. කෝ ඒකවත් මට ලැබෙන වයි මේ ගොල්ලන්ගේ ඊර්ෂ්‍යාවයි කාමාශාවයි නිසා. ඉතින් උඹ මට කියන්නෙ මොනව කරන්නෙයි කියල ද?''

පියාගේ කෝපය නිවෙන තෙක් නිහඬව සිටි පුත්‍රයා යළිත් කථා කෙළේය:-

''අපට මේ ගෙදර අත් හැරල යන්න පුළුවන් නම්! එත කොට නගරයට ගිහිල්ල ජීවත් වෙන්න පුළුවන්. අපි මේ පිටිසරට වෙලා හරක් වගේ ජීවත් වෙන එකේ තේරුම මොකක්ද? එතකොට මේ කරදරකාරයින්ගෙන් වෙන්වෙල ඉන්නත් පුළුවන්.''

තම පුත්‍රයා මෙසේ කීවිට වං ලුං අවඥසහගත සිනාහවක් පහළ කොට පුතාගේ අදහස ප්‍රතික්ෂෙප කෙළේය.

''මේ මගේ ගෙදර'' යයි වං ලුං ස්ථිරව කියමින් මේසය ළඟ වාඩිවී දුම් කෝවද තමා වෙත ඇදගෙන යලිත් කථා කෙළේය.

''ඉතින් උඹට කැමති නම් එහි සිටිය හැකි. මේව මගේ ගෙවල්, මගේ ඉඩම්, ඉතින් මේ ඉඩම් නැත්නම් අපිටත් වෙන්නෙ වෙන අයට වගේ බඩගින්නෙ මැරෙන්න. උඹටත් ඔච්චර ලස්සන ඇඳුම් පැළඳුම් ඇඳගෙන උගතෙක් වෙලා ඉන්න පුළුවන් වුනේ මේ ඉඩම් නිසයි.''

මෙසේ කිය කියා වං ලුං නැගිට අඩි හප්පමින් මැද කාමර යේ ඇවිදිමින් බිමට කෙල ගසමින් හැසුරුනේ ගොවියෙකු කුඹුරෙහි හැසිරෙන ලෙසය. මේ අතර පුත්‍රයා පියා පසුපස යමින් මෙසේ කීවේය:-

''හොඳයි! අර හ්වැංලාගෙ ගේ තියෙනව. ඒකෙ ඉස්සරහ පැත්තෙ එහෙන් මෙහෙන් ආපු දුප්පත් මිනිස්සු පිරිල ඉන්නව. ඇතුල් පැත්තෙ කොටස් වහල දමලයි තියෙන්නෙ. අපට ඒව කුලියට ගන්න ඇත්නම් නිදහසේ ඉන්න පුළුවන්. ඉතින් ඔබටත් මගේ බාල මල්ලිටත් වරින්වර ඉඩම් බලන්න එන්න පුළුවන්. එතකොට මාත් අර බාප්පාගේ පුතාත් අතරෙ ආරවුල් සංසිඳේවි.''

ඇසින් කඩා හැලෙන කඳුළු අතින් පිස දමා නොගෙන තව දුරටත් ඔහු කථා කරගෙන ගියේය.

''ඉතින් බලන්න මට තව ටික දිනකින් හොඳ පුතෙකුත් ලැබෙනව. මම සූදුවට යන්නෙත් නැහැ. අබිං උරන්නෙත් නැහැ. මගේ භාර්‍යාවගෙන් පමණක් සතුටු වෙලා ඉන්නව. මම ඔබෙන් ඉල්ලන්නෙත් ඉතා සුළු කොටසක් පමණයි.''

තමාගේ කඳුළු සැලීමෙන් පියාගේ හදවත සැලුනා දැයි පුතා නොදත්තේය. එහෙත් හ්වැං මැඳුර මතක් කළ විට නම් ඔහුගේ හදවත සැලුනේය. වරක් තමා ඒ මහ ගෙදරට ගොස් එහි සිටියවුන් අබියස ලජ්ජාවෙන් සිටි අයුරුත් දොරටුපාලයාට පවා බියවූ සැටිත් හ්වැං යන නාමය පුත්‍රයාගේ මුවෙන් ගිලිහුන විට ඔහුගේ සිහියට නැගුනේය. ඒ දිනය සිහිවන විට ඔහුට ඇතිවූනේ ලජ්ජාව පමණක් නොවේ; කෝපයද ඇති

Scanned by CamScanner

වුණේය. එහෙයින් පුත්‍රයා හ්වෑං නාමය කීවිට අතීතය සිහිය-මක් මෙන් ඔහුට පෙනුණේය.

"ඔව් එහි වාසයට ගියනම "එද අර නාකි රදළ ගෑණි වහලෙකුට වගේ මට අණ කරමින් වාඩිවී සිටි පුටුවෙ වාඩිවෙල ඉදගෙන මටත් වෙන අයට එහෙම අණ කරන්න පුළුවන්" යයි සිතූ වං ලුං "ඔව් මට උවමනා නම් ඒක කරන්න පුළුවන්" යයි තමාටම කියා ගත්තේය.

සිතිවිලි සාගරයෙහි පිහිනමින් සිටි ඔහුට පුත්‍රයා පිළිතුරක් නොදුන්නේය. එහෙත් තම දුම් කෝව දුම්කොළ වලින් පුරවා ගෙන ගිනි සිලකින් එය දල්වා ගෙන තමාට කළ හැකි දේ ගැන සිහින මවන්නට වූයේය. එක වරම තීරණය නොකළ මුත් විමසිලිමත් වූ ඔහු බාප්පාගේ පුතා තරුණියන් දෙස බැලුම් හෙලීමේ චෝදනාව සත්‍යයක් බව තීරණය කොට තොල් මතුළේ "මට මේ කාමුක බල්ල එක්ක මේ ගෙදර ඉන්න බැහැ" යනු වෙනි. ඔහු සවකීය බාප්පා ගැන ද කල්පනා කර බැලුවේය. නිතර අබිං ඉරීම නිසාත් මහළු තම නිසාත් බාප්පා කෘශවී කුදු ගැහී සිටින බව වං ලුං ට පෙනුණේය. බාප්පා කැහැ කැහැ ලේ මිශ්‍රව කෙල ගසනු හේ දිටීය. ස්ථූල ශරීරයෙන් යුක්ත වූවත් කුඩම්මා ද අබිං වලින් පිඩාවට පත්ව සිටින අයුරු වං ලුං ට දක ගත හැකි විය. දුබල බවට ගිය ඒ දෙදෙනාගෙන් දූන් ඔහුට කරදරයක් නැත. එතෙක් මේ අබිං වලින් මට්ටු නොවූයේ ඔවුන්ගේ පුත්‍රයාය. අවිවාහකව සිටි මේ තරුණයා බොහෝ විට ක්‍රියා කෙළේ වල් සතෙකු මෙන්ය.

ඔහු මහළු යුවල මෙන් අබිං වලට අවනතවී සිහින ලොවක සැතපී කාමාසාව සංසිඳුවා නොගත්තේය. මේ ගෙදර දී විවාහ වන්නට ද ඔහුට වං ලුං ගේ කැමැත්ත නොලැබුණේය. වං ලුං එසේ කැමැත්ත පළ නොකෙළේ ගෙදර ජනගහණය වැඩිවන හෙයිනි.

ගමෙන් බැහැරව සිටි මිනිසුන් පෙරළා පැමිණි පසු ගම් පැහැර ගනිමින් සිටි සොරු වයඹ දෙසට පැන ගියහ. මේ තරුණයා ඒ සොරමුල සමගවත් පැන නොගොස් වං ලුං මැඳුරෙහිම නතර වූයේ එහි 'බත මුලකින්ම' යැපෙන්නට ඉවා ගෙනය. මෙසේ නතරවී සිටි තරුණයා වං ලුං ගේ ඇසට කටුවක් වැනි විය.

ඔහු මුළු කාලය ගත කෙළේ එහා මෙහා ඇවිදිමින් හා වාචාල කතා දෙඩවමින්ය.

දිනක් වං ලුං දෙවෙනි පුත්‍රයා බැලීමට නගරයට ගොස් ඔහුගෙන් මෙසේ විමසුවේය:-

"හොඳයි උඹේ කැමැත්ත කොහොමද උඹේ අයියගෙ යෝජනාව ගැන. අයිය කථා කරනව මහ ගෙදරින් කොටසක් කුලියට අරගෙන එහි පදිංචියට යන්න."

වෙළඳ පලෙහි සෙසු ලිපිකරුවන් මෙන් හොඳට ඇඳ පැළඳ සිටි තියුණු දෙනෙතකින් යුත් ඒ තරුණයා පියාගේ කථාවට එකඟ වුනේය.

"ඒක නම් හරි හොඳයි තාත්තෙ. ඒක මටත් ගැලපෙනව. එතකොට මටත් කසාද බැඳල මගේ භාර්‍යාවත් එක්ක එහි පදිංචි වෙන්න පුළුවන්."

නොයෙක් කරදර නිසා දෙවෙනි පුත්‍රයාගේ විවාහය ගැන කිසිවක් වං ලුං ට කළ නොහැකි විය. මෙතෙක් වං ලුං ඒ පිළිබඳව සැලකිල්ලක් නොදැක්කුවේ දෙවෙනි පුත්‍රයා කලබලකාරී කෙනෙකු නොවන නිසාය. දෙවෙනි පුත්‍රයාට තමාගෙන් ඉටුවිය යුතු ඒ යුතුකම මෙතෙක් ඉටු කරන්ට නොහැකි වීමෙන් වං ලුං ට ඇති වුනේ තරමක ලජ්ජාවකි.

"මෙච්චර දවස් උඹ අමතක කරල නෙවී මම හිටියෙ. නොයෙක් කරදර නිසා ඔය කාරණේ ගැන කල්පනා කරන්නවත් වෙලාවක් තිබුනෙ නැහැ. දැන් ඉතින් කරදරත් අඩු නිසා ඒ ගැන සොයන්නම්" යයි කියමින් වං ලුං කල්පනා කෙළේ දෙවෙනි පුත්‍රයාට ගැලපෙන තරුණියක් ගැනය.

"හොඳයි එහෙනම් මම කසාද බඳින්නම්. මුදල් තියෙන වෙලාවට එහෙම වැඩක් කරන එක මැණික් ගලක් ගන්නවටත් වඩා හොඳයි. හැබැයි නගරයෙ ගෑණියෙක් නම් මට එපා! එහෙම උනොත් මගේ අයියට වගේ මටත් වෙන්නෙ ගෑණිගෙ පුරසාරම් කතා නිතර නිතර අහන්නයි. සීමාවක් නැතුව මුදල් වියදම් කරන නගරයේ ගෑණුන්ට මම කැමති නැහැ."

වං ලුං දෙවෙනි පුතාගේ මේ කථාව අසමින් මහත් විශ්මයට පත්වුනේය. ගෙදර සිටින සවකීය ලේලිය අහංකාර පරවස වියදම් කාරියක බව ඔහු මෙතෙක් නොදැන සිටියේය. ඇගේ

බාහිර ගතිගුණ වලින්ම ඔහු පැහැදී සිටියේය. කෙසේ වුවත් දෙවෙනි පුතාගේ කථාව සුදුසු බව ඔහුට වැටහුනේය. ඔහු වඩාත් පැහැදුනේ පුත්‍රයාගේ අරපරෙස්සම ගැනය. තමා මෙතෙක් මේ දෙවෙනි පුත්‍රයා ගැන හරි අවබෝධයක් ඇතිව නොසිටි බව ඔහු සිතිය. වෙළඳ සැලෙහි පුහුණුව සඳහා නගරයට ගිය පසු ඔහු ගැන වං ලුං ට අමතක වුනේය. හදිසියෙන්වත් කිසිවෙකු දරුවන් ගැන ඇසුවහොත් ඔහුට මතක් වුනේ ''තමාට පුත්‍රයන් තිදෙනෙකු'' සිටින බව කීමට පමණකි.

දෙවෙනි පුත්‍රයා ගැන අළුත් හැඟුමකින් යුක්තව වං ලුං ඔහු දෙස බැලුවේය. කොටකර කැපූ කෙස් වැටියෙන් ද අළු පාට සේද ඇඳුම් කට්ටලයකින් ද සැරසී සිටි තරුණ පුතාගේ කායඝික්ෂම දේහය වං ලුං ගේ සිත ඇද ගත්තේය. අනතුරුව ඔහු ''එහෙනම් උඹට ඕනෑ කොහොම තරුණියක් ද''යි පුත්‍රයාගෙන් ඇසුවේය.

තරුණයා සෙමින් සෙමින් අවංකව කථා කෙළේය.

''මට ඕන කරන්නෙ පිටිසර තරුණියක්. හොඳ ඉඩකඩම් තියෙන දුප්පත් නෑදෑයො නැති පවුලකින් පැවතෙන එකියක්. වඩා රූමත් කමක් නැති උනාට කමක් නැහැ. හැබැයි අවලක්ෂණ එකියක් නම් හොඳ නැහැ. හොඳට කෑම උයන්න පුළුවන් එකියක් වෙන්නත් ඕන. එතකොට ගෙදර වැඩකාරයො හිටියත් ඔවුන් ගෙන් ඇයට වැඩ ගන්න පුළුවන්. ඇයට කෑම් බීම් පිළිබඳවත් ඇඳුම් පැළඳුම් පිළිබඳවත් අරපරෙස්සමකුත් තියෙන්න ඕන.''

මහළුවියට පත් තමාගේ අදහස් වලටත් වඩා තරුණ පුත්‍රයාගේ අදහස් මෝරා තිබෙන අයුරු දූක වං ලුං මවිතයට පත් වුනේය. පුත්‍රයාගේ දුර දක්නා නුවණ ගැන ඔහු ආඩම්බර වුනේය.

''හා! හොඳයි එහෙම තරුණියක් මම සොයන්නම්. චිං ට මේ කාරණය කිව්වහම ඔහු ගමේ ගොඩේ ගෙවල්වල සොයාවී''යි කියා සිනාසෙමින් වං ලුං ගමන් කෙළේ මහගෙදර පිහිටි වීථියටය. ඔහු මහ ගෙදර ගේට්ටුව වෙත පැමිණ මොහොතක් නතර වුනේය. ගේට්ටුව දෙපස වූ සිංහ රූප දෙක හැර ඔහු නතර කරන්නට— ඔහුගේ ගමන වලක්වන්නට කිසිවෙක් එහි නොවීය. තරමක විශ්මයකින් යුක්තව ගේට්ටුවෙන් පිවිසී ගමන් කළ ඔහුට එහි මිදුල්වල වියළෙන්නට වැනූ රෙදි ද සපත්තු මසමින් හා මසාදුප

කථා කරමින් සිටි ගැහැණු ද කුණුවැකුණු නග්න සිරුරින් යුක්තව ගඩොල් ඇල්ලූ පොළොවෙහි පෙරළෙමින් සිටි කුඩා දරුවන් ද පෙනුනි. පෙර සුගන්ධවත් වූන මේ මැඳුරෙහි සෑම කාමරයකින් ම ආඝ්‍රාණය වුනේ අපවිත්‍ර දුර්ගන්ධයකි. තමාගේ වැඩිමල් පුතාද වරක් පැමිණ මිත්‍රව සිටි ගණිකාව ද වාසය කළ කාමරය විවෘතව තිබුනි. මහළු මිනිසෙකු එහි වෙසෙන බව දූන වං ලූං ඔහු ඉදිරියට ගියේය.

පෙර රදළ පවුල වාසය කළ සමයෙහි නම් තමා ද මේ දුප්පතුන් අතර එකෙකු මෙන් වං ලූංට සිතිය හැකි විය. එහෙත් ඔහු ද දූන් ධනවතෙකු නිසා දුගී ජනයාට පිළිකුල් කරමින් නාසයද ඇඟිලි වලින් තද කරගෙන දුප්පතුන්ට ද්වේෂ කරන්නෙකු මෙන් මහගෙදර මිදුල් හරහා ගමන් කෙළේය. ඉදිරියටම ගමන් කළ ඔහුට වැසුන දොරටුවක් හමු විය. ඒ අසළ මිදුලෙහි මැහැලියක් නිදි - කිරමින් සිටියාය. ඇය දෙස බැලූ ඔහුට වැටහුනේ ඒ අර මුරකාරයාගේ කැලල් සහිත බිරිය බවයි. මෙයින් විශ්මයට පත් ඔහු යළිත් ඇය දෙස බැලුවේය. ඇය ඔහුට මතක තිබුනේ තරබාරු මැදි වයස් ගැහැණියක මෙන්ය. එහෙත් දූන් ඇය ඇකිලුන - රැලිවැටුන සමකින් හා සුදු හිස කෙසින් ද යුක්තව සිටියාය. එසේ ඇය දෙස බැලූ ඔහු එකවරටම සිතුවේ තමා කුළුඳුල් දරුවාත් වඩාගෙන තරුණයෙකු මෙන් මෙහි පැමිණි කාලයේ පරතරය මේ ගැහැණියගේ රූපාකාරය වෙනස් වීමෙන් පැහැදිලිවන බව හා තමාත් දූන් කොතරම් මහළුද? යන්න ගැනය. වං ලූං ගේ සිතට මහළු බවේ හැඟුම ප්‍රථම වරට ආක්‍රමණය කෙළේ මෙදය. වං ලූං මැහැලියට කාරුණිකව ඇමතුවේය.

''මේ ගේට්ටුව අරින්න මට ඇතුල් වෙන්න.''

මැහැලිය සිහිනයකින් මෙන් තිගැස්සී දෙනෙත් විදහමින් වියලි දෙතොල විකමින් මෙසේ කීවාය:—

''ඇතුළු කාමර සේරම මිලයට ගන්න කෙනාකුට මිසක් වෙන කෙනෙකුට ගේට්ටුව අරින්න තහනම් කරල තියෙනව.''

''හොඳයි මෙතන මට සුදුසුය කියල හිතෙනව නම් සොයා බලා ගන්නවා''යයි කියූ වං ලූං ඇයට තමා කවරෙක් දූයි හඳුන්වා නොදුන්නේය. එහෙත් ඔහු තමාට හොඳට පුරුදු මාර්ගයෙහි ඇය පසු පස ගමන් කෙළේය. තමා ඕ ලැං ගෙන යාමට පැමිණි

දිනයෙහි තම කුඩය තබා ගිය කාමරය ද පසු කරමින් රක්ත වර්ණයෙන් ඔප දමූ කුළුණු වලින් සැරසුන වරණ්ඩයකින් යුක්ත මහා ශාලාවට පිවිසුන විට ස්වකීය සිතිවිලි අතීතය කරා ගමන් කෙළේය. මෙයට අවුරුදු විසි පහකට තිහකට පෙර වහල් තරුණියක සොයා මෙ ශාලාවේම මහෝගනී අසුනක හිඳගෙන සිටි මහළු රදළ කාන්තාවක හමුවට පැමිණි මෝඩ දුප්පත් වං ලුං නැමති ගොවි තරුණයා දූත් අමුතු ආත්මයක් ලැබූවෙකු මෙන් ඒ සාලාවේ එම ආසනය ලඟටම පැමිණ සිටින බව සැබෑවූ සිහිනයක් මෙන් ඔහුට වැටහුනේය.

මේ වැටහීමෙන් පසුව අපූර්ව බලයකින් මෙහෙයනු ලැබූ ඔහු වරක් ඒ රදළ කාන්තාව අරා සිටි ඒ අසුනෙහි වාඩිවී ඒ අසළ තිබුන මේසය මත ස්වකීය අත තබා ගත්තේය. මේ උස් අසුනෙහි හිඳගත් ඔහු විචාරාත්මකව බැලුවේ තමා දෙස ඉහි මරමින් සිටි මැහැලියගේ අඳුරු මුහුණ දෙසය. මොහොතක් ගතවන්නට පෙර ඔහුගේ හදවත ප්‍රීතියෙන් පිනා ගියේය.

එහෙයින් ඔහු මේසයට අතින් ගසා මෙසේ කීවේය:-

"මම මේ ගෙය ගන්නව."



යමක් තීරණය කළ වහාම ක්‍රියාත්මක කිරීමේ ශක්තිය මේ දිනවල වං ලුං කෙරෙන් පහව ගොස් තිබුණේ මහළු කමෙන් ඇති වූන දුබල කම නිසාය. එහෙයින් ඉඩම්වල මදක් එහා මෙහා ඇවිද වරින් වර නිදගැනීමෙනුත් නිදහස්ව වාඩිවී බැස යන හිරු දෙස බලාසිටීමෙනුත් ඔහු දවස ගත කෙළේය. එයට වඩා දෙයක් ඔහුට කළ නොහැකි වූන නිසා සෑම තීරණයක්ම ක්‍රියාවේ යෙදීමට අණ කෙළේ වැඩීමල් පුතාටය. එහෙයින් අළුත් වාසස්ථානයකට යෑමේ කටයුතු වැඩීමල් පුතා පිළියෙළ කරද් දී වං ලුං දෙවන පුතාට පණිවුඩයක් යැව්වේය. සියල්ල සම්පූර්ණ වූවිට පද්මාත් කෝකිලාත් වැඩීමල් පුත්‍රයාගේ භාර්යාවත් වැඩීමල් පුත්‍රයාත් බඩු බාහිරාදිය හා දසියනුත් කම්කරුවනුත් රැගෙන අළුතෙන් කුලියට ගත් ඒ නිවාසයේ පදිංචියම ගියහ.

එහෙත් වං ලුං එක වරට එහි පදිංචියට නොගොස් බාල පුත්‍රයා සමග එහිම නතරව සිටියේය. තමා උපන් ඉඩම අත්හැර යාමේ මොහොත එළඹී විට එය කලින් සිතූ තරම් පහසු වැඩක් නොවන බව ඔහුට හැඟුණේය.

''හොඳයි මගේ පදිංචියට වෙනම කොටසක් ඉතුරු කරල ඒ ගෙය පිළියෙළ කර ගනිල්ල. මමත් කැමති දවසක එන්නම්. මගේ මුනුපුරා උපදින්න දවසකට කලින් තමයි එන්නෙ. නැවත ඕන දවසක ආපසු මගේ ඉඩම්වලට යන්න පුළුවනි''යි ඔහු පුත්‍රයන් අමතා කීවේය.

Scanned by CamScanner

ඔහුගේ පුත්‍රයන් මහගෙදර පදිංචියට යාමට තව තවත් බල කරන විට ඔහු තව දුරටත් මෙසේ කීවේය :-

"හොඳයි අර මගේ 'පුංචි මෝඩී' උඹලා එක්කර ගෙන යන වද එහෙම නැත්නම් මම එනකොට එක්කර ගෙන එනව ද? නැහැ නැහැ මම එනකොටම ඇයත් එක්කරගෙන එන්නම්. එහෙම නැති උනොත් ඈ කැවද බීවවද කියල බලන්නවත් කෙනෙක් නැහැ නොවැ."

වං ලුං මෙසේ කීවේ තම ලේලියට ඇනුම් පදයක් වශයෙනි. ලේලිය 'පුංචි මෝඩියට' පිළිකුල් කළාය. පුංචි මෝඩිය තමා ළඟට එනවිට ඇය කීයේ "මෙහෙම අය ජීවත්වන එක හොඳ නැහැ. මෙකි දිහා බැලුවත් ඇති මගේ කුසයෙහි ඉන්න දරුව විරූප වෙන්න" යන වචනයි.

තම බිරිය කෙරෙහි පියා තුළ ඇති නොකැමැත්ත යථෝක්ත ඇනුම් පදයෙන් වටහාගත් වං ලුං නිශ්ශබ්ද වූනේය. යලි වං ලුං ඒ ඇනුම් පදය ගැන පශ්චාත්තාපයට පත් වෙමින් "මම එන්නම් දෙවෙනි පුතාට කසාද බඳින්න තරුණියක් සොයා ගත්තහම. එතකං චිං එක්ක වාසය කිරීම පහසු" යයි කීවේය.

ඉක්බිති ගෙදර ඉතිරිවුනේ බාප්පාත් ඔහුගේ බිරිය හා පුතාත් චිං සහ කුලීකරුවන් කීපදෙනෙකුත් බාල පුතාත් 'පුංචි මෝඩියත්' පමණකි. බාප්පාත් ඔහුගේ බිරිය හා පුතාත් පද්මා පදිංචිව සිටි ගෙය අයිතිකර ගත්හ. එය වං ලුං ගේ සන්තාපයට හේතුවක් නොවූයේ බාප්පාගේ ජීවිතයෙන් තව ඉතිරිව තිබෙන්නේ සුලු කොටසක් හෙයිනි. ඔහු මියගිය පසු ඒ පවුල වෙනුවෙන් තමාගේ වගකීම අවසන් වන බව ඔහු දැන සිටියේය. ඉදින් තරුණයා— බාප්පාගේ පුතා තමා කියන විදියක ජීවත් නොවුවහොත් ගෙදරින් පන්නා දැමීම ගැන කිසිවෙකු දෙස් නොකියන බව ද ඔහුට සිකුරුය.

චිං ද වැඩ කරුවෝ ද පිටත තිබුන කාමරවල පදිංචියට ගියහ. වං ලුං ද බාල පුතා ද පුංචි මෝඩිය ද මැද කාමරයෙහි පදිංචි වූහ. ඔවුන්ගේ සේවය සඳහා වං ලුං ශක්තිමත් ස්ත්‍රියක් නතරකර ගත්තාය.

ඉන්පසු වං ලුං සම්පූර්ණ කාලය ගතකෙළේ විවේකයෙනි. ඔහුගේ ඇඟට මහත් වෙහෙසක් දැනුන නිසා ඔහුට මේ විවේකය අවශ්‍ය විය. බාල පුත්‍රයා ද නිශ්ශබ්ද දරුවෙකු වූ බැවින් කරදරවලින් තොර සාම කාලයක් මේ ගෙදරට යලිත් උදාවුනේය.

වං ලුං විසින් ඊළඟට කළයුතු කාය්‍ය්‍ය වූයේ දෙවන පුතාට තරුණියක සෙවීමට චිං යෙදවීමය. මේ කාලය වන විට මහළු බවට පත් චිං වියලී ගිය පත්‍රයක් බවට පත්වෙමින් සිටියේය. එහෙත් පුතකයෙකු මෙන් වං ලුං ට කීකරු වූත ඔහු තුළ වූයේ විශ්වාසයේ ශක්තිය පමණකි.

වං ලුං දැන් ඔහුට උදැල්ලක් ඉස්සීමටත් නගුල පසුපස ගමන් කිරීමටවත් ඉඩ නොදෙයි. එහෙත් වං ලුං ට තවමත් ඔහු ප්‍රයෝජන වත් වූයේ වැඩ කරුවන්ට ඒ ඒ කටයුතු නියම කිරීමේදීත් ධාන්‍ය වර්ග කිරීමේ හා මැණීමේදීත් උපදෙස් ගැනීමටය. වං ලුං ගේ පණිවුඩ පනත් එහේ මෙහේ ගෙන ගියේ ද චිං ය. වං ලුං ගේ නියමය පරිදි ගමෙන් ගමට තරුණියන් සොයා පෙරලා පැමිණි චිං මෙසේ කීවේය:–

''ඔබේ පුතාට තරුණියක් සොයන එක මට තරුණියක් සොයනවටත් වැඩිය අමාරුයි. මේ ගමට ගම් තුනකට එහා හොඳ තරුණියක් ඉන්නව. තරබාරු ඈ හොඳ පරෙස්සම් කාරියක්. වරදකට තියෙන්නෙ නිතර හිනාවෙන එක පමණයි. එයාගෙ තාත්තත් කැමතියි. මේ කාලෙ හැටියට හොඳ දෑවැද්දකුත් දේවි. එයාට ඉඩමුත් තියෙනව. නමුත් මම කිව්ව ඔබේ වචනයක් නැතුව මට පොරොන්දු වෙන්න බැරිය කියල.''

චිං ගෙන ආ පුවත යහපත් එකක් බව වං ලුං ට වැටහුනි. ඔහු එය ඉටුකර ගැනීම සඳහා නොඉවසිලිමත් විය. එහෙයින් ඔහු එයට සිය කැමැත්ත දුන්නේය.

දෙවෙනි පුතාගේ විවාහ මංගලය පිළියෙළ වන විට වං ලුං ගේ හදවතෙහි මෙබඳු සිතිවිලි පහළ වූනේය :–

''මට තව ඉන්නෙ එක පුතයි. මේ සේරම කසාද බැඳිලි, මේ මහුල් කෑම ඉවර උනහම මට ඉතින් විවේකයෙන් ඉන්න පුළුවන්.''

විවාහ මංගලයේ කටයුතු ප්‍රීතිමත් ලෙස කෙළවර වුනේය. ඉන්පසු මියගිය සවකීය පියාට මෙන් හිරු එළිය තැප තැප විවේක ගැනීමට වං ලුං ට අවස්ථාව ලැබුනේය. චිංසහ තමා, මහලු වයසට ගිය නිසාත් තුන්වෙනි පුත්‍රයා තවම ලාබාල නිසාත් ඉඩම්වල වගකීම් භාරය පැවරීමට කිසිවෙකු නැතිවූන විට ඇත තිබෙන කුඹුරු කීපයක් හා ඉඩම් කීපයක් බදු දීමට තීරණය කළේය. ඔහුගේ මේ තීරණය

Scanned by CamScanner

අසා අසල ගම්වල මිනිස්සු මේ ඉඩම් බදු ගැනීමට පැමිණියහ. ඔහු ඔවුන්ට මේ ඉඩම් බදු දුන්නේ අස්වැන්නෙන් භාගයක් තමන්ට දීම වත් පොරොන්දු කර ගෙනය. ඇතැම් බෝග වර්ග ද සමහර පෝර වලවල් ද තමාගේ සෙක්කුවල තෙල් සිඳීමෙන් පසු ඉතුරුවන පුනක්කු ද බෝංචි පොතු ද බදු කාරයන් විසින් වං ලුං ට දිය යුතු විය.

මෙයින් පසු ඉඩම් පාලනය පිළිබඳ කටයුතු ද අඩුවූයෙන් ඇතැම් විටක වං ලුං මහගෙදර තමාට වෙන් කරපු කාමරයේ ද වරින් වර වාසයට ගියේ ය. එහෙත් සෑම උදයකම ඔහු නගරයේ දොරටුව විවෘත කළ විට එයින් නික්ම තම ඉඩම් බලන්ට යාමද අමතක නොකෙළේය. තමාගේ ඉඩම්වලට පැමිණ ඉඩම් ඇසුරු කරමින් හමා ගිය උදය මාරුතය ආස්වාදය කිරීම ඔහු පරම සුවයක් කොට සැලකුවේය.

මේ දවස්වල බාප්පාගේ පුතාට ද ගෙදරින් බැහැර යන්නට තරම් සිතුනේ එහි ගැහැණුන් නොමැතිවූ නිසාය. ගෙදර නතරව සිටියේ එක් කුලීකරුවෙකුගේ බිරියක් වන තරබාරු ස්ත්‍රියක් පමණකි. දිනක් මේ තරුණයා උතුරේ පවතින යුද්ධයක් ගැන අසා වං ලුං ට මෙසේ කීවේය :–

''උතුරෙ මේ දවස්වල යුද්ධයක් තියෙනවලු, නිකම් ඉන්නවට වැඩිය හොඳයි ඒකට වත් බැඳෙන්න ඇත්නම්. මට ඇඳුම් ගන්නත් පොරව ගැනීමට රෙදි ගන්නත් රට ගිනි පොල්ලක් ගන්නත් සල්ලි දෙනව නම් මම ඒකට බැඳෙනව.''

මෙයින් වං ලුං ගේ හදවත ප්‍රීතියෙන් ඉපිල ගියේය. එහෙත් ඔහු තම ප්‍රීතිය කපටි කමින් සඟවා ගෙන ආරූඪ කරගත් ශෝකයෙන් දුක් වූයේය.

''උඹ තමයි මගේ බාප්පට ඉන්න එකම පුතා. උඹෙන් පස්සෙ එයාගෙ පරම්පරාව ගෙනියන්න කෙනෙක් නැහැ. ඉතින් උඹත් යුද්දෙට ගියහම කොහොම ද?''

''හා! මම එච්චර මෝඩයෙක් නොවෙයි. මගේ ජීවිතය අනතුරකට භාජනවන විදියට වැඩ කරන්නෙ නැහැ මම. මට ඕන කරන්නෙ නාකි වෙන්න ඉස්සෙල්ල එහේ මෙහේ ඇවිදල රටතොට බලාගන්න'' යයි තරුණයා සිනාසෙමින් කීයේය.

වං ලුං ඔහුට මුදල් දුන්නේ ''මූ ගෙදරින් යන එක ලොකු වාසනාවක්, කොච්චර හොඳද රටේ සැමදම යුද්ද තියෙනව නම්.

මගේ වාසනාවක් තියෙනව නම් මූ යුද්දෙදි මැරෙන්නත් පුළුවන්. සමහර ඇයො එහෙමත් මැරෙනව''යයි සිතමිනි.

සචකීය පුත්‍රයා ගෙදරින් පිටව යන විට වං ලුං ගේ කුඩම්මා අඬන්ට පටන් ගත්තාය. වං ලුං ඇයට අබිං ටිකක් දී දුම් පයිප්පයක් ද දල්වා දී මෙසේ කිය කියා සැනසුවේය :– ''අඬන්න එපා කුඩම්මෙ, එයා යුද්දෙට ගිහිල්ල උසස්වෙලා ඒවි. එතකොට අපටත් ලොකු නම්බුවක්.''

ඉන්පසු සපිර ලෙසම වං ලුං මැඳුරට සාමය ලඟාවූයේය. වං ලුං නිවසෙහි ඉතිරිවූයේ මුළු දවසම නිද ගැණීමටම ගත කරණ මහළු යුවළ පමණකි. නගරයේ පුතාගේ නිවාසයෙන් මුණුබුරාගේ උපත පවසන පණිවුඩය පැමිණීමේ කාලය ද ලංවෙමින් තිබුණේය.

මේ කාලය ලංවෙත්ම නාගරික නිවාසයෙහි ලැගුම් ගත් වං ලුං එහි මිදුල්වල එහා මෙහා ඇවිදිමින් තෙරක් දකිය නොහැකි–නිමාවකට පත් නොවන සිහින මැව්වේය. වරක් පොහොසත් රදළ පවුලක් විසූ මේ මහා මන්දිරයෙහි තම දරුවන් සමග තමා වාසය කරණ අයුරුත් මෙහිදී තමාගේ තුන්වෙනි පරම්පරාවද ඇරඹෙන සැටිත් සිත සිතා වං ලුං විශ්මයට ද ප්‍රීතියට ද පත් වුනේ ය.

ඉන්පසු ඔහු හොඳ හොඳ වර්ගයේ උපකරණ හා ඇඳුම් පැලඳුම් ගැනීමට මුදල් යෙදවූයේය. ඇඳ පුටු මේසවල ඇතිරීමට ඔහු මිලට ගත්තේ ඉහල වර්ගයේ පට රෙදිය. දසියන්ට නිල් හා කාල වණ් කපු රෙදි මිලට ගෙන දුන්නේය. එක් වැඩකරුවෙක් වත් ඉරුණ ඇඳුම් නොඇන්දේය. වැඩිමල් පුත්‍රයාගේ නාගරික මිත්‍රයෝ ද මේ මන්දිරයට පැමිණ කා බී ප්‍රීති වූහ. ඔවුන්ගේ පැමිණීම වං ලුං ට ආඩම්බරයක් ද ප්‍රීතියක් ද වීය.

වං ලුං ද පෙරට වඩා හොඳ හොඳ ආහාර ගැණීමට අදහස් කෙළේය. ඔහු ගතවුන කාලයෙහි තිරිඟු පාන් කැබැල්ලක් සුදුළූණු කැබැල්ලක් සමග කා ප්‍රීති වුනේය. එහෙත් දැන් ඔහු දවසේ වැඩි හරියක් නින්දට ගත කෙළේ නොයෙක් වර්ගයේ ආහාර වලින් සන්තර්පනය වීමෙනි. උණ දලුත් ඉස්සනු ත් දකුණේ මාලු ත් උතුරු මුහුදේ කකුළුවනු ත් පරෙවි බිත්තර ත් ඔහුගේ ආහාරයට සැපයුනේය. එකල ධනවතෙකුගේ ආහාර වට්ටෝරුවට ඇතුළත් වන මේ දේවල් පුත්තු ද පද්මා ද ප්‍රීතියෙන් අනුභව කළහ.

මේ සිදුවූ සියල්ල දුටු කෝකිලා "හා! දැනුත් හරියටම මම අර ඉස්සර මේ ගෙදර ගත කළ කාලය වගේ ම යි. මම නාකිවෙලා සිටින එක පමණයි වෙනස. නාකි රදළයෙකුටවත් මා දුන් පුදසු නැහැ''. යි සිනාසෙමින් කීවාය. මෙසේ කියමින් ඇය හොරැහින් වං ලුං දෙස බලමින් යලිත් සිනාසුනාය. වං ලුං ඇගේ වචන නොඇසුන බවක් පළ කෙළේය.

එහෙත් ඔහු ප්‍රීතියට පත්වුනේ ඇය විසින් තමා නාකි රදළ තැන හා සැසඳූ නිසාය. මෙසේ ධනේශ්වර ජීවිතයක් ගත කළ වං ලුං කැමති විටක නිදගනිමින් ද කැමති විටක පිබිදෙමින් ද දවස් ගත කෙළේ මුණුබුරාගේ උපත බලාපොරොත්තු වෙමින් ය.

එක් උදෑසනක ඔහුට ගැහැණියකගේ කෙඳිරි හඬක් ඇසුනේය. ඔහු එය අස අසා වැඩිමල් පුතාගේ කාමරය බලා ගමන් කෙළේය. එහි දී හමුවූ පුත්‍රයා ඔහුට මෙසේ කීවේය:–

''වේලාව නම් ලඟයි. නමුත් කෝකිලා කියනව හුඟක් ප්‍රමාද වේවි කියල.''

එවිට වං ලුං පෙරලා තමාගේ කාමරයට ගොස් හිඳගෙන ඒ කෙඳිරියට කන් දුන්නේය. මේ කෙඳිරියට ඇහුම්කන්දෙත්ම ඔහුට ඇතිවුනේ මෙයට අවුරුදු බොහෝ ගණනකට පෙර මෙබඳුම අවස්ථාවක ඇතිවුන භීතියක් ය. මේ භීතිය විසින් මෙහෙයනු ලැබූ ඔහු ඇඳෙන් නැගිට වෙළඳසැලකට ගොස් හඳුන්කූරු ආදිය රැගෙන අනුකම්පාවේ දෙවදුව වසන නගරයේ දේවාලයට ගියේය. එහිදී හමුවුන පූජකයෙකුට මුදල් දී සුවඳ වර්ග පුද කිරීමට අණකරමින් මෙසේ කීවේය :–

''මම පිරිමියෙකු නිසා මේක කරණ එක හරි නැහැ. මගේ පළමු මුණුබුරා ලැබෙන්ට දැන් සූදනම්. මුණුබුරාගෙ අම්මට හුඟක් අමාරුයි. ඇය නගරයේ ගැහැණු ලමයෙකු නිසා හරි සිවුමැලියි. මගේ පුතාගෙ අම්මත් මැරිල. ඒ නිසයි මේ පූජාව කරන්න ගැහැණියෙක් නාවෙ.''

දෙවරුව ඉදිරිපිට තිබුන භාජනයක හඳුන්කූරු ගැසූ පූජකයා දෙස නැරඹූ වං ලුං ට සිහිවුනේ ''හොඳයි බැරිවෙලාවත් මේ උපදින දරුව පුතෙක් නොවී කෙල්ලක් වුනොත්'' යන්නය. එබැවින් ඔහු වහා මෙසේ කීවේය :–

Scanned by CamScanner

"හොඳයි ඒ දරුව පුතෙක් නම් මම මේ දෙවි දූවට අලුත් රතු වස්ත්‍රයකට මුදල් ගෙවනව. නමුත් කෙල්ලක් නම් මම මොකුත් කරන්නෙ නැහැ."

වං ලුං දෙවොළට එද්දී "පුතා ද? දුව ද?" යන ප්‍රශ්නයක් ඔහු සිතෙහි නොවීය. එහෙත් ඔහු දෙවොළෙන් පිටව ගියේ ඒ ප්‍රශ්නයෙන් බලවත් ලෙස ව්‍යාකූලත්වයට පත්වෙමිනි. ඔහු යලිත් කඩයට ගොස් තව තවත් සුවඳ වර්ග මිලට ගත්තේය. අධික උෂ්ණ දිනයක් වුවත් වියතක් පමණ ඝනකමට වීථි දූවිල්ලෙන් වැසී තිබුනත් ඒ කිසිවක් ගණනකට නොගෙන ඔහු තම ඉඩම් වලට මුහුණ ලා සිටින වෙල්යාය මධ්‍යයෙහි වූ කුඩා දෙවි රූ දෙක වෙත ගියේය. ඔහු ගෙනගිය සඳුන්කූරු ආදිය ඒ දෙවි රූ යුවළට පුද මෙසේ තොල් මතුළේය :-

"මගේ පියාත් මමත් මගේ පුතාත් ඔබට උපස්ථාන කළා. ඉතින් මගේ පුතාටත් පුතෙකු නොවුවහොත් ඔබ යුවළට සලකන්න කිසිවෙක් නැතිවේවි."

මෙසේ දෙවි රූ යුවළ හමුවෙහි යාඥා කොට පෙරලා ඔහු ගෙදර ගියේය. ගෙදර ගිය ඔහු මේසය ලඟ පුටුවෙහි හිඳගත්තේ දසියක් තමාට තේ ගෙනාවොත් හොඳ යයිද තවත් දසියක් මූණ පිසද ගැණීමට උණු වතුරෙන් තෙත් කළ තුවායක් ගෙනාවොත් හොඳ යයිද සිතමිනි. එහෙත් ඒ කිසිවක් සිදුනොවූ නිසා කිසි වෙකු කැඳවීමට ඔහු අප්පුඩි ගැසුවේය. එයින් ද කිසිවෙකු කැඳවා ගැනීමට නොහැකි වීය. සියල්ලන්ම එහා මෙහා දුවන බව ඔහුට පෙනුනේය. උපන්නේ කොහොම දරුවෙක් ද? නැතහොත් දරුවෙක් උපන්නාද ? යන්නවත් ඇසීමට කිසිවෙකු කැඳවන්නට වං ලුං මැලි වුනේය. දූවිලි වැකුණු ගතින් යුක්තව වෙහෙසට පත්ව බොහෝ වේලාවක් හිඳ ගෙන සිටි ඔහු හා කිසිවෙක් කථා නොකෙළේය.

ඊ බෝවීයත්ම කෝකිලාත් කැටුව පැමිණි පද්මා ඔහුට මෙසේ කීවාය :-

"හා! අත්ත පුතාගෙ ගෙදර තවත් පුතෙක්. අම්මයි පුතයි දෙන්නම සැපෙන් ඉන්නව. දරුව මම දක්ක හරි ලස්සනයි. නිරෝගියි."

මේ පුවත ඇසූ වං ලූං සිනාසුනේය. පුටුවෙන් ද නැගිට අත් පොලසන් දී යළි යළිත් සිනාසුනේය.

"මම මෙතන ඉඳගෙන බලාපොරොත්තු උනෙත් ඒක තමයි. දැන් ඉතින් මොනවද දන්නෙ නැහැ කෙරෙන්න ඕන වැඩ."

කෝකිලා හා පද්මා ස්වකීය කාමරයට ගිය පසු ඔහු යළිත් මෙසේ කල්පනාවෙහි නිමග්න වූයේය :-

"හා! මේ මගේ ලොකු පුතා උපදින වෙලාවෙ මෙච්චර භය උනේ නැහැ. ඇය තනියම අඳුරු කාමරයට ගිහිල්ල පුතා වැදුව. ඊළඟ වාරවලද පුතුනුත් දූවරුනුත් වැදූ ඈ වැඩි විවේකයක් නොගෙන මාත් සමග කුඹුරු වැඩටත් ගියා. එහෙත් මේ ගැණි- මගේ පුතාගෙ බිරිය දරුව උපදින වෙලාවෙ පොඩි ළමයෙකු මෙන් ඇඬුව. ගෙදර සිටි සෑම දසියකටම ඒ ගැන නිරතවන්නට සිදුවුනා. ඒ වගේම ඇගේ සැමියත් ඉදර ළඟ සිටිය."

සිහිනයක් මතක් කරවන එකෙකු මෙන් අතීතයට සිතයොමු කළ වං ලූං ට ඕලෑං මොහොතකට විවේක ගෙන ඇගේ දරුවාට කිරිදුන් හැටි ද, ඒ පොෂ්‍යදායක සුදු කිරි ඇගේ පියයුරු වලින් ගලා ගොස් බිම ඉහිරුණු හැටි ද, සිහියට නැගුනේ නොසිදුවිය හැකි දේවල් මෙන්ය.

මේ අතර ඔහුගේ පුත්‍රයා සිනා සෙමින් අවුත් මෙසේ කීවේය:-

"තාත්තෙ, දරුව නම් උපන්න. දැන් අපි ගැණියක හොයා ගන්න ඕන දරුවට කිරි දෙන්න. මගේ බිරිය කිරි දුන්නොත් ඇගේ රූපයත් ශක්තියත් පිරිහී යාවි. මම ඒකට ඉඩ දෙන්නෙ නැහැ. නගරයේ කිසිම වැදගත් ගැණියෙක් එහෙම කරන්නෙත් නැහැ."

වං ලූං ශෝකීව පුත්‍රයාට පිළිතුරු දුන්නේය:- "හොඳයි ඒක එහෙමනම් ඒ විදියට කරපන්. ඉතින් ඇයට ඇගේ දරුවාට කිරිදෙන්න නොහැකි නම් මොකොද කරන්නෙ?"

දරුවා ඉපදී මාසයක් ගතවූ විට දරුවාගේ පියා චීනයේ චාරිත්‍රානුකූල "උපන් දින මංගලෝත්සවය" සිදු කෙළේය. ඒ මංගලෝත්සවයට නගරයේ අමුත්තන් ද බිරිය ගේ මව හා පියා ද කැඳවනු ලැබූහ. ඔහු රතුපාට කළ බිත්තර සිය ගණනක් පැමිණි අමුත්තන්ට බෙදා දුන්නේය. උත්සවයේ සියළුම කටයුතු ප්‍රීතියෙන්

සිදුවුනේය. මාසයක ජීවිතයක් නීරෝගීව ගත කළ දරුවාගේ පොඩිති දේහය නරඹා ඔහුට දීර්ඝායුෂ පතමින් අමුත්තෝද ප්‍රීති වූහ.

මේ උත්සවය සමාප්තවුන පසු පුත්‍රයා වං ලුං සමග කථා කෙළේය:–

''දැන් ඉතින් මේ ගෙදර පරම්පරා තුනකම අය ඉන්නව. ඔය ලොකු පවුල්වල අය වගේ අපිත් අපේ පරම්පරාවෙ අයගෙ 'නාම පුවරු' පිළියෙළකොට තබමු. දැන් අපි සපිරවම පිහිටි පවුලකට අයත්වන නිසා ඒ විදියට නාම පුවරු තබාගත්තහම අවුරුදු පතා උත්සව පවත්වන්නත් අපට පුළුවන්.''

පුතාගේ මේ යෝජනාව වං ලුං ගේ මහත් ප්‍රීතියට හේතු විය. එහෙයින් ඔහු ''නාම පුවරු'' පිහිටුවීමට අණ කෙළේය. පියාගේ අණින් මේ පුවරු පේලියට තැබුවේ අර මහා ශාලාවේය. ඉන් එක එක පුවරුවක වං ලුං ගේ සීයාගේ නම ද ඔහුගේ පියාගේ නම ද ලියන ලදී. මේ පුවරු පේලියෙහි හිස් – කිසිවක් නොලියූ පුවරුද විය. ඒවායේ නම් ලියවෙන්නේ පවුලේ දැනට ජීවත්වන්න වුන් මිය ගිය පසුය. මේ නාම පුවරු පේලියට දුම් ඇල්ලීමෙන් වං ලුං ගෞරව කෙළේය.

මෙයින් පසු වං ලුං ට සිහිවුනේ තමා ''අනුකම්පාවේ දෙවි දුවට'' පොරොන්දු වූ රක්ත වස්ත්‍ර යයි. එහෙයින් ඔහු දේවාලයට ගොස් එයට මුදල් ගෙව්වේය. වං ලුං දෙවොළෙහි සිට ආපසු ගෙදරට පැමිණෙන විට අස්වැන්න කපා පැගෙන කුඹුරේ සිටි මිනිහෙක් දුවගෙනැවිත් කියූ ප්‍රවෘත්තියෙන් ඔහුගේ සිහියට නැගුනේ ''දෙවියන් සම්පත ද නොහඟවා දෙන්නාක් මෙන් විපත ද නොහඟවති'' යි යන්නය. එබඳු හැඟුමක් ඔහු තුළ පහළවුනේ ඒ පැමිණි මිනිසා ''විං මරණාසන්නව සිටින බව'' පැවසූ නිසාය. මේ පුවතින් කලබලයට පත් වං ලුං හති දම දමා සිටි ඒ මිනිහා දෙස බලමින් කෝපයෙන් මෙන් කථා කෙළේය.

''මට හිතෙන්නෙ මම නගරයෙ ඉන්න දෙවි දුවට 'රතු වස්ත්‍රයක්' දුන්න නිසා අර කුඹුරෙ ඉන්න දෙවි යුවළ තරහ වෙන්න ඇතෙයි කියලයි. ඒ ගොල්ල දන්නෙ කොහොමද ඒ ගොල්ලන්ට තියෙන්නෙ ඉඩම ගැන මිසක් දරුවන් ලබාදීම ගැන බලයක් නැති බව.''

Scanned by CamScanner

මේ වේලාව වන විට දහවල් භෝජනය ද පිළියෙළ වී තිබුනේය. එය ද අනුභව නොකොට වීං බලනු සඳහා ගමට යාමට පිටත්වන විට පද්මා බත් කා යන ලෙස පෙරැත්ත කළාය. ඇගේ ඉල්ලීම ද නොඅසා ඔහු පිටත්ව යනු දුටු පද්මා තෙල් කරදසියෙන් සෑදූ කුඩයක් ද දී ඔහු පසුපස දසියක් ද පිටත්කර හැරියාය. වං ලූං වේගයෙන් ගමන් කළ නිසා ඒ ශක්තිමත් දසියට ද කුඩය ඇල්ලීම සඳහා ඔහු වෙත ලං වන්නට නොහැකි වීය.

වහ වහා සවකීය ගෙට ගොඩවුන වං ලූං ප්‍රමාද නොවී ගමන් කෙළේ වීං වැතිර සිටි කාමරයටය. කාමරයට පිවිසුන වීගස ඔහු හැමටම ශබ්ද නගා කථා කරමින් ''කොහොමද මේක සිද්ධවුනේ'' යයි ඇසුවේය. කාමරයට රොක්වී සිටි අය අතර ඇතමෙක් මෙසේ කීහ:–

''එයා ධාන්‍ය වෙන් කරණ තැන වැඩ කළා. අපි කිව්ව එයාට වැඩ කරන්න එපයි කියල. එතන හිටිය අලුත ගත්ත වැඩ කාරයෙක්. එයාට හරියට කසේ අල්ලන්න තේරෙන්නෙ නැති නිසා වීං ඒක අල්ලන හැටි පෙන්වන්න ගියා........ මේක වයසක කෙනෙකුට බර වැඩක්.''

එවිට වං ලූං කෝපාත්මකව ශබ්ද නගා මෙසේ හඬ නැගුවේය:– ''මට ඒ වැඩකාරයා ගෙනත් දියල්ල.''

ඔව්හු ඒ අලුත් වැඩකාරයා වං ලූං ඉදිරියට තල්ලු කළහ. තරබාරු රතුවන් ඒ ගැමි කොල්ලා බියෙන් සැලි සැලී වං ලූං හමුවෙහි සිටියේ මහත් ආයාසයකිනි. බොල්ලෑවෙකු වූ ඔහුගේ ඇස් ගොණෙකුගේ මෙන් රවුම්ය, ලොකුය, අඳුරුය. ඔහු කෙරෙහි අනුකම්පාවක් නොදැක්වූ වං ලූං කොලුවාගේ දෙකම්–මුලට අතින් පහරක් දී දසියගේ අතින් කුඩය ද ගෙන එයින් ඔහුගේ ඔලුවට පහර දෙන්ට වුනේය. එහි සිටි කිසිවෙක් ඔහු වැළැක්වීමට ඉදිරිපත් නොවූහ. කොලුවා ද ඒ සියල්ලක්ම ඉවසාගෙන සිටියේය.

මෙවිට ඇඳෙහි වැතිර සිටි වීං කෙඳිරිගෑවේය. වං ලූං කුඩය බිම දමා ''මම මේ ගොණාට ගහනකොට අනිකා මැරේවි'' යයි කෑගැසුවේය.

ඉක්බිති ඔහු වීං සමීපයෙන් ඉඳගෙන ඔහුගේ අත අල්වා ගත්තේය. වේලුන කොළයක් තරමට සැහැල්ලු වූ ඒ අතෙහි ලේ ගමන් කිරීම පවා දැන ගැනීම අපහසු වීය. සුදුමැලි මුහුණෙහි

තැන තැන කලු පුල්ලි ද මතුවී තිබුනි. දෙනෙත ද අඩවන්ව පැවතුනි. හුස්ම ද වැටුනේ කඩින් කඩය. වං ලුං ඔහු වෙත නැඹුරුවී කණට ලංව මෙසේ හඬ නැගුවේය.

"ඔබේ අවසාන කටයුතු මගේ තාත්තගෙ අවසාන කටයුත්ත තරම්ම හොඳින් කරන්නම්."

චිං ඒ අවස්ථාවෙහි සිටියේ ඔහුගේ වචන ඇසුන බව හැඟවීමේ ලකුණක්වත් කළ නොහැකි තත්වයකය. හතිලමින් සිටි ඔහු එක් වරක් කට ඇර යලිත් පියාගත්තේය. චිං අවසන් හුස්ම හෙලූ බව වං ලුං දැනගත්තේය.

තමාගේ මිත්‍රයෙකු වශයෙනුත් කීකරු සේවකයෙකු වශයෙනුත් සිටි මේ මිනිසාගේ මරණය වං ලුං ට ඉවසිය නොහැකි දෙයක් වූයේය. එහෙයින් ස්වකීය පියා මියගිය ද ද නොහැඬූ වං ලුං චිං ගේ මරණය ගැන ඉකිබිඳ බිඳ හැඬුවේය. ඔහු චිං ගේ භූමදානයේ කටයුතු ඉතා උසස් ලෙසට පිළියෙළ කෙළේය. මෘත ශරීරයද තැන්පත් කෙළේ අගනා පෙට්ටියකය. ආගමික චාරිත්‍ර සඳහා පූජකවරු ද ගෙන්වනු ලැබූහ. පුතාට ද වලලුකර වටේ සුදු රෙදි පටි බැඳගන්නට නියමකොට වං ලුං ද සුදු ඇඳුම් කට්ටලයකින් සැරසී මෘත දේහය පසුපස ගමන් කෙළේය. ඔහු චිං ට අවසාන ගෞරවය කෙළේ ස්වකීය නෑයෙකුට මෙන්ය. වං ලුං ගේ පුත්‍රයා මේ ගැන තම පියාට ගතු කීවේය:-

"එයා හොඳ සේවකයෙකු බව ඇත්තයි. ඒ උනාට මොනවට ද ඔය තරම් දුක්වෙන්නේ?"

චිං ගේ මෘතදේහය වං ලුං පවුලෙහි සුසාන භූමියෙහිම වළලන්නට කැමති වුන නමුත් පුත්‍රයා "අපේ සීයත් අම්මත් වැතිරී සිටින පොළොවෙ ඔවුන් සමග ඔවුන්ගෙ දාසයෙකුගෙ මළ සිරුර තැන්පත් කරන එක අප ජීවත්ව සිටිද්දීම හොඳ නැතැ" යි කීයේය.

පුත්‍රයන්ගේ විරෝධයට ඇහුම්කන් දුන් වං ලුං කුඩාකල පටන් සෙවනැල්ලක් මෙන් ඇසුරු කළ චිං නැමති ඒ මිනිහාගේ මෘතදේහය පවුලේ සොහොන් බිමේ පවුරේ දොරටුව ලඟ භූමදාන කෙළේය. එපමණකින් සෑහීමකට පත් වං ලුං පුත්‍රයන්ට අමතා "හොඳයි ඔන්න උඹලගෙ කැමැත්ත පරිදි මම ඒක එහෙම කළා. මම මැරුණ පසුත් චිංගෙ සොහොනට හැකිතාක් කිට්ටුවෙන් මාව වළලන්න ඕනෑ" යයි කීයේය.

Scanned by CamScanner

වීංගේ මරණයෙන් පසු වං ලූං ස්වකීය ඉඩකඩම් බලන්නට ගියේ ඉතා කලාතුරකිනි. තනිවම එහි යාම ඔහුට මහන්සිය ද වේදනා ද ගෙන දෙන්නක් වූයේය. එහෙයින් ඔහු හැකිතාක් ඉඩ කඩම් බදු දුන්නේය. මිනිස්සු ද ඔහුගේ සරු සාර ඒ ඉඩම් මහත් කැමැත්තෙන් බදු ගත්හ. ඔහු මේ ඉඩම් බදු දුන්නා මිසක් බිම අඟලක්වත් විකිණීමට අදහස් නොකෙළේය. සියළුම ඉඩම් තමාගේ යයි සිතමින් අභිමානවත් ජීවිතයක් ගත කිරීමට දක්වූ අසාව නිසා ඔහුගේ ඉඩම් ඔහුගෙන් පිටයාමට ඔහු කැමැත්තක් දක්වූයේ නැත.

ඉන්පසු ගමේ මුල් ගෙයි පදිංචියට ඔහුගේ බිරියත් එක් වැඩ කරුවෙකුත් ඔහු විසින් පත් කරනු ලැබුවේය. අබිං උරමින් කාලය ගතකළ මහළු යුවළ බලාගැනීමට පැවරුනේ ද ඒ දෙදෙනාටය. වං ලූං බාල පුතාට කථාකොට මෙසේ කීවේය:–

''උඹ මාත් එක්ක නගරයට වරෙන්. 'පුංචි මෝඩියත්' එහාට එක්කර ගෙන යන්න ඕන. ඈ මගේ කාමරයෙ නවත්ත ගන්න පුළුවන්. දැන් ඉතින් වීං නැති නිසා උඹටත් පාලු ඇති. වීං නැති නිසා 'පුංචි මෝඩීට' අනුකම්පා කරන්නෙ කවුද? ඇයට ගැහැව්වත් නරකට කන්න දුන්නත් කියන්නවත් කෙනෙක් නැහැ නොවැ. උඹටත් මෙහේ ඉඳල වැඩක් නැහැ. දැන් ඉතින් ඉඩම් ගැන උඹට කරුණු කියා දෙන්නෙ කවුද?''

බාල පුතාද පියාගේ යෝජනාවට කැමති වුනේය. වං ලූං ඔවුනුත් කැටුව නගරයේ පදිංචියට ගියෙය. ඉන් පසු වං ලූං ස්වකීය ජීවිතය ඇරඹූ ගමෙහි පිහිටි ගෙදරට පැමිණියේ ඉතාමත් කලාතුරකිනි.

Scanned by CamScanner

මහළු වයස නිසා අවශ්‍යතාවයන්ගෙන් අඩු ජීවිතයක් ගත කිරීමට හැකිවේයයි එතැන් පටන් වං ලූං කල්පනා කෙළේය. දූත් ඔහු නිතර අව්ව තැප තැප ''පුංචි මෝඩිය'' ද පසෙකින් තබාගෙන පයිප්පය ද උර උරා කාලය ගතකරන්නේ සාමයෙනි. ස්වකීය ඉඩම් ද බදුකාරයන්ගේ මාර්ගයෙන් රැකුණේය. එයින් කිසි මහන්සියක් නොමැතිව මුදල් ද තම අතට ලැබුණේය. එහෙත් වැඩිමල් පුත්‍රයා නිසා මේ සාම කාලය නොරැකුණේය. තෘප්තියකට පත්කළ නොහැකි ඒ පුතා දිනක් ඔහුට මෙසේ කීවේය:–

''අපට මේ ගෙට සෑහෙන දේවල් නම් ඔක්කොම හරි. ඒ උනාට ලොකු පවුලක් වසයෙන් කලක් යන කොට අපට මේ ගේ මදිවේවි. මගේ මල්ලිගෙ විවාහයත් තව හය මාසයකින් විතර සිද්ධවෙනව. අමුත්තන් ආවහම ඉඳගන්න දෙන්න මේ තියෙන පුටුත් මදි. ඒ වගේම මේසත් මදි. ඒ මදිවට ගේට්ටුවෙන් ඇතුල්වුන හැටියෙම අමුත්තන්ට එන්නවෙලා තියෙන්නෙ කිලිටු වැරහැලි ඇඳගෙන නිතරම කෑගසමින් සිටින අර දුප්පත් මිනිසුන්ගෙන් පිරුණු ගඳ ගහන කාමර අතරින්. ඒකත් අපට හරි ලජ්ජාවක්. ඉතින් මගේ මල්ලිත් විවාහවුනාම ඒ කාමරත් අපට ඕන වෙනව.''

එවිට වං ලූං විසිතුරු ඇඳුම්වලින් සැරසුන තම පුත්‍රයා දෙස බලා යළිත් දෙනෙත පියාගෙන දිග දුම් උගුරක් ද ඇද තර්ජනාත්මකව ප්‍රශ්න කෙළේය:–

Scanned by CamScanner

''මොකක්? වෙන මොනවද කියන්න තියෙන්නෙ?'' පියා වෙහෙසට පත්ව සිටින බව පුතාට දැනුනේය. එහෙත් ඔහු යළිත් උස් හඬින් කථා කෙළේය:-

''අර කාමර ටිකත් අපට ගන්නයි තියෙන්නෙ. අපේ තත්වයෙ හැටියට අපේ ගේ අපි පිළියෙළ කරගන්න ඕන. අපිට දැන් ඉඩම් තියෙනව, සල්ලි තියෙනව.''

ඉන්පසු වං ලුං තමාටම තොල්මතුරා ගත්තේය. ''ඉඩම් මගේ තමයි. උඹල ඒවට කවදක්කත් අත පෙව්වෙ නැහැ.''

''හොඳයි හොඳයි තාත්තේ''යයි කෑගැසූ තරුණයා ''උඹ තමයි මාව උගතෙකු කෙළේ. දැන් ඉතින් මම ඉඩම් හිමියෙකුගෙ පුතෙකුවගේ ඉන්න හදනකොට ඔබ බණිනව; මටත් මගේ බිරියටත් සලකන්නෙ හරකුන්ට වගේ''යයි කියමින් වේගයෙන් ආපසු හැරී ඉවත් වන්නට තැත් කෙළේ, මිදුලෙහි තිබුන ''පයින්'' ගසෙහි හිස ගසාගෙන සියදිවි නසා ගන්නට සැරසෙන්නෙකු මෙනි.

මෙයින් වං ලුං භීතියට පත්වුනේ ඔහු ජීවිතයට අනර්ථයක් කරගනිතියි සිතාගෙනය. ඔහු නිතර කිපෙනසුලු මිනිසකු බවද සිහිවුනේය. එහෙයින් ඔහු ''හා! හා! උඹට ඕන විදියක් කරපන්! මට කරදර කරන්න විතරක් එපා''යයි හඬ නැගුවේය.

මෙය ඇසූ පුත්‍රයා ප්‍රීතියට පත්වුනේ පියාගේ අදහස වහා වෙනස් කරගත් නිසාය. ඔහු වහ වහා ''සුවුව්''හි සිට ගෙන ආ ගෘහභාණ්ඩ මිලයට ගත්තේය. දක්ෂ ශිල්පීන් විසින් කැටයම් කරනු ලැබූ ඇඳ පුටු මේස මේ ගෘහභාණ්ඩ අතර වූහ. කුඩුමහත් මල් පෝච්චි ද බිත්තිවල එල්ලීමට රූමත් කාන්තාවන්ගේ ඡායා රූප ද හැකිතාක් ඔහු මිලයට ගත්තේය. මල්පාත්ති සකස් කොට ඒ අවට තැබීමට වර්ණාලේපකොට සකස් කළ නොයෙක් ගල් වර්ගද ඔහු දකුණෙන් ගෙන් වීය. දින කීපයක් ගතවනතෙක් ඔහුට මුළු කාලය යොදන්නට සිදුවුනේ ගෙය සකස් කිරීමේ කටයුතු වෙනුවෙන්ය.

බඩු ඒ ඒ තැන්වලින් ගෙන ඒමටද නිතර එහා මෙහා යාමට ඔහුට සිදුවුනි. ඔහු දුප්පතුන් වසන කාමර පේලිය පසුකර යන සෑම විටම නාසය අල්ලාගෙන ගමන් කෙළේ එහි දුගඳ ඉවසිය නොහැකිවුන නිසාය, ඒ මිනිස්සු ඔහු නොරිස්සුවේය. ඔහු එම කාමර පෙල පසුකර යන සෑම විටකම ඒ මිනිස්සු සිනාසෙමින්

Scanned by CamScanner

''අනේ අනේ එයාට එයාගෙ තාත්තගෙ ගෙදර ඉස්සරහ තිබුන කුණු පෝරවළේ ගඳ මතක නැතිවුන හැටි''යයි කීහ.

ඔවුන් කී ඒ වචන ඔහුට ඇසුණේ නැත. අළුත් අවුරුද්ද එළඹුනේය. කාමරවලට කුලිය අය කරන කාලයද පැමිණියේය. ගතවුනු අවුරුදුවලට වඩා මේ වාරයෙහි කාමරවල බදු කුලිය වැඩිකර තිබෙන බව දුප්පතුනට වැටහුණි. තනි පුද්ගලයෙකු ඒවාට විසාල මුදලක් ගෙවා ගන්නට සැරසෙන නිසා තමන්ට මේ වාරයේ ඒ කාමර අත්හැර දමන්ට සිදුවන බව ඔව්හු දැනගත්හ. වං ලුං ගේ කපටි පුත්‍රයා දුප්පතුන්ට නොදැනෙන්නට මේ කාමර පෙල ගැනීමට කටයුතු පිළියෙළ කරගත්තේ වෘද්ධ හ්වෑං රදළ තැනගේ පිටරට සිටින පුත්‍රයා සමග ලිපි ගනු දෙනු කරගැනීමෙනි. මේ පරණ ගෙයින් ඉතා වැඩි මුදලක් ලබාගැණීම විනා වෙන කිසිවක් රදළ පුත්‍රයා ද බලාපොරොත්තු නොවූයේය.

දුගී ජනයා ද ඒ කාමර පෙල හැර ගියේ පොහොසතුන්ට අවලාද කරමිනි. තම තමන්ගේ බඩු බාහිරාදිය පොදි බැඳගෙන මගට බැස ගමන් ගත් ඔව්හු ''හා! හොඳයි අපටත් වාරයක් ඒවි'' යයි ද තොල්මතුරා කීහ.

මේ කිසිත් වං ලුං නොදත්තේය. දැන් වං ලුං ගේ සිතෙහි වගකීම් භාරයක් නැත. ඔහු සතු එකම කාර්‍යයවූයේ සුවපහසු කාමරයකට වී කමින් බොමින් නිදාගනිමින් මහළු කාලය ගතකිරීම පමණකි. සියල්ලෙහි පාලන බලය අතට ගත් වැඩිමල් පුතා දක්ෂ වඩුවන් හා කුලිකරුවන් ගෙන්වා ගේට්ටු ද දුප්පත් ජනයා විසින් කඩා බිඳ දමා තිබුන කාමර ද මිදුල් ද පොකුණු ද ඉතා අලංකාර ලෙස ප්‍රකෘතිමත් කර වීය. එහිවූ පොකුණුවලට රන්වන් මාලුවන්ද ගෙනත් දැම්ම වීය; එහි ඕලු ද නෙලුම් ද සිටවීය. ඉන්දියන් උණ පඳුරු ද වත්තෙහි සුදුසු තැන්වල වගා කෙරෙව්වේය. වං ලුං ගේ පුතාත් ඔහුගේ බිරියත් මේ ප්‍රතිසංස්කරණ කටයුතුවලින් ඇතිවුන අලංකාරය නරඹමින් කාමරයෙන් කාමරයට ද මිදුලෙන් මිදුලට ද පොකුණෙන් පොකුණට ද නිතර නිතර ගමන් කළහ. ඇතැම් තැන්වල ඇති අඩුපාඩු බිරිය විසින් පෙන්වා දුන්විට ඔහු එයට සැලකිල්ලෙන් කන් දී ඒවා ද සකස් කිරීමට ඉටාගත්තේය.

වං ලුං ගේ පුතාගේ කටයුතු ඇසූ නගරයේ මිනිස්සු තැන් තැන්වලට එකතුවී ''හා! ඔන්න ආයිමත් මහ ගෙදරට ධනවතුන්

ආවා''යයි කියමින් මහගෙදර ගැන සාකච්ඡා කරන්නට වූහ. ඔව්හු ''වං නැමති ගොවියා''යයි ඇමතූ මිනිහාට ''වං නැමති ධනවතා''යයි අමතන්නට–කියන්නට වූහ.

මෙතෙක් මේ ගෘහයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වරින්වර මුදල් වියදම්වූනේ වං ලුං ගේ අතිනි. තමාවෙත පැමිණි වැඩිමල් පුතා ''මට රිදී කාසි සීයක් ඕන. ගේට්ටුවක් අළුත් වැඩියා කරගන්න තියෙනව ඒකට සල්ලි ටිකක් ඇත්නම් හොඳයි'' යනාදී චාටු බස් කිය කියා මුදල් ටික ටික ඉල්ලාගත් නිසා පුතාට දුන් මුදල් ගැනද වං ලුං ට හරි අවබෝධයක් නොවීය. වං ලුං ද ඉල්ලන සැමවිටකම පුත්‍රයාට මුදල් දෙමින් විවේකයෙන් කාලය ගත කෙළේය. සැම අස්වැන්න කාලයකම මුදල් පහසුවෙන් තමාට ලැබුන නිසා මෙසේ දීමට ද ඔහුට අපහසුවක් නොවීය.

දිනක් හිරු තාප්පය උඩින් දිස්වන්නට ද පෙර දෙවන පුත්‍රයා අවුත් මෙසේ කීවේය:–

''ඇයි තාත්තෙ මෙච්චර සල්ලි අහක දන්නෙ. අපට මොනවටද මේ මාලිගාවක් වගේ ගෙවල්. මේ ගේ වෙනුවෙන් දීපු මුදල පොළියට දුන්න නම් පවුම් බරගණනක් අපට එනවනේ. මේ පොකුණු වලින්–මේ මල්ගස් වලින් – මෙ ගෙඩි නැති ගස්වලින් ඇති වැඩේ මොකක්ද?''

මේ කථාවෙන් වං ලුං දුටුවේ සහෝදරයන් දෙදෙනා අතර ඇතිවිය හැකි භෙදයක පෙර නිමිත්ය. තමාගේ විවේකය ඉක්ම–නින්ම නැතිවී යතැයි සිතූ වං ලුං ''හා! මෙ සැරසෙන්නෙ උඹෙ මඟුල් කෑමට''යයි කීවේය.

එවිට ද තරුණයා කපටි හිනාවක් පාමින් යළිත් කථා කෙළේය:–

''මනමාලිගෙ වටිනකම වගේ දස ගුණයක් මඟුල් කෑම වෙනුවෙන් වියදම් කරණ එක මොන විකාරයක්ද? ඔබ නැති දවසක අපි දෙන්නට බෙදගන්න තියෙන මේ ධනය අයිය ආඩම්බරයට වියදම් කරණ එක හරි නැහැ.''

වං ලුං දෙවන පුත්‍රයාගේ අදහස් දත් හෙයින් ඔහුම පක්ෂව කථා කෙළේ ඔහු සතුසන්නටය.

''හා! හා! මම අද ඉඳල ඒ වියදම් නවත්වන්නම්. උඹ කියන කථාව ඇත්ත.''

මෙතෙක් වියදම් කළ මුදල් පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් තරුණයා ගෙනැවිත් තිබුනේය. වං ලූං ඒ ලැයිස්තුවෙ දිග ප්‍රමාණය දැක' මෙසේ කීවේය.

''මම තවම උදේට කැවෙත් නැහැ. ඒ නිසා කලන්තෙ වගෙයි. හොඳයි පස්සෙ මම මේකට කරණ දෙයක් කරන්නම්.''

වං ලූං ස්වකීය කාමරයට ගියපසු දෙවන පුත්‍රයා එතැනින් ඉවතට ගියේය.

ඔහු එදින සවස වැඩිමල් පුත්‍රයා ගෙන්වා මෙසේ කීවේය:–
''ඔය තීන්ත ගාන--සායම් වැඩ අත්හැරල දමාපන්. කොච්චර සායම් ගෑවත් අපි ගොඩේ මිනිස්සු.''

''අපි ගොඩේ අය නොවෙයි තාත්තෙ. නගරයෙ මිනිස්සු අපට කියන්න පටන් අරන් තියෙනව 'වං නැමති ධනවත් පවුලෙ'යි කියල. ඉතින් අපි ඒ නමට කැතවෙන විදියට ජීවත් වෙන එක හොඳ නැහැ. අපි කවුරුත් ඒ ගෞරවය ආරක්ෂා කරගන්න ඕන.''

වැඩිමල් පුතා කියන අයුරු නගරයේ මිනිසුන්ගේ මේ කතාව වං ලූං ට අසන්නට නොලැබුනේ හුඟ දවසකින් ඔහු නගරයට නොගිය නිසාය. පුතා කියූ ඒ පුවත ඔහුගේ ප්‍රීතියට හේතුවිය.

''ඔව් ධනවත් පවුල් වුනත් හැදෙන්නෙ ඉඩම්වලින්, ඉඩම් තමයි ඒවට මුල.''

ඔහු පුතා හා දිගින් දිගට වාද කිරීමට අකමැති වුනේය.

''මම කියන්න ඕන තරම් දේවල් උඹට කියල ඇති. ඔය මුදල් නාස්තිකිරීම නවත්වපන්''යි හේ කීය.

ඇඳිරි වැටීගෙන එන නිසා කථාව නතර කිරීමට වං ලූං අදහස් කළ ද පුත්‍රයා තව තවත් කථාවට සැරසුනේය.

''හොඳයි ඒ ඇති. මට කාරණයක් කියන්න තියෙනව.'' ඉක්බිති වං ලූං දුම් පයිප්පය පොළොවේ ගසා ''මට නිදහසේ ඉන්න දෙන්නෙ නැද්ද'' යි තර්ජනය කෙළේය.

''මම මේ කියන්න හදන්නෙ මා ගැනවත් මගේ පුතා ගැනවත් කාරණයක් නොවෙයි. මගේ බාල මල්ලි ගැන කාරණයක්. එයාට

Scanned by CamScanner

මෝඩයෙකු වගේ හැදෙන්න ඉඩ දුන්නහම කොහොමද? එයාටත් යමක් ඉගැන්නුවහම නරකද?''

මේ කථාවෙන් පසු වං ලුං උඩ බැලුවේ ඔහු කියූ ඒ කාරණය අළුත් දෙයක් වූ නිසාය. ඔහු තම බාල පුතා ගැණ තීරණය කෙළේ බොහෝ කලකට පෙරය. එහෙයින් මෙසේ කීවේය :-

''මේ ගෙදරට තවත් අකුරු උගත් අය ඕන නැහැ. මම මැරුණට පසුව ඉඩම් බලාගෙන ඉන්න පුරුදු කරන්න ඕන එයාටයි.''

''ඔව් ඒ වුනාට එයා මේක හන්ද හැමදම රෑට අඬනව. එයා ඔච්චර කෙට්ටුත් ඒක'' යි පුත්‍රයා පිළිතුරු දුනි.

වං ලුං මෙතෙක් බාල පුත්‍රයා ගැන කිසිම දෙයක් නොසෙව්වේ ''ඔහු ගොවියෙකු විය යුතුය'' යි තීරණය කොට තිබුන හෙයිනි. මෙතෙක් නොසොයා සිටි ඒ කරුණ වැඩිමල් පුතා විසින් මතක් කරණු ලැබූ විට එය ඔහුට අලුත් දෙයක් විය. වං ලුං වීසි කළ දුම් පයිප්පය අහුලා ගනිමින් ''උඹ එහෙනම් එයාගෙන් ඒ ගැන අහල බැලුවද?'' යි ඇසුවේය.

''තාත්තම අහල බලන්න'' යයි තරුණයා කීය. ''අහල බලන්න නම් පුළුවන්. මම කල්පනා කරන්නෙ මේ ඉඩම් – කඩම් බලාගන්නත් කෙනෙක් ඉන්න ඕනෙයි කියන එකයි.''

''ඇයි තාත්තෙ එහෙම කියන්නෙ? ඔබේ එක පුතෙක් වත් දසයො වගේ වැඩ කරන්න උවමනාවක් නැහැ. එහෙම වැඩ කරන කොට මිනිස්සු දෙස් කියාවි අන්න අර මිනිහ කුමාරයෙකු වගේ ඉඳගෙන පුතාගෙන් හරකෙකුගෙන් වගේ වැඩ ගන්න හැටි කියල.''

පුත්‍රයා මෙසේ කීවේ තම පියා අනුන්ගේ කීම් ගණන් ගන්නා කෙනෙකැයි සැලකූ නිසාය.

''ගුරුවරයෙකු ගෙන්වල උනත් එයාට උගන්වන්න අපට පුළුවන්. එයාට ඕන නම් දකුණේ ස්කෝලෙකට උනත් පිටත් කළ හැකියි. ඉතින් ඔබට උදව්වෙන්න මම ගෙදර ඉන්න නිසාත් අනිත් මල්ලි නගරයෙහි වෙළඳාම ඉගෙණ ගන්න නිසාත් මේ කොලුවට කැමති දෙයක් කරන්න ඉඩ දෙමු.''

අන්තිමේ දී ''එයාට මා ළඟට එන්න කියාපන්'' යයි කීවේය.

වං ලුං ගේ තෙවෙනි පුත්‍රයා උස හීන්දෑරි කොලුවෙකි. මවගේ නිශ්ශබ්දතාව හැරෙන්නට පියා ගේ හෝ මව ගේ දේහ ලක්ෂණයක්

ඔහුගේ සිරුරෙහි නොවීය. පියාට හෝ මවට වඩා ඔහු රූමත් වීය. මේ පවුලෙහි වූවන් අතර ඔහු රූමත් කමින් දෙවෙනි වූයේ වං ලුං ගේ දෙවෙනි දියණියට පමණකි.

ටික වේලාවකට පසු පියා වෙත මේ තෙවෙනි පුතා පැමිණියේය. පියා ඔහු දෙස මඳ වේලාවක් බලා සිට මෙසේ ඇසුවේය :-

"උඹේ ලොකු අයිය කියන්නෙ උඹ ඉගෙණගන්න ආසයි කියල?"

"ඔව්" යයි බාල පුත්‍රයා පිළිතුරු දුන්නේ දෙතොලවත් නොසෙල්වෙන පරිදිය.

වං ලුං තම දුම් පයිප්පයේ අළු ගසා දමා එයට අලුත් දුම්කොළ දමා මහපටැඟිල්ලෙන් තද කරමින් "මෙච්චර මට පුත්තු ඉඳලත් ඉඩකඩම් බලා කියාගෙන ඉන්න එකෙක් නැතිවුන හැටි!" යයි කීවේය. පියා ශෝකයෙන් කියූ මේ වචන පුතා නිශ්ශබ්දව අසා ගෙන සිටියේය. ඔහුගේ නිසල බවෙන් වං ලුං කෝපයට පත්වුනේය.

"මොකොද උඹ කථා නොකරන්නෙ? උඹ ඉඩම්වල ඉන්න අකමැතිය කියන්නෙ හැබෑද?"

"ඔව්" යන එකම වචනයෙන් පුතා එයට පිළිතුරු දුන්නේය.

මේ පුත්‍රයන් සියළුදෙනාම තමාගේ තත්වයට වැඩි බවත් තමාගේ මහළු අවස්ථාවෙහි ඔවුන් කරදරයට හේතුවන බවත් සිත සිතා මෙසේ ද කීවේය :-

"උඹ මොනවා කළත් මට කමක් නැහැ. පලයන් ඉතින්!"

එවිට දරුවා වහා එතැනින් පිටත්ව ගියේය. වං ලුං තනිවම හිඳගෙන තමාටම මෙසේ කියාගත්තේය :-

"මේ දූරු දෙන්න මගේ පුත්තුන්ට වඩා මට හොඳයි. උන්ගෙන් කිසි කරදරයක් නැහැ."

සන්ධ්‍යාලෝකය පැතිරෙත්ම වං ලුං ගේ කෝපය ද පහව ගියේය. කවදත් කරන්නාක් මෙන් ම මේ වරද ඔහු පුතාගේ අදහසටම ඉඩදුන්නේය. යලිත් වැඩිමල් පුත්‍රයා කැඳෙව්වේය.

"එයාට ඕන එකක් කරන්න කියාපන්. කැමති නම් ගුරුවර යෙකු ගෙන්න දීපන්. හැබැයි මට නම් කරදර කරන්න එපා!"

ඉන්පසු දෙවන පුත්‍රයා කැඳවා කීවේ "මගේ ඉඩම් බලා ගන්න කෙනෙක් නැති නිසා මේ බදූ ඉඩම් වලින් එන මුදල් ගැන

Scanned by CamScanner

සොයල බලාපන්. උඹට ගණනුත් පුළුවන් නිසා මගේ කළමනා කාරය වෙයන්'' යන්නය.

පියා විසින් තමාට පත් කළ මේ පදවිය ගැන දෙවෙනි පුතා ප්‍රීතියට පත්වූයේ මෙතැන් පටන් ලැබෙන ආදයම අරපරෙස්සමෙන් වියදම් කළ හැකි යයි සිතූ නිසාය.

දෙවන පුත්‍රයා තමාගේ අනික් පුත්‍රයන්ට වඩා ගතිගුණ අතින් හුඟක්ම වෙනස් බව වං ලුං දැන සිටියේය. ලඟදී එළඹුන මඟුල් දිනයේ දී පවා මස් හා මද්‍යපානාදියට යන මුදල ගැන ඔහු සැලකිලිමත් වූයේය. ඔහු කෑම මේස බෙද දුන්නේ ද ඉතා ප්‍රවේසමිනි. කෑම පිළියෙළ කෙළේද අමුත්තන්ගේ හැටියටය. හොඳම කෑම වර්ගවලින් සංග්‍රහ කෙළේ එම කෑම වර්ගවල මිල දන්නා නගරයේ මිත්‍රයන්ට පමණකි. බදු කාරයන්ටත් ගොඩේ මිනිසුන්ටත් ඔහු සංග්‍රහ කෙළේ එතරම් යහපත් නොවන කෑම වර්ග වලිනි. මේ අයට කෑම මේස පිළියෙළ කෙළේ ද මිදුල්වලය. නිතර නිතර රළු ආහාරයට පුරුදුව සිටි ගොඩේ මිනිසුන්ට තරමක් හොඳ ආහාර ඉතා හොඳ වන බවද ඔහු දැන සිටියේය.

ගෙදරට එන තෑගි බෝග භාරගත්තේ ද දෙවෙනි පුතාය. දූසි දූස්සන්ට වැටුප් වසයෙන් ගෙව්වේ ද ඉතා සුළු මුදලකි. කෝකිලාවගේ අතට ඔහු රිදී කාසි දෙකක් දැමූ විට ඇය අන්‍යයන්ටද ඇසෙන පරිදි අවඥ සහගතව මෙසේ කීවාය :–

''උසස් පවුල්වල අය නම් මෙහෙම දෙන්නෙ නැහැ. මට පේන්නෙ මේ අය මේ ගෙදරට අයිති නැති අය වගෙයි.''

මෙය අසා වැඩිමල් පුත්‍රයා ලජ්ජාවට පත්වුනේය. ඔහු ඇගේ කටට බිය නිසා රහසේම තවත් රිදී කාසි කීපයක් දුන්නේය. මේ කරදරය සිදුවුනේ මනාලියගේ දෝලාව ගෙදරට ලඟාවුන දිනයෙහි අමුත්තන් මේස වටා අරාගෙන සිටිද්දීය.

වැඩිමල් පුතා තමා ගේ මිත්‍රයන් අතුරෙන් මේ උත්සවයට කැඳවූයේ වඩා වැදගත් නොවූ ටික දෙනෙක් පමණකි. මනාලිය ගැමි තරුණියක නිසාත් මල්ලිගේ මසුරු කම නිසාත් වැඩිමල් පුත්‍රයා අතිශයින්ම ලජ්ජාවට පත්වුනේය.

''මගේ මල්ලී තෝරාගෙන තිබෙන්නෙ මැටි බඳුනක්. අපේ තාත්තගෙ තත්වයෙ හැටියට මැණිකක් වගේ තරුණියක් සොයා ගන්නට තිබුනා'' යයි අයියා කීවේ අවඥ සහගතවය.

Scanned by CamScanner

නව යුවළ පැමිණ තමන්ට හා තම බිරියට ආචාර කරනවිට ඔහු රළු ලෙස හිස වැනීම පමණකින් එම ආචාරය පිළිගත්තේය. වැඩිමලාගේ බිරිය ඔවුන්ගේ ආචාරය පිළිගත්තී මහත් අමාරුවෙන් මදක් නැමී ය.

වං ලුං ගේ මේ නිවසෙහි වාසයකළ සියල්ලන් අතුරෙන් වං ලුං ගේ මුණුබුරා හැර සාමයෙන් හා සැපයෙන් කල් ගෙවූ වෙන කෙනෙක් නැතැයි වං ලුං ට වැටහුනි. වං ලුං පවා මේ දිනවල මහා මන්දිරයක වාසය කලත් තවමත් ජීවත්වන්නේ අඩියකින් දෙකකින් තම කුඹුරුවලට යාහැකි තරම් දුරකින් පිහිටි අර මැටි ගැසූ අඳුරු ගේ පිළිබඳ සිතින් සිහින මවමිනි.

පුතුන් අතර ද සන්සුන් කමක් දක්නට නොලැබුනි. වැඩිමල් පුතා නොසන්සුන් බවට පත්වූනේ මල්ලී ගෙදර වියදම මසුරුකමින් කරණ නිසා නාගරිකයන් දෝෂාරෝපනය කරතියි සිතූ හෙයිනි. මහ ගේට්ටුවෙන් ගොඩේ මිනිසුන් ඇතුල්වීම ගැන ද ඔහු රුචි නොකෙළේය. දෙවැන්නා නොසන්සුන්වූයේ ගෙදර කටයුතු වලට මුදල් වියදම් වීම ගැනය. තෙවෙනි පුත්‍රයා නොසන්සුන්වූයේ ගොවි තැන සඳහා මිඩංගු කළ කාලය ඉගෙණීමට ආපසු ඇදගැණීමට නොහැකිවුන නිසාය.

එහෙත් මේ සියල්ල මධ්‍යයේ එහා මෙහා දුව පනිමින් තමා ගේ ජීවිතයෙන් සැහීමකට පත්වූවෙක් ද වීය. ඒ වං ලුං ගේ මුණුබුරාය. මේ පොඩ්ඩා මේ විසාල ගෙය ගැන හැර අන් කිසිම තැනක් ගැන හෝ දෙයක් ගැන නොසිතුවේය. ඔහුගේම වූ මේ ගෙය ඔහුට කුඩා වූවක් හෝ විසාල වූවක් නොවීය. පියාත් අම්මාත් සීයාත් ඔහුගේ සේවය සඳහා නිතර සැදී පැහැදී සිටියහ. වං ලුං සාමය ද සැනසීම ද සතුට ද ලැබුවේ මේ පොඩ්ඩා ගෙනි.

සීයා දෙස බල බලා මේ පොඩ්ඩා ඇද වැටෙන සෑම මොහොතකම, ඔහු වෙත දුවගිය සීයා කොතෙක් ඒ පොඩ්ඩා නැගිටුවා සිටෙව්වද සැහීමකට නම් පත් නොවූයේය. දරුවා නොවැටී සිටින්නට ඔහු කළ එකම දෙය නම් තමාට තම පියා කළාක් මෙන් රෙදි දරණුවකින් දරුවා වටකිරීමය. මිදුලෙන් මිදුලට ගිය මේ පොඩ්ඩා පොකුණුවලට එබී එබී එහි පීනූ රන්වන් මාලුවන් දෙසට අත්පොඩි දිගු කෙළේය. මල් පඳුරෙන් මල් පඳුරට ගිය මේ පොඩ්ඩා මල් ද කඩා ගත්තේය.

Scanned by CamScanner

වං ලුං වෙත සාමය වැඩි වැඩියෙන් කැඳවන්නට මෙන් පුතාගේ බිරිය අවුරුදු පතා පුතෙකු බැගින් වැදුවාය. යම් විටක කිසිවෙකු වැඩිමල් පුතාගේ කාමරයට තව එකෙක් වැඩි උනා යයි කිවහොත් වං ලුං සිනාසී එයට කියන්නේ

''අපට කාටත් සෑහෙන්න කුඹුරු තියන නිසා ඒක හොඳය'' යන වචනයි.

දෙවන පුතා ගේ බිරිය ද ප්‍රසූතියට ලංව සිටියාය. ඇය දියණියක වැදුවේ ඇයගේ නෑනාට දක්වූ සැලකිල්ල ප්‍රකාශ කරන්නාක් මෙන්ය. මෙසේ පස් අවුරුදු කාලපරිච්ඡේදයක දී වං ලුං මුණුපුරන් සතර දෙනෙකුගේ ද මිණී බිරියන් තිදෙනෙකුගේ ද සීයා කෙනෙක් වීය. ඉන්පසු මුළු ගෙයම මුණුපුරන්ගේ හා මිණිපිරියන් ගේ හැඬීම් හා සිනාසීම් හඬින් පිරී පැවතුනි.

මේ පස් අවුරුදු කාලය ඇතුළත බාප්පාට හා ඔහුගේ බිරියට අබිං සැපයීම ද වං ලුං විසින් අමතක නොකරනු ලැබූවකි. අධික සීත කාලයක් ද උදාවුනේය. අවුරුදු තුනක කාලයකින් පසු ලැබූ මේ සීත කාලයෙහි නගරය වටා තිබුන අගලෙහිද දිය මිදුනේය. එහෙයින් ඒ අගළ තරණය කිරීමට ඔරු පාරු අවශ්‍ය නොවීය. සියල්ලෝම මිදුන අයිස් මත ගමන් කළහ. මේ සීතලය, ලොම් ඇඳුම් වලින්ද වළකා ගත නොහැකි වීය. මහගෙදර සෑම කාමර යක් ම අඟුරු බඳුන් තබා උෂ්ණවත් කොට තිබුණි. එහි මිනිසුන් ආශ්වාස ප්‍රාශ්වාස කෙළේ ද මහත් වෑයමෙනි.

මේ කාලය වන විට බාප්පා සහ ඔහුගේ බිරිය අබිං ඉරීමෙන් ඇට සැකිලි බවට පත්ව සිටියහ. ඔව්හු රැ දවල් දෙක්හිම වියළී ගිය කෝටු දෙකක් මෙන් ඇඳෙහි වැතිරගත්තෝය. තම බාප්පා අන්තිම හුස්ම හෙලමින් වෙසෙන බව අසා වං ලුං ඔහු බැලීමට ගියේය. තව පැය කීපයකට වඩා මහල්ලාට ජීවත්විය නොහැකි බව ඔහුට දැනුනේය. එවිට වං ලුං තරමක් හොඳ ලීයෙන් කළ මිනීපෙට්ටි දෙකක් ගෙන්වා මහල්ලා වැතිර සිටින කාමරයට යැව්වේ තමාට ද සලකන්ට කෙනෙකු සිටිතැයි සිතමින් මහල්ලා සැනසෙතැයි සිතූ නිසාය. එවිට බාප්පා කෙඳිරිගාමින් මෙසේ කීවේය :- ''අනේ මගේ අර ඇවිද ඇවිද ඉන්න එකා නෙවෙයි පුතා උඹයි මගේ පුතා.'' මහල්ලාට වඩා තරමක ශක්තිමත් ගතියක් දක්වූ ඔහුගේ බිරිය ද තොල් මතුර මතුරා මෙසේ කීවාය :-

Scanned by CamScanner

''මම මැරෙන්න ඉස්සෙල්ල ඒක මෙහාට නාවෙත් අප පරම්පරාව රැකෙන්නට ඔහුට තරුණියක් ගෙනැවිත් දීමට උඹ පොරොන්දු වෙන්න ඕන.''

වං ලුං එයට ද පොරොන්දු වුනේය.

එහෙත් වං ලුං නොමැති විටක–වං ලුං නොදන්නා මොහොතක බාප්පා අවසන් හුස්ම හෙලුවේය. ඔහු මියගිය බව සෙස්සන්ට දැන්වූයේ දිනක් සන්ධ්‍යාවක සූප් භාජනයක් රැගෙන ඔහු වෙත ගිය සේවිකාවක විසිනි.

අධික සීතල දිනයක – හිම වලාකුල් පාවෙද්දී – සීත සුලං හමද්දී – වං ලුං බාප්පාගේ මිනී පෙට්ටිය තැන්පත් කෙළේ පියාගේ සොහොනටත් තමාගේ සොහොන සෑදෙන තැනටත් අතරිනි.

මින්පසු වං ලුං මුළු පවුලටම ශෝකය පළකරණ ඇඳුම් අඳින්නට නියම කෙළේය. එසේ නියම කෙළේ බාප්පාගේ මියයාම ඉවසාගත නොහැකි වුන පාඩුවක් වූ නිසා නොව විශාලම පවුලක නෑදෑයෙකු මිය ගිය විට එසේ කරන නිසාය. ඔව්හු අවුරුද්දක්ම එසේ ශෝකයේ ලකුණු වලින් යුක්ත වූහ.

වං ලුං වයසක කුඩම්මා ද මහගෙදරට කැඳවා ගෙන ගියේය. ගෙයි ඈත කෙළවරේ කාමරයක් වෙන්කොට දී සාත්තුව සඳහා දසියක් වෙන් කරණ ලෙස ද කෝකිලාට නියම කෙළේය. මැහැලිය ද දිනපතා අබිං උරමින් ඉතා සතුටින් එහි කාලය ගත කළාය. ඇය පසෙකින් වූ මිනීපෙට්ටිය ද ඇයගේ සතුටට හේතු වීය.

වරක් ශක්තිමත්ව හා තරබාරුව විසූ ඇය දැන් ඉතා කෘශය, සිහින්ය, දුබලය. මෙයට අවුරුදු ගණනකට පෙර මේ මන්දිරයෙහිම ඇද වැටී මිය ගිය මහළු රදළ නෝනාගේ අවතාරයක් මෙන් ඇය ඇඳෙහි වැතිරී සිටියාය.

Scanned by CamScanner

ජීවිතයේ කිසි කලෙකත් යුද්ධයක් නොදුටු කෙනෙකි වං ලුං. දකුණේ නගරයක සීත සෘතුව ගතකරමින් සිටිද්දී හෝ වෙන යම් අවස්ථාවල දී ඔහු යුද්ධයේ නාමය ඇසුවා විනා යුද්ධයේ තත්වය නොදැක්කේය. එහෙත් ඔහු කුඩා කල පටන් වරින් වර ''බටහිර පැත්තේ ඔන්න යුද්ධයක්, උතුරු පැත්තේ මේ වර යුද්ධයක්, වයඹ පැත්තේ දැන් යුද්ධයක්'' යන රාවය පමණක් අසා පුරුදුය. එහෙයින් ඔහුට ''යුද්ධය'' යනු අහස-පොළොව හෝ ජලය වැනි දෙයකි. ගෙදර දබරයක් වූ විටක හෝ රක්ෂාවක් නැතිව බඩගින්නේ සිටින්නට වූ විටක ''අපි යුද්ධයටවත් බැඳෙන්න ඕනෑ ය'' කියන මිනිසුන් ඔහු නොයෙක් වර දැක තිබුනි. වං ලුං ගේ පුතා ද වරක් එසේ කියා ඇති බව ඔහුට වරින් වර මතක් වුනේය. වං ලුං මහළු වයසට පත්වන තුරුම ඔහුට ඈත්ව තිබුන ''යුද්ධය'' ළඟ ළඟම එන බව දිනක් දැනගත්තේ වෙළඳ පොලෙහි සිට පැමිණි දෙවෙනි පුත්‍රයා ගෙනි. දහවල් කෑමට ගෙදර පැමිණි ඔහු තම පියා අමතා මෙසේ කීවේය:–

''දැන් දකුණෙ යුද්ධයක් පටන් අරගෙන තියෙනව. එය ළඟ ළඟම එන නිසා ධාන්‍ය මිල ඉහළ නැගීල. අපේ ධාන්‍ය තොගය ටිකක් පහුවෙනකන් තියාගන්න ඕන. එතකොට ලොකු මුදලකට විකුණන්න පුළුවන්.''

දහවල් කෑම කමින් මේ පුවත කියූ දෙවෙනි පුතාට වං ලුං මෙසේ කීවේය :–

Scanned by CamScanner

"ඒක හරි පුදුමයක්. මම හරි ආසයි මේ යුද්දෙයි කියන්නෙ මොකක්ද කියල බලන්න. මම ඒක කවදක්කත් දැකල නැති එකක්."

යුද්ධය පිළිබඳව මොහොතකට පෙර නොමැති වූ භයක් හදිසියෙන් ඔහු තුළ හටගත්තේ දුප්පතෙකු වසයෙන් දකුණේ නගරයක ජීවත් වුන කාලයේ යුද්ධ භටයන් විසින් තමා අල්වා ගන්නට තැත් කිරීම සිහිවුන විටය. ඉක්මනින් ම ඒ හැඟුම පහව ගියේ තමා දැන් පොහොසතෙකු නිසා මීට පසු එවැන්නක් නොවෙතියි සැලකූ නිසාය. එහෙයින් යුද්ධය බැලීමේ ආසාව යළිත් ඔහුට ඇති වුනේය.

"හොඳයි ධාන්‍ය මිලට ඕන දෙයක් කරපන්. ඒක උඹේ වැඩක්" යයි කියූ පියා එළඹෙන යුද්ධය නොඉවසිල්ලෙන් බලාපොරොත්තු වුනේය.

කැමති සේ නිදගනිමින් ද දුම් පයිප්ප උරමින් ද "පුංචි මෝඩියා"ගේ සුව දුක් විමසමින් ද මුණුපුරා සමග සෙල්ලම් කරමින් ද වං ලුං කාලය ගත කෙළේය.

පළුහැටි රංචුවක් මෙන් වයඹ දෙසින් මිනිසුන් සමූහයක් නගරයට ගලා ආවේ ගිම්හානයේ ප්‍රථම දිනයේ උදයක ය. ඒ උදයෙහි සිදුවන්නට යන්නේ කුමක් දැයි නැරඹීමට වැඩකරුවෙකුත් සමග දෙරටුව වෙත ගොස් සිටි වං ලුං ගේ කුඩා මුණුබුරා දුඹුරු පාට කබා ඇඳගත් "මිනිස් පේලි" දැක යලි සීයා වෙත දුව අවුත් "සීයෙ, බලන්න අර කවුද එන්නෙ" යයි හඬ නැඟුවේය.

දරුවා ප්‍රීතිමත් කිරීම සඳහා වං ලුං ඔහු ද කැඳවා ගෙන දෙරටුව ළඟටම ගියේය. මුළු නගරයේ සෑම වීථියක් ම මේ මිනිසුන්ගෙන් පිරී තිබෙන අයුරු ඔහුට පෙනුනේය. ඔවුන් දෙස කල්පනාවෙන් බලාසිටි වං ලුං ට වැඩිදුරටත් පෙනුනේ සෑම කෙනෙකුම පිහියක් වැනි දෙයක් සවි කළ කිසියම් ක්‍රමයක ආයුධයක් රැගෙන එන බවයි. සෑම කෙනෙකුගේ ම මුහුණක රළු බවෙහිත් තද පරුෂ ලකුණු පිළිබිඹු වී තිබුනි. මොවුනතර සිටි වයසින් අඩු වූවෝ ද රළු බවින් තද බවින් පරුෂ බවින් අඩු නොවූහ. ඔවුන්ගේ දරුණු මුහුණු දුටු වං ලුං "අපි යමු පුතා ආපහු. ඒ ගොල්ල බලන්න හොඳ මිනිස්සු නෙවි" යි කීවේ දරුවා ද තමා වෙතට ඇද ගනිමිනි.

Scanned by CamScanner

ඔහු ආපසු හැරී ගමන් කරන්නට සැරසෙත් ම ගේට්ටුව පසුකර යමින් සිටි ප්‍රථම කණ්ඩායමේ එකෙක් ''හෝ! අර ඉන්නෙ අපේ තාත්තගෙ අයියගෙ පුතා'' යයි කෑගැසුවේ ය.

යළිත් ආපසු හැරී බැලූ ඔහුට පෙනුනේ යුද්ධයට ගිය බාප්පාගේ පුතා ය. සෙස්සන් මෙන් ඔහු ද ඇඳ සිටියේ දූවිලි වැකුන දුඹුරු පාට කබායකි. ඔහුගේ මුහුණ සෙස්සන්ටත් වඩා කලු වී රෞද්‍ර වී තිබුනි. ඔහු සිනාසී තම සගයන් ට මෙසේ කීවේය:–

''අපිට මෙතැන නැවතුන හැකි. මෙයා පොහොසත් අයෙක්. මගේ නෑයෙක්.''

මින්පසු මේ මිනිස් කණ්ඩායම වං ලුං ගේ ගෙමිදුලට ගලන කුණු වතුරක් මෙන් වං ලුං ද පසු කරමින් ගේට්ටුවෙන් ඇතුළු වුනේය. මොහොතක් ගතවන්නට පෙර මෙහි සෑම මිදුලක් ම භේවායන්ගෙන් පිරුණි.

මොවුන් අතර ඇතමෙක් එහි බිම දිගාවූහ. ඇතමෙක් පොකුණු වලට අත පොවා එහි ජලය පානය කළහ. ඇතමෙක් එහා මෙහා ඇවිද ඇවිද කෙලගසමින් මහ හඬින් කථා කළහ.

මෙයින් කලබලයට පත් වං ලුං දරුවා ද සමග තම වැඩිමල් පුතා සොයන්නට දුව ගියේය. පියා කාමරයට ඇතුල් වන විට පොතක් කියවමින් සිටි පුත්‍රයා අසුනෙන් නැගිට්ටේය. වං ලුං හතිලමින් කියූ දෙයට සවන් දුන් ඔහු කෙඳිරි ගාමින් කාමරයෙන් පිටවූයේය.

ආයුධයකුත් රැගත් තාත්තාගේ ඥාති සොහොයුරා– ''බාප්පාගේ පුතා'' දුටු ඔහු ආචාර ශීලීව ආශිර්වාද කරමින් පිළිගත්තේය. බාප්පාගේ පුතා ද ''අයුබෝවන් ආයුබෝවන්! මෙන්න අමුත්තො කට්ටියකුත් එක්කරගෙන ආවා''යයි කීවේය.

''හොඳයි ඒ ගොල්ලන්ට ඉක්මනට යන්න ඕන නිසා මම කෑම ටිකක් ඉක්මනට පිළියෙළ කරන්නම්'' යයි වං ලුං ගේ පුතා කීවේ ඔවුන් ඉක්මනටම යතියි සැලකූ නිසාය.

එහෙත් බාප්පාගේ පුතා දත් විලිස්සා මෙසේ කීවේය :–

''නැහැ. නැහැ කලබල වෙන්න එපා! අපි මෙතන කැමති දවසක් විවේක ගන්නව. යුද්ධයට කැඳවනකන් අපට මේ නගරයෙ තමයි ඉන්න වෙලා තියෙන්නෙ. සමහර විට යුද්ධයට කැඳවන කොට මාසයක් හමාරක් අවුරුද්දක් දෙකක් වෙන්නත් පුළුවන්.''

Scanned by CamScanner

ඔහුගේ ඒ කථාව වං ලුං ගේ හා පුත්‍රයාගේ බලාපොරොත්තු කඩ කෙළේය. එහෙත් ඒ දෙපොළ තම සිත් තැවුල සඟවා ගත්තේ සෑම මිදුලකම කරකැවෙමින් තිබුන ආයුධ නිසාය.

වැඩිමල් පුත්‍රයා කෑම පිළියෙළ කරන්නට යන බවක් හඟවා තම පියාත් කැටුව ගේ ඇතුළට දිව්වේය. මිදුල්වල සිටියවුන්ට නොදැනෙන්නට ඔහු ගෙයි දොර වසා අගුළු ද දැම්මේය. දොර වසමින් ගෙය තුළට පිවිසුන ඔවුන් දෙදෙනා කථා කරගත නොහැකිව ඔවුනොවුන් මුහුණු බලමින් මොහොතක් සිටියහ. කුමක් කටයුතු දැයි තීරණය කිරීමට ඒ දෙදෙනාටම නොහැකි වීය. අනතුරුව දෙවෙනි පුත්‍රයා දුවගෙන අවුත් දොරට ගසන්නට වීය. විවෘත කළ දොරෙන් ඔහු හති දම දමා ඇතුළුවුනේ ''සෑම තැනකම—සෑම ගෙයකම හේවායො පිරිල ඉන්නව. දුප්පතුන්ගෙ ගෙවල්වලත් එහෙමමයි. මම මේ දුවගෙන ආවෙ ඔවුන්ට විරුද්ධ වෙන්න එපයි කියන්නයි. මම හොඳට අඳුනන—මගේ වෙළඳ පලේ ලිපිකරුවෙක් ගෙදර ගියා, එයාගෙ භාර්‍ය්‍යාව ලෙඩින් ඉන්න කාමරයෙ පවා, හේවායො පිරිල ඉන්නවයි කියල අහල, ඔහු ඔවුන්ට විරුද්ධ උනා. නමුත් ඔහුට සිදු වුනේ අනිත් පැත්තෙන් පසා වෙන පිහිය පාරක් කන්නයි. ඒ නිසා ඒ ගොල්ලන්ට ඕන දෙයක් අපි දෙමු.''

බියෙන් තැතිගත් ඒ තිදෙනා එකිනෙකාගේ මුහුණු බැලූහ. ඔව්හු තමන්ගේ බිරියන් ගැන ද මේ කාමුක ධූර්තයන් ගැන ද කල්පනා කළහ. වැඩිමල් පුතා තමාගේ විනීත භාර්‍ය්‍යාව ගැන සිතමින් ''අපි ගෑණුන් සේරම ඇතුල් කාමරවල දමමු. එහි දොරවල් වහල මුර තබ්බවමු. පස්ස පැත්තෙ ගේට්ටුව විතරක් ඇරල තියමු'' යි කීවේය.

ඔව්හු එසේ කිරීමට කැමති වූහ. එහෙයින් එහි සිටි ගෑණුන් හා දරුවන් කලින් පද්මා හා කෝකිලා තනියම වාසය කළ කාමරයට දැමූහ. වං ලුං ද වැඩිමල් පුතා ද රෑ දවල් දෙක්හි එහි මුර කළහ. දෙවෙනි පුතා ද වරින් වර එයට සහභාගි වුනේය. එහෙත් මේ මුර කිරීම සාර්ථක නොවූයේ බාප්පාගේ පුතා දොරටුවට ගසමින් ගේ ඇතුළට පැමිණි නිසාය. ඔහු නායෙකු නිසා නීත්‍යානුකූලව පිටමන් කර ගැනීමට ද ඔවුන්ට නොහැකි වීය. බලයෙන් මෙන් ගෙට ඇතුල්වුන ඔහු එහි එහා මෙහා ඇවිද්දේ තියුණු

පිහියක් ද දිග ඇරගෙනය. වැඩිමල් පුතා දුක් මුසු මුහුණින් යුතුව ඔහු පසු පස ගමන් කෙළේය. ඔහු එහි සිටි සෑම ගැහැණියක දෙසම බලමින් ඔවුන් විවේචනය කෙළේය :-

''හා! උඹට අහුවෙල තියෙන්නෙ නෙලුම් පොහොට්ටුවක් වගේ බඩුවක්'' යයි ඔහු කීවේ වැඩිමල් පුතාගේ බිරියට ය. ''හා මේ තියෙන්නෙ තර රතු රාබු ගෙඩියක්'' යයි ඔහු කීවේ දෙවෙනි පුතාගේ බිරියට ය. වැඩිමලාගේ බිරිය ඉවතට හැරී මුහුණ සඟවා ගත්තාය. දෙවැන්නාගේ බිරිය සිනහවක් පාමින් ''ඔව් සමහර මිනිස්සු රතු රාබු කන්න කැමති'' යයි කීවාය.

''ඔව් ඔව් මමත් කැමති'' යයි කියමින් තරුණයා ඉදිරියට පැන්නේ ඇය අල්වා ගන්නට මෙන් ය. ඔහුගේ ඒ කථාවෙන් හා විලාසයෙන් ලජ්ජාවට පත්වූන වැඩිමලා ස්වකීය භාර්‍යාව දෙස බැලුවේය.

''ඔව් ඔව් මම රතු ඒවට කැමතිය''යි යළි යළිත් ඔහු කියද්දී වැඩිමල් පුතාගේ බිරිය වහා කාමරය තුළට වැදුනාය. ඉන්පසු තරුණයා දුම් පයිප්පයක් උරමින් පද්මාට කථා කොට මෙසේ කීවේය :-

''මේ නගරයෙ ගෑණු හරි ජේත්තු කාරියො. එහෙම නේද ලොකු හාමිනේ? මේ වං ලුං පොහොසත් බව මම දැනගෙන හිටියෙ නැහැ. ඔබ දිහා බැලුවමයි මට ඒක ජේන්නෙ.''

''ලොකු හාමිනේ'' යයි ඇමතීමෙන් පද්මා ප්‍රීතියට පත්වූයේ එහි උසස් පවුල්වල කාන්තාවන්ට එසේ ඇමතීම සිරිතක් වසයෙන් පැවති නිසාය. ස්වකීය දුම් කෝවෙහි අලු ගසා දැමූ පද්මා ''මේ වගේ රළු මිනිසුන්ටත් කවට කම් කරන්න පුළුවන්''යයි කීවේ දුම් කොළ පිරවීමට පයිප්පය දාසියකගේ අතට දෙමිනි. යළිත් ඇය මේ මිනිහා දෙස මුකුළු බැල්මක් හෙළුවාය. එහෙත් ඇයගේ ඇස්වල පෙර පැවති කාන්තිමත් ගතිය වයස විසින් පැහැර ගෙන තිබුන නිසා ඒ මිනිහාට නම් ඒ බැලුමෙහි මුකුළු බවක් හෝ රසවත් බවක් නොවීය. ඇගේ ඒ බැල්ම දුටු ''බාප්පාගේ පුතා'' මහ හඬින් සිනාසී ''හා! තවමත් අර බැලීම එහෙම ම කරණවා'' යයි කීවේය.

වං ලුං ගේ වැඩිමහළු පුතා මොහුගේ මේ විකාර කථා නිශ්ශබ්දව අසාගෙන සිටියේ කෝපයෙනි.

ඉන්පසු ''බාප්පගේ පුතා''- වං ලුං ගේ මස්සිනා සිය මව බැලීමට ගියේ වං ලුං ද කැටුවය. ඔවුන් එහි යන විට ඇය ඇඳෙහි වැතිර නිදගෙන සිටියාය. පුතාට ඇය අවදි කිරීමට නොහැකි විය. ඔහු තමාගේ තුවක්කුව ගඩොල් පොළොවෙහි හැප්පූ විට ඇය පිබිදී ඔහු දෙස බැලුවාය.

''අම්මෙ, අම්මෙ, මේ පුතා ඇවිල්ල ඉන්නාව. ඒත් අම්ම නිදි.''

ඉක්බිති ඇය නැගිට ඇඳෙහි වාඩි වී යළිත් ඔහු දෙස විශ්මයෙන් බලමින් ''මගේ පුතා–මගේ පුතා'' යයි කීවාය. මෙසේ කියා සවකීය අබිං පයිප්පය ඔහු වෙත දිගු කරමින් දසියකට අඩගසා ''මෙයින් ටිකක් මෙයාටත් පිළියෙළ කර දීපන්'' යයි නියම කළාය.

''නැහැ නැහැ, මට එපා! මට එපා!'' යයි ඔහු කියන විට වං ලුං භය වූනේ 'ඇය මේ විධියට කෙට්ටු වෙන්නට උඹ කුමක් කෙළේ ද?' යන ප්‍රශ්නය ඔහු නගාවිදෝ යන සැකයෙනි.

එහෙයින් වං ලුං ඔහු එසේ අසන්නට පෙර මෙසේ කීවේය :–

''අබිං ටික ටික ගන්නව නම් ඔහොම වෙන්නෙ නැහැ. ඇගේ අබිං වලට දවසකට කාසි අහුරක් විතර වියදම් වෙනව. ඒ උනාට ඇගේ වයසෙ හැටියට ඇ අසතුටු කරන එකත් එතරම් හොඳ නැහැ.''

වං ලුං සුසුම් හෙලමින් මේ වචන කීවේද බාප්පාගේ පුතා දෙස හොර ඇසින් බල බලාය. එහෙත් බාප්පාගේ පුතා කිසිත් කථා නොකර සවකීය මවගේ තත්වය බලාගෙන සිටිද්දී ඇය යළිත් ඇඳෙහි දිගා වී නිදන්නට වූවාය. ඉන්පසු ඔහු තම තුවක්කුව බිම අණිමින් ශබ්ද නගා එතැනින් පිට වූනේය.

තම ගෙ–වත්ත ආක්‍රමණය කොට සිටි යුද සෙබලුන් අතුරෙන් වං ලුං හා ඔහුගේ පවුල වඩාත් භය වූනේ සවකීය ඥති සහෝදරයාට ය. ඒ යුද්ධ භටයෝ ගෙවත්තෙහි වූ ගස් හා වැල් සිඳ බිඳ දමමින් රිසි රිසි පරිදි එහි මල් හා පල කඩා ගත්හ. ඔවුන්ගේ රළු සපත්තු වලින් පාගා එහි මේස පුටුවල කැටයම් කඩා දැමූහ. රන්වන් මාළුන් ගෙන් හා මල් වලින් ගැවසී ගත් පොකුණු මූත්‍ර කිරීම ආදියෙන් අපවිත්‍ර කළහ. මේ නිසා පොකුණුවල සිටි රන්වන් මත්සායෝ මැරී එහි මතු පිට පාවෙන්නට වූහ. ඒ මසුන් කුණුවීම නිසා අවට මාරුතය ද අපවිත්‍ර විය. එතරම හානියක්

Scanned by CamScanner

ඔවුන්ගෙන් සිදු වුනත් වං ලුං ගේ හා පවුලෙහි ද්වේෂයට ඉලක්ක වූයේ බාප්පාගේ පුතාය.

සෙසු යුද සෙබළුන් ට වඩා මේ තරුණයා ට මෙහි අයිතිවාසිකමක් තිබුන නිසා කිසි වකිතයක් නොමැතිව කැමති පරිදි ගෙයි එහා මෙහා ඇවිදිමින් දසියන් දෙස බැලුම් හෙළුවේය. මොහුගෙන් ගෙය ආරක්ෂා කරගන්නට සිදු වුන නිසා දවස් ගණනක සිට වං ලුං පවුලෙහි වූවෝ නිදි වර්ජනය කළහ. නිදි නොලැබීම නිසා පීඩාවට පත් ඔවුන් දුටු කෝකිලා මෙසේ කීවාය :-

''දැන් මේකට කරන්න තියෙන්නෙ එකම දෙයයි. එයාට කැමති හැටියකට සතුටු වෙන්න දසියක් දෙමු. එහෙම නොකොළොත් එයා මොනව කරාවිද දන්නෙ නැහැ.''

වං ලුං කෝකිලාගේ අදහස පිළිගත්තේ ''ඒක හොඳ අදහසක්'' යයි කියමිනි. ඔහුගෙන් කවර දසියකට කැමති දැයි ඇසීමට පිටත් කෙළේ ද කෝකිලා ය. පෙරලා පැමිණි කෝකිලා ''එයා කැමති අර හාමිනේගෙ ඇඳ ළඟ නිදගන්න සුදු එකීට'' යයි කීවාය.

මේ සුදු මැලි එකියගේ නම ''පේරමලී'' ය. එක් සාගත කාලයක වං ලුං විසින් මැය මිලයට ගනු ලැබුවේ ඉතා කුඩා කාලයේ ය. ඇගේ කෝමල කම් නිසා කුඩා කල පටන් ම වං ලුං පවුලෙහි වූවන්ගේ සුරතලයට භාජන වූ ඇය එහි වැඩෙමින් කෝකිලා ගේ කටයුතු වලට උදව් දෙමින් ද පද්මා ගේ සුලු සුලු වැඩ කරමින් ද කාලය ගත කළාය.

කෝකිලා මේ යෝජනාව කරණ විට ද පේරමලී සිටියේ පද්මා ට තේ පිළියෙළ කරමිනි. පේරමලී මේ යෝජනාව අසා හඩන්නට වූවාය. බියෙන් තැති ගැනුන ඇයගේ අතින් තේ පෝච්චිය ද බිම පතිත වී සුනු විසුනු වී ගියේය. තම අතින් තේ පෝච්චිය ගිලිහුනා ද ? යන්න ගැනවත් සිහි කිරීමට තරම් කල්පනාවක් ඇයට නොවීය. ඇය පද්මා ඉදිරිපිට බිම වැතිර හිස පොළොවෙහි ගසමින් මෙසේ කන්නලව් කළාය :-

''අනේ මගේ හාමිනේ, අනේ මගේ හාමිනේ, මාව එයාට බාර දෙන්න එපා! එපා! මං මැරේවි!''

''මේක හරි පුදුම කරදරයක්. මොකක් ද මේ කන්නලව්වෙ තේරුම? ඒ මිනිහ පිරිමියෙක්! හැම පිරිමියෙක් ම තරුණියක පාවා

Scanned by CamScanner

ගන්න බව උඹ දන්නෙ නැද්ද''යි පද්මා පේරමලී ගෙන් ඇසුවේ උදහස් වූවාක් මෙන් ය. මෙසේ කියූ පද්මා කෝකිලා දෙසට හැරී යලිත් කථා කළාය :-

''මේ පේරමලී අරගෙන ගිහිල්ල එයාට භාර දීපන්.''

ඉක්බිති මේ අහිංසක තරුණිය දෙ අත් එකතුකොට ඔවුන්ට වැඳ වැඳ ශබ්ද නගා හඬන්ට වූවාය. ඇයගේ සිරුර සට සට ගා බියෙන් වෙවුලන්නට විය.

පද්මා ගේ නියෝගයක් නිසා වං ලුං ගේ පුත්තු ද මේ ක්‍රියාවට විරුද්ධව කිසිවක් නොකීහ. මේ ක්‍රියාවෙහිදී ඔවුන්ගේ භාර්‍ය්‍යාවෝද තම ස්වාමිවරුන් අනුගමනය කළහ. එහි දාසි දස්සෝ ද පොඩි ලමයි ද හඬා වැලපෙන ඒ තරුණිය දෙස නිහඬව බලා සිටියහ. ඇයගේ විලාපය හැරෙන්නට කිසි හඬක් එහි නොවීය.

මේ පිරිස අතර නොසන්සුන් ගතියක් දක්වූයේ වං ලුං පමණකි. එහෙත් ඔහු ද පද්මා කෝප කරවන්නට අකමැති වූනේය. තරුණිය වං ලුං ගේ මුහුණෙහි පිළිබිඹුව තිබුන කාරුණිකත්වය දුටුවේය. ඇය ඔහු වෙත දුව ගොස් ඔහුගේ දෙපතුළෙහි වැටී එහි හිස තබාගෙන ඉකි බිඳ බිඳ හැඬුවාය. ඇයගේ කෝමලත්වය ද අහිංසකත්වය ද වං ලුං ට පෙනුනේය; සවතිය මස්සිනා වැනි තරුණ විය.ද ඉක්මවා සිටි රළු මිනිසෙකු ඇයට නුසුදුසු බව ද ඔහුට වැටහී කෝකිලාට කථා කළේය :-

''ඈ! කෝකිලා, මෙහෙම තරුණියකට බලකරණ එක හොඳ නැහැ නෙව ද?''

ඔහුගේ මෘදු වචනය ඇසූ කෝකිලා තියුණු ලෙස කථා කළාය:-

''ඒකිට කියාපු දේ ඒකි කරන්න ඕන. කවද හරි ගැහැණියකට සිදුවන්න තියෙන දෙයක් ගැන ඔච්චර අඬන එක මොන මෝඩ කමක් ද?''

ඉන්පසු වං ලුං පද්මා සතුටු කරන්නට කථා කෙළේය :-

''අපි ඊට ඉස්සෙල්ල වෙන කරන්න පුළුවන් මොකක් ද කියල කල්පනා කරල බලමු. මම උඹට වෙන දසියක් හරි වෙන කැමති දෙයක් අරන් දෙන්නම්. අපි ඉතින් බලමු මේකට වෙන කරන්නෙ මොකද කියල?''

Scanned by CamScanner

කීප දිනක සිට රට ඔරලෝසුවක් ගැනත් මැණික් ගල් ඇල්లූ මුද්දක් ගැනත් සිත සිතා සිටි පද්මා වං ලූං ගේ කථාව අසා නිශ්ශබ්ද වූවාය. වං ලූං යළිත් කෝකිලා ට ඇමතුවේය.

''ඉතින් මගේ මස්සිනාට ගිහින් කියාපන් ඒ කෙල්ල භයානක රෝගයකින් පෙලෙන බව. ඉතින් ඒ කෙල්ල ලෙඩත් තියෙද්දි භාරගන්න කැමති නම් ඇය ඔහු වෙත එවිය හැකි බවත් එහෙම අකමැති නම් වෙන කෙල්ලක් අප ළඟ ඉන්න බවත් කියාපන්.''

ඔහු එසේ කිය කියා අවට සිටි දසියන්ගේ මුහුණු දෙස ද බැලුවේය. එයින් ලජ්ජාවට පත් දසියෝ සිනාසෙමින් මුහුණු ඉවතට හරවා ගත්හ. ඔවුනතර සිටි විසි හැවිරිදි තරම් වූ ශක්තිමත් දේහයක් ඇති තරුණියක් සිනාසෙමින් මෙසේ කීවාය :-

''හා! හා! කාටවත් බැරි නම් මම කැමතියි ඒකට. ඔය කියන පිරිමිය එතරම් අජුව ඇති කෙනෙකුත් නොවෙයි.''

''හොඳයි එහෙනම් පලයන්!'' යයි වං ලූං කිව්වේ හිසෙහි තිබුන බරක් ඉවත් කරන්නාක් මෙන් ය.

අනතුරුව ඇය කැඳවා ගෙන යාමට සැරසුන කෝකිලා ''හොඳයි එහෙනම් මගේ පස්සෙන් වරෙන්. ඒක සිද්ද කරන එක එතරම් අමාරු වැඩක් නොවේ''යි කීවාය. කෝකිලා පසු පස ඒ තරුණිය ගමන් කරද්දී ද පේරමලී වං ලූං ගේ පය පාමුල වැටී සිටියාය. ඇයගේ මේ ක්‍රියාවට නොසතුටු බවක් පළකරමින් පද්මා සවකීය කාමරයට ගිය පසු වං ලූං කාරුණික ලෙස ඒ තරුණිය එසෙව්වේය. සුදුමැලි වී සිටි ඇය බිම බලාගත්වනම ඔහු ඉදිරියෙහි නැගී සිටියාය.

''දරුව, දවසක් දෙකක් ගත වෙනකන් ලොකු හාමිනේ ගෙන් ඈත්වෙලා ඉඳපන්. එතකොට තරහ අමතක වෙලා යාවි. හැබැයි අර මගේ මස්සිනා එනකොට හැංගෙන්න ඕන. ඒකට උඹ ආයිමත් ඕන වෙන්න පුළුවන්'' යයි වං ලූං කීවේ තමා ඉදිරියෙහි නැගී සිටි ඒ කෝමල තරුණිය දෙස කාරුණිකව බලමිනි.

එවිට ඇය දෙනෙත් ඔසවා ගෞරවාන්විත බැල්මක් ඔහු දෙස හෙලා සේයාවක් මෙන් එතැනින් ඉවත්ව ගියාය.

වං ලූං ගේ මස්සිනා එහි නතරව සිටියේ මාසයක් පමණකි. එහෙත් මේ කාලය ඇතුළත ඔහු භාර්යාභාව වසයෙන් තබාගත්

Scanned by CamScanner

තරුණිය ගැබ් ගැණීම ඔහුට ආඩම්බරයක් විය. හදිසියෙන් මෙන් තැන තැන නතරව-සිටි යුද භටයන් රණ බිම් කරා කැඳවීමක් සිදුවිය. මේ නිසා වං ලුං ගේ ගෙදර ද නතර වී සිටි යුද භටයන් එයින් බැහැර වුනේ සුලඟට අසු වූ දහයියා මෙන් ය. ඔවුන් මේ ගෙදර අත්හැර ගිය පසු ඔවුන්ගෙන් මෙහි ඉතිරි වුනේ ඔවුන් විසින් එහි තැන තැන කළ කැඩුම් බිඳුම් හා අපිරිසිදු දේවල් පමණකි.

රණ බිමට යනු සඳහා පිහිය ඉණෙහි එල්ලාගෙන තුවක්කුව ද කර ගසා ගෙන ස්වකීය නෑයන්ට ආයුබෝවන් කියූ වං ලුං ගේ මස්සිනා මෙසේ ද කීවේය :–

''හොඳයි උඹලා වෙත මට නැවතත් පැමිණෙන්ට නොහැකි උනත් කාරියක් නැහැ. ඔන්න මා වෙනුවෙන් දරුවෙක් තව ටික දවසකින් උඹලට දකින්න ලැබේවි. මගේ අම්මටත් මුණුපුරෙක්... හඃ හා! මාසයක් දෙකක් නතර වෙච්ච තැනක දරුවෙක් ඇති කරල යන එකත් හැම මිනිහට ම කරන්න බෑ. හඃ හා! හේවායන්ගෙ හැටි ඔහොම තමා...''

යුද්ධ භටයන් ගේ කරදරයෙන් හ්වැං මැඳුර නිදහස් වුනි. ඔවුන් කඩා බිඳ දමා ගිය තැන් හා ගෘහ භාණ්ඩත් ප්‍රතිසංස්කරණය කිරීමට වං ලුං ද ඔහුගේ පුත්‍රයන් දෙදෙනා ද ලහි ලහියේ සූදානම් වූහ. ඔවුන් තිදෙනා පළමු වරට ඒකමතිකවූන අවස්ථාව ද මෙයමැයි. ඔව්හු වඩුවන් හා පෙදරේරුවන් කැඳවා ඒ ඒ කටයුතු නියම කළහ. ගෙදර දාසි දස්සෝ යුද්ධ භටයන් අපවිත්‍ර කළ තැන් පවිත්‍ර කළහ. මිදුල් වල වූ පොකුණු ද යලිත් සකස් කරවූහ. අළුත් පිරිසිදු ජලයෙන් පිරුණ පොකුණුවලට වැඩිමල් පුතා රන්වන් මාලුවන් ද මිලයට ගත්තේය. යුද්ධ භටයන් විසින් සුන්බුන් කළ මල් පාත්ති ද අලුත් අලුත් මල් වර්ග සිටුවා සකස් කළහ. මාසයක් ගතවන්නට පෙර ඒ මැඳුර නවතායෙන් ද නව සිරියෙන් ද බබලන්නට වුණි. එහි සාමය ද යලිත් උදවුණි.

වං ලුං ගේ බාප්පා ගේ පුතා නිසා ගැබ්ගත් දසිය මේ දවස්වල වං ලුං විසින් යොදවනු ලැබ සිටියේ මහළු කුඩම්මාගේ සාත්තුවටය. ඇයගේ අවසානය තව ටික දිනකින්ම සිදුවෙතියි ඔහු සිතුවේය. එහෙයින් කුඩම්මාගේ මළ සිරුර පවා මිනී පෙට්ටියෙහි තැන්පත් කිරීමට නියම කොට තිබුනේ ඒ දසියට ය.

මේ දසිය නොබෝ දිනකින් ගැහැණු දරුවකු වැදීම ද වං ලුං ගේ ප්‍රීතියට හේතු වූයේය. යම් හෙයකින් පිරිමි දරුවෙකු වැදුවා නම් ඒ දරුවාට ද තම පවුලෙහි අයිති වාසිකම් දෙන්නට සිදුවන්නේය. එහෙයින් ගැහැණු දරුවා වැදූ දිනයෙහි ඔහු කල්පනා කෙළේ "දසියක් තවත් 'දසියක වැදීමෙන් සිදුවන වෙනසක් නොමැතිය"

Scanned by CamScanner

යන්නය. එහෙත් වං ලූං, පවුලෙහි සෙස්සන්ට මෙන්ම ඒ දසියට ද යුක්ති සහගත වූයේය. මහළු ස්ත්‍රිය මියගිය පසු ඇය වෙසෙන කාමරය දසියට දීමට ද ඔහු අදහස් කෙළේය. ඔහු එසේ අදහස් කෙළේ තම ගෙයි කාමර රැසක්ම තිබෙන බැවින් එක් කාමරයක් ඒ දසිය වෙනුවෙන් වෙන් කිරීම පාඩුවක් නොවන නිසාය. ඔහු දසියට වරින් වර මුදල් ද දුන්නේය. ඇය ද එක් දෙයකින් හැර අන් සෑම දෙයකින්ම තෘප්තිමත් වූවාය. ඇය බොහෝ විට ඒ කරුණ ගැන ද ඔහුට පැවසුවේ "මහත්මය, ඔය මුදල් මගේ ඇවැද්ද හැටියට තියා ගන්න. ඔබට කරදරයක් නැත්නම් කාට හරි මා කසාද බැඳල දෙන්න. ගොවියෙකු උනත් දුප්පත් මිනිහෙකු උනත් කමක් නැහැ. අනේ පින්සිද්ද වෙච්චි ඒක ඉෂ්ට කරන්න. පිරිමියෙකු සමග මාසයක් වත් ගතකරපු මට තනියම ඉන්න එක මහ වදයක්" යන වචනයි.

ඇගේ ඉල්ලීම ඉටු කිරීමට වං ලූං පොරොන්දු වූයේය. එසේ පොරොන්දුවුන විට ඔහු තුළ අළුත් සිතුවිල්ලක් ද පැන නැගුනි. එනම් දසියක දුප්පත් මිනිහෙකුට පාවාදීමට පොරොන්දු වුන මේ මිනිහා ද වරක් මෙහිම විසූ දසියක් පාවා ගැණීමට දුප්පත් ගොවි–යෙකු වසයෙන් මේ මැදුරට ම පැමිණි බවයි. ඒ අතීතය ඔස්සේ වං ලූං ට සිහිනයක් මෙන් සිහිවුනේ ඕලැං ය. අතීතයේ තමා පිළිබඳ සිදුවීම් සිහියට නැගෙන විට ඔහුගේ හදවත ශෝකාත්මක හැඟීම් වලින් හා සංවේගාත්මක හැඟීම් වලින් බරවූණේය.

"ඔය නාකි අබිං කාරි මැරුණ විට මම උඹට මිනිහෙකු හොයල දෙන්නම්. ඒකට වැඩි කාලයක් ගත් වන්නේ නැතැ"යි වං ලූං දසිය අමතා කීවේ ඇය සනසමිනි.

මෙසේ දවස් කීපයක් ගතවී යත්ම එක් උදයක ඒ දසිය ඔහු වෙත පැමිණ "දූන්වත් මහත්තයො, ඔබේ පොරොන්දුව ඉටු කරන්න. ඒ නාකි එක්කෙනා ඔන්න උදේ මැරුණ. මම මේ ආවෙ මළ සිරුරත් මිනී පෙට්ටියෙ තැන්පත් කල්ල" යයි කීවාය.

එවිට වං ලූං කල්පනා කෙළේ තම ඉඩම් වල වැඩ කරන මිනිසුන් අතරින් ඇයට සුදුසු එකෙකු ගැනය. ඔහුට එක වරටම සිහිවුනේ චිං ගේ මරණයට හේතු වූ ගොත ගසා කථා කරන දත් බොල්ලෑ ඒ තරුණයා ගැන්ය. ඔහු පණිවුඩයක් යවා ඒ තරුණයා ගෙන්වා ගත්තේය. එද මහළු රදළ නෝනා තමාට ඕලැං පාවාදුන්

තැනම පිළියෙළ කළ වටිනා ආසනයක හිඳගෙන වං ලූං දසිය පාවා දීමට කැඳවූ තරුණයාට මෙසේ කීවේය:–

"ඒයි මිනිහො! මේ ගෑණි ඕන නම් පාව ගනින්. මගේ බාප්පගෙ පුතා විතරයි මෑ පාවගෙන හිටියෙ."

තරුණයා ද ස්තුතිපූර්වකව ඇය භාර ගත්තේය. මෙබඳු එකියක් මිස මෙයට වඩා හොඳ එකියක් පාවා ගැණීමට තරම් ඒ තරුණයාට පොහොසත් කමක් නොවීය; ඔහු එතරම් දුප්පත්ය.

ඒ ගොවි තරුණයා ඇය පාවාගත් පසු වං ලූං අසුනෙන් නැගිට්ටේ මහත් බරකින් නිදහස් වූවෙකු මෙන්ය. තමා කළයුතු සියළුම කටයුතු අවසන් කළ කෙනෙකැයි ඉන්පසු ඔහු සිතුවේය. මෙතෙක් සිදුවූන දෙය සිදුවුනේ කෙසේදැයි සිතන්ට වත් ඔහුට බැරි තරම්ය.

මේ සිදුවීම් සියල්ලකින්ම පසු ඉතින්වත් සාමය පැතිරේ යයි ඔහු සිතුවේය. හැටපස් වියට එළඹුන ඔහුට අවුරුදු පතා උන කොපිලි මෙන් මුණුපුරෝ ඇතිවූහ. දැන් වැඩිමල් පුත්‍රයාගේ ද පුත්‍රයන් තිදෙනෙකි. ඔවුන්ගෙන් වැඩිමලා දස හැවිරිදි තරම්ය. දෙවන පුත්‍රයාට ද පුත්‍රයන් දෙදෙනෙකි. තෙවන පුත්‍රයාගේ විවාහයේ දිනය ද එළඹෙමින් තිබුනි. තෙවන පුතාගේ විවාහයෙන් පසු ස්ථිරලෙස සාමයෙන් කාලය ගතකළ හැකැයි වං ලූං අදහස් කෙළේය. එහෙත් එයද සිතිවිල්ලක් පමණකි. ඔහුට නම් සාමයක් හෝ නිදහසක් නොවීය.

මේ වර සටන ආරම්භවුනේ–සාමය කඩව ගියේ පුත්‍රයන්ගෙන් නොවේ; එකම ගෙදර විසූ පුත්‍රයන්ගේ භාර්‍යාවන් ගෙන්ය. ඈ ලා එකිනෙකාට ඊර්ෂ්‍යා කළහ; ද්වේෂ කළහ. ලොකු අයගේ මේ අමනාපයට හේතුවූයේ තම තමුන්ගේ දරුවන් අතර ඇතිවුන රණ්ඩුය. ළමයින් සෙල්ලම් කරණ අතර ඇතිවුන මේ රණ්ඩු සංසිඳුවීමට පැමිණි මව්වරු තම දරුවන් නිවැරදි කරුවන් ලෙස සලකා අන්‍යයන් ගේ දරුවන්ට තදින් පහර දුන්හ. මෙහිදී සෑම මවකටම පෙනුනේ තම දරුවාගේ නිවැරදි බවය. මේ නිසා මේ ගෙදර ගෑහැණුන් දෙදෙනා අතර ඇතිවුන දබරය නොසන්සිඳුවිය හැකි තත්වයකට පත්වූනේය. එහෙයින් මේ දෙදෙනා නිතර නිතර එකිනෙකා හෙලා දැකීමේ අදහසින් ඇනුම් පද ද කියා ගත්හ. වැඩි-මල් පුතාගේ බිරිය සවකීය දරුවන් කාමර වලින් පිටත යන විටද

Scanned by CamScanner

“හා! උඹල ඔය නැහැදිච්ච ලමයි සමග සෙල්ලමට යන්න එපා!” යයි අනිකාගේ බිරියට ඇසෙන්නට කීවාය. දෙවන පුතාගේ බිරිය ද කඩිසරව එයට පිළිතුරු දුන්නී “ඔය තයි එක්ක සෙල්ලම් කරන්න එපා! උඹල හපාවී!” යන වචන වලිනි.

බිරියන් අතර පැවති මේ දබරය ක්‍රමයෙන් වැඩිවූයේ සොහොයුරන් දෙදෙනා අතර එකඟත්වයක් නොවූ නිසාය. වැඩිමල් පුතා නිතරම කල්පනා කෙළේ තම උසස් පවුල පහතට වැටේදෝ යන්නය. දෙවෙනි පුත්‍රයා මනෝරාජ්‍යයක් නිතරම මැව්වේ “අයියා වියදම් කරන තරමට පියා මිය ගිය විට බෙද ගන්න තරම් ධනයක් ඉතුරු වේදෝ” යන සිතුවිලි උඩය. පියාගේ බූදලය ගැනත් මුදල් හදල් පිළිබඳ කටයුතුත් මල්ලීට පැවරී තිබීම නිසා අයියා මල්ලීට වඩාත් ඊර්ෂ්‍යා කෙළේය. මේ නිසා භාර්යාවන් අතර පැවති අසමගිය සොහොයුරන් අතර ද පහසුවෙන් පැතිරී ගියේය. මුළු ගෙදරම කිසිවෙකුගේ මුහුණක ප්‍රීතිය පිළිබිඹු නොවීය. එහි සෑම කාමරයක්ම කෝපයෙන් පිරුණාක් මෙන් වීය. සවකීය ගෙදර පවතින මේ අසමගිය ගැන කෙඳිරිගෑම විනා වං ලූං ට වෙන කළහැකි දෙයක් නොවීය.

වං ලූං හා පද්මා අතරද අප්‍රසිද්ධියේ කලබලයක් හටගත්තේ ද මේ දිනවලය. එද බාප්පා ගේ පුතාගෙන් පේරමලී වං ලූං විසින් ආරක්ෂා කර ගැනීම මේ දබරයට හේතු වීය. ඒ තරුණිය කිසිත් වෙනසක් නොමැතිව පද්මාට සේවය කළ නමුත් ඇය පද්මා ගේ ද්වේෂයට ලක් වූවාය. තරුණිය රෑ දවල් දෙකෙහිම දුම් පයිප්පය පුරවමින් ද පද්මාගේ අත පය මිරිකමින් ද මුළු කාලය ගත කෙළේ සිත් දිනා ගැණීමටය. එහෙත් පද්මා ඇය කෙරෙහි පළ කෙළේ අසතුටු බවක්මය. වං ලූං කාමරයට එන විටද තරුණිය එයින් පිටත් කර හැරියේ ඔහු ඇය දෙස බලතියි දෙස් කියමිනි. මුලදී වං ලූං තුළ ඒ තරුණිය කෙරෙහි පැවතුනේ අහිංසක දරුවෙකු කෙරෙහි පැවතිය යුතු අන්දමේ කාරුණික හැඟුමකි. පද්මාගේ මේ දෝෂදර්ශනය නිසා අමතක වූවක් මතක් වූවාක් මෙන් වං ලූං ඒ තරුණිය දෙස අනුරාගාත්මකව බැලුවේය. මේ බැලීම නිසා දස වසරකට පෙර නිශ්චලව තිබුන ඔහුගේ හැඟීම් යළිත් වරක් ක්‍රියාත්මක වුනි.

වරක් වං ලූං සිනාසෙමින් “උඹ හිතන්නෙ තවමත් මම කාමුකෙයි කියලද? අවුරුද්දකට තුන් වරක් වත් උඹ වෙසෙන

කාමර වලට එන්නෙ නැති මා ගැන එහෙම හිතන එක වැරදිය''යි කිවේ තරුණිය දෙසද බැලුම් හෙලමිනි.

පද්මා වෙන දේවල් ගැන අඥාන වුවත් එක දෙයක් හොඳින්ම දැන සිටියාය. පිරිමින්ගේ ගැහැණුන් හා ඇති සම්බන්ධතාවය ඇය විශෙෂඥවරියක මෙන් දැන සිටි නිසා තරුණියක් ඉදිරියෙහි වයස් ගතවූ ද පිරිමියෙකු තුළ ඇතිවෙන කැළඹිලි ඇයට නොරහසකි. ඇය විසින් තරුණිය තේ කඩයකට විකිණීමට යෝජනා කරනු ලැබුවේද එහෙයිනි. සුව පහසු ජීවිතයට කැමති නිසාත් කෝකිලා මහළු වී වැඩපල කළ නොහැකි තත්වයක සිටි නිසාත් ජේරමලී තමාගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමට දක්ෂ නිසාත් ඇයගෙන් වෙන් වීම පද්මාට එතරම් පහසු නොවීය. එහෙයින් ජේරමලී නතර කර ගැනීම හෝ විකිණීම පද්මාට උභතොකෝටික ප්‍රශ්නයක් වීය. එහෙත් ඇයගේ කෝපය නම් නොසන්සිඳුනේය.

මේ හින්නරුවික ගැහැණුන්ගේ කරදර වලින් ගහණ මේ ගෙදරට තවත් කරදරයක් එකතු වීය. මේ අළුත් කරදරයේ කථා නායකයා වං ලුං ගේ බාල පුතාය. මේ බාල පුතා පොත් වලටම ඇලුන නිශ්චල තරුණයකු වසයෙන් අහළ පහළ ප්‍රකටව සිටි කෙනෙකි. එහෙත් මෑතක සිට ඔහුගේ ගතිගුණ වෙනස් වුනේ පසුගිය කාලයේ ඇසුරු කරන්ට ලැබුන යුද හටයන් නිසාය. එහි නතරවී සිටි යුද සෙබලුන් ඒ ඒ රටවලදී තමන්ට සිදුවුන හා තමන් කළ නොයෙක් ත්‍රාස ජනක කථා කියන විට වං ලුං ගේ බාලපුතා ඒවාට ඇහුම්කන් දුන්නේ මහත් ආසාවෙනි. මේ ආසාවෙන් පොළඹවනු ලැබූ ඔහු නොයෙක් රටවල් ගැනත් යුද්ධ ගැනත් ලියවුන පොත් සවකීය මහළු ගුරුවරයාගෙන් ඉල්ලා ගෙන කියෙව්වේය. මෙහි ප්‍රතිඵලයක් වසයෙන් ඔහුගේ සිත නොයෙක් සිහින වලින් පිරුනි.

දිනක් මේ තරුණයා පියා වෙත ගොස් ''තාත්තේ, මම හේවායෙක් වෙලා යුද්දෙට යනවා''යයි කීවේය. බාල පුතාගේ මේ වචන වං ලුං ගේ හද තුළට ගෙන ආවේ ශෝකය හා කෝපයත්ය. එහෙයින් ඔහු වේගයෙන් කථා කෙළේය:-

''මේ මොන පිස්සුවක් ද? මට මගේ පුත්තු නිසා නැහැ නොවැ විවේකයක්! පුතේ, ඉස්සර හිටපු මිනිස්සුන්ගෙ කීමක් තියෙනව ඇණයක් හදන්න හොඳ යකඩ ගන්නෙ නැතෙයි කියල. ඒ

වගේම තමයි හේවා කමටත් හොඳ මිනිහෙක් යන්නෙ නැහැ. උඹ මගේ හොඳම පුංචි පුතා. උඹ හේවායෙක් වෙලා තැන තැන ඇවිදින කොට මට ඒක ඉවසන්න බැරි දෙයක්.''

පියා කොතෙකුත් ප්‍රතික්ෂෙප කළත් පුතාගේ අධිෂ්ඨානය බලවත් වීය. එහෙයින් ඔහු තම පියා දෙස බලා ඇඟිලි බැම ගුලි කොට ''මම යන්න ඕනැ''යයි කීවේය. යළිත් පියා සචකිය පුතා පොළඹවා ගැනීමට වෑයම් කෙළේය:–

''උඹට ඕනෑම ඉස්කෝලෙකට යන්න මම පිළියෙළ කරල දෙන්නම්. දකුණෙ ලොකු පාසැලකට උනත් පිටත් කරන්නම්. හැබැයි හේවායෙකු නම් වෙන්න එපා! ඒක මම වගේ මිනිහෙකුට නින්දවක්. සල්ලි ඉඩකඩම් තියෙන මිනිහෙකුගෙ පුතෙක් හේවා–යෙක් වෙන එක නම්බුවක් ද? හොඳයි කියාපන් මේ යුද්දෙට යාමෙ තේරුම මොකක් ද කියල?''

පුතා වහා වහා පියාට පිළිතුරු දුන්නේය.

''අපි කවදක්කත් ඇහුවෙ නැති විධියෙ යුද්දයක් වෙන්න යනවාලු. ඉතින් කවදක්කත් නොවූ සටන් කෝලාහල වේවි. එතකොට අපේ ඉඩමුත් නිදහස් වේවි.''

''මේ මොන විකාර කථාවක් ද කියල මටනම් තේරෙන්නෙ නැහැ. අපේ ඉඩම් දැනටමත් නිදහස්. ඒව මට ඕන කෙනෙකුට බදුදීල සල්ලි ගන්න පුළුවන්. උඹල ඔය කන්නෙ අඳින්නෙ ෂෝක් කරන්නෙ ඒවයින් තමයි. මට තේරෙන්නෙ නැහැ මීට වඩා මොන නිදහසක් ද කියල.

''නාකි අයට ඕව තේරෙන්නෙ නැහැ ''

වං ලුං කල්පනා කරමින් පුත්‍රයා දෙස බල බලා තමාටම මෙසේ කියා ගත්තේය:–

''මේ පුතාට මම සැම දෙයක්ම දුන්න. ඉඩම් වලින් අස්කල්ල ඕන හැටියකට ඉගෙණ ගන්නත් ඉඩ දුන්න. දැන් ඉතින් මගේ ඉඩම් කඩම් බලාගන්නත් කෙනෙක් නැහැ. මේ වෙනුවට හිටි එක්කෙනාටත් මම ඉගැන්නුව. එයා ඉල්ලන සැම දෙයක්ම මම දුන්න. එයාට කසාදයක් බැඳල දෙන්න තමයි තාම බැරි උනේ.''

ඉතාමත් සැලකිල්ලෙන් සචකිය බාල පුත්‍රයාගේ සිහින් උස් තරුණ දේහය නැරඹූ වං ලුං යළිත් ශබ්ද නගා කථා කෙළේය.

Scanned by CamScanner

''හොඳයි පුතේ, අපි උඹට ඉක්මනටම කසාදයක් බැඳල දෙන්නම්.''

බාල පුතා කෝපාත්මක බැල්මක් පියා දෙසට හෙලා අවඥ සහගතව කථා කෙළේය.

''එහෙනම් මම ඇත්තෙන්ම පැනල යනව.''

''නැහැ නැහැ අපි එහෙනම් එහෙම කරන්නෙ නැහැ. මොකද උඹට ඕන කරන දසියක් එහෙම මෙහේ ඉන්නව ද?'' යනු වෙන් පියා තමාට වුන වරද හරි ගස්සමින් කථා කෙළේය.

ඉක්බිති තරුණයා දෙඅත් ලය මත බැඳගෙන ගැඹුරු බැල්මක් පියා දෙස හෙලමින් පියාගේ ප්‍රශ්නයට පිළිතුරු දුන්නේය:-

''මම ඔය රටේ තොටේ ඉන්න අනික් ඉලන්දරින් වගේ නොවෙයි. මට ඕන කරන්නෙ ගෑණු ගන්න නොවෙයි; ජය ගන්නයි. ගෑණු නම් කොහෙත් ඉන්නව. ඒ ඇරත් මෙහේ ඉන්න දසියො තරම් කැත, අවලක්ෂණ ගෑණු කොහේවත් නැහැ. යන්තමටවත් ලස්සන එකියකට ඉන්නෙ අර පේරමලී තමයි.''

බාල පුතා පේරමලී ගැන කථා කිරීමෙන් වං ලූං ට ඇතිවුනේ ඊර්ෂ්‍යාවකි. මෙයින් පසු තමා වයස් ගත මිනිසෙකු බවද ඔහුට දැනුනේය. කෝපය ද ඇවිස්සුනේය; එහෙයින් වේගයෙන් කථා කෙළේය.

''හා! හා! දසියන් අත්හැර දපන්! ඔය රදළ තරුණයන්ට වගේ උඹට වැඩ කරන්න ඉඩ දෙන්න බැහැ. අපි හොඳ පැවතුම ඇති පිටිසර මිනිස්සු. මගේ ගෙදර ඔය නාඩගම් නටන්න ඉඩ දෙන්න බැහැ.

එවිට තරුණයා ඇස් දල්වා දෙබැම විහිද දෙළර නටවා ''ඔබයි ඒ ගැන පළමුව කථා කෙළේ''යයි කියමින් වහා එතැනින් පිටතට ගියේය. එහි හුදකලා වුන වං ලූං බාල පුතා පේරමලීට බැලුම් හෙලීම නිසා ඇතිවුන අලුත් කෝපයෙන් දැවෙමින් ''මට මගේ ගෙදර කිසි කලෙකත් සාමයක් නැත''යි සිත සිතා දුක් සුසුමක් හෙලුවේය.

ඒකීය බාල පුතනුවන් පේරමලී ගැන කී දෙය සිතෙන් බැහැර කිරීම වං ලුං ට එතරම් පහසු නොවීය. මහළු වියේ හටගත් මේ ආසාව පේරමලීට පුදකළ ඔහු එය රහසක් මෙන් තබා ගත්තේය.

මෙයින් පසු වං ලුං කාලය ගත කෙළේ සම්පූර්ණ හුදකලාවය. පද්මා වෙතින් අයින් වී සිටි ඔහු වෙනද මෙන් මුණුපුරන් බැලීම-වද නොගියේ ලේලි වරුන්ගේ අසමගිය නිසාය. ඔහු සන්ධ්‍යා කාලයේ බොහෝ විට විවේක සුවය ගත කෙළේ ගෙමිදුලෙහි වූ සුපිපුන මලින් සැදී සිටි ඇසල ගස යට හිඳගෙන ගිම්හානයේ මාරුතය ද විඳිමිනි. ඇසල මල් සුවඳින් උදම් වී ගිය ඔහුගේ සිතට තරුණ බවෙහි ආවේසය ආරූඪ වූයේය. පා වහන් හා මේස් ගලවා තම ඉඩම්වල ඇවිදිමින් ''සාර භූමියේ'' පහස විඳිමට ද ඔහුට සිතුනේය. එහෙත් එය ඔහුට කළ නොහැකි වූයේ මිනිසුන් තමා දෙස පොහොසතෙකු ලෙස බලන නිසාය. සිතිවිලි ලෝක යෙහි ජීවත් වූන ඔහු තමාට ම මෙසේ කියා ගත්තේය.

''තරුණිය කොලුවාට දෙන එක හොඳයි.''

නැවත නැවතත් කියාගත් මේ වචනයෙන් ඔහුගේ හදවතට ඇතිවූයේ තුවාල වූ තැනකට නැවත නැවතත් අනින්නාක් මෙන් වේදනාවකි.

මෙසේ ඔහු කළුවරේ ඇසල ගස යට සිටි එක් සන්ධ්‍යාවක මේ අසලින් කවුදෝ ගමන් කරමින් සිටියේය. ඔහු ඒ දෙස වහා

Scanned by CamScanner

බැලුවේය. ඒ ගමන් කෙළේ පේරමලී ය. ඔහු රහසින් මෙන් පේරමලීට ඇමතුවේය.

"පේරමලී! පේරමලී!! පේරමලී!!!"

තරුණිය ඒ ඇමතුමට කන් යොමුකරමින් හිස නමා ආචාර කොට නතර වුනේය. යන්තම් උගුරෙන් හඬ නිකුත් කරමින් ඔහු නැවතත් ඇමතුවේය.

"මෙහෙ වරෙන් මගේ ළඟට."

ඇය බියෙන් ඔහු ළඟට ඇදුනාය. ඉන්පසු මහළු වං ලුං තමා ඉදිරියෙහි නැගී සිටි ඇයගේ කබායේ කොනක් කළුවගේම අල්වාගෙන "දරුවා" යයි ඇමතුවේ අඩක් හිර වූ වචන වලිනි. ඔහු ඇයගේ කබාය අල්ලා පිරිමැද්දේ තමා දූන් මහල්ලෙකු බවත් මේ තරුණියට කිට්ටු තරම් වයසෙහි මුණුපුරන් හා මිණිපිරියන් තමාට ද සිටින බවත් සිත සිතාය. පේරමලී ද නටුවකින් බිමට බරවෙන මලක් මෙන් ඔහුගේ පා අල්වා ගණිමින් පය පාමුල වැතිර ගත්තී මහත් ලජ්ජාවෙනි.

"දරුවා, මම හුඟක් ම නාකි මිනිහෙකැ" යි ඔහු සෙමින් සෙමින් ඇයට කීවේය.

"මම නාකි මිනිසුන්ට කැමතියි. ඒ අය හරි කරුණා-වන්ත" යයි සිහින් හඬින් ඇය කථා කෙළේ සුපිපුන ඒ ඇසල රුක සුසුම් හෙලන්නාක් මෙනි.

"උඹ වගේ ලක්ෂණ පුංචි තරුණියන්ට වුවමනා කරන්නෙ මගේ බාල පුතා වගේ උස සිහින් දේහයක් ඇති ඍජු ශරීරයක් ඇති තරුණයො" යයි ඔහු ඇයට කීවේ තමාට ඇය කෙතෙක් දුරට ආසා කරන්නී දැයි දැන ගැනීමටය.

"තරුණ අය කරුණාවන්ත නැහැ. ඒ අය හරි පරුෂ" යයි දෙපතුළෙහි වැතිරී සිටි ඇය කීවේ ඇය දෙපතුළෙන් නැගිටු වීමට මහල්ලා තුළ ආසාවක් ද කරුණාවක් ද ප්‍රාණවත් ගතියක් ද ඇති කරවමිනි. ඔහු විසින් ඔසවනු ලැබූ ඇය නැගී සිටියාය. ඉන්පසු ඔහු ඇය ද පසුපස කරගෙන ඒ අඳුරෙහිම ස්වකීය කාමරයට පිවිසුනේය. මේ මහළු අවස්ථාවෙහි වං ලුං ට ඇතිවුන "ආලය" ඔහුගේ ම විශ්මයට හේතු විය. එය පහසුවෙන් සන්තර්පනය කළ හැක්කක් විය. හැත්තෑ වියට ළංවෙමින් සිටි මේ මහල්ලා ඇගේ

ළද බොළඳ සිරුරෙහි පහස ලබා තෘප්තිමත් වූයේය. පහසුවෙන් ම සන්සිඳී ගිය මේ ආලය ගැන ඔහු යළි යළිත් මවිත වුනේය.

පේරමලී ද කාමුක එකියක් නොවූයේ වයස විසින් ඇය එයට නොමෙහෙයූ නිසාය. වං ලූං හා පේරමලී අතර සිදුවූන මේ රහස එළිදරව් නොවූයේය. පේරමලී ද තම ස්වාමියාගෙන් සිදුවූන මේ දෙය රහසක් මෙන් රැක්කාය. එහෙත් කවුරු නොකීවත් මේ දෙය.........කෝකිලා ගෙන් සඟවා ගන්නට නොහැකි විය. ඇගේ උකුසු ඇසට මේ රහස ලකුණු වූයේ පේරමලී උදෑසන වං ලූං ගේ කාමරයෙන් පිටවී යන විට ය. කෝකිලා කාමරයෙන් එළියට පැමිණි පේරමලී ට සිනාසෙමින් මෙසේ කීවාය :-

''හා ! ඔය ඉතින් කලින් මෙහේ සිටි නාකි රදළය වගේ ම තමයි.''

කෝකිලා ගේ වචන ඇසූ වං ලූං ස්වකීය ඇඳුම් ඇද ඇද එළියට අවුත් සාඩම්බර සිනහවක් පා තොල් මතුළේය ;

''මේ–මම මේකිට කිව්ව තරුණයෙක් සොයාගන්නෙයි කියල. ඒකිට නාකියම ඕනැලු.''

''හා! හා! හොඳයි මම එහෙනම් හාමිනේට කියන්නංකො.''

''මමවත් දන්නෙ නැහැ මේක සිද්ද වුනේ කොහොමද කියල. මගේ කාමරයෙ ගෑණියෙක් නවත්තගන්න මට ඕනකමක් නැහැ. මේ සිදුවුනේ ඉබේට ම.''

''හොඳයි හොඳයි ඒ උනාට හාමිනේට නම් කියන්න ඕන'' යයි කෝකිලා කීවාය.

වං ලූං අන් හැමටම වඩා බිය වූයේ පද්මාගේ කෝපයටය. එහෙයින් ඔහු කෝකිලාගෙන් මෙසේ ඉල්ලුවේය.

''ඉතින් උඹට ඕන නම් ඒක පද්මට කියාපන්. පද්මා කෝප නොවන විදියට මේක උඹට කියන්න පුළුවන් නම් මම උඹට මුදල් ටිකක් දෙන්නම්.''

ඔහුගේ ඉල්ලීම ඉටු කිරීමට කෝකිලා පොරොන්දු වුනේ සිනා සිසී හිස වනමිනි. වං ලූං කාමරයට පිවිසී යලිත් එළියට පැමිණි විට කෝකිලා මෙසේ කීවාය.

''ඔන්න මම ඒක කිව්ව. ඒක අහල හරියටම කේන්ති ගියා. නමුත් මම කිව්ව හුඟ කාලයක පටන් ඕන කරල තියෙන රට ඔරලෝසුවකුත් ඔබ අරන් දෙන්න පොරොන්දු වුන බව. ඇයට

Scanned by CamScanner

අත් දෙකට ම ගල් අල්ලපු මුදු දෙකකුත් ඕන ලු. ජේරමලී තවත් එහි පිවත් කරන්න එපා ලු. වෙන දසියෙකුත් ඕන ලු. ඔබටත් එහි පැමිණෙන්න එපා ලු.''

''හොඳයි ඇයට ඕනෑම දෙයක් ගෙනත් දීපන්. මම ඒකට අකමැති නැහැ.''

පද්මා ට අවශ්‍ය දේ සම්පූර්ණ වී ඇගේ කෝපය සංසිඳෙන තුරු ඇය වෙත යන්නට නොලැබීම ගැන ඔහු ප්‍රීති වූයේය. එහෙත් තම පුතුන් තිදෙනා ගැන සිහිවන විට ඔහුට ඇතිවූයේ ලජ්ජාවකි. ඔහුගේ සිතෙහි නැවත නැවතත් පැන නැංගේ ඒ කරුණම ය.

''මම මේ ගෙදර ස්වාමියා නේද? මට මගේ සල්ලි වලින් දසියක් ගන්න බැරි ද?'' යන ප්‍රශ්න නිතරම ඔහුගේ සිතිවිලි තරංගයෙහි මතුවූයේය.

අනතුරුව එළඹුනේ තම පුතුන් කාමරයට පැමිණෙන වේලාවය. එද ඔහු හමුවට ඔවුන් පැමිණියේ වෙන වෙනම ය. දෙවෙනි පුතා පළමුවෙන් පැමිණියේය. මෙසේ පැමිණි ඔහු කථා කෙළේ ඉඩම් ගැනත් අස්වැන්න ගැනත් පැවිල්ල ගැනත් ය. වෙනද මෙන් වං ලූං දෙවන පුතාගේ මේ කථාවට සැලකිලිමත් නොවූයේ පසුගිය අස්වැන්නෙන් ලැබූ මුදල් ඉතිරිව තිබෙන නිසාත් ණයට දුන් මුදල්වල පොලිය දෙවෙනි පුතා එකතු කිරීමෙහි යෙදී සිටින නිසාත් ය.

නොසැලකිලිමත් ව සවන් දුන් පියා ඉදිරියෙහි කථා කර කර සිටි දෙවෙනි පුතා කාමරයෙහි ඇත මෑත ඕනෑ කමින් බැලුවේය. පුතා මේ බලන්නේ තරුණිය වෙන්ට ඇතැයි සිතූ වං ලූං ''ජේරමලී! ජේරමලී!!. මටත් මගේ මේ පුතාටත් තේ අරන් වරෙන්'' යයි ඇමතුවේය. එවිට ඇය එළියට පැමිණියාය. ඇගේ සුදුමැලි සුදුවන් මුහුණ ඉදුන ඇටඹ ගෙඩියක් මෙන් රතු වී තිබුනි. හිස පහත හෙලාගෙන ඔවුන් ඉදිරියෙහි පෙනී සිටි ඇයගේ රූප විලාසය දෙවන පුත්‍රයාට පැහැදිලි ලෙසම පෙනුනේය. එහෙත් ඔහු මේ ගැන කිසිත් නොකියා යලි යලිත් මතක් කෙළේ වෙනස් කළ යුතු ඉඩම් බදුකාරයන් ගැන හා ඉඩම් වලින් ලාභ ගන්නා ක්‍රම ගැනත්ය. ඉක්බිති වං ලූං ඔහුගේ දරුවන් ගැන ද විමසුවේය.

Scanned by CamScanner

"මේ දවස්වල ඒංගොල්ලන්ට කක්කල් කැස්ස. මේ උෂ්ණ දේශ ගුණය නිසා ඒක ගණන්ගතයුතු නැතැ" යි යනුවෙන් දෙවන පුත්‍ර පියාට කීවේය.

මෙසේ ඔව්හු තේ බොමින් නොයෙක් දේ ගැන කථා කළහ. බොහෝ වේලාවකට පසු තමා දුටු දෙය හිතෙහි පමණක් තබාගෙන දෙවන පුත්‍රයා එතැනින් පිට වී යාම වං ලුං ට ලොකු නිදහසකි. ඉන් පැය භාගයකට පමණ පසු පළමුවෙනි පුත්‍රයා පැමිණියේය. උස්වූ ද විසාලවූ ද සාඩම්බර දෙහයකින් යුක්තවුන පළමු වන පුතා පැමිණි කෙනෙහිම ඔහු පේරමලීට නොඇමතුවේය. දුම් පයිප්පය උර උරා පුත්‍රයාගේ සුවදුක් විමසුම්වලට වං ලුං නිශ්චලව පිළිතුරු දුන්නේ තම වැඩිමහල් පුත්‍රයා කෙබන්දෙක් ද යන්න ඔහු දැන සිටි නිසාය. මේ පුත්‍රයා ශරීරයෙන් විසාල වූවත් සවකීය නාගරික බිරියට බියෙනි ඔහු කාලය ගත කෙළේ. මේ බව සිහි කළ වං ලුං පේරමලීට අමතා තේ ගෙණෙන්නට නියම කෙළේය. බිමට යොමු කළ නෙතැතිව ඔවුන් හමුවට පැමිණි ඇය කරන්නට නියම කළ දේ ඉටු කිරීමට සැරසුනාය. ඇය තේ පිළියෙල කරණ තුරු ඔව්හු නිශ්ශබ්දව සිටියහ. තේ ගෙනත් තබා ඇය එතැනින් ඉවත්ව ගිය විට ඔව්හු තම තේ භාජන එසවූහ. මේ අතර වං ලුං ඉතා ඕනෑ කමින් පුතාගේ නෙත් දෙස බැලුවේය. එක් මිනිසෙකු තවෙකෙකුට ඊර්ෂ්‍යා කරන විට ඇතිවන හැඟුම් එහි ගැබ්වී තිබුනි.

තේ පානයෙන් පසු පුත්‍රයා ගැඹුරු සවරයෙන් කථාකෙළේය.

"මම ඒක එහෙම වෙයි කියල විශ්වාස කෙළේ නැහැ."

"ඇයි නැත්තෙ, මේක මගේ ගෙදර" යනුවෙන් පියා පිළිතුරු දුන්නේය. පුත්‍රයා දිග සුසුමක් හෙලා යලිත් මෙසේ කීවේය.

"ඔව් ඔබ පොහොසත් නිසා ඕන එකක් කරන්න පුළුවන්. මිනිසෙකුට සෑහීමක් වෙන්නෙ නැහැ නොවැ. ඒ උනාට කවදහරි..........."

වං ලුං උපහාසාත්මකව සිනාසුනේය. පුත්‍රයා කිසිත් නොකියා නික්ම ගියේ අළුත් අදහසකින් සවකීය සිත බර කර ගෙනය. වං ලුං නොනවත්වාම දුම් කෝව ඉරුවේ මෙතරම් මහළු වයසට පැමිණත් තම අදහස ඉටුකරගත් හෙයින් ආඩම්බරයට පැමිණෙමිනි.

බාල පුත්‍රයා ඔහු වෙත පැමුණුනේ රෑ බෝවුන විටය. ඔහු එන විටද වං ලුං මැද කාමරයෙහි සිටියේ දුම් කෝව උරමිනි.

දැල්වූ රතු ඉටිපන්දමෙන් කාමරය ආලෝකවත් වී තිබුනි. පේරමලී ද ඔහුට ඉදිරියෙන් තිබුන මේසය ලඟින් මූණට මූණලා වාඩිවී සිටියේ සවකීය දෑත උකුළ මත තබාගෙනය. මෙසේ සිටි ඇය ඇතැම් විටක කුඩා දැරියක මෙන් වං ලුං දෙස මුකුළු බැලුම් හෙලුවාය. ඇයගේ මේ බැලුම් වං ලුං ගේ උඩඟුබව තව තවත් නැංගුවේය.

බාල පුතා අඳුරෙහි ඔහුගේ කාමරයට ඇතුළුවුනේ කිසිවෙකු දකින්නට පෙරය. හදිසියෙන් තමා ඉදිරියෙහි දිස්වුන මේ දශීණ යෙන් වං ලුං ගේ සිහියට නැගුනේ පෙර ගමෙහිදී දුටු දිවියෙකුගේ ස්වරූපයයි. ඝන වූ ඇහි බැමකින් හා දිලිසුන දෙනෙතකින් යුක්ත වූ බාල පුත්‍රයා ගැඹුරු හඬින් කථාකෙළේය.

"දැන් මම හේවායෙක් වෙන්න යනාවා. මම හේවායෙක් වෙනාවා."

මෙසේ කියූ ඔහු තරුණිය දෙස නොබැලුවේය. ඔහු බැලුවේ පියා දෙස පමණකි. මෙයට හදිසියෙන්ම බියපත් වූ වං ලුං ගොත ගස ගසා කථා කිරීමට සැරසුනේය. එහෙත් දුම් කෝච කටෙහි රුවාගත් ඔහුට කථා කරගත හැකි නොවීය. එහෙයින් ඔහු පුත්‍රයා දෙස නිහඬව බලා සිටියේය.

"මම යනවා. මම යනවා" යයි බාල පුත්‍රයා නැවත නැවතත් කීවේය. මෙසේ කියා පෙරලා යන්නට සැරසී ඔහු වහා තරුණිය දෙස ද බැල්මක් හෙලුවේය. ඇය ද හැකිලෙමින් ඔහු දෙස බලා අත් දෙකින් මුහුණ වසා ගත්තාය. පුත්‍රයා ද තම දෙනෙත වහා ඇයගෙන් ඉවතට ඇදගෙන කාමරයෙන් පිටවී අඳුරෙහි නොපෙනී ගියේය. ඉන්පසු යලිත් එහි නිශ්ශබ්දතාවය පැතුරුනේය. මොහොතක් පැවති ඒ නිශ්ශබ්දතාවය කඩකරමින් වං ලුං පේරමලීට කථාකෙළේ ය.

"දරුවා මම උඹට නාකි – වැඩියි. මට ඒක හොඳටම තේරෙනව."

පේරමලී මුහුණින් අත් ඉවතට ගෙන බැගෑපත් හඬින් කථා කළාය.

"තරුණයො හරි කෲරයි. ඒ නිසා මම කැමතියි නාකි මිනිසුන්ට වඩාම."

පසු දින පහන්වන විට වං ලුං ගේ බාල පුතා ඒ මැදුරෙන් අතුරුදහන් වී තිබුනි. කිසිවෙක් ඔහු ගියේ කොහේදැයි නොදත්හ.

Scanned by CamScanner



මහළු වං ලූං තුළ පේරමලී කෙරෙහි ඇතිවුන ආලය තාවකාලික දෙයක් වූයේ සීත ඍතුව ලංවන විට ඇතිවන ග්‍රීෂ්ම ඍතුවේ උද්දමය මෙන්ය. ඉන්පසු ඔහු හද තුළ ඇය වෙනුවෙන් තැන්පත් වූයේ ආශාවක් හෝ ආලයක් නොව කරුණාවය. කාමාසාව නමැති ගිනිදැල්ල මනසින් පහව යන විට වං ලූං ට එකවරටම දැනුනේ තද සිහිල් බවකි.

පේරමලී ද ඔහුගේ කාමරයෙහි වෙසෙමින් කරුණාවෙන් හා ඉවසීමෙන් යුක්තව ඔහුට සේවය කිරීම ඔහුගේ සැපයට හේතු වීය. වං ලූං ද ඇයට දැක්වූයේ සවකීය දියණියකට මෙන් අතිශයින්ම කාරුණික බවකි.

පේරමලී වං ලූං ට මෙන්ම 'පූංචි මෝඩිය'ට ද කාරුණික වූවාය. එයද ඔහුගේ ප්‍රීතියට හේතුවක් වීය. කලක සිට වං ලූං ගේ සිතෙහි බලවත් ලෙසම පැවතුනේ තමාගෙන් පසු 'පූංචි මෝඩිය'ට යන කල දවස කුමක් ද? යන්නය. තමාගෙන් පසු ඇය ගැන සොයන්නට කිසිවෙකු නොමැති බව ඔහු දැන සිටියේය. එහෙයින් ඔහු වරක් බෙහෙත් සාප්පුවකට ගොස් සුදු පාට විස කුප්පියක් ගෙනවුත් තමාගේ මරණය ලංවන විට එය 'පූංචි මෝඩිය'ට දීමට අදහස් කරමින් සිටියේය. එහෙත් ඔහුට එය කළ නොහැකි වීය; පේරමලී ලවා එය කළ හැකි යයි සිත සිතා ප්‍රීතිමත් වූ ඔහු ඇය කැඳවා මෙසේ කීවේය.

''මගේ මරණයෙන් පසුව මේ දුප්පත් 'පූංචි මෝඩි' බාර දෙන්න ඉන්නෙ උඹ තමයි. මම මළාට පසුවත් ඇය හුඟ කලක් ජීවත්

Scanned by CamScanner

වේවි. මගෙන් පසුව ඇට කිසිම පිහිටක් නැති බව මම දන්නව. සමහර විට ඇට ඉබාගාතෙ ඇවිදින්නත් ඉඩ දේවි. මගේ මරණයෙන් පසු මෙන්න මේ කුප්පියෙ තියෙන ඒවයින් ටිකක් මිශ්‍ර කරල බත් කන්න දීපන්. එතකොට ඇයත් මා පසුපසම ඒවි. එවිට මගේ හිතට කිසිම කරදරයක් නැහැ.''

පේරමලී හයින් මිරිකෙමින් කථා කළාය.

''මට කුඹියෙක්වත් මරන්න බැරි එකේ කොහොමද ඕක කරන්නෙ? බැහැ බැහැ මහත්තයො, මම වෙන දෙයක් කරන්නම් ඔබ මට කරුණාව දක්වූ නිසා මම 'පුංචි මෝඩී' මගේ පාලනයට ගන්නම්.''

ඇගේ මෘදු මොළොක් වචන වලින් වං ලුං ගේ හදවත කරුණාවෙන් තෙත් වුනේය; ඔහුට ඇඬුම් ආවේය — ඔහු අඩ අඩා කථා කෙළේය.

''ඒ උනත් මේක ගණින් දරුව. උඹ වගේ විශ්වාසදායක කෙනෙක් මට වෙන නැහැ. කවදහරි උඹත් මැරෙණව. ඉතින් උඹෙන් පසුව කවුරුත් නැහැ. මගේ පුත්තුන්ට මා ගැන සිතන්ට වෙන්නෙ නැහැ. උන්ගෙ දරුවන්ගෙත් ගැණුන්ගෙත් කරදර නිසා.''

ඔහුගේ අදහස දැනගත් පේරමලී ඒ වස කුප්පිය අතට ගත්තී කිසිවක් කථා නොකළාය. මෙයින් පසු වං ලුං සන්සුන් බවට පත් වූයේ පේරමලී කෙරෙහි තැබූ විශ්වාසය නිසාය.

වඩ වඩාත් මහළු බවට පත්වුන වං ලුං දැන් ගත කරන්නේ සම්පූර්ණ හුදකලා ජීවිතයකි. ජීවිතයේ සන්ධ්‍යා සමය තමා සමග ගත කරණ පේරමලී ගැන අනුකම්පා සහගතව වරින් වර ඔහු මෙසේද කීවේය.

''දරුව, මේ ජීවිතේ උඹට නිශ්චල වැඩියි.
මමත් දැන් හොඳටම නාකි මිනිහෙක්.''

''නැහැ. නැහැ. ඔබ මට හරි කරුණාවන්තයි. ඔබට තරම් වෙන අයෙකුට මම ආස කරන්නෙ නැහැ. වෙන මිනිසුන් කෙරෙහි මගේ විශ්වාසයක් නැහැ.''

''හොඳයි අනිත් මිනිසුන්ට උඹ ඔය තරම් හය වීමට හේතුව මොකෝ? කුඩා කාලෙ උඹට මොකුත් උනාද?''

Scanned by CamScanner

මේ ප්‍රශ්න අස අසා ඔහු ඇය දෙස බලන විට ඇයට ඇති වූනේ බියකි. ඇය තම ඇස් අත්වලින් වසා ගෙන තොල් මතුළේය.

"මම සෑම පිරිමියෙකුටම ද්වේෂ කරනව. මගේ පියාට උනත් එහෙමයි. මම අහල තියෙන්නෙ ඒගොල්ලන්ගෙ නරක පමණයි. ඒ නිසයි ඔවුන්ට මම ද්වේෂ කරන්නෙ."

"හොඳයි මේ කාමරයෙ ඉදිද්දි උඹට නිශ්චලව කරදරයක් නොමැතිව ඉන්න පුළුවන් උනා නෙව දූ"යි ඔහු ඇසුවේ ඇ සඟවා ගෙණ සිටිතැයි සැලකූ ඒ රහස දැන ගැණීමේ ආසාවෙනි.

"මම සෑමවිටම තරුණයන්ට පිළිකුල් කරණවා" යන්න පමණකි ඇය පිළිතුරු වසයෙන් කීවේ. එහෙයින් වං ලූං තව තවත් ඒ ගැන කල්පනා කෙළේය. පද්මා ඇගේ ජීවිතයේ තොර තුරු කියා මේ තරුණිය භයගන්වන්ට ඇතැයි ද කෝකිලා තම අත් දැකීම් කියා ඇය රවටන්ට ඇතැයි ද එසේත් නැත්නම් කුඩා කාලයේ ඇයට රහසිගත උපද්‍රවයක් වෙන්ට ඇතැයි ද ඔහු සිතුවේය. එහෙත් මේ පිළිබඳව ප්‍රශ්න කිරීම ඔහු අත්හළේය.

වං ලූං ප්‍රිය කළ සාමය දැන් ඔහුට තිබේ. ඔහු නිතර ආසා කෙළේ 'පුංචි මෝඩිය'ත් පේරමලීත් ලඟින් වාඩිවී කාලය ගත කිරීමට පමණකි. මියගිය පියා මෙන්ම වං ලූං ද දැන් මිදුලෙහි වාඩිවී අව්ව තපිමින් කඩින්කඩ නින්දට ද වැටෙමින් දවල් දවස ගත කෙළේ කැහැ කැහැය. කටයුතු නිමවූ මිනිසෙකු වසයෙන් ඔහු සතුටට ද පත් වූනේය.

ඔහු දරුවන්ගේ කාමර වලටද කලාතුරකින් ගියේය. වරින් වර පද්මා ද ඔහුට හමුවූනි. එහෙත් පේරමලී ගැන ඇය හා කථා නොකෙළේය. පද්මා ද මහළු වයසට පත්වෙමින් සිටි හෙයින් ආසා කෙළේ කෑම් බීම් වලට පමණකි. මෙකල පද්මාත් කෝකි-ලාත් ජීවත්වූනේ ස්වාමිදුවකුත් සේවිකාවකුත් මෙන් නොව මිතුරි යන් දෙදෙනෙකු මෙන්ය.

මේ දෙදෙනා නොයෙක් නොයෙක් දේ ගැන කථා කළහ. ශබ්ද නගා කථා නොකළ හැකි දේවල් ඔවුන් කථාකළේ රහසි ගතවය. එකට කා බී ඕපාදූප කථා කරමින් කාලය ගත කිරීම මේ දෙදෙනාගේ විනෝදය විය.

Scanned by CamScanner

කලාතුරකින් වං ලුං පුත්‍රයන්ගේ කාමරවලට ගිය විට ඔවුන් ඔහුට සැලකුවේ මහත් කරුණාවෙනි. ඔව්හු පියාට කෑම බීම වලින් සංග්‍රහ කළහ. මුණුපුරු මිණිපිරියන් ගැන ඇලුම් කළ ඔහු පුත්‍රයන්ගෙන් මෙසේ ප්‍රශ්න කෙළේය.

''දැන් මට මුණුපුරු මිණිබිරියන් කීදෙනෙක් ඉන්නවද?''

''දැන් ඔබේ පුත්තු දෙන්නටම පුත්තු එකොළහකුයි දුවරු අට දෙනකුයි ඉන්නවා''යයි එක් පුත්‍රයෙක් පියාට පිළිතුරු දුන්නේය.

''හා! හා! සෑම අවුරුද්දකම දෙක දෙක එකතු කළාම හරි නේද''යි ඔහු කීවේ සිනාසෙමින් හා ඉහි මරමිනි. මෙසේ කථා කරමින් සිටින විට ඔහු වෙත ලංවෙන දරුවන් දෙස එබී එබී බල බලා තොල් මතුළේය.

''අර එකා හරියට එයාගෙ පියා වගේ මයි – පුංචි ලි යූ නැමති වෙළෙන්දෙක් වගෙයි.''

''කොහොමද උඹල ඉස්කෝලෙත් යනවද?''

''ඔව් සීයේ''යයි කියමින් ඔව්හු පිළිතුරු දුන්හ.

''උඹලා පොත්හතර එහෙම පාඩම් ගන්නවාද''යි යළිත් වං ලුං ඇසුවේය.

කුඩා ලමයි මහල්ලාට සිනාසී මෙසේ කීහ. ''නැහැ සීයෙ, මේ විප්ලවයට පස්සෙ ඔය පොත්හතර කවුරුවත් ඉගෙන ගන්නෙ නැහැ.''

''හා! මමත් දන්නව ඔය විප්ලවය ගැන. නමුත් කුඹුරු වැඩ නිසා මට ඒකට යන්න උනේ නැහැ.''

කොල්ලෝ එයට ද සිනාසුනාහ. මේ හිනාව අස අසා ඔහු ඒ කාමර වලින් පිටව ගියේ තමා ඒවාට අමුත්තෙකැයි ද යන හැඟුම ඇතිවය.

මෙයින් පසු බොහෝ කාලයක් ගතවෙනතෙක්ම ඔහු පුත්‍රයන් ගේ කාමර වලට නොගියේය. දිනක් ඔහු කෝකිලා කැඳවා මෙසේ විමසුවේය.

''ඇ බාන් මගේ ලේලිල දූන්වත් සමාදනයෙන් ඉන්නවද?''

කෝකිලා බිමට කෙලගසා පිළිතුරු දුන්නේය. ''ඒගොල්ල ද? ඒ ගොල්ල හරියට පොරකන බළල්ලු වගේ නෙව. ඔන්න වැඩි-මලාගෙ බිරියත් දැන් එයාට එපා වෙලා. එයා හරි ආඩම්බර කාරියක්. එයා නිතරම කථා කරන්නෙ එයාගෙ තාත්තලගෙ වගතුග

වැඩිමලා වෙන ගෑණියක් ගන්න යනවයි කියල කථාවකුත් තියෙනව. හැබැයි මිනිහ අර තේ කඩේට නම් නිතර නිතර යනව.''

''මොනවා?''යි වං ලූං කීවේය. එහෙත් ඒ ගැන අසන්නට ඔහු තුළ සැලකිල්ලක් නොවීය. නොදනුවත්වම ඔහුට තේ වතුර ගැනද සිහි වූනේ වසන්තයේ සීතල මාරුතය ඔහු වැලඳ ගත් හෙයිනි.

ඔහු යළිත් කෝකිලා අමතා කතා කෙළේය. ''කවුරුවත් අහල තියෙනවද මගේ බාල පුතා ගැන. එයා මෙච්චර කල් කොහේද ගියේ කියල?''

එයට ද කෝකිලා පිළිතුරු දුන්නේ ඇය නොදන්නා දෙයක් මේ ගෙවල් අතර නොවූ නිසාය.

''හා! එයා ලියුම් එවන්නෙ නම් නැහැ. නමුත් ඉදල හිටල දකුණු පළාතෙන් එන අය කියනව ඒ පැත්තෙ 'විප්ලවයක්'ය කියන මොකක් ද එහෙක ලොක්කෙක්ය කියල. මම නම් දන්නෙ නැහැ ඒ මොකක් ද කියල. සමහර විටක මොකක් නමුත් ජාවාරමක් වෙන්න ඇති.''

එයටද වං ලූං කීවේ ''හැබැටම'' යන්න පමණකි. ඔහු ඒ ගැන වැඩිපුර කල්පනා නොකෙළේ සන්ධ්‍යාවේ සීතල සුළඟ ඔහුට පීඩාදායකවූ නිසාය. පෙර මෙන් එක් දෙයක් ගැන සිත යොදවා නැබීමට දැන් ඔහුට නොහැක. අන් හැමටම වඩා ඔහු සැලකිල්ලක් දක්වූයේ කැම් බීම් ගැනය. පේරමලීගේ උණුසුම ඔහුට ලැබීම නිසා සීතලෙන් ඔහුට පීඩාවක් නොවීය. ඇගේ උණුසුම ලබ ලබා ඔහු සතුටු වූනේය.

වසන්තය ද ගෙවී ගියේය. වං ලූං ට දුබල බව ද දැනෙන්නට වූනේය. එහෙත් ඉඩම් වලට ඇති ආසාව නම් ඔහුගේ සිතෙන් පහ නොවීය. නගරයේ ධනවතෙකු මෙන් ජීවත් වූනත් නිතරම ඔහුගේ සිත පැවතුනේ ගමේ ඉඩ කඩම් වෙතය. මාස කීපයක් ඉඩම් ඔහුට අමතක වී තිබුනත් සෑම වසන්තයකම සෞඛ්‍ය ඉඩම් වලට ඔහු යාලූකු විය. කුඹුරෙහි කිසිම වැඩක් කරගත නොහැකි වුනත් ඔහු එසේ ගියේ එයට පැවති ආසාව නිසාය. ඇතැම් වසන්තයක කොට්ට මෙට්ටද ගෙන ගොස් ඔහු තමාට දරුවන් ලැබුණු ඕලෑං මරණයට පත් අර ගමේ පැරණි ගෙයි පදිංචිව සිටියේ කුඹුරු

වැඩ අවසන් වන තෙක්ය. ඒ ස්ථානය ගැන ඔහු තුළ ඇති වූයේ අපූරු බැඳීමකි. එහි වෙසෙන සැම උදයකම ඔහු කරන්නේ වෙවුලන අත්වලින් මල් පොකුරක් කඩාගෙන එය සිඹ සිඹ සිටීමය.

වසන්තයේ අඟහරියේ දිනයකි. වං ලූං ද කුඹුරේ ටික දුරක් ගමන් ගත්තේ කඳු ගැටයක් මත තැන්පත් කළ තමන්ගේ නෑයන්ගේ සොහොන් බිමට ද ගොඩ වෙමිනි. ඔහු සැර යටියේ වාරුවෙන් එහි එහා මෙහා ඇවිදිමින් මිනී වළවල් දෙස බලමින් අතීතය සිහි කෙළේය. එහිවූ එක් එක් සොහොනක කථානායකයන් ඔහුගේ සිහියට නැඟුනේ ගෙදර සිටින පුතුන්ටත් වඩා පැහැදිලි ලෙසය. කොහොම නමුත් ඔහුගේ මනය ගතවූ අවුරුදුවලට දිවවේය. මැතක දී සිහියට නොනැඟුන–කලක් අමතක වී තිබුන දෙවන දියණිය ගැනද ඔහුට මතක් වුනේය. සේද පටියක් වැනි රතුවන් දෙතොලකින් යුක්ත ඒ තරුණිය තමා ඉදිරියෙහි දිස් වන්නාක් මෙන් ඔහුට දැනුනි. එහෙත් ඒ දෙවන දියණිය ද මේ සොහොන් වල සැතපෙන්න වූත් මෙන්ම තමාට හුහක් ඈත්ව වෙසෙන බව කල්පනා කළ ඔහු ''හා! මීලඟට මෙතැනට එන එක්කෙනා මම තමා''යයි කීවේ අනාගතයට ද එබෙමිනි.

අනතුරුව ඔහු තව තවත් සොහොන් බිම පරීක්ෂා කර බැලුවේය. තම පියාගේ හා බාප්පාගේ සොහොනට පහළිනුත් චිං ගේ සොහොනට ඉහළිනුත් ඕලෑං ගේ සොහොනට නොදුරුවත් අනාගතයෙහි තමා සැතපෙන තැන දුටුවේය. මෙසේ තම ජීවිතය පිළිබඳ අනාගත සිතුවම් අඳිමින් ඔහු මෙසේ තොල් මතුළේය.

''දැන් ඉතින් මිනී පෙට්ටියකුත් සොයල තියාගන්න ඕන.''

මේ සිතිවිල්ල ඔස්සෙහි වේදනා සහගත හැඟුම් නොකඩවා ඔහු හදවතට ගලා ආවේය. ඉන්පසු යළිත් නගරයට ගිය ඔහු වැඩිමහලු පුත්‍රයා කැඳවා මෙසේ කීවේය.

''මට කියන්න කාරණයක් තියෙනව.''

''හොඳයි කියන්න ඒ මොකක්ද?''

කියන්නට ගිය දෙය වං ලූං ට හදිසියේම අමතක විය. වේදනා සහගත හැඟුම් වලින් බර ඔහු කියන්නට ගිය දෙය කල්පනා කරමින් දෙනෙතින් උණුකඳුළු කැට කඩා වැටෙද්දී ජේරමලි ට කථා කෙළේය.

''දරුව, මොකක් ද මට කියන්න ඕන කෙළේ.''

Scanned by CamScanner

"ඔබ අද කොහේද ගියේ?"

"මම අද ඉඩම්වලට ගියා."

"ඉඩම්වල කොයි කෑල්ලටද ගියේ?"

"හා! ඔන්න දැනුයි මට මතක් උනේ. පුතේ, මේ පොළොවෙ මට හිමි තැන මම බලාගත්ත...........මැරෙන්න ඉස්සෙල්ල මට ඕන කරන්නෙ මගේ මිනීපෙට්ටිය බලාගන්නයි."

එවිට වං ලුං ගේ වැඩිමහලු පුතා සුවච ලෙස කථාකෙළේය.

"ඒ වචන නම් කථාකරන්න එපා! නමුත් මම ඔබට කැමති දේ කරන්න" යයි කියූ පුතා මිනීපෙට්ටි විකුණන සාප්පුවකට ගියේය. එහි ගොස් වටිනා ලී වර්ගයකින් සාදන ලද අනර්ඝ කැටයමකින් සැරසූ මිනීපෙට්ටියක් මිලදී ගත්තේය. ගෙදරට ගෙන ආ ඒ පෙට්ටිය දැක වං ලුං අතිශයින්ම සතුටට පත්වූයේ එය මිනීපෙට්ටි සෑදීමට ගන්නා ශක්තිමත් ලී වර්ගයකින් කර තිබුන නිසාය.

මේ මිනීපෙට්ටිය තැන්පත් කෙළේ වං ලුං ගේ කාමරයෙහිය. ඔහු දිනපතාම එය බැලීමට අමතක නොකෙළේය. හදිසියෙන් මෙන් තවත් කල්පනාවක් ඔහුට පහළවුනි. ඔහු එය පුත්‍රයන්ට ද කීවේය.

"මම මේ පෙට්ටිය අර ගමේ මගේ මැටි ගෙයටම යවන්න ඕන. මගේ අන්තිම දවස් එහේ තමයි ගතකරන්න ඕන."

පුත්‍රයෝ ද ඔහුගේ මේ බලවත් ආසාවට විරුද්ධ නොවූහ. එහෙයින් ඔහු යළිත් තම ඉඩ කඩම් හා කුඹුරු මැද පිහිටි ගමේ ගෙදරට ම වාසය සඳහා ගියේය. පේරමලී ත් පුංචිමෝඩිය ත් තවත් වුවමනා කරණ මෙහෙකරුවන් කීප දෙනෙකුත් ඔහු සමග ගියහ.

අස්වැන්න සමය උදාවුනෝය. වං ලුං ද තම පියා හිඳගත් බිත්තිය අද්දරටම වී ග්‍රීෂ්ම ඍතුවේ හිරු එළිය තපිමින් සිටියේය. ඔහුගේ සිත දැන් සම්පූර්ණයෙන්ම නිදහස්ය. කෑම බීමත් ඉඩ කඩම් ගැනත් හැර වෙන දෙයක් ගැන ඔහු කල්පනා නොකෙළේය. වෙනදමෙන් ඉඩම්වල වගාකළයුතු බෝග වර්ග ගැන හෝ අස්වැන්න ගැන ඔහු කිසිත් නොසිතුවේය. බොහෝවිට ඔහු කෙළේ තම වත්තෙහි වාඩිවී පස් ස්වල්පයක් අතින් එකතුකොට ගෙන ඒ දෙස බලා සිටීමය. අත්ලෙහි තම ඉඩම්වල පස් තිබෙන විට ඔහු සිතුවේ තමා අතෙහි ප්‍රාණය තිබෙන්නාසේ ය. ඔහු

එපමණකින්ම තෘප්තිමත් විය. වරින් වර මිනීපෙට්ටිය ද බැලූ ඔහුට සාර භූමිය තමා පිළිගැනීමට නිසලව බලා සිටින අයුරු පෙනුනේය.

පුත්‍රයෝ ද වං ලුං ට හැකිතරම් සුවච බවක් පළකළහ. ඔව්හු තම පියා බැලීමට ද නිතර නිතර එහි පැමිණියහ. එසේ පැමිණි පුත්‍රයෝ ඔහුගේ වයසට සුදුසු කෑම බීමද ගෙනආහ. කොතෙක් කෑම වර්ග ලැබුනද ඔහු වඩාත් කැමතිවුනේ තම පියා මෙන් පිටි සවල්පයක් උණුවතුරට දියකොට එය ආහාර වසයෙන් ගැණීමය.

ඇතැම් විටක දිනපතාම පුතුන් නොපැමිණි කල්හි ඔහු ජේරමලීට අමතා මැසිවිලි කීවේය.

"මොකද දන්නෙ නැහැ දූන් හුඟක් දවසකින් නාවෙ."

"ඒ අය දන් ගතකරන්නෙ ජීවිතයෙ හොඳම කාලය. ඒ අයට වැඩ අධිකයි. ඔබේ වැඩිමල් පුතා නගරයෙ පොහොසත් මිනිසුන්ගෙ සංගමයෙ සභාපති. එයාට දූන් අළුත් බිරියකුත් ඉන්නව. ඔබේ දෙවන පුතත් ධාන්‍ය වෙළඳ පලක් පටන් ගන්න යනව."

ඔහු ඒ සියල්ලටම සවන් දුන්නේය. එහෙත් එය තේරුම් ගත නොහැකිවුනේ තම ඉඩම් ගැන හදිසියෙන් කල්පනාවුන හෙයිනි. ඔහුට ඇය කියූ දෙය අමතක වී ගියේය.

පසුදිනය ඔහුට ප්‍රීතිමත්වූයේ පුත්‍රයන් දෙදෙනාම පැමිණි හෙයිනි. තාත්තා විසින් ආදරයෙන් පිළිගනු ලැබූ පුත්‍රයෝ ගෙයි එහා මෙහා ඇවිද ඉඩම් බැලීමට ද ගියහ. වං ලුං ද නිශ්චලව ඔවුන් පසුපස ගියේය. පුත්‍රයන් දෙදෙනා ඉඩම්වල ඇවිද එක්තරා තැනක නතර වුනවිට වං ලුං ඔවුන් වෙත ගියේය. බුරුල් පස මත තැබූ අඩි ශබ්දය හෝ සැරයටි ශබ්දය පුත්‍රයන්ට නොඇසුනි. එහෙත් දෙවන පුත්‍රයා ගුප්ත ස්වරයෙන් මෙසේ කියනු වං ලුං ට ඇසුනි.

"මේ ඉඩමත් මෙන්න මේකත් අපි විකුණමු. විකුණල මුදල් සම සමව බෙද ගනිමු. උඹේ කොටසත් මම හොඳ පොළියකට ණයට ගන්නම්. දූන් දිගටම දුම්රිය ගමනාගමනයත් තියෙන නිසා මෙහි අස්වැන්න නැවට ගෙනියන එකත් පහසුයි. ඒ නිසා මම........"

Scanned by CamScanner

වෘද්ධයාට ඔහුගේ මේ වචනවලින් ඇසුනේ ''ඉඩම විකුණනවා'' යන්න පමණකි. එහෙයින් ඔහු කෝපයෙන් වෙව්ල වෙව්ලා කථා කෙළේය.

''ඈ බොලව් කම්මැලියො, ඉඩම විකුණන්නයි කථාව?''

මෙහිදී ඔහුගේ උගුර හිරවුනි. ක්ලාන්තවී වැටෙන්නට ද ගියේය. එහෙත් ඔව්හු මහල්ලා අල්ලා ඔසවා ගත්හ. මහල්ලා හඩා වැළපෙන්නට වුනි.

පුත්‍රයන් දෙදෙනා මහල්ලා සනසමින් කථා කළහ.

''නැහැ නැහැ අපි කවදක්කත් ඉඩම විකුණන්නෙ නැහැ.''

''ඔව් ඒකනෙවෙන්නම්. ඉඩම විකුණන එක පවුලෙ විනාශයක්. ඔය ඉඩම්වලින් තමයි අපි ආවෙ. ආපහු ඒවටම යනවා. උඹලයි ජීවිතේ තියෙන්නෙ ඔය ඉඩම්වල තමයි. උඹලගෙන් ඔය ඉඩම කාටවත් උදුරා ගන්න බැහැ''යි මහල්ලා කීවේ දෙනෙතින් වැටුන කඳුළු මුහුණෙහි වියලී යද්දීය. යලි ඔහු පස් අහුරක් අතටගෙන ''උඹලා ඉඩම විකුණතොත් ඒක තමයි අවසානය''යි කීය. ඔහුගේ පුතුන් දෙදෙනා පියාගේ දෙපසට වී වත්තම් කරගෙන සැනසුම් බස් පැවසූහ. ඔහු තම අතින් පස් අහුර තදින් අල්ලා ගත්තේය.

''සහතික වෙන්නම් තාත්තෙ, කවදක්කත් ඉඩම නම් විකුණන්නෙ නැහැ''යි පුත්තු යලි යලිත් කීහ.

එහෙත් ඔවුන් දෙදෙනා එසේ කීවේ වං ලුං ගේ හිසට උඩින් එකිනෙකාගේ මුහුණු බල බලා සිනා රැලි නංවමිනි.

Scanned by CamScanner